මේ පංච ස්කන්ධය නිබඳ ව ම වෙනස් වන පංච උපාදාන කොට්ඨාශයක් බව වටහා ගැනුම අත්‍යවශ්‍ය ය. එ හෙයින් ඒවා අනිත්‍ය යි; එ නිසා දුක්ඛ යි. පළමු ආර්ය සත්‍යය පිළිබඳ විස්තර වාක්‍යයෙහි එය එ සේ සඳහනි. තව ද, ඒවා ආත්මයක් නො දරන බව (-අනන්ත) ද නොයෙක් විට ප්‍රකාශ වෙයි. මෙය ද, අනිත්‍ය බව (-අනිච්ච) සහ දුක්ඛ ද සියලු සංස්කාර ධර්මයෙහි ත්‍රිවිධ ලක්ෂණ යි. මේ පංච ස්කන්ධ අතුරෙන්, අභ්‍යන්තරික හෝ බාහිර හෝ, සියුම් හෝ දළ හෝ, පහත් හෝ උසස් හෝ එකක්වත් ''මම'' නො වෙයි. එ හෙයින්; ඔබ ගේ නොවන දෑය අත්හරිවූ. එම ක්‍රියාව දිගු කලක් ම, ඔබගේ යහපතට සහ සොම්නසට හේතු වනවා ඇත. කුමක් ද මේ ඔබේ නොවන්නේ? පංච ස්කන්ධයෙන් එකක්වත් ඔබේ නොවේ; ඉන් එකක් වත් 'ඔබ' නොවේ; ඔබගේ ආත්මය ද නො වේ. එ නිසා ඒ සියල්ල ඉවත ලන්න'' (Mi 140-41, iii 33-4). එහෙත්, ඉන්ද්‍රිය නොහොත් සිත පිළිබඳ උදාසීනත්වයක් හෝ අවුලක් හෝ ඇති කරගත යුතු බවට උපදේශයක් කවර තැනෙක වත් නොමැති. ජය අත්පත් කරගත හැක්කේ වෙනස් වන ලෝක ස්වභාවයෙන් ගැහැටක් නො ලබා, සියලු ඓන්ද්‍රිය - අවබෝධ ඩැහැ ගන්නේ නැති ව, ඒ සැම නිසා නො සැලී සිටිමින්, නව චෛතසික ස්වභාවයක් මවා ගන්නා මනුෂ්‍යයාට ය. තව ද, බාහිර ලෝකයෙන් කිසි දු බලපෑමක් නොලබන තරමට ම ඉන් චෛතසිකය මුදාගෙන ''සියලු නිසැල්ම'' (Sn 902) රජයන ගැඹුරු සමවත්වලට සම වදින්නට ද

ඓන්ද්‍රීය ක්‍රියා විෂය සහමුලින් ම ඉක්ම වීම ද කළ හැකි වේ. ''යුදයෙහි දී සෙබළුන් දහසක් පරදනුවට වඩා ශ්‍රේෂ්ඨ වූ ආත්ම-දමනය (ධම්මපදඃ 103) නම් මේ යි.''

මේ ඉතින්, උපාදාන කොට්ඨාශ වූ ද, සසරෙහි මෙ තෙරට අප බැඳ තබන සංයොජන වූ ද පංච ස්කන්ධය පිළිබඳ කෙටි විස්තරය යි; ඉන් නොමිදුණේ උපත්-ජරා මරණයෙන් ද, ඉන් හටගැනෙන දුක්ඛයෙන් (M, i.8) ද විමුක්තියක් නො ලබයි. බුද්ධ ධර්මයෙන් ඉගැන්වෙන්නේ මේ පවත්නා ආත්ම-භාවය සියලු අමා සුව සඳහා යෙදිය යුතු එක ම අවස්ථාව යැ'යි හෝ, මෙය ''පුද්ගලයකු'' ලබා සිටින එක ම නොහොත් අවසන් ජීවිත-අවස්ථාව යැ'යි හෝ, එක් අත්බවකින් පසු තවත් අත්බවක් ලැබීම පැතිය යුත්තෙකැ යි හෝ නො වේ. බුද්ධ ධර්මයෙන් ඉගැන්වෙන්නේ එයට ඉඳුරා විරුද්ධ අදහසෙකිඃ ''පුනරුත්පත්තිය දුකක්'' (ධම්මපදයඃ 153) බව යි. ඉතින් බුද්ධ ධර්මයෙහි උසස් ස්ථානයක් දරන්නා වූ ප්‍රතිපත්ති විෂයයෙහි නිතර යෙදෙන්නා ස්කන්ධ පිළිබඳ ස්වකීය අදහස් වෙනස් කරගෙන, උපාදානයෙන් ද, ''තමා ගේ'යි'' හැඟුමෙන් ද මිදිය යුතු) වෙයි. මේ පළමු සත්‍යය පිළිබඳ අප කළ යුත්තේ දුක්ඛ සහ එහි සියලු ලක්ෂණ මැනැවින් අවබෝධ කරගැනුම යි.

දෙ වැනි සත්‍යය නම් දුක්ඛ සමුදය යි. මේ පුනරුත්පත්තිය හා සම්බන්ධ වූ තණ්හාව නම් ''පිපාසය'' යි. ඉන් අදහස් වන්නේ කාම සැප, භව සහ විභව කෙරෙහි බැඳි තණ්හාව යි. (විභව යනු භවයේ අධික ස්වභාවය යි. වි-උපසර්ගය අභාවවාචී ද වන හෙයින්, භවයේ නැසුම සේ ද එය ගත හැකි යි.) මේ සත්‍යය වටහා ගැනුමට නම්, අර සංස්කාරවලින් යුත් ප්‍රාණියකු වන මනුෂ්‍යයා ගැන අප සිතා බැලිය යුතු යි. බුද්ධ ධර්මය අනුව, මරණය වූ කෙණෙහි, පස් වැනි ස්කන්ධය වූ විඥානය වෙනත් අලුත් ස්ථානයක් ප්‍රතිෂ්ඨා කොටගෙන රැඳෙන්නට පටන්ගන්නේ (S. ii. 65) ස්ත්‍රී ගර්භයක් තුළට පිවිස, සෙසු චතුස් ස්කන්ධය රැස්කොට ගෙන යළිත් බිහිවෙයි. සාමාන්‍යයෙන් ''ප්‍රාණියා'' යනුවෙන් හඳුන්වනු ලැබීමට අවශ්‍ය වන චෛතසික - භෞතික ස්කන්ධය වූ නාම - රූපය තුළට විඥානය, වෙන අන් තැනෙක නො ගොස්, පිවිසෙන බව කියති -(D. ii. 32). තාපය සහ ජීවය සේ ම, එය ද ප්‍රාණියා ගේ ශරීරය හා වෙළී පවතී (D. ii 338). එනිසා, විඥානය කෙරෙහි නම් වෙනසක් ඇති නොවෙයිඃ එය එක් කලෙක යම් තැනැත්තකුගේ භෞතික ස්කන්ධයෙහි රැඳී තිබුණේ ද ඒ ස්කන්ධයෙහි අභාවයෙන් තවත් තැනක් සොයා යන්නේ, සිය (ක්‍රියාකාරීත්වයේ) අඛණ්ඩභාවය රැකගනිමිනි, විඥානය වූ කලි ගලා යන දිය දහරෙකි - ශ්‍රොතයෙකි. (D. iii. 105); මරණ මොහොතෙහි පැවැති අවසාන චුති-විඥාන මාත්‍රය, පුනරුත්පත්තියෙහි දී ඇති වන පළමු ප්‍රතිසන්ධි-විඥාන මාත්‍රය වෙත නො සිඳී ගලා යයි. එ හෙයින්, විඥානය ඇතුළු වීමෙන් නවත්වයක් ලබා ජනිත වන නව පුද්ගලයා පෙර අත්බැවෙහි විසූ තැනැත්තා නො වන අතර ම, සහමුලින් ම වෙනස් නිර්මාණයෙකින් යුත් පුද්ගලයෙක් ද නො වෙයි. ප්‍රතිරාවයක් හට ගන්නා ආකාරය මීට සමාන ය. එය හැට ගැනුණේ ශබ්දය නිසා ය; එහෙත් මූලික ශබ්දයේ සංසරණය නිසා හටගැනුණේ නො වෙයි. සංසරණය වන්නේ ක්‍රියා පද්ධතිය යි, පුද්ගලයා නොවේ. පුනරුත්පත්තිය සිදු වන්නේ ද කර්මය සංසරණය වීමෙනි; විඥානය, නව චෛතසික-භෞතික ස්කන්ධයක් හා ආශ්‍රයට පමුණුවන්නේ කර්මය යි. තවත් අයුරෙකින් කිවහොත්, කිරි ද දී ද අතර සම්පූර්ණ ඒකත්වයක් හෝ සම්පූර්ණ විශුද්ධ ස්වභාවයක් හෝ නොමැත්තා සේ ම, නව විඥානය පූර්ව විඥානයෙන් සම්පූර්ණ වෙනස් ස්වභාවයක් නො දරන අතර ම එය හා සාරූප්‍යයක් ද නො දරයි.

එ නිසා ආර්යය ශ්‍රාවක තෙමේ තමා සසරෙහි සැරි සරන්නකු සේ හෝ, නව නිර්මාණයක් ලද්දකු සේ හෝ, පුනරුත්පත්තියක් ලද්දකු සේ හෝ, නො සිතයි. ඒ වෙනුවට, නොයෙක් පුද්ගල භාවයන් හටගැනුමට ද නැති වී යෑමට ද හේතු වන කරුණු රැස අවබෝධ කොට ගනියි. (S. ii. 26,27) එ නිසා පරමාර්ථ වශයෙන් සලකන කල, එක් වාස භූමියෙක සිට තවත් වාස භූමියක් කරා යන ''පුද්ගලයකු''

නොමැති හෙයින් චතුස්සත්‍යය විදර්ශනායෙන් අවබෝධ කොට, නො කඩවා මාරුවෙන් මාරුවට සිදු වන මරණයෙන් සහ පුනරුත්පත්තියෙන් යුක්ත වූ සංසාර චක්‍රයෙහි භ්‍රමණය කෙළවර කරන තෙක්, එය හා බැඳී සිටිමින් කර්ම බල වේගය හේතුකොට ගෙන සංසරණය වන හෙයින් ''මම'' හෝ ''අර අසවලා'' හෝ නොවන බව පැහැදිලි වෙයි.

''ඔබටත් මටත් අතිදීර්ඝ භ්‍රමණයක්-සංසරණයක් පවතිතැ (D ii. 90 S.V 431-2-Aii) යි යන ප්‍රකාශනය සත්‍ය වන ආකාරය පටිච්ච සමුප්පාදයෙන් පෙනෙයි. ඉන් දැක්වෙන්නේ සංස්කාරවලින් යුක්ත වූවන්, අවිජ්ජාවෙන් වැසී ද, තණ්හාවෙන් බැඳී ද සිටින නිසා, කර්මය හේතු කොටගෙන, ආරම්භයක් වටහාගත නොහැකි සංසාර චක්‍රයට වෙළී පසුවන බව යි. කර්මයෙහි ආවේනික ලක්ෂණයක් නම් විපාක ගෙන දීම යි; පටිච්ච සමුප්පාදයෙහි ක්‍රමවත් ව දැක්වෙන්නේ ඒ පිළිවෙළ යි. කර්මය පුද්ගලත්වයෙන් තොර බල වේගයෙකි; යම් ක්‍රියාවකින් නිසි සේ ප්‍රතිඵලයක් ඇති කරවන්නේ එය යි. මෙහි ප්‍රමාණය අනුව මේ ආත්මභාවයේ දී, හෝ පසු ආත්ම භාවයෙක දී, හෝ නොහොත්, පසු ආත්මභාව රැසෙක දී, සිය බලවේගය සිඳි යන තෙක්, මෙය විපාක ගෙන දෙයි.

යහපත් කර්ම සහ අයහපත් කර්ම යන දෙවර්ගයෙන් ම ප්‍රතිඵල ඇති වෙයි. ඒ එකින් එක අසම්බන්ධ යි; එ නිසා, යහපත් කර්මයෙකින් අයහපත් කර්මයෙක ප්‍රතිඵල කවර විධියෙකින් වත්, ලොප් කළ හැකි නො වේ. ''වපුල බිජුවට යම් පරිදි ද, ඉන් නෙළන අස්වැන්න ද එ පරිදි වේ: යහපත කරන්නා යහපත ම ද, අයහපත කරන්නා අයහපතම ද රැස් කර ගනියි.'' (S. i. 227). මෙනිසා, යමකු කරන සියලු යහපත් ක්‍රියා සියල්ලට වුව ද, ඔහු කරන පාප ක්‍රියාවල වේගය සිඳලනු අපහසු ය; ඒ සියල්ලෙහි ඵලවිපාක වෙන් වෙන් ව හටගනී. සංස්කාරවලින් යුක්ත වූ මනුෂ්‍යයාට නම් කයින් වචනින් සහ සිතින් කළ යුතු ක්‍රියාව තෝරාගැනීමේ බලයක් තිබේ. ''(ඔබ හැම) කුශලතා ඇති කරවීමට පොහොසත් නිසා මම මෙසේ පවසමි; කුශලතා ම ඇති කරවු''(A. i. 58). යම් පුද්ගලයකුගේ පෙර ආත්මභාව ස්වභාවය සහ අනාගත ආත්මභාව ස්වභාවය ද, වර්තමානය ද පිළිබඳ සැක - ඒවා ධර්මයේ හෝ ප්‍රතිපත්තියේ හෝ මූලික සංස්ථා නොවන නිසාත්, ධර්මාවබෝධයට ආධාරයක් නොවන නිසාත්, නුසුදුසු සේ දෙසන ලදි.

''අතීතය ගැනත් නො සලකමි; අනාගතය ගැනත් නො සලකමි; මම ධර්මය දෙසමි. එහි සම්පිණ්ඩනය මෙය යි. මෙය ඇතිවීමේ හේතුවෙන් මෙය ද හටගනියි; මෙය හටගත්තේ නම්, මෙයද හට නොගනී; මෙහි නිරෝධයෙන් මෙය ද කෙළවර වෙයි'' (Mi. 32). මෙසේ සර්ව විෂයයෙහි ලා හේතු ධර්මයක් ප්‍රකාශ කිරීම පාළි පිටකයෙහි පවත්නා බෙහෙවින් ම සිත්ගන්නා-සුලු තැනෙකි. සංසාර චක්‍රයට ද අදාළ වන එය දෙ වැනි ආර්යය සත්‍යය හා ප්‍රතිබද්ධ යි; දුකෙහි උපතට ද හේතුවක් තිබිය යුතු යි. නිර්වාණය හැර අන් කිසිවක් පෙර පැවැති හේතු සාධකයක් නොමැතිව හටගන්නේ නොවේ. ථෙරවාදය අනුව - එහෙත් සර්වාස්තිවාදය අනුව මේ නොවිය හැකියි - එකම අහේතුක ධර්මය නිර්වාණය යි.

හේතුව, පටිච්ච සමුප්පාදයෙහි ඉතා විශේෂ තැනෙක ලා ඉදිරිපත් කරනු ලබයි. ඉන්, භව හේතු ප්‍රත්‍යයේ සහ සංසාරික ජීවිතයේ අඛණ්ඩතාව ද එහි කෙළවර දැක්ම ද මූලික පදනම් සේ ගැනීමෙන් අතීතය වර්තමානය හා ද, වර්තමානය අනාගතය හා ද සම්බන්ධ වේ. මේ පටිච්චසමුප්පාද චක්‍රය බුද්ධ ධර්මයට ම විශේෂ යි; සියලු බුද්ධ ධර්මයෙහි මධ්‍යවර්තී වූයේ ද එය යි. එහි, එකිනෙකට ඇඳී තිබෙන්නා වූ ද, හේතු ප්‍රත්‍ය වශයෙන් එකිනෙකට සම්බන්ධ වූ ද, පුරුක් දොළොසෙකි. එහි හැමෙකක් ම, එයට කලින් පවත්නෙහි ඵලය යි; එයට පසුව පවත්නෙහි හේතුව යි. මේ සියල්ල යම් තැනැත්තකු කෙරෙහි, පිළිවෙළින්, එකින් එකට, බලපායි-එහි ක්‍රියාකාරීත්වය සිඳ දමන තෙක් - ඒ

චක්‍රයේ භ්‍රමණය නවතාලන තෙක්, බලපායි. ඒ අතර ම, සියලු හේතු අතුරින් පරම හේතුවක් බුද්ධ ධර්මයෙන් ප්‍රකාශ නොවන බව ද, සියලු ලෝක ධර්ම විෂයයෙහි, අක්‍රමවත් භාවයක් නො ව, නියම ක්‍රමවත් භාවයක් ම පවත්නා බව ද මින් වටහාගත හැකි ය. මේ සාධක හෙවත් පුරුක් මෙසේ යි;

අවිද්‍යාව හේතු කොට ගෙන සංස්කාර (කර්මපිණ්ඩ) උපදී; ඉන් විඥානය උපදී (මේවා අතීතයට අයිති ය); විඥානය හේතුකොට ගෙන නාම - රූප හෙවත් චෛතසික සහ ද්‍රව්‍යාත්මක ස්වරූපය හටගනියි; ඉන් සළායතන ද, ෂඩායතනයෙන් ස්පර්ශය ද හටගනියි. ඉන් වේදනා ද, වේදනාවෙන් තෘෂ්ණාව ද, තෘෂ්ණාවෙන් උපාදානය ද, උපාදානයෙන් භව ද හටගනියි. (මේවා වර්තමානයට අයිති ය); භව හේතුවෙන් ජාති ද, එයින් ජරා-මරණ ද දුක්ඛ දොමනස්ස ද හටගනී. මෙ පරිද්දෙනි, අවිද්‍යාවෙන් මේ මහත් දුක්ඛස්කන්ධය ඇතිවන්නේ. අවිද්‍යාව සිඳ දැමිය හැකි නම් මේ සියලු ක්‍රියා පද්ධතිය පියවරින් පියවර අත්හිටියි. දෙවැනි ආර්යය සත්‍යය ඒ පිළිබඳ ව යි; ඒ දුක්ඛය උපුටා ලෑමය, පහ කිරීමට සහ නවතාලීමට යි.

අපි දැන් තෙවැනි ආර්යය සත්‍යය වූ දුක්ඛ නිරෝධයට බසිමු. මේ නිර්වාණය යි. මේ පිළිබඳ ව ලියා ඇති ග්‍රන්ථ සංඛ්‍යාව අප්‍රමාණ ය. කොටින් කිවහොත් නිර්වාණය යමෙක ප්‍රතිඵලයක් සේ හට ගැනෙන්නක් නොවේ. එය අවිජ්ජාව සහ තණ්හාව නැසූ කල නිරායාසයෙන් ම ඇති වන ප්‍රතිඵලයක් ද නොවේ. පාළි බෞද්ධ ග්‍රන්ථ අනුව, කවර කරුණක් හේතුකොට ගෙන වත් නූපදින්නා වූ ද, නො හටගැනෙන්නා වූ ද - එක ම ධර්මය - අහේතුක වූ ද, අනිර්මාණක වූ ද, අසංස්කෘත වූ ද එක ම ධර්මය නිර්වාණය යි. නිර්වාණය පවතී (අර්ථය); භක්තිමත්, උද්‍යොගවත්, අධිෂ්ඨානයෙන් යුත් අපේක්ෂකයාට කළ හැකි එක ම දෑය නම් එය අවබෝධ කොටගැනීම යි. නිර්වාණය අවබෝධ කළ තැනැත්තකු මිය ගිය කල, ඔහු ගේ යැයි කිව හැකි කිසිවක් ඉතිරි නො වේ නම්, ඒ නිවන් සුවය භුක්ති විඳින්නේ කවරෙක් ද යි යන්න බොහෝ විට අසනු ලබන ප්‍රශ්නයෙකි. මේ සැබැවින් ම, අනුචිත යි. නිර්වාණය නම්, යමකු මළ කල භුක්ති විඳිය හැකි තත්ත්වයක් - යහපත් ශික්ෂණය නිසා අත් කරගනු ලබන ත්‍යාගයක් - සේ නො ගිණිය යුතු ය. වඩා උචිත ප්‍රශ්නය මෙය යි; මේ දැන්, මෙහි දී, නිවන පසක් කරන්නේ කවරෙක් ද? පිළිතුර නම්; භාවනාවෙහි මනා නිපුණත්වයක් දරන්නා යනු යි; මේ අත්බැවෙහි දී වුව නිවන පසක් කරන්නා හෙතෙමේ යි.

සිව් වැනි වූ දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය නිර්වාණ අවබෝධය සඳහා අනුගමනය කළ යුතු මාර්ගය ද ක්‍රමය ද පහදා දෙයි. මේ සම්‍යක් දෘෂ්ටි, සංකල්ප, වාචා, කර්මාන්ත, ආජීව, ව්‍යායාම, සති සහ සමාධි යන දෑයින් සමන්විත වූ ආර්යය අෂ්ටාංගික මාර්ගය හෙවත් මධ්‍යම ප්‍රතිපදාව යි. මේ කරුණු අට ම විස්තර කිරීමට දැන් මම නොඑළඹෙමි. එහෙත්, මජ්ඣිම නිකායේ සූත්‍රයෙක (L 301) දැක්වෙන අයුරින් මෙන්, ඒවා කොටස් කළ හැකි යි. මින් බෞද්ධ ප්‍රතිපත්ති ශාසනයෙහි ප්‍රධාන අංග තුන ඉස්මතු වී පෙනෙන්නට වූ හෙයින් මහත් යහපතක් ලෙස සලකනු හැකි යි. මෙසේ, සම්‍යක් වාචා, කර්මාන්ත සහ ආජීව යන තුන ''ශීල'' සේ කොටස් කළ හැකි යි. එහි, යටත්පිරිසෙයින් හෝ ගැනෙන පංච ශික්ෂා පද බෞද්ධ ප්‍රතිපත්තියේ ඉතා මූලික පදනම යි; එය නොමැති ව කිසිදු චෛතසික හෝ ආධ්‍යාත්මික හෝ සංවර්ධනයක් ඇති විය නො හැකි යි. මේ ශාරීරික සහ වාචික ශික්ෂා පද හෙවත් පොරොන්දු පහ නම් ප්‍රාණඝාතයෙන්, සොරකමින්, කාම මිථ්‍යාචාරයෙන්, මුසාවාදයෙන් සහ සුරාපානයෙන් වැළැකී සිටීම යි. මේ සදාචාරය ලබාගන්නා ශ්‍රාවකයාට සම්‍යක් ව්‍යායාමය, සතිය සහ සමාධිය මනාව පුහුණු කිරීමට හැකි වේ. මේ තුන සමාධි හෙවත් චිත්ත යනුවෙන් කොටස් කළ හැකි යි. චිත්තේකාග්‍රතාව, චෛතසික ශික්ෂණය සහ පාලනය යන අර්ථ ඇති එය ප්‍රතිපත්ති ශාසනයේ දෙ වැනි ප්‍රධාන අංගය යි. ශ්‍රාවකයකු සිය සිත පාලනය නො කරමින් සිය සිතට තමා පාලනය කරන්නට ඉඩ සලසා නම්, ඔහුට ප්‍රතිපත්ති ශාසනයේ තුන් වැනි අංගය

වූ ප්‍රඥාවට පිවිසීම අපහසු වෙයි. මේ 'ප්‍රඥාව' නම් බාහ්‍ය - ඓන්ද්‍රීය වූ ද, අප්‍රයෝග - සිද්ධ වූ ද ප්‍රඥාව යි. සම්‍යක් දෘෂ්ටියෙන් සහ සම්‍යක් සංකල්පයෙන් යුක්ත වූ එය තමා, සියලු සංස්කාර ධර්මවල නියම 'තථ' ස්වභාවය හඳුනා ගැනීමට ප්‍රතිෂ්ඨා පිණිස පවත්නේ ය. පුළුල් ව සලකහොත්, 'මම ය මා ගේ ය' යන සියලු හැඟුම් නැති වූ කල ද, සියලු ජීව වස්තු කෙරෙහි මෛත්‍රිය, කරුණාව සහ අහිංසාව පිළිබඳ අදහස් පතුරා හළ කල ද සම්‍යක් සංකල්පය පවතිතැ'යි කිව හැකි ය. එ බඳු සංකල්ප කොටස් කරනු ලබන්නේ ප්‍රඥාව යටතෙහි බව සැලකිය යුතු කරුණෙකි. සම්‍යක් දෘෂ්ටියෙහි සාරය නම් චතුරාර්ය සත්‍යාවබෝධය යි. මින් අදහස් වන්නේ ඒවා ද එහි අන්තර්ගත කරුණු ද නුවණින් විමසා වටහා ගැනුම පමණක් නො වේ. ඒ අවබෝධය නම් ඒවා විනිවිද දැකුම යි, නියම ස්වභාවය තියුණු දැක්මෙන් වටහා ගැනුම යි, ප්‍රතිවේධය යි. බුද්ධ ධර්මයෙහි කෙටි මං නො පවතී. මාර්ගයෙහි හැම පියවරක් ම ගත යුතු ය; ප්‍රකාශ වී පවත්නා පිළිවෙළ අනුව වුව ද, ඒ හැම හා ආශ්‍රිත ප්‍රතිපත්ති ඉතා දැඩිව පිරිය යුතු යි; මේ සිව් වැනි සත්‍යය පිළිබඳ අප කළ යුත්තේ ඉන් දැක්වෙන සියලු අංග ප්‍රතිපත්ති බවට හරවා ගැනීම යි.

යම් යහපතක් කළ යුත්තේ ඒ යහපත කිරීම උදෙසා ම යැ'යි කල්පනා කිරීම ප්‍රමාණවත් නොවන බව පාළි පිටකයේ නොයෙක් තැනින් පැහැදිලි වේ. පෞද්ගලික ප්‍රයත්නයේ අවසන් අරමුණ කිසිසේත් එය නොවේ. සදාචාර ප්‍රතිපත්ති පුහුණුව එය සාදා ගැනුමේ මාධ්‍යයක් පමණි. එ සේ වුව ද, චෛතසික වර්ධනය සහ චෛතසික පාලනය ක්‍රියාවේ යොදන අතර ම, පරමාර්ථ තත්ත්වය වූ නිර්වාණය අවබෝධ කිරීමෙහි ලා එය ද අවශ්‍ය වෙයි.

ශීල, සමාධි, ප්‍රඥා යන අංගත්‍රය නිර්වාණාවබෝධ මාර්ගය සාදා ගැනුමෙහි ලා ප්‍රයෝජනවත් ය (S i. 105). ඒවා එකට ගත් කල, මනුෂ්‍යයකුගේ ක්‍රියා පිළිවෙළ, කතා-බහ, ජීවනෝපාය චෛතසිකය සහ උපරි-විඥානය පිරිසිදු කරයි. මේ පාරිශුද්ධිය සන්සුන් බව යි, විමුක්තිය යි. ''මහ සයුර එක ම ලුණු රසින් යුක්ත වන්නා සේ ම, ධර්මය ද එක ම විමුක්ති රසයෙකින් යුක්ත යි.'' ඉතින් අවසානයෙහි, පුද්ගලයෙක් භවසංයෝජන සිඳ, ස්වකීය ආත්ම දමනය කොට, සියලු විජයග්‍රාහකයන් අතුරින් ශ්‍රේෂ්ඨතමයා ව සිටියි. එය යුද බිමෙහි දී දස ලක්ෂයක් යෝධයන් පැරදවූවාට වඩා උසස් ය (ධම්මපදයඃ 103). මෙ සේ සිටින හෙතෙමේ දුක සහමුලින් සිඳ ලෑම පිළිබඳ අවබෝධයේ අතිපවිත්‍ර ප්‍රඥාවෙන් යුක්ත ව පසු වෙයි. සත්‍යය මත පිහිටි මේ විමුක්ති සුවය සෙල්විය නො හැකි යි. කුමක් නිසා ද? මේ ශ්‍රේෂ්ඨතම පවිත්‍ර සත්‍යය උපතක් නැති, ජරාවක් නැති, මරණයක් නැති නිර්වාණය ම (M. iii. 245) නිසා යි. ථෙරවාදය අනුව, කාම-වෙදනා අරභයා පවත්නා කාමතෘෂ්ණාවෙන් බැඳී ඇති සංසාරයට ප්‍රතිවිරුද්ධ ව යි, නිර්වාණය පවත්නේ. කාම ආයතන මේ ලෝකය විෂයෙහි ද මේ කාලය විෂයෙහි ද පවත්නා සේ ම පරම සත්‍යය වූ ඒ උදාර 'ධර්ම' ද මේ ලෝකය විෂයෙහිත් මේ කාලය විෂයෙහිත් පවතියි. එය ලබාගත හැක්කේ කාම-වේදනාවල බලපෑමෙන් නිදහස් වුණා වූ ද, සංයෝජනවලින් මිදුණා වූ ද සිතක් ඇත්තකුට ය. මේ විමුක්ති සුවය කැමැත්තාට මුලින් ආචාර්යවරයකු යටතේ පුහුණු කළ යුතු, භාවනානුයෝගී ක්‍රම රැසක් අවශ්‍ය වෙයි. බාහිර ලෝකය පිළිබඳ ඔහු ගේ ආශාව යම් පමණෙකින් අඩු වන කල, ඔහු ගේ ආභ්‍යන්තරික ලෝකය, ඒ පමණින් ම විස්තාරණය වන්නේ ද, එහි, ඔහුට අයත් වන ස්වාමීත්වය මුහුකුරා යන්නේ ද මේ භාවනානුයෝගී ක්‍රම නිසයි. පුද්ගලයකු වශයෙන් එ බඳු සම්පූර්ණ පවිත්‍රතාවක් ලබා සිටින්නා වූ ද, පහත් කම් සැප සහ වෙනස් වන සුලු, ව්‍යාජ වූත් ප්‍රීතීන් කෙරෙහි බැඳී උපාදානයෙන් සහමුලින් ම මිදී සිටින්නා වූ ද උත්තමයාණෝ ''රහත්'' නමින් හැඳින්වෙති. අවසාන ද්‍රව්‍යමය ස්වරූපය දරන කෙනකු සේ සැලකිය හැකි උන්වහන්සේ ''කවර තැනෙකවත්, කවර දෑයෙක වත්, බින්දු මාත්‍රයෙන් වුව'' (M. iii. 45) නො රැඳී සිටීමට තරම් විමුක්ති සුවයක් විඳින සේක.

<u>1961.02.18</u>

# 02

# විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය හා බෞද්ධ පුනර්ජීවනය

## ආචාර්ය සිථු තිං අවුං

ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලය මගින් පිරිනමන ලද ශාස්ත්‍රසූරී උපාධිය හේතු කොට ගෙන මේ අවස්ථාවේදී මම අසීමිත ප්‍රීතියකට පත්ව සිටිමි. ගරු අග්‍රාණ්ඩුකාරතුමාගේ අතින් ම එම උපාධිය ලැබීමෙන් හා අද දින මහා සංඝරත්නයෙන් ද රාජ්‍ය පරිපාලකයන් ගෙන් ද සම්භාවනීය උතුමන්ගෙන් ද ශ්‍රේෂ්ඨ විද්වතුන්ගෙන් හා ශිෂ්‍යගණයා ගෙන් ද සමන්විත මෙම සම්භාවනීය උත්සව සභාව ඇමතීමේ භාග්‍යය හිමි වීමෙන් මාගේ ඒ ප්‍රීතිය ද්විගුණ වේ.

ශ්‍රී ලංකා රාජ්‍යය සමග අවුරුදු දෙදහසකට අධික කාලයක් ඉතා කිට්ටු සම්බන්ධයක් ඇති රටක නියෝජිතයෙකු වශයෙන් ඔබ අතරෙහි පෙනී සිටීමේ ගෞරවය ද ලැබීම මට මහත් ආඩම්බරයකි. දෙරටට ම පොදු වූ ශ්‍රේෂ්ඨ ආගමක් ද සංස්කෘතියක් ද තිබීම අන්‍යෝන්‍ය සම්බන්ධයට බෙහෙවින් හේතු විය. ලංකාව සහ බුරුමය යන දෙරටෙහි පිහිටීම අනුව ප්‍රචණ්ඩ සමුද්‍රයකින් වෙන් වී තිබුන ද, බෞද්ධාගමත් බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදායත් හිතමිත්‍ර දෙරට සම්බන්ධ කරන රනින් හා රිදියෙන් කළ සේතුවක් වැන්න. නැතහොත් ඈත අතීතයෙහි පටන් දෙරට අතරෙහි වූ සමුද්‍රය තරණය කිරීමට උපයෝගී කරගත් පටපිළියෙන් කළ රුවලක් නැංවූ ධවල නෞකාවක් වැන්න.

පවුලේ ඉතිහාසය අනුව මාගේ පරම්පරාවට නෑ සබඳකම් ඇති අයෙක් බුරුම අධිරාජයාගේ නියෝජිතයෙකු වශයෙන් දොළොස්වන සියවස පමණේ දී හීලෑ කරන ලද ඇතුන් තුන්දෙනෙකු-ගෙන් යුත් පරිත්‍යාගයක් ද රැගෙන මෙම දිවයිනට පැමිණ තිබේ. එසේ ම දහතුන්වන සියවස පමණේ දී නිර්මල බුදු දහම සොයා ආ මාගේ මුත්තනු කෙනෙක් මෙහි ම පැවිදි උපසම්පදා ලැබ ඔබ මහා සංඝයා වහන්සේ කෙරෙන් තෙවළා දහම් හැදෑරූ බව ද මෙහි ලා සඳහන් කරමි. එම වටිනා පාරම්පරික සිරිත ආරක්ෂා කිරීමක් වශයෙන් දෝ මම ද ඔබ හමුවට පැමිණියෙමි. මාගේ ඒ මුතුන්මිත්තන් මෙන් පුද පඬුරු වශයෙන් හස්තීන් නොගෙනාවත්, පැවිදි උපසම්පදා ලැබීමට තරම් වාසනා ශක්තියක් හා සුදුසුකමක් මට නැතිවුවත් අද දින මා ද මෙහි පැමිණියේ සත් සියවසකට පමණ ප්‍රථම ගරු මහා සංඝරත්නය විෂයෙහි ද ලාංකික විද්වතුන් කෙරෙහි හා සාමාන්‍ය ලක් ජනතාව කෙරෙහි ද භක්ත්‍යාදරපූර්වකව පැමිණ ඒ මාගේ දයාබර මුතුන් මිත්තන්ගේ අඩිපාරේ ගමන් කරමිනි.

බුරුම දේශ වැසියෙකු හෝ බෞද්ධයෙකු වශයෙන් පමණක් නොව තම තරුණ ජීවිතය උසස් බටහිර විශ්වවිද්‍යාලයවල ගතකොට ජීවිතයේ ස්වර්ණමය කාලය තම ජාතියේ අධ්‍යාපනය උදෙසා කැපකළ අයෙකු වශයෙන් අද සිට ඔබ විශ්වවිද්‍යාලයයේ උපාධිධරයෙකු වීමට ලැබීම මාගේ මහත් භාග්‍යයකි.

මෙම විශ්වවිද්‍යාලයයේ අධ්‍යාපනය වූකලී ඉතා උසස් සම්ප්‍රදායානුකූල බෞද්ධ අධ්‍යාපනයේ ද ඉතා පුළුල් බටහිර අධ්‍යාපන සම්ප්‍රදායයේ ද සම්මිශ්‍රණයෙකි. මෙම විශ්වවිද්‍යාලය අනාගතයේ දී, යුදබිය වලා පටලවලින් ද පරමාණු විෂ බෝම්බවලින් ද ජාත්‍යන්තර අවිශ්වාස බව හා වෛරයෙන් ද සාමාජික ආර්ථික වෙනස්වීම්වලින් ද අඳුරු වූ ලෝකයක මඟපෙන්වන ප්‍රදීපස්තම්භයක් බවට

පත්වෙනවා නො අනුමානය. අප ජීවත් වන මෙම යුගය දීප්තිමත් මනුෂ්‍ය ඉතිහාසයක විජයග්‍රාහී යුගයක් වුව ද එය නොඑක් දුක් දොම්නස් කම්කටොලුවලින් පිරී තිබේ.

දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු ලෝකයේ බොහෝ ජාතීහු තම වහල් බැමි සිඳ ස්වාධීනත්වය ලබා යටත් විජිතවාදය නැමැති බිහිසුණු සිහිනය අමතක කොට ආලෝකමත් උදෑසනක පහන් එළිය දුටහ. එහෙත් ස්වාධීනත්වය ලැබූ මෙම නව රාජ්‍යයන්හි මෙම ආලෝකමත් උදෑසන, සමාජ විප්ලව සහ ආර්ථික වෙනස්වීම් පසුපසින් ආ දුක් කරදර හේතුන් නිසා තවමත් ආලෝකමත් දවසකට පරිවර්තනය නොවීය. මේ යුගයෙහිම නවීන විද්‍යාව ලැබූ විශිෂ්ට දියුණුවේ හේතුවෙන් මිනිසා පරමාණුව පිළිබඳ රහස සොයා දැන ගත්තේය. එහෙත් එම පරමාණු බලය සුවච මෙහෙකරුවෙකුසේ මනුෂ්‍යයාගේ සේවය සඳහා පාලනය විය යුතුව තිබිය දී එය ම රොස් පරොස් පතාක යෝධයෙකුගේ විලාසයෙන් තම කෲරබලයෙන් හා න්‍යෂ්ටික විෂවායුවෙන් මුළු මිනිස් සංහතියම විනාශ කිරීමේ තත්ත්වයකට පත්ව තිබේ.

බෞද්ධ වූ අපට ද බුදුරජාණන් වහන්සේ සහ උන්වහන්සේගේ නිර්මල ධර්මය උසස් ලෙස සලකන අබෞද්ධ ජනතාවට ද දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව ඇති වූ අවිනිශ්චිත බිහිසුණු අන්ධකාර තත්ත්වය දෙදහස් පන්සියයේ බුද්ධ ජයන්තිය සමඟ උදා වූ බෞද්ධ පුනර්ජීවය නැමැති ආලෝකයෙන් පහ වී යාමට ඉඩ ඇති බව පෙනීම ලෝකාභිවෘද්ධිය පතන අප කාගේත් ඉමහත් සැනසිල්ලට හේතුවකි. මෙම පුනර්ජීවය විශේෂයෙන් අග්නිදිග ආසියානු රටවල පැහැදිලිව කැපී පෙනෙන බව ප්‍රකාශ කළ යුතුයි. බුද්ධ ධර්මයේ මූලික පදනම වූ මෙත්තා, කරුණා, උපෙක්ඛාදී ගුණයෙන් අවිද්‍යාන්ධකාරයෙන් වැසීගත් ලෝකයාට අවශ්‍යයෙන් ම හිමි විය යුතුයි.

යුරෝපා දේශයේ භෞතික වාදය තදින් බලපැවැත් වූ එකුන්විසිවන සියවසේ දී පවා ඉහත සඳහන් මෙත්තා කරුණාදී ගුණ සමුදායෙන් වශීකෘත බටහිර ප්‍රාඥයින්ගේ සිත් බුද්ධ ධර්මය කෙරෙහි යොමු වීම නොඉවසූ භෞතික වාදයේ පුරෝගාමියෙකු වූ ෆෙඩ්රික් නිට්ෂේ (Friedrich Nietzche) නමැති චින්තකයා ''නව බුද්ධ ධර්මයක තර්ජනයක් යුරෝපයට එල්ල වී තිබේ'' යයි රොසින් මෙන් ප්‍රකාශ කළේය.

විසි වෙනි සියවසේ ලොව පහළ වූ ශ්‍රේෂ්ඨතම චින්තකයා වූ බර්ට්‍රන්ඩ් රසල් නම් මහා දර්ශනවාදියා ''බටහිර දර්ශන වාදයේ ඉතිහාසය'' නමැති ග්‍රන්ථයේ නිට්ෂේ විසින් හඳුන්වනු ලැබූ බලය හා ශක්තිය පිළිබඳ මිථ්‍යා දර්ශනයත් බෞද්ධ දර්ශනයත් අතර ඇති විසමතාව විවේචනාත්මකව දක්වමින් මනඃකල්පිත බුද්ධ ස්වරයකින් මෙසේ ආමන්ත්‍රණය කරණු ලැබීය. ''නැපෝලියන් සහ ඇලිසිබියඩිස් (Alcibiades) වැන්නවුන් කෙරෙහි මාගේ විශේෂ ප්‍රසාදයක් නොමැති බව ඇත්තකි. එහෙත් මාගේ ද ගෞරවාදරයට පාත්‍රවූ වීරෝදාර පුද්ගලයෝ සිටිති. වෛර කරන්නවුන්ට මෛත්‍රිය කරවයි දේශනා කළ මට පසුව ලොව පහළ වී වදාළ ජේසු ස්වාමි දරුවෝ ද ස්වභාව ධර්මයේ නොයෙකුත් බලවේග යන් මැඩ ඒවා තම පාලනයට ගෙන අල්පශ්‍රමයෙන් ආහාර ද්‍රව්‍යය නිපදවීමට සමත් වූ පුද්ගලයෝ ද, රෝදුක් වූපසමනය කිරීමේ මාර්ග සොයාගත් වෛද්‍යවරයෝ ද... කරුණාව... ප්‍රඥාව... මොවුහු අභාවිකත්වය නොහඟවති. මෙම ගුණයෝ ලොව පහළ වන ශ්‍රේෂ්ඨතම පුද්ගලයන්ගේ වුව ද ජීවිත සරුසාර කොට ඒවා අර්ථවත් කිරීමට පොහොසත් වෙත්. රසල් සාමිතුමා බෞද්ධයකු නොවන හෙයින් එතුමාගේ මනඃකල්පිත වාඩ්මාලාවේ බුදුරජාණන් වහන්සේගේ ආගෞරවයට හෝ කෙලෙසීමකට හේතුවන යම් අදහසක් වේ නම් ඒ පිළිබඳව එතුමාට සමාව දිය යුතුයි. කරුණු මෙසේ වුව ද එතුමාගේ ග්‍රන්ථයේ අවසාන භාගයෙන් උපුටා ගන්නාලද පහත දැක්වෙන පාඨයෙන් බුද්ධ ධර්මය කෙරෙහි එතුමා තුළ තිබූ අචල ශ්‍රද්ධාව හා භක්තිය මනාව පැහැදිලි වේ.

''මාගේ වැටහීමේ ප්‍රමාණය අනුව බුදුරජාණන් වහන්සේගේ ධර්මය මම පිළිගනිමි. එහෙත් එම ධර්මයේ සත්‍යතාව ගණිත මිණිත විද්‍යාදි විෂයන් මෙන් තර්කන්‍යායාදියෙන් ඔප්පු කිරීමට අසමත්මි. ලොව මනුෂ්‍යඝාතනය නැතිකොට එමගින් විශ්වකීර්තියක් හිමිකර ගැනීමට තැත් කරණ පාපතර ජයග්‍රාහකයන් වීරයන් වශයෙන් සලකන නිට්ෂේගේ අදහස් මම පිළිකුල් කරමි. ඔහු ලොව සියලු සත්ත්වයන් වෙත පැතිර වියයුතු මහා කරුණා මෛත්‍රියාදි ගුණ හෙළා දකියි. ලෝකය පිළිබඳ මාගේ බලාපොරොත්තු මුදුන්පත් කර ගැනීමේ ඒකායන ගුණ මාර්ගය මෛත්‍රියයි. පසු කාලවල ඇතිවූ නිට්ෂේගේ ශ්‍රාවකවරු තම කර්තෘවරයාගේ අදහස් ව්‍යාප්ත කරලීමට වෙහෙසුනු නමුදු එම උත්සාහය ඉක්මනින් අසාර්ථක වීමේ සලකුණු අපට පෙනෙන්නට තිබේ.''

තෙවසකට පෙර මෙම විශ්වවිද්‍යාලය ආරම්භ කළ අවස්ථාවේදී මෙහි අනාගතය ගැන සැක පළකළ අය ද සිටියහ. මෙම විශ්වවිද්‍යාලය විවේචනයට ලක්කළවුන් පළමුවෙන් කියා සිටියේ එය පැරණි පිරිවෙන් සම්ප්‍රදාය ද වර්තමාන අපරදිග විශ්වවිද්‍යාල පරිපාලන ක්‍රමය ද සංකලනය කරණ අස්වාභාවික වූ අළුත් පන්නයක ආයතනයක් බවය. දෙවනුව, මෙහිදී දීමට බලාපොරොත්තු වන ආගමික හා ලෞකික කරුණු පිළිබඳ අධ්‍යාපනය තෙලත් ජලයත් මිශ්‍ර නොවන්නාක් සේ කිසි සේත් සම්මිශ්‍රණය නොවන බවත්ය. විශ්වවිද්‍යාලය සම්ප්‍රදාය වූකලී බෞද්ධ අධ්‍යාපනයට ද පාණ්ඩිත්‍යයට ද නුහුරු වූ පෙර නොවූ විරූ නවීන දෙයකැයි යන මිථ්‍යා මතයෙහි මෙම විචාරකයෝ එල්බ සිටියහ. මෙය මෙසේ නොවෙනවා පමණක් නොව සෑම බෞද්ධ රටක ම ශතවර්ෂ ගණනාවක් තුළ බාල මහලු සැමගේ අධ්‍යාපනය බෞද්ධ භික්ෂූන් වහන්සේ අතෙහි ම තිබූ බව මෙහිලා ප්‍රකාශ කළ යුතුව තිබේ. නිදසුනක් වශයෙන් බුරුම රට අධ්‍යාපනය ඔබට සිහිකරවමි. උපද්‍රව ගහණවූ කෙටි කාල පරිච්ඡේදය හා බ්‍රිතාන්‍ය යුගය හැර පසුගිය අවුරුදු දෙදහස තුළ බුරුම රට අධ්‍යාපනය බෞද්ධ භික්ෂූන් වහන්සේ සතුව තිබුණි. බුරුම රට දරුවාගේ භක්ත්‍යාදරයට පළමුව පාත්‍රවන ගුරුවරයා බෞද්ධ භික්ෂූන් වහන්සේය. සිය නිවස හැරුණු විට තමාට උගැන්මත් හික්මීමත් ගුණවගාවත් ලද හැකි අනෙක් තැන බෞද්ධ විහාරයයි. දනුදු බුරුම බසින් ''පාසල'' යන්නෙන් ''බෞද්ධ විහාරය'' අදහස් කෙරේ. බ්‍රිතාන්‍ය යුගයෙහි පවා බුරුම දරුවනට එකල අලුතෙන් පිහිටුවන ලද පාසල්වලට යාමට සිදුවුව ද ඔවුන් පොහෝදින සහ නිවාඩු දින ගත කළේ තම ගෙවලට නුදුරින් පිහිටි විහාරාරාමවල ය. තව ද බුරුම ළමයා ස්වල්ප කලකට වුව ද සසුන්ගත වීමේ චිරාගත සම්ප්‍රදායය අදද අඛණ්ඩව පවතී. එහෙයින් බුරුම රට ප්‍රාථමික අධ්‍යාපනය බෞද්ධ භික්ෂූන් වහන්සේ අතට නැවත පත් කිරීමට බුරුම රජය තීරණය කිරීම විස්මයට කරුණක් නොවේ. උසස් අධ්‍යාපනයත් බෞද්ධ ධර්මයත් අතර ඇති සම්බන්ධතාව බුරුම බසෙහි විශ්වවිද්‍යාලයට දී ඇති නාමයෙන් පිළිබිඹු වේ. බුරුම බසින් විශ්වවිද්‍යාලය හඳුන්වනු ලබන්නේ ''තෙක්කථො'' යන්නෙනි. ''තෙක්කථො'' යනු කලක් උතුරු ඉන්දියාවෙහි ශ්‍රේෂ්ඨතම බෞද්ධ විද්‍යාපීඨය වූ ''තක්කසිලා'' විශ්වවිද්‍යාලයට දී තිබෙන බුරුම පර්යාය නාමයයි. අගනුවර ''තක්කසිලා'' වෙහි උගැන්ම ලබා දඹදිව හෝ ලක්දිව ''තෙක්කථොවකට'' යන බුරුම තරුණයන් ගැන බුරුම රට ජනකථා පුරාවෘත්ත සහ සාහිත්‍යය යන සියල්ලෙහි නොයෙක් තැන සඳහන් වී ඇත. මෙසේ ගිය බුරුම ජාතිකයෝ පැවිද්දෝම නොවූහ. බෞද්ධ පොතපත හැදෑරීම ජොතිෂ්ශාස්ත්‍රය වැනි ලෞකික විෂයයන් හැදෑරීම ද මොවුන් විසින් කරණ ලදී.

ශ්‍රේෂ්ඨ බෞද්ධ විශ්වවිද්‍යාල ප්‍රාග් අසෝක යුගයෙහි ද කෙසේ වුවත් ප්‍රතාපවත් අශෝක අධිරාජ සමයෙහි බිහි වී පළමුවෙනි සහ දසවැනි සියවස් අතර කාලවල ස්වර්ණමය යුගයකට පා තැබූ බව කිව හැක. දේශාටනයේ සහ වන්දනාවේ යෙදුන විද්වතෙකු වන චීන ජාතික යුවාං චාං තුමා සත් වැනි සියවසේ දී චාරිකාවක යෙදී දඹදිව නාලන්ද විශ්වවිද්‍යාලයය පිළිබඳව සියැසින් දුටු දේ

පළකරණ පැහැදිලි විවරණයක් සපයා ඇත. යුවං චාං තුමා ක්‍රි:ව: 636 දී නාලන්දාවට පැමිණීමට පෙර එතුමාගේ ශ්‍රද්ධාව ගැන ද, චීනයේ සිට දඹදිවට ගොඩබිමින් යාමෙහිදී මුහුණ පෑ යුතු අනන්ත කම්කටොලු ද නොතකා චාරිකාවේ යෙදීමේ එතුමාගේ ස්ථිර අධිෂ්ඨානය ගැන ද අභ්‍යුද්ගත කීර්තිය දඹදිව ද පතළ වී තිබුණි. එහෙයින් නාලන්දාවට පැමිණෙන එතුමා පිළිගැනීම සඳහා විශිෂ්ට ප්‍රමුඛාචාර්ය භික්ෂූන් වහන්සේලා සිවුනමක් ද, දෙසියයක් පමණ වූ අන්‍ය භික්ෂූන් වහන්සේ ද දහසක් පමණ ගෘහස්ථයන් ද ඔසවන ලද ස්වර්ණච්ඡත්‍ර ධජපතාකයෙන් හා මාලා ගන්ධාදියෙන් යුක්තව පෙර ගමන් කළ බව ප්‍රකට කරුණකි. විශ්වවිද්‍යාල භූමියට පිවිසි එතුමෝ තපොවෘද්ධ වයොවෘද්ධ අතිශය විද්වත් විශ්වවිද්‍යාලයාධිපතීන් වහන්සේ විසින් පිළිගනු ලැබූහ. මෙම විශිෂ්ට ආගන්තුකයන් වෙනුවෙන් විශ්වවිද්‍යාලය විහාරයක සෙනසුන් නියමකොට ඔහුගේ යැපීමට අවශ්‍ය ධාන්‍ය සලාකයක් ද වෙන් කරණ ලදි. අවට පිහිටි විහාරාරාම විශ්වවිද්‍යාලය ආදියට ගමන් කිරීම සඳහා ඇත් ගොව්වන් දෙදෙනෙකු සහිතව ඇතෙක් ද මෙතුමාට දෙන ලදි. එකල නාලන්දාව වූකලී ආදියෙහි පන්සියයක් පමණ වෙළඳ දෙටුවන් විසින් අප භාග්‍යවතුන් වහන්සේට පූජා කරණ ලද විහාරයකින් ඇරඹී පසුව ශත වර්ෂ ගණනාවක් තුළ ශ්‍රද්ධාසම්පන්න ත්‍යාගශීලීන් විසින් ගොඩනගන ලද විහාරයක සකස්වූවකි. යුවාංචාං තුමා පැමිණි විට නාලන්දාවෙහි ගොඩනැගිලි ගණනාවක් ද රණින් රුවනින් අලංකෘත ශතාධික ධාතුමන්දිර සංඛ්‍යාවක් ද තිබුණි. මෙකල ව්‍යවහාරය අනුව විශාල විශ්වවිද්‍යාලය (කැම්පස්) භූමියක් ද සෙවන ගෙන දෙන උපවන ද, රම්‍ය තණබිම් සහ උයන්වතු ද නිශ්චල ජලයෙන් පිරි පොකුණු තටාක ආදිය ද මෙහි විය. අතිශය විශාල නේවාසිකාගාර හයක් ද විය. ගුරු ශිෂ්‍ය දෙපක්ෂයට ම එක් රැස්ව සිටිය හැකි චතුරශ්‍රයන් වටා අධයන, පරිපාලන සහ නේවාසික ශාලා ගොඩ නංවා තිබුණි. එහි තිබූ පුස්තකාලවල රැස්කර තිබූ ග්‍රන්ථ සංඛ්‍යාව දැක යුවාංචාං තුමා විස්මයට පත් වූ බව කියනු ලැබේ. තවද මෙහි කථාශාලා සියයක් ද විය. සෑම ශාලාවක ම ප්‍රමුඛාචාර්යවරයෙකු සඳහා වෙන් වූ ධර්මාසනයක් ද විය. විශ්වවිද්‍යාල ප්‍රවේශය ලැබ පඬික්තිවලට පැමිණීම සඳහා වූ සවිස්තර නියෝගාවලියක් ද, විශ්වවිද්‍යාල විනයනීති උල්ලංඝනයට දඬුවම් පැනවූ විනය නීති මාලාවක් ද තිබුණි. ගුණ නැණ දෙකින් හීන ශිෂ්‍යයෝ බොහෝ විට විශ්වවිද්‍යාලයෙන් අස්වූහ. ඇතමෙක් විශ්වවිද්‍යාල පාලක මණ්ඩලය මඟින් ම පහළ පඬික්තිවලට යවන ලදහ. ප්‍රධාන වශයෙන් උගන්වන ලද්දේ බෞද්ධ ත්‍රිපිටකය වුව ද ගණිතය, ජ්‍යොතිඃශාස්ත්‍රය, භූගෝලවිද්‍යාව, වෛද්‍යශාස්ත්‍රය සහ රාෂ්ට්‍ර පාලනය වැනි ලෝකීය ශාස්ත්‍රවලට ද තැනක් මෙහි හිමිවිය.

මෙකල ලක්දිව සහ බුරුමයේ බෞද්ධ විහාරවල මෙන් ශිෂ්‍යයන් විසින් ධර්ම පාඨ සජ්ඣායනයද ආචාර්යවරයාගේ සාරගර්භ දේශන ද ගුරු ශිෂ්‍ය දෙපක්ෂයම සහභාගි වන සාකච්ඡා පැවැත්වීම ද මෙහි අධ්‍යාපන පරිපාටියේ ලක්ෂණ විය. ඒ ඒ නිර්දිෂ්ට පාඩම් මාලා සාර්ථක ලෙස නිමකොට උපාධි ලැබීම එහි සිරිත විය. එම උපාධි තුන්වර්ගයක් විය. මෙකල ව්‍යවහාරය අනුව ශාස්ත්‍රපති, ශාස්ත්‍රසූරී වැනි පශ්චාද් උපාධි දෙකක් ද තිබූ බව සිතිය හැක. එකල නාලන්දාවේ නේවාසික ගුරු-ශිෂ්‍ය දෙපක්ෂයේ සංඛ්‍යාව දස දහසකට අධික විය. මොවුනතුරෙන් බහුතර සංඛ්‍යාව වූකලී බෞද්ධ භික්ෂූන් වහන්සේය. එහි සිටි ගිහි ශිෂ්‍යයනට ද පැවිදි ශිෂ්‍යයන් සඳහා වූ දැඩි විනය නීතිවලට අවනත වීමට සිදු විය. මෙහි යෝධ උදක හෝරා යන්ත්‍රයක් ද විය. දිනකට සම්පූර්ණ පැය අටක පමණ කාලයක් අධ්‍යයනාදි වැඩ කටයුතු සඳහා නියම විය. එහෙත් යුවාංචාං හිමියන්ගේ කියමන් අනුව මෙම පැය අටේ කාලය ද දිනට නියමිත වැඩකටයුතු අවසන් කිරීමට ප්‍රමාණවත් නොවූ බව පෙනේ. විශ්වවිද්‍යාලයාධිපතීන් වහන්සේ ද ප්‍රමුඛාචාර්යයන් වහන්සේලා ද පත් කරනු ලැබුයේ ලබන ලද පාණ්ඩිත්‍යය අනුව වේ. බෞද්ධ විහාරය ප්‍රජාතාන්ත්‍රික ආයතනයක් වූ හෙයින් විශ්වවිද්‍යාලයේ පරිපාලනය සඳහා සනාතන සභාවක් ද පාලක සභාවක් ද තිබුණාට සැකයෙක් නම් නැත. නොබෝදා නාලන්දාවේ තිබී සොයාගන්නා ලද පුරාවස්තු අතර නාලන්දා විශ්වවිද්‍යාලයීය සලකුණ දක්වන

මුද්‍රාවක් ද විය. ''නාලන්ද මහාවිහාරික මහා සංඝයා වහන්සේ'' යන සන්නස් වාක්‍යය ද එහි විය. ආගමික සංස්ථාවන් වටා ගොඩනැගුනු පැරිස්, ඔක්ස්පර්ඩ්, කේම්බ්‍රිජ් වැනි උසස් විශ්වවිද්‍යාල අපරදිග රටවල ඇතිවූයේ මුස්ලිම් ආධිපත්‍යයේ මුවහත් අසිපතට අසුවීමෙන් හෝ ගිනිබත් වීමෙන් හෝ විනාශ වී ගිය අප විසින් ඉහත සඳහන් කරන ලද බෞද්ධ විශ්වවිද්‍යාලය නැතිවීමෙන් බොහෝ කලකට පසුව ය. අපරදිග විශ්වවිද්‍යාලයවල උපත සහ ඒවායේ පශ්චාත් කාලීන සංවර්ධනය සිදු වූයේ බෞද්ධ විශ්වවිද්‍යාලයවලට හාත්පසින් වෙනස් වූ අයුරකින් වුව ද සමහර විට ඒවායේ ආදි කර්තෘවරුන්ගෙන් කිසිවෙක් ඒවා ආරම්භ කිරීමට පෙර පැවති බෞද්ධ විශ්වවිද්‍යාලයන් පිළිබඳ ව සේයාමාත්‍රයක දැනීමක් ඇතිව හෝ පුරාවෘතයක් ගැන යම් කිසි හැඟීමක් ඇතිව හෝ වෙන්නට පුළුවන.

බෞද්ධ විහාරස්ථාන විශ්වවිද්‍යාලය තත්ත්වයට වර්ධනය වූයේ කෙසේ ද? පුද්ගලයා සතු නිදහස ගැන බුදුසමය දක්වූ සැලකිල්ල ඉමහති. මෙම නිදහස නොවළක්වන බෞද්ධ විහාරය නිදහස් ව සිතීමට අවකාශ තිබිය යුතු විශ්වවිද්‍යාලයකට පරිවර්තනය වීම පුදුමයක් නොවේ. බෞද්ධාගම අනුව සර්වබලධාරී දෙවිකෙනෙකුගේ කැමැත්තට අපි යටත් නොවෙමු. අපගේ ශික්ෂාපද සමාදානයෙන් කෙරෙනුයේ කිසිවකුගේ අණසකකට යටත් වීමත් නොව සිය කැමැත්තෙන් ප්‍රතිඥාවල බැඳීමයි. ප්‍රාණඝාතයෙන් හෝ අදත්තාදානයෙන් හෝ වැළකෙනුවස් නියෝග කිරීමක් අප ආගමෙහි නැත. එම පාපධර්මවලින් වැළකී සිටීම අප කරන්නේ සිය කැමැත්තෙනි. ''ප්‍රාණඝාත නොම කරව'' යන නියෝගයෙහිත් ''ප්‍රාණඝාතයෙන් වැළකී සිටීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.'' යන ප්‍රතිඥාවෙහිත් ඇති වෙනසින් බුදු සමයෙහිත් අන්‍ය ලබධිවලත් ශීල සමාදානයෙහි ඇති වෙනස පැහැදිලි වේ. මෙසේ සලකන කල නියම බෞද්ධයකු වශයෙන් හැඳින්විය හැක්කේ වැටහීමෙන් තොර ක්ෂණික තීරණයකින් හෝ පසුව වෙනස් විය හැකි උනන්දුවකින් හෝ දහම වැළඳ ගත් තැනැත්තා නොව සාවධානව සිතා බලා නුවණැස මෙහෙයවා එය වැළඳ ගන්නා පුද්ගලයා ය. අප භාග්‍යවතුන් වහන්සේට තම ජීවිතය සේවය සඳහා කැප කළ ඒ හේතුවෙන් ම රහත් බව ලැබීම පවා පමා වූ ආයුෂ්මත් අනඳ මහ තෙරුන් වහන්සේ අමතා යම්කිසි කරුණක් අරබයා කළ එක් ප්‍රකාශයක් සිහියට නැගෙනවිට හුදු ශ්‍රද්ධාව පමණක් අපට ප්‍රමාණවත් නොවන බව පැහැදිලි වේ. ''පාසාදා බො ත්වං ආනන්ද වදෙසි ඤාණමෙව නෙත්ව ආනන්ද තථාගතස්ස'' (''ආනන්දය ඔබ කෙරෙහි ප්‍රසාදය බලපවත්වන අතර තථාගතයන්වහන්සේ කෙරෙහි බලපවත්වන්නේ ඤාණයයි.'')

මෝහාන්ධකාරයෙහි නිමග්නව ඥානය සෙවීමෙහි නියැලි මිනිස් වර්ගයාට නිදහස නැමැති ආලෝකය අවශ්‍ය බව බුදුසමය පිළිගනියි. එකිනෙකට නොගැළපෙන සංකල්පනා නැමැති ඝන වනාන්තරයෙහි සත්‍යය නැමැති මල්බර ලතාමණ්ඩපයට පිවිසිය හැකි නොවරදින මාර්ගය තර්ක මාර්ගයයි. ප්‍රකල්පිත අදහස් සහ චිරන්තන දෘෂ්ටි ද්වේෂයට හා කලහයට හේතු භූත වේ. නිදහස් සාකච්ඡාව හා මෛත්‍රී පූර්වක වාදමාර්ගය සත්‍යාවබෝධයට හා සමඟි සම්පන්නතාවට මං පාදා දෙන අයුරු බුදු දහම පෙන්වා දෙයි.

එහෙයින් සෑම කරුණක් ගැන ම මනාසේ සිතා බැලීම වූ කලී බෞද්ධ ගිහි පැවිදි ගුරු ශිෂ්‍ය සියල්ලන්ගේ ම පරම යුතුකමකි. බෞද්ධ විහාරයේ වැඩ වසන අතිශය නවක භික්ෂුවට පවා තර්ක වාදාදියෙන් සත්‍යය සොයා දැන ගැනීමේ අයිතියක් තිබේ. මේ සියල්ලෙන් වැටහෙනුයේ නිදහසින් යුත් ප්‍රජාතන්ත්‍රවාදී පරිසරයක් බෞද්ධ විහාරයේ තිබුණු බවත් එම විහාරය ක්‍රමයෙන් විශ්වවිද්‍යාල තත්ත්වයට පරිවර්තනය වූ බවත් ය. විශ්වවිද්‍යාලයකින් ඉටුවන ඥානවර්ධනය එකකි. එහි ගොඩනැගිලි ආදී බාහිර සංවර්ධනය අනිකකි. දෙවනුව සඳහන් කරන ලද බාහිර සංවර්ධනය සඳහා රාජරාජ මහාමාත්‍යාදීන් ගෙන් හා ත්‍යාගශීලී භවතුන්ගෙන් ලත් ධන සම්භාරය ඉවහල් වුනි.

පොකුණේ ඇති නිර්මල ජලයෙහිත් එහි ම පුබුදින නෙළුම් මලෙහිත් අන්‍යෝන්‍ය බලපෑමක් ඇතැයි බුරුම ජාතිකයන් අතර කියමනක් ඇත. නෙළුම්මල පරවී අශෝභන වූ විට පොකුණේ ජලය ද කැකෑරී බොරවී යයි. එමෙන් ම මට්ටම නගින ජලයත් සමඟ නෙළුම් මල ද ඉහළ නගියි. මට්ටම බසින ජලයත් සමඟ නෙළුම් මල ද පහත බසියි. බෞද්ධ සමාජයෙහි සුගන්ධවත් නෙළුම් බෞද්ධ භික්ෂූන් වහන්සේයි. ජලය බෞද්ධ ගෘහස්ථයා ය. බෞද්ධ ගෘහස්ථයන් විසින් කළ නොමසුරු ධන පරිත්‍යාගය හේතුකොට ගෙන මෙම ශ්‍රේෂ්ඨ බෞද්ධ විශ්වවිද්‍යාලවල ගුරු ශිෂ්‍ය දෙපක්ෂයට ම සිත් තැවුල් ආදියෙන් තොරව තම අධ්‍යයන කාර්යයන්හි නියුක්ත වීමට ඉඩ ප්‍රස්තා සැලසුණි. ගෘහස්ථයන් විසින් ඒ සා විශාල ධන පරිත්‍යාගයන් කරන ලදදේ ගරුතර මහා සංඝරත්නය ද ගිහි ශිෂ්‍යයන් ද ධර්මානුකූල ජීවිතයකට හැඩගැසුනු ශික්ෂාකාමී බහුශ්‍රැතයන් වූ හෙයිනි.

යට සඳහන් කරුණු අනුව ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලය ද පුරාතන බෞද්ධ විශ්වවිද්‍යාලය පරපුරට අයත් බව පැහැදිලි ය. එම විද්‍යා පීඨයන්ගෙන් අප ලත් අනර්ඝ දායාද අතර සියලු සත්ත්වයන් වෙත පතළ කළ යුතු මෛත්‍රිය, නිදහස හා බහුශ්‍රැත භාවය ද වේ. අප ලබා සිටින එම උරුමය ජනකථාදියෙහි සඳහන් වන රාජ්‍යයක් වටිනා මාණික්‍යකට හෝ අහසින් හා භුගර්භය තුළින් ඍද්ධි ප්‍රාතිහාර්යය දක්වමින් යෑමේ ශක්තියක් දෙන අද්භූත දාර්ශනිකයාගේ පාෂාණයට හෝ වඩා වටනේයි. අනුරාධපුර, තක්සිලා, නාලන්දා යන ස්ථානවල සංවර්ධනය වූ කීර්තිමත් විශිෂ්ට බෞද්ධ විද්‍යාපීඨ අපට ආදර්ශ ස්ථාන විය යුතුයි.

තව ද ශ්‍රී මුඛ දේශනාවෙන් සංගෘහිත වූ උතුම් ත්‍රිපිටකය පවා පළමුව ග්‍රන්ථාරූඪ වූයේ ලක්දිව බෞද්ධ සිද්ධස්ථානයක බව මෙහි ලා සඳහන් කරමි. විසිතුරු ප්‍රාසාද පංතියෙන් හා තපෝවෘද්ධ විද්වත් පුණ්‍යක්ෂේත්‍ර මහා සංඝරත්නයෙන් සමන්විත මෙම විද්‍යෝදය විශ්වවිද්‍යාලය භූමියෙහි එක්සිත් ව, එක්රැස් ව, විනය ගරුක ව බෞද්ධ ධර්මාලෝකය ලොව පැතිර වීමේ පරමාර්ථයෙන් සමෘද්ධිමත් වූ සාමූහික ජීවිතයක් ගතකිරීමට සෑම අතින් ම අවකාශ ඇත. නාලන්දාවේ විසූ ගුරු ශිෂ්‍ය ගිහි පැවිදි සියල්ලන් ම ස්වකීය කාර්යයන් සඳහා නියමිත කාලවේලාව ප්‍රමාණවත් නොවන බව පළ කළාක් මෙන් අපගේ අධ්‍යයන පර්යේෂණාදී කටයුතු සඳහා ද කැප වී ඇති කාලය ප්‍රමාණවත් නොවන බව පෙනීයනවාට සැක නැත. විශ්වවිද්‍යාලයේ නා නා කාර්යයන්හි යෙදෙන අවස්ථාවක චිත්තසන්තාපයක් හෝ වෙහෙසක් ඇතිවුවහොත් පුරාතනයෙහි වැඩ විසූ මහාවංශ කර්තෘන් වහන්සේගේ පඬිවදන සිහි කළ විට ඔබ ධෛර්‍යමත් වනු ඒකාන්තය. එතුමෝ කීහුඃ ''භවෙය්‍ය කො ලොකහිතෙ පමාදවා'' (ලොවට වැඩ පිණිස එන කරුණකදී කවර නම් පුද්ගලයෙක් ප්‍රමාද වේ ද?)

<u>*1961.11.22*</u>

# 03

# විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය

## ආචාර්ය ඊ. ඩබ්ලිව්. අදිකාරම්

වර්තමාන මනුෂ්‍යයා ස්වකීය ජීවිතයේ එක අංශයකින් ඉතා උසස් තත්ත්වයකට පැමිණ සිටින අතර තවත් අංශයකින් එතරම් දියුණුවකට පැමිණ නැත. මේ දෙකටම ප්‍රධාන හේතුව අධ්‍යාපනයයි. මනුෂ්‍ය වර්ගයේ අනික් සියලුම ක්‍රියා මෙන්ම අධ්‍යාපනය ද සර්ව සම්පූර්ණ එකක් නොවේ. සමහර අංශවලින් අධ්‍යාපනය පුදුම දියුණුවක් ලබා ඇත. මනුෂ්‍යයා දියුණු වී ඇත්තේ අධ්‍යාපනයේ ඒ කොටස නිසා ය. මනුෂ්‍ය ජීවිතයේ එක අංශයක් පිරිහීමට පත් වී ඇත්තේ ද අධ්‍යාපනයේ එම අංශය දියුණු වී නැති නිසා යයි පිළිගත යුතුව ඇත. මේ අංශ දෙක ගැනම හැකිතාක් අපක්ෂපාත භාවයකින් යුක්තව සොයා බැලීමත් ඊට නිසි ප්‍රතිකර්ම යෙදීමත් විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනයේ යුතුකමක් වගකීමත් විය යුතුව පවතී.

භෞතික ය අධ්‍යාත්මික යයි එකිනෙකට වෙනස් වූ අංශ දෙකකට මනුෂ්‍යයා බෙදීමට පුලුවන් කමක් නැත. ආහාර නොමැති කම, ජීවත් වීමට සුදුසු ගෙයක් නොමැති වීම ආදී භෞතික හේතුවලින් පෙළෙන මිනිසාට ආධ්‍යාත්මික සුවය ගැන සිතන්ට වෙලාවක් නැත. ඔහු දුක් විඳින මිනිසෙකි. එසේම කොතරම් හොඳට ආහාරපානාදිය තිබෙතත් කොතරම් හොඳ ගෙයක ජීවත් වුවත් යමෙකුගේ සිත නොසන්සුන් නම් නොයෙකුත් කරදරවලින් යුක්ත නම් ඒ තැනැත්තා ද දුක් විඳින මිනිසෙකි. අධ්‍යාපනයෙහි පරමාර්ථය විය යුතු වන්නේ ශාරීරික වශයෙනුත් මානසික වශයෙනුත් සුවපත් වූ මිනිස් සමාජයක් බිහිකරවීම ය. එවැනි සමාජයක් බිහි කරවීමට ශක්තිය ඇත්තා වූ ද සුදුසු වූ ද ආයතනය විශ්වවිද්‍යාලයයි. එහෙත් අභාග්‍යයකට මෙන් වර්තමාන ලෝකයේ කිසිම රටක ඇති විශ්වවිද්‍යාලයකින් එම කාර්යය සතුටුදායක අන්දමකින් කෙරෙන බවට සාක්ෂි නැත.

විශ්වවිද්‍යාලය වනාහි රටක තිබෙන උසස්ම අධ්‍යාපනික ආයතනය යි. රටක සිටින ඉගෙනීමට ඉතාම දක්ෂ තරුණ පිරිස සිටින්නේ ද විශ්වවිද්‍යාලයෙහි ය. එමෙන්ම නුදුරු අනාගතයෙහි දී රටේ සියලුම වගකිවයුතු තැන් ලැබීමට සිටින්නේ ද අද විශ්ව විද්‍යාලයවල ඉගෙනීම ලබන පිරිස ය. එහෙයින් විශ්වවිද්‍යලයකින් දෙනු ලබන අධ්‍යාපනය මනුෂ්‍ය ජීවිතයේ එක අංශයක් පමණක් සකස් කරන්නක් නොව පූර්ණ අධ්‍යාපනයක් විය යුතු ය. ඉතා උසස් උපාධි ලැබූ එහෙත් වංචනික හෝ කෲර හෝ දුශ්චරිතයෙහි ගැලුණු හෝ උගතුන් දක්නට ලැබෙන්නේ ඒ අය ලත් ඉගෙනීම අසම්පූර්ණ බැවින් ය. විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය ඥාන වර්ධනයට පමණක් සීමා වී චරිත වර්ධනය නොසලකා හැර තිබීම අභාග්‍යයකි. සැබෑ ඉගෙනීමෙන් ඥානවර්ධනයත් චරිත වර්ධනයත් යන දෙකම එක විට සිදු වෙනවා ඇත.

පාලි භාෂාවෙහි තිබෙන ''සික්ඛා'' (සංස්කෘත 'ශික්ෂා') යන වචනය ගැන මෙහි දී යමක් කීම අවශ්‍ය ය. සික්ඛා යන වචනයෙහි තේරුම් දෙකක් තිබේ. එයින් එකක් ''ඉගෙනීම'' ය. අනික ''හික්මීම''ය. ''සික්ඛති'' යනු ''ඉගෙන ගනියි'', එසේම ''හික්මෙයි''. ඉංග්‍රීසි භාෂාවෙහි ''ඩිසිප්ලින්'' (Discipline) යන්න ද මීට බොහෝසෙයින් සමාන ය. එහි ද ඉගෙනීම, හික්මීම යන අර්ථ දෙකම තිබේ.

ඉගෙනීමෙන් හික්මීම ඇති වෙනවා නොව ඉගෙනීමම හික්මීම වන්නේය. මෙය සිදු වන්නේ කෙසේදැයි දැකීමට ඉගෙනීම ඇති වන සැටිත් හික්මීම ඇති වන සැටිත් අප විසින් පළමුකොට තේරුම් ගත යුතු වේ.

ඉගෙනීම යනුවෙන් පොදු ජනයා අදහස් කරන්නේ ඥානවර්ධනය යි හෙවත් දැනුම වැඩිකර ගැනීම යි.

මේ අර්ථයෙන් වන ඉගෙනීමෙහි පළමුවෙනි පියවර යම්කිසි දෙයක් පිළිගැනීම යි. ඒ පිළිගැනීමෙහි අවබෝධයක් නොමැතියි. කුඩා ළමයා තම පරිසරයෙන් වචන අහුලා ගනියි. ඒ වචන ඔහුගේ මොළයෙහි සටහන් වෙයි. මුළු භාෂාවක් ඉගෙනීම සඳහා ඔහුට අත්තිවාරම වන්නේ එසේ ප්‍රඥප්ති වශයෙන් පිළිගෙන තැන්පත් කර ගත් ඒ වචන සමූහයයි. පසු කලක දී ඔහුට අලුත් වචනයක් ඇසෙයි, එසේ නැත් නම් ඔහු අලුත් වචනයක් පොතක දකියි. ඒ අලුත් වචනය ඔහු තේරුම් ගන්නේ එම වචනය තමා කලින් තැන්පත් කරගෙන තිබුණු වචනවලට පරිවර්තනය කර ගැනීමෙන් ය. නොදන්න වචන දැන ගැනීමට ආකාරාදියක් හෙවත් ශබ්දකෝෂයක් පාවිච්චි කරනවා යයි කියන්නේ මෙම ක්‍රියාවලියට ය. අන්‍ය භාෂාවක් ඉගෙන ගන්නවා යයි කියන්නේ ද අලුත් අවබෝධයක් ඇති කර ගන්නවා නොව එකම දෙයට වචන දෙකක් කියන්ට සමාර්ථ කමක් ඇති කර ගැනීම ය. එසේම භාෂා පනහක් ඉගෙන ගන්නවා යයි කියන්නේ එකම දෙය පනස් විදියකින් කියන්ට හැකි වීම ය. කලින් ඔහු එක්තරා සතෙකු හැඳින්වීමට දැන සිටියේ ''බළලා'' යන වචනයෙන් පමණ ය. දැන් එකට එකක් වෙනස් වචන පනහකින් බළලා හැඳින්වීමට ඔහුට පුලුවන. මෙහි දී ඔහු වචන රැස් කර ගත්තා පමණ ය. මෙහි දී ඔහුගේ ඉගෙනීම දියුණු වූවා මිස අවබෝධයේ වැඩි වීමක්වත් ගුණධර්මයක පහළ වීමක් වත් සිදු වූයේ නැත. භාෂාව සම්බන්ධයෙන් පමණක් නොව ඕනෑ ම ශිල්ප ශාස්ත්‍රයක් ඉගෙන ගැනීමෙහි දී සිදු වන්නේ ද මීට සමාන වූවකි, එනම් පිටස්තරයෙහි තිබෙන දේවල් වචනවල ස්වරූපයෙන් හෝ සංකේතවල ස්වරූපයෙන් හෝ තමාගේ මොළයේ තැන්පත් කරගැනීමකි. එවැනි ඉගෙනීමකින් කෙනෙකු වචන මට්ටමේ උගතෙකු, බහුශ්‍රැතයෙකු, විශේෂඥයෙකු, වන්ට පුලුවන. එවැනි උගත්කමින් ප්‍රයෝජන නැත්තේ නොවේ. භෞතික යයි සම්මත ජීවිතයට එය බොහෝ සෙයින් ප්‍රයෝජනවත් වන්ට පුලුවන. බාහිර ඔපයක් සහ බාහිර සුවිනීතභාවයක් ද එවැනි උගත්කමින් ඇතිවන්ට පුළුවන. එහෙත් මනුෂ්‍යයා තුළ දයාව, අනුකම්පාව, වැනි මිනිස් ගුණ එයින් හටගන්නේ නැත. එහෙයින් දයාවෙන් තොර වූ ඒ උගතා මනුෂ්‍යයාගේ විනාශය සඳහා ද තම ඥානය යොදවන්ට පුලුවන. අද ලෝකයට උගත්කම නිසා සිදු වී ඇති විපත මෙයයි.

'සික්ඛා' යන්නෙන් ප්‍රකාශ වන අනික් අර්ථය වන හික්මීම ද බොහෝ විට වරදවා තේරුම් ගෙන තිබෙන වචනයකි.

භය නිසා ඇති වන හික්මීම සැබෑ හික්මීම නොවේ. එසේ ම පෙළඹීමක් නිසා, ලාභයක් බලාපොරොත්තුවක් නිසා ඇති වන හික්මීම ද හික්මීම නොවේ. දෘෂ්ටියක් නිසා, ව්‍රතයක් නිසා, ඇති වන හික්මීම ද හික්මීම නොවේ. එවැනි හේතුවක් නිසා ඇති වන හික්මීම තාවකාලිකය. හේතුව නැතිව ගිය විට ඒ හික්මීම ද නැතිව යන්නේය. සැබෑ හික්මීමෙහි කැඩීමක්, බිඳීමක්, පලුදුවීමක්, නැති වී යාමක්, නැත. එය ඇති වන්නේ යම් කිසි ක්‍රියාවක් අශෝභන බව, අහිතකර බව, වැරදි බව, ප්‍රත්‍යක්ෂ වශයෙන් දැකීමෙන් ය.

උගත්කම යනුවෙන් අප සාමාන්‍යයෙන් අදහස් කරන්නේ යමක් අසා, බලා, කියවා ඒ දෙය මතක තබාගැනීම ය, ඒ දෙය ගැන තර්ක කරන්ට විමසා බලන්ට නිශ්චය කරන්ට පුලුවන්කමක් ඇති කර

ගැනීම ය. කලින් සඳහන් කළාක් මෙන් ඒ ඉගෙනීම කරුණු රැස්කර ගැනීමකි. නිවැරදි දෙය මෙන් ම වැරදි දෙය ද ඒ රැස්කර ගැනීමෙහි ඇතුළත් වන්ට පුලුවන. තවද මතකයෙහි තැන්පත් වුණු දෙයක් හෙයින් ඉගෙන ගත් දෙය නිතරම පරණ ය.

කරුණු රැස්කර ගැනීමේ අපේක්ෂාවෙන් කෙරෙන මෙම ඉගෙනීමට වඩා වෙනස් වූ තවත් ඉගෙනීමක් තිබේ. ඒ වනාහි යමක් දෙස අලුතෙන් බලා එහි යථා ස්වභාවය හෙවත් ඇති සැටිය දැකීමකි. ඒ බැලීමෙහි පූර්ව නිගමන නැත. යමක යථාස්වභාවය දැකීමට පූර්ව නිගමන බාධාවකි. විද්‍යාඥයා යම් සියුම් දෙයක් දෙස අණ්වීක්ෂ කන්නාඩියෙන් බලන්නේ පූර්වනිගමන ඇතිව නොවේ. පූර්ව නිගමනයෙන් යුක්තව බැලීම අලුත් දෙයක් සොයා ගැනීමෙහි දී බාධාවකි.

අඳුරේ ගමනක් අප යනවා යයි සිතමු. ඉස්සරහට තිබෙන දේ කිසිවක් අපට නොපෙනෙන හෙයින් අපේ ජීවිත ගමන ද අඳුරේ යන ගමනකි. මාර්ගයෙහි වළවල් තිබෙන්නට පුලුවන. ගොඩැලි තිබෙන්ට පුලුවන. කටු ගල් බොරළු ආදිය තිබෙන්ට පුලුවන, ක්ෂේමස්ථාන ද අතරින් පතර තිබෙන්ට පුලුවන. එසේම මාර්ගයෙහි නයි පොළොංගු වැනි විසකුරු සතුන් සිටින්ට පුලුවන, අහිංසක සතුන් ද සිටින්ට පුලුවන. අඳුරේ යන අපට ඒ කිසිවක් පෙනෙන්නේ නැත. අප ආධාර කර ගන්නේ අනුන් විසින් දෙන ලද ගමන් විස්තරයෙකි. හොඳ නරක, කළයුතු දේ සහ නොකළයුතු දේ යනාදි වශයෙන් අප ගුරුවරුන්ගෙන්, පොතපතින්, ඉගෙන ගත්ත දේ එම ගමන් විස්තරයයි. අප ගමන් කරන්නේ අඳුරෙහි හෙයින් එම විස්තරයෙහි අඩංගු දේ අපට ප්‍රත්‍යක්ෂ නැත. එහෙයින් ගොඩ කොතැන ද වළ කොතැන ද යි අප හිරිහැටි දන්නේ නැත. එහෙයින් ම නොයෙකුත් ව්‍යසනවලට මුහුණපාන්ට අපට සිදුවෙයි. ඉගෙනගත් හොඳ නරක අපේ ප්‍රත්‍යක්ෂයන් නොවන හෙයින්, ජීවිත ගමනෙහි දී අප නොමඟ යවන්ට ඒ මාර්ග විස්තරය හේතු වන්ට පුලුවන. මෙය වර්තමාන ලෝකයෙහි ඉතා පැහැදිලිව දක්නට තිබෙන දෙයකි. ඉතාම ඉහළට ඉගෙන ගත් අය පවා දුශ්චරිතයෙන් වෙළුණු ඉතාම පහත් ජීවිත ගත කරනු නොයෙක් විට අපට දක්නට ලැබෙන්නේත් ඇතැම් රටවල උසස් ආගමික නායකයන් පහත් කෲර මිනීමරන්නවුන් වී සිටිනු දක්නට ලැබෙන්නේත් එහෙයිනි. එවැනි ඉගෙනීමකින් මනුෂ්‍ය වර්ගයාට පිහිටක් නැත.

අඳුරේ යන විට අප අතේ එළියක් තිබෙනවා නම් මේ අවාසනාවන්ත තත්ත්වය අපට සිදු වන්නේ නැත. මේ සම්බන්ධයෙන් අපට ලබාගත හැකි එළිය වනාහි දැකීමත් සමඟම හික්මීම ඇති කරවන ඉගෙනීම ය.

ඉතා කුඩා දෙයක වුව ද ඇති සැටිය අපට පෙනුනු විට ඒ දෙය සම්බන්ධයෙන් අපේ හැසිරීම සහමුලින් වෙනස් වන්නේය. බෝතලයෙහි ''විස'' යන ලේබලය දැකීමෙන් පසු එය අතපත ගාන්නේ කවුද? පාරෙහි තිබෙන කුණු කසළ ඇගේ තවරා ගන්නේ සිහිය ඇති කවරෙක් ද? සත්ත්ව හිංසාවෙහි ඇති කෲරභාවය දුටු තැනැත්තා කිසි කලෙක සතුන් මරන්නේ නැත. බොරු කීම අනුන් රැවටීම, අපවිත්‍ර ක්‍රියා බැව් දකින තැනැත්තා බොරු කියන්නේ නැත, අනුන් රවටන්නේ නැත. නොකළ යුතු ඒ ඒ දේ නොකරන්නේ භයක් නිසා නොව ඒවා නොකළ යුතු බැව් පැහැදිලි නිසාය. මේ පැහැදිලි බව නියම ඉගෙනීමේ ඒකාන්තය ඵලයයි.

අප අසන, කියවන, දකින, කරන, දේ තත්ත්වාකාරයෙන් ප්‍රත්‍යක්ෂව දැකීමේ අවංක ඕනෑකම්ම ඒ ඒ දේ පිළිබඳ අවධානයත් ආලෝකය දල්වා ගැනීමත් වන්නේය. සංසන්දනය කිරීමක්, විතර්ක කිරීමක්, පිළිගැනීමක් හෝ ප්‍රතික්ෂේප කිරීමක් එහි නැත. තිබෙන්නේ අවධානයත් ආලෝකයත් පමණ ය. යමක් සාරවත් ද නැතහොත් නිස්සාරද යි එම ආලෝකයට පෙනෙයි. ඔහු ඒ වූ පරිද්දෙන්

හැසිරෙයි, ඒ හැසිරීම සැබෑ හික්මීම ය. එසේ හික්මුණු තැනැත්තාගේ ජීවිතය විධිමත් ය, අහිංසක ය.

ලෝකයෙහි සාමය ඇති වන්නේ එලෙස ඉගෙනගත් හික්මුණු අය නිසා ය. විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය විය යුත්තේ එසේ ඉගෙනීමත් හික්මීමත් එකවිට ඇතිකරවන, 'සික්ඛා' යන වචනයෙන් ඉතා හොඳින් ප්‍රකාශ වන පූර්ණ අධ්‍යාපන යයි. කරුණු ඉගෙනීමෙන් පමණක් නොව හික්මීමෙන් ද යුත් ඒ පූර්ණ අධ්‍යාපනය ශිෂ්‍යයන්ට දීමට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමර්ථවේවායි ප්‍රාර්ථනා කරමි.

*1979.12.13*

# University Education

## Dr. E.W. Adikaram

Man, as we know, has made immense progress in one aspect of his life, while in another he has made no progress at all. Perhaps he has regressed. Education is the main cause for this progress as well as for this stagnation or regression.

As in all other activities of man, there is no perfection in the field of education also. It is in the aspect where education has progressed that mankind has progressed. On the other hand, man has failed where education has not progressed. It is the duty and the responsibility of University education to investigate as impartially as possible both these aspects and remedy their defects.

It is not possible to divide man into two distinct compartments as physical and spiritual. The man who does not have sufficient food to eat or a suitable house to live in, has no time to think of spiritual matters. So is the man who has all physical comforts but is tormented in mind with his problems. Both suffer, each with his own set of problems. The aim of education should be to bring about a society of human beings who are happy physically as well as psychologically. The University is the institution that is capable of bringing into being such a happy society. But unfortunately no university in any country in the world today seems to be performing this task satisfactorily.

The University is the highest educational institution in a country. The cleverest students in a country are the students in a University. Moreover, those who will occupy all the responsible positions in a country in the near future are the present university students. As such, it is essential that university education should not be fragmentary but should be aimed at developing all aspects of human life. It is because of this present incompleteness of university education that there are people of very high academic qualifications, who are deceitful, cruel or of unworthy character. It is unfortunate that university education is limited to advancement of knowledge and has neglected the development of character. True education will simultaneously bring about both advancement of knowledge and advancement of character.

In the Pali language there is the word 'sikkhã' (Sanskrit Sikshã) which deserves special mention here. This word has two meanings. One is "learning" , the other is "discipline". This is very similar to the English word "discipline" which also means both learning and orderliness.

Learning itself is discipline. To understand how this happens, one has to understand how learning takes place and how discipline comes into being.

The ordinary meaning of "learning" is "advancement of knowledge". In this sense, the first step in learning is acceptance. In accepting, there is no understanding. A child picks up words from his environment. The word is registered in his brain. Such words become the foundation for the future

learning of an entire language. Later, he hears a new word or he reads a new word in a book. He learns the meaning of that new word by interpreting it in terms of words that he already knows and which he has stored up in his memory. This is also how we use a dictionary. In learning a foreign language, too, one does not get a new understanding. He only acquires the ability to use two words for the same object. What One means by saying that a person has learned fifty languages, is that he can now say the same thing in fifty different ways. Earlier he could name a certain animal only by using the word "cat". Now he says (The same thing in fifty different forms. He has acquired only words. In this process he has neither acquired any new understanding nor has it brought about in him any virtue. This is true not only in learning a language. It is equally true in the learning of any art or science. What he actually does is to bring in and store in his memory by way of words or symbols various external things. With such learning one can become at verbal level an educated person or a well-read person or a specialist. Not that such learning is useless. It has many essential uses in that aspect of life which is generally termed physical. Such learning may also bring about an external polish and an externally good demeanour but it will not bring about in a person human qualities such as kindness and compassion. Such an educated man, possessing no love or compassion, can employ his knowledge for the destruction of mankind. This is the disaster that unbalanced education has brought about in the world today.

The other meaning, namely, "discipline" of the Pali word "Sikkhã", mentioned earlier, is also often incorrectly understood.

Discipline brought about by fear, is not discipline. Similarly it is not discipline which is the result of incitement or expectation of a reward. That discipline which is the result of a belief or a practice is also not discipline. All such discipline is temporary and will fade away when the cause ceases to exist. True discipline is incorruptible. Such discipline comes into being when the ugliness, the harm, of the incorrectness of some behaviour or act is clearly understood.

As mentioned earlier, by education we generally mean the storing up in memory of what we hear, see or read and also the acquiring of the ability to reason out, to examine and to make decisions on what we have thus acquired. Such learning is only acquisition of facts. What is good as well as what is bad can be acquired. Further, as it is stored up in memory, such learning is always old.

There is another kind of learning in which there is no motive of storing up facts. That learning is to look at something afresh and understand it as it is. In that looking there is no pre-judgement. Pre-judgement is a hindrance to the understanding of what it is. When a scientist investigates something with his microscope he has no pre-judgement of what he is going to see. Such pre-judgement is a hindrance to the scientist in discovering something totally new.

When we are taking a journey in the dark we do not see what is in front of us. Our journey in life, too, is such a journey. The road may be uneven, there may be thorns and stones, there may be poisonous snakes or there may be harmless creatures. None of that is seen by us who are travelling in the dark. We are aided only by a description given by others. In the description we get from our teachers and from our books we are told what is good and what is bad and what should be done or not done. As we are

travelling in the dark, we have no first-hand discernment of what is described. The ups and downs are not seen by us, nor do we know where the poisonous snakes lie hidden. As such, we have to face many a danger in our journey. As we have no clear personal understanding of what is good and bad, the description can lead us astray. This is evident from what is happening in the world today. One often comes across even among the most educated people, those who lead immoral and degraded lives. In some countries one can see even cruel murderers among the high religious dignitaries. Such education is clearly of no help to mankind.

If, when we travel in the darkness, we have a light with us, this unfortunate situation would not arise.

The light we have in this connection is that learning which instantaneously brings about discipline.

If we perceive even a very small thing as it actually is, it radically changes our attitude to that. If one sees the word 'poison' on the label or a bottle, who will meddle with it? Who, other than the insane, will take dirt from the roadside and smear it on his body? He who has seen the cruelty of taking life, will never kill a sentient being. Similarly he who sees the ugliness of lying and deceiving will never tell a lie or deceive another. He abstains from a thing which should not be done, not because he is afraid, but because he understands clearly that it should not be done. This clarity is the immediate effect of right learning.

The very intense and earnest desire to perceive exactly as they are, what we hear, see and do, brings about attention and with it an inward clarity. In that attention there will be no comparing, doubting, accepting or rejecting. There is only attention and clarity. With that light he discerns what is true and what is false. In that light he conducts himself and that conduct is true discipline. Such a person's life is orderly and innocent.

Peace in the world will come about through such educated and disciplined people. Education in the University should be that which is so beautifully expressed in that Pali word, "Sikkhã" which produces both learning and discipline simultaneously. I earnestly hope and trust that the University of Sri Jayewardenepura will impart to the students that integrated education which is both learning and discipline.

*1979.12.13*

# 04

# ලක්දිව භික්ෂු සමාජය සතු වගකීම

## ආචාර්ය පූජ්‍ය පරවාහැර පඤ්ඤානන්ද හිමි

අද ඉතිහාසයට යන සුවිශේෂ දිනෙකැයි හඟමි. ස්ථවිරවාදී භික්ෂු සංඝ පරම්පරාවෙන් පැවැතෙන මහතෙරුන් දෙනමකට සම්මානෝපාධි පිරිනමනු ලැබීම හා භික්ෂූන් වහන්සේ නමක් ම විශ්වවිද්‍යාලයීය උපාධි උදානෝත්සව දේශනය පැවැත්වීම ඊට හේතුවයි. මේ ඓතිහාසික මොහොතෙහි අප වෙතැ යම් කිසි කුශලතාවන් අගයමින් සම්මානෝපාධියෙන් බුහුමන් දැක්වීම නිමිතිකොට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කුලපති, උපකුලපති, පීඨාධිපති මහ වියත් පාමොක් සනාතන සභාවට අපගේ අකුටිල හාර්දික ශුභාශීර්වාදාත්මක කෘතඥතාව පිරිනමමු. මේ උසස්ම සම්මානය පෞද්ගලික කොට අප වෙතැ පිරිනැමුණු නමුදු එය නිඛිල භික්ෂු සංඝ රත්නයට කළ මහා පූජා සත්කාරයක් කොට නිහතමානතායෙන් යෙදී පිළිගන්නෙමු. වෙසෙසින් අනාගත භික්ෂු පරම්පරාවට මෙය මා හැඟි ආදර්ශයක් හා දිරිගන්වන්නක් ද වනු ඇත.

''සිංහල මහරජදරුවන් දවස ව්‍යක්ත. විශාරද, බහුශ්‍රැත, ධර්ම විනයධර මහතෙරහු රාජගුරු පදවියෙන් ද රාජකිරීටයෙන් ද පිදුම් ලද හ'', යන්න ඉතිහාසගත සත්‍යයෙකි. සිංහලද්වීපය රත්නත්‍රයට අයත් රාජදේය භූමි ඛණ්ඩයෙකි. ස්වර්ණමාලී මහා චෛත්‍ය රාජයාණන්ට, ශ්‍රී මහා බෝධීන් වහන්සේට, ධර්මකථිකයන් වහන්සේට හෙළ බොදු රජ දරුවන් විසින් සිරිලක් රජය නොයෙක් වර පුදන ලද්දේය. ''රත්නත්‍රය සන්තක සිංහලද්වීපය දැහැමින් සංසාණත්තිය නුගුළුවා රකුවයි ආපසු මහරජුට පැවරුණේ විහාරස්ථානයත් භාරකාරයෙකුට පවරණ අයුරිනි. ඒ අනුව උතුරු නැගෙනහිර පළාත් දෙක ඇතුළු සකල සිංහලද්වීපයම බුදුසසුන සතුය. සිංහලයෝම සිංහල දේශයේ නිත්‍ය භාරකාරයෝ ද භූමි පුත්‍රයෝ ද වෙති. ඔවුන් විසින් පත්කරගනු ලබන රාජ්‍යය ද භික්ෂු මහා සංඝයා වහන්සේ දක්වන සන්මාර්ගයෙන් රට පාලනය කළ යුතුය. නො එසේ වුව රාජ්‍යකාරකයෝ දුර්විපාකයනට ගොදුරුවන්නාහුය. මේ බව රජයත් ජනතාවත් විසින් මොනොවට සිත්හි ලා දරාගත යුත්තෙකි. පරශත්‍රුන්ගේ උපාය මාර්ගයන් පිඹ හරිමින් සිංහලද්වීපයත් සම්බුද්ධ ශාසනයත්, සිංහල දේශීය භාෂා ශාස්ත්‍ර කලා ශිල්පත් රැකගෙන එන්නාහු භික්ෂු සංඝයා වහන්සේය.

ආරම්භයේ සිට මේ දිවයිනේ පවත්වා ගෙන එනු ලබන බෞද්ධාධ්‍යාපනය ගැන යමක් පැවසීම ද ප්‍රස්තාවෝචිත යයි හඟිමි. පිරිවෙන් අධ්‍යාපනය, දහම් පාසල් අධ්‍යාපනය යි, බෞද්ධාධ්‍යාපනය සාකල්‍යයෙන් ගෙන දෙකකට බෙදා දැක්විය හැක. ලොවැ බැවහරෙහි එන හැම අධ්‍යාපන මාර්ගයන් විමසා බලන්නෙකුට සමන්බහදුරු වූ එක ම අධ්‍යාපන මාර්ගය ව පැනෙන්නේ බෞද්ධාධ්‍යාපන මාර්ගය යි. එයට කළ යුතු ඌන පූරණයක් හෝ ඉවත ලියැයුත්තෙක් කැලම එහි නැත. සිංහල මනුෂ්‍ය වර්ගයා ලෝකයෙහි ශාන්ත, නිර්මාණ කුශලතායෙන් සපිරුණු, නීතිගරුක, එහි ස්වාගතවාදී ශ්‍රේෂ්ඨතම ජාතියක් වූයේ අවුරුදු දෙදහසකට වැඩි කාලයක් තුළ භික්ෂු මහා සංඝයා වහන්සේගේ දූරදර්ශීතාත්මක ක්‍රියා මාර්ගය ඔස්සේ බෞද්ධාධ්‍යාපනය ජාතියට නිසි මඟින් බෙදා හැරීමේ සත්ප්‍රතිඵල විසිනි. වර්ෂ 400 ක තරම් කාලයෙක පටන් විදේශික, ජාතික, විධර්මයන්ගේ සංපර්කය මෙරට ජනතාවට ලැබීමේ දුර්විපාක විසින් භික්ෂු මහා සංඝයා වහන්සේටත් සිංහලයාටත් තිබූ හිමිකම් ඇවිරී ගියේය. ශතවර්ෂ දෙකෙකින් මෙදැතුරෙහි රජයෙකින් කළ විහාරාරාමයෙක් මෙ හෙළදිවු තෙලෙහි නැත. බෞද්ධාධ්‍යාපනය නංවා ලීමට දුන් පිටුවහලෙක් නැත. ගිය සිවු සියවස

තුළ යම්ම බෞද්ධාධ්‍යාපන පුනර්ජීවයෙක් විහාරාරාමකරණයක් කලා ශිල්ප සංවර්ධනයක් වී නම් ඒ හැම මහාජනානුග්‍රහයෙන් භික්ෂූන් වහන්සේ විසින් ම කරණ ලද්දේය. සිංහල භාෂා සාහිත්‍යයේ පුනරුදය ද භික්ෂූන් වහන්සේගෙන් ම විය. දනුදු වන්නේය. අනුබල දෙනු වෙනුවට හැම රජයක් කෙළේ බෞද්ධ විහාර දේවාලයනට අයත් ආදායම පොදු දේපොළ භාරකාරයාගේ පාලනයට යටත් කොට තැබීමය. මෙ පිළිවෙත තවම නොසිඳී පැවැතෙයි. ඒ අතර අබෞද්ධ ආයතනයන් සතු මහා ධන කෝෂයකට අත තැබීමට පවා බානා සුලුය. වර්ෂ දෙදහසකට අධික කාලයක සිට ලෝක කල්‍යාණයෙහිත් විමුක්තිමාර්ග ප්‍රචාරයෙහිත් නිඃස්වාර්ථව වැඩ කරණ සිංහල භික්ෂූන් වහන්සේ තරම් ලොව අන් කිසිවෙක් ද්වේෂ-දෝෂ පාත්‍රව නැත. වාග් විෂය ඉක්මවා යන තරම් භයානක දුක් හිරිහැරවලට මුහුණපාමින් චාම් දිවිවැටුමින් පිළිවෙත් සරුව, දිවි වටනා උන්වහන්සේගේ චිත්ත සන්තානය මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යන සතර බඹ විහරණින් පවිත්‍රීභූතව පවතී. ඒ සමඟ ම උන්වහන්සේ ඡන්ද, දෝෂ, භය, මෝහ යන සතර අගතියෙන් දුරස්ථව පරිපීඩිත ජනතාව දුර්ග මයෙන් නංවාලීමෙහි සමුත්සාහිත වන්නාහ. මෙ කියු කරුණු ටික සාකල්‍යයෙන්ම ග්‍රාමවාසී භික්ෂූන් වහන්සේ තුළ අදත් සප්‍රාණව පවත්නා බව ඊර්ෂ්‍යා පරවශතායෙන් තොර වූ හැමට පහසුවෙන් දක්ක හැක. පිරිවෙන් අධ්‍යාපනය මෙරටෙහි තවමත් පරිණත අවස්ථායෙක් හි පවත්නේ ඒ පිණිස භික්ෂූන් වහන්සේ දරණ මහනීය උත්සාහයේ ප්‍රතිඵල වශයෙනි. අද වුවද සාම්ප්‍රදායික පිරිවෙන් අධ්‍යාපනය හරිහැටි ලැබුවහු වෙත්නම් ලොවැ කවර ගැටලුවෙක දී හෝ නිසි විසඳුම් දීමෙහි උන්වහන්සේ සමත් වෙති. මෙ වචනය ගෙනහැර පෑවෙම් පිරිවෙන් අධ්‍යාපනයේ ශ්‍රේෂ්ඨත්වය ජනතාවට වටහාදීම පිණිසය. බුද්ධශාසනය, සංස්කෘතිය, අධ්‍යාපනය වැනි ප්‍රශ්නවලදී සිල්වත්, නැණවත්, ගුණවත්, බහුශ්‍රැත මහතෙරුන් වහන්සේගේ අදහස් නොවිමසා ජනතාවත් මහා සංඝයා වහන්සේත් නොමඟ යැවීමට දෝ අභව්‍ය පුද්ගලයන් මුල්තැන්හිලා පිළිගැනීම පිළිවෙත් මඟකොට ගෙන ඇත. ධර්මිෂ්ඨ සමාජය යන්න වචනයට පමණක් සීමාවූවක් වුවහොත් බෞද්ධ, හින්දු, මුස්ලිම් ආගම් එකතු කිරීමේ පිළිවෙත හුළං බැඳීමට කරණ තැතක් වෙයි.

රට්ඨ පිණ්ඩය මොහොතක් වුව මෙත් කුළුණු වඩා වැඩකරණ භික්ෂූන් වහන්සේට කැප බව සවුනේදම් ගෙවා දත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ වදාළ සේක. රට්ඨ පිණ්ඩය නම් රටවැසියා විසින් පිරිනමනු ලබන පිඩ හෙවත් පඩියයි. ආචරිය භාග නම් වන ගුරු වැටුප භික්ෂූන් වහන්සේට ධර්ම විනය දෙකින්ම නිසි කොට දක්වෙයි. iv වන මිහිඳු මහරජතුමාගේ මිහින්තලා සෙල්ලිපිය ගෙන බලන්න. පෙර රජුන් විසින් සුදුසුකම් අනුව සිව්පසයෙන් සංග්‍රහ කළ සැටි එහි සටහන්ව ඇත. ශාසන ප්‍රතිපත්තියට හානි නොවන අධ්‍යාපන සේවා, මහජන සේවා වැනි මෙහෙයෙහි නියුතුවන භික්ෂූන් වහන්සේට සිව්පසයෙන් සංග්‍රහකිරීම රජයේත්, අධ්‍යාපනායතනයන්හිත් යුතුකම වන බව ඉඳුරා කියමි. භාෂා, සාහිත්‍ය, කලාශිල්ප, සංස්කෘතිය වැනි විෂයයන් අළලා පොත් ලියූ මහතෙරුන් වහන්සේට පෙර රජදරුවෝ ගම්වර පිදූහ. මේ රට තුනුරුවන් සතු දේපොළ වන හෙයින් රටේ කවර තැනක වුව ද විසුමට, විහාරාරාම ඉදිකරවා මහා ජනයා සන්මාර්ගයෙහි යෙදවීමට භික්ෂූන් වහන්සේට සතු අයිතිය උදුරාලිය යුතු නැත. ස්වධාර්මිකයනට ඉඩ නොතබා විජාතිකයනට විධර්මීනට ඉඩකඩ සළසාදීමට සුදුසු නොවේ.

ජාතික සංවර්ධනයේ මුල් උල්පත අධ්‍යාපනයයි. බෞද්ධාධ්‍යාපනයේ එන මූලධර්ම පදනම් කොට ගත් අධ්‍යාපන මාර්ගයක්ම සකසා ගත යුත්තේයි හඬ නැඟෙන්නේ ඒ හේතුයෙනි. රටක උසස් අධ්‍යාපන පීඨය වන්නේ විශ්වවිද්‍යාලයයි. පයෝෂණයට මුල් තැන් දෙන අධ්‍යාපනය එහි අනිවාර්යයෙන් පැවැත්ත යුත්තේය. හුදෙක් උපාධිධාරීන් මවා ලන කර්මාන්තයක් කොට ඒ නොපැවැත්විය යුත්තෙකි. එබඳු විශ්වවිද්‍යාලයෙකින් ධර්ම සාහිත්‍ය, භාෂා, ශාස්ත්‍ර, නීති, පාලන තන්ත්‍ර, අධ්‍යාපන ආදී විවිධ විෂයයන් පිළිබඳ නිෂ්ඨංගත විශාරදයෝ පහළ නොවෙති. එය ජාතියක

පතනයට තුඩුදෙන අතර උත්පතනයට මහා බාධා පමුණුවයි. අපගේ හැම විශ්වවිද්‍යාලයක් පර්යේෂණයට මුල් තැන් දෙන උච්චතම ශ්‍රේණියේ විශ්වවිද්‍යාලය තත්ත්වයට නංවා ගත යුතුව ඇත. මිනිසාගේ කායික චෛතසික හා බෞද්ධික නිර්මාණ ශක්තිය අනුපිළිවෙළින් යොමු කරවන උසස් අධ්‍යාපනය මායා මරීචියෙකි. එ තත්ත්වයෙන් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයාධ්‍යාපනය මුදා සාර්ථකත්වයෙහි පිහිටුවීමට උපායමාර්ග සෙවීමට අධ්‍යාපන විශාරදයන්ගේ නෙත් සිත් පොබයනු කැමැත්තෙමි. පොදු ජාතිකාධ්‍යාපනය සේම විශ්වවිද්‍යාලයාධ්‍යාපනය ද නිලධාරීවාදීන්ගේ ආඥාචක්‍රයෙන් ඉඳුරා මුක්තකොට ලියැ යුත්තේ ය. මෙහිලා ජනතාවට ඇස්විය යුත්තෙක් ඇත. රටේ සම්පූර්ණ ශක්තිය රැඳී ඇත්තේ ජනතාව සතු ආර්ථික, ආධ්‍යාත්මික උන්නතියෙහි ය. අර්ථෝපායනයත් සච්චරිත්‍රොපායනයත් ජනතාව සතු කාර්යභාර වෙයි. එයට තුඩු දෙන සදුපාය මාර්ගය ධාර්මික, නීති ව්‍යවස්ථා ප්‍රඥප්ති මාර්ගයෙන් රජය අනුබල දෙන්නේය. සච්චරිත්‍රොපායන මාර්ගය ප්‍රධාන වශයෙන් ජනතාවට පෙන්වන්නේ විහාරස්ථානයයි. ධනෝපායන මාර්ගය දෙන්නේ රජයයි. ඒ අනුව විහාරය හා රජය අතර සමීප සම්බන්ධය නොසිඳ පැවැත්ත යුත්තේය. මේ උභයායත්නය නිසා දේශීය සංස්කෘතිය රැකෙයි. එ මඟින් පුරුෂාර්ථ සිද්ධිය වන්නේ ය. ධනය උපයන්නෝ එය නිසි පරිදි නිසිකල්හි සමානාත්මතාවෙන් ජනතාවට බෙදා දෙන්නාහ. මෙ කරුණු සම්මා සම්බුදුරජාණන් වහන්සේ අනාථ පිණ්ඩික, විශාඛා බඳු තත්කාලීන ධනකුවේරයනට මැනවින් වටහා දුන් සේක.

සංවර්ධනෝපායමාර්ග සැකැසීමෙහිලා විශේෂයෙන් රජයට විශාල ධනස්කන්ධයක් වැය කිරීමට කරුණු යෙදෙයි. එ පිණිස ධන කුවේරයන්ගේ වස්තු නිධියෙන් කොටසක් කරවුවර විසින් පමණක් නොව පරිත්‍යාග විසිනුදු කලින් කල දිය යුතු වන්නේය. ශ්‍රී ලංකාවෙහි ද මහා ධන කුවේර සිංහල, දෙමළ, මුස්ලිම් ආදීහු වෙසෙති. පොදු අධ්‍යාපනයත් උසස් අධ්‍යාපනයත් යථා ස්ථානගත කිරීමට හුදුරජයකට සමත් බවෙක් නැත. එ පිණිස ධනවතුන්ගේ අනුප්‍රදානය ආවශ්‍යකමය. විශ්වවිද්‍යාලය අධ්‍යාපනය සාර්ථක කර ගැනුමට එ නිසා අර්ථපතීන්ගේ නොමසුරු පරිත්‍යාග රජයටත් විශ්වවිද්‍යාලය බඳු අධ්‍යාපන කේන්ද්‍රස්ථානයටත් දිය යුතු වන්නේය. ශ්‍රී ලංකාද්වීපය වෙන්දේසියෙහි ලා විකිණීමට අවස්ථාවක් පැමිණිය හොත් එය මිල ගෙවා ගැනීමට තරම් පොහොසත් ධන කුවේරයෝ මෙහි වෙසෙති. මහබඩැරී ආගමිකායතනයෝ ද ඇත. ඔවුන්ගේ ධන ගබඩා රජයේ සංවර්ධන ව්‍යාපාර සඳහාත් විශ්වවිද්‍යාලයායතන සඳහාත් විවෘත කොට ලීමට හොඳම කාලයකි මේ. සම්මාදම් විසින් හෝ ණයතුරුස් විසින් ලොවපුරා සැරිසැරුම කලෙකටවත් නවතා දේශීය ධනපතීන්ගේ පෞද්ගලික ධන සන්නිධීන් හා ආයතන සන්තක ධනාගාරත් අධ්‍යාපන කටයුතු සඳහාත් සංවර්ධන ව්‍යාපාර සඳහාත් උපයෝගීකොට ගැනීම රජය විසින් කළ යුත්තෙකි. ශ්‍රී ජයවර්ධනපුරය ශ්‍රී ලංකාවේ අග්‍ර රාජධානිය වන්නේය. එහි පිහිටි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ලෝකයේ උසස්තම අධ්‍යාපනායතනය කොට මවා ලීමට ධනවතුන්ගේ ස්වච්ඡන්දධනානුප්‍රදානයට මංපාදාදීමට ජනතාව උත්සුක වෙත්වායි වෙසෙසින් පතමි.

ශ්‍රී ලංකා ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සවයේ දී මා විසින් කරණු ලබන මේ දේශනයෙහිදී දක්වෙන හැම කරුණක්ම පක්ෂ පුද්ගල පරාමාර්ශයෙන් ඉඳුරා තොරව විනාශකාරී චෙතනායෙන් සුපරිමුක්තව පැවැසුනු බව රට දැය, සමය යන තෙ පුරුක් එකට අමුනා ශාන්තිකර, සාමපූර්ණ, සුසමෘද්ධ සිංහල දේශයක් යළි මවාලීමේ ශුද්ධ චේතනායෙන් පැවැසූ බවත් සැළකුව මැනැවි. අප වෙතැ සම්මානොපාධි ප්‍රදානයෙන් රත්නත්‍රය විෂයෙහි දක්වන ලද මහා බහුමානයෙන් ජනිත පිනෙන් ශ්‍රී ලංකා ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විශ්ව කිර්තියට පත් වේවා යි ද කුලපති උපකුලපතිතුමන් දෙපොල ප්‍රමුඛ සනාතන සභා සහ පාලක සභා සදස්‍ය මණ්ඩලයත් ආචාර්ය මණ්ඩලයත් කාර්ය මණ්ඩලයත් සුහෘෂ්ට, සුපුෂ්ටව සේනානිෂ්ඨවෙත්වා යි ද පතමින් මෙ දෙසුම නවත්වමි.

**හැමට සාමය, ශාන්තිය හා සමෘද්ධිය වේවා!**

<u>*1981.03.27*</u>

# The Responsibility of the Community of Sangha of Sri Lanka

## Dr. Ven. Paravahera Paññānanda Thero

I think that today is a very special day that would go into the annals of history. The reason is, today the University confers honorary degrees to two very great elder monks who traditionally come from the Theravada community of Bhikkhus and that the convocation address too is delivered by a respected member of the Sangha. On this historic occasion, I wish to offer my grateful thanks and blessings to the Chancellor, the Vice-Chancellor, the Deans of the Faculties, Professors and Lecturers and the learned members of the Council and the Senate for conferring me with an honorary degree by appreciating and evaluating the services rendered by me to the country, the people and the religion. I consider this award not merely as a personal honour to me but also as a great honour to the whole Maha Sangha of this country. This would no doubt serve as a great encouragement and an example to the younger generation of Bhikkhus in the country.

During the days of the ancient Sinhala Kings, the erudite and scholarly monks who were well-versed in Dhamma Vinaya (Doctrine and Discipline) were honoured with such titles as "Rajaguru" (Royal Teacher) and "Rajakreeta" (Royal Crown). The Sinhaladveepa (the island of the Sinhalas) is a land offered many a times to the Triple Gem by Royalty. Further the island of Sri Lanka has been offered to the Swarnamali Maha Chyaitya, to the Sri Maha Bodhi and exponents of the Doctrine by the ancient Sinhala Kings, on various occasions. Just as a vihara is entrusted to a trustee the community of monks handed back the island to the king, on the understanding that it will be ruled and safeguarded on the advice of monks. According to this, the whole island of the Sinhalas including the Northern and Eastern Provinces belongs to the Buddha Sasana. The Sinhala are the permanent trustees and the Bhumi putras (sons of the soil) of the Sinhala' Land (the Sinhala Desa). The Government elected by them should rule the country righteously under the guidance of the Maha Sangha. If not the rulers will face unfavourable consequences. The Government and the people should take this into serious consideration. Defeating the schemes and strategies of the enemies, it is the Community of Maha Sangha that continued to protect and develop the Sam Buddha Sasana, and the Languages, Literatures, Arts and Sciences of the Sinhala Desa.

I think it is appropriate for me to refer to the system of Buddhist Education that has been prevalent in this country since the introduction of Buddhism. Buddhist system of Education consists of two aspects — Pirivena Education and Daham Pasal Education. Comparatively speaking, Buddhist system of Education is a well balanced and a wholesome system. The Sinhala race became a law-abiding and disciplined nation, with supreme creative genius in the world as a consequence of the ideal system of Buddhist Education imparted by the great community of Maha Sangha for over two thousand years.

Since the country's foreign domination for over 400 years both the great community of Maha Sangha and the Sinhala race lost their vigour, vitality and rights. For the last four centuries no Government in Sri Lanka has constructed or built a single Vihara or Arama and no government gave the Buddhist System of Education its due place and recognition. If any renaissance in Buddhist Education occurred, if any temple or monastery was constructed, if any development in Sinhala arts and crafts, and the revival of the language and literature took place during the last four centuries all that was done under the patronage of the great community of Maha Sangha with the help and support of the generous Buddhist public. Instead of supporting and assisting, what all Governments actually did was to bring all the revenues of all Buddhist temples and monasteries under the public trustee. This policy yet continues as regards the Buddhist temples but the Government has not extended its controls on the revenues of non-Buddhist institutions. For more than two thousand five hundred years Buddhist monk has incessantly worked for the good and welfare of the suffering humanity by showing them the path to Deliverance and, quite strangely, in spite of this the monk has himself been subjected to criticism and ridicule for rendering such selfless service. Though confronted with indescribable difficulties, obstacles and hardships he leads a very simple life, practicing what he preaches with his mind conditioned by the fourfold Brahma Viharas. Being free from the Four States of Woe (the satara Agati) namely (1) Greed (Chanda) 2) Hatred (Dõsã) 3) Bhaya (Fear) and 4) Ignorance (Mõha) he endeavours to uplift the downtrodden from the state of suffering that they are plunged in.

Anyone who received the traditional System of Pirivena Education is capable of solving any human problem. If the Government really is sincere in its professed objective of establishing a righteous society (a Dharmista Samãjaya) then the Government should take the monks and laity into confidence and restore their due place and rights. The educated erudite, virtuous, disciplined community of Mãha Sangha are not consulted on matters concerning Buddha Sasana, education and culture. The object of establishing a righteous society (a Dharmista Samajaya), should not be limited to words.

The all knowing Omniscient Buddha has taught that the Bhikkhus who work compassionately with loving kindness for the welfare of others are worthy of receiving a "Ratta pinda" — a wage or a salary. Both the Sutta Pitaka and the code of Vinaya says that the Bhikkhus are worthy of receiving "Achariya Bhãga" or fourfold requisites. For example, the Mihintale rock edict of King Mahinda IV states that the ancient kings paid emoluments to Bhikkhus in accordance with the services rendered by them. I wish to state without any hesitation that it is the bounden duty of both the State and the educational institutions to pay adequate wages to the Bhikkhus who engage themselves in educational services and public services that are not in contradiction with the principles of the Sasana. The ancient Sinhala kings were philanthrophic enough to donate lands to the Mãha Sangha who wrote books on language, literature, culture, arts and crafts. As this country is the property of the Noble Triple Gem it is the right and privilege of the Bhikkhus to erect vihãras and build temples and monasteries and reside wherever they want and guide the laity on the Right Pãth. That right and privilege should not be taken away from them.

The highest institute of education in a country is the University and the conduct of research is one of its primary functions. It should just not be a factory producing graduates but an institution producing

scholars and experts on various fields of studies. Therefore all our Universities should be developed according to the highest traditions befitting supreme seats of learning Both the National System of Education and the System of University Education should be free and emancipated from the shackles of the bureaucracy.

There is a question that the people should raise. The future of the country rests not only on the economic development of the country but also on the spiritual upliftment of its people. Its the responsibility of the Government to create the infrastructure and the necessary environment for people to develop themselves. The temple plays a vital role in the moral and spiritual development of the people by showing them the righteous path. The Government creates economic opportunities. Therefore, the close relationship between the temple and the State should continue without a break, because it is this relationship that has safeguarded and protected the national culture. As a result development takes place, and development means not only the production of wealth but also its equitable distribution among the people. The Buddha explained these matters to contemporary millionaires like Anatha Pindika and Visakha.

The Government has to spend a vast amount of money for development. The capitalists and philanthropists should also participate in the developmental effort by voluntary contributions. Even in Sri Lanka, we get rich among the Sinhala, the Tamils and the Muslims etc. The Government alone cannot support the entire system of Education both in the fields of General Education and Higher Education. For that the active support and participation of the philanthropists are absolutely essential. Therefore in order to make higher education successful, the donations of the capitalists should be received by both the State and Higher Educational Institutions like Universities. The Government should at least temporarily suspend begging missions to foreign lands and instead utilize the resources locally available for developmental activities. Sri Jayewardenepura is the Capital of Sri Lanka May the philanthropists of this country endeavour to make its University the greatest Educational Institution in the world by voluntarily contributing towards its progress.

Whatever I have said in this address to the convocation of the University of Sri Jayewardenepura is without any reference to persons or parties, and without malice or prejudice to any individual or community, but with one objective and hope in mind that of seeing this Sinhala Desa reemerging as a haven of peace and prosperity with Buddhism and its culture flourishing once again, surpassing even its pristine glory. I conclude by wishing; May the Sri Jayewardenepura University become well known all over the world, may it gain honour and universal respect, may its Chancellor, Vice-Chancellor, Professors and Lecturers, and members of the Senate and the Council live long and happily for the welfare and progress of all.

**May Peace, Harmony and Prosperity be with you all!**

*1981.03.27*

# 05

# සන්නිවේදනයේ නූතන ප්‍රවණතා

## ආචාර්ය ආනන්ද තිස්ස ද අල්විස්

සම්මාන උපාධියක් මවෙත පිරිනැමීම සම්බන්ධයෙන් කුලපතිතුමාටද, උපකුලපතිතුමාටද, පීඨාධිපතිවරුන්ටද, මහාචාර්යවරුන්ටද, ආචාර්යවරුන්ටද, සනාතන සභාවේත්, පාලක සභාවේත් විද්වතුන්ටද, මගේ හද පත්ලෙන්ම නැගෙන ස්තුතිය පිරිනැමීමට කැමැත්තෙමි. මෙය මා සලකන්නේ පුද්ගලයකු වශයෙන් මවෙත පිරිනැමෙන ගෞරවයක් වශයෙන් නොව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය හා එම විශ්වවිද්‍යාලයේ විද්වතුන් විසින් ජන සන්නිවේදන විද්‍යාවට පුදනු ලැබූ සැලකිල්ලක් වශයෙනි.

සත්‍යය ගවේෂණය කිරීම තම කාර්ය භාරය කොටගත් අය මෙලොව ඇත්තාහ. මේ අය විසින් කරනු ලබන්නේ මිනිසාට ශිෂ්ටාචාරය ගෙන දීමත් එමගින් විශාල පුරවරයන් ගොඩ නගා සංස්කෘතීන් වර්ධනය කර විවිධ ලබ්ධීන් ජනිත කර මිථ්‍යා විශ්වාස නමැති සම්බාධක ඉවත් කිරීමත් ය. මුල් බැහැගත් විශ්වාසයන්ටද, වචනවල අරුත්වලටද, චින්තනයටද නිරන්තර අභියෝගයක් මොවුන් විසින් එල්ල කරනු ලැබේ. මේ ක්‍රියාවලිය සමහරුන් හඳුන්වන්නේ ''පර්යේෂණ'' වශයෙනි. අන්‍යයෝ එය ''භාවනා'' යනුවෙන් හඳුන්වති. නව සංකල්පනාවක් තම විඥානය තුළින් විදුලි සැරයක් මෙන් දීප්තිමත්ව විහිදී යන ඉතා දුර්ලභ ගණයේ අත්දැකීමක් ලත් විට අප එය හඳුන්වන්නේ නව ඥාන මාත්‍රයක් පහළවීමක් වශයෙනි.

සංකල්ප විස්තර කිරීම සඳහාත්, විශ්ලේෂණය කිරීම සඳහාත්, ප්‍රබුද්ධ ගණයේ සඟරා හා ග්‍රන්ථ ඇත. එහෙත් විද්වතුන් වැනි සුළු කොටසකට වඩා පෘථුල වූ ජන කොටස්වලට එවැනි සංකල්ප බොහෝ විට ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ. එවැනි සංකල්ප නිසා දුම්රියේත්, බසයේත්, වෙළඳ පළේත් දක්නට ලැබෙන ජන ජීවිතය කෙරෙහි ඇති වෙන බලපෑම් පිළිබඳවද අවබෝධයක් පුළුල් වශයෙන් ප්‍රචලිත කළයුතු වෙයි. මෙවැන්නක් ප්‍රකාශ කිරීම සඳහා වෙනස් ස්වර තන්ත්‍රයක් අවශ්‍ය වේ. වෙනත් හඬක් අවශ්‍ය වේ. ඒ හඬ රැගත් ස්වර තන්ත්‍ර ජනසන්නිවේදන විද්‍යාඥයා සතු හඬ වේ.

විද්‍යාව විසින් නිර්මාණය කරන ලද්දා වූද, නිරන්තරයෙන්ම ඉස්මතුවන නව සොයා ගැනීම් විසින් ඉදිරියට තල්ලු කර හරිනු ලබන්නා වූ ද, පාරිභෝගික සමාජයට මිනිසාගේ සිත් තුළ පහළ වන නව අදහස් පිළිබඳ අවබෝධයක් අවශ්‍ය වේ. සමාජයේ එම අපූර්ව ස්වභාවය නිසාම නව නිෂ්පාදිතයන් ඉල්ලුම් කරනු ලැබේ. එබැවින් ලොවට ප්‍රකාශ කිරීම සඳහා වඩා ඉක්මන් මාර්ග සෙවීම සන්නිවේදකයාගේ කාර්යභාරය වේ.

රූපවාහිනිය පැතිරවීමට පෙර ගුවන් විදුලිය ප්‍රබල මාධ්‍යයක් විය. එකල ග්‍රාමීය ඇමෙරිකාවේ ජීවත් වූ දහස් ගණන් පවුල් සමග සම්බන්ධතාවක් පවත්වා ගැනීම සඳහා ජනාධිපති රූස්ට්වෙල්ට් ගුවන් විදුලිය මගින් සුහද සාකච්ඡාවන්හි යෙදුනේය. ඔහු දේශනයන් කළේ නැත. ගුවන් විදුලි යන්ත්‍රයක් වටා රැස්ව සිටි ඔහුගේ නොපෙනෙන අසන්නන් සමඟ ඔහු කතා බහ කළේය. ඒ අයට

වොෂිංටන්හි සිට කතා කෙරෙන මිතුරු හඬක් ඇසිනි. ඒ මිතුරු හඬින් ප්‍රකාශ වූයේ ඒ අයගේ ප්‍රශ්න පිළිබඳ අවබෝධයක් ඇති බවත් ඒවා බලා හදා ගන්නා බවත්ය.

රූස්ට්වෙල්ට් නිතර ගුවන් විදුලියෙන් කතා නොකළේය. ඔහු සුහද සාකච්ඡාවක් පැවැත් වූයේ සති තුනකට වරක් හෝ මසකට වරක් හෝ පමණි. ඒ සෙමින් සෙමින් කටයුතු සිදු වූ කාලයකි. අද ඇමෙරිකානු ජනාධිපතිවරයා රූපවාහිනි ප්‍රචාරයට විවෘත වී ඇත. සාමාන්‍යයෙන් සතියකට වරක්වත් මුළු ලොවම ඔහු දකී. ඔහුගේ කටහඬ අසයි.

ජනාධිපති නසර් විසින් මැද පෙරදිග ජනතාවට දහස් ගණන් ගුවන් විදුලි යන්ත්‍ර නොමිලේ බෙදා දෙන ලදි. ඔහු විසින් එසේ කරන ලද්දේ කයිරෝ නුවර සිට ප්‍රචාරය වන ඔහුගේ කථාවන් අරාබි ලෝකයට ද ඇහෙන්නට හැකිවන පරිදිය. මේ කරුණ නිසාම අරාබි ජනමතය එක්සත් වී තහවුරු විණි. අදත් ඒ ජනමතය ශක්තිමත්ව පවතී.

අයොතුල්ලා කුමේනි වසර බොහෝ ගණනක් ජීවත් වූයේ පැරිස් නගරයෙහිය. එහෙත් ඉරාන ජාතිකයන් වෙතට එල්ල වුණු ඔහුගේ කතා කැසට්පටිවලට ගෙන ඉරානය තුළට හොරෙන් යවා ප්‍රචලිත කරන ලදි. මේ මඟින්ම ඉරානය තුළ බලගතු ව්‍යාපාරයක් හට ගැනී ලෝකයේ පැරණිතම රාජාවලියකට අයත් රජෙක් බලයෙන් පහවිය.

එක් රටක සිට අනික් රටකට කරනු ලබන ගුවන් විදුලි ප්‍රචාර සමහරවිට සමහර රටවල් විසින් විද්‍යුත් උපකරණ යොදා වළක්වනු ලැබේ. එහෙත් සන්නිවේදන චන්ද්‍රිකාවන් නිසා එක් එක් රාජ්‍ය තන්ත්‍රයක් විසින් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්ති පවා අභිබවා යමින් තමන්ට කැමති ප්‍රචාරයන්ට සවන් දීමට අවස්ථාවක් රටවැසියනට දූන් ලැබී ඇත. (දකුණු ඉන්දියාවෙහි දූරදර්ශන් ප්‍රචාරයට වඩා රූපවාහිනිය ප්‍රිය මනාප වී ඇත.)

විද්‍යාඥයන් විසින් මානව සංහතියට විවිධ අදහස් හා භාණ්ඩ තෝරා ගැනීමේ පුළුල් නිදහස ලබාදී ඇත. ජාත්‍යන්තර සම්මන්ත්‍රණවල දශක ගණනාවක් තිස්සේ තර්ක විතර්ක පැවැතුණු නමුදු මේ තේරීමේ නිදහස නවීනතම විද්‍යාව පැමිණෙන තුරු මානව සංහතියට අහිමි වී තිබිණි. එහෙත් තමන්ගේ ආර්ථිකයක් පරිපාලනයට හා විධානයට හසු කිරීමට තීරණය කර ඇති ජාතීන්ගේ මති මතාන්තර හා ඒ නිදහස ගැටේ. ඔවුන් සඳහන් කරන්නේ සමස්තයක් වශයෙන් ගත්කල ''ප්‍රවෘත්ති'' යන්න භාණ්ඩයක් හැටියටය. වුවමනාවෙන්ම විශාල ප්‍රවෘත්ති පද්ධති ප්‍රවෘත්ති විකෘති කරන බවත් ලොවට ඒ ප්‍රවෘත්ති කියා පෑමේදී තමන්ගේ දෘෂ්ටි කෝණය කවනු ලබන බවත් ඔවුහු ප්‍රකාශ කරත්.

යුනෙස්කෝ සමුළුවලදී වාක් සංග්‍රාමයක් දූන් පවතින්නේ රජය විසින් ජනසන්නිවේදන මාධ්‍යය පරිපාලනය කළ යුතු ද සමාජයට හිතකර වූ කරුණු පමණක් ප්‍රචාරය කළ යුතු ද යන්න ගැනයි. වෙනත් වචනවලින් කිවහොත් තමන්ට පෙනෙන හැටියට ජනසන්නිවේදන මාධ්‍යය විසින් සියල්ල කිව යුතු ද? එසේ නැතහොත් ප්‍රවෘත්ති ප්‍රවාහය පිළිබඳ පරිපාලනයක් තිබිය යුතු ද? මේ ගැනය විවාදයක් හටගෙන ඇත්තේ.

ඇමෙරිකා එක්සත් ජනපදය වැනි විවෘත සමාජයන්හි මහජන ප්‍රසාදය දිනා ගැනීම සඳහා විවිධ සන්නිවේදන මාධ්‍යය තියුණු තරඟයක යෙදේ. එවැනි සමාජයක පෙන්ටගන් තුළ සන්ත්‍රාසයත් ඇමෙරිකාවේ මිතුරන්ගේ පුදුමයත් සතුරන්ගේ සතුටත් ජනිත කරමින් යුද්ධ අවි හා යුද්ධෝපාය

පිළිබඳ රාජ්‍ය ලේඛන ද වරින්වර පළකරනු ලැබේ. පාලිත සමාජයන්හි රාජ්‍ය තන්ත්‍රයේ දේශපාලන හෝ ආර්ථික අරමුණු හා සම්පාත වන ප්‍රවෘත්ති හා අදහස් උදහස්වලට ප්‍රමුඛතාව ලැබේ.

යථා දෘෂ්ටියෙන් බලන විට පෙනීයන්නේ පාරිභෝගික වරණයට ඇති ඉඩකඩ හීන කරලමින් ආර්ථිකයේ යම් යම් අංශ පමණක් දියුණු කිරීමේ ප්‍රතිපත්ති අනුගමනය කරන රාජ්‍යයක පූර්ණ ප්‍රවෘත්ති නිදහස පරස්පර විරෝධී සංකල්පයක් වන බවය.

විවිධ සන්නිවේදන මාධ්‍යයන් බහුල වශයෙන් ප්‍රචලිත වී ඇත්තේ විද්‍යාව හා තාක්ෂණය විසින් ඒවා ඉතා සියුම් ලෙස කාර්යක්ෂම කර ඇති නිසාම නොවේ. ජනසන්නිවේදන මාධ්‍යය ඇබ්බැහිකම් ඇති කරයි. අපි බොහෝ දෙනෙක් පුරුදු වී ඇත්තේ උදේ තේ බීමත් පුවත්පත් බැලීමත් යන රිද්මයටය. සමහරුන්ගේ රිද්මය වන්නේ උදේ තේ බීමත් මිහිරි සංගීතයත් යන දෙකටමය. උදෑසන ගුවන් විදුලියේ රිද්මය අනුව විවිධ ජාතීහු අවදිව තම වැඩපලවල යෙදෙති. වැඩපොලෙහි පවා සමහරු ගුවන් විදුලි යන්ත්‍රය ළඟ තබාගෙන එයට සවන් දෙමින් තම කාර්ය භාරයන්හි යෙදෙති. එසේම ඇස් කන් දෙකම පිනවන ගෙදරදොරේ ''කතා - දර්ශන පෙට්ටිය'' කෙතරම් ඇබ්බැහියක් ගෙන දෙන්නේද යත් අමුත්තන් සමඟ පිළිසඳරේ යෙදීම පවා දැන් අනවශ්‍ය වී ඇත.

මේ නිරන්තර ප්‍රචාරයේ ඵලය ඉතා දෘඪතර වේ. මෙයින් හානිකර හෝ විනාශකාරී යන අරුත ගෙන දීමට මම අදහස් නොකරමි. මා ප්‍රකාශ කරන්නේ විධිමත් අධ්‍යාපනයක් ලබාගැනීමේ මන්දගාමී ක්‍රියාවලියටත් රට රටවල්වල ඇවිදීම නමැති වඩා විය පැහැදම් දැරිය යුතුවන ක්‍රියාවලියටත් වඩා ජාතීන් කෙරෙහි විශාල බලපෑමක් මේ මාධ්‍යයන්ට ඇතිකළ හැකි හෙයින් ඒ මාධ්‍යයන්ගේ ප්‍රතිඵල දෘඪතර යන බවයි.

ජනසන්නිවේදන මාධ්‍යන්ගේ වැඩුමත් ඒ මාධ්‍යයන් පවත්වාගෙන යෑමේ විය පැහැදම් වැඩිවීමත් නිසා ප්‍රචාරය කෙරෙහි වැඩි සැලකිල්ලක් අද දක්වන්නට සිදුවී ඇත. වෙළඳ ප්‍රචාර නොමැතිව නවීන ජනසන්නිවේදන මාධ්‍යය එක්කෝ මියයනු ඇත. නැත්නම් ඒවාට ආණ්ඩුවේ සහනාධාර අවශ්‍ය වනු ඇත. කිසියම් ව්‍යවහාර මුදලකින් ඒකක 10 ක් වියදම් කොට පුවත්පතක් පාඨකයෙකු ගනිත් නම් ඒ පුවත්පතම දැන්වීම් ආදායම් නොලැබ පළ කරනු ලබන විට එහි මිල ඒකක 100ක් වනු ඇත.

ප්‍රචාරක කටයුතු අද අතිවිශාල කර්මාන්තයක් බවට පත්වී ඇත. එය ජනසන්නිවේදන මාධ්‍යයේ අත්‍යවශ්‍ය අංගයක් වී ඇත. අලෙවිය සඳහා ද ඉවත් නොකළ හැකි අංගෝපාංගයක් වී ඇත. නවීන විද්‍යාව විසින් සපයනු ලබන අතිවිශාල භාණ්ඩ සම්භාරය ද නවීන මිනිසා විසින් අපේක්ෂිත අති විශාල භාණ්ඩ සම්භාරයද නිසාත් නවීන ජාතීන් විසින් පවත්වා ගෙන යා යුතු සේවා නියුක්ති මට්ටම් නිසාත් ජනසන්නිවේදන වර්ණාවලියෙහි ප්‍රමුඛ ස්ථානයට දැන්වීම් සන්නිවේදනය පත්වී ඇත.

දැන්වීම් ප්‍රචාරණය පිළිබඳව ප්‍රැන්ක්ලින් රූස්ට්වෙල්ට් මෙවැන්නක් ප්‍රකාශ කොට ඇත.

*''මවිසින් ජීවිතය නැවතත් මුල සිට ආරම්භ කරන්නේ නම් අන් කිසිම දෙයකට වඩා දැන්වීම් ප්‍රචාරය කිරීමේ රැකියාවක යෙදීමට මගේ සිත නැමෙනු ඇත. මක්නිසාදයත් මිනිස් වුවමනාවන් පද්ධතියම පුරා පැතිර යමින් මිනිස් මනස පිළිබඳ ගැඹුරු අවබෝධයක් හා නව චින්තන ක්‍රම පද්ධතියක් ප්‍රචාරක මාධ්‍යය අපේක්ෂා කරන හෙයිනි. වැදගත් දේ පිළිබඳ සත්‍ය දැනුම අතිවිශාල ජනකායකට එමඟින් ගෙන දෙනු ලැබෙන නිසාත් එය එක් විදියක අධ්‍යාපනයක් වෙයි. එය ඉතා වේගයෙන් කලාවක් බවට පත්වී ඇත. එය සැමවිටම නව මං සොයයි. නවීන ශිෂ්ටාචාරයේ*

*ගුණාත්මක තත්ත්වයන් පසුගිය අඩ ශත වර්ෂය තුළ සිදුවීමට හේතු භූත වූයේ දැන්වීම් ප්‍රචාරය මගිනි.''*

දැන්වීම් ප්‍රචාර කටයුතුවල යෙදී සිටින්නා ජනසන්නිවේදන මාධ්‍යය රැක බලා ගන්නා වූ හෝ ශිෂ්ටාචාරයේ මට්ටම් ඉහළ දැමීමට වෙහෙසෙන්නා වූ හෝ දානපතියෙක් නොවන්නේය. එහෙත් ස්වාර්ථය තුළින් ඉහත සඳහන් අරමුණු දෙකම ඔහු ඉටුකර ගනී. ප්‍රචාරකයා පුවත්පතක ඉඩකඩ හෝ එළිමහනේ දැන්වීම් පුවරු හෝ ගුවන් විදුලි හා රූපවාහිනියේ කාලච්ඡේද හෝ ලබා ගන්නේ එයට වැය වන මුදල සැලකිල්ලට ගෙනය. මේ වැයවන මුදල ගණන් බලනු ලබන්නේ තමන්ගේ පණිවිඩය ග්‍රාහකයන් 1000 කට ගෙන යෑමට වැය වන මිල මුදල් වශයෙනි. රූපවාහිනියේ දැන්වීම් ප්‍රචාරයක් බ්‍රිතාන්‍ය පවුම් 100 ක් වන්නේ නම් ප්‍රචාරකයා කල්පනා කරන්නේ ඒ මිලට කෙතරම් ජනකායකට තම පණිවිඩය ගෙන යා හැකි ද යන වශයෙනි. ජනකායෙන් 1000 කට මේ පණිවිඩය ගෙන යාහැකි නම් ඒ පුද්ගලයෙකු වෙත එම පණිවිඩිය ගෙන යෑමේ විය පැහැදම එක් පවුමක් වේ. මෙවැනි ප්‍රශ්න තවත් සංකීර්ණ වී ඇත. එනම් මේ ප්‍රචාරය කරනු ලබන්නේ තමන්ගේ භාණ්ඩය හෝ සේවාව අපේක්ෂා කරන පුද්ගලයන්ට ද යන ප්‍රශ්නය පැන නැඟේ. විය පැහැදම් වැඩි වෙත්ම තරඟය තියුණු වෙත්ම මෙවැනි ප්‍රශ්න වඩ වඩාත් අසන්නට සිදුවේ. මක්නිසාද වෙළඳ ප්‍රචාරය සඳහා මුදල් වියදම් කරනු ලබන්නේ නම් ඒ මුදල් නාස්ති නොවිය යුතු යැයි ප්‍රචාරකයාගේ විශ්වාසය වන හෙයිනි. මෙවැනි ප්‍රශ්නවලට පිළිතුරු නොලැබෙන්නේ නම් තරඟය තුළින් වෙළඳ ප්‍රචාරකයා වෙළඳ පොළෙන් ඉවතට තල්ලු කරනු ලැබේ. එබැවින් ජනසන්නිවේදන මාධ්‍යය තියුණු පර්යේෂණයට ලක්කරනු ලැබේ. සත්‍ය පිළිතුරු ලබා ගැනීමට මෙය උපයෝගී කරගනු ලැබේ. මෙවැනි මාධ්‍යය සම්බන්ධයෙන් කෙරෙන ප්‍රචාර විවිධ ස්වරූප ගනු ලබන අතර ඒ සියල්ලගේම අරමුණ වන්නේ එක් මූලික ප්‍රශ්නයකට පිළිතුරු ලබාගැනීමය. **එනම් පාඨකයා/ශ්‍රාවකයා කවුරුන්ද** යන්නයි.

මෙහි ප්‍රධාන අරමුණ වන්නේ විවිධ කාලච්ඡේදයන්හිද, විවිධ ප්‍රදේශවලද විවිධ මාධ්‍යයන් සඳහාද ශ්‍රාවක පාඨක ජනයාගේ පැතිකඩක් ලබාගැනීම වේ. පර්යේෂණ තුළින් ශ්‍රාවක පාඨක ජනතාව පිළිබඳව බොහෝ කරුණු ලබා ගැනීම අවශ්‍යය. ඔවුන්ගේ වයස ස්ත්‍රී පුරුෂ භාවය ආදායම ජීවත්වන ප්‍රදේශය ආදිය මේවාට ඇතුළත් වේ. මෙවැනි තොරතුරු ලැබුණ විට තම පණිවිඩය සකසා ගැනීමට අවශ්‍ය සුදුසුතම මාධ්‍යය ප්‍රචාරකයා විසින් තෝරාගනු ඇත. එපමණක් ද නොව තම පණිවිඩියේ අන්තර්ගත කරුණුත් එම පණිවිඩයේ ස්වරූපයත් එමඟින්ම සැකසෙනු ඇත.

ප්‍රචාරක කටයුතු තනිවම නො පවතී. එය **අලෙවිය** යනුවෙන් හැඳින්වෙන අති විශාල කර්මාන්තයක කොටසකි. *''නිෂ්පාදන ස්ථානයේ සිට පරිභෝජන ස්ථානය වෙත උපරිම වේගයෙන් හා අවම විය පැහැදමින් යුතුව කිසියම් භාණ්ඩයක් විද්‍යාත්මකව බෙදා හැරීම අලෙවිකරණය වේ.''* (Market Research and Scientific Distribution by A.H. Davies and O.W. Palmer)

අලෙවිකරණය සම්බන්ධයෙන් පැන නැඟී ඇති සංකල්පයකි ''අලෙවි මිශ්‍රණය'' යන්නය. මෙම මිශ්‍රණයට අවශ්‍ය වන අංග කිහිපයක් ඇත.

1. නිවැරදි පර්යේෂණ
2. යෝග්‍ය නිෂ්පාදිතය
3. සුදුසුතම අසුරණය
4. නිසි බෙදා හැරීමේ ස්ථාන
5. යෝග්‍ය මිල
6. මනෝඥ ප්‍රචාරය

මේ හැරුණු විට මෙම මිශ්‍රණයට නිරන්තර පර්යේෂණ අඩංගු වේ. ව්‍යාපාරයක කටයුතු නිරන්තරව පවතින්නක් වන හෙයින්ද වසරක් පාසා පවත්නා තත්ත්වයන් වෙනස්වන හෙයින්ද නිරන්තර පර්යේෂණ අවශ්‍ය වේ.

දැන්වීම් ලිවීම ලේඛකයාගේ කාර්යභාරයකි. සිරස්තල හා අවශ්‍ය වාක්‍ය ඔහු විසින් ලියනු ලැබේ. කෙටි අමතක නොවන වැකි බොහෝ විට ප්‍රචාරක දැන්වීමක දක්නට ලැබුන ද නවීන ප්‍රචාරයන් සටන් පාඨවලින් ඈත්ව ඇත. දැන්වීමකට අවශ්‍ය වැකි සම්පාදනය කිරීම විශේෂ නිර්මාණ කුසලතාවක් අවශ්‍ය කාර්යයකි. එවැනි කුසලතාවන් ඇති අය මෙම වෘත්තීයෙහි අද්විතීය ස්ථානයක් ගනිති. ලෝක ප්‍රසිද්ධ ලේඛකයන් වන ඇල්ඩස් හක්ස්ලි හා අර්නස්ට් හෙමින්ග්වේ වෙළඳ දැන්වීම් ප්‍රචාරයකට අවශ්‍ය ලේඛන කලාවේද වරක් නියැලෙන්නට පටන් ගත්හ. ඒ කටයුත්තේ ඇති දුෂ්කරතාව හා ගාම්භීරත්වය ඔවුන් විසින් පසුව ප්‍රකාශ කර ඇත. හොඳ දැන්වීමක් ලිවීම හොඳ කවක් ලිවීමටත් වඩා දුෂ්කර යැයි හක්ස්ලි ප්‍රකාශ කර ඇත.

ඉතා ශ්‍රේෂ්ඨ දැන්වීම් තුළ මිනිස් ළතෙත් බවත්. උණුසුමත්, හසරැළි නංවන සුළු බවත් ගැබ්ව ඇත. ජීවත්වීම ප්‍රීතිදායක කරවන ඉතා සුලු දේවල් ඒවායේ ගැබ්වී ඇත. දරුවකුගේ හසරැළිවල දක්නට ලැබෙන අපූර්ව සුන්දරත්වය හා ඒ දරුවාගේ කඳුළුවල ගැබ් වී ඇති ඛේදවාචකයද, තුරුණු ආදරයේ සිහින හා සුන් වූ බලාපොරොත්තුවල දක්නට ඇති ශෝකීභාවය යනාදී සියල්ලම දැන්වීම් වැකි ලියන්නාගේ හදවත් තුළ ද මනසෙහි ද තිබිය යුතුවේ.

පැරණි අගලක් අසල සිටින කුඩා දරුවන් දෙදෙනෙකුගේ ඡායාරූපයක් කොඩැක් සේයාරූ සමාගම විසින් දක්වනු ලබයි. නූලක් අග, නැමුණු ඇල්පෙනිත්තක් ගැටගසා ඒ නූලේ අනික් අග කොටුවක ගැටගසා පිරිමි ළමයා මසුන් අල්ලන්ට තැත් කරයි. ගැහැණු ළමයා නොසැලී බලාපොරොත්තුවෙන් යුතුව ඒ දෙස බලා සිටී. ඒ ඡායාරූපයට ශීර්ෂ පාඨයක් වශයෙන් ඉපැරණි ගීතයක ඛණ්ඩයක් වන ''මතක සටහන් තැනෙන්නේ මේවායෙන්'' යැයි සඳහන් වෙයි.

බටහිර ලෝකයේ රටවල විශාල ප්‍රචාරක දැන්වීම් අඩු මිලට සකසා ගත හැකි හෙයින් වසරක් පාසා දහස් ගණන් එවැනි දැන්වීම් නිකුත් කරනු ලැබේ. ෆෝඩ් මෝටර් රථ සමාගම විසින් බිළිඳුන් ගෙන යන ප්‍රෑම් රියක් පෙන්වා මෙවැනි සිත්ගන්නා සුලු පාඨයක් එයට යොදයි. ''ෆෝඩ් රථයට වඩා විකිණෙන්නේ මේ රිය පමණි.''

ලෝ පුරා දහස් ගණන් ඉතා ආකර්ෂණීය වෙළඳ දැන්වීම් නිර්මාණය කරනු ලැබේ. ඒවායින් යහපත්ම දැන්වීම් ක්ෂණික චින්තන ශක්තියක් ඇති ලේඛකයන්ගේ හා වෙනත් කලා කරුවන්ගේ හපන් කම් වේ.

සාමාන්‍යයෙන් සංඥා නාම ඇති භාණ්ඩ ප්‍රචාර කිරීම සඳහා ඉතා ප්‍රවේශමෙන් සකසන ලද සැලැස්මක් අවශ්‍ය වේ. පර්යේෂණ කටයුතුවලට ද මූලික ප්‍රචාරක කටයුතු වලටද පරීක්ෂණ කටයුතුවලට ද හය මසක් පමණ ගතවේ. පරීක්ෂණ හා පර්යේෂණයන්ගේ ප්‍රතිඵල පරීක්ෂණයට භාජනය කිරීමට අවශ්‍ය වන්නේ දශ ලක්ෂ ගණන් මුදල් ප්‍රචාරක ව්‍යාපෘතියක් සඳහා යොදවනු ලබන බැවිනි. දැන්වීම් මාලාවක් හෝ නිවේදන මාලාවක් හෝ සැකසීමට ප්‍රථම ඒ ප්‍රචාරක වැඩකටයුතුවලින් විසඳීමට අදහස් කරන අලෙවිකරණ ප්‍රශ්නය කුමක්දැයි සොයා ගත යුතුයි. ඒ ප්‍රශ්නය නැතහොත් අරමුණ නිසියාකාරව සොයාගත නොගතහොත් ඒ ප්‍රචාරයෙන් වැඩක් නොවේ. එබැවින් ප්‍රචාරක කටයුතු කලාවත් විද්‍යාවත් දෙකම උපයෝගී කර ගනී.

විවිධ මාධ්‍යයන්හි දැන්වීම් ප්‍රචාරය අන්තර්ගත පණිවිඩය අතින් ද ස්වරූපය අතින් ද වෙනස් නොවේ. විවිධ මාධ්‍යයන් අනුව පණිවිඩය වෙනස් වන්නේ එය ඉදිරිපත් කරන අයුරිනි. පුවත්පත්හි දැන්වීම් නිශ්චල දැන්වීම් වේ. එහෙත් ඒ සම්බාධකය රූපවාහිනියේ නැත. වර්ණ රූපවාහිනියෙන් කිසියම් නිෂ්පාදිතයක් ඇත්තටම භාවිත වන අයුරු දක්වන ඉරියව්, චලනය වර්ණය හා හඬ උපයෝගී කර ගනී. සුගන්ධය පමණක් පර්යේෂණාංගාර දශකයක් ගතවනවාත් සමඟම අපට ලැබෙනු ඇත. කොහේ නමුත් විශ්වවිද්‍යාල ආචාර්යවරයෙකු රෝස මලක සුවඳ සැතපුම් දහස් ගණනක් විහිදුවාලීමේ ක්‍රම පිළිබඳ පර්යේෂණ දැන් කරනු ඇත. අද එවැන්නකු නොමැති නම් වැඩිකල් නොගොස්ම එවැන්නකු බිහිවනු ඇත.

ජනසන්නිවේදනයට අවශ්‍ය ශිල්පය, පුහුණුව හා දැනුම ප්‍රායෝගිකව ලබා ගත්තක්ම නොවේ. ඉන් වැඩි හරියක් බටහිර ලෝකයේ විශ්වවිද්‍යාලයවලින් ලැබිණි. අලෙවිකරණය, අලෙවි පර්යේෂණ, ප්‍රචාරය, නිෂ්පාදිතයන් තැනීම වැනි විෂයයන් ඇමෙරිකාවේ විශ්වවිද්‍යාලයවල උගන්වනු ලැබේ. ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව සිය පාඨමාලා සම්බන්ධයෙන් ලෝක පූජිත විශ්වවිද්‍යාල අද ඇත.

සමහර විශ්ව විද්‍යාලවල මෙවැනි පර්යේෂණයන්ගේ සමහර අක්ෂරවල හඬ ප්‍රිය මනාප වන්නේ යැයි ද ඒවා ප්‍රචාරය සඳහා සුදුසු වන්නේ යැයි ද හෙළිවී ඇත. එසේම යම් යම් වෘත්තීන්වලට යම් යම් අය යොමුවන්නේ කුමක් නිසාද යම් අය මිතුරන්ට යම් යම් ත්‍යාග මිලදී ගන්නේ කුමක් නිසාද යන්න පිළිබඳව විශ්වවිද්‍යාලවල මනෝ විද්‍යාඥයෝ පර්යේෂණ කරති. මෙය යොමුව පිළිබඳ මනෝ විද්‍යාත්මක පර්යේෂණ වශයෙන් හැඳින්වේ. මේ අනුව විවිධ විද්‍යාවන් හා විෂයයන් ප්‍රචාරක මාධ්‍යයට උපස්තම්භක විණි.

සමහරවිට මිනිස් දුර්වලකම් උපයෝගී කරගෙන සූරා කෑමක යෙදෙන වෘත්තියක් වශයෙන් ප්‍රචාරක මාධ්‍ය පෙනී යන්නට පිළිවන. එහෙත් චිත්තාකර්ෂණීය ප්‍රචාරක දැන්වීමක් දකින අය මෙවැන්නක් පිළිනොගනු ඇත්තාහ. යම් යම් දේවලට යොමුවීම ඇබ්බැහිවීම ප්‍රචාරක කර්මාන්තයේ නිර්මාණයක් නොවන්නේය. උසස් තත්ත්වයක් ලබාගැනීමට ඇති අපේක්ෂාව හෝ ආදරය, කරුණාව තමා වුවමනා බව යන හැඟීම් ප්‍රචාරක මාධ්‍ය විසින් මිනිස් මනසෙහි ජනිත කරන ලද්දක් නො වන්නේය. එවැන්නක් කාටවත් කළ නො හැක්කේය. කළ හැකි එකම දෙය වන්නේ දන්නා හඳුනන අවශ්‍යතාවන් හා අපේක්ෂාවන් යොදා ගෙන භාණ්ඩ හා සේවාවන් මිල දී ගැනීමට මිනිසුන් යොමු කිරීම වේ.

ප්‍රචාරක විද්‍යාව අවශ්‍ය වශයෙන්ම, රූස්වෙල්ට් මහතා ප්‍රකාශ කළ පරිදි එක් විධියක අධ්‍යාපන ක්‍රමයකි. සබන් හා දන්තාලේප පාවිච්චි කිරීම නිසා ලක්ෂ සංඛ්‍යාත ජනතාවගේ සෞඛ්‍යය දියුණුවී ඇත. පාලිත ආර්ථිකයන්හි බොහෝ කලකට පෙර හැම තැනම මෙවැනි දැන්වීමක් ප්‍රදර්ශණය කරන ලදි. 'ඔබේ දත් සැමදාම මදින්න' එහෙත් සැලසුම්කරුවන්ට පෙනී ගියේ වැඩි දෙනෙකු මේ විධානය නොසලකා හැරිය බවය. ඒ නිසා ප්‍රචාරක කටයුතු පිළිබඳ විශේෂඥයන්ගේ පිහිට පතන්නට සිදු විය. ඔවුන් විසින් සරල වැකියක් ඉදිරිපත් කරන ලදි. එය මෙසේ විය. 'හැමදාම දත් මැද ලස්සනට සිනාසෙන්න' ඒ දැන්වීම ඉතා සාර්ථක විය.

ප්‍රවෘත්ති හා තොරතුරු සම්භාරය නිදහසේ ජනතාව වෙත ගලා යෑම නිදහස් සමාජයක් බිහිවීම සඳහාද එවැනි සමාජයක පැවැත්ම සඳහා ද අවශ්‍ය වේ. සන්නිවේදන මාධ්‍යයන්ගෙන් තොරතුරු සඟවනු ලබන විට හෝ පොදු වැදගත් කමකින් යුතු කරුණු පළකිරීම වළක්වාලනු ලැබුවහොත් හෝ

එවැනි දෙයක් සිදුවන සමාජයක් ඒකාධිපතීත්වයක් කරා ගමන් කරන සමාජයක් වේ. විවෘත සමාජයක ස්වභාවය වන්නේ එහි ජන සන්නිවේදන මාර්ගය නිදහස්ව හා විවෘතව තිබීම යි.

සංවර්ධන වන රටවල විවිධ මට්ටම්වල ජනසන්නිවේදන මාධ්‍ය හා රාජ්‍ය අතර මතභේද ඇති වේ. සමහර රටවල කැමති ඕනෑම දෙයක් පළකිරීමේ නිදහස ඇත. අන්‍ය රටවල ජන සන්නිවේදන මාධ්‍ය හා අන් සියලුම දේවල් දැඩි පාලනයට ලක් වේ. විවෘත සමාජයන්හි ඇති ආණ්ඩු බොහෝවිට පෙන්නුම් කරන්නේ ජන සන්නිවේදන මාධ්‍යය ඔවුනට හිසරදයක් බවයි. එවිට ජන සන්නිවේදන මාධ්‍ය හෙළි කරන්නේ විවෘත සමාජයත් ආවෘත සමාජයත් අතර ඇති වෙනස පවත්වාගෙන යෑම වැදගත් වන බවත් ඒ වැදගත් අංගය ආරක්ෂාකර ගැනීමට ඔවුනට නිදහස අවශ්‍ය බවත්ය.

සංවර්ධන වන රටවල ජනසන්නිවේදන මාධ්‍ය බටහිර ප්‍රජාතන්ත්‍රවාදී රටවල පවත්නා සම්ප්‍රදායානුකූල මාධ්‍ය ඔස්සේ ගමන් කිරීමට සතුටක් දක්වයි. නිර්මාණශීලීභාවය රැක ගැනීමට අවශ්‍ය එම මාර්ග ප්‍රකාශ කරන්නේ රජය සතුටු කිරීම සඳහා රජයට මාධ්‍යයෙන් විශාල කොටසක් වැය කිරීම ඔවුනට අහිත කර බවය. විවිධ රාජ්‍යයන් ප්‍රකාශ කරන්නේ යටත් විජිත සමයේ දී මහජන ඡන්දයෙන් පාලනයක් නොතිබුන හෙයින් නිවාස රැකීරක්ෂා, සෞඛ්‍ය පහසුකම්, අධ්‍යාපනය, ජල පහසුකම්, මංමාවත් තැනීම, ආහාර සැපයීම ආදිය සම්බන්ධයෙන් පැන නගින ඉල්ලීම් යටත් විජිත පාලකයන්ට ඉවතලන්නට හැකි වූ බවය. යටත් විජිත භාවයෙන් මිදුන විට එතෙක් ගොඩ ගැසී තිබූ අසන්තෘප්ත ඉල්ලීම් සම්භාරය නිසා බොහෝ විට අලුතෙන් දිනාගත් නිදහස හෝ ජාතියේ පිතෘවරුන් හෝ වැඩිකල් පැවතුනේ නැත. මේ ඉල්ලීම් සම්භාරය අතිවිශාල වූ අතර ඒවා මාස ස්වල්පයක් තුළදී සම්පූර්ණ කරනු ලබනු ඇතැයි විශ්වාසයක් පැවතින. රටවල සම්පත් හා විශේෂයෙන්ම කර්මාන්ත ගැන සැලකිල්ලක් නොතිබුණේ විදේශ පාලකයන් ඔවුන්ගේ භාණ්ඩ මේ රටවල තොග වශයෙන් ගොඩ ගසා විකිණීමට පුරුදු වී සිටි නිසාය. මේ තත්ත්වයන් යටතේ බහු පක්ෂ හා නිදහස් ජනසන්නිවේදන මාධ්‍ය සහිත විවෘත ජන සමාජයක් පවත්වා ගෙන යෑම දුෂ්කර විය. විප්ලවයක් ඇති වීම නැවැත්වීමට නම් දැඩි ක්‍රියා මාර්ග ගැනීමට අවශ්‍ය විය. 1939 සිට 1945 දක්වා වූ ලෝක යුද්ධයෙන් පසුව නිදහස ලැබූ රටවල් බොහෝමයක් විවෘත සමාජ ක්‍රමය අත් හැරියේය. මේ සංඛ්‍යාවට අප්‍රිකාවේ රටවල් පනහක්ද ආසියාවේ හා ඈත නැඟෙනහිර රටවල් දහයක් ද අයත් විය. කෙනෙකු ජපානයෙන් පිටත්ව බටහිරට ගමන් කළ හොත් නිදහස් ජනසන්නිවේදන මාධ්‍ය, නිදහස් මැතිවරණ හා විවෘත සාකච්ඡා පවත්නා රටවල් සොයාගැනීමට ශ්‍රී ලංකාවට හා ඉන්දියාවට පැමිණිය යුතු වේ. අතර තුර ඇති සෑම රටක්ම ද පකිස්ථානයේ ද බංගලාදේශයේ ද ඇත්තේ ඒකපාක්ෂික රාජ්‍යයන් ය.

අප පටන් ගත්තේ සත්‍යය ගවේෂණය කරන අය ගැන සඳහන් කරමිනි. අඳුරෙහි සත්‍යය සොයා ගැනීම දුෂ්කර ය. ජන සන්නිවේදන මාධ්‍යයන්හි නියැලී සිටින අය හා සත්‍යය ගවේෂණය කරන අය අතර සමීප ඥාතීත්වයක් ඇත. මේ දෙකොටසම තමන් මානව සංහතිය වෙනුවෙන් මෙහෙවර කරන්නේය යන ප්‍රස්තුතය ඉදිරිපත් කරති. විශ්වවිද්‍යාල ආචාර්යවරු මූලික සොයා ගැනීම්වල යෙදෙති. ඔවුන්ගේ සොයා ගැනීම් පුළුල් වශයෙන් ව්‍යාප්ත කිරීමත් කාර්යක්ෂම හා බලගතු ලෙස ජනතාව අතර ප්‍රචලිත කිරීමත් සම්බන්ධයෙන් නියැලෙන අය ජනසන්නිවේදකයෝ වෙති. මේ දෙකොටස ම මිනිසාට තොරතුරු සැපයීමටත් අධ්‍යාපනය ගෙනදීමටත් විනෝදය ගෙන දීමටත් ආරක්ෂාව සැපයීමටත් සෞඛ්‍ය වර්ධනයටත් මානසික ප්‍රබෝධයටත් උපස්තම්භක වෙති. මෙය ඔවුන් ලබන ප්‍රතිලාභය වේ. ඩෙ රිපබ්ලිකා නැමති ග්‍රන්ථයෙහි සිසේරෝ ප්‍රකාශ කළ ලෙස ''සෑම මිනිසෙකුගේම මනස ඒ මිනිසාම වේ'' එබැවින් ඒ ප්‍රතිලාභය සෑහෙන්නේය.

<u>*1983.04.29*</u>

# New Trends of Communication

## Dr. Ananda Tissa De Alwis

On this occasion, I wish to offer my grateful thanks to the Chancellor, Vice-chancellor, the Deans of the Faculties, Professors and Lecturers and the learned members of the Council and the Senate for confering on me an Honorary Degree. I do not consider this award as a personal honour to me but as a recognition by the Sri Jayewardhanapura University and the learned fraternity in Sri Lanka to the discipline of Mass Communication.

There are those whose mission is to seek Truth. It is they who civilize man, and in doing so help to build cities, nurture cultures, create religions and attack the dead weight of superstition. They continuously challenge vested beliefs, the meanings of words and thought itself. Some call this process "research" others "meditation". And that rare experience when the splendour of thought flashes like lightning across the consciousness, we call 'insight'.

Thoughts can be explained and analysed in learned papers in magazines and in books. Quite often, however, they need to be presented to wider publics than to intellectual minorities and their impact on human life dwelt upon in the trains and buses and market places. To do so, however, another voice is needed and that is the voice of the Mass Communicator.

The consumer society, created by Science and propelled by discovery, wants communication of what is new in the minds of men. New products are demanded by the very nature of society and the communicator has to look for ever faster means by which he can, go tell the world.

Roosevelt, before Television, and in the early days of Radio, used the Fireside Chat to reach and keep on his side thousands of families in rural America. He did not deliver a speech. Instead he chatted with his audience and families sat around a radio while they were told by a friendly voice in Washington that he knew their problems and would look after them.

Roosevelt did not speak often. He spaced out his talks to one about once in three weeks to a month.

They were, of course, leisurely days. Today an American President is exposed to TV coverage which is viewed by almost the whole world and averages once every week.

President Nasser distributed hundreds of thousands of Transistor Radios free of charge all over the Middle East so that his broadcasts from Cairo could be heard in the Arab world. The results of that single fact are to be seen in the solidarity of Arab opinion that continues as strong as ever.

Ayotullah Khoumeni lived in Paris for many years, but cassettes of his talks to Iranians were smuggled into the country and built a movement within Iran that ended with the overthrow of one of the oldest monarchies in the world.

Broadcasts from one country to another are jammed by the recipient country if it so desires. Communication satellites, however, now enable citizens to choose the broacasts they will hear regardless of the policies of their governments (Rupavahini is preferred to Doordharshan in South India).

The scientist has won for humanity a freedom of choice denied to it despite decades of polemics at International Conferences. Such freedom, however, conflicts with the views of nations which choose to control and direct their economies. They argue that, globally, news is a commodity, and giant network agencies distort, by choice of news and slant what the world will consume through its communication systems.

There is a war of words in assemblies of UNESCO on whether media should or should not be guided by the State to publish material such as would be useful to the wellbeing of society. In other words: should media 'tell all', each as it knows how: or should there be control of the flow of information.

In open societies such as the United States of America, there is a fiercely competitive situation where media fight bitterly for public favour. In such a society there are occasions when state documents dealing with armaments and war strategies are published, to the horror of the Pentagon, the surprise of America's allies and the amusement of its enemies. In guided societies the news or views that get priority coincide with the political or economic objectives of the State.

Placed in fair perspective, total information freedom is a contradiction in a state whose policy it is to develop certain sectors of its economy at the loss of consumer choice.

The proliferation of Media is not only because science and technology have made them so efficient. Media is habitforming. Many of us are tuned to a rhythm of morning tea and morning newspaper; others to tea and radio. It is to the rhythm of the morning radio that nations wake up and get to work. Even at work people have their radios beside them. And, of course, the tele-tube or 'Box' or even Idiot Box' as they call it is so habit-forming that conversation, even with visitors, has ceased to be necessary.

The impact of this incessant barrage is devastating. I do not use this word in the sense of expressing enormous damage: rather in the sense that its capacity to influence nations is greater than the slower process of education and the expensive process of travel.

The growth and rising costs have made media dependent on advertising. Without revenues from advertisements modern mass media would die or need government subsidies. A newspaper which costs 10 units of currency to the reader would cost 100 units of the same currency if advertising revenue did not absorb the costs of production and distribution.

Advertising is today a giant industry and has become a necessary part of mass communication. It is also an indivisible part of Marketing. The great number of goods modern science has made possible and modern man insists he must have: the services and employment levels modern nations must sustain: have made Advertising Communication the art at the summit of the Communication Spectrum. In the developed world the annual expenditure on advertisement is over £ 31 billion.

Franklin Roosevelt is on record with the following statement on advertising:

"If I were starting life all over again, I am inclined to think that I would go into the advertising business in preference to any other.

This is because advertising has come to cover the whole range of human needs and also because it combines real imagination with a deep study of human psychology. Because it brings to the greatest number of people actual knowledge concerning useful things, it is essentially a form education... It has risen with ever-growing rapidity to the dignity of an art. It is constantly paving new paths...The general raising of the standards of modern civilization among all groups of people during the past half century would have been impossible without the spreading of the knowledge of higher standards by means of advertising.'

The advertiser is not a philanthropist dedicated to the cause of sustaining media or of raising the standards of civilization. He does both by serving his own interest.

The advertiser buys space in print, in outdoor sites, or time on Radio and Television by measuring the cost. The measure is the 'Miline Rate', which is simply the cost per thousand people reached. If a Television commercial costs £ 1100 he wants to know how many people he can reach at that price. If he can reach 1,000 people, then the cost to reach a single person is £ 1. There are refinements of this inquiry. Are they the right people, i.e., are they people likely to buy the advertiser's product or service? As the costs rise and the competition gets fiercer by the day more and more questions need to be asked because while there is money to be spent on advertising, there is no money to be wasted, or else the competition will drive the Advertiser off the Market.

Media are intensely researched in order that truthful answers can quickly be given. Research into media take many forms all aimed at answering questions such as:

## Who is the Reader/Listener?

The idea is to etch a profile of the audiences at different times, in different places, and for different media.

Research must reveal the age, the sex, the income, the location, and other facts about the audience. Such information enables the advertiser to choose the right medium for his message and to create the form and content of the message itself.

Advertising cannot stand on its own. It is part of that massive industry called MARKETING.

“Marketing is the scientific distribution of a product from the point of manufacture to the place of consumption with maximum speed and minimum cost”. (Market Research & Scientific Distribution by A H Davies & O W Palmer)

In the function of Marketing there is the concept of the: "The Marketing Mix" This "Mix" has several ingredients:

(1) The Right Research
(2) The Right Product
(3) The Right Package
(4) The Right Place (Distribution)
(5) The Right Price
(6) The Right Advertising

and research again and again and again without end because the life of a business is continuous and the conditions for it are never the same from one year to another.

The writing of advertisements is the province of the “Copywriter”. Headlines and texts are called “Copy”; a term borrowed from journalism where the Reporter’s news is a “Story” and the writing is “copy”. Short, memorable lines are sometimes used at the foot of advertisements and make good slogans but advertisements have come a long way from being dependent on slogans. Writers with specially creative gifts are needed in Copywriting and the best of them are the heroes of the profession.

Writers like Aldous Huxley and Ernest Hemmingway tried writing advertising "copy". Both of them recalled their attempts with appreciation of the difficulty and the seriousness of the work. Huxley said it was easier to write a sonnet than a good advertisement.

Great advertisements have human warmth and empathy, love of humanity and compassion and a sense of humour. The little things that make living worthwhile; the glory of a child’s laugh and the terrible tragedy of its tears; a place for young love’s dream and the pathos of despair: all this must find response in the copywriter’s heart and mind.

KODAK films showed a photograph of two little children by the side of an old ditch. The boy was trying to fish with a thread tied to a stick and a bent pin. The girl was beside him, intense and still.

Borrowed from a well known song the words in the headline were:

“MEMORIES ARE MADE OF THIS”

A British firm manufacturing breakfast cereals showed a child holding a telephone receiver over his plate of ‘Kelloggs” while his friend somewhere also listened in on another phone to the sounds of the hot cereal ‘Crackle and Pop’ as milk was poured over it.

The headline was:

"LISTEN TO BREAKFAST"

In Western countries advertising with posters is cheap and popular, and hundreds of very large posters are printed every year. The Ford Motor Company of America showed a Baby's pram with the statement:

"THE ONLY CONVERTIBLE THAT OUTSELLS THE FORD!"

All advertising campaigns, of course are not on these lines. No one can say at a glance whether an advertisement is "good" or "bad" because only its success in solving a stated marketing problem can attract its approval or rejection. If there is a sale on, for instance, and the need is to announce how much cheaper the product would be, all that is needed is to say: "10% off!-Come and get it!" Such an advertisement is good if it draws people to the bargain counter.

Thousands of excellent advertisements are created all over the world. The best of them are primarily the work of quick minds. Sometimes it is the mind, of a writer, but good graphic artists have inspirations that make the world catch its breath in happy surprise! Such inspirations come those to who think they can catch a falling star or see a wink in the eye of a needle.

Generally, branded goods are advertised according to a carefully designed plan. It would take six months to a year to research, rough out, test and complete a campaign. Research and testing are essential because millions in money are needed for a good campaign and if it fails the results can be disastrous. Before an advertisement series is designed researchers must identify the marketing problem to be solved. It may be a simple objective of 20% higher sales to reach in the following year; or a new use for the product to be made widely known so that more of the product will be sold; or to fight back the thrust of a rival product. If the objective is not reached the money spent on advertising is a waste. What went wrong? Again, the researchers have to find the answer. Once in a while untested campaigns are run and they achieve success. This is a risk although the brilliant thought of an advertising genius may sometimes be worth all the tests of research. They are, however, dangerous regions where only eagles dare.

Advertisements do not change in content and message in different media. What changes is the manner of presentation. The restrictions of a newspaper advertisement where pictures and print stand still do not hamper the skills of a commercial on television. Colour television provides sound, movement, expressions of people and demonstrations of the product in actual use. Smell is a few laboratory decades away. There must surely be a Dor somewhere who is trying to transmit the perfume of a Rose: If there isn't there soon will be!

Many skills of Mass Communication have been developed in the field and working places but a greater part is the contribution of Universities in the Western world. Universities in the United States

lay considerable emphasis on the disciplines of Marketing, Marketing Research. Advertising and Produce Development. Certain Universities enjoy world-wide reputations for courses in Business Management.

A study with University students concluded, for instance, with the theory that there are "selling sounds" or "selling letters" in the English language, e.g. L.M, N.R, CH, S. Sh, Z'. Controlled studies were done with students to discover whether there was favourable response to some sounds in preference to others. Other research was to find out whether there was a way to make reading of English easier and quicker. The proposition emerged that there should be at least 26 affixes to every hundred words.

(It would be better to say especially than specially... better to say Truly than true)

Psychologists worked in Universities to discover what motivated people to action in varied forms - to take to politics, or become a 'Thinker', or to hit the fellow next to him, or to buy gifts for others and so on. This discipline was called MOTIVATIONAL RESEARCH. They consulted Professors in other areas of study including Archaeology. The Archaeological contribution was that fire was a sex symbol to cave man. Because fire was made by rubbing two pieces of wood together. Our ancestors carved the wood in the shape of phallic symbols.

The advertisers were quick to use this finding and turned it over to motivation researches. The makers of a Cigarette Lighter were advised to emphasize the flame in their advertisements. "Sell the flame not the lighter" was the brief to the graphic designers. The sceptics are entitled to chuckle, but the fact is that the particular brand of cigarette lighters sold as many as they could make. Modern man, apparently, has not moved too far from the Cave.

Advertising, packaging and product design went through a torrid phase of domination by similar and sometimes vulgar attempts to exploit one aspect of human motivation. There were other motivations, like the search for status. The investigative writer, Vance Packard, wrote a book: 'The Status Seekers" in which he surveyed the malady as it affected American Society.

He quoted the following advertisement for Real Estate.

Although in our country there are great traditions and deep knowledge regarding mental culture and the mind, there is no effort to apply them to real life and daily duties. They are not even mentioned in such contexts. A very successful approach used in Japan is referred to as '**KAIZEN**', meaning *dhyana applied* to work. This goal-seeking methodology is applied to life and industry without any feeling of shame or reluctance, and with great success. I wonder whether our graduates even think of such things as dhyana, sati, guarding and disciplining of the mind, and being goal-directed.

Today the very operation of universities has become problematic. The management in many situations is disorderly. A key to sound management is close contact which facilitates the formation of good relationships. If we were to distance ourselves from students thinking that they belong to unions which will take up their causes, will form groups to achieve narrow ends, and are intent on making commotions,

we thereby become weak. In many situations students are interested in debate and conflict. For that very reason, closeness, contact, and moving with them is essential. They need our leadership and guidance in fashioning their lives, analysing and evaluating social situations, and ethical development. Distancing ourselves would be detrimental to them, even if that is not our intention. Our service to students should not be confined to giving subject knowledge and specific skills. If so, the future generations would not be brought up correctly. Hence, we must deliberately make connections with our students. We must never devalue any one of them. We must not consider any one inferior on account of intellect and age. We must count students as being among those whom we consider the best friends. I personally know the value of such friendship. In any part of Sri Lanka I can find close friends. I know that they care for me. I never feel lonely out there.

It is not my intention to end my address with a wish. Such wishes are pointless if you do not work tirelessly and with dedication. You only can create your own world out of the infinite number of things in the universe. Therefore strive diligently towards the attainment of your goals.

Thank You.

*1992.07.24*

# 13

# මහා බෙත්මක් : සමාජ ප්‍රශ්නයක්

## මහාචාර්ය සිරි ගුනසිංහ

දැනට ශතවර්ෂ බාගෙකට විතර කලින් දවසක (එවකට) ලංකා විශ්වවිද්‍යාලයේ පැවැත් වුන එක උපාධි ප්‍රදානෝත්සවයක් මට මේ වෙලාවෙදී මතක් වෙනවා. ඒ මම බී.ඒ. උපාධිය ලබා ගත්ත දවස. ඒ උපාධි උත්සවය මගේ මතකයට ආවෙ මට උපාධිය ලැබුනු නිසා ම නොවෙයි. ඒ උපාධි උත්සවයත් මේ උපාධි උත්සවයත් පසුගිය ශතවර්ෂ බාගයක් පමන කාලය ඇතුලත අපේ රටේ ඇති වෙලා තිබෙන අධ්‍යාපනික, සංස්කෘතික හා සමාජයීය වෙනස්කම් පිලිබිඹු කරන සංකේත දෙකක් හැටියට පෙනෙන නිසයි.

බාහිර ස්වරූපය අතින් බැලුවොත් ශතවර්ෂ බාගයකට විතර ඉහත පැවැත්වුනු ඒ උපාධි උත්සවයත් මේ උපාධි උත්සවයත් අතර මහ විශාල වෙනසක් නැතැයි කියලා කියන්නත් පුලුවන්. එදා වගේ අදත් උපාධිලාභියෝ, ලාභිනියෝ නිල ඇඳුමෙන් සැරසිලා, වේදිකාවට ඇවිල්ලා එදා කුලපත තුමාගෙන්, අද කුලපති තුමියගෙන්, උපාධි සහතිකය ලබා ගන්න එකයි ප්‍රධාන කාර්යය. බැලූ බැල්මට ඒ විදිහට පෙනුනත්, උපාධි සහතිකය ලබා ගන්න එක විතරක් නෙවෙයි මේ වගේ උත්සවයකදී සිද්ද වෙන්නෙ.

උපාධිලාභියා හෝ ලාභිනිය තමන්ගෙ දෙමව්පියෝ යාලු මිත්‍රයෝ ආදීන් ඉදිරියෙ, ඒ කියන්නෙ මහ ජනයා ඉදිරියේ, සමාජය ඉදිරියේ, ස්වාධීන පුද්ගලයෙක් හැටියට පෙනී සිටීම තමයි ප්‍රධානතම දේ. ඒ අය ජීවිතයේ එක අවධියක් අවසාන කරලා අලුත් අවධියකට සම්ප්‍රාප්ත වෙනවාය කියලා කියා පෑමක් ඒ. උපාධිලාභියෝ ඇඳගෙන ඉන්න නිල ඇඳුමෙන් ප්‍රකාශ වෙන්නෙ උගත්කම පමනක් නෙවෙයි. මේ උදවිය වගකීම් සහිත කාර්යභාරයක් බාර ගන්න අවශ්‍ය පූර්න සුදුසුකම් ලාබාගත්ත උදවිය යි කියන එකයි මේ බාරදූර පෙනුමක් තියෙන ඇඳුම් කට්ටලයෙන් කියාපාන්නෙ. මේ නිල ඇඳුමෙන් මේ උපාධිලාභියෝ, ලාභිනියෝ ප්‍රදර්ශනය කරන්නෙ සමාජයේ සුදුසු තැන්වලට පත්වෙන්න අවශ්‍ය සුදුසුකම් තමන්ට තියෙනවාය කියන එකයි. ඒ අතින් බැලුවොත් එදාත් අදත් අතර කිසි වෙනසක් තියෙනවැයි කියලා කියන්න බැහැ. නමුත් මේ බාහිර දර්ශනයෙන් ටිකක් ඔබ්බට ගිහින් කල්පනා කලොත් කිසියම් වෙනසක් දකින්න පුලුවනි. එදා උපාධිධාරීන්ට සමාජයෙන් ලැබුන ප්‍රතිචාරයත් අද ලැබෙන ප්‍රතිචාරයත් එක හා සමාන දැයි කියලා ප්‍රශ්නයක් අහන්න පුලුවනි. වෙනස ඇත්තේ මේ ප්‍රශ්නයට ලැබෙන පිලිතුර අනුවයි.

එදා විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබාගෙන උපාධිධාරීන් හැටියට සමාජයට එකතු උනේ සුලු සංඛ්‍යාවක්. එදා තිබුනෙ එක විශ්වවිද්‍යාලයයි. ඒ ආයතනයේ ඉඩකඩ තිබුනේ ටික දෙනෙකුට විතරයි. විශ්වවිද්‍යාලයට ඇතුල් වෙන එක විශේෂ වරමක් වගේ පෙනුනෙ ඒ නිසයි. ඇත්ත වශයෙන් ඒක වරමකට වැඩිය එදා සමාජයේ තිබුන හැඩගැස්ම අනුව සිද්ද වුනු දෙයක් කියලා කියන්න පුලුවනි. ඒ දවස්වල අධ්‍යාපනය කෙරුනේ ඉංගිරිසියෙන්. නිදහස් අධ්‍යාපනය එන්න කලින් මහ නගරවල තිබුනු 'කොලීජි'වලට යන්න පුලුවන් උනේ ටික දෙනෙකුට විතරයි. උසස් අධ්‍යාපනය සමාජයේ එක කොටසකට පමනක් ලැබුනු වරමක් වගේ පෙනුනෙ ඒ නිසයි.

නිදහස් අධ්‍යාපනයත් ස්වභාෂා මාධ්‍යයත් නිසා ටික දෙනෙකුට විතරක් සීමා වෙලා තිබුනු උසස් අධ්‍යාපනය ඒ සීමාවලින් මිදුනා. මහා විද්‍යාල, මධ්‍ය විද්‍යාල ආදියේ මාර්ගයෙන් අධ්‍යාපනය රට පුරා පැතිර ගියා විතරක් නෙවෙයි විශ්වවිද්‍යාලයට ඇතුල් වීමට සුදුසු ශිෂ්‍ය සංඛ්‍යාව දහස් ගණනින් වැඩි උනා. ඒ නිසා අනිවාර්යයෙන්ම අලුත් අලුත් විශ්වවිද්‍යාල ආරම්භ කරන්න යෙදුන බව කවුරුත් දන්න දෙයක්. එදා විශ්ව විද්‍යාලෙන් උපාධි ලබාගෙන පිටවුනු සංඛ්‍යාවට වැඩිය විශාල සංඛ්‍යාවක් අද විශ්ව විද්‍යාලවලින් පිට වෙනවා.

මේක වැදගත් සිද්දියක්. අධ්‍යාපනය රටපුරා පැතිර යන එක රටේ දියුනුවට අවශ්‍ය දෙයක්. අතලොස්සකට පමනක් සීමා වුනු අධ්‍යාපනයක් තියෙන රටක් දියුණු රටක් බවට පත්වෙන්නෙ නැහැ. එහෙම රටක සමාජය නිසි ආකාරයට සකස් වෙන්නේ නැහැ. එහෙම රටක සංස්කෘතිය වර්ධනය වෙන්නේ නැහැ. එහෙම රටක ධනය වර්ධනය වෙන්නෙ නැහැ. කෝටිපතීන් දෙතුන් දෙනෙකුගේ අතට සීමාවුනු ධනයෙන් රටට ප්‍රයෝජනයක් නැතුවා වගේම සුලු කොටසකට පමනක් සීමාවුනු උගත්කමත් රටට ප්‍රයෝජනයක් නැති උගත්කමක් බවට පත්වෙනවා. ඒ නිසා තමයි අධ්‍යාපනය රට පුරා පැතිර යන විදිහට කරුනු සලස්සන්න ඕන කරන්නෙ. නිදහස් අධ්‍යාපනයත් ස්වභාෂා මාධ්‍යයත් නිසා අධ්‍යාපනය පැතිර ගිය බව ඇත්ත. ඒ උනත් සමාජයේ මානසික සෞඛ්‍යය ආරක්ෂා කරගන්න අවශ්‍ය තරමට අධ්‍යාපනය පැතිර ගිහින් තියෙනවා කියලා කියන්න අමාරුයි.

සාමාන්‍ය අධ්‍යාපනය කොයිතරම් පැතිර ගිහින් තිබුනත් අපේ සමාජයට අවශ්‍ය ප්‍රමානයට උසස් අධ්‍යාපනය පැතිර ගිහින් කියලා හිතන්න බැහැ. උසස් අධ්‍යාපනය ලබා ගන්න අවශ්‍ය සුදුසුකම් තියෙන අය අතරින් සුලු කොටසකට පමණයි උසස් අධ්‍යාපන ආයතනවල ඉඩ තියන්නෙ. උසස් අධ්‍යාපනය තවමත් විශේෂ වරප්‍රසාදයක්. රටේ හැම දෙනෙක්ම උසස් අධ්‍යාපනය ලබා ගන්න ඕනැයි කියන එක නෙවෙයි මෙයින් අදහස් කරන්නේ. උසස් අධ්‍යාපනය ලබාගන්න උවමනාවත් සුදුසුකමත් තියෙන හැම කෙනෙකුටම ඒ අධ්‍යාපනය ලබාගන්න අවසර තියෙන්න ඕන කියන එකයි අදහස. කාලීන වශයෙන් සමාජයේ ඇතිවෙන ප්‍රවනතාවන්ට අනුවයි. උසස් අධ්‍යාපනය ලබාගත යුත්තේ කව්ද නැත්තෙ කවුද කියන එක නිශ්චය කෙරෙන්න ඕනෑ.

ජනගහනය එක්කෝටි අසූලක්ෂයක් විතර ඉන්න ලංකාවේ විශ්වවිද්‍යාල තියෙන්නෙ අටයි. 1991 සංඛ්‍යා ලේඛනවලට අනුව ජනගහනයෙන් සීයට එකයි දශම එකයි (1.1%) විශ්වවිද්‍යාලවලත් අනිත් උසස් අධ්‍යාපන ආයතනවලත් ඉගෙන ගන්න ශිෂ්‍යයෝ ගනන. මේක බොහොම කුඩා අනුපාතයක්. ලෝකයේ දියුනු රටවල්වල විතරක් නෙවෙයි දියුණු වේ ගෙන එන රටවල්වලත් තත්වය මීට වැඩිය හුඟක් වෙනස්. විශ්වවිද්‍යාලවලට ඇතුල් වෙන්න සමත් නොවුනු තරුන තරුනියෝ විශාල සංඛ්‍යාවක් දුර්මුක වෙන එක පුදුමයක් නෙවෙයි. බලාපොරොත්තු විනාශ කර ගන්නවා. සමාජය ගැන ඒ ගොල්ලන්ගෙ විශ්වාසය නැති වෙනවා. ඒ ගොල්ල සමාජයක් එක්ක උරන වෙනවා. මහ බෙත්මේ මුල් අවස්ථාවයි ඒ. ඒ එක පැත්තක්.

මේ ප්‍රශ්නයෙ තවත් පැත්තක් තියෙනවා. සමාජික තරාතිරම, මුදල් හදල් ප්‍රශ්නය ආදී නොයෙක් දුෂ්කරතා යටපත් කරගෙන කන කොකා විය සිදුරෙන් එළිය බලනවා වාගේ කොහොම හරි උපාධියක් ලබා ගත්තත් ඊ ළඟට මොකද වෙන්නෙ. උපාධියක් ලබාගැනීම ලේසි වැඩක් නෙවෙයි කියන එක අමුතුවෙන් කියන්න ඕන නැහැ. අවුරුදු තුනක් හෝ හතරක් තිස්සෙ එපා නොකියා පාඩම් කරන්න ඕන. සතිපතා රචනා ලියන්න ඕන. පරීක්ෂනවලට මූන දෙන්න ඕන. (මේවා තවමත් එහෙම කෙරෙනවාද නැද්ද කියන එක වෙනත් ප්‍රශ්නයක්) මේ ඔක්කොම දුක් විඳලා උපාධියක් ලබාගෙන යන්න එන්න තැනක් නැති තත්වයකටයි මූනපාන්න සිද්ද වෙන්නෙ. ඒක සාධාරණද?

උසස් අධ්‍යාපනයට සමාජයට අවශ්‍ය ප්‍රමානයට සමාජය පැතිර ගිහින් නැතත් දහස් ගණනකට විශ්වවිද්‍යාලයට ඇතුල් වෙන්න බැරි උනත් විශ්ව විද්‍යාලවලින් උපාධි ලබාගෙන ජීවිතය ආරම්භ කරන්න ලෑස්ති වෙලා ඉන්න අය දාස් ගනනකින් වැඩිවෙලා. ඒ නිසා අපේ සමාජයෙ ස්වභාව සමාජ රටාව හුඟක් වෙනස් වෙලා. අපේ ජීවන චර්යාව හුඟක් වෙනස් වෙලා. අපේ සමාජ ධර්ම වෙනස් වෙලා. ඒ එක්කම අපේ සාරධර්මත් වෙනස් වෙලා. මේ නිසා සමාජය විසින් විසඳා ගතයුතු ප්‍රශ්න රාශියක් මතු වෙලා තියෙනවා. ඒ ප්‍රශ්න බොහෝමයක් කවුරුත් දන්න නිතර නිතර සාකච්ඡාවට භාජනය වෙන ප්‍රශ්න නිසා ඒ ගැන සඳහන් කරන්න අවශ්‍ය නැහැ. අපේ කල්පනාවට සාමාන්‍යයෙන් භාජනය වෙන්න නැති එක කරුනක් පමනක් සඳහන් කරන්න ඕන.

සමාජයේ හවුල්කාරයන් හැටියට සේවය කිරීමට අවශ්‍ය සුදුසුකම් ලබාගත්තත් මේ නවකයන්ට ඒ සේවය කරන්න ඉඩකඩ නැති බවයි පෙනෙන්න තියෙන්නෙ. ඒ නිසා ඔවුන් තුල ඇති වෙන්නෙ අසහනයක්. ඒ අසහනය ඔවුන් මුලු මහත් සමාජයටම යොමු කරනවා. ඒ ගොල්ලන්ට සමාජය පෙනෙන්නෙ තමන්ට අයිතියක් නැති තැනක් හැටියටයි. සමාජය ගෙනියන්නෙ වෙනින් කට්ටියක්. ඒ කට්ටියට අපි අයිති නැහැ කියලා ඒ ගොල්ලන්ට හිතෙනවා. ඒ තමයි අසහනයට මූල. මේ අසහනය නිසා සමාජ කාරිය කරගෙන යන අය ඒ කියන්නෙ සමාජයෙ තම තමන්ගෙ නියම තැන් ලබා ගෙන වැඩ කටයුතු කරගෙන යන නොතරුන, වැඩිහිටි අය අකාරුනික ප්‍රතිපත්ති අනුගමනය කරන්න පෙලඹෙනවා. සමාජයේ එක කොටසක අසහනයක් ඇති වෙන්නෙ ඒ සමාජයේ අනිත් කොටස අනුගමනය කරන ක්‍රියා පටිපාටිය පදනම් කරගෙන බව රහසක් නෙවෙයි. කොයි විදිහකට බැලුවත් මෙතන තියෙන්නෙ එක කොටසක අසහනය අනිත් කොටසේ අසහනයට තුඩු දීමයි. වෛරයෙන් වෛරය සංසිඳෙන්නෙ නැහැ වගේ අසහනයෙන් අසහනය සංසිඳෙන්නෙ නැහැ. මේ තත්වය නිසා සමාජයේ ඇතිවෙලා තියෙන්නෙ විශාල භේදයක්. මහ බෙත්ම කියලා මම කියන්නෙ මේ භේදයට තමයි.

පහුවුනු දශක කීපය ඇතුලත අපේ සමාජ ප්‍රවනතාවයන් පරිනාමය වුනු ආකාරය දිහා විචාරාක්ෂියෙන් බැලුවොත් අනාවරනය වෙන එක දෙයක් තියෙනවා. සාමූහික අසහනය කතාවෙන්, ක්‍රියාවෙන් ප්‍රකාශ කරන තරුණ නැත්නන් නවක පක්ෂයයි. ඒ අසහනයට විරුද්ධව තමංගෙ සාමූහික අසහනය ඉදිරි පත්කරන තරුණ නොවූ පක්ෂයයි අතර තියෙන මානසික සට්ටනයයි. ඒ සමාජයේ තමන්ට අයිති තැන නොලැබී යාම ගැන තරුනයෝ නොතරුනයන්ට දොස් කියනවා. ඒ අතර සමාජය විනාශ මුඛයට යොමු කරනවැයි කියලා නොතරුනයෝ තරුනයන්ව හෙලා දකිනවා. මූලික ප්‍රශ්නය ඒකයි.

මෙතෙන්දි ඇති වෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි කවුද තරුනයෝ කියන්නෙ කවුද නොතරුනයෝ කියන්නෙ කියන එක. මේ වෙනස වයස අනුව නිර්වචන කරන්නත් පුලුවන්. නමුත් ඊට වඩා මේ වෙනසට පදනම සමාජ තත්වයත් ආර්ථික ශක්තියත් ය කියලයි පෙනෙන්නෙ. නවක පක්ෂයේ වැඩි දෙනෙක් මෙතෙක් ආර්ථික වශයෙන් දියුනුවක් ලබාගෙන සමාජයේ තත්වයක් තහවුරු කරගන්න සමර්ථ නොවුනු, ජීවිතේ ආරම්භ කරන්න අවස්ථා හොය හොයා ඉන්න උදවියයි. වයසින් තරුන අය තමයි වැඩිපුරම මේ ගනයට අයිති වෙන්නෙ අවශ්‍ය සුදුසුකම් ලබාගෙන මහ සමාජයට අලුතෙන් ඇතුල් වෙන්න ඉන්න අය. ප්‍රශ්න තියෙන්නේ ඒ අයටයි. මේ ආධුනිකයන්ට ක්‍රියාවෙන් හරි කතාවෙන් හරි ගුරුහරුකන් දෙන්න, ඒ ගොල්ලන්ගෙ ප්‍රශ්නවලට විසඳුම් සපයන්න, අවශ්‍ය ශක්තිය, අවශ්‍ය දැනුම තියෙන්නෙ සමාජයේ ස්ථාවර වෙලා ඉන්න ප්‍රවීනයන්ටයි. මේ ප්‍රවීනයෝ වැඩි හරියක් වයසින් මුහුකුරා ගිය උදවිය. මේ නිසයි මේ භේදය තරුන වැඩිහිටි භේදයක් හැටියට පෙනෙන්නෙ. කුල භේද, ආගම් භේද, භාෂා භේද, ගිහි පැවිදි භේද, ගැනු පිරිමි භේද ආදී මෙකී නොකී හැම භේදයක්ම

යටපත් කරගෙන ඉස්මතු වෙලා තියෙන්නෙ මේ තරුන වැඩිහිටි භේදයයි. නමුත් ඒ ගැන අපි තවම ප්‍රමානවත් විදිහයට හිත් යොමුකරලා තියෙනවාද කියන එක නිතර නිතර ඇසිය යුතු ප්‍රශ්නයක්. අන්තිම වශයෙන් බැලූවොත් අසහනය ප්‍රතිචාරයක් විතරයි. එහෙම නං ඒ ප්‍රතිචාරයට තුඩු දෙන දේ මොකක්ද කියලා හොයන්න වටිනවා. අපක්ෂපාතීව කල්පනා කලොත් අවබෝධ වෙන්න ඕන සාමාජීය අසහනය ඇති වෙන්නෙ සමාජ ධර්ම ක්‍රියාකාරී කෙරෙන ආකාරයට අනුවය කියන එක. සමාජ ධර්ම සමාජ සංස්ථා ආදිය ක්‍රියාකාරී කරවන්නෙ නවකයෝ නෙවෙයි. ප්‍රවීන වැඩිහිටි පක්ෂයයි. ඒ නිසා වැඩිහිටි පක්ෂයයි මේ ප්‍රශ්නයට විසඳුමක් දෙන්න ඕන. ඒ විසඳුම පිටතින් හොයා ගන්න පුලුවන් විසඳුමක් නෙවෙයි. ඒක සමාජය තුලින්ම, ඒකියන්නෙ පුද්ගලයින් තුලින්ම, ප්‍රවීනයන් තුලින්ම සොයාගත යුතු විසඳුමක්. මේ බර ප්‍රවීනයන්ගෙ නැත්නං වැඩිහිටියන්ගෙ කරපිට පටවන්නෙ ඇයි කියලා කෙනෙකුට අහන්න ඉඩ තියෙනවා. ඒ ප්‍රශ්නයට දෙන්න පුලුවන් එකම උත්තරයයි - සමාජය හසුරුවන්නෙ ප්‍රවීනයෝ නිසා හොඳත් නරකත් දෙකම ඒ ගොල්ල බාර ගන්න ඕනැයි කියන එකයි.

සමාජයේ බලතල ඔක්කොම තියෙන්නෙ වැඩිහිටියන්ගෙ අතේය කියන එක කවුරුත් දන්න දෙයක්. දේශපාලන බලය, ධන බලය තානාන්තර බලය පූජනීයත්ව බලය ආදී හැම බලයක්ම පරිහරනය කරන්නේ වැඩිහිටි පක්ෂයයි. සමාජයේ උසස් තැන්වල ඉන්න අය තමයි සමාජ ධර්ම, චර්යා ධර්ම මොනවාද කියා තේරුන් බේරුම් කරන්නෙ. ඒ උදවිය බොහොම වෙලාවට කියන්නේ, නැත්නං අදහන්නෙ, බලය කියන්නෙ ධනෝපායන මාර්ගයක් කියන එකයි. ඒ එක්කම අනිත් පැත්තට කියනවා ධනය කියන්නෙ බලය ලබා ගැනීමට මාර්ගයක් ය කියලා. ඒ අනුව බලන කොට ධනයත් බලයත් එකම කාසියෙ දෙපැත්ත වගෙයි. රටේ බලයත් රටේ ධනයත් තමන්ගෙ පුද්ගලික අයිතිවාසිකමක් හැටියටයි ප්‍රවීනයෝ වැඩිදෙනෙක් සලකන්නෙ. ප්‍රවීනයෝ ඒ අනුව නවකයින්ට උගන්වන්නෙ වැරදි පාඩමක් : බලය කියන්නෙ බලපුලුවන්කාරකම. බලපුලුවන්කාරකම තියෙන තැනැත්තා නීතියට ගරු කරන්න ඕන නැහැ. නීතිය තියෙන්නෙ බලයත් ධනයත් නැති උදවිය ආංබාං කරන්න මිසක් බලවතුන්ගෙ නිදහස සීමා කරන්න නෙවෙයි කියන එකයි ඒ ගොල්ල හුඟක් දුරට ඇදහුවෙ. ප්‍රවීනයන්ගෙ ඒ වගේ අදහස්වලට විරුද්ධ වෙන එක නවකයෝ සාමාන්‍යයෙන් කරන දෙයක්. නවක අසහනය කියන්නෙ ඒකයි.

ධනය ඉපයීම වැරදි වැඩක්ය කියලා කියන්න බැහැ. යහපත්, සැපවත්, කම්කටොලුවලින් තොර ජීවිතයත් ගත කරන්න ධනය අවශ්‍යයි. නමුත් - වරදක් හැටියට පේන්නෙ ධනය ඉපැයීමත් වස්තු රැස්කිරීමත් කියන දෙක එකක් කියලා හිතා ගැනීමයි. ධනය උපයන්නෙ හොඳින් ජීවත් වෙන්න තියෙන උවමනාව නිසා. වස්තු රැස් කරගෙන වස්තුවට තියෙන ආශාව නිසා ධනය ඉපයීම සමාජයට හානියක් නොවන විදිහට කරන්න පුලුවනි. වස්තු රැස්කිරීම සමාජයට හානි නොකර කරන්න බැහැ. ඒ ඇයි? වස්තු රැස් කරනවා කියන්නෙ තමන්ගෙ ජීවිතයට අවශ්‍ය නැති, තමන්ට ප්‍රයෝජනයට ගන්න බැරි වස්තුවක් තමන් සන්තක කර ගැනීමයි. ඒක සමාජ විරෝධී වැඩක්. අදින්නාදානාවක්. නවකයින්ගෙ අසහනයට හේතුව මේ අනවශ්‍ය වස්තු රැස්කිරීම නිසා රටේ හැමෝටම අයිති ධනයෙන් තමන්ට අයිතිවිය යුතු කොටස නැතිවී යාමයි. නවකයො හෙලා දකින්නේ එවැනි සමාජ විරෝධි අවස්ථා බිහි කරන සමාජ රටාවයි. මේ සමාජ රටාව අපේ රටට විතරක් සීමා වෙච්ච එකක් නෙවෙයි. ලෝකයේ හැම තැනම තියෙන ප්‍රශ්නයක් ඒක.

ධනයත් බලයත් එක හා සමානව හැමදෙනා අතරම බෙදී යා යුතුයි කියලා මෙයින් අදහස් කරන්නෙ නැහැ. ධනයත් සමෝසමව බෙදී යා යුතුයැයි ප්‍රකාශ කළ සමාජ රටාව සාර්ථක උනේ නැහැ. නමුත් එක කොටසක් පමණක් සැප විඳිනවානං අනිත් කොටසට ඒ සැප සම්පත් නොලැබෙන

එක පුදුමයක් නොවෙයි. එහෙම තත්ත්වයක් තියෙන කොට සමාජ අසහනය මඳුවැල් වගේ වැවෙනවට සැකයක් නැහැ. ඇත්ත වශයෙන් ම ඒක සමාජය විනාශ කරන පිළිලයක්. එහෙම තත්වයක් ඇති වීමට පසුතලය සකස් කිරීම ගැන වගකියන්න ඕනෑ සමාජය මෙහෙයවන වැඩිහිටි පක්ෂයයි. ප්‍රභූ පක්ෂයයි.

අවුරුදු ගනනාවක් සමාජය විසින් නියම කර ඇති විදියට අධ්‍යාපනයක් ලබා ගෙන අවශ්‍ය සුදුසුකම් ලබාගෙන ජීවිතය ආරම්භ කරන්න බලාපොරොත්තු වෙන නවකයින්ට ඒ ජීවිතය ගෙනයන්න අවශ්‍ය පරිසරය සකස් කිරීම ප්‍රභූන්ගේ කාර්යයි කියලා කියන්න පුලුවනි. ඒ ඇයි ඒක සමාජයෙන් ඔවුන්ට ලැබී ඇති ප්‍රභූත්වයට අදාල වගකීමක් නිසායි.

සමාජ රටාවත් ආර්ථිකයත් යහතින් තියෙනවා නම් ප්‍රභූ පක්ෂයට අමුතුවෙන් කරන්න දෙයක් නැහැ. ගඟක් ගලා ගෙන යනවා වගේ හැමදෙයක්ම නිසි ආකාරයෙන්, නිරායාසයෙන් සිද්ද වේවි. නමුත් හැබෑ තත්වය ඒක නෙවෙයි. නොයෙක් නොයෙක් විදිහේ ගල්පර මතුවෙලා ගඟේ බැස්ම තැන් තැන්වල ඇන හිටලා සමහර ගල්පර පේන්නෙ නැහැ. ඉදලා හිටල මතු උනත් සාමාන්‍යයෙන් කවුරුවත් ඒවා ඒ තරන් ගනනකට ගන්නෙ නැහැ. එහෙම ගනනකට නොගත්ත ගල්පර තමයි නවක - වැඩිහිටි අසහනය.

මේ අසහනය සමාජයේ කල්පනාවට යොමු වෙන්නෙ විශාල අර්බුදයක් ඇති උනොත් විතරයි. ඒ ඒ වෙලාවට කිසියම් තාවකාලික පිලියමක් කරනවා මිසක් ප්‍රභූ සමාජය මේ අසහනය භයානක දෙයක් හැටියට ගනන් ගන්නෙ නැහැ. මේ තත්වය අපේ සමාජයට පමනක් සීමා වෙච්ච එකක් නෙවෙයි. ලෝකයේ හැම රටකම වගේ මේ නවක වැඩිහිටි අසහනය තියෙනවා. නමුත් කොයිම රටකවත් මේ ප්‍රශ්නය විසඳීමේ ක්‍රියා පටිපාටියක් දියත් කරලා තියෙනවාද කියලා කියන්න අමාරුයි. සමහර රටවල තියනවා රක්සා නැති උගත් හෝ නූගත් නවකයින්ට මාසික පිං පඩියක් දීමේ ප්‍රතිපත්තියක්. නමුත් එයින් අසහනය නැතිවෙනවැයි කියන්න බැහැ. ඇත්ත වශයෙන් වෙන්නෙ අසහනය වැඩිවීමයි. ඇයි, එයින් වෙන්නෙ නවකයින්ගේ ආත්ම ගෞරවය හීන වීමක්.

යෞවන කටයුතු සහ ක්‍රීඩා අමාත්‍ය අංශයක් අපට තියෙනවා. ඒ අමාත්‍යාංශයේ දර්ශනය මොකක්ද කියන එක තේරුම් ගන්න පුළුවනි. ඒකට දීලා තියෙන නමෙන්ම. අපි කියන යෞවනයන්ට ක්‍රීඩා කරන්න වෙලාවක් තියෙනවද කියන එකත් ප්‍රශ්නයක්.

අපට හැඟෙන්නේ ලෝකයේ අනාගතය ගැන නිතර නිතර කතාබස් කරන ලෝක සංවිධාන මේ ප්‍රශ්නයට හිත් යොමු කරන්න ඕනෑ ය කියන එකයි. ජනගහන ප්‍රශ්නය, ආහාර ප්‍රශ්නය, සෞඛ්‍ය ප්‍රශ්නය වගේ ප්‍රශ්නවලට පිලිතුරු සපයන්න මාන්සි ගන්න කණ්ඩායම් ලෝකයේ කොතෙකුත් තියෙනවා. කලා ශිල්ප ආරක්ෂා කිරීමට, සාහිත්‍ය සංවර්ධනයට, පුරා වස්තු සංරක්ෂනය කිරීමට විශේෂ කන්ඩායම් සකස් වෙලා තියෙනවා. මේ හැම දෙයක් ගැනම කතාබස් කරන එක්සත් ජාතීන්ගේ සංවිධානය පවා මේ සමාජ භේදය ගැන හිතලා ඇති බවක් පේන්න නැහැ. යෞවන පරම්පරාව ජාතියේ අනාගතයැයි කියන කතාව නොකියන ප්‍රභූවරයෙක් වැඩිහිටියෙක් නැතිතරං. ඒ උනත් ඒ අනාගතය සාර්ථක කරන්න වැඩ පිලිවෙලක් වෙලා නැහැ එහෙම වැඩ පිලිවෙලක් සකස් වනතුරු මේ මහ බෙත්ම, මේ නවක වැඩිහිටි භේදය අවසාන වේවි කියලා හිතන්න අමාරුයි.

දැන් සාමාන්‍යයෙන් කෙරෙන්නෙ එක පක්ෂයක් අනිත් පක්ෂයට දෝෂාරෝපනය කරන එකයි. එයින් වැඩක් සිද්ද වෙයි කියලා හිතන්න අමාරුයි. එකිනෙකාට දොස් පැවරීමේ ආනිසංස මොකක්ද කියන එක ධම්මපදයේ ගාථාවක ලස්සනට කැටිකරලා තියෙනවා.

පරවජ්ජානුපස්සිස්ස
නිච්චං උජ්ඣානසඤ්ඤිනො
ආසවා තස්ස වඩ්ඪන්ති
ආරා සො ආසවක්ඛයා

නවක - වැඩිහිටි අසහනය සමාජ පරිහානියට යොමු කරන ආසවයක්. ඒක අන්‍යෝන්‍ය දෝෂාරෝපනයෙන් නැති කරන්න බැහැ. වැඩිහිටි පක්ෂය විශේෂයෙන් මේ ප්‍රශ්නයට හිත් යොමු කරන්න ඕනෑය කියන එකයි අපේ විශ්වාසය.

<u>*1994.11.15*</u>

# 14

# උපාධිධාරීන්ගේ රැකියා ප්‍රශ්නය හා ඊට විසඳුම්

## මහාචාර්ය විමල් ජී. බලගල්ලේ

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මේ වර්ෂයේ උපාධි ප්‍රදානෝත්සව දේශනය පැවැත්වීම සඳහා උපකුලපතිතුමන් ම වෙත කළ ආරාධනය මා සතුටින් බාර ගත්තේ එය, පුරා අවුරුදු තිස් ගණනක් මුළුල්ලේ විශ්වවිද්‍යාලයීය මහාචාර්යවරයකු වශයෙන් මෙන්ම බලමණ්ඩල සාමාජිකයකු වශයෙනුත් කිසියම් පමණකින් මේ විශ්වවිද්‍යාලයට මගෙන් ඉටු වූ මෙහෙවර අගය කොට සැලකීමක් සේ හැඟී ගිය නිසා පමණක් නොව එමඟින් එක අතකින් අභිනව උපාධිලාභී තරුණ පිරිසටත්, අනෙක් අතින් අපේ රටේ උසස් අධ්‍යාපනයෙහි වර්තමාන නියාමකයන්ටත් ප්‍රයෝජනවත් වෙතැයි සිතෙන අදහස් කීපයක් ඉදිරිපත් කිරීමට ඉඩ ලැබෙන නිසාත් ය. එසේ හෙයින් එම අවස්ථාව සලසා දීම පිළිබඳව, මම පළමුකොට  ම උපකුලපතිතුමන් ප්‍රමුඛ සනාතන සභා/පාලක සභා සාමාජික භවතුන් වෙත මගේ හෘදයංගම ස්තුතිය පිරිනමමි.

ඊළඟට මා පිට පැවරෙන අවස්ථෝචිත කාර්යයක් සේ මා සලකන්නේ, අපේක්ෂිත ඵලය වූ උපාධි ලාභය පිළිබඳව, අපේ සන්තුෂ්ටිය හා ආශිර්වාදයත් නවෝපාධිලාභීන් වෙත පළ කිරීමයි. නවෝපාධිලාභීනි, විශ්වවිද්‍යාලයට ඔබ ඇතුළු වීමෙන් පසුව ගත වූ අවුරුදු තුන හතර තුළ පමණක් නොව සමහර විට ඊට පෙර ඔබ පාසල් අධ්‍යාපනය ලබන කාලයේදීත් උපාධිධාරියකු වශයෙන් අනාගතයට පා තබමින් අභියෝගකාරී සමාජයට පිවිසීමට ඔබ තුළ වූ අපේක්ෂාව අද ඔබ මුදුන්පත් කරගෙන ඇත්තේ ජනගහනයෙන් ඉතා සුළු පිරිසකට පමණක් ලැබෙන විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය ලැබීමේ වාසනාව නැතහොත් බුද්ධිමත් බව ඔබ සතුව වූ නිසාම නොවේ. වැඩියක්ම නැතිනම් ඒ පමණට ම ඔබේ අප්‍රතිහත ධෛර්ය නිසාය: විවිධ දුක්කරදර හිරිහැර ඉවසීමටත්, අධිෂ්ඨාන පූර්වකව විවිධ බාධක ජය ගැනීමටත් ඔබ තුළ වූ හැකියාව නිසා ය. ඔබ දියුණු කළ මෙකී හැකියාවන් හා හොඳ පුරුදු යටත් පිරිසෙයින් සුදුසු රැකියාවක් ලබා ගන්නා තෙක් නුදුරු අනාගතයෙහි දු ඔබට ප්‍රයෝජනවත් වනු ඇත. තමන් දුක්හිරිහැර විඳිමින් ඔබ උසස් අධ්‍යාපනයට යොමු කළ ඔබේ දෙමාපිය භාරකරුවන් ද, එසේ ම ඔබට ඉගැන්වූ අධ්‍යයනයට මං පෙන්වූ ඔබේ ආචාර්ය මහාචාර්යවරුන් ද මටත් වඩා මේ අවස්ථාවෙහි ප්‍රීතියක් ප්‍රමෝදයක් භුක්ති විඳිනවාට සැකයක් නැහැ.

### උපාධිධාරීන්ගේ රක්ෂා නියුක්ති ප්‍රශ්නය

මීළඟට මම කැමතියි ඔබට අදාළ වන තවත් වැදගත් ප්‍රශ්නයක් කෙරෙහි අවධානය යොමු කරන්ට. එය තමයි නවෝපාධිධාරීන්ගේ සේවා නියුක්තිය පිළිබඳ ප්‍රශ්නය. අද මේ උපාධි ප්‍රදාන පර්ෂදයේ මුලසුන හොබවන කුලපතිතුමිය විසින් 1986 දී පවත්වන ලද උපාධි ප්‍රදානෝත්සව දේශනයේදී මේ සම්බන්ධයෙන් පවසන ලද වැදගත් කරුණු කීපයක් වර්තමාන තත්ත්වයට ද අදාළ බව මගේ අදහසයි.

මේ වන විට අපේ රටේ රක්ෂා විරහිත, නැතහොත් ඌන සේවා නියුක්ත උපාධිධාරීන්ගේ සංඛ්‍යාව දොළොස් දහසක් පමණ වන බවට වාර්තා වී තිබෙනවා. මේ අය අතරෙන් වැඩිදෙනා

ශාස්ත්‍ර විෂයයන්ගෙන් උපාධි ලබාගත් අය වන නමුත් ඇතැම් වෘත්තීය විෂයයන් ද ඇතුළුව විද්‍යා විෂයයන්ගෙන් උපාධි ලබාගත් අයත් මේ අය අතරෙහි සිටින බව දැන ගන්නට තිබෙනවා. මෙය වර්ෂ දශක දෙක තුනක පටන්ම වරින් වර අඩුවැඩි වෙමින් දිගටම පැවත එන තත්ත්වයක්. මේ කාලය තුළ විවිධ රජයන් මගින් මෙම තත්ත්වය මැඩ පැවැත්වීමට පිළියම් වශයෙන් යම් යම් තාවකාලික ක්‍රියාමාර්ග ගෙන ඇතත්, ඒවා රෝගකාරක හේතු නිවැරදිව වටහා ගෙන කළ පිළියම් නොවූ නිසාදෝ, අද දක්වාත් මේ රටේ රක්ෂා විරහිත උපාධිධාරීන් පිළිබඳ ප්‍රශ්නය නොවිසඳී පවතිනවා. එය එක් අතකින් විදේශීය ආයෝජන මාර්ග වැඩි දියුණු කිරීම වැනි වෙනත් මාර්ගවලින් රට තුළ ඇති කිරීමට අපේක්ෂා කරන වේගවත් සංවර්ධනය උදෙසා අධ්‍යාපන සුදුසුකම්, විවිධ හැකියාවන් හා උනන්දුවත් ශක්තියත් ඇති තරුණ පිරිසෙන් කොටසක් සහභාගි කරවා ගැනීමට අපොහොසත් වීමෙන් සංවර්ධන ප්‍රයත්නය අඩපණ වීමට හේතුවක් වෙනවා. අනික් අතට හැකියාවනුත් ශක්තියත් ඇති තරුණ පෙළ රැකියා විරහිතව ජීවත් වන විට ඔවුන් හා ඔවුන්ගේ මවුපිය භාරකරුවන් සහිත සමස්ත සාමාජයම අපේක්ෂා භංගත්වයටත් අසහනයෙන් පෙළෙන්නන් බවටත් පත්වෙනවා.

ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වන රටක රජය උසස් අධ්‍යාපනය සඳහා මහජන මුදලින් විශාල ප්‍රමාණයක් වැය කරනවා. මෙය අපතේ නො ගිය වියදමක්, නැතහොත් ලාභ ගෙන දෙන ආයෝජනයක් ලෙස සැලකීමට හැකි වන්නේ එසේ උසස් අධ්‍යාපනය හා පුහුණුව ලැබූවන් නිසි කල්හිදී නිසි කාර්යයන්හි යොදා ගැනීමට වැඩ පිළිවෙළක් සැකැසී ඇතොත් පමණයි. රටේ උසස් අධ්‍යාපනය සැලසුම් කිරීමේ හා පවත්වා ගෙන යෑමේ කාර්යභාරය ඍජුවම උසුලන විශ්වවිද්‍යාලයන් ඇතුළු උසස් අධ්‍යාපන ආයතනත්, එම උසස් අධ්‍යාපන ආයතනවලින් වසරක් පාසා පිටවන ශාස්ත්‍රවේදීන් හෝ තාක්ෂණවේදීන් නිෂ්පාදන, කළමනාකරණ අධ්‍යාපන මාර්ගදේශකත්ව වැනි කාර්යයන් සඳහා යොදවා ගැනීමේ හැකියාව ඇති රාජ්‍ය හා පෞද්ගලික අංශවල කාර්යාංශ හා ආයතනත් සුදුසු පරිදි හා ඔවුනොවුන්ට ප්‍රයෝජනවත් වන පරිදි සම්බන්ධ කොට ගනිමින් කාලෝචිත වූ එබඳු වැඩපිළිවෙළවල් සැලසුම් කිරීමෙහි හා ක්‍රියාත්මක කිරීමෙහි සමත් උගත් රැකියා නියුක්ත අධිකාරියක් පිහිටුවීම මුඛ්‍ය වශයෙන් රජයේ වගකීමක් සේ පිළිගැනීම අවශ්‍යය. මෙබඳු වැඩපිළිවෙළක් යටතේ, විශ්වවිද්‍යාලවලින් හෝ පිළිගත් උසස් වෘත්තීය පුහුණු ආයතනවලින් හෝ පිටවන සෑම උපාධි/ඩිප්ලෝමා ලාභියකුම පළමුවෙන් උගතුන්ගේ රක්ෂා නියුක්ති අධිකාරියට බඳවාගෙන, දෙවනුව අදාළ කාර්යාංශ, සංස්ථා ආයතන ආදියේ අවශ්‍යතාවන් පුද්ගලයන්ගේ සුදුසුකම් හා අභිරුචියන් අනුව රැකියාවල නියුක්ත කළ හැකිවනු ඇත. එසේ ස්ථිර රැකියාවක නියුක්ත කරන තෙක් ගත වන කෙටි කාලපරිච්ඡේදය තුළ සෑහෙන යැපීම දීමනාවක් යටතේ ස්වයං රැකියා ද ඇතුළුව විවිධ රැකියාවලට අනුරූප වන පරිදි සැලසුම් කළ, අභිමතය අනුව වරණය කළ හැකි යෝග්‍යීකරණ පාඨමාලාවක් හැදෑරීමට ඔවුන් යෙදවිය හැකියි. මෙහිදී ද විශේෂයෙන් සැලකිය යුත්තක් නම් වසරක් පාසා තේරීමේ පරීක්ෂණ ආදිය මඟින්, රාජ්‍ය පරිපාලන සේවා, විදේශීය සේවා, අධ්‍යාපන සේවා ආදිය සඳහාත් පෞද්ගලික රැකියා සඳහාත් තෝරාගනු ලැබීමෙන් පසු ඉතිරි වන සියලුදෙනා අවශ්‍යතාව නොසලකා දැනට පවත්නා රජයේ කාර්යාංශ හා සංස්ථා ආදියෙහි රැකියාවලට කෙසේ හෝ අනුයුක්ත කිරීමක් මෙයින් අදහස් නොකෙරෙන බවයි. ආයතනයක සේවා අවශ්‍යතා නොසලකා වැඩ නැතිව වැටුප් ලබන අතිරික්ත පිරිසක් යෙදවීමෙන් සිදුවන්නේ එය ක්‍රමයෙන් පරිහානිය කරා යෑමයි. එක් අතකින් එම තත්ත්වය එහි මනා ක්‍රියාකාරීත්වයට බාධා පැමිණවීමක්. අනෙක් අතින් වෙහෙස වී වැඩ කරගෙන ආ සේවකයන්ගේ ද ධෛර්යය හා ඕනෑකම හීන කරවීමක්. ඒ මඟින් රටේම ආර්ථික පරිහානියට මං සලසනවා.

එසේ හෙයින් කළ යුතු හොඳම දෙය වන්නේ ජාතික සංවර්ධනයට හේතු වන පරිදි රටේ කෘෂිකාර්මික නිෂ්පාදන මාර්ග සමග ස්වාභාවික සම්පත් උපයෝගිතා ක්‍රම වැඩි දියුණු කිරීම ආයාත නිර්යාත වානිජ්‍යයේ විධිමත් කිරීමක් අධ්‍යාපන සෞඛ්‍ය හා ගමනාගමනය වැනි පොදුජන සේවා වැඩි දියුණු කිරීම් ආදිය මඟින් උගත් ශ්‍රමිකයන් යෙදවිය හැකි රැකියා අවස්ථා වැඩි වැඩියෙන් ජනනය කරවා, එමඟින් සංවර්ධන කාර්යය සඳහා සෑම උගත් ශ්‍රමිකයකුගේ ම දායකත්වය ලබා ගැනීම යි. මෙහි දී සැලසුම් සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය හා තරුණ කටයුතු අමාත්‍යාංශය ඇතුළු වෙනත් අදාළ අමාත්‍යාංශවලද පූර්ණ සහයෝගය ලබාගැනීමේ වගකීම උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට පැවරෙනු ඇත. එයට සරිලන පරිදි යෝග්‍ය සම්බන්ධීකරණෝපක්‍රම මාර්ගයෙන් රටේ විශ්වවිද්‍යාල/වෙනත් උසස් වෘත්තීය පුහුණු ආයතනත් උපයෝගී කොට ගනිමින් විවිධ ක්ෂේත්‍රවල විවිධ වෘත්තීන්හි යෙදෙමින් රටේ සංවර්ධනයට උරදිය හැකි රටට අවශ්‍ය උපාධි/ඩිප්ලෝමාධාරීන් බිහි කෙරෙන තැනට කටයුතු සලසා ගැනීම උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් රජයකට පහසුවෙන් කරගත හැකි වනු ඇත.

උසස් අධ්‍යාපන ආයතනවල විවිධ වෘත්තීන්ට ගැළපෙන රැකියා යොමු පාඨමාලා පමණක් පැවැත්විය යුතු බවක් මෙයින් අදහස් කෙරෙන්නේ නැහැ. වෛද්‍ය වෘත්තීය, ඉංජිනේරු වෘත්තිය, නීති වෘත්තිය වැනි සමහරක් වෘත්තීන්ට අදාළ පාඨමාලා හැරුණුවිට, අධ්‍යාපනය, පරිපාලනය වැනි වෘත්තීන් බොහෝමයක් සඳහා අපේක්ෂකයන් යොමු කරවීම හා යෝග්‍ය කරවීමත් විශ්වවිද්‍යාලයීය ප්‍රථමෝපාධියකින් පසුව දෙනු ලබන දෙතුන් මසක හෝ සමසක යෝග්‍යීකරණ වැඩපිළිවෙළක් මඟින් සාර්ථක ලෙස ඉටුකර ගත හැකිය.

ඇතැම් වෘත්තීන්හි නියුතු ප්‍රථමෝපාධිලාභීන් උදෙසා පැවැත්වෙන ලේඛකත්ව හා සන්නිවේදන වැනි දීර්ඝකාලීන පශ්චාද් උපාධි හෝ ඩිප්ලෝමා පාඨමාලා මේ ගණයට වැටෙන්නේ නැහැ.

ඉහත කී ආකාරයක වුවත් රැකියා යොමු පාඨමාලාවනට සිසුන් බඳවා ගත යුත්තේ එක් එක් වෘත්තීය සඳහා පවත්නා ඉල්ලුම නිවැරදිව හඳුනා ගැනීමෙන් පසුවය. එසේ නැතහොත් රැකියාවක් හෝ ප්‍රයෝජනවත් විෂයඥානයක් හෝ නැති පිරිසක් එමඟින් බිහිවිය හැකි නිසා ය. 1973 විශ්වවිද්‍යාලය ප්‍රතිසංවිධානයේදී අත්හදා බැලූ රැකියා යොමු පාඨමාලා අසාර්ථක වීමට ප්‍රධාන හේතුව වූයේ මෙකී අඩුපාඩුවයි.

## රැකියා යෝග්‍යතාව දියුණු කර ගැනීම

අප මෙතෙක් සාකච්ඡා කළේ උපාධිධාරීන්ගේ රැකියා නියුක්ති ප්‍රශ්නය විසඳීම සඳහා රජයට හා විශ්වවිද්‍යාල ඇතුළු උසස් අධ්‍යාපන ආයතනවලටත් කළ හැකි දේ මොනවාද යන්නයි. එහෙත් ඉබේම තමන්ට රැකියාවක් ලැබෙන තෙක් නිකම් නොසිට උපාධිධාරීන් විසින් ද තම තමන්ගේ ප්‍රශ්න විසඳා ගැනීම සඳහා කළ හැකි දේ ඇති බව මෙහිදී අමතක නොකළ යුතුය. මා ඉහතින් සඳහන් කළ උපාධි ප්‍රදානෝත්සව දේශනයේදී පෙන්වා දී ඇති පරිදි උපාධියට අමතරව විවිධ රැකියා සඳහා විශේෂයෙන් පෞද්ගලික අංශයේ රැකියා සඳහා අවශ්‍ය සේ සැලකෙන අතිරේක සුදුසුකම් හා යෝග්‍යතාවන් දියුණුකර ගැනීම ඒ ඒ අපේක්ෂකයා සතු වගකීමක්. උපාධිධාරීන්ට, විශේෂයෙන් ශාස්ත්‍ර උපාධිධාරීන්ට, පෞද්ගලික අංශයේ හොඳ රැකියා ලබා ගැනීමට ඇති බාධා කීපයක් ඉහත කී දේශනයෙහි දක්වෙනවා. මෙහි ලා පළමුවැන්න වශයෙන් දක්වෙන්නේ අවශ්‍ය ප්‍රමාණයට ඉංග්‍රීසි භාෂාව නොදැනීමයි. මේ ප්‍රශ්නය ඇති තරම් සාකච්ඡා වී ඇති නිසා ඒ ගැන මා විස්තර කරන්ට යන්නේ නැහැ. දෙවැන්න නම් නවෝපාධිධාරීන් බොහෝදෙනා තනතුරු දැරීමේ හැකියාව හෙවත්

යෝග්‍යතාව අඟවන ලක්ෂණ ප්‍රදර්ශනය නොකිරීමයි. මෙ කියන යෝග්‍යතාව අඟවන ලක්ෂණ නම් වගකීමක් දැරීමට ඇති හැකියාව හා කැමැත්තත්, විනීතත්වය හා පෞරුෂයත්, නිර්මාණශීලී චින්තනයත් වැනි ගුණාංගයි. මෙකී ගුණාංග නව උපාධිධරයන් තුළ ඇත්තේ අල්ප වශයෙනැයි බොහෝ සේවා යෝජකයන් නිගමනයකට නැතහොත් පූර්ව විනිශ්චයකට එළඹ ඇති බවක් පෙනෙනවා. මෙසේ වීමට මුළුමනින් කෙසේ වෙතත් එක්තරා ප්‍රමාණයකට, මෑත කාලයේදී ලක්දිව විශ්වවිද්‍යාලවල නිරන්තරයෙන් ඇතිවන බවට ජනමාධ්‍ය මඟින් අසන්නට දකින්නට ලැබෙන සිසු ගැටුම්, පංති වර්ජන, නවකවද, හා සති/මාස ගණන් විශ්වවිද්‍යාලය වසා තැබීම් වැනි අහිතකර පුවත් ද හේතු වූවා විය හැකිය. විශ්වවිද්‍යාලයේ බුද්ධිමත් සිසු පිරිසටත් පරිපාලනයටත් ආචාර්ය මණ්ඩලයේ ද සහයෝගය ඇතිව එම අහිතකර තත්ත්වය මඟ හරවා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමෙන් පමණයි මේ බාධකය ඉවත් කර ගත හැකි වන්නේ.

අතීතයෙහි ලක්දිව මෙන්ම ඉන්දියාවෙහිත් පැවති සාම්ප්‍රදායික අධ්‍යාපනයෙහි මුඛ්‍ය අරමුණ වූයේ දැනීම දීම ද නොව එමඟින් පුද්ගල ශික්ෂණයත්, එමඟින් ස්ථානාන්තර යෝග්‍යතාවත් ඇති කිරීමයි.

''විද්‍යා දදාති විනයං - විනයාද්‍යාති පාත්‍රතාම්
පාත්‍රත්වද්ධනමාප්නෝති - ධනාද්ධර්මං තතඃ සුඛම්''

''උගත්කම මිනිසා තුළ ශික්ෂණය ඇති කරයි. ශික්ෂණය මඟින් ඔහු ස්ථානාන්තර යෝග්‍යතාවටත්, යෝග්‍යතාව නිසා ස්ථාන්තර ලාභය මඟින් ධනවත් බවටත් එමඟින් සැපයටත් පැමිණෙයි.'' යනු එම ශ්ලෝකයේ අදහසයි. අපේ මංගල සූත්‍රයෙහි එන බාහු සච්චංච සිප්පංච විනයෝච සුසික්ඛිතො'' යන ගාථාර්ථයෙන් ද පැවසෙන්නේ මීට සමාන වූ අරුතක්. අධ්‍යාපනය පිළිබඳ ප්‍රාථමික, කණිෂ්ඨ, ද්විතියික, ජ්‍යෙෂ්ඨ ද්විතියික තෘතියික හෙවත් උසස් අධ්‍යාපන යන සෑම පියවරකදීම විෂයඥාන හා කුශලතා වර්ධනයත් සමග සමගාමී වූ පාරම්පරික සාරධර්ම නොහොත් ඇගයීම් ක්‍රමවල ශික්ෂණයත් පෙරදිග සාම්ප්‍රදායික අධ්‍යාපනයෙන් අපේක්ෂිත වුණා. පැරණි ඉන්දියාවේ තක්ෂිලා, නාලන්දා මහාවිහාර වැනි හින්දු හා බෞද්ධ විශ්වවිද්‍යාලවලත්, පැරණි අනුරාධපුරයේ තිස්සමහාරාම මහාවිහාර ද අභයගිරි මහාවිහාර හා තොටගමුවේ විජයබාහි පිරිවෙන වැනි විශ්වවිද්‍යාලවලත් පැවතුණේ එම තත්ත්වයයි. නූතන ඉන්දියාවේ පාලකයන් හා චින්තකයන් ද අධ්‍යාපනයෙන් මීට සමාන ප්‍රතිඵල අපේක්ෂා කළ බව / කරන බව අපි දන්නවා. 1957 පළ වූ 'නිව් ෆ්‍රන්ටියර්ස් ඔෆ් එඩියුකේෂන්' (අධ්‍යාපනයේ නව පෙරමුණු) නම් ග්‍රන්ථයට පෙරවදනක් ලියමින් සර්වපල්ලි රාධාක්‍රිෂ්ණන් පවසන ''අධ්‍යාපන විෂයඥානය දීමට හෝ කුශලතා පිළිබඳ පුහුණුවට හෝ සීමා නොවේ. එය පාරම්පරික ඇගයීම් පිළිබඳ මනා හැඟීමක් ද අධ්‍යාපිතයාට දිය යුතුය. (මානවීය ශාස්ත්‍ර හා සමාජීය ශාස්ත්‍ර උගතුන් පමණක් නොව) විද්‍යාඥයෝ හා තාක්ෂණවේදීහු ද පුරවැසියෝ වෙති. එහෙයින් තමන් ජීවත්වන ජන සමාජය කෙරෙහි වගකීමක් ඔවුන් වෙත ද පැවරෙයි'' යන වැකියෙන් පෙනෙනවා. මෙම අදහස පෙරදිගට පමණක් සීමා වූවක් නොවන බව ද 'ක්‍රයිසිස් ඉන් ද යුනිවසිටි' (විශ්වවිද්‍යාලයේ අර්බුදය) නම් ග්‍රන්ථයෙහි සඳහන් ''සමාජයෙහි සාදාචාරාත්මක, බුද්ධිමත් හා ආධ්‍යාත්මික විප්ලවයක් ඇති කිරීම සඳහා අධ්‍යාපනයට දායක විය හැකි නම් ලොව හැම තැනම වෙසෙන මානව වර්ගයාට තමන් විඳින දුකෙන් විමුක්තිය අපේක්ෂා කළ හැකි වනු ඇත.'' යන කියමනෙන් හෙළිවෙනවා.

ලක්දිව අතීතයෙහි පැවැති පිරිවෙන් අධ්‍යාපනය ද ඇතුළු සාම්ප්‍රදායික අධ්‍යාපනයෙහි ව්‍යාප්තියේ පෘථුලත්වය හා ගැඹුර කලින් කල අඩු වැඩි වී ඇතත්, චරිත වර්ධනය හා සමාජීය සදාචාරයත් එහි ප්‍රමාණ අරමුණක් සේ සැලකීම අඛණ්ඩව පැවති බවට සාහිත්‍ය හා ඓතිහාසික සාධක තිබෙනවා.

## නව පාඨමාලා. පාඨමාලා නවීකරණ හා හිතකර සාම්ප්‍රදායික අංග

එසේ වුවද අද රටේ පවතින උසස් අධ්‍යාපනය ද ඇතුළු සෑම මට්ටමක ම අධ්‍යාපනයෙන් මෙම අරමුණ බොහෝ දුරට ඉවත් ගොස් ඇති බවක් පෙනේ. මෙයට සුදුසු පිළියම් යෙදීම නොපමාව කළ යුත්තකි. රටේ වේගවත් ආර්ථික සංවර්ධනය / සැලසුම් සම්පාදකයන්ගේ හා ක්‍රියාකාරීන්ගේ එකම ඉලක්කය, නැතහොත් ප්‍රධානතම ඉලක්කය වීම නිසා දෝ අනෙකුත් පුරුෂාර්ථ ටිකින් ටික සමාජයෙන් බැහැරවන සේ ය. රටක සැබෑ සංවර්ධනයට ආර්ථික සංවර්ධනය මෙන් ම රටවැසියන්ගේ පුද්ගල චරිත වර්ධනය ද ඇතුළත් විය යුතු ය. සනාතන සාරධර්ම අගයන සාදාචාර සම්පන්න සුඛිත මුදිත ජනතාවක් රට තුළ බිහිවන්නේ එමගිනි.

මෙහිදී සැලකිය යුතු තවත් කරුණක් තිබෙනවා. ස්වකීය අභිමතය අනුව පාඨමාලා තෝරා ගැනීමේ ඉඩකඩ තවමත් හරිහැටි සැලසී නැතත් හැකියාව හා උනන්දුව ඇති, එසේම මූලික සුදුසුකම් සපුරා ගත්, හැම කෙනෙකුට ම නැතත් වැඩි දෙනෙකුට එල නෙළා ගත හැකිවන පරිදි අද අප රටේ විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය පුළුල් වී වර්ධනය වී තිබේ. එක් අතකින්, රටේ කාලීන අවශ්‍යතා සමහරකට මෙයින් පිළියම් සැලසෙන අතර ම අනික් අතින් එය අධ්‍යාපනයේ ගුණාත්මක තත්ත්වය හා කළමනාකරණය පිළිබඳ ගැටලු පැන නැගීමට ද හේතුවක් වී ඇත. අප කවර ක්ෂේත්‍රයක හෝ සංවර්ධන කටයුතු මෙහෙය විය යුත්තේ එමගින් අපට සරලත්වයෙහි සිට සංකීර්ණත්වය කරා යෑමට සිදුවිය හැකි බව සිත තබා ගනිමිනි. 'ඔෆ් සොසයිටි ඇන්ඩ් මෙන්' (මානව සමාජ හා මිනිස්සු) නම් කෘතියෙහි ලා කාර්ල් හැරිසන්, ප්‍රවර්ධනය සංකීර්ණතාවටත් සංකීර්ණතාව විශේෂිකරණයටත්, විශේෂිකරණය නැවත ඒකත්වීකරණයටත් මංසලසන බව පවසනවා.

උසස් අධ්‍යාපනයේ කිසියම් විෂය ක්ෂේත්‍රයක හෝ වෘත්තීය ශික්ෂණයක හෝ විශේෂිකරණයෙන් අපේක්ෂා කරන්නේ ඒ පිළිබඳ අත්‍යන්ත විශිෂ්ටත්වයක් ළඟා කර ගැනීම හා පවත්වා ගැනීමයි. ජේම්ස් ඒ. පර්කින්ස් මෙය දකින්නේ ඥානවිදාරණයෙහි ප්‍රතිඵලයක් වශයෙන් පැන නැඟුණක් ලෙසයි. 'ද යුනිවසිටි ඉන් ට්‍රාන්සිෂන්' (විශ්වවිද්‍යාලය සංක්‍රමිකා අවස්ථාවෙහි) නම් කෘතියට ලිපියක් සපයමින් ඔහු මෙසේ කියනවා, ''ඊනියා ඥාන විදාරණය'' අධ්‍යාපනයේ සාම්ප්‍රදායික ආයතන මත වෙනස් ආකාරයක දුෂ්කරතාවක් පටවා ඇත. එක් කලකදී විශ්වවිද්‍යාලය තමන් ගැන සිතුවේ ඥානයේ ඒකාග්‍රතාව ගවේෂණය කළ හැකි ආයතනයක් ලෙසයි. එහෙත් එයට දූන් ප්‍රස්තුතයෙහි අත්‍යන්ත විශිෂ්ටතාව පවත්වා ගැනීම සඳහා ඥානයේ විශේෂිකෘත ඛණ්ඩයන් කෙරෙහි අවධානය යොමු කිරීමට සිදුව තිබේ'' යනුවෙනි.

මේ විශේෂීකරණය අද සමහර විශ්වවිද්‍යාලවල ඇතැම්විට සම්පත් ප්‍රමාණය කාලීන අවශ්‍යතාව හෝ ඵලදායිතාව පවා නොසලකා විලාසිතාවක් වශයෙන් ක්‍රියාත්මක වන බවටත් එක් විෂය ශාඛාවකට පමණක් විශේෂාවධානය යොමු කිරීම නිසා උපාධිලාභීන්ට ප්‍රායෝගික වශයෙන් බොහෝ සෙයින් වැදගත් වන සාමාන්‍ය ඥානය පුළුල් කර ගැනීමට අවස්ථාව නොලැබී යන බවටත් විවේචන එල්ල වී තිබෙනවා. විශේෂිකරණයට ඉඩ තිබියදීම වුවත්, අධ්‍යයනාංශ අතරෙහිත් පීඨ අතරෙහිත් විෂය ශාඛා තෝරා ගැනීමට ඇති ඉඩකඩ වර්ධනය විය යුතු බවත් බොහෝ අධ්‍යාපනඥයන් පිළිගන්නා දෙයක්. එනිසා මෙය අදාළ අධ්‍යාපන බලමණ්ඩලවල අවධානය යොමුවිය යුත්තක්.

විශේෂිකරණය මගින් කිසියම් විෂය ශාඛාවක් හෝ වෘත්තීය ශික්ෂණයක හෝ අධ්‍යයන පර්යේෂණවල අත්‍යන්ත විශිෂ්ටතාවක් ඇති කිරීමට නම් ඒ සඳහා ප්‍රමාණවත් භෞතික සම්පත් මෙන් ම විශේෂඥ පුද්ගල සම්පත් ද තිබිය යුතු වෙයි. එහෙත් බොහෝ විෂය ක්ෂේත්‍ර සම්බන්ධයෙන්

අපේ රට වැනි සංවර්ධනය වන රටවල සාමාන්‍යයෙන් මෙකී දෙයාකාරයේ ම සම්පත්වල හිඟයක් ඇත. එබඳු හිඟයක් නැති ක්ෂේත්‍රවල බොහෝවිට විශේෂඥයින් පිළිබඳ ව අවශ්‍යතාවට වඩා අතිරික්තයක් ඇත. එබැවින් මෙබඳු රටවල විශේෂීකරණයක් සැලසුම් කළ යුත්තේ, අවිධිමත් ද්විත්වීකරණ බහුත්වීකරණ මාර්ගයෙන් පවත්නා සම්පත් ස්වල්පය සී සී කඩ විසිරී යෑමට ඉඩ නොතබා එයින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට හැකි වන අයුරිනි. මහජන මුදල් අපතේ යෑම ද එමඟින් වැළැක්විය හැකිය. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා උසස් අධ්‍යාපන ආයතන මඟින් වඩාත් හොඳින් සංවිධානය කළ හැකි විශේෂීකෘත පාඨමාලා සඳහා විවිධ අමාත්‍යාංශ හා කාර්යාංශ මඟින් වෙනම අභ්‍යාස ආයතන ආරම්භ කිරීම හා පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් ද මෙකී කරුණු බොහොමයක් අදාළ වෙනවා. මෙබඳු අභ්‍යාස ආයතන අභ්‍යන්තර අවශ්‍යතා සඳහා පමණක් සේවකයන් පුහුණු කිරීමට සීමා නොවී පුහුණු අතිරික්තයක් ද පිට කිරීමට ගියහොත් සේවාස්ථ කිරීම සඳහා සුදුසු පුද්ගලයන් තෝරා ගැනීමේදී විශේෂයෙන් එය පරිබාහිර සේවාදායකයන්ටත්, නියමිත වැටුප් ක්‍රම හා උසස්වීම් ලබා ගැනීමේදී සේවකයන්ටත් ගැටලු මතු කරන්නක් විය හැකියි.

වර්තමානයෙහි විශ්වවිද්‍යාලයන්හි සාමාන්‍යයෙන් දක්නට ලැබෙන ප්‍රගතිශීලී ප්‍රවණතාවන් නම් නවීකරණයට හා නවාංග එක් කිරීමට ඇති උනන්දුවයි. මෙය නූතන ඥාන විදාරණය නිසා විවිධ විෂය ක්ෂේත්‍රවල ඇති වී තිබෙන ප්‍රගතියත්, රට තුළ ඇති අවශ්‍යතාව මත පදනම් වූ ප්‍රායෝගික වැදගත්කමත් සම්පත්වල සුලභතාවත් සැලකිල්ලට ගනිමින් සිදුකෙරෙතොත් ආයතනයේ ප්‍රවර්ධනයට මෙන්ම එහි හොඳ නමටත් බෙහෙවින් ශුභ දායක වන්නක්. එසේ නැතිව විලාසිතාවක් වශයෙන් කෙරෙන විදේශීය ආදර්ශ අනුකරණයක් පමණක් වුවහොත් එහි ප්‍රතිඵලය පිරිසක් අමාරුවේ වැටීම පමණක් විය හැකියි. පාඨමාලා නවීකරණයේදී විශේෂයෙන් සැලකිය යුත්තක් නම්, බාහිර ලෝකයෙහි ඇති වී තිබෙන ඥාන විදාරණයට හා විෂය ක්ෂේත්‍රයන්ගේ ප්‍රගතියට පමණක් සීමා නොවී අනාදිමත් කාලයක් අපට ඉෂ්ට ප්‍රතිඵල ලබා දී ඇති දේශීය වූ සාම්ප්‍රදායික දැනුම ගිලිහී යා නොදී මතුකොට ගැනීම හා ප්‍රයෝජනයට ගැනීම වැදගත් වන බවයි.

සම්ප්‍රදාය ගැන කථා කරන විට අප විශ්වවිද්‍යාලවලටත් සම්ප්‍රදායක් ඇති බව අමතක නොකළ යුතුයි. අද පැවැත්වෙන මේ උපාධි ප්‍රදානෝත්සවයන් සියවස් 10 ක් පමණ ඈතට දිවෙන යුරෝපීය විශ්වවිද්‍යාලය සම්ප්‍රදාය අනුව පැවැත්වෙන්නක්. ඒ අපේ මේ වර්තමාන විශ්වවිද්‍යාලය පිහිටුවා තිබෙන්නේ බොහෝදුරට එම සම්ප්‍රදාය අනුව යමින් නිසායි. එහෙත් ඊටත් වඩා පැරණි විශ්වවිද්‍යාලයීය අධ්‍යාපන ක්‍රමයක් පෙරදිගත්, ලක්දිවත් පැවතුණා. ලක්දිවින් එය අතුරුදන් වූයේ 16 වන සියවසේදී විදේශීය ආක්‍රමණ නිසා බව පෙනෙනවා.

මෑත අතීතයේ ලක්දිව විශ්වවිද්‍යාලවල පැවති හිතකර සම්ප්‍රදායක් තමයි නිබන්ධ හෙවත් ටියුටෝරියල් ලිවීම හා සාකච්ඡාව. වර්තමානයෙහි අපේ විශ්වවිද්‍යාලවලින් මේ දෙකම ටිකෙන් ටික ගිලිහී යන බවක් පෙනෙන්නට තිබීම කණගාටුවට කරුණක්. දේශන ශාලාවලින් පිටත බාහිර ලෝකයෙහි හෝ විද්‍යාගාරවල හෝ කරනු ලබන සමීක්ෂණ, පරීක්ෂණ, අත්හදාබැලීම්, පුහුණුවීම් වැනි ප්‍රායෝගික වැඩ අඩුවෙන් කෙරෙන මානවීය හා සමාජීය විද්‍යා විෂයක ශික්ෂණයන්ට මේ නිබන්ධ ලිවීම විශේෂයෙන් වැදගත් වෙනවා. මෙයින් ලැබෙන ප්‍රධානම ප්‍රයෝජනය නම් පුළුල් ලෙස පොතපත කියවන්නට පෙළඹීමයි. මේ මඟින් තරමක් අපහසුවෙන් හෝ ඉංග්‍රීසි පොතපත කියවීමට යොමු කිරීමෙන් විෂය ඥානය සමග භාෂා ඥානයත් ලබා ගන්ට සැලැස්විය හැකියි. එසේ කියවා ප්‍රස්තුතයට අදාළ කරුණු රැස්කර ගන්නටත්, ඉලක්කය කරා යොමු වන පරිදි ඒවා ඉදිරිපත් කරන්නටත්, කර්මණ්‍ය ලෙස බස හසුරුවා ගන්නටත් එමඟින් ලැබෙන පුහුණුව ඔහුට/ඇයට පසුකාලයෙහි බෙහෙවින් ප්‍රයෝජනවත් වන්නක්. ලක්දිව විශ්වවිද්‍යාලවලින් මෑත කාලයේ පිටවන

උපාධිධාරීන්ට ඊට කලින් අවදියේ පිට වූ උපාධිධාරීන්ට තරම් සාමාන්‍ය ඥානය නැති බවට සමහරු කරන විවේචනයටත් එමගින් පිළියමක් යෙදෙනවා.

සාකච්ඡාව හා සංවාදය ඈත අතීතයේ පටන් ම පෙරදිග මෙන් ම අපරදිගත් විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනයෙහි වැදගත් අංගයක් වුණා. නිර්මාණාත්මක ලෙස සිතන්නටත්, තර්කානුකූල ලෙස කරුණු ඉදිරිපත් කොට ප්‍රතිවාදී මත බිඳ දමමින් ස්වමත ස්ථාපනයටත් එමගින් මනා පුහුණුවක් ලැබුණා. පැරණි චීනයේ කොන්ෆියුසියස් ග්‍රීසියේ සොක්‍රටීස්, ඉන්දියාවේ බුදුන් වහන්සේ වැනි දාර්ශනික මාර්ගදේශක බුද්ධිමතුන් ඉගැන්වීම සඳහා උපයෝග කරගත්තේ මේ සංවාද ක්‍රමයයි. ක්‍රි.පූ. 4 වන සියවසේ දී ප්ලේටෝ විසින් ඇතැන්ස්හි ඇකඩමි නමිනුත්, ඇරිස්ටෝටල් විසින් ලයිසියම් නමිනුත් ඇරඹූ උසස් අධ්‍යාපන ආයතනවලත් ඉගැන්වීමේදී සංවාදයට ලැබුණේ වැදගත් තැනක්. අපේ විශ්වවිද්‍යාලයවලත් මුල් අවධියේ දී පැවති පරිදි නිබන්ධ පන්ති, සාහිත්‍ය නිර්මාණ පන්ති හා සාහිත්‍ය විචාර පන්ති ආදිය උපයෝගි කොට ගනිමින් සිසුන් අතර සංවාදයට මං සැලසීම ඔවුන්ගේ චරිත වර්ධනයට ද හේතුවක් වෙනවා.

අවසාන වශයෙන් අපේ රටේ උසස් අධ්‍යාපනය හැඩගැස්වීමේ දී සැලකිය යුතු තවත් එක් කරුණක් ගැන මා මෙහිදී සඳහන් කරන්නට කැමතියි. නව පාඨමාලා ඉදිරිපත් කිරීමත්, පවත්නා පාඨමාලාවල නවීකරණයත් මඟින් ශිෂ්‍යයන්ගේ ඥානවර්ධනය සඳහා සෑහෙන උනන්දුවක් අද විශ්වවිද්‍යාලවල දක්ක හැකියි. එසේම ක්‍රීඩා හා ශාරීරික අභ්‍යාස මඟින් ශිෂ්‍යයන්ගේ ශාරීරික සංවර්ධනය සම්බන්ධව ද සෑහෙන උනන්දුවක් දක්වන බව පෙනෙන්නට තිබෙනවා. එහෙත් ශිෂ්‍යයන්ගේ මානසික වර්ධනය සම්බන්ධයෙන් දනට දක්වනු ලබන සැලකිල්ල ප්‍රමාණවත් ද යන්න සොයා බැලිය යුත්තක්. ඉහත ගෙන හැර දැක්වූ රාධා ක්‍රිෂ්ණන්ගේ හා මොබර්ලිගේ කියමන්වලිනුත් පෙනෙන්නේ අධ්‍යාපනයේ සෑම පියවරකදීම එහි ඇති වැදගත්කමයි. විශ්වවිද්‍යාලවල ශිෂ්‍යයන්ට ඇති මානසික ගැටලු සොයා බලා පිළියම් යෙදීම මෙහිදී මූලික අවශ්‍යතාවක්. ඒ සමඟම විවිධ වූ රුචිකත්වයන්ට ගැළපෙන විවිධ වූ නිර්මාණාත්මක, කලාත්මක, ආගමික, සංස්කෘතික වැනි පාඨමාලා පරිබාහිර වැඩසටහන්, අධ්‍යාපනික සමාජීය ස්වේච්ඡා සේවා වැඩසටහන් ආදියට සහභාගිවන්ට සැලැස්වීම ඇතුළු උපාය මාර්ග මෙහිදී ප්‍රයෝජනවත් වෙනවා. එවිට ඉහත 'විද්‍යා දදාති විනයං' යන්නෙන් කියූ පරිදි කවර වගකීමක යෙදීමට වුවත් යෝග්‍ය වූ අංගසම්පූර්ණ උගතුන් බිහිකිරීමට විශ්වවිද්‍යාලය සමත් වන බව මගේ විශ්වාසයයි.

නවෝපාධිලාභීන් හැමදෙනාට දීප්තිමත් අනාගතයක් උදාවේවා යි නැවතත් ආශිංසනය කරමින් උපාධි ප්‍රදානෝත්සව දේශනය මෙයින් නවත්වමි. අසා සිටි ඔබ සැමට ස්තුතියි !

<u>1996.11.02</u>

# Solutions for the Graduate Unemployment

**Prof. Wimal G. Balagalle**

There were more than one reason for me to accept so willingly the invitation extended to me by the Vice Chancellor of the University of Sri Jayewardenepura to deliver this convocation address on this solemn occasion. On the one hand, I consider this gesture as a token of appreciation of my humble contribution to this University as a university don and member of various university bodies for some thirty years; on the other, I thought this would provide me an opportunity to express a few ideas that might be useful not only to the new graduands but also to contemporary leaders of higher education in this country. Therefore, I wish to sincerely thank the Vice -Chancellor and the members of the Senate and of the University Council for offering me this opportunity.

I feel it is my next duty to congratulate the new graduands on achieving their desired goal and to give them my blessings. Dear friends, it is not solely due to your intelligence or your being fortunate enough to receive university education which is restricted to a very small fraction of the population that you have been able to fulfill your wish to enter this challenging society, the wish you had been cherishing not only during the three or four years at the university but even long before when you were studying at school. Your success is more due to your indomitable courage, your strength to endure untold hardship and surmount various obstacles with firm resolution.

These skills and good habits which you have cultivated may stand you in good stead in the near future, at least till you find a suitable employment. Your parents and guardians who prompted you to pursue higher studies and your teachers and Professors who guided you in university education no doubt rejoice on this occasion and are much happier than I am.

Under such a scheme every holder of a degree or a diploma passing out of universities or recognized higher professional training centres can first be pooled into the higher employment bureau and then be employed in relevant departments. corporations or institutes in accordance with requirements of the institute, their educational qualifications and preferences. During this short period they spend before they secure permanent employment, they may be made to follow an apprenticeship course providing a variety of options, which is properly planned to cater to different vocations including self-employment on the basis of an adequate subsistence allowance. It must, however, be particularly mentioned that this does not in any way mean a random absorption of those who are left over after selecting candidates by means of interviews etc. for administrative service, overseas service, education service and so on, is contemplated without taking into consideration the actual need of the exiting state departments and corporations. The employment of a work force receiving pay without work paying no regard to the requirements of the institute, would gradually lead the institute to its decline. Moreover, this situation would become a hindrance to its proper administration on the one hand, and through discouragement

and lack of enthusiasm on the part of those who work hard, it paves the way for the economic decline of the entire country, on the other.

Therefore, the best thing to do is to generate more and more job opportunities for educated workers, by improving methods of utilizing natural resources together with improved production methods in agricultural and industrial sectors in such a way that they contribute to national development, by regularizing import and export trade and by improving public amenities such as education, health and transport. This would provide an opportunity to the educated worker to make his contribution to the development process. It is the responsibility of the Ministry of Higher Education to obtain the co-operation of the Ministry of Planning & Implementation, Ministry of Youth Affairs and other relevant ministries. With the help of the Ministry of Higher Education, the government can easily achieve the objective of turning out graduates and diploma holders capable of giving a thrust to development. For this purpose the University and other higher professional training institutes should be put to better use through proper co-ordination.

This is not to say that the institutes of higher education should provide only job-oriented courses. Apart from professional courses such as medicine, engineering and law, this can be successfully achieved by introducing certain professions like education and administration and prepare the students for them by means of an apprenticeship programme lasting two, three or six months after obtaining a first degree.

Long-term postgraduate and diploma courses like those of writership and mass communication conducted for first-degree holders employed in certain other professions do not come under this category.

Whatever the nature of the job-oriented course hinted at above, students should be enrolled only after correctly identifying the demand for each profession. Otherwise it might result in producing a set of graduates unfit to take up a job or possessing no useful subject knowledge. This is the main reason for the failure of the job-oriented courses tried during the university reorganization of 1973.

## Improving Job Fitness

We have so far discussed what the state and the institutes of higher education including universities could do to solve the unemployment problem of graduates. But we should not forget here that there are certain things that graduates themselves could do without idling away time waiting for jobs to come their way. As has been shown in the convocation address I referred to above, it is a responsibility on the part of the candidates to obtain additional qualifications and improve other skills which are considered, in addition to the degree, essential for a job in the private sector in particular. The above address has highlighted a number of obstacles which graduates, particularly the arts graduates, face in securing good jobs in the private sector. The first of these is the inadequate knowledge of English. Since this issue has already been discussed at length I do not propose to dwell on it on this occasion. The second is the failure on the part of the new graduates to display their ability or fitness to take up a job. This much

needed qualification covers the ability and the willingness to take up a responsibility, discipline and personality, creative thinking and so on. It appears that many employers have a preconceived notion that new graduates do not possess these qualities in sufficient measure. This situation has resulted, to some extent at least, from such incidents as student clashes, boycott of lectures, ragging and the closure of campuses for weeks months, reported in the mass media so often. This barrier can only be removed by the intelligent student community and the university administration by working in co-operation with the academic staff striving to remedy such unhealthy situation.

The main aim of the traditional education in ancient Sri Lanka as well as India was not just to impart knowledge but to promote individual discipline, and through it make him a worthy person.

‘Vidya dadãti vinayan vinayad yãti pãtratam
pãtratvãd dhanamapnoti dhanãd dharmam tatah sukham’

(Knowledge gives discipline; through discipline one acquires worthiness; from worthiness one obtains wealth; wealth leads to virtue and from there to happiness).

The half verse 'bãhu sachchan cha sippan cha vinayo cha susikkhito' occurring in the Mahamangala Sutra too conveys a meaning similar to the above. In all stages in an individual’s education such as elementary, junior secondary, senior secondary and tertiary or higher, subject knowledge and skill development running parallel to a training in traditional values or evaluation methods was expected of the traditional education in the East. This concept was upheld in Hindu and Buddhist universities of ancient India such as Taksasila and Nalanda Mahavihara as well as in the Tissarama mahavihara and Abhayagiri-Mahavihara of ancient Anuradhapura and the universities like Vijayabahu-pirivena of Totagamuva. We know that the rulers and thinkers of modern India expected similar results from education. This is exemplified by the following statement made by Sarvapalli Radhakrishnan in his foreword to the book **New Frontiers of Education** which was published in 1957. He says, “Education is not limited to the imparting of information or the training in skills. It has to give the educated a proper sense of values. Scientists and technologists are also citizens, and so have a social responsibility to the community in which they live”.

That this is not a view confined to the East alone is borne out by the following idea expressed by Sir Walter Moberly in his book the Crisis in the University (1959): “If education can contribute to a moral, intellectual and spiritual revolution, then it offers a real hope of salvation to suffering humanity everywhere.”

There have been ups and downs in the extent of spread and depth of Pirivena education including traditional education in ancient Sri Lanka. Nonetheless, literary and historical evidence affirm that character building and inculcating social ethics were considered right through one of its main objectives.

## New Courses, Modernization and Salutary Traditional Aspects

However, Education at all levels (including higher education) prevalent in the country today appear to have veered away from these goals, and remedial measures need to be taken without delay. Probably because the accelerated economic growth of the country has become the sole or rather the most important aim of the planners, the other ideals appear to slowly disappear from the society. The real development of a country should include not only the economic growth but also the development of the individual character of its citizens. Then only will the country be able to boast of a people cherishing social values, full of virtue, happy and content.

There is another matter that needs our consideration here. Although the freedom to select courses of study to one's liking is something much to be desired, our university education has today widened and developed so much so that many, if not all, who have the ability and the interest and have satisfied the basic requirements can immensely benefit by it. While this satisfies some of the present-day needs of the country, it has also given rise to problems of quality and management of education. Whatever field you are involved in the development process, you have to do so fully realizing that you have to proceed from simplicity to complexity. In his book of Societies and Men, Carl Harrison says, "Growth leads to complexity, complexity to specialization and specialization to integration".

In higher education, specialization aims at reaching and maintaining a high degree of excellence in a particular discipline or professional field. James A. Perkins sees this as a result of knowledge explosion. Writing an article to the volume titled **The University in Transition** (1966), he says, "The so-called knowledge explosion created a kind of strain on traditional institutions. Where the University had once thought of itself as an institution that could explore the unity of knowledge, it now finds that in order to maintain excellence it must concentrate on specialized segments of knowledge".

A criticism that has been levelled against this specialization is that, in certain universities today, it is being done as fashion without paying any heed to the needs of the day or its usefulness and that graduates do not get and opportunity to widen their general knowledge so important to them practically, as it directs their special attention to only one branch of knowledge. Many educationists believe that, even as specialization is continued, more and more opportunities should be provided for selecting subjects from among various departments and faculties. This fact should engage the attention of the relevant authorities on higher education.

If a higher degree of excellence is to be achieved in a certain aspect of a subject or professional discipline or educational research, there should be adequate material resources as well as expert personnel. But in respect of many disciplines in developing countries like ours, there is a general dearth of both these kinds of resources. In fields where there is no such dearth, there is often an excess of specialists. In such countries specialization needs to be planned in such a way that the maximum use could be made of such resources without letting them scatter due to senseless duplication or multiplication. This can also arrest waste of public funds. Most of these matters will be relevant to the establishment and maintenance of separate training institutes by various ministries and departments, to

conduct specialized courses that could be organized by the Ministry of higher Education and the institutes of higher education. If these training institutes are bent on turning out trainees in excess, without confining themselves to training workers for internal requirements, it might create problems specially for outside employers in selecting suitable persons for appointment, and for the workers in getting approved salary scales and obtaining promotions etc.

An upward trend is generally seen in present day universities in their readiness to modernize courses and to add new features. If this is done taking into consideration the progress in various subject fields as a result of knowledge explosion, the practical importance depending on the country's needs and the availability of resources, it would be very beneficial to the progress of the institute and its good name. If, on the contrary, it is reduced to mere imitation of foreign examples as a fashion, it would only result in putting a certain section in trouble. An important thing to remember in organizing courses is that the local traditional knowledge should not be allowed to be forgotten but should rather be preserved and made use of, without confining ourselves to knowledge explosion taking place in the world outside and to the progress of the subject fields.

When we talk of tradition we should not forget that our universities too inherit a tradition. Even this convocation being held today can be traced back to an European university tradition that started about ten centuries ago. Our modern university is largely based on that tradition. However, a still older system of university education existed in the East and also in Sri Lanka. This system disappeared from Sri Lanka around the 16$^{th}$ century apparently as a result of foreign invasions.

A healthy tradition that existed in Sri Lanka universities in the recent past was the writing and discussing tutorials. It is sad to note that this practice is slowly disappearing today from our universities. The writing of tutorials is of special importance for studies in the fields of humanities and social science where there is less involvement of practical work such as surveys, investigations, experiments and training taking place in the laboratories or in the world outside beyond the class-rooms:

The main benefit of this type of activity is that the students are encouraged to read widely, since this would compel them to read in English even with some difficulty, a language skill in addition to the subject knowledge could be acquired. The training he or she receives in collecting data relevant to the subject in hand, arranging and presenting them to prove a point and in the skillful use of the language would be of immense benefit to him/her in the long run. This might provide an answer to the accusation made by some that the graduates who pass out of universities in recent times do not display a general knowledge as much as those of the previous generation.

Discussion and dialogue was an important aspect of university education both in the East and the West, from the very ancient times. By this method the student was able to develop his skill of thinking creatively and to establish his viewpoint by refuting opposing views by logical presentation of his facts. It was this dialectical method that was used by such philosophical teachers of great wisdom as Confucius of ancient China, Socrates of Greece and the Buddha of India in teaching their doctrines. The dialectical method held an important place in the teaching in the institutes of higher education such as Academy

started by Plato and Lycium by Aristotle in Athens in the 4th century B.C. Paving way for discussion among students in our universities too as was done in the past by making use of tutorial classes, creative literature classes and classes of literary criticism and so on, would be a main factor in their character development.

Lastly, I would like to mention another matter of vital importance in shaping higher education in this country. A substantial interest can be seen in universities todays in the development of knowledge in the students by offering new courses and revising existing ones. There is also sufficient interest seen in the physical development of students, through sports and physical training. It is worthwhile inquiring whether sufficient interest is shown in the mental development of the student. Its importance in every stage of education is also implied in the above quoted statements of Radhakrishnan and Moberly. A basic necessity herein is to investigate into mental problems of students and take remedial measures. Such methods as would involve them in extra-curricular activities catering to a variety of interests such as creative, artistic, religious and cultural activities, and voluntary programmes of educational and social work would be of immense benefit here. It is my belief that, if this is done, our university will be able to produce perfect scholars fit to take up any responsibility as exemplified by the dictum 'Knowledge gives discipline' quoted above.

Wishing once again all the graduands a bright future I conclude my convocation address.

Thank you all for listening to me.

*1996.11.02*

# 15

# දේශීය බුද්ධිමතුන් පරපුරක් බිහිනොවූයේ ඇයි?

## ආචාර්ය වෛද්‍ය ගුණදාස අමරසේකර

මේ විශ්වවිද්‍යාලය විසින් තුන් හතර වසක් ශාස්ත්‍රය ප්‍රදානය කර මෙවන් විද්වතුන් පිරිසක් රට තුළට මුදා හරිනු ලබන මේ මොහොත ජාතික වැදගත්කමකින් යුතු අවස්ථාවක් ලෙසයි ම විසින් සලකනු ලබන්නේ. මේ අවස්ථාවේ මෙහි පැමිණ ඔබ අමතන ලෙස මහාචාර්ය තිස්ස කාරියවසම් මහතා මගෙන් ඉල්ලා සිටි අවස්ථාවේ මා එය සතුටින් පිළිගත්තේ මා ඒ මතයේ දැඩි ව එල්බ ගෙන ඇති බැවිනුයි. මේ අරහයා ඔබ ද මා සමඟ එකඟවනු ඇතැයි මා හිතනවා. අද ඔබ මෙහි දී උපාධිය ලබාගෙන පිටව යෑමේ උපනිශ්‍රය ආසන්න ම අරමුණ ඒ උපාධියට සරිලන රැකියාවක් ලබාගැනීම වෙන්න පුළුවන්. එහෙත් ඒ ආත්මාර්ථකාමී අරමුණු ඉක්මවා සිටින උදාර වැදගත් පරමාර්ථයක් මේ සිද්ධිදාමය සමඟ බැඳී ඇති බව ඔබ කිසිවකු විසින් නොපිළිගන්නවා ඇතැයි මා හිතන්නේ නැහැ. ඔබට මෙසේ උගත්වා උපාධියක් ප්‍රදානය කර පිටකර හැරීම මඟින් මේ රටේ ජනතාව ඔබ වසන සමාජය, අපේක්ෂා කරන උදාර පරමාර්ථයක් ඇති බව එයට රහසක් විය නොහැකියි. අපේ ජනතාව, අපේ සමාජය ඔබගෙන් උදාර මෙහෙයක් සේවයක් අපේක්ෂා කරනවා. ඔබ ඔවුන් අතරට පැමිණ ඔබ මෙහිදී ප්‍රගුණ කළ ශාස්ත්‍රය, ඥානය, ප්‍රඥාව ඇසුරෙන් ඒ සමාජයේ බුද්ධිමය චින්තන ක්ෂේත්‍රය පොහොසත් කර පුළුල් කර ඔවුන්ගේ නුවණ නඟා ලනු ඇතිය යන්න ඒ සමාජය විසින් ඔබගෙන් අපේක්ෂා කරනු ලබන කාර්යයයි. ඔවුන් සමඟ සංවාදයක යෙදී ඒ සමාජය යහ මඟ වෙත යොමු කරනු ඇතිය යන්න ඔවුන් තුළ ඇති බලාපොරොත්තු වයි.

මෙන්න මේ හේතුව නිසයි මේ අවස්ථාව ඔබ එකිනෙකාගේ පටු පරමාර්ථ ඉක්මවා සිටින ජාතික වැදගත් කමකින් යුතු අවස්ථාවක් ලෙස ම විසින් සලකනු ලබන්නේ.

මේ කටයුත්ත මේ විශ්වවිද්‍යාල විසින්ම මෙසේ වසර ගණනාවක් මුලුල්ලෙහි ඉටුකරන ලද බව ඔබ දන්නවා ඇත. ඇත්ත වශයෙන් මෙය අපගේ විශ්වවිද්‍යාල විසින් අඩසියවසකට වැඩි කාලයක් තුළ වසරක් පාසා නොපිරිහෙළා ඉටුකරන ලද කටයුත්තක්. මීට පනස් වසරකට පමණ පෙර මාගේ වැඩිමහල් සොහොයුරා මෙවැනි උපාධි ප්‍රදානෝත්වයකට සහභාගි වූ අවස්ථාව මේ වේලෙහි සිහිපත් වෙනවා. ඒ අවදියේ මේ රටේ තිබුනේ එක විශ්වවිද්‍යාලයයි. කොළඹ වූ ඒ විශ්වවිද්‍යාලයෙන් එදා පිටවී ගියේ සියයකට අඩු සංඛ්‍යාවකුයි. කිං ජෝර්ජ් ශාලාවේ පවත්වන ඒ උත්සවයේදී උපාධි ප්‍රදානය කරන ලද්දේ අග්‍රාණ්ඩුකාරයා විසිනුයි. එතෙක් මෙතෙක් අපි මේ කටයුත්ත මේ රටේ ඇති මුළු මහත් විශ්වවිද්‍යාලය පද්ධතිය මඟින් වසරක් පාසා නොවරදවා සිදු කරගෙන යනවා. මෙසේ ලෝගු පැළඳ, කුඩ සේසත් සහිතව පෙරහරේ ගොස් මෙවන් දේශන පවත්වා කරනු ලබන මේ කටයුත්ත දැන් වසරක් පාසා සෑම විශ්වවිද්‍යාලයක් විසින් කරනු ලබන යාතුකර්මයක් බවට පත් වී ඇතැයි කීවොත් එය අතිශයෝක්තියක් නොවෙයි.

අවුරුදු පනහකට වැඩි කාලයක් තුළ අප විසින් අවිඥානිකව මෙන්, නිෂ්පාදන භාණ්ඩයක් කම්හලකින් පිට කරන්නාක් මෙන් කරගෙන යන ලද මේ කටයුත්ත කෙතරම් දුරට අර්ථාන්විත කාර්යයක් බවට පත් වී ඇත්ද, කොතරම් දුරට අපගේ සමාජය බලාපොරොත්තු වූ අපේක්ෂා ඉටුකර ඇද්ද යන්න සැකෙවින් සලකා බැලීමයි මා මේ දේශනයෙන් අදහස් කරන්නේ. එවන් පිරික්සීමක

එවන් සිංහාවලෝකනයක යෙදීමට සුදුසු කාලය මීන් පෙර කිසිදු අවස්ථාවකට වඩා අද එළඹී ඇති බවයි මගේ වැටහීම.

අප නිදහස ලබා පනස් වසරක් පිරීමේ අවස්ථාව අප විසින් ඉමහත් උත්සවශ්‍රීයෙන් සමරන ලද්දේ ගිය අවුරුද්දේ බව ඔබ කාටත් මතක ඇති. ඒ අවස්ථාව මට නම් හැඟී ගියේ උත්සවාකාරයෙන් සැමරිය යුතු අවස්ථාවක් ලෙස නොව අඬා වැලපී සිහිකටයුතු අවස්ථාවක් ලෙසයි. නිදහස ලබා පනස් වසරකට පසු අප තරම් පරිහානියේ ප්‍රපාතයට ගිය වෙන රටක් මේ අග්නිදිග ආසියාකරයේ ඇති ද යන්න මට නම් සැක සහිතයි. පනස් වසරක් ඒ ප්‍රපාතය ඔස්සේ අප කළ ගමනේ අන්තිම අවධිය වෙත අප දැන් තල්ලු වී ඇති බවයි මගේ වැටහීම, මගේ මේ නිගමනය ඔබ කිසිවකු විසින් අභියෝගයට ලක් කරනු ඇතැයි මා හිතන්නේ නැහැ. ඔබ අයත් වන පරපුරට මෙය එතරම් පැහැදිලි නොවන්නට පුළුවන්. එහෙත් හැත්තෑවියට පා තබන අපට නම් ඒ පසුගිය පනස් වසර කෙබඳු ආකාර ශෝචනීය, සුන් වූ බලාපොරොත්තුවලින් යුතු අභාග්‍ය සම්පන්න කාල පරිච්ඡේදයක් වීද යන්න දැන් සක්සුදක් සේ පැහැදිලියි. පනස් වසරකට පෙර හද්‍ර යෞවන වියේ පසුවෙමින් උන් අප එදා අනාගතය වෙත පා තැබුවේ කෙතරම් අපේක්ෂා සහගතවද? මේ රටේ සමාජයේ අනාගතය පිළිබඳ කෙතරම් සුන්දර සිහිනවලින් යුතුවද? මේ රට බුද්ධිමතුන් විසින් මෙහෙයවනු ලබන, සමානාත්මතාවෙන් යුතු මානවහිතවාදී උත්තර සමාජයක් බවට පත්වනු ඇතිය යන අභිලාෂයයි අපගේ සිත් සතන් තුළ වූයේ. නිදහස ලබා දස වසරකට පසු, 1956 පෙරළියෙන් තුන් වසරකට පසු ම විසින් එකල පැවති ''සංස්කෘති'' සඟරාවට ලියන ලද ලිපියක් මෙවේලෙහි මට සිහිපත් වෙනවා. එය ඔබගේ ඇතැමෙකු විසින් කියවා තිබෙන්නට පුළුවන්. ඒ ලිපියෙහි මාතෘකාව වුයේ 'මේ රටේ අනාගතය බාරගනු ලබන්නේ උගත් ගැමි තරුණයන් විසිනි' යන්නයි. එවැන්නක් ලිවීමට එවේලෙහි මා පොළඹවන ලද්දේ මා හද තුළ එවේලෙහි වූ ඒ ප්‍රාර්ථනාවල උණුසුමයි. එහෙත් අද ඒවා සිහිනෙන් ගෑ සුවඳක් සේ බොරවී ඇති බව කිවමනා නොවෙයි. ඒ වෙනුවට අද සිදු වී ඇත්තේ අප තුන් හිතකින්වත් සිතූ පැතූ දෙයක් නොවෙයි. මේ රට අද මුහුණ දෙන මේ ශෝචනීය ඉරණම අප වෙත එළඹෙනු ඇතැයි අප තුන් හිතකින්වත් හිතුවාද?

පසුගිය පනස් වසර තුළ මෙරට සමාජය කෙතරම් පරිහානියකට පත්ව ඇද්ද යන්න ගැන නිදර්ශන උදාහරණ සැපයීම ඔබ වැනි උගත් පිරිසකට අවශ්‍ය යයි මා හිතන්නේ නැහැ. අපේ රටේ ඕනෑම ක්ෂේත්‍රයක් ගෙන බැලුවොත් මේ ඛේදවාචකයේ තරම ඔබට දැක බලා ගත හැකියි. රටක ප්‍රධානම ක්ෂේත්‍රය වන අපේ දේශපාලන ක්ෂේත්‍රය කෙබඳුද? පසුගිය පනස්වසර තුළ දේශපාලනය වශයෙන් අපගේ දේශපාලකයන් කර ඇත්තේ විජාතිකයා අප මත පටවා ගිය වෙස්ට්මිනිස්ටර් පාර්ලිමේන්තුවාදය, පක්ෂ දේශපාලනය, ප්‍රජාතන්ත්‍රවාදය අපටම වින කරන භයානක විහිළුවක් බවට පත් කිරීම නොවේද? අප විසින් ඒ සංස්ථා දීන අනුකරණය මඟින් යොදා ගෙන ඇත්තේ සිය දිවි තුරන් කර ගැනීම පිණිස නොවේද? ඒවා මඟින් අප කර ඇත්තේ මේ රටේ ප්‍රධාන ජාතිය වන සිංහලයාගේ මළගම ළඟාකර දීම නොවේද? පනස් වසරකට පසු අපගේ සභ්‍යත්වය සංස්කෘතිය ගැන අපට කීමට ඇත්තේ කුමක්ද? පෙර දින ථේරවාදී බුදුදහම රැකගත් රට ලෙස ලොව පතළ වී සිටි අපගේ රට දැන් බටහිර ලොව තුළ ප්‍රසිද්ධව ඇත්තේ සමලිංගික සම්බන්ධතා සඳහා ලෙහෙසියෙන් ම සහකාරයන් ලබාගත හැකි රට ලෙසයි. සියදිවි නසා ගැනීම අතින් බීමත්කම අතින් අද අප ලෝකයේ ප්‍රමුඛ ස්ථානය දිනාගෙන ඇති බව නොදන්නා කරුණක් විය. අපේ ආර්ථික ක්ෂේත්‍රය කෙබඳුද? නිදහස ලබාගන්නා විට ලී කුවාන් යු කියා සිටියේ සිය රටවන සිංගප්පූරුව ලංකාවේ තත්ත්වයට ගෙන ඒම සිය අභිලාෂය බවයි. 1992 එක්සත් ජාතීන්ගේ කෘෂිකර්ම සංවර්ධන ජාත්‍යන්තර අරමුදල විසින් පවත්වන ලද සමීක්ෂණයක් අනුව පසුගිය විසිවසර තුළ ශීඝ්‍රයෙන් දිළිඳු බවට පත් වූ රටවල් 144 අතරින් අප ලබා ඇත්තේ පළමුවෙනි තැනයි. ලෝකයේ බර අඩුම දරුවන් උපදින

රටවල් 7 අතරින් අපේ රට එකක්. මේ රටේ අවුරුදු පහට පහළ දරුවන්ගෙන් සියයට පනහක් මන්ද පෝෂණයෙන් පෙළෙන්නන්. රටේ ඇති විරැකියා තත්ත්වය සියයට විස්සකට වැඩියි. ආදායම් විෂමතාව අතින් අප දෙවැනි වන්නේ බ්‍රසීලයට පමණයි. ඉහළට ආදායම් ලබන සියයට දහය (10%) ජාතික ආදායමක් සියයට හතළිස් නමයක් (49%) ගිල ගන්නා අතර අඩුම ආදායම් ලබන සියයට හතළිහට (40%) හිමි වී ඇත්තේ ජාතික ධනයෙන් සියයට හතක් (7%) පමණයි. අපේ ආර්ථික තත්ත්වය එබඳුයි. අපගේ සාහිත්‍ය කලා ශිල්පවල තත්ත්වය කෙබඳු ද? පනස් වසරකට පෙර පන්දහසක් විකුණාගත හැකි වූ හොඳ හරවත් නවකථාවකින් අද විකුණා ගත හැක්කේ දාහක් පමණයි. මේ අතර කාලය තුළ අපගේ ජනගහනය සියයට සීයකින් වැඩිවන්නට ඇති. අපගේ චිත්‍රපටිවලින් අද කියන්නේ 'රාගයේ උණුසුම' ගැනයි. නවකථාවලින් අපේ සංස්කෘතියේ උත්තරීතර සංකල්පයක් වන බෝධිසත්ත්වයා, නිරූපණය කරනු ලබන්නේ සත වෙත පතල මහා කරුණාචිත්තය නිසා අනුන්ගේ ගැනුන් 'බඩ දරුවන් කරන්නකු' ලෙසයි. අපේ සාහිත්‍ය කලා ක්ෂේත්‍රය දැන 'විදූෂකයන්ගේ විනෝද සමයක්' වී ඇතැයි කිසිවකු කියනු මා ළඟදී ඇසුවා. එය සම්පූර්ණ ඇත්තක්.

නිදහසින් පනස් වසරකට පසු අප එළඹ ඇති තත්ත්වය මෙයයි. මෙවැන්නකට හේතුව කුමක්ද? මෙවැන්නකට වගකිව යුත්තේ කවුරුන්ද? අපට ඇඟිල්ල දික් කළ හැක්කේ කවුරුන් වෙතද?

මෙහිදී එක් ප්‍රකාශයක් නිර්භයව කිරීමට මම සූදානම්.

මේ රට අද මුහුණ දෙන මේ තත්ත්වයට වගකිවයුත්තේ අන් කිසිවකු නොව ඔබගේ පරපුරයි. පසුගිය පනස් වසර තුළ මේ විශ්වවිද්‍යාල ද්වාර වෙතින් පිට වී ගිය ඔබගේ පරපුර සිය කාර්යභාරය නිසි ලෙස ඉටුකරන ලද්දේ නම් ස්වධර්මය ඉෂ්ට කරන ලද්දේ නම් මෙවැනි අභාග්‍ය සම්පන්න තත්ත්වයකට මේ රට අපගේ සමාජය පත් නොවෙනු ඇතිය යන්න මගේ අවංක විශ්වාසයයි. මේ දොරටුවලින් පිට වී ගිය ඔබ, උපන් සමාජය වෙත ගොස් ඒ ජනතාව සමඟ බුද්ධිමය සංවාදයක දේශපාලන සංවාදයක යෙදුනේ නම් එවැනි සංවාදයක් මඟින් ඒ ජනතාව තමන්ගේ අදහස් උදහස්වලට නම්මවා ගත්තේ නම්, ඒ ජනතාවගේ නුවණ ඔබ විසින් පාදන ලද්දේ නම් මෙවැනි ඉරණමකට මේ රට ගොදුරු නොවෙනු ඒකාන්තයි. මෙහිදී මා දේශපාලන සංවාදය යනුවෙන් හැඳින්වූයේ මේ රට තුළ පසුගිය පනස්වසර තුළ පැවති ජුගුප්සාජනක පක්ෂ දේශපාලනය නොවෙයි. 'මිනිසා දේශපාලන සත්ත්වයෙකි' යන ඇරිස්ටෝටල්ගේ නිගමනය අනුවයි, මෙහිදී ඒ වහර ම විසින් යොදා ගනු ලබන්නේ.

පනස් වසරකට පසු තවමත් ඔබගේ පරපුර මේ කටයුත්ත, ඔබගෙන් මෙරට ජනතාව අපේක්ෂා කළ ඒ කාර්යභාරය, ඔබ සතු ස්වධර්මය ඉටුකර නොමැති බව ඔබ විසින් දැන්වත් පිළිගත යුතුයි. ඒ අමිහිරි සත්‍යය ඔබ විසින් පිළිගත යුතුයි.

ඔබට ඒ කාර්යය ඉටුකර ගත නොහැකි වූයේ කුමක් නිසාද? ස්වධර්මය ඉෂ්ට නොකිරීමෙන් ඔබ වළකා සිටියේ කුමක්ද?

ඊළඟ සුළු කාලය තුළ ඒ අරහයා අදහස් කීපයක් ඔබ හමුවේ තැබීමටයි මා බලාපොරොත්තු වන්නේ.

මේ කටයුත්ත - මෙරට ජනතාව සමඟ සංවාදයක යෙදී ඔවුන් ඔබ වෙත නම්මා ගැනීමේ කාර්ය ඉෂ්ට නොවීමට ප්‍රධාන හේතුවක් වශයෙන් මා දකින්නේ ඔබ 'පිටමං කළ' පිරිසක් බවට පත්වීම යයි

මා හිතනවා. මෙරට පසුගිය පනස් වසර තුළ බලපැවැත්වූ පාලක ආධිපත්‍යය විසින් ඔබ 'බුද්ධිමතුන්' වශයෙන් පිට මං කළ බව ඇත්තක්. ඔවුන් ඔබ පරිහරණය කළේ බුද්ධිමතුන් ලෙස නොව සිය ආධිපත්‍යය රැක ගැනීමට අවශ්‍ය සේවක පිරිසක් ලෙසයි. එදා විජාතික පාලකයන් විශ්වවිද්‍යාලයෙන් පිටවන උගතුන් යොදාගත් ආකාරයටමයි නිදහසින් පසු පහළ වූ අපගේ පාලකයන්ද ඔබ යොදවා ගත්තේ. විජාතික පාලකයා ස්ථාපිත කළ සමාජ ඇගයීම් පද්ධතියමයි අපගේ පාලකයන්ද ඉදිරියට ගෙන ගියේ. ඔබේ පරපුර ද ඒ පිටමං කිරීම ඒ ලෙස ඔබ යොදවා ගැනීම ඉවසා සිටියේ ඉමහත් තෘප්තියකින් බවයි මගේ නිගමනය. ඔබගේ දෙමාපියන්ට පුරුදු කරන ලද ඒ සමාජ ඇගයීම් ඔබේ පරපුරටත් එලෙස ම රුචි වුණා. ඊට විරුද්ධ කැරලි ගැසීමට ඔබට උවමනා නැහැ. විශ්වවිද්‍යාලයට එවූ ඔබගේ දෙමාපියන්ගේ එකම ප්‍රාර්ථනය වුණේ තමන්ගේ පුතා ඒජන්ත කෙනෙකු දිසාපති කෙනෙකු 'ලොකු මහත්තයෙකු' කිරීමයි. ඔබට ද එය එලෙසම රුචි වුණා. නමට අගින් 'CCS' යනුවෙන් ලියා ගැනීම තමයි, විශ්වවිද්‍යාලයෙන් පිට වී ඇති ඔබගේ වැඩිමහල් පරපුරේ එකම ප්‍රාර්ථනය වූයේ ඊට අමතරව තවත් අවශ්‍යතා කීපයකුත් ඔබට තිබුනා. දිසාපති වීමෙන් පසු ලොකු මුදලාලි කෙනෙකුගේ දුවක් බැඳගෙන කොළඹ අවට විසල් ප්‍රාසාදයක් තුළ වැජඹීම තමයි ඔබගේ ඉදිරි ජීවන දර්ශනය වුණේ, එමනිසා ඔබගේ ඒ මුල් පරපුර හැඳින්විය යුත්තේ සිය කැමැත්තෙන්ම 'පිටමංවූ' පිරිසක් ලෙසයි. ඒ පරපුර ගත කළ නිස්සාර ජීවිතය මගේ නිර්මාණවලින් ම විසින් නිරූපණය කර තිබෙනවා. ඔවුන් අතර වූ විප්ලවාදිය පවා මා දුටුවේ 'ගන්ධබ්බයකු' ලෙස බව ඔබ දන්නවා ඇති. පසුගිය කාලය තුළ ඒ පාලක ආධිපත්‍යය ජුගුප්සාජනක අසික්කිත මුහුණුවරක් ගත්තා. දැන් ඒ හමුවේ ඔබට සිදු වී ඇත්තේ ඒ ආධිපත්‍යය හමුවේ දාසයන් ලෙස කටයුතු කිරීමටයි. හෘදය සාක්ෂියකින් තොර වූ නිවටයන් ලෙස සේවය කිරීමටයි. මෙයට ඇති එකම පිළියම මේ රටේ ජනතාව ඒ ආධිපත්‍යයෙන් ගළවා ගැනීම පිණිස ඒ ජනතාව සමඟ සංවාදයක යෙදී ඔවුන්ට මඟ පෙන්වා කටයුතු කිරීම බව දැන්වත් ඔබට පෙනී යා යුතු යයි මා හිතනවා.

ඔබට ස්ව ධර්මය ඉෂ්ට කිරීමට නොහැකිවූ දෙවන කරුණ වශයෙන් මා දකින්නේ ඒ උදාර කාර්යය ඉටුකිරීමට අවශ්‍ය වන දැනුම, ප්‍රඥාව ඔබගේ පරපුර සතු නොවීමයි. ඊට වගකිව යුත්තේ ඔබ නොව ඔබට හිමිකර දෙන ලද මූලික අධ්‍යාපනය සහ විශ්වවිද්‍යාලය අධ්‍යාපනයයි. ඔබට හිමිකර දෙන ලද්දේ ඔබ උගතුන් විනා ප්‍රාඥයන් බවට පත් කරන අධ්‍යාපනයක් නොවේ.

වසර පනහක් ගෙවීත් අද පවා ඔබගේ පරපුරට අපි හිමිකර දෙන්නේ අර විජාතිකයා අපට කියා දී ගිය අධ්‍යාපනයයි. විජාතිකයා ඒ අධ්‍යාපනය හිමිකර ඇත්තේ ඔබ බුද්ධිමතුන් ප්‍රඥාංකුරයන් කරනු සඳහා නොවෙයි. ඔබ ඔවුන්ගේ සුවච කීකරු දාසයන් බවට මනසින් මෙන් ම හදවතින් ද පත් කරගනු සඳහායි. ඉන්දියාව පාලනය කළ සාමිවරයා, අධ්‍යාපනය මගින් මේ කටයුත්ත කළ හැකි අයුරු ඉතා මැනවින් පෙන්වා දී තිබෙනවා. පාටින් පමණක් වෙනස් එහෙත් මනසින් මෙන් ම හදින් ද පාලකයා අනුකරණය කරන පිරිසක් තැනීම සිය අධ්‍යාපනයේ පරමාර්ථය බව මැකෝලිසාමිවරයා පළකළා. නිදහස ලැබූ පසු බිහි වූ අන් පාලකයන් විසින් මැකෝලිසාමිගේ ඒ පිළිවෙත අකුරටම පිළිපැද ඇති බවයි මට පෙනෙන්නේ.

ඔබට දෙන මූලික අධ්‍යාපනයෙන් කර ඇත්තේ ඔබ ඔබගේ පසින් ඔබ බිහිකළ සමාජයෙන් හැකිතාක් ඉවත් කිරීමයි. ඒ ගිරාපෝතක අධ්‍යාපනයෙන් තැත් කළේ ඔබ "O" ලෙවල් "A" ලෙවල් කඩුලු පැනීමට සමත් හොඳ රේස් අස්සයකු කිරීමය. රේස් අස්සයා තරඟයෙන් දිනවන්න නම් ඔහුගේ දැස් අවට ලෝකය වෙතින් වසා තැබිය යුතුයි. ඔබගේ දැසත් අවට ලෝකය වෙතින් වසා තැබිය යුතුයි. ඔබගේ මනස හද තමා හිමිකර උපන් සමාජයෙන්, සංස්කෘතියෙන්, සිය ජාතිකත්වයෙන්

ඇත් කර තැබිය යුතුයි. ඔබට දෙන ලද මූලික අධ්‍යාපනයෙන් අපි ඒ කටයුත්ත ඉතා සාර්ථක ලෙස ඉටු කළා.

මීට අවුරුදු කීපයකට පෙර ඩඩ්ලි සියර්ස් (Dudley Seers) නමැති ආර්ථික විද්‍යාඥයා 'Political Economy of Nationalism' නමැති ඉතා වැදගත් පොතක් පළ කළා. ඩඩ්ලි සියර්ස්, යටත් විජිතවල පැවති තුන්වන ලෝකය පිළිබඳ ගැඹුරු අවබෝධයකින් යුත් බුද්ධිමතෙක්. මෙහි මගේ වයසේ අයට ඔහුගේ නම මතක ඇති. ඔහු මෙරටට පැමිණි අප විසින් ගත යුතු ආර්ථිකය ගැන කියා දුන්නා. එවේලෙහි ඔහු කියූ එක කරුණක් මට තාම මතකයි. ඔහු කිව්වා අප ආනයනය කරන සීනිවලින් බාගයක් අපේ තේ කෝප්පයේ ඉතුරු වී වතුරට ගසා ගෙනයන බව. ඔහු සිය කෘතියෙන් තුන්වන ලෝකයේ රටවල් දිය යුතු මූලික අධ්‍යාපනය පිළිබඳ ඉතා වැදගත් නිරීක්ෂණයක් කර තිබෙනවා. මම එය ඉංගිරිසියෙන් ම කිය වන්නම්.

"The centre piece of education is history, the history of the nation in relation to its continent and the world ranging up to the persent times. Making children familiar with their nation's cutural heritage-myths, fables, songs, dance and sculpture, buildings etc, which expresses national experience can help inhibit the growth of cultural dependance."

අප විසින් පසුගිය කාලය තුළ කර ඇත්තේ කුමක්ද? Centre piece of Education වශයෙන් ඩඩ්ලි සියර්ස් ඇඳින්වූ ඉතිහාසය අපේ පාසැල්වල විෂයමාලාවෙන් ඉවත් කිරීමයි. එතැනට අංක ගණිතය, වීජ ගණිතය, රේඛා ගණිතය, භෞතික විද්‍යා, රසායන විද්‍යා අර කුඩා මොළවලට ඇතුළුකොට ඒවා කොම්පියුටර් බවට පත්කර වඳ පිදීමට සැලැස්වීමයි.

මෙරට විශ්වවිද්‍යාලවලින් ඔබට දෙන ලද අධ්‍යාපනයෙන් කරන ලද්දේ කුමක්ද?

මහවැලි නදිය අසබඩ ඔක්ස්පර්ඩ් කේම්බ්‍රිජ් දෙස බලා ඒවා අනුකරණය කර අප විසින් තනන ලද අපගේ ප්‍රථම විශ්වවිද්‍යාලයෙන් අප තැත් කළේ ඒ අනුකාරක මොඩලය මේ රට තුළ ස්ථාපිත කිරීමයි. එහි පළමු උපකුලපතිවරයා වූ ජෙනිංස්ට උවමනා වුනේ ඒ මඟින් අර මැකෝලිසාමිගේ දරුවන් පරපුරක් මේ රට තුළ බිහිකිරීමයි. එතැනින් බිහිකළ අනුකාරක උගතුන් අද ඩොලර්වලට සිය රට ජාතිය පවා පාවා දීමට තැත් කරන සැටි ජෙනිංස්ට දැක ගන්නා ලැබුනා නම් ඔහු කොතරම් උද්දාමයකට පත් වනු ඇත්ද යන්න අපට සිතා ගත හැකිය. අභාග්‍යයකට මෙන් අප සතුව තිබූ ශ්‍රේෂ්ඨ ආයතන දෙකක් මුල්කොට තැනූ විශ්වවිද්‍යාලවලට ඒ පේරාදෙණිය අනුකරණය කිරීමෙන් වැළකී සිටිය හැකි වූ බවක් මට නම් පෙනෙන්නේ නැහැ. බටහිර විශ්වවිද්‍යාල අනුකරණය කරමින් අප දෙන මේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය මුලුමනින් වෙනස් කළ යුතු බවයි මගේ වැටහීම. අද මේ විශ්වවිද්‍යාලවලට මහාචාර්ය, ආචාර්යවරුන් ප්‍රසිද්ධියේ ලැජ්ජා රහිතව කරනු ලබන කිලිටි රෙදි සේදීමෙන් අපට පෙන්නුම් කරන්නේ එවැනි වෙනසක් අත්‍යවශ්‍ය බව නොවේද? කොටින් කියතොත් අපගේ විශ්වවිද්‍යාලවල පරමාර්ථය විය යුත්තේ විවිධ විෂයන් අරභයා විශේෂඥයන් ඇරඹීමට වඩා රටට අවශ්‍ය වන බුද්ධිමතුන් ප්‍රඥාංකුරයන් බිහිකිරීමයි. විශේෂඥයන් බිහිකිරීම විශ්වවිද්‍යාල නැතුවාට කළ හැකි දෙයක්. මේ කටයුත්ත කිරීමට නම් මේ විශ්වවිද්‍යාල ව්‍යුහය සහමුලින් වෙනස් කළ යුතු බවයි මගේ අවංක හැඟීම.

ඔබේ පරපුරට සිය කාර්යභාරය ඉටුකිරීමට නොහැකි වූ අනික් කරුණ වශයෙන් මා දකින්නේ එවැන්නකු සඳහා වූ චින්තන සම්ප්‍රදායක් ජාතික දේශපාලන චින්තනයක් ඔබ පරපුර අතට පත්කිරීම

අසමත් වීම යයි මා හිතනවා. ඔබ වෙත ජාතික දේශපාලන දර්ශනයක් හිමිකර දිය යුතුව තිබුණේ මේ සියවසේ මුල් භාගයේ විසූ ප්‍රාඥයන් බුද්ධිමතුන් විසිනුයි. ඔබගේත් අපගේත් අභාග්‍යය නම් එවැනි පරපුරක් මේ රට තුළ පහළවී නොතිබීමයි. මේ සියවසේ මුලදී අනගාරික ධර්මපාල, හික්කඩුවේ ශ්‍රී සුමංගල, මුනිදාස කුමාරතුංග, මාර්ටින් වික්‍රමසිංහ වැනි ප්‍රාඥයන් කීපදෙනෙකු පහළ වුවත් එවැනි ඒකාබද්ධ පැහැදිලි මැනවින් සැකසුනු ජාතික දේශපාලන දර්ශනයක් ඔවුන් අතින් පහළ වූ බව අපට කියන්නට බෑ. මේ රට තුළ වූ විජාතික අධ්‍යාපනය සහ සංස්කෘතිය තුළින් බිහිවූයේ අනුකාරක ලිබරල්වාදී උගතුන් කොටසක් සහ මාක්ස්වාදී උගතුන් කොටසකුයි. ඔවුන් දෙකොටසම එකම විජාතික කාසියේ දෙපැත්තයි. මේ දෙපිරිස විසින් අවසාන වශයෙන් කර ඇත්තේ මේ රට විනාශ මුඛය වෙත යොමු කිරීම බව අද අපට පැහැදිලිව දැකගත හැකි කරුණක්. එබැවින් අප සතු ජාතික චින්තන උරුමය පහදා දීමෙහි සමත් වූ පරපුක් මෙහි නොවීම නිසා ඔබගේ පරපුර බලවත් ලෙස අනාථ වූ පරපුරක් බවට පත් වීම හේතු සහිතයි. එහෙත් ඔබගේ හදවත් තුළ ජාතික චින්තන උරුමයේ බීජුවට රැඳී ඇති බව ඔබ විසින් වටහා ගත යුතුයි. අනුකරණයෙන් තොරව ඔබ ඔබගේ හදවත් තුළට ම දෑස් යොමු කළේ නම් ඔබට එය දැක ගැනීමට හැකිවනු නොඅනුමානයි.

ම විසින් ඉහතින් දැක්වූයේ පසුගිය පනස් වසර තුළ මේ විශ්වවිද්‍යාල ද්වාරවලින් පිට වී ඔබට සිය ස්වධර්මය ඉටු කිරීමට ඉඩ නුදුන් හේතු කීපයකුයි.

ඔබට මෙතෙක් ඒ මෙහෙවර ඉටුකිරීමට නොහැකි වී ඇති නමුත් ඔබ කෙරෙහි මා තුළ වූ භක්තිය කීපලෙසකින් අඩුවී ඇතැයි ඔබ විසින් නොසිතිය යුතුයි. මීට හතළිස් වරසකට පෙර මා උන් ස්ථාවරයේ යි මා අදත් පසුවන්නේ. මේ රටේ අනාගතය බාර ගනු ලබන්නේ ඔබ වැනි උගත් ගැමි තරුණ පරපුර විසින් බව මාගේ එකම විශ්වාසයයි. ඒ කාර්යය සඳහා අවශ්‍ය ගුණය ඇත්තේ ඔබ ළඟ පමණයි. එබැවින් මෙතෙක් අතපසු කරන ලද ඒ උදාර කාර්යය වෙත වහ වහා නැඹුරු වන ලෙසයි මෙවේලෙහි මා ඔබෙන් ඉල්ලා සිටින්නේ, මේ අවසාන මොහොතෙහි හෝ ඔබ ඒ සඳහා ඉදිරිපත් නූනොත් මේ රටේත් අපේ ජාතියේත් අප සියලු දෙනාගේත් අවසානය ඉතා අඳුරු බව ඔබ විසින් වටහා ගත යුතුයි.

මගේ මේ දේශනයට සවන් දුන් ඔබ සැමට ස්තුතියි.

<u>*1999.12.13*</u>

# 16

# අතීත අධ්‍යාපන නිකේතන හා විදුදය සරසවිය

## වෛද්‍ය පී. ආර්. ඇන්තනීස්

අපේ විශ්වවිද්‍යාල පද්ධතියේ සමාරම්භක කාන්තා කුලපති පදප්‍රාප්ත ආචාර්ය විමලා ද සිල්වා මහත්මිය ඉදිරියෙහි මෙම දේශනය පවත්වන්නට ලැබීම ඉමහත් භාග්‍යයක් ලෙස සලකමි. ඇය සතුව පවත්නා පාණ්ඩිත්‍ය සම්බන්ධවත්, ඇගේ ඉතා ප්‍රසන්න ඇවතුම් පැවතුම් සම්බන්ධවත් මා තුළ නිරන්තර භක්තියක් පවතියි. ඊට අමතරව ඇය උසස් අධ්‍යාපනය සම්බන්ධයෙන් කරන ලද ඉමහත් සේවාව ගැනද මා තුළ ගෞරවනීය හැඟීමක් පවතියි. ඇයට ඉක්මන් සුවයත්, මනා සෞඛ්‍යයත් ලැබේවායි මා පතන්නේ අප රටේ උසස් අධ්‍යාපන කාර්යයයෙහි ලා ඇගෙන් ඉටු විය යුතු කුදු මහත් කාර්යභාරය ඉටු වනු දකිනු රිසියෙනි. අති උසස් සම්ප්‍රදායකට උරුමක්කාරකම් කියන්නා වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි ඔබ සැම සියළු දෙනා ඉදිරියෙහි ම මෙසේ සිටින්නට හැකි වීම ගැන මම වඩාත් සතුටු වෙමි.

කවර නාමයකින් හැඳින්වූවත්, - විශ්වවිද්‍යාල පිළිබඳ සම්ප්‍රදාය අප රටට අමුත්තක් නොවේ.

බටහිර රටවල ප්‍රථම විශ්වවිද්‍යාලය ආරම්භ වූයේ ක්‍රි.වර්ෂයෙන් 11 වැනි සියවසෙහිදී ඉතාලියෙහිය. ඒ බොලෝනියා විශ්වවිද්‍යාලයයි. නමුත් අනුරාධපුර මහාවිහාරයෙහි ක්‍රිස්තු පූර්ව 250 සිට 210 දක්වා පැවැති එවැනි අධ්‍යාපනික මධ්‍යස්ථානයක් කෙතරම් ජනප්‍රිය වීද යත් භාරතයේ සිට බුද්ධඝෝෂ හිමියෝද එතැනට පැමිණියහ. තවත් බොහෝ විද්වත්තුද එතැනට පැමිණ ශාස්ත්‍ර ගවේෂණයෙහි යෙදුණාහු මතු පමණක් නොව අධ්‍යයනයද කළහ.

අභයගිරි අධ්‍යාපනික සංකීර්ණයෙහි ශිෂ්‍යයෝ පන් දහසක් අධ්‍යාපනය හැදෑරූහ. එය සම්පූර්ණ වරප්‍රසාද සහිත අන්තර්ජාතික සම්බන්ධතා සහ අනුබද්ධ විද්‍යායතන ද සහිත විද්‍යා පීඨ පහකින් සැදුම් ලද්දේය. සමහර අනුබද්ධ ආයතන පැවැත්තේ මියන්මාර්, සුමාත්‍රා, තායිලන්තය, චීනය සහ ඉන්දියාව යන රටවල්වලය. අවුරුදු 1500 කට පමණ පෙර එනම් ක්‍රිස්තු පූර්ව 89 සිට 77 දක්වා කාලයේදී එම සමෘද්ධිමත් අධ්‍යාපනික මධ්‍යස්ථානය චෝළ ආක්‍රමණිකයන්ගේ මූලෝත්පාටනයට ලක් වූ බව පෙනේ.

තදනන්තරව, ශ්‍රී ලංකාව එක්සේසත් කොට සාමය සහ සමෘද්ධිය කැඳවා ගෙනැවිත් අවුරුදු 57ක් තුළ රාජ්‍ය විචාරණය කළ පරාක්‍රමබාහු රජතුමා පහළ විය. මෙම පසුබිම තුළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය එවැනි මහාර්ඝ බුද්ධිමය සම්ප්‍රදායකට උරුමකම් කියයි. ලෝක ඉතිහාසයෙහි අවුරුදු 50කට වැඩි කාලපරිච්ඡේදයක් රජ කළ රජවරුන්ගේ සංඛ්‍යාව අතේ ඇඟිලිවලට සීමාවෙයි. නිදසුන් ලෙස සඳහන් කළහොත් ප්‍රාන්ස් ජෝසප් නම් ඔස්ට්‍රියානු අධිරාජයා වර්ෂ 68 ක් රජකම් කළේය. වික්ටෝරියා මහ රැජින අවුරුදු 63 ක් රාජ්‍ය විචාළාය. හිරෝහිතෝ අධිරාජයා වසර 61ක් රජකම් කළේය.

හයවැනි පරාක්‍රමබාහු රජු වෂී 57 ක් සිරිලක රාජ්‍ය කළේය. ඒ ක්‍රිස්තු වෂී 1450 සිට 1467 දක්වාය. එම නරපතියා ඉතා ප්‍රඥාවන්ත උසස් බුද්ධිමතෙකි. මේ නිසා රටේ කිසිදාක නොවූ විරූ ඉහළම

මට්ටමේ සාහිත්‍ය කලා ප්‍රබෝධයක් ඇති විය. කලා කෘති නිර්මාණය වූයේ අසිරිමත් ලෙසය. පිරිවෙන්වල ශාස්ත්‍ර පාරග භික්ෂූන් වහන්සේලා වැඩ වාසය කළාහු ග්‍රන්ථ රචනා ද කළ සේක. ග්‍රන්ථ රචනාවෙහිද, කාව්‍යකරණයෙහිද, උන්වහන්සේලා තැබූ කීර්තිනාමය අදත් දනන් තුඩ තුඩ පවතියි.

මෙම අධ්‍යාපනික මධ්‍යස්ථානයන්ගෙන් වඩාත් සම්භාවනාවට පත් වූයේ තොටගමුවේ විජයබා පිරිවෙණයි. එහි පිරිවෙන්පතිධූරය හෙබැවූවෝ ශ්‍රී රාහුල හිමියෝය. උන්වහන්සේ කාව්‍යශේඛරය, සැළලිහිණි සන්දේශය සහ පැරැකුම්බා සිරිත ද රචනා කළහ. එම විද්‍යාස්ථානයෙහි වෛද්‍ය විද්‍යාව ද උගන්වන ලද්දේය.

එතුමන් සතුව පැවැති අපූර්ව කාව්‍ය නිර්මාණශක්තිය එකම කෘතියකින් වුවත් විශද වන බව කියනු ලැබේ. ආචාර්ය ආනන්ද තිස්ස ද අල්විස් එම කාව්‍ය රචනාව ගැන මෙසේ කියයි.

"රාහුල හිමියෝ කෝට්ටේ නගරය ගැන වර්ණනා කරති. උන්වහන්සේ ස්වීය රචනාවෙහි මවන සංකල්ප රූප අපේ ඇස් මත්තට ගෙන එයි. අපේ චින්තනය එයින් ප්‍රබෝධවත් වෙයි. අතීතයෙන් එන සැමරුම් හඬක් ලෙස එම වැණුම පාඨකයාගේ සිත කළඹාලයි.

ගුත්තිල කාව්‍ය රචනා කළ ගලතුරුමුල පිරිවෙන්පති වෑත්තෑවේ හිමියෝ ද ශබ්දාලංකාරයෙන් ද අර්ථාලංකාරයෙන් ද පරිපූර්ණ වූ ශ්‍රේෂ්ඨ කාව්‍යමය නිර්මාණයක් ලෙස ගුත්තිල පඬිවරයාගේ වීණාවාදනය ශ්‍රවණය කරමින් දෙවඟනක් නර්තන පෑ ආකාරය මනාව විග්‍රහ කළහ. එකල පැවැති අනික් විද්‍යාස්ථාන අතරට පැපිලියානේ සුනේත්‍රාදේවී පිරිවෙනත්, වනරතන සංඝරාජයන් වහන්සේගේ නායකත්වයෙන් පැවැතුණු කැරගල පද්මාවතී පිරිවෙනත්, සඳහන් කළයුතුයි. වීදාගම පිරිවෙන්පති වූවාහුද ප්‍රසිද්ධ කවියකු වූ වීදාගම හිමියෝ ය. උන්වහන්සේගේ අතින් නිමහම් දුටු ලෝවැඩ සඟරාව සහ බුදුගුණ අලංකාරයත් ශ්‍රේෂ්ඨම කාව්‍ය රචනා ලෙස පිළිගැනෙත්.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මෙම මහා සම්ප්‍රදායට හිමිකරුවෙකි. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි ආචාර්ය ප්‍රාචාර්යවරුන්, විද්‍යාර්ථීහුත්, මෙම සම්ප්‍රදාය සම්බන්ධයෙන් දැනගත යුත්තාහු ප්‍රෞඪභාවයට ද පත් විය යුත්තාහ. එම සම්ප්‍රදාය තවදුරටත් ප්‍රවර්ධනය ඔබ සතුය. එකී සම්ප්‍රදාය හඳුනාගැනීම අහම්බෙන් සිදු වූවාක් මෙන් සලකුණු කෙරෙන්නක් නම් වැලිවිටියේ සෝරත නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ එම විශ්වවිද්‍යාලයෙහි ප්‍රථම උපකුලපති ධූරයෙන් පිදීමයි. මම උන්වහන්සේට වරක් සැත්කමක් කළෙමි. එයින් පසුව උන්වහන්සේ ළඟින් ආශ්‍රය කළ අතර උන්වහන්සේගේ පාණ්ඩිත්‍යයට මම අදත් ගරු කරමි. උන්වහන්සේගෙන් ලැබුණු පරිත්‍යාගයක් මම අදත් ගෞරවයෙන් සිහිපත් කරමි. එය නම් ශ්‍රී සුමංගල ශබ්දකෝෂයයි.

විශ්වවිද්‍යාල යනු එක්ටැම් ගෙවල් ලෙස, නිර්මල වස්තු ලෙස, සංවෘත ආයතන ලෙස, හුදකලා ඒකක ලෙස පැවතුණු යුගය අවසාන වී බොහෝ කල්ය. විශ්වවිද්‍යාලවල සජීවභාවය ඉවත් වී ගොස් ඇත. වර්තමාන සංකීර්ණ ප්‍රජා ජීවිතයට සහ සම්බන්ධයක් නැති තත්ත්වයට පත් වී ඇත. ජීවිතයේ හැමදෙයක්ම වෙනස් වන බැවින් එය ඉක්මනින් වෙනස් වන බැවින්, විද්‍යාවේ සහ තාක්ෂණයේ නව සොයාගැනීම් සමඟම තොරතුරු ප්‍රවාහය ද ඉක්මනින් අප වෙත ළඟා වෙයි. කාලය සමඟ ද ඉදිරියට යාමට නම් විශ්වවිද්‍යාල ද මෙම වෙනස්වීම් සමඟ සමගාමී ගමනක් ආරම්භ කළයුතුයි. ශාස්ත්‍ර ප්‍රමිතීන් පිළිබඳ ඉහළම සම්භාවනීය තත්ත්වය විශ්වවිද්‍යාල මඟින් ආරක්ෂා කොට වර්ධනය කර ගත යුත්තේය. එසේම එම ශාස්ත්‍රීයභාවයත් සමඟම ප්‍රායෝගික ලෝකයත් අතර සමතුලිතාවයක් ඇති කර ගත යුතුය. ශාස්ත්‍රීය සම්ප්‍රදාය දියාරු නොකොට අඛණ්ඩව රැක ගත යුතුයි. එසේ නොවුණ

හොත් එය විශ්වවිද්‍යාලයක් නොව බහුතාක්ෂණික ආයතනයක තත්ත්වයට පත්වන්නේය. උපාධි අපේක්ෂකයා තමන්ගේ නිවාඩු කාලවල පවා තම ශාස්ත්‍රීය ඥානය පුළුල් කර ගැනීම සඳහා ප්‍රායෝගික කාර්යයන්හි නිරත විය යුත්තේය. එහෙයින් උපදේශනය සහ මාර්ග දර්ශක ඒකක පවත්වා ගෙන යාම අත්‍යවශ්‍ය වෙයි. ඒවා උපාධි අපේක්ෂකයන් තුළ සක්‍රිය ආකල්පයක් ජනනයට හේතු වෙයි.

අවසාන වශයෙන් උපාධිලාභීන්ට වචනයක් කිවයුතුව ඇත. ඔබේ කාලය අපතේ නොයවන්න. දැනුම සමඟ සමාන කළහැකි වෙනත් කිසිදු වස්තුවක් නොමැත්තේය. විශ්වවිද්‍යාලය පිරිසිදුව තබා ගන්න. ඔබේ ම අනාගත සහෝදරයාට සහ ඔබේ දූදරුවන්ට හොඳ පරිසරයක් ඇති කර තබන්න. ඔබට තෘප්තිමත් ජීවිතයක් ප්‍රාර්ථනා කරමි.

<u>*1999.12.14*</u>

# 17

# විශ්වවිද්‍යාල අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි නව ප්‍රවණතා, නව ඇගයීම් හා නවීකරණයන්හි අවශ්‍යතාව

## ආචාර්ය කරුණාසේන කොඩිතුවක්කු

වරක් ආචාර්යවරයෙකු වශයෙන් ද, තවත් වරෙක නිසි බලධාරි වශයෙන් ද, අනික් වරෙක උපකුලපතිවරයා වශයෙන් ද, මට සේවය කිරීමට භාග්‍යය ලැබුණු, විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ඉහළ ප්‍රමුඛත්වයක් දරන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි බාහිර උපාධිධරයන් උදෙසා පවත්වනු ලබන මෙම උපාධි සමර්පණෝත්සවයෙහි උපාධි ප්‍රදාන දේශනය පවත්වන ලෙස මා වෙත කරන ලද ආරාධනය මට කරන ලද සම්භාවනාවක් ලෙස සලකන අතර, එය ඉතා නිහතමානී ව ඉටු කරන්නට කැමැත්තෙමි.

හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක ස්වාමීන්වහන්සේගේ මූලිකත්වයෙන් සහ නායකත්වය යටතේ 1873 වර්ෂයේදී කොළඹ මාලිගාකන්ද ප්‍රදේශයේදී පිහිටවනු ලැබූ විද්‍යෝදය පිරිවෙන, 1958 අංක 45 දරන විශ්වවිද්‍යාලය පනත යටතේ විශ්වවිද්‍යාලය තත්ත්වය ලබා 1959 සිට විද්‍යෝදය විශ්වවිද්‍යාලය ලෙස නම් කරනු ලැබීය. එහි ප්‍රථම උපකුලපති ධූරය හෙබවූ පූජ්‍ය වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමියන්ගේ අප්‍රතිහත ධෛර්යය නිසා ම එවකට පැවැති අනෙකුත් විශ්වවිද්‍යාලයන් අභිභවනය කරමින් දියුණුවට පත්වීමට විද්‍යෝදය සරසවිය සමත් විය. පසුව සයවැනි පැරකුම්බා මහරජතුමා සිය මෑණියන් වන සුනේත්‍රා දේවියට පින් පතා පැපිලියානේ ශ්‍රී සුනේත්‍රා දේවි පිරිවෙනට සඟ සතු කොට පූජා කර තිබූ ගංගොඩවිල අක්කර විසිපහක පමණ භූමි භාගයක් තුළ විද්‍යෝදය සරසවිය ස්ථාපිත කිරීමට සෝරත හිමිපාණෝ පියවර ගත්හ. මෙවන් පින් බිමක පිහිටි වර්තමාන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය තුළ 1979 වසරේ සිට ක්‍රියාත්මක වන බාහිර විභාග ඒකකය විසින් නිල වශයෙන් පවත්වන්නට යෙදෙන මෙම ප්‍රථම බාහිර උපාධි ප්‍රදානෝත්සවයේදී උපාධි ලබන ප්‍රථම උපාධිධාරීන් කණ්ඩායමට ඇතුළත් වීමේ භාග්‍යය අද දින උපාධි ලබන ඔබ සැමට උදා වී ඇත. එසේම 1960 ගණන්වලදී කළමනාකරණ අධ්‍යයන ක්ෂේත්‍රය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතිය තුළට හඳුන්වා දීමට පුරෝගාමී වූ මෙම විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපකුලපති පූජ්‍ය වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමියන්ගේ 40 වන ගුණසමරුව හෙටට (ජූලි 17) යෙදී තිබේ. මෙම කරුණු දෙක නිසා අද ඓතිහාසික දිනයක් ලෙස සැලකිය හැක.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අද දින මෙම උපාධි ප්‍රදානය කරන්නේ විශ්වවිද්‍යාලයට පැමිණීමේ භාග්‍යය නොලද නමුත්, මහත් වූ චිත්ත ධෛර්යයකින් යුක්ත අනේකවිධ දුෂ්කරතා මධ්‍යයේ ස්වයං අධ්‍යයනයෙහි යෙදෙමින්, විශ්වවිද්‍යාලයේ ඇදුරන්ගේ අනුග්‍රහය සහ උපදේශ යම්කිසි ප්‍රමාණයකින් ලබමින් තම අධ්‍යයන කටයුතුවල අරමුණු සාර්ථක ව ඉටු කර ගත් තරුණ තරුණියන් සඳහා වීම අප සියලුදෙනාගේ ම සතුටට හේතුවකි. නිදහස් අධ්‍යාපනයෙහි වරප්‍රසාද භුක්ති විඳිමින් ශාස්ත්‍ර හැදෑරූ අයෙකු ලෙස තවදුරටත් එකී නිදහස් අධ්‍යාපන සංකල්පය ආරක්ෂා කරමින් එය ප්‍රවර්ධනය කිරීම ගැන ද, විශ්වවිද්‍යාලයක් තුළ අභ්‍යන්තර ශිෂ්‍යයෙකු හෝ ශිෂ්‍යාවක ලෙස ශිල්ප කිරීමේ ආස්වාදය ගිලිහී ගිය තරුණ කැළකට බාහිර ශිෂ්‍යයෙකු ලෙස උපාධියකට උරුමකම් කීමට මං පෙත් විවර කෙරුමට පෙරමුණ ගෙන ක්‍රියා කිරීම පිළිබඳ ව මාගේ අභිනන්දනය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයටත්, එහි උපකුලපතිතුමා ප්‍රමුඛ සනාතන සභාවට සහ මේ සඳහා ඇපකැපවී සිටින

සියලු ම පීඨවල ආචාර්ය මණ්ඩලයටත් පිරිනමමි. දැනට ක්‍රියාත්මක වන නිදහස් අධ්‍යාපනය තවදුරටත් පෝෂණය කරමින් වඩාත් අර්ථාන්විත ව රටේ උන්නතියට ඵලදායී වන පරිදි ඉදිරියට ගෙන යාම, වත්මන් රජයේ ද පරම බලාපොරොත්තුව යි. ඉතා විශාල පරිමාණයෙන් ලැබෙන විදේශ ආධාරවලින් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි මෙන් ම පාසල් පද්ධතියෙහි කෙරෙන සාමාන්‍ය අධ්‍යාපනය හා අනෙකුත් ආයතන මඟින් ලබාදෙන වෘත්තීය අධ්‍යාපනය තුළ ද ඉතා පුළුල් නවීකරණයක් දියත් වෙමින් තිබුණ ද එයින් මේ දක්වා ලබා දුන් නිදහස් අධ්‍යාපනය කිසිදු ලෙසකින් කපාහැරීමක් අරමුණු නොකෙරෙන බව අවධාරණය කළ යුතු ය. රාජ්‍ය නොවන ආයතනවල සහ වෘත්තිකයන්ගේ සහභාගීත්වය අපේක්ෂා කරන්නේ රජයේ අධ්‍යාපන ප්‍රතිපත්ති සහ සැලසුම් ක්‍රියාත්මක කිරීම්වලට පරිපූරකයන් ලෙස දායකවීමට යි.

වඩාත් පුළුල් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ නවීන ලෝකයට ගැළපෙන හා රටේ ආර්ථික සංවර්ධන අරමුණු සහ උපාය මාර්ගයන්ට වඩාත් උචිත වන අයුරින් අප වර්තමානයේ මුහුණ දී ඇති බොහෝමයක් ගැටලුවලට පදනම වූ දිළිඳුකම සහ උග්‍ර සේවා වියුක්තියට විසඳුම් ලබාදීමට උපකාරී වන වඩාත් යථාර්ථවාදී සහ ප්‍රායෝගික, විෂය මාලාවක් සහ අධ්‍යාපන යාන්ත්‍රණයක් රට තුළ ස්ථාපිත කිරීමට අපි අපේක්ෂා කරමු. සාම්ප්‍රදායික ව පවත්වාගෙන යනු ලබන ශාස්ත්‍රීය පාඨමාලාවට අතිරේක ව නව චින්තනයක් ප්‍රචලිත කිරීමට අත්වැල් සපයන, එසේම වර්තමානයේ පවතින තරඟකාරී ආර්ථික රටාව තුළ රැඳී සිටීමට සහ ප්‍රගමනය වීමට අත්‍යවශ්‍ය වන නිපුණතා සහ කුශලතා ප්‍රවර්ධනය කරවන නවීන පාඨමාලා හඳුන්වාදීම සහ සාර්ථක ව කරගෙන යාමට ශ්‍රී ලාංකේය විශ්වවිද්‍යාලය උත්සුක විය යුතු ය.

විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යනු ලබන අභ්‍යන්තර උපාධි පාඨමාලා පමණක් නොව බාහිර උපාධි පාඨමාලා ද පුළුල් කිරීමට සහ නවීකරණය කිරීමට කටයුතු කළ යුතු කාලය දැන් එළඹ ඇත. කළමනාකරණ කුශලතාවන් සහ තාක්ෂණික දැනුම දීප ව්‍යාප්ත ව බෙදා දෙන වැඩ පිළිවෙළවලට එම ආයතන යුහුසුලු ව අවතීර්ණ විය යුතු ය. මේ පිළිබඳව සහ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සිදුවෙමින් පවතින නවීකරණයන් මෙන් ම ඒවායේ ඇති අදාළත්වය පිළිබඳ ව කරුණු කීපයක් ගෙනහැර පෑමට මම කැමැත්තෙමි.

1948 බ්‍රිතාන්‍ය පාලනය අවසන් වීමත් සමඟ අප අපේ ම පාලනයක් යටතේ ස්වාධීන ස්වෛරී රටක් ලෙස කටයුතු කරන්නට පටන් ගත්තෙමු. එහෙත් ගත වූ අවුරුදු 55 තුළ අප ලබා ඇති දේශපාලනික, ආර්ථික සහ සමාජීය වර්ධනය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි බව බොහෝ දෙනා පිළිගන්නා කරුණකි. මේ කාලය තුළ විවිධ සංග්‍රාමයන්හි අපි නියැළුණෙමු. වරෙක දේශපාලන මතිමතාන්තර සංග්‍රාමයක ද, ඉන් පසුව ඒ තුළින් ම පැන නැඟුණු මිනිස් ඝාතන සංග්‍රාමයක ද 2001 වසර අවසානය වන තෙක් නියුක්ත වූවෙමු. මේ අතරතුර දශක කිහිපයකින් අපට පිටුපසින් සිටි අප කලාපයේ සහ තදාසන්න කලාපවල රාජ්‍ය, ආර්ථික සහ සමාජීය වශයෙන් දශක කීපයකින් අපට වඩා ඉදිරියට යෑමට සමත්ව සිටී. අපට අත් වූ අවාසනාවන්ත ඉරණම, දැඩි ආර්ථික පසුබෑස්ම, සමාජ ප්‍රභේදනය, දහස් සංඛ්‍යාත ජීවිත අහිමිවීම ආදීන් ඒ සංග්‍රාමයන් මඟින් අප වෙත ළඟා කර දුන් විනාශකාරී ප්‍රතිඵලය යි.

ගෝලීයකරණය තුළින් සිදුවී ඇති සහ සිදුවෙමින් පවතින වෙනස්කම්, දැනුම හැකියාව රජකරවන සීමා මායිම් රහිත (Borderless) තරඟකාරී ලොවක් නිර්මාණය කොට ඇත. අනාගත සෞභාග්‍යය සඳහා විවෘත ආර්ථික ප්‍රතිපත්තිවල බලපෑම්වලින් හා උපනතීන්වලින් කිසිම රටකට බැහැර විය නොහැකි තත්ත්වයක් උදා කර ඇත. රටරටවලට, විශේෂයෙන් ම තුන්වැනි ලෝකයේ රටවලට තනි

තනිව නැඟී සිටීමේ හැකියාවක් මේ ගෝලීයකරණ විශ්වය තුළ දැන් නැත. තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ වර්ධනයන් සහ ඇතැම් භාෂාවන් විශ්ව භාෂාවන් බවට අවතීර්ණය (Emergence) වීම මෙතෙක් කල් ජාතීන් අතර බාධකයන් ව පැවති දූරස්ථභාවය සහ සන්නිවේදන නොහැකියාව අර්ථ ශූන්‍ය කර ඇත. මෙ මඟින් තොරතුරු සන්නිවේදන තාක්ෂණ කුසලතාව හා විශ්ව භාෂා ඥානය, දැනුම සහ හැකියාව මුල්කර ගත් අනාගත සීමා මායිම් නොමැති ලොව තුළ ජයග්‍රහණය සඳහා අවශ්‍ය ම කුසලතාවන් බවට පත්ව ඇත. මේවා නොයෙක් ආකාරයේ විෂයයන් සහ ක්ෂේත්‍ර පිළිබඳව දැනුම සහ හැකියාව ලබා ගැනීමේ මූලික මෙවලම් බව පිළිගත යුතු ය. ඒවා රටක තරඟකාරී හැකියාවේ තීරකයන් බවට පත් ව ඇත. රටක් අත්කර ගත් ආර්ථික සංවර්ධනයේ මට්ටම මනින මිණුම් දඬු බවට පත්ව ඇත. තොරතුරු සන්නිවේදන තාක්ෂණය අතින් ඉතා ඉහළ ම මට්ටමක් හිමි කර ගත් ෆින්ලන්තය, ඇමරිකා එක්සත් ජනපදය, සිංගප්පූරුව, ස්වීඩනය, අයිස්ලන්තය, කැනඩාව, ඩෙන්මාර්කය, තායිවානය හා ජර්මනිය යන රටවල් ලෝකයේ ඉහළම ඒක පුද්ගල ආදායම වාර්තා කිරීමට සමත් ව ඇත. තොරතුරු සන්නිවේදන තාක්ෂණය සහ ආර්ථික සංවර්ධනය අතර දැඩි සම්බන්ධතාවක් මෙයින් තහවුරු වේ.

මේ පසුබිම තුළ ලංකාවේ අනාගත අභිවෘද්ධිය සඳහා අනුගමනය කළ හැකි ඉතා දූරදර්ශී උපාය මාර්ගයක් නම් සර්වග්‍රාහී (Comperhensive) මානව සම්පත් සංවර්ධනය යි. එය ළඟා කර ගත හැක්කේ සමස්ත අධ්‍යාපන ක්ෂේත්‍රය ම ඉතා පුළුල් නවීකරණයකට භාජනය කිරීම මගිනි. එම නවීකරණ ක්‍රියාවලිය සමස්ත විශ්වවිද්‍යාලයීය පද්ධතිය තුළ මෙන් ම සාමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රය වන පාසල් පද්ධතිය තුළ සහ වෘත්තීය අධ්‍යාපනය තුළ ද සිදුවිය යුතු ය. වර්තමාන රජය රටේ සංවර්ධනය සඳහා ප්‍රමුඛ අවශ්‍යතාවක් වශයෙන් මෙය හඳුනා ගෙන ඇත. ඒ සඳහා සැලසුම් කොට ක්‍රියාත්මක කිරීමට දැනටමත් පියවර ගෙන ඇත. ඉතා කෙටියෙන් මේ සඳහා ගෙන ඇති වැඩ පිළිවෙළ පිළිබඳ ව සඳහන් කරනු කැමැත්තෙමි. අධ්‍යාපන අමාත්‍යාංශය දැනටමත් තොරතුරු සන්නිවේදන කුසලතාව පාසල් දරුවන් තුළ කුළුගැන්වීම සඳහාත් විශ්ව භාෂාවක් වශයෙන් ඉංග්‍රීසි භාෂාව හඳුන්වා දීමටත් දැවැන්ත කඩිනම් ක්‍රියාවලියක් ආරම්භ කර ඇත. මේ සඳහා ලෝක බැංකුවේත්, ආසියානු සංවර්ධන බැංකුවේත් අනුග්‍රහය අපට ලැබී ඇත. මේ වර්ෂය අවසාන වන්නට පෙර ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය අනුග්‍රහයෙන් ක්‍රියාත්මක වන ද්විතීය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය යටතේ පාසල් කේන්ද්‍රීය පරිගණක ඉගැනුම් මධ්‍යස්ථාන 800ක් පිහිටුවීමට අපේක්ෂිත යි. දැනටමත් මෙවැනි මධ්‍යස්ථාන 212ක් දිස්ත්‍රික්ක 22ක ඉතා සාර්ථක ව විවෘත කර ඇත. මීට අමතර ව මෙම ව්‍යාපෘතිය යටතේ ම තවත් මධ්‍යස්ථාන 200 ක් 2004 වර්ෂය ඉක්මවන්නට පෙර පිහිටුවීමට සැලසුම් කර ඇත. විශ්ව භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාෂාව දෙයාකාරයකින් හඳුන්වා දීමට ද පියවර ගැනෙමින් පවති. එක් පියවරක් නම් ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගැනීමට මෙන් ම ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබා ගැනීමේ පහසුකම් ද ඇති කිරීම යි. ලෝක බැංකු ආධාර ඇති ව ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය යටතේ පාසල්වල ප්‍රාථමික සහ ද්විතීයික මට්ටම්වල මෙන් ම ජාතික අධ්‍යාපන ආයතනවල ඉංග්‍රීසි ඉගැන්වීම ද පුළුල් කෙරෙනු ඇත. මුළු විශ්වවිද්‍යාල ක්ෂේත්‍රය තුළ ම මෙවැනි නවීකරණයන් රැසක් දියත් කිරීම වර්තමාන රජයේ අපේක්ෂාව යි. ඒ සඳහා මූලික පියවර රැසක් ඉතා සාර්ථක ව මේ වන විටත් ගෙන ඇත.

මේ නවීකරණ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය තවත් සාධක කීපයක් ඇත. එනම් විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථීන්ගේ උනන්දුව සහ දායකත්වය, පාසල්වල ගුරු භවතුන්ගේ නොමසුරු දායකත්වය සහ කැපවීම, පාසල්වල සිසු දරුවන්ගේ අවබෝධය සහ කැපවීම සහ දෙමවුපියන්ගේ මඟපෙන්වීම සහ දිරිගැන්වීම යි. තවදුරටත් ශූන්‍ය දේශපාලන මතිමතාන්තරවල එල්බ නොගෙන අධ්‍යාපන කටයුතුවල කැපවීමෙන් යුතු ව නියැළීමට සිසු දරුවන් මෙහෙයවීම විශ්වවිද්‍යාල සහ

ආචාර්යවරුන්ගේ සහ පාසල් ගුරුභවතුන්ගේ වැදගත් කාර්යභාරයක් විය යුතුවාක් මෙන් ම එය දෙමව්පියන්ගේ මැදිහත් වීමෙන් ද සිදුවිය යුත්තකි. ශ්‍රී ලාංකේය සංස්කෘතික උරුමයන් ඉදිරියට ගෙන යමින් සමාජ සාරධර්ම සහ වටිනාකම් අගයන දූ දරුවන් පිරිසක් රටට දායාද කිරීමට මේ සියලු කොටස් එකතු විය යුතු ය. උසස් අධ්‍යාපනය සඳහා සරසවි, අනෙකුත් කාර්මික විද්‍යාලය සහ තාක්ෂණික ආයතනවලට පිවිසෙන මේ රටේ උගත් සහ බුද්ධිමත් තරුණ කැළ තම අධ්‍යාපන අරමුණුවලින් බැහැර කරවමින් විනාශකාරී වැඩ පිළිවෙළ කෙරෙහි යොමු කරවන බලවේගවලින් ආරක්ෂා කර ගැනීම අප සැම දෙනාගේ ම යුතුකමක් සහ වගකීමකි. දිළිඳු රටක් වන ශ්‍රී ලංකාව දශක දෙකකට වැඩි කාලයක් දිග ඇදුණු වාර්ගික යුද්ධයකින් හෙම්බත් වී ආර්ථික පසුබෑමකට සහ විශාල ණය බරකට හසු වී සිටියි. මෙවැනි පසුබිමක් යටතේ ඉතාමත් අපහසුවෙන් සොයාගන්නා මුදල් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ නිසි අන්දමින් ඵලදායී ලෙස ආයෝජනය නොවුණ හොත් අපේ අනාගත ඉරණම තවත් කනගාටුදායක මෙන් ම දුක්ඛිත එකක් ද විය හැකි ය. එම නිසා ඉතාමත් දුෂ්කරතා මධ්‍යයේ අධ්‍යාපන ක්ෂේත්‍රය උදෙසා යොදවන මුදල්වලින් විපුල ඵලනෙළා ගැනීම උදෙසා අපගේ දරුකැළ මෙහෙයවීම ඉතාමත් වැදගත් වේ. ඒ සඳහා නිසි මඟ පෙන්වීම සහ උපදෙස් ලබාදීම අප අතින් සිදුවිය යුතු වැදගත් කාර්ය භාරයකි; සමාජ යුතුකමකි. නිසි සන්නිවේදනය මඟින් ජාතීන් අතර මනා සහජීවනයක් ඇති කර ගත හැකි අතර එමඟින් ඔවුනොවුන් අතර පවතින අනවබෝධය ඉවත් කර ගැනීමට හැකි වේ. මීට අමතර ව මෙම භාරදූර කටයුත්ත සාර්ථක ව කරගැනීම සඳහා රාජ්‍ය නොවන අංශවල සහ වෘත්තිකයන්ගේ දායකත්වය ද අත්‍යවශ්‍ය ව පවතී. ඔවුන් සැමදෙන ක්‍රියාකාරී ව අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඇති කළ යුතු නවීකරණයන් සඳහා දායකත්වය ලබාදිය යුතුය. එය ඉහතින් සඳහන් කළ අන්දමට රජයෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩ සටහන්වලට පරිපූරකයන් වනු ඇත. එය සෑම ජන කොට්ඨාසයකට ම සංවර්ධන ඉඩ ප්‍රස්තා කඩිනම් ව ළඟා කර දීමට පිටිවහලක් වනු ඇත.

මේ ද්විවිධ උපාය මාර්ග මගින්, එනම් තොරතුරු සන්නිවේදන තාක්ෂණය සහ විශ්ව භාෂාවක් වශයෙන් ඉංග්‍රීසි දැනුම පුළුල් කිරීම තුළින්, අපට අහිමි වූ අතීතය යළි හිමිකර ගන්නට, නව තාක්ෂණයෙන් අධිවේගයෙන් ඉදිරියට යන ලොව කරා ජව සම්පන්න පිම්මකින් අවතීර්ණ වන්නට, එහි ඵල නෙළා ගන්නට අපේ වර්තමාන සහ ඉදිරි පරම්පරාවලට පිටිවහලක් වේය යන්න අපේ අපේක්ෂාව යි.

විශ්වවිද්‍යාලවලින් පිට වූ උපාධිධාරීන් මෙන්ම විශ්වවිද්‍යාලවල අධ්‍යාපනයේ නිරත ව සිටින සිසුන්ට ද අනාගත අභියෝගයන්ට මුහුණදිය හැකි වන්නේ විශ්ව භාෂාවන් සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ දැනුම තමන් හදාරන අනෙකුත් විෂයන්ට අමතර ව ප්‍රගුණ කළ හොත් පමණි. බොහෝ විශ්වවිද්‍යාලවල දැනටමත් මෙයට අවශ්‍ය පහසුකම් ලබා දී තිබුණත් මේවා පරිහරණය කරනු ලබන්නේ ඉතා සීමිත පිරිසකි. මෙය වහා ම වෙනස් විය යුත්තකි. විශ්වවිද්‍යාල ආචාර්යවරුන් ද මෙම වෙනස ඇති කරලීමට කඩිනම් උපාය මාර්ග හඳුන්වා දෙමින් දායක විය යුතු ය. අද දින උපාධි ගන්නා ඔබ සියලුදෙනා ජීවිතයේ වැදගත් ජයග්‍රහණයක් ළඟා කරගෙන ඇත. බාහිර සිසුන් වශයෙන් ඇතැම් විට රැකියාවල ද නියුක්ත වෙමින් අධ්‍යයන කටයුතුවල නියැළෙන අතරතුර ඉහත කී කුසලතාව ලබා ගැනීමට ඔබ දැනටමත් අවධානය යොමු කර ඇතැයි මම විශ්වාස කරමි. එය ඔබ උපාධිය තුළින් ලබාගත් ජයග්‍රහණය වඩවඩාත් ඔපවත් වීමට සහ රටට වැඩදායී වීමට හේතුවක් වනු ඇත. අද දින උපාධි ලබාගන්නා සියලු දෙනාට ම ඉතා දීප්තිමත් අනාගතයක් නැවතත් ප්‍රාර්ථනා කරමි.

සරසවි තුරු සෙවණේ අධ්‍යාපනය හැදෑරීමේ භාවාත්මක සුවය ලකුණක් හෝ දෙකක් අඩුවීම නිසා අහිමි වී ගිය අපේම තරුණ තරුණියන් රැසකට ඔවුන් විසින් අත්කරගත් උපාධිය නැමැති ජයග්‍රහණය ඉතාමත් ගෞරවාන්විත අන්දමින් ලබාගැනීමට මෙවන් ප්‍රභාස්වර උපාධි ප්‍රදානෝත්සවයක් සංවිධානය කිරීම පිළිබඳව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා ඇතුළු සමස්ත අධ්‍යයන කාර්ය මණ්ඩලයටත් ලේඛකාධිකාරීතුමා ඇතුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලයටත් මේ රටේ මානව සම්පත් සංවර්ධන, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු භාර ඇමතිවරයා ලෙස මගේ හෘදයංගම ස්තූතිය පළ කරමි. මෙවන් උපාධි ප්‍රදානෝත්සව දේශනයකට ආරාධනා කිරීමෙන් මා වෙත කරන ලද ගෞරවය පිළිබඳව නැවත වරක් කෘතඥතාව පළ කරමින් මාගේ දේශනය අවසන් කිරීමට කැමැත්තෙමි.

<u>*2003.07.16*</u>

# New Trends in University Education: The Need for Re-evaluation and Reform

**Dr. Karunasena Kodituwakku**

I consider it a privilege and an honour to deliver this keynote address at this convocation ceremony held to award degrees to the graduates of the external degree programme of the University where I served first as a lecturer, then as competent authority, and finally as the Vice Chancellor.

Vidyodaya Pirivena which was founded in Maligakanda, Colombo, under the leadership of Venerable Hikkaduve Sri Sumangala Nayaka Thero in 1873 was granted the University status since 1959. The first Vice Chancellor of this University was Venerable Welivitiye Sri Soratha Nayaka Thera. He was able to develop this University into a center of higher learning with his indefatigable strength and courage overshadowing even other contemporary universities. The Venerable Thero was the pioneer of introducing the field of management in to Sri Lankan universities. Later he was able to establish this University in 25 acres of land which was originally donated to Sri Sunethra Devi Pirivena of Pepiliyana by the King Parakramabahu VI in order to transfer merit to his mother, queen Sunethara Devi. The University of Sri Jayewardenepura, which is located on this land, thus epitomises this meritorious act of the royal family. The university established a separate unit since 1979 for the external degree examinations. This is its first batch of students to receive degrees at a convocation ceremony. The 40th anniversary of the demise of the late Venerable Sorata will be commemorated at a ceremony tomorrow, the 17th of July. Due to these two reasons, I consider today to be a historic day.

I am extremely happy to hear that the University of Sri Jayewardenepura has organized this ceremony to award degrees for these young men and women who have achieved their academic goals with determination largely through self- study, with some guidance and assistance of the resources of the University. I myself, as a beneficiary of the free education system, salute the University of Sri Jayewardenepura, the Vice Chancellor, the members of the Senate and the Faculty Members for their effort to preserve and develop the concept of free education in this country. It is the fervent hope of the present government to foster and develop meaningfully the free education system in Sri Lanka. Although a comprehensive modernization is now taking place in the general and vocational education system due to the large amount of foreign aid coming in, this is not intended at all to curtail the existing free education of the country. The participation of non- governmental organizations and professionals is expected to be of complementary assistance to implement the educational policy and planning of the government.

We intend to establish realistic and practical educational programmes in order to alleviate the many problems such as poverty and unemployment that we face today in this country. These programmes should be carried out under broad educational reforms in accordance with the aims and objectives related to the economic development of the country and the needs of the modern world. The attention

of the Sri Lankan universities must be geared to introduce and conduct new academic programmes. These new programmes, in addition to the existing academic courses, must help the society to develop its new thinking process and to build up proficiency and skills needed to survive within this competitive economic framework of today.

It is high time for us to consider modernizing and reforming not only the existing internal degree programmes but also the external degree programmes of the universities. The Universities should develop and distribute management skills and technical knowledge among the young men and women through out the island. I would like to elaborate on this point as well as on the reforms and their relevance to the field of education.

With the termination of the British administration in 1948, we began to govern this country as an independent nation. However it is a well known fact that the political, economic and social development of the country since then have been unsatisfactory to say the least. During this time we engaged in two battles which lasted up to the end of the year 2001, beginning with a political and ideological battle which ultimately led to massive human destruction. The governments of our neighbouring countries as well as others in the region, which used to trail behind us in development by a number of years, have now superceded us by several decades. Severe economic regression, the disintegration of our society, the loss of thousands of human lives and other misfortunes are the disastrous results that we gained by this.

The changes that the globalization process has brought and is still bringing have created a borderless competitive world where knowledge and skills are given pride of place. A situation has been created where no country can achieve successful development without obeying the dictates of a laissez-faire economy. No chance is given for a country, specially a third world country, to develop in isolation in this globalized world. The lack of a medium of communication and distance that had posed obstacles to the relationship among countries are now rendered meaningless by the emergence of some languages as universal languages and the development in the field of information technology. Thereby, knowledge of a universal language and skill in information technology are prerequisites for meeting the challenges of this borderless competitive world. They have become the basic tools for gathering skills and competitiveness of a particular society. They have become a determiner of economic progress. Countries like Finland, The United States of America, Singapore, Sweden, Iceland, Canada, Denmark, Taiwan and Germany which had paid attention to developing their skills in information technology record the highest per capita income. This has proved the link between information technology and economic development.

Given this background, the most farsighted step we can take today for the future prosperity of Sri Lanka is comprehensive human development. This can be done only by completely overhauling and modernizing the field of education. This modernizing process should take place not only at a university level but also at the level of "general education" which includes the school system and the vocational training institutes. The present government has recognized this need as a priority in development. Already steps have been taken to plan implemented action. I would like to speak briefly about some of

these. The Ministry of Education has already launched a massive project to develop the skills of school children in information technology and to introduce English as a universal language. We have been given aid by both the World Bank and the Asian Development Bank for this purpose. 800 school computer centers will be established before the end of this year under the secondary education development project funded by the Asian Development Bank. Already 212 centers in 22 districts have been successfully established. In addition, steps will be taken to create 200 more centers before the end of 2004. English will be introduced as a universal language in two ways. That is, by providing opportunities for the learning of English as well as creating the possibility of studying in the English medium. The teaching of English will be broadened at primary and secondary levels at schools as well as in the national institutes of education by this project funded by the World Bank. The present government hopes to make a series of changes in the entire university system as well. The first successful step has been taken towards it already.

There are some more essential elements needed for this modernization process. That is the interest and the contribution of the university community, the generous commitment and contribution of school teachers, the understanding and commitment of university and school students, the guidance and encouragement of parents. It is an important task of the academic staff of the universities as well as the school teachers to guide students towards commitment to their education instead of belief in meaningless political ideologies and this should be done with the involvement of parents as well. These elements should join together in order to endow the country with a group of sons and daughters who evaluate social values within the cultural tradition of Sri Lanka. It is our duty and responsibility to protect the intelligent and educated young men and women who pursue their higher studies in universities, technical colleges and other institutes of higher learning. We must prevent them from getting involved in destructive forces that obstruct their academic goals. Sri Lanka is a poor country. It has suffered greatly due to debt, economic recession and an ethnic war which lasted for more than two decades. Our future destiny under these circumstances will be an unhappy one if we do not invest properly the money that we receive in education. Therefore it is very important to direct our young men and women to achieve beneficial results from the money that we spend for education. Our duty is to advise and direct them in the correct path. It is a social responsibility. We can create the mutual understanding and ethnic harmony through the proper communication. In addition, the non-governmental sector and professionals should also contribute towards this process. They should actively contribute towards the changes taking place in the field of education. In this way they will complement the programmes initiated by the government. This will help in providing development opportunities to all sectors of society.

We hope that this two fold effort that of providing opportunities for developing skills in information technology and of learning the universal language will enable the present and future generations to capture a past that they had lost and to enter the fast moving world of information technology with a giant leap to have a share of all benefits.

Graduates as well as undergraduates will be able to face the challenges of the future if only they are equipped with knowledge of information and universal language in addition to the subjects they have

studied. Though many universities have already given the necessary resources for this purpose, only a very few students make use of them. This has to change. University lecturers should make suggestions as to how things could be improved and make a speedy contribution towards this change. All of you who are receiving degrees today have achieved an important victory in your life. I trust you that you would have given thought to the acquiring of the skills that I have talked about, along with this education you have received as external students perhaps while you were involved in a profession. This will make the victory you have achieved by being honoured with a degree, so much the greater.

As the Minister of Human Resources, Education and Cultural Affairs, I wish to convey my heartfelt thanks to the Vice Chancellor, the academic staff, Registrar and the administrative staff for organizing this excellent convocation ceremony to award external degrees for these young men and women who have missed the opportunity by one or two marks to enter the university as internal students. I would like to conclude my speech by wishing all of you a very bright future and also by expressing my gratitude to the university for inviting me to deliver this convocation address.

*2003.07.16*

# 18
# Prowess of Healing
## Prof. Priyani Soysa

Today is a great day for all of you who are in black graduand gowns in this hall. It is a great pleasure to address you, and for this honour, I thank the Dean and his cohort of medical scientists-the professors, Senior and Junior Lecturers and also the youngest probationers, all of whom add to the glory and colour of this occasion.

My memory goes back to 1950 when I, like you, sat down in the audience to be conferred the MBBS after six year training in Colombo.

Whatever the motivation that led you to enter these portals, today you feel free that the shackles of many exhausting examinations have been shed. When you look back, you have achieved the desire to be a professional. A recent survey of medical students was portrayed with some regrets, of students who feared that they had not anticipated such a rigorous training. To them I say, that I hope you have evolved from that earlier shock and now, the realization of the great responsibility of a professional will inspire you. Indeed you will now carry human life in your hands and you must carry that with humility and not with arrogance, and that is given to you with a shower of blessings. Respect life: save life, along with this prowess of healing you have been trained to acquire, goes the Doctor Patient relationship with its innuendoes, the responsibility to function as efficiently as it is within your human ability and the confidentiality which goes along with that responsibility. At all times, you are called upon to rush for emergencies and the daily rounds, mindful of having all your wits about you, and a behavior worthy of the medical profession. In short, now don another special cloak, that of a professional which in today's local context is much criticized for erratic performance. Sad to say, there is some truth in such criticism because there are these who forget the patient's rights. Public demands are not always possible. The old saying "Rajakama nethnam Vedakama" is not truly applicable in modern society because this carries arrogance, rather than humility. Only a few politicians are national minded. Many are hungry for power and wealth. You and I have not deigned to choose that path; If you join the public service, most certainly you have to adhere to government policy - otherwise you have the freedom to go private. Having served several governments since Sri Lanka gained independence over five decades, I can say in all honesty and humility that I did not acquire a mite but a mighty experience of being Your Obedient Servant'. I was not a trade unionist though related to a giant one of yore. I had to fight my own battle for seniority and won it too late to enjoy it over those who had not worked as hard for merit. So, follow the spirit of the only right you have, which is your duty, come what may!

Your training is incomplete without internship, which today is such a shared duty, that it cannot be compared with our training when we were on call every other day. If you forgive me for saying this, I will tell you that I was on call for all the wards at the Lady Ridgeway Hospital for children and Lady

Havelock for women every other day. There were children having fits, intestinal obstruction due to intussusception or round worms on one side and women with ectopic gestation and even induced abortions on the other, to be attended to, single handed, late into the night even and in the wee hours of the morning. There were no SHO's or Registrars for support. But this experience I referred to earlier added up to a might' which helped in postgraduate training. You have to develop human compassion and realize that in our society this stands Like a beacon of help to the under-privileged majority. You cannot always care, but pain and suffering can be alleviated. I was responsible for initiating Paediatrics as a separate subject in the final examination and subsequently it has evolved as a separate choice for internship. Scores of Paediatricians and four Professors of Paediatrics have under gone their training and they are now functioning with further insight and futuristic training in health care for the public and private sectors.

In the global scene, medicine has evolved with great speed in the last twenty years or so. There is a glittering array of technologies. Hippocrates, noble as he was, would have had to revise his oath, but the public still refer to it when they fault the medical profession. You would have to master the art of applying new technical skills and equipment to any special situation rather than wave those like magic wands for sundry illnesses. Make certain that you identify your need for this use with due consideration coupled with the patients requirement and not merely for the fear of litigation and practicing defensive Medicine, thereby increasing the cost of health care to all.

Sri Lanka has need of you. I toured Jaffna, Mannar, Vavuniya and the East in my monitoring of Sri Lanka's certification in the background of global polio eradication. There were several retired re-employed medical officers doing their best, where permanent staff was not available, I was questioned in New Delhi in March this year by the international Regional Commission for polio eradication as to why the vacancies were not filled. They did not know the ground situation. However, I was happy to see a young pediatrician in the post which I served in Jaffna from 1956 - 1958. This same pediatrician was working with missionary zeal as he did in Trincomalee when I visited that area 2 years earlier.

<u>*2004.06.26*</u>

# 19

# චර්යා ධර්මයන්හි අගය වටහා ගත යුතු යුගයක්

මහාචාර්ය කේ. එන්. ඕ. ධර්මදාස

මනුෂ්‍යයා අන්‍ය සත්ත්වයන්ගෙන් වෙනස් වන්නේ ප්‍රධාන වශයෙන් කරුණු දෙකක් නිසා යැයි කිව හැකිය. එකක් නම් සත්ත්වයන්ට නොමැති බුද්ධි ශක්තියක් මනුෂ්‍යයා සතු වීමය. එම බුද්ධි ශක්තිය වසර ගණනාවක් තිස්සේ සංවර්ධනය වුවත් ඈත අතීතයේ මානව වර්ගයා අන්‍ය සත්ත්වයන් හා සමීපව සිටි අවධියේ මනුෂ්‍යයාත් අන්‍ය සත්ත්වයනුත් අතර වෙනසකට තිබෙන්නට ඇත්තේ ඔවුන්ට වඩා ඉතා ස්වල්ප වශයෙන් වැඩි වූ බුද්ධි ශක්තියක් වූ නිසා බවට සැක නැත. මානව සත්ත්වයාගේ පරිණාමය පිළිබඳ ගවේෂණයන් මඟින් දැනට ශේෂ වී ඇති කපාලයන්හි ප්‍රමාණය පරීක්ෂා කොට මේ අනුමානය ඉදිරිපත් වී තිබේ. එම අනුමානය ම අනුව අපට සිතිය හැක්කේ මනුෂ්‍ය සත්ත්වයාගේ ප්‍රාථමික මී මුත්තන් වූ සත්ත්වයන් හා අන්‍ය සත්ත්වයන් අතර වෙනසක් නොතිබුණු යුගයක් ද තිබෙන්නට ඇති බවය. ඒ අනුමාන කෙසේ වෙතත් අද දින අප යථාර්ථය ලෙස දකින්නේ මානව සත්ත්වයා අන්‍ය සියලු සත්ත්වයන් අභිභවා අසහාය බුද්ධි ශක්තියකින් යුක්තව සිටිමින් තම වාසස්ථානය වූ පෘථිවිය පමණක් නොව සමස්ත විශ්වයම තම ග්‍රහණයට හසු කර ගැනීමේ ශක්තියකින් යුක්තව සිටින බවයි.

මනුෂ්‍යයා අන්‍ය සත්ත්වයන්ගෙන් වෙසෙසා දැක්වෙන අනෙක් කාරණය වන්නේ ඔහු විසින් ගොඩ නඟා ගෙන ඇති චර්යා ධර්ම සමූහය යි. චර්යාව යනු හැසිරීම යි. ධර්මය යනු උසස් යැයි, උතුම් යැයි පිළිගැනෙන තත්ත්වයකි. චර්යා ධර්ම යන්නෙන් අදහස් වන්නේ මනුෂ්‍යයන් විසින් අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකා කෙරෙහි පැවතිය යුතු ආකාරය ගැන පොදුවේ පිළිගැනීමට පත් කරගෙන ඇති විශ්වාස සමූහයකි. මහාචාර්ය සරච්චන්ද්‍රයන් **ධර්මිෂ්ට සමාජය** කෘතියෙහි කියන පරිදි නොයෙක් සමාජවල පවත්නා චර්යා ධර්ම පද්ධති සංසන්දනය කරන විට ඒවායේ බොහෝ පොදු ලක්ෂණ තිබෙන බව පෙනී යයි.

''සමානකම් කොතරම් ද කිවහොත් හැම සමාජයකට ම සාධාරණ වූ චර්යා ධර්ම පද්ධතියක් තිබේ යැයි සිතීමට ඉඩ තිබේ. මුසාවාදය සාවද්‍ය බව හැම සමාජයක් විසින් ම පිළිගනු ලැබේ. ඇතැම් සමාජයක ''ප්‍රාණ ඝාතය'' යන්නෙහි අර්ථය මනුෂ්‍යයන් මැරීමට සීමා වන බවත් යුද්ධයක දී සතුරන් මැරීම ප්‍රාණ ඝාතය ලෙස නොගැනෙන බවත් පෙනෙන නමුදු පොදුවේ ප්‍රාණ ඝාතය අකුසල කර්මයක් ලෙස හැම සමාජයක ම පිළිගනු ලැබේ. මෛථුනය ගැන නොයෙක් අයුරේ තහංචි කවර සමාජයක හෝ වේවා පවතී.

සත්ත්ව ලෝකයේ එබඳු සීමා පැනවී නැත. අසුවල් දේ කිරීම නුසුදුසු ය සාවද්‍යය යනාදී ධර්මමය විනිශ්වයන් එහි ක්‍රියාත්මක නොවේ. අසහාය බුද්ධි ශක්තියකින් යුත් මනුෂ්‍යයා තම බුද්ධිය අධාර්මික සාවද්‍ය නොමනා යනාදි වශයෙන් හැඳින්විය හැකි දේ සඳහා යොදා නොගන්නේ ඔහු චර්යා ධර්ම පිළිබඳ පොදු එකඟතාවට අනුගතව ක්‍රියා කරන හෙයිනි. උදාහරණ වශයෙන් මනුෂ්‍යයා තම බුද්ධි මහිමයෙන් නිපදවා ගත් විෂබීජ ආයුධ හෝ න්‍යෂ්ටික ආයුධ භාවිත කිරීමෙන් වැළකී සිටින අයුරු දැක්විය හැකිය. මේ මූලධර්මය එබඳු ආන්තීය සිද්ධියක් සඳහා පමණක් නොව කුඩා පරිමාණයේ සිද්ධියක් කෙරෙහි ද යෙදවිය හැකි ය. එනම් තමන් අත ඇති බලය අනිසි ලෙස නොයෙදීම හැන්ද

තමන් අත ඇති කල තමන්ට වාසිදායක සේ බෙදා ගැනීම ආදි වශයෙනි. සෑම මනුෂ්‍ය සමාජයක ම මේ කාරණය ගැන පොදු එකඟතාවක් ඇතැ යි කිව හැකිය.

අන්‍ය සත්ත්වයන් හා සසඳන කල මනුෂ්‍යයා තුළ ඇති මෙම චර්යා ධර්මය විශේෂතාව ආගමික ශාස්තෘවරුන් විසින් ද පෙන්වා දී තිබේ. ආගමික ශාස්තෘවරුන් ''ශික්ෂා පද'' යනුවෙන් දක්වා ඇත්තේ මනුෂ්‍යයන්ගෙන් අපේක්ෂිත චර්යා ධර්ම බව පෙනේ. ශික්ෂා පද අනුගමනය කරන්නෝ මෙලොව හා පරලොව සුගතියට පත්වෙති. නොකරන්නෝ දුගතිය ලබති. එබඳු චර්යා ධර්මයන් ක්‍රියාත්මක නොවන විලෝපන අවස්ථාවන් පිළිබඳ විස්තර ද ඇතැම් විට ආගමික සාහිත්‍යයන්හි දැකිය හැකිය. කලි යුගය - 'මුරුගසං වර්ෂාව' වැනි අවස්ථා උදාහරණ වේ.

සමාජය විසින් පිළිගැනුණු ප්‍රතිමාන හෙවත් චර්යා ධර්ම පද්ධතීන් බිඳ වැටුණු තත්ත්වය සමාජ විද්‍යාඥයන් හඳුන්වන්නේ අනෝමීය (Anomic) වශයෙනි. මෙම සංකල්පය පළමුවෙන් හඳුන්වා දුන් එමිල් දුර්බයිම් සිය **ස්වයං ඝාතනය** (Suicide) නම් ග්‍රන්ථයෙහි පළ කොට ඇති ඇතැම් අදහස් ආගමික ශාස්තෘවරුන්ගේ අදහස්වලට සමාන ය. තිරිසන් සතුන් හුදෙක් භෞතිකමය හෙවත් ශාරීරික අවශ්‍යතාවන් එක එල්ලේ ක්‍රියාත්මක කරන නමුත් මනුෂ්‍යයා ඔවුන්ගෙන් වෙනස් වන්නේ සිතා මතා ක්‍රියා කරන හෙයිනි යි කියන දුර්බයිම් මෙසේද පවසා තිබේ.

''බැහැරින් කිසියම් බලවේගයක් විසින් පාලනය නොවුණහොත් අපේ හැඟීම්වලට සීමාවක් නැත්තේ ය. එවිට එය ම වධයක් බවට පත් වේ. (එහෙයින්) අපේ තෘෂ්ණාවන් සීමා කළ යුතුව ඇත. ඒවා අපේ හැකියාවන් හා සුසංයෝගී කොට තෘප්තිමත්භාවය ලැබිය හැක්කේ එවිට පමණි. එහෙත් පුද්ගලයාට තම හැඟීම් තමා විසින් ම පාලනය කර ගැනීමේ හැකියාව නොමැති බැවින් එය ඔහුගෙ න් පරිබාහිර වූ බලවේගයක් විසින් කළ යුතුව තිබේ. එය ඔහු පැකිළීමකින් තොරව ගරු කරන අධිකාරීත්වයකින් සිදු විය යුතුය. පොදු සාමූහිකත්වයක් වශයෙන් හෝ ස්වකීය සංස්ථාවක් මඟින් හෝ මෙම කාර්යය සිදුකළ හැක්කේ සමාජයට පමණකි.''

දුර්බයිම් මෙහි ලා විශේෂයෙන් සඳහන් කරන්නේ සමාජයට පුද්ගලයා පාලනය කළ හැක්කේ පුද්ගලයා සමාජයේ විනිශ්චයට ගරු කරන තාක් පමණක් බවයි. ඔහු සමාජයේ විනිශ්චයට බිය නිසා නොව ගෞරවය නිසා කීකරු විය යුතු ය.'' යනු ඔහුගේ අදහසය.

මෙහි දී අපට සිහිපත් වන්නේ ගුත්තිල කාව්‍යයේ මූසිලට බඹදත් රජතුමා දෙන මේ ඔවදන ය.

| | |
|---|---|
| ඇතත් සිත | ආසා |
| තම දිවි රැකුම | උදෙසා |
| සිටි මව්පිය | ලෙසා |
| නොකිය බස් ගුරුවරුන් | වෙසෙසා |

ගුරුවරුන්ගේ සිත් නොරිදවිය යුතුය, ඔවුන් කෙරේ අත්‍යන්ත ගෞරවය දැක්විය යුතුය, යන සමාජ සාරධර්මයට අනුගත වන ලෙසටය රජතුමා මූසිලට කියන්නේ. එසේ නැතිව ඔහුට දඬුවම් කිරීමේ තර්ජනයක් නැත. ''මිනිසාගේ සුවිශේෂ වරප්‍රසාදය වන්නේ ඔහු අනුගත වන බන්ධනය ශාරීරික නොව සදාචාරමය එකක් වීමයැ'' යි පවසන දුර්බයිම් එයට මෙයද එක් කරයි.

''ඔහු තමන් මතට බලහත්කාරයෙන් ආරෝපණය වූ භෞතික පරිසරය විසින් පාලනය වනවා නොව තමන්ට වඩා උත්කෘෂ්ට වූ හෘදය සාක්ෂියකින් පාලනය වන්නේ ය. සමාජ සාරධර්මයන් චිත්තයෙහි තැන්පත් ව පවතින හෙයින් මනුෂ්‍යයාගේ චර්යාවන් ඒ අනුව ක්‍රියාත්මක වනු ඇත. සමාජයක උපදින දරුවන් ක්‍රමයෙන් හැදෙන වැඩෙන විට ඔවුන් සමාජානුයෝජනයට පත් වන්නේ මේ ''හොඳ නරක පිළිබඳ සංකල්ප ඔවුන්ගේ සිත්හි තැන්පත් කිරීමෙනි. මෙය ඍජු අවවාද ලෙසින් හෝ අන්‍යයන් නිරීක්ෂණයෙන් බැස ගන්නා නිගමන මඟින් සිදුවේ.

සමාජ සාරධර්මයන්හි වටිනාකම ප්‍රත්‍යක්ෂ වන්නේ ඒවා බිඳ වැටුණු අවස්ථාවක් ගැන මෙනෙහි කරන විටය. දුර්ඛයිම් විසින් අනෝමීය තත්ත්වයක් ලෙස පෙන්වා දී ඇත්තේ ඉහත කී සාරධර්ම මඟින් සමාජ පරිපාලනය සිදු නොවන්නා වූ ද හෘදය සාක්ෂියෙහි ග්‍රහණය ගිළිහී ගියා වූ ද අවස්ථාවකි. මෙබඳු තත්ත්වයන් ආර්ථිකය කඩා වැටීම් නිසා මෙන් ම ක්ෂණිකව විශාල බලයක් හෝ ධනයක් අත්පත් වීමෙන් සිදුවිය හැකිය.

දුර්ඛයිම් පෙන්වා දෙන්නේ එබඳු අවස්ථාවන්හි දී ''අවශ්‍යතා පරිපාලනය කළා වූ ප්‍රමිතීන්ට තව දුරටත් ඒ අයුරින් ම ක්‍රියාත්මක විය නොහැකි'' බව ය. ''කලින් පැවතුණු තුලනය බිඳ වැටී ගිය අතර නව තුලනයකට සැණෙකින් ස්ථාපනය විය නොහැකි ය. සියලු පරිපාලනයෝ කලකට නවතියි.... යුක්තිය කුමක් ද?, අයුක්තිය කුමක් ද? කියා හෝ සාධාරණ ඉල්ලීම් කවරේද? ප්‍රමාණාතික්‍රාන්ත ඉල්ලීම් කවරේද? යන විනිශ්චයක් නැත. මහජන මතයෙන් පාලනය නොවන තෘෂ්ණාවෝ සිය සීමාවන් කොතැන දැයි නොදනිති''

එසේ සමාජ ප්‍රතිමාණයන් නොමැති ව්‍යාකුලතාව රජයන යුගයක සිය දිවි හානි කර ගැනීම් බහුල වන බව දුර්ඛයිම් පෙන්වා දී තිබේ. එසේ පුද්ගල ආත්ම ඝාතනයට අමතරව සමාජය ද සිය සම්පත් විනාශ කර ගනිමින් ආත්ම හානියෙහි ද යෙදෙන බව පෙන්විය හැකිය.

දුර්ඛයිම්ගේ නිරීක්ෂණයන් කියවන විට බෞද්ධයෙකු තුළ නිතැතින් පැන නැඟෙන හැඟීමක් නම් ස්වයං විනය හා තෘෂ්ණාව පහ කර ගැනීම පිළිබඳව බුදුරජාණන් වහන්සේ දක්වා ඇති අදහස් හා සමඟ එම සමාජ විද්‍යාඥයාගේ සංකල්ප කෙතරම් එකඟ වන්නේ ද යන්නයි.

සමාජයේ පිළිගත් චර්යා ධර්මයන් කෙරේ සැලකිලිමත් විය යුතු අවධියක අප වෙසෙන බව කරුණු විමසා බලන ශ්‍රී ලාංකිකයෙකුට වැටහෙනු ඇත. අද සමාජයේ සිදු වෙමින් පවතින දෑ කිසියම් ප්‍රතිමාණ පද්ධතියක් මඟින් පාලනය නොවුණ හොත් අපට මහත් ව්‍යසනයකට ගොදුරු වීමට සිදුවනු ඇතැයි හැඟේ. ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම, ආර්ථික සංවර්ධනය සාධනය කර ගැනීම ආදී ප්‍රබල අවශ්‍යතා ඉටුකර ගැනීම පිළිගත් චර්යාධර්මයන්ට අනුගත ව සිදු විය යුතුය. අප අධිෂ්ඨානයෙන් ක්‍රියා කළහොත් මෙම පරීක්ෂණයෙන් සමත් වීමේ හැකියාව අප සතුව තිබෙන බව කිව මනා ය.

<u>*2004.06.26*</u>

# 20

# රූප කාය, නිර්මාණ කාය හා ගුණ කාය

මහාචාර්ය ජේ. බී. දිසානායක

පෙරදිග ශිෂ්ටාචාරය ගොඩ නඟාගැනීමට භාරතයත් චීනයත් පාදක වූයේ යම් සේ ද එසේම අපරදිග ශිෂ්ටාචාරය ගොඩ නඟාගැනීමට ග්‍රීසියත් රෝමයත් පාදක විණ. නූතන ඉතාලියේ අගනුවර බවට පත්ව ඇති රෝමය ඉතාලි ජාතිකයන් තමන්ගේ භාෂාවෙන් හඳුන්වන්නේ Lacitta eterna (ල චිත්තා එතෙර්නා) යනුවෙනි. එහි තේරුම - සදාතන නගරය - යන්නයි. අතීත ශ්‍රී විභූතියක ලක්ෂණ අදත් රෝම නගරයෙහි දක ගන්නට පුළුවන.

බටහිර ලෝකයට විශ්වවිද්‍යාල සංකල්පය හඳුන්වා දුන්නේ ඉතාලියයි. යුරෝපයෙහි ප්‍රථම විශ්වවිද්‍යාලය බිහි වුණේ ඉතාලියෙහිය. ඉතාලියෙහි වයඹ දිග පිහිටි බොලොඤ්ඤා (Bolongna) විශ්වවිද්‍යාලය එහි පැරණිතම විශ්වවිද්‍යාලය වශයෙන් සැලකේ. එය පිහිටුවන ලද්දේ ක්‍රිස්තු වර්ෂ 1200 දීය. මධ්‍යකාලීන යුරෝපයෙහි විසූ විද්‍යාර්ථීහු ඥානය සොයා යුරෝපයෙහි සතර දිග්භාග යෙන්ම බොලොඤ්ඤා විශ්වවිද්‍යාලයට ඇදී ආහ.

ඩාන්ටේ වැනි කවියනුත් කොපනිකස් වැනි විද්‍යාඥයනුත් ඥාන ගවේෂණයෙහි යෙදුණේ බොලොඤ්ඤා විශ්වවිද්‍යාලයෙහිය. යුරෝපයෙහි ශාස්ත්‍රාලෝකය පැතිරවීමට පුරෝගාමී වූ ඉතාලියට හෝ රෝම නගරයට ඔබ අද ගියහොත් එක් කරුණක් නිසා විස්මයට පත්වනු ඇත. එනම් ඒ රටෙහි අධ්‍යාපන අමාත්‍යාංශයක් දක්නට නොලැබීමයි. Ministry of Education යන ඉංගිරිසි නාමය Minisyero dell Educazione යනුවෙන් ඉංගිරිසියට පෙරළිය හැකි වුවත් එවැනි අමාත්‍යාංශයක් රෝමයෙහි නැතැයි ඔබට ඇදහිය හැකිද?

එහෙත් ඇත්ත එයයි. බටහිර ලෝකයෙහි පළමුවන විශ්වවිද්‍යාලය බිහිකළ ඉතාලියෙහි අගනුවර වන රෝම නගරයෙහි අධ්‍යාපන අමාත්‍යාංශයක් නැතැයි කීමෙන් අදහස් කෙරෙන්නේ එහි වර්තමාන අධ්‍යාපන කටයුතු පරිපාලනයකින් තොරව කෙරෙන බවක් නොවේ. ඒ කටයුතු පැවරී ඇත්තේ වෙනත් අමාත්‍යාංශයකට බවයි. ඒ අමාත්‍යාංශය ඉතාලි බසින් හැඳින්වෙන්නේ Ministero della publica Istruzione (මිනිස්තේරො දෙල්ලා පුබ්ලිකා ඉස්තෲත්සියෝනෙ) යන නමිනි. මෙයින් අදහස් කෙරෙන්නේ කුමක්ද? ඉතාලි ජාතිකයන් educazione යන පදයත් Publica istrutzione යන පදයත් සංකල්පමය වෙනසක් දකින බවයි. මේ වෙනස අප පාලනය කළ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් ද දැන සිටි බව පෙනේ. එදා කොළඹ පිහිටි අධ්‍යාපන දෙපාර්තමේන්තුව හඳුන්වන ලද්දේ Department of Public Instruction යන නමිනි. Public Instruction යන ඉංගිරිසි පදයත් Publica Istruzione යන ඉතාලි පදයත් - පොදු ඉගැන්වීම් - යනුවෙන් සිංහලයට නැඟිය හැකිය.

පොදු ඉගැන්වීම් යනු මුළු මහත් අධ්‍යාපනය නොව එහි එක් කොටසක් පමණක් බව ඔවුහු දැන සිටියහ. අද පාඨශාලාවලත් විද්‍යාලවලත් විශ්වවිද්‍යාලවලත් කෙරෙන්නේ ඒ ඒ ක්ෂේත්‍රවලට අදාළ දැනුම් සම්භාරයක් දීම පමණකි. වෛද්‍ය විද්‍යාව, ස්වභාව විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, නීති විද්‍යාව, සමාජයීය විද්‍යා, මූල්‍ය කළමනාකරණය යනාදි දහසකුත් එකක් විද්‍යා ශාස්ත්‍රවලට අදාළ පොදු

ඉගැන්වීම් මේ ආයතනවල සිදුවෙමින් පවති. ඒ ඒ විෂය ක්ෂේත්‍රවලට අදාළ අලුත් දැනුමෙන් මේවායෙන් ඉගෙනුම ලබන්නෝ දැනුවත් වෙති. ඒ දැනුම සමාජයට අත්‍යවශ්‍ය වන්නකි.

එහෙත් මේ ඉගැන්වීම් Education යන පදයෙන් හඳුන්වන්නට ඉතාලි ජාතිකයා මැලිවන්නේ අධ්‍යාපනයත් පොදු ඉගැන්වීමත් අතර සංකල්පමය වෙනසක් දකිනා බැවිනි. මේ වෙනස හඳුනා ගැනීම අද විශ්වවිද්‍යාල උපාධියක් ලබා සමාජයට පිවිසෙන ඔබට වැදගත් වනු ඇතැයි මට සිතේ. Educaztione යන පදය ඔවුන් යොදන්නේ - හැදිච්චකම - යන අර්ථයෙනි. සමාජයට අහිතකර චරිත ලක්ෂණ ඇති කිසියම් පුද්ගලයෙකු හැඳින්වීමට ඔවුන් යොදන්නේ un uomo senza educaztione යන වහරයි. එහි අර්ථය - අධ්‍යාපනයක් නැති එකා හෙවත් - නැහැදිච්ච එකා යනුවෙන් සිංහල ජන වහරට නැඟිය හැකිය.

සිංහල ගැමියා කිසියම් පුද්ගලයෙකු නැහැදිච්ච එකෙකු වශයෙන් හඳුන්වන්නේ ඒ පුද්ගලයා සතු විෂය ඥානය අනුව නොවේ. ඒ පුද්ගලයා සතු උපාධි හෝ සහතිකපත් බලා ද නොවේ. හුදෙක් ඒ පුද්ගලයා සතු චරිත ලක්ෂණ දෙස බලායි. කිසිවෙකුගේ චරිත ලක්ෂණ වැඩි දියුණු වන්නේ ඔහු ලබා ගන්නා විෂය ඥානයෙන් නොව ශික්ෂණයෙන් ය. විෂය ඥානයෙන් පරිපූර්ණ මිනිසෙකුට ශික්ෂණයක් ද ලැබුණ හොත් ඒ පුද්ගලයා හුදෙක් උගතෙකු හෝ බුද්ධිමතෙකු පමණක් නොව ප්‍රාඥයෙකු බවට ද පත් වේ.

මෙලොව උපදින හැම කෙනෙකුට ම කායත්‍රයක් ඇතැයි මම සිතමි. ඒ ත්‍රිකාය හැඳින්වීමට රූප කාය, නිර්මාණ කාය හා ගුණ කාය යන පද යොදන්නට මම කැමැත්තෙමි. රූප කාය යනු කිසිවෙකු සතු කායික හැඩ රුවයි. නිර්මාණ කාය යනු යම්කිසි නිර්මාණයක් කිරීමට කිසිවෙකු සතු කුසලතාව හෝ ප්‍රතිභා ශක්තියයි. ගුණ කාය යනු කිසිවෙකු සතු චරිත ලක්ෂණ අනුසාරයෙන් උපදින ගුණ සම්භාරයයි. හැම පුද්ගලයෙකු කෙරේම මේ කායත්‍රය අඩු වැඩි වශයෙන් පිහිටා තිබේ.

බුදුන් වහන්සේ අනන්‍යසාධාරණ වූ රූප කායකින් ද ගුණ කායකින් ද හෙබි පුද්ගලයෙකු සේ බෞද්ධයන්ගෙන් පිදුම් ලබති. කුස රජතුමා රූප කායෙන් අඩු වුවත් නිර්මාණ කායෙන් ද ගුණ කායෙන්ද හෙබි පුද්ගලයෙක් විය. ඔහු නිර්මාණය කළ කාන්තා ප්‍රතිමාව කොතරම් තාත්වික වී ද කිව හොත් ඒ දුටු කුදිය ඒ සැබෑ ගැහැනියකැයි වරදවා තේරුම් ගෙන ඊට පහර දුන්නා ය. ඔහු බෝධිසත්වයෙකු සතු ගුණ කායකින් ද යුක්ත වූවෙකි.

නිර්මාණ කාය වැඩි දියුණු වන්නේ විෂය ඥානයට එක් වන ප්‍රතිභාව නිසා ය. ප්‍රතිභාව යනු පූර්ව ජන්මයකින් තමාට උරුම වන්නක් වශයෙන් සලකනු ලැබේ.

මෙය වාසනා යන පදයෙන් ද සාහිත්‍ය විචාරයෙහි හැඳින්වේ. විද්‍යාඥයා මෙන් ම කලාකරුවා නිර්මාණ කාය වැඩි දියුණු කොට ගත් පුද්ගලයෝ වෙති.

සිය නිර්මාණ කාය දියුණු කොට ගත් විද්‍යාඥයෝත් කලාකරුවෝත් අද අප අතර සිටිති. චන්ද්‍රිකාවක් නිර්මාණය කළ ආතර් සී.ක්ලාක් මහතා අනූපම නිර්මාණ කායක් ඇති විද්‍යාඥයෙකි. නාද රටා අපූර්ව සංයෝගවල යොදමින් සංගීත ඛණ්ඩ බිහි කරන අමරදේවයෝත් කේමදාසයෝත් අපූර්ව නිර්මාණ කායකින් යුක්ත වන්නාහ. වර්ණ අපූර්ව සංයෝජනයෙහි යොදමින් තිලක් අබේසිංහයනුත් සෝමබන්ධු විද්‍යාපතීනුත් මවන ලෝකය ආස්වාදනීය වෙයි. අභිනයෙන් කුසලතා දක්වන පණිභාරතයෝත් චිත්‍රසේනයෝත් නිර්මාණ කායෙන් පිරිපුන්ය. භාෂාවෙහි එන වචන

නිර්මාණ කාර්යයෙහි යොදන්නෝ කවියන් ඇතුළු සාහිත්‍යකාරයෝය. ගුණදාස අමරසේකර මහතා අද මේ විශ්වවිද්‍යාලයෙන් සම්මාන ලබන්නේ එතුමා සිය නිර්මාණ කායෙන් දක් වූ විශිෂ්ටතා නිසා ය. වෘත්තියෙන් දන්ත වෛද්‍යවරයෙකු වන ඔහු දන්ත වෛද්‍ය විද්‍යාව පිළිබඳ විෂය ඥානයක් ඇත්තෙකි. එහෙත් ඔහුගේ නිර්මාණ කාය දන්ත විද්‍යාවෙන් ඔබ්බට විහිදුණකි. උයනක හිඳ ගී ලියන්නට පමණක් නොව ගනඳුරු මැදියම අරුණලු දකින්නටත් ඔහු යොමු කළේ ඔහුගේ නිර්මාණ කායයි.

මිනිසෙකු සතු මේ කායත්‍රයෙන් මා වඩාත් විශිෂ්ට කොට සලකන්නේ ඔහුගේ ගුණ කායයි. කෙනෙකුගේ රූප කායත් නිර්මාණ කායත් මානව වර්ගයාගේ හිත සුව පිණිස යොදාගත හැක්කේ අසාමාන්‍ය ගුණ කායක් ඇත්තෙකුට පමණක් බැවිනි. මානව වර්ගයාට සෙත සැලසූ ආගමික නායකයෝ අනූපම ගුණ කායකින් හෙබියෝ වූහ. ඔවුහු ස්වකීය නිර්මාණ කාය මානව වර්ගයාගේ හිත සුව පිණිස යෙදූහ.

රූප කාය මෙන්ම නිර්මාණ කාය ද මිනිසාගේ අර්ථයට මෙන්ම අනර්ථයට ද යොදා ගත හැකි ය. තමාගේ රූප කාය පාරිභෝගිකයන්ට හෝ අතිශයින් වැඩිහිටි චිත්‍රපටවලට හෝ විකුණන ගැහැනිය කොතරම් නිර්මාණාත්මක වුවත් ගුණ කායෙන් හීන පුද්ගලයෙකු සේ මම දකිමි. පරිගණක යන්ත්‍රයෙහි මෘදුකාංග අතරට වයිරසයක් ඇතුළු කරන පරිගණක ශිල්පියා සිය නිර්මාණ ශක්තිය මිනිසාගේ අනර්ථය උදෙසා යොදන්නෙකි. සමාජයට අහිතකර වෙළෙඳ භාණ්ඩයක් නිෂ්පාදනය කරන ව්‍යාපාරිකයාත් ඔහුගේ භාණ්ඩය විකුණා දීමේ එකම චේතනාවෙන් වෙළෙඳ දැන්වීම් සැලසුම් කරන ශිල්පියාත් මට පෙනෙන්නේ සූක්ෂම නිර්මාණ කායක් ඇතත් ගුණ කායෙන් හීන පුද්ගලයන් වශයෙනි.

භාෂාවේ වචන ද හොඳට මෙන්ම නරකට ද යොදා ගත හැකිය. කොතරම් අලංකාර ලෙස කාව්‍යෝක්ති නිර්මාණය කළත් ගැයෙන කවියකින් දෙන පණිවිඩය රසිකයාගේ හිත සුව පිණිස නොවේ නම් මම එවන් නිර්මාණ අගය නොකරමි. ස්වකීය රූප කාය මෙන්ම නිර්මාණ කාය ද බහු ජන හිත පිණිසත් බහු ජන සුඛ පිණිසත් යොදන්නා ගුණ කායෙන් ද අග තැන්පත් අසාමාන්‍ය මනුෂ්‍යයෙකි. අද උපාධි ලබාගෙන ජන සමාජයට පිවිසෙන ඔබ ගුණ කායෙන් ද හෙබි පුද්ගලයෙකු වනු දැකීම මගේ එක ම අපේක්ෂාවයි; එකම ප්‍රාර්ථනාවයි.

<u>2004.06.26</u>

# 21

# පූර්වැසිභාවය සඳහා විද්‍යාව

## මහාචාර්ය ආර්. ඕ. බී. විජේසේකර

වත්මන් පුරවැසියෙකුගේ ජීවිතයේ මතුවී පෙනෙන ප්‍රධාන සාධකයක් වන්නේ විද්‍යාවයි. විද්‍යාව මෙතරම් බලවත් සහ බලපෑම් මීට ඉහත කවදාවත් කර නොමැත. එසේ වුවද ලොව දුප්පත්කමින් වැඩි පුරවැසියන් වැඩි දෙනෙකුට එය ආගන්තුක දෙයකි. එහි යහපත් බලපෑම් ඔවුනගේ ජීවිතයට ළං වී නොමැති තරම්ය. එම නිසා ගෝලීය කෝණයෙන් බලන කල ප්‍රශ්නයක් අසනු ලබයි... **ඇයි විද්‍යාව?** මෙයට පිළිතුරු දීමට කෙනෙක් එක් දෙයක් තේරුම් ගත යුතුයි... **විද්‍යාව යනු කුමක්ද?** මිනිසාට තමාගේ පරිසරය සහ ඇති සහජීවන සබඳතාව සහ තමා තුළ නිතැතින් ඇති වන කුතුහලයයි. තමාට අවශ්‍ය ආහාර සහ නිවහනක් ලබා ගැනීමට පෙළඹීම ඒ ගැන සොයා බැලීමට මූලික වූ ගාමක බලවේගයයි. ස්වාභාවික සංසිද්ධීන් තුළ ඇති පුදුම එළවන කරුණු ඔහුගේ දැනුම පදනම පුළුල් කිරීමට හේතු විය. ලෝක ස්වභාවය, විශ්වය සහ ඉන් එහා ගැන ඇති දර්ශනවල ආරම්භයත් එයයි. මිනිසා හැම විටම දැනුම සොයා යන්නෙක් විය. ඔහු තුළ ස්වභාවයෙන්ම පිහිටි ලක්ෂණයක් විය. මගේ පෞද්ගලික අත්දැකීමකින් මෙය පැහැදිලි කිරීමට ඉඩ දෙන්නඃ

*සිව් වසරක් වයසැති මාගේ මුනුබුරා දඟකාරව හැසිරෙන විට ඔහුට කියන ලද්දේ (ඔහුගේ වැඩිහිටියකු විසින් අවවාදාත්මක නොවන) දෙවියන් වහන්සේ ඉහළ අහසේ සිට ඔහු දෙස බලා සිටින බවයි. එවිට පුතා, විශ්වාසයෙන් යුතුව අම්මාගෙන් විමසා සිටියේ ඉහළ අහසේ සිට ඔහු දෙස දෙවියන් බලා සිටීම ගැටලුවක් බවයි. ඔහුට පොළව මතට පැමිණීමට බැරි ඇයි? එම නැඹුරුවෙන්ම ඔහු අම්මාගෙන් ඇසුවේ දෙවියන් වහන්සේ මොන පාටද? වෘත්තියෙන් තොරතුරු විද්‍යාඥවරියක වූ මගේ දුව හොඳටම ව්‍යාකූල තත්ත්වයට පත් වූවා ය. පුතා, ඇයි ඔබ එහෙම අසන්නේ, ඇ විමසුවාය. හොඳයි පොඩි පුතා උත්තර දුන්නේ, අපට ඔහුව දැකිය නොහැකි නම්, එලෙසම ඉහළ අහසේ සිටී නම් ඔහු එක්කෝ නිල් පැහැ විය යුතුය. නැතිනම් කළු පැහැ විය යුතුයි. දිවා කාලයේ අහස නිල් පැහැ නිසා අපට ඔහුව දැකගත නොහැකි ය. රාත්‍රියේ අහස කළුවර නිසා තවදුරටත් ඔහුව දැකගත නොහැකි ය. ඉන් පසු කුඩා දාර්ශනිකයා තවදුරටත් එකතු කළේ ''මම හිතන්නේ ඔහු නිල් පාටයි'' යනුයි. මක්නිසාද යත්, රාත්‍රි කාලයට කළුවර ඉහළ සිට නොපෙනේ. නිල්පාට දිවා රාත්‍රි දෙකටම නොපෙනේ.*

එම නිසා නිරීක්ෂණය, කුතුහලය, යම් නිගමනවලට පැමිණීම සහ සංකල්ප ගොඩ නැගීම මිනිසාගේ සහජ ස්වභාවය විය. විද්‍යාව ගොඩනැගීමට හේතු වූ කොටස් ඒවා විය.

පරිසරයේ ස්වභාවය ගැන මිනිසාගේ මුල් අවධියේ ගවේෂණ, ලෝකයේ සහ විශ්වයේ ස්වභාවය ගැන විමර්ශනාත්මක සිතීම මුල් අවධියේ ආගම් දර්ශනවලට හේතුවිය. එම දර්ශන සහ සංකල්ප වලින් පුළුල් පරාසයක් ආවරණය විය. ඒවා අතර ජ්‍යෝතිෂය සහ තාරකා විද්‍යාව (පසු කී දේ විද්‍යාව බලහත්කාරයෙන් පැහැරගෙන යාම) මෙම ගවේෂණාත්මක ස්වභාවය සාගර සහ මහද්වීප සොයා ගැනීමට හේතු විය. සුළඟට සහ දියරැලට **අදාළ අතිපුරාණ විද්‍යාව** ලෝකයේ බලවත්කම, ගෞරවය සහ ආර්ථික බලපෑම්වලට හේතු විය. මේ අතර නිරතුරුවම පරිසරය මිනිසාගේ තදබල නිරීක්ෂණයකට භාජන විය. මක්නිසාදයත්? මිනිසාට අවශ්‍ය ආහාර, ඇඳුම්, පැළඳුම්, නිවහන පමණක් නොව ඖෂධ

වර්ගද සපයා ගන්නේ අවට පරිසරයෙනි. සොබාදහම ගැන කරන ලද මෙම ගවේෂණයම, විද්‍යාව, විද්‍යාත්මක දැනුම සහ කෘෂිකර්මයට උපත දෙන ලදී. දැනුම ලබා ගන්නා විද්‍යාත්මක ක්‍රම ක්‍රියාත්මක විය. අප අද හඳුන්වන විද්‍යාත්මක දැනුම් සම්භාරය ලබා ගන්නේ මෙම ක්‍රමවලිනි. විද්‍යාත්මක ක්‍රම, නිරීක්ෂණය සහ සංකල්ප ඔබ්බට ගියේය.

එය පර්යේෂණ කිරීමේ සංසිද්ධිය බිහි කරන කළේය. නිරීක්ෂණය, අත්හදා බැලීමේ නිරීක්ෂණවලට පත්විය. සිද්ධාන්ත, සංකල්ප ගොඩනැගීම, මෙම සිද්ධාන්තවල නිවැරැදිභාවය ගැන සොයා බැලීම, තවදුරටත් පර්යේෂණ කිරීම, ස්වභාවය ගැන නීති සකස් කිරීම ආදී මේ සියලු ක්‍රියාවන් ක්‍රමානුකූලව සිදුවිය. විද්‍යාත්මක ක්‍රමවලින් විද්‍යාත්මක දැනුම ලබාගැනීම, එකතු කිරීම සහ කාලයක් තිස්සේ ගොඩනැගීම මෙම කවය නිසා සිදුවිය.

දැනුම ලබා ගත හැකි එකම ක්‍රමය මෙය යැයි මොහොතකටවත් තේරුම් නොගත යුතුය. පිළිගත් ජීව විද්‍යාඥයෙකු වන ශ්‍රීමත් පීටර් මෙඩවොර් FRS, විද්‍යාත්මක සිතුවිලි ගැන ප්‍රවිෂ්ටය සහ සහජඥානය මැයින් ලියන ලද ඔහුගේ ආනන්දජනක ග්‍රන්ථයේ මෙසේ සඳහන් කර ඇත.

*'විද්‍යාඥයෙකුගෙන් අහන්න ඔහු සිතාගත් විද්‍යාත්මක ක්‍රමය කුමක්ද යන්න, ඔහු මහත් ගම්භීර බවක් සහ කපටි බැල්මක් මවාගනී. ගම්භීර යනු - ඔහු යම් මතයක් ප්‍රකාශ කළ යුතු යැයි සිතීමයි. කපටි බැල්මක් යනු මක්නිසාද යත්? ඔහුට මතයක් නැතැයි සඟවා ගැනීම කළ යුත්තේ කෙසේද යන්න ගැන සිතන විටය.'*

මේ නිසා බොහෝ විද්‍යාඥයන් ක්‍රමවේද ක්‍රියාත්මක කළත්, විද්‍යාත්මක ක්‍රමය ගැන ඔවුන් සියලුදෙනාම තුළ දැනුමක් තේරුමක් නැත. දර්ශනය ගැන සලකා බලන විට මීට හාත්පසින්ම වෙනස් දෙයක් පවසයි. විද්‍යාවේ අප දන්නා පර්යේෂණ ක්‍රම මඟින් එහි හරි වැරදි බැලිය නොහැක. මෙම හේතුව නිසා ප්‍රායෝගික විද්‍යාවේ සීමාවන්ගෙන් ඔබ්බට යෑමට දර්ශනය සමත් වෙයි. එසේ වුවද, මිනිසාට සහ ඔහුගේ පරිසරයට අඩු මට්ටමක ප්‍රායෝගික වැදගත්කමක් ඇති හුදු සංකල්පමය වටිනාකමකින් යුතුව දර්ශනය පවති. එසේ වුවද අද දක්වාම මිනිසා සහ පරිසරය අතර ඇති පොළොඹවන සහජීවනය, නව දැනුම සොයා යෑමට ගිජු කමක් දක්වයි. මෙය අවශ්‍යතාව අනුව හෝ තණ්හාව නිසා සිදුවෙයි.

මෙම ආශාවම, විද්‍යාව සහ එහි ගවේෂණයේ ඉදිරි ගමන් බලවේගයයි. ජීවිතය යනු වැළැක්විය නොහැකි ගවේෂණ මාලාවකි. මේ නිසා මිනිසා සත්ත්ව විශේෂයක් ලෙස තිරසාර පැවැත්මට, විද්‍යාව සහ විද්‍යාත්මක දැනුම සම්භාරය දායක වෙයි. එලෙසම එය භයානක ප්‍රතිඵල දීමට පුළුවන. මේ ගැන පසුව කරුණු ඉදිරිපත් කරමි.

ප්‍රතිචාරයක් දැක්විය යුතු තවත් ප්‍රශ්න දැන් මතුවෙයි: මිනිස් වර්ගයාට විද්‍යාව අවශ්‍ය ඇයි? විද්‍යාව කුමක් සඳහාද? විද්‍යාව කා සඳහා ද? මේවා ගැන අපි තතු සොයමු.

ඇත්ත වශයෙන්ම අද විද්‍යාව වත්මන් ලෝක සංස්කෘතියේ කොටසකි. වත්මන් විද්‍යාව ලෙස එහි නියම ආරම්භය සිදුවූයේ යුරෝපයේ කාර්මික විප්ලවයෙන් පසුවය. එයට සමගාමීව නිව්ටන්ගේ භෞතික නීති සොයාගැනීම, රොබට් බොයිල්ගේ රසායන විද්‍යාව නීති සොයා ගැනීම සිදුවිය. එලෙසම විවිධ සංගම් බිහි වීම: එංගලන්තයේ රාජකීය සංගමය, ප්‍රංශයේ Academia Royale des Science, යුරෝපයේ බිහිවුණ සංවිධානාත්මක සංගම් ආරම්භ විය. මෙම නව ආයතනවලට පළමුවන

චාල්ස් සහ දාහතර වන ලුවී රජු වැනි පාලකයන්ගේ අනුග්‍රහය ලැබිණ. වත්මන් ජීව විද්‍යාව, චාල්ස් ඩාවින්ගේ සත්ත්ව පරිණාම සිද්ධාන්තය වැනි දේ ඉදිරිපත් කිරීමට මාර්ගය පෑදුවේ භෞතික සහ රසායන විද්‍යාවයි.

දොළොස් වන සියවසේ සොයාගත් කරුණු මිනිසා කෙරෙහි විශාලතම බලපෑමක් ඇති කළේය. ගොඩබිම සහ මුහුදේ ස්වාභාවික සම්පත් පිළිබඳව කරන ලද පර්යේෂණ, මිනිසාගේ යහපත සඳහා යොදාගත හැකි දැනුම් සම්භාරයක් විය. පුරාතන මිනිසා තමාගේ ඖෂධ ලෙස යොදා ගත් ශාක ද්‍රව්‍ය හැඳෑරීමෙන් චිකිත්සක සාධක පිළිබඳව විප්ලවයක් ඇති කළේය. එතැන සිට කෘත්‍රිම (සංශ්ලේෂක) රසායන විද්‍යාව ආරම්භ වූ අතර, සොබා දහමේ අණු, නිර්මාණය කර රසායනාගාරයක් තුළ නිපදවීමට මිනිසාට හැකි විය. සංශ්ලේෂක පොලිමර් වර්ග වත්මන් දිවිය විප්ලවයකට ලක්කර ඇත. පරිගණකයේ සිට ස්ත්‍රියකගේ ඇඳුම් දක්වා සෑදිය හැකි කෘත්‍රිම ද්‍රව්‍ය දැන් බිහිවී ඇත. මිනිසා සාදන ලද කෘත්‍රිම ග්‍රහයන්ගේ උපකාරයෙන් සුළඟ සහ දියරැලි හදාරා නිවැරදි කාලගුණ දත්ත නිකුත් කිරීමට හැකියාවක් ඇත. ගමනාගමනය, ප්‍රවාහනය සහ සන්නිවේදනය අප රට තුළ පවා නිදහස ලැබූ අඩසිය වසකට පෙර පැවැති තත්ත්වයට වඩා විශාල ලෙස වෙනස් වී ඇත. විද්‍යාව සහ විද්‍යාවට අදාළ තාක්ෂණ ක්‍රමවේද, අප ජීවන රටාව යළිත් ආපසු හැරවිය නොහැකි මට්ටමකට ළඟා කර ඇත. ලෝක ගෝලයේ ඈත පිටිසර ප්‍රදේශවල ජීවත්වන පුරවැසියන්ගෙන්, පරිගණක, ජංගම දුරකථන, රූපවාහිනිය සහ වත්මන් පහසුකම් නැතිව ජීවත් විය හැක්කේ කී දෙනෙකුටද?

මෙම හැම දෙයක්ම නියෝජිතයා වන්නේ විද්‍යාවයි. ලෝකයේ පුරවැසියන් වන අපට විද්‍යාව නොමැතිව ජීවත්විය නොහැකියි. පැහැදිලිවම ආර්ථිකයේ බලවත් බව තීරණය කරන සාධකය විද්‍යාව වන අතර සියලු පුරවැසියන්ගේම ජීවන මට්ටම රඳා ඇත්තේ විද්‍යාව තුළය. පොහොසත් සහ දුප්පත් ජාතීන් අතර ඇති විශාල වෙනස්කම්, විද්‍යාව සහ තාක්ෂණයට සමාන්තර වෙයි.

එසේම තවත් ගුණාංග තුනක් ඇත. මෙය විද්‍යාව නිසා කෙලින්ම ලැබෙන ප්‍රතිලාභ වන අතර ඒවා අනතුරු සංඥා නිකුත් කරයි.

පළමුවෙන්ම අප දන්නා තරමට විද්‍යාව සහ එහි මූලික ප්‍රතිලාභ ලෝකයේ දුප්පත්ම රටවලට තවමත් ලැබිය යුතුවේ. දියුණුවේ වැඩියෙන්ම පවතින ලෝකයක සහ ආහාර සැපයුම විශාල වශයෙන් ඇති කලක, ලොව ජනගහනයෙන් මිලියන 840 ක් පමණ දෙනා තවමත් කුසගින්නෙන් සහ මන්දපෝෂණයෙන් පෙළෙති. ලෝක ආහාර සංවිධානය පෙන්වා දෙන අයුරු මෙම සංඛ්‍යාවෙන් මිලියන 799 ක්, සංවර්ධනය වෙමින් පවතින රටවල ජීවත්වන අතර, විද්‍යාවේ ප්‍රතිලාභ ඇති බවක් පෙන්නුම් කරන්නේ අල්ප වශයෙනි. විදුලිය සහ වෙනත් වත්මන් ශක්ති ප්‍රභව සමාජයේ ඉහළ සමෘද්ධිමත් කොටස්වලට ලැබී තිබුණද, මේවා ලොව ජනගහනයෙන් පුරවැසියන් විශාල කොටසකට තවමත් ලැබිය යුතු වෙයි.

ජලය, සෞඛ්‍ය පහසුකම් සහ සමාජ ප්‍රතිලාභ ගැන සැලකීමේදී මෙහි තත්ත්වය ඉහත සඳහන් පරිදි වෙයි. ලෝක ජනගහනයෙන් 15% පමණ කොටසක් විද්‍යාවේ ප්‍රතිලාභ 85% තරම් ප්‍රමාණයක් භුක්ති විඳිති. පොහොසත් සහ දුප්පත් රටවල දකින්නට ඇති ආර්ථිකමය බෙදීම, විද්‍යාවෙන් කෙලින් හෝ වක්‍රව සිදුවුණ දෙයකි.

දෙවනුව, විද්‍යාව නිසා අපරාධවල දරුණු බව වැඩි වී ඇත. දුප්පත් සහ පොහොසත් රටවල් නිරතුරුවම මෙම භයානක තත්ත්වයෙන් වෙළී ඇත. ත්‍රස්තවාදය යනු අතීත වශයෙන් ගෝලීය

ප්‍රශ්නයකි. මෙහි භයානකකම රැඳී ඇත්තේ එය පාලනය කිරීමට ඇති දේශපාලන දෙගිඩියාවයි. ත්‍රස්තවාදය නිසා දුප්පත්ම කොටසට ඇති බලපෑම ගැන ලැබෙන්නේ අල්ප අවධානයකි. පොහොසත් රටවල් ඉන් ආරක්ෂා වීමට පියවර ගනී.

තුන්වනුව, ස්වයං මහත් විනාශකාරී යතුරු තුනක් විද්‍යාව ලබාදී ඇත. න්‍යෂ්ටික බලයේ විනාශකාරී බව, ජීව තාක්ෂණයේ ජිනෝම් අදාළ කරුණු සහ සෛල පර්යේෂණ එම යතුරු තුනයි. මෙම අන්තරායදායක අංශයන් සලකා බැලීමේදී අපේ සැප පහසුකම් ගැන ලැබෙන්නේ බිංදුවකි. විද්‍යාව සහ දේශපාලන අන්තර් තලය මේ සඳහා වගකිව යුතුය: මේ නිසාම අනාගත විද්‍යා අධ්‍යාපනයේ වැදගත්කම ගැන තර්ක කළ හැකිය. හැම අංශයක්ම පුරවැසිභාවයට සහ නායකත්වයට එල්ල කළ අධ්‍යාපනයයි. මෑතකදී සිදු වූ සිදුවීම් ගැන සලකා බැලීමේදී. මෙම තීරණාත්මක විෂය සම්බන්ධයෙන්, විද්‍යා අධ්‍යාපනය ආචාර ධර්ම සහ සදාචාරයට සම්බන්ධ කළ යුතුය. මෙය වඩාත් නිත්‍යානුකූල බව සාමාන්‍ය පුරවැසියන්ට පෙනී යනු ඇත. ඔවුන්ගේ අවශ්‍යතාවන්ට සහ ඕනෑ එපාකම්වලට අනුකූල ලෙසත් පිළිගත යුතුය.

මහජනතාවට විද්‍යාව තේරුම් ගැනීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයවල සහ පාසල්වල විද්‍යා විෂය ඉගැන්වෙන්නේ කෙසේද යනුවෙනුත් සලකා බැලිය යුතුය.

එම නිසාම ප්‍රශ්නයක් අසනු ලබයි: *කවුද උගන්වන්නේ? උගන්වන්නේ කුමක්ද? කාටද උගන්වන්නේ?*

අට හැවිරිදි දරුවෙක්, විශ්වය ගැන, කාලගුණය ගැන, පරිණාමය, ද්‍රව්‍ය සහ ඛනිජ ද්‍රව්‍ය, ශාක සහ සත්ත්වයන් ගැන, ප්‍රශ්න කරයි නම්, එම අට හැවිරිදි දරුවාට තේරුම් ගැනීමට හැකි අයුරින් ඒවා ගැන විස්තර කියා දීමට ගුරුවරයා සමත්විය යුතුය. මෙහි තේරුම විෂය මාලාව, ගුරු පුහුණු කිරීම, උගන්වන ක්‍රමවේදය, මාධ්‍ය සහ ද්‍රව්‍යය, නව පරපුර සඳහා කේන්ද්‍ර කොටගත යුතුය. ඒ පරපුර නව සහශ්‍රයේ විද්‍යාත්මක හැඩ ගැසීම තුළ හැදි වැඩී ඇත. මීට අමතරව අවම සරසවි විෂයමාලාවක් ස්ථාපනය කළ හැකිද? සත්‍ය සහ පැහැදිලි බව ගැන ගැඹුරින් කැපවී අවධානය යොමු කළ හැකි විද්‍යාඥයන් සොයා ගත හැකිද? මෙය කළයුත්තේ ස්වාභාවික සංසිද්ධීන් නම් ආකුල ජාලයේ යම් ක්‍රමවත් බවක් නිරවුල් බවක් සොයා ගැනීම පිණිස ලැබිය හැකි සෑහීමකට පත්වන වින්දනයක්, තෘප්තියක් ලැබීම සඳහා පමණිද?

සුප්‍රසිද්ධ ඇමරිකානු භෞතික විද්‍යාඥයෙකු වන මහාචාර්ය අයි. අයි. රාබිගේ වචන කිහිපයක් සඳහන් කරන්න ඉඩ දෙන්න.

*''මගේ විශ්වාසය නම් පාසල්වල සහ විශ්වවිද්‍යාල තුළ විද්‍යාව ඉගැන්විය යුත්තේ ශිෂ්‍යයන්ට විද්‍යාව යනු කුමක්දැයි අවබෝධ කර ගැනීම පිණිසය. මිනිසා සතු අත්දැකීම් නම් දැනුම් සම්භාරය, දායාදය සහ තමාගේ පරිසරය සමඟ ඇති සහජීවන සම්බන්ධතාව ගැන යම් අල්පමාත්‍ර දර්ශනයක් ඔවුන්ට දැනගැනීමට හැකි වීමටය. අප අවට සිදුවන විශාල වෙනස්වීම්, අතිශයින්ම ව්‍යාකූල තාක්ෂණ ක්‍රමවලින් සොයා ගන්නා නව දේ ආදි මිනිසාගේ අත්දැකීම් ගැන යම් අවබෝධයක් ලබා ගැනීමටය.''*

විද්‍යාව පිළිබඳව මහජන අවබෝධය ප්‍රවර්ධනය කිරීමට විද්‍යාව ඉගැන්විය යුත්තේ කෙසේද යන්න වැදගත්ය. මම විශ්වාස කරන්නේ, ඔවුන් විසින්ම විද්‍යාත්මක විමසීම් මඟින් විද්‍යාව හොඳින් ඉගෙන ගත හැකි බවයි. ඔවුන් ඉගෙන ගන්නා විද්‍යාව, ඔවුන්ගේ ජීවිත සමඟ සම්බන්ධ කළහැකි

නම් එයට ඔවුන් වඩාත් ඇල්මක් දක්වනු ඇත. එවිට එය අමතක නොවන අත්දැකීමක් විනා කට පාඩම් කළ යුතු දෙයක් නොවනු ඇත. විශ්වවිද්‍යාල සහ පාසල් අතර අන්තර් සම්බන්ධතාවක් ගොඩනැගිය යුතුය. උදාහරණයක් ලෙස, ඉතිහාසය, භූගෝල විද්‍යාව, භාෂාවන් කලා සහ සාහිත්‍ය වැනි අංශ ගැන විද්‍යාත්මක ගවේෂණ කළ යුතුය. පර්යේෂණවලින් අලුත් සංකල්ප සහ කරුණු හෙළි වනවිට පරණ සහ වැදගැන්මක් නැති දේ ඉවත දැමිය යුතුය. මේ ආකාරයෙන් කටයුතු කරන විට නව දර්ශනයට සහ දැනුමට ශිෂ්‍යයන් ප්‍රතිචාර දක්වනු ඇත.

විද්‍යාව සහ තාක්ෂණය විසින් ජනිත කරන ධනය සහ බලය ලුහුබැඳ යාමේ උන්මාදය සමඟ යම් ඒකඟතාවකට එළඹිය යුත්තේ, විද්‍යාඥයන් විසින්ම ඔවුන්ගේ වැළැක්විය නොහැකි පොදු කටයුතු සමඟ කරන සටනට මුහුණ දෙන ආකාරයටය, වටිනාකම සහ ඉලක්ක ගැන ඔවුන් අදාළ සැලකිල්ලක් දැක්විය යුතුය.

විද්‍යාව නමැති සමූහ ආණ්ඩුව ජාත්‍යන්තරය, එහි ස්වභාවයෙන්ම උත්කෘෂ්ඨය. එහි සාකච්ඡා සංවාදවලට සහභාගිවිය හැක්කේ විද්‍යාඥයන්ට පමණි. එය පාලනය කළ හැක්කේ ද ඔවුන්ට පමණි. එසේ වුවත් මා කලින් පෙන්වාදුන් අයුරු එයින් ලැබෙන විද්‍යාව සහ තාක්ෂණය, ආර්ථික බලයේ සහ ගෝලීය සමෘද්ධියේ පදනම වෙයි. එහෙත් විද්‍යාව සහ දේශපාලන අන්තර් තලයේ වටපිටාව අනතුරුදායක වෙයි. විද්‍යාව සහ තාක්ෂණය ප්‍රායෝගිකව යොදා ගන්නා ආකාරය ගැන දේශපාලනඥයෝ ද, මහජනයා ද, විවාද, තර්ක විතර්ක කරති. මෙහි බලපෑම සෑම දෙනාටම දැනේ. එය ප්‍රජාතන්ත්‍ර රාමුව තුළ හෝ පිටත ඇත්දැයි දැනගැනීම පිණිස සෑමදෙනාගේම මතය ප්‍රකාශ කිරීමට අයිතියක් ඇත. විද්‍යාව හා තාක්ෂණය මඟින් ජනිත කරන ලද සංස්කෘතියක් තුළ අද අප ජීවත්වන ලෝකයේ, එහි සෑම පුරවැසියෙක් තුළම යම් මතයක් ඇති බව අවශ්‍යයෙන්ම පිළිගත යුතු දෙයකි. එම නිසා විද්‍යාව ගැන අවබෝධයක් දීම මෙන්ම විද්‍යාව තුළින් අධ්‍යයනයක් ලබා දීම වැදගත් වෙයි.

මේ නිසාම ගෝලීය විද්‍යාවේ සහභාගි වීම තදබල ජාතික ප්‍රශ්නයක් වෙයි. නිවට උපාය මාර්ග යක් වන්නේ ගෝලීය විද්‍යාවෙන් සම්පූර්ණයෙන්ම ඈත්වී සිටීමයි. එය දිවි නසා ගැනීමකි. මේ නිසා විද්‍යාව කළමනාකරණය කිරීම රටක පැවැත්මට තීරණාත්මක දෙයක් වෙයි. මෙහි තේරුම වන්නේ අදාළ ක්ෂේත්‍ර සඳහා ජාතික හැකියාවන් ලබා ගැනීමත්, අවශ්‍ය තරම් විද්‍යාත්මක පිරිස් බලයක් ගොඩනැගීම සහ නිර්මාණාත්මක සහ නිපදවීමේ කාර්යයන් කරන ආයතන පවත්වාගෙන යාමත්ය.

<u>*2004.06.27*</u>

# Science for Citizenship

## Prof. R. O. B. Wijesekera

Science is one of the dominant factors in a modern citizen's life. Science has never been so powerful and influential. Yet to the large majority of the poorer people of the world, it is indeed a stranger. Its beneficial effects hardly touch their lives. So from a global standpoint the question begs itself: *Why Science?* To respond to this one must first comprehend: *What is Science?* Man's symbiotic relationship with his natural environment and his inherent curiosity, and the need to use it for food and shelter was the initial driving force to investigate. Wonderment at the natural phenomena led to the enhancement of his knowledge base. It also was the beginning of philosophies regarding the nature of the world, the universe and beyond. Man has always been a seeker of knowledge. It appears to be one of his intrinsic characteristics. Let me illustrate this with a personal anecdote:

*My grandson four years old was told (unadvisedly, by one of his elders), when he was naughty, that God would be watching him from above. He then confided in his mother that he was puzzled as to why God must watch from above. Why could he not come down, to earth? In the same vein he asked his mother "What colour is God?" My daughter, a professional information scientist herself was quite confused. "Why do you ask that" she queried her son. "Well" answered the little boy, "if we cannot see Him, and, he is above, then He should be either blue or blacks. In the daytime the sky is blue and we cannot see Him. In the night time the sky is black and we still cannot see him." Then the little philosopher added, "I think he is blue, - because, black will not be visible above at night, but only blue would not be visible both during daytime and night.*

So, observation, curiosity, deduction, and hypothesizing appear to be in the very nature of mankind. They are the ingredients that gave rise to science.

The early excursions of Man into the nature of the environment and speculative thinking on the nature of the world and the universe resulted in the early religious philosophies. Such philosophical theories covered concepts regarding the nature of the solar system, and the lunar system, and gave rise to subjects such as astrology, and astronomy (later to be hi-jacked by science). The same exploratory spirit led to the discovery of oceans and continents. And the "primitive sciences", related to winds and waves, began to spell, power, prestige, and economic influence in the world. All this time the immediate environment too received man's attention, for it was flora and fauna that provided man with his food, clothing, and even his medicines. It was this exploration of the environment that gave rise to the birth of Science, and scientific knowledge, and Agriculture. The scientific method for the acquisition of knowledge came into play. The corpus of knowledge that we now call Science was built up this way. The scientific method went beyond observation and hypothesizing.

It brought in the phenomenon of experimentation. Observation was followed by experimental observation, building theories, verification of these theories, by further experimentation, compiling

laws of nature, and all these operations followed in a systematic, *"la ronde".* It is this *la ronde,* that is, scientific method, by which knowledge in science is acquired, collated and built upon over time.

Let it not be understood that this is the only way that knowledge can be acquired. The noted biologist Sir Peter Medawar FRS, in his delightful book, entitled: Induction and Intuition in Scientific Thought has this to say:

"*Ask a scientist what he conceives the scientific method to be and he will adopt an expression that is at once solemn and shifty eyed: Solemn, because he feels he ought to declare an opinion: Shifty eyed-because, he is wondering how to conceal that fact that he has no opinion to declare.*"

So not all scientists are aware of the scientific method although they may practice it. Philosophy, in contrast, remains as such, not being verifiable by the type of experimentation we know of in science. As a consequence, Philosophy could reach out, beyond the practical limitations of science, but remains abstract and with lesser practical relationship to Man and his Environment. However, the compelling symbiosis between man and the environment remains to this day, and leads to the craving for more knowledge, if it were for need as for greed.

This craving is the driving force of science and exploration itself- life being inevitably a series of explorations. Thus Science and the build up of scientific knowledge brings with it prospects for man's continued sustenance as a species. It also brings dangers about which we shall deal with later.

Now some further questions emerge which demand responses: *Why does mankind want Science? For what is Science?* For whom is Science? Let us now consider these.

Today Science is indeed part of the modern world's culture. Its real beginnings as modern science commenced after the Industrial Revolution in Europe, with the introduction of Newtonian physics, and Robert Boyle's Laws in Chemistry. The founding of bodies: like the Royal Society in England, and the Academie Royale des Sciences in France was also the beginning of organized science in Europe with these new institutions gaining the patronage of the of rulers like Charles the first, and Louis IV. Physics and Chemistry led the way to modern Biology with the Theories of Evolution of Charles Darwin.

The discoveries of the twentieth century have had the greatest impact on mankind. Researches on Natural Resources, both —Terrestrial and Marine - have led to a vast repertoire of knowledge for use by man for his benefit. The revolution in therapeutic agents came with the study of plant natural products which primitive man had been using as his medicines. Synthetic chemistry took over from there and based on nature's molecules, man was able to make his own, for designed purposes. Synthetic polymers have revolutionized modern life, with materials that enable everything from computers to women's clothes. Studies of the winds and waves with man-made satellites have enabled prediction of the weather to a nicety. Travel, transportation, communications are vastly different to what was in the time of our own country's independence, only half a century ago in time. Science and the science related technologies have moved the living style of citizens to a range from where we cannot now

recede. How many people, even some in remote areas of the globe, can now do without computers, cell phones, television, and modern conveniences and conveyances.

Science is the agent of all this and we the citizens of the world cannot do without science. Besides science is clearly now the factor that determines economic power and thus the level of life of all citizens. 1f there is a vast difference between the rich nations and the poor it parallels the respective capabilities in science and technology. Yet there are three major characteristics, seemingly the direct result of science, that springs danger signals.

Firstly, science as we know it and its basic benefits, have still to reach the poorest in the world . In a world of increasing prosperity and plentiful food supplies, about 840 million citizens still suffer from hunger and malnutrition. Of these, 799 million according to the FAO, live in developing countries where, there is relatively little evidence of the beneficial effects of science. Although electric and other forms of modem energy types operate in the affluent areas, their benefits have yet to reach a larger part of the world's citizens. The story is the same as regards water, health care, and social comforts. Only about 15% of the world's population, enjoy the bulk of 85% of the benefits of modern comforts. Science has somehow or other, even accentuated the economic divide between the citizens of the rich countries and the poorest.

Secondly, science has enhanced the power of crime. The poorer countries as well as the rich are constantly embattled with this danger. Terrorism is indeed a global issue. but the danger is the fact that there is a political dichotomy in combating it. The impact of terrorism on the poorest sector receives little attention as the richer countries wade in to secure themselves.

Thirdly, Science has given the world several self-distruct handles with awesome destructive power, namely, the potential of nuclear power, of genome related biotechnology and stem cell research. So in this aspect of danger, there is naught for our comfort. The science-political interface is responsible and this argues for the importance of future science education - education directed towards citizenship and leadership in all spheres.

Recent events have shown that, on this crucial issue, science education must be linked to a moral and ethical foundation, that is seen as legitimate by ordinary citizens It must also be accepted as being responsive to their needs and interests. How science is taught in Universities and particularly schools is also vital to a public understanding of science.

So indeed the questions beg themselves: *Who teaches? Teaches what? Teaches whom?* If an eight year old asks about the universe, the climate, evolution, materials and minerals, plants and animals, the teacher should be equipped to reach for the information and deliver it to the eight year old within his framework of comprehension. This means that curricula, teacher training, and teaching mechanisms, media and materials, should be attuned to the new generation, who have been nurtured in a scientifically fashioned milieu. In addition, can we install in the minimum University curriculum, the concept of scientists who

care deeply for truth and clarification, if only for the rewarding experience of finding order and beauty in a chaotic jumble of natural events?

May I quote below the words of the eminent American Physicist Professor I. I Rabi:

*It is my belief that teaching science well in schools and Universities is to enable students to learn what science is. It is to enable them to catch a glimpse of the heritage of man's experience and his symbiotic relationship with his environment. It is to understand man's experience in the context of the vast changes that surround us, born of new revelations enabled by the same technologies that appear awesomely foreboding.*

How science is taught, therefore, is vital to promoting a public understanding of science. I believe that students can best learn science by indulging in scientific inquiry themselves. They would find it appealing if the science they are learning is meaningfully connected to their own lives. It becomes then a memorable experience and not something to be memorized. Universities and schools should integrate, scientific exploration with other disciplines, for example, history, geography, languages, art and literature. And as leading edge research releases new facts and concepts, the older untenable ones should be discarded. In this way, students will be responsive to new insights and knowledge.

A major ingredient in coping with a world, gone mad in the pursuit of wealth and power driven by science and technology, is the manner in which scientists themselves cope with their inevitable involvement in public affairs. They should be concerned with values and goals.

The *Republic of Science* is international and elitist by its very nature. Only scientists can participate in its deliberations and governance. But, as we observed earlier, science and the Technology that derives from it, is the very foundation of economic power and global wealth. And at the interface of science and politics, the atmosphere becomes dangerous. Politicians and even the public should engage in the debate with regard to the applications of science and technology. The issue affects everyone. And so everyone has a right to be heard, whether it is with or without a framework of democracy. This makes it imperative that every citizen has some idea of the world we live in, dominated by the culture pattern set by science and technology. So an education *about* science is just as important as an education *in* science.

Thus, the participation in global science is very much a national issue. A *naive recipe* would be, a total withdrawal from global science that would be suicidal. So the management of science in a country becomes crucial to its existence. This means the acquisition of national capability in regard to pertinent areas, the maintenance of adequate scientific personnel and institutions in creative and productive activity. The nation's future citizens have to be groomed to address these needs.

*2004.06.27*

# 22

# Knowledge Economy, Competition and Career Development

## Prof. Gunapala Nanayakkara

In 1984, two decades ago, the University of Sri Jayewardenepura celebrated its Silver Jubilee. His Excellency the President J.R.Jayewardene was invited to deliver the convocation address that year, and the then Vice-Chancellor asked me to draft the address for the His Excellency. To my great disappointment, he read some other speech. However, I preserved my draft because I thought, the speech titled *Innovative Society and the University,* contained some valuable ideas for the university community. Two decades later, I put the same ideas into my way of communicating and I was about to publish them in a single volume along with my other writings. Today, I am grateful to the Vice-Chancellor, the Senate and the Council for giving me this opportunity to share those ideas with you all.

The University of Sri Jayewardenepura is forty-five years old. In fact, Universities never age, because the more they experience and learn, the more they realize that the boundaries of discovery are still broader and blurred. Universities must generate energy and strength at a rate higher than the other organizations in society. They must be in the forefront of others in society so that they can lead social organizations by providing power, the power of knowledge.

The economy of the future is derived from the science of today. It happened this way in the information economy, and in the industrial economy before that, and it will happen again in the molecular economy. A new economic life cycle begins as science learns something new about the way the world works. Next, technology shows us how to turn new science into new productive capabilities. As a life cycle reaches maturity, business will employ the new technology to improve its performance. Ultimately, as an economy ages and once the new technology becomes a standard commodity, we encode the deeper lessons from science and technology and apply them to the way work gets done and the way society is organized.

Let us look at the evolution of industrial economy through these four stages. In the gestation period, the industrial revolution began with scientific breakthroughs in Mathematics, Physics and Biology. The growth phase translated these scientific discoveries directly into the technologies that powered the industrial economy, electrical networks, steel mills, and oil companies. As the maturity stage arrived, entrepreneurs of the industrial economy reorganized their capabilities around new management concepts such as assembly lines and interchangeable parts, and around new structures of organizations, multinational companies extending their power beyond national boundaries. These concepts and structures reached the level of decreasing efficiency by the l960s and economic progress needed the support of a new basis of power.

In the mid-twentieth century, a new economic life cycle started. Technology based on information theory and semiconductors enabled the manipulation of large quantities of data at high speed, building an infrastructure for providing cheap computer hardware, software, then communication networks, and currently, an explosion of wireless devices. Today, we are in the middle of the third phase, the growth phase, when every kind of business and government organizations attempt to incorporate the new technologies to improve their value, cost, and quality performance (e.g., through mass customization, online order confirmation, and mobile connectivity).

The information economy is just now beginning to glimpse its organizational phase, which will come into focus much more in the decade ahead. We see it as practices like Internet-based virtual teams, telecommuting. and networked organizations start to take hold. A new organizational model built around a key technology - networks - has already begun to challenge the structures of the previous economy. Higher education outside the traditional class rooms is already made possible by e-learning and interactive distance-mode delivery systems. A growing employment force is already working on part-time arrangements, and the shift of economic power toward individuals is shaping the styles of management every where. Connectivity has created a marked increase in economic volatility that will define the key challenges of the next decade.

Analysis of history of technology by futurists such as Ray Kurzweil shows that technological change is exponential contrary to the common sense, so we will not experience 100 years of progress in the twenty-first century — it will be more like 20,000 years of progress (at today's rate). Place an order online, and your confirmation appears in your inbox before you are offline. Try to have your computer repaired, and you find that it's been replaced by a newer model. And the expectations of today's customers is that any feature they've seen anywhere should be available everywhere instantly. Referring to change during the industrial era, we were told that everything, except change, is subject to change. Today, in the information age, we have realized that change itself is changing, it's rate of change is exponential.

My goal today is to get us all thinking together about the future, the future use of our knowledge. The knowledge economy has come. It is featured by connectivity. In the connected economy, innovations must take place in all human activity, technological, organizational, and social. For this, we may have to innovate a new man, and in this sense, innovation is psychological, philosophical, and behavioural. People must learn to look at the whole rather than the part. People must learn to work together rather than in specialized compartments challenging and competing each other. People must share goals rather than pursue conflictive goals. Technological progress alone cannot promise this nor is it the way.

To succeed in the knowledge economy, you must understand how knowledge works. Unfortunately, knowledge is among the least understood in our universities. Let me ask what is knowledge? Knowledge is science, and Westerners tend to emphasize one aspect of knowledge, i.e. the explicit one or coded knowledge. This knowledge, as a body of organized information, can be understood at three levels. The first is the shallow level that presents data organized in order to provide information in response to the question 'what' is out there: what it looks like, what is happening, what it contains,

etc. The 'what' question looks for description of matter, relations and events. A university graduate would go beyond this shallow level of description and raise the question 'why' which looks for explanation of phenomena. It is in this context that analysis of information comes in by way of such means as reasoning, cause effect analysis, hypothesis testing, etc. Moving further and deeper, one examines questions of methodology or 'how' such analysis was made and pays attention to reliability, validity and tenability of explanations by replicating the analyses previously undertaken. When you enter the competitive employment markets you will be armed with this 'coded' knowledge, attested by the degree certificate you receive today.

In the knowledge economy, coded knowledge alone would not guarantee your success. You need to master another aspect of knowledge, i.e. tacit knowledge, also known as implicit knowledge. Tacit knowledge you acquire by experience, experimentation, and application. The knowledge economy demands you, the knowledge worker, to develop expertise around tacit knowledge in order to succeed in competition. The knowledge worker is an employee who is simultaneously an investor and owner of the enterprise he/she is working for. You as the knowledge worker are the major creator of wealth. The knowledge-based human resource has overtaken the importance of land and buildings, raw materials, finance capital and other material inputs to organizations. The knowledge worker is different from the employee whose progress depended on orderly supply of labour in exchange of a salary. Your job is different from even the information worker whose job is about data and information processing. In a knowledge-based organization, it is the knowledge worker's creativity that would make the entire system successful. As Peter Drucker said, in a traditional workforce, the worker serves the organization; in a knowledge workforce, the organization must serve the worker.

You must become outstanding performers in our future economy. For you to become truly outstanding, you must go beyond your book knowledge and learn how to combine coded knowledge with tacit knowledge. Let us take the case of a development assistant in a Divisional Secretariat who begins a career of functional specialization. Your authority as development assistant would be limited to skilled preparation of assigned tasks in a given area of responsibility. Your next step of career development would be cross-functional. In the new job, as Development Officer, you take up the challenge of designing and creating new projects for the clients of the division. While each officer's style of learning may be unique, it is important, however, that you learn beyond 'cooking recipes' and do something of your own. Creativity is more likely to be a function of cross-functional learning than of functional specialization. You have to learn needs and wants of clients and customers and develop the skill of sensing their expectations as they enter the Divisional Secretariat office. You want to be a truly professional.

At each level of your work, if you prepare yourself one-step ahead of your career path, you in no time become an outstanding professional at the organizational level - the highest level. There, you will provide leadership, develop and share a set of excellence-enhancing values, norms, and behaviour in the entire organization.

By now you would have realized how important it would be for you to develop core competencies in your early career. Unless you are able to deliver value, based on a core activity that your employer assigns priority, your life in any organization will be miserable. You will feel misery because you are not wanted, the team does not welcome you, and you do not have a sense of achievement at the end of the day. As core competencies in you, many employers value one's ability to design a product, convince a customer, apply quality standards, operate IT system, record type and report accurately, record performance and follow-up, or analyze information and make recommendations. If you do not posses one or more of the like, then you must acquire them immediately.

Having core competencies alone is not sufficient to perform a job satisfactorily. Core competencies are applied in a system of physical, technological, and socio/psychological environment of an organization. You are only one element of the larger system and hence you must know how to connect with other components of the system. The range of skills you need for this connectivity are known as generic skills.

*They are about communication* - how to listen, respond, assert, write, and present convincingly. They are about interpersonal relations - understanding other's needs and mental states, perceiving accurately, coping, helping, and synergizing in group situations. Furthermore, the networked organization today expect you to communicate and work with others in an IT environment. Without a mastery of IT. you will be out of place, reactive, and refused.

*Chancellor:*

In a knowledge economy these are some of the challenges our graduates would face. What advice could we give them at this juncture of their commencement of professional life? Here are a few for you to be ahead of others:

*Take the initiative:* Though employers like employees to perform what they are assigned to do, they expect you to look around, see improvements, and take the initiative of value creation. In the knowledge economy and organization, each employee has to define and re-define their tasks and develop a dynamic organization. If your behaviour is passive, reactive, and resembles an obedient pupil, you are getting closer to the exit door.

*Be with people:* The most vital resource in the knowledge organization is the people, the bosses, co-workers, team members, customers etc. With your multiple interpersonal skills you make each and every one of them want you. They depend more on you than you depend on them, that is the equation. If you are introvert, acquire some values of extrovert. If you are an extrovert already, learn how to manage your qualities for greater personal power.

*Continue to learn:* Tragedy awaits out-dated knowledge. In the knowledge economy, the rate of change is exponential and what you have learnt in your university will soon become obsolete, if not already. In

a competitive market system, knowledge of the past has only a marginal value, and you must compete for the acquisition of futuristic knowledge.

*Chancellor:*

The university of Sri Jayewardenepura has a historic origin which is worth of reminding at an occasion like this. As a centre for higher learning, this university was pioneered first as the Vidyodaya Pirivena in 1873 by Ven. Hikkaduwc Sri Sumangala Nayaka Thera. The re-establishment of this leading academic institution in the form of a University took place in 1959 under the illustrious leadership of Ven. Weliwitiye Sri Soratha Nayake Thera. In the light of the academic and research traditions which have evolved during this long period of our history, the University of Sri Jayewardenepura has undoubtedly played a pivotal role in our society. Our University is challenged by the IT revolution, and it will be challenged very soon by the new economy of molecular technologies that is in the making elsewhere. We must learn to transform with courage the medieval University structure and bring the University to the forefront of knowledge creating institutions.

I wish you all a successful future. Thank you.

*2004.06.27*

# 23

# වඩාත් හොඳ කළමනාකරණයක් උදෙසා බුදු දහමෙන් ලැබෙන ආලෝකය

## මහාචාර්ය කේ. ආර්. ඇම්. ටී. කරුණාරත්න

විශ්වවිද්‍යාල පද්ධතිය තුළ කළමනාකරණ ක්ෂේත්‍රය පිළිබඳ විශිෂ්ටත්වයක් උසුලන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ කථිකාචාර්යවරයකු වශයෙන් ද, මහාචාර්යවරයකු වශයෙන් ද, කලක් එම පීඨයේ පීඨාධිපතිවරයා වශයෙන් ද වර්ෂ තිස් දෙකකට අධික සේවාකාලයක් සම්පූර්ණ කිරීමේ භාග්‍යය ලද මට කළමනාකරණ පීඨයේ බාහිර උපාධිධරයන් සඳහා පැවැත්වෙන මෙම උපාධි ප්‍රදානය කිරීමේ උත්සවයේ දී උපාධි ප්‍රදානෝත්සව දේශනය පවත්වන ලෙස කරන ලද ආරාධනය ගෞරවනීය ලෙස සලකා මා එය බාරගත්තේ ඉතා සතුටිනි.

අද තරුණ පරපුරේ බොහෝදෙනෙකු නොදන්නේය යන උපකල්පනය මත මෙම විශ්වවිද්‍යාලයේ ඉතිහාසයෙන් වැදගත් කරුණු බිඳක් මෙහිදී සඳහන් කිරීමට මට අවසර දෙන්න.

ධර්ම ශාස්ත්‍ර ප්‍රබෝධය නිසා මෙරට පැරණි පිරිවෙන් අධ්‍යාපනයෙහි ප්‍රබෝධයක් සිදුවීමත් සමග 1873 වර්ෂයේ කොළඹ මාලිගාකන්දේ දී විද්‍යෝදය පිරිවෙන පිහිටවනු ලැබුවේ හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක ස්වාමීන්වහන්සේගේ මූලිකත්වය හා මඟ පෙන්වීම යටතේයි. ගිහි පැවිදි ශිෂ්‍යයන් හත්දෙනෙකුගෙන් ආරම්භ කරන ලද විද්‍යෝදය පිරිවෙනෙහි ශිෂ්‍ය සංඛ්‍යාව ක්‍රමයෙන් වර්ධනය වන්නට වූයේ විශේෂයෙන්ම එම පිරිවෙනට ශිෂ්‍යයන් ඇතුළත්කර ගැනීමේ දී ජාති, වර්ග පළාත් හා ආගම් පිළිබඳ වෙනසක් නොදැක්වූ බැවිනි.

ධර්ම ශාස්ත්‍ර හැදෑරීම සඳහා දිවයිනේ විවිධ ප්‍රදේශවල සිට එවකට මෙම පිරිවෙන වෙත පැමිණි ගිහි පැවිදි සිසුන් අතුරින් බිහිවූ ප්‍රකට පඬිවරුන් දෙදෙනකු ලෙස පසු කලෙක විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපකුලපතිධූරය හෙබවූ පූජ්‍ය වැලිවිටියේ ශ්‍රී සෝරත ස්වාමීන්වහන්සේත්, ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලයේ අධිපති ධුරය හෙබවූ පණ්ඩිත ජී. පී. වික්‍රමාරච්චි වෛද්‍යාචාර්යතුමාත් ඉතිහාසයෙන් පෙන්නුම් කරයි.

එවකට විද්‍යෝදය පිරිවෙන පෙරදිග භාෂා ශාස්ත්‍රයන් ප්‍රගුණ කිරීමේ කේන්ද්‍රස්ථානය වශයෙන් ප්‍රසිද්ධියට පත්වී තිබූ බැවින් බ්‍රිතාන්‍ය ආණ්ඩුවෙන් වාර්ෂික ආධාර මුදලක් ද මෙම පිරිවෙනට ලබාගැනීමට හැකිවූ අතර ජපානය, ඉන්දියාව, සියම, බුරුමය හා ටිබැටය ආදී විදේශ රටවලින් පැමිණි ගිහි පැවිදි පඬිවරු මෙම පිරිවෙනහි ධර්ම ශාස්ත්‍රය හදාරා ඇතිබව පෙන්නුම් කරයි.

1958 වසරේ අංක 45 දරණ විශ්වවිද්‍යාල පනත මගින් විද්‍යෝදය පිරිවෙන 1959 වසරේ සිට විශ්වවිද්‍යාලයක් බවට උසස් කොට විද්‍යෝදය විශ්වවිද්‍යාලය ලෙස නම් කෙරිණ. එහි ප්‍රථම උපකුලපතිධූරය දැරූ පූජ්‍ය වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමියන්ගේ නොපසුබට වීර්යය හා ධෛර්ය නිසාත්, මා මෙහි මුලින් විද්‍යෝදය පිරිවෙන පිළිබඳව සඳහන් කරන්නට යෙදුන ගමන් මාර්ගය

ඔස්සේම එනම් ජාති, වර්ග, පලාත් හා ආගම් ආදිය පිළිබඳව වෙනසක් නොතකා ශිෂ්‍යයන් ඇතුළත් කොට එවකට පිරිවෙනෙහි උගන්වන ලද ප්‍රධාන විෂයමාලාවට ඇතුළත් වූ පාලි, සංස්කෘත, සිංහල ඇතුළු ප්‍රාචීන භාෂාවන් සමග විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙහි ශාස්ත්‍ර පීඨයද ඊට අමතරව ව්‍යවහාරික විද්‍යා පීඨයද පසු කලෙක කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා, වෛද්‍ය විද්‍යා, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨද එක්කොට අද පවතින ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වැදගත් පීඨ පහකින් යුත් ශ්‍රී ලංකාවේ පමණක් නොව විදේශයන්හි පවා ඉතා උසස් ගණයට ඇතුළත් වන විශ්වවිද්‍යාලයක් ලෙස පිළිගැනෙයි.

මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණක් වන්නේ කළමනාකරණය අධ්‍යයන ක්ෂේත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ නොතිබූ අවධියක අනාගතය පිළිබඳ දුර දක්නා නුවණින් යුතුව ප්‍රථම උපකුලපති පූජ්‍ය වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමිපාණන් විසින් කළමනාකරණ අධ්‍යයන ක්ෂේත්‍රය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතිය තුළට හඳුන්වා දෙමින් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල ප්‍රථම කලමනාකරණ අධ්‍යයන ක්ෂේත්‍රය 1960 ගණන්වලදී මෙම විශ්වවිද්‍යාලයේ ආරම්භ කිරීමයි. කලමනාකරණ ක්ෂේත්‍රය අද ලෝකයේ විශ්වවිද්‍යාලයන්හි පුළුල් වී ඇති අන්දම සළකන විට එදා සෝරත නාහිමියන් ගත් එම කාලෝචිත පියවර පිළිබඳව අප සැමදෙන උන්වහන්සේ නමස්කාරපූර්වකව අගය කළයුතු බව මෙහිලා සඳහන් කිරීම මගේ යුතුකමක් යැයි හැඟේ.

ලෝක සම්මත ආර්ථික විද්‍යාවට අනුව මිනිසාට තිබෙන අවශ්‍යතා අසීමිත යැයි පිළිගැනෙයි. ඇඩම් ස්මිත් ආර්ථික විද්‍යාඥයාගේ අදහසට අනුව මෙම අවශ්‍යතා මුදුන්පත්කර ගැනීම සඳහා මිනිසා ආත්මාර්ථකාමී විය යුතු බව ඔහු දක්වයි. එහෙත් ආත්මාර්ථකාමී බව පවතින විට සමාජයේ අන් අය කෙරෙහි තැකීමක් නොමැති වෙයි. යහපත් හා දෝෂාරෝපණය නොකළ හැකි ජීවනෝපායකින් අන් අයගේ අදහස් ගැන තැකීමක් නොකොට පුද්ගලයකුට ආත්මාර්ථකාමී විය නොහැකියි.

යම් පුද්ගලයකු වෙළඳාමක හෝ ව්‍යාපාරයක හෝ වෘත්තියක හෝ යෙදෙන විට රැවටිලි, වංචා, දූෂණ හා කෘෘරකම්වලින් තොරව ඒවායේ නිරතවීම යහපත් කාර්යයන් ඉටුකිරීමට අත්‍යවශ්‍ය වේ. එහෙත් ඇඩම් ස්මිත්ගේ අදහසට අනුව ආත්මාර්ථකාමීත්වය තිබෙන විට රටක ජනගහනයෙන් සුළු කොටසකට, වැඩි පිරිසක් අබිබවා ධනවත්වීමට ඉඩ සලසයි. මෙය සමාජ පරිහානියට තුඩුදෙන කරුණකි. මක්නිසාද යත් දිළිඳුකම වැඩිවන විට වංචා හා දූෂණ වැඩිවීම නොවැළැක්විය හැකි බැවිනි.

එහෙත් ෂූ මාකර් පෙන්වා දී ඇත්තේ ආත්මාර්ථකාමීත්වයෙන් තොරව තම පුද්ගලික යහපතට ක්‍රියා කරන අතර සමාජයේ සියලුදෙනාගේ පැවැත්මට හා යහපතට තුඩුදෙන අන්දමේ සමාජ ඉලක්කයන් පුද්ගලයකුට තිබිය යුතු බවයි. මෙසේ පවතින විට සෑම පුද්ගලයකුගේම මිනිස් ශ්‍රමය, රටේ මූල ධනය හා යාන්ත්‍රිකය භාවිතයට ගැනීමෙන් වඩාත් හොඳ ප්‍රශස්ත මට්ටමකින් ආර්ථික දියුණුවක් ළඟා කරගත හැකි බව ඔහු විසින් පෙන්වා ඇත.

කළමනාකරණ නියමුවන් ලෙස ප්‍රකට එෆ්.ඩබ්ලිව් ටේලර් විසින් හඳුන්වා දෙන ලද විද්‍යාත්මක කළමනාකරණයත්, හෙන්රි ෆෙයොල් විසින් සාකච්ඡාවට භාජනය කරන ලද නූතන කළමනාකරණයත්, එල්ටන් මායෝ විසින් විස්තර කරන ලද චර්යාත්මක කළමනාකරණයත් යන මේවායේ අඩංගු කරුණු සලකා බලන විට, මීට වර්ෂ දෙදහස් පන්සියයකට පෙර බුදුන්වහන්සේ විසින් දේශනා කරන ලද කළමනාකරණ සංකල්ප ඉතා වැදගත් බව අපට පෙනී යයි.

පිරිස් කළමනාකරණය, දේපල කළමනාකරණය, ව්‍යාපෘති කළමනාකරණය, ආධ්‍යාත්මික කළමනාකරණය, ආර්ථික කළමනාකරණය, කාල කළමනාකරණය, පරිසර කළමනාකරණය ආදී කළමනාකරණ සංකල්ප බුදුරදුන් විසින් සලකා බලා තිබේ.

මිනිසුන්ගේ භෞතික අවශ්‍යතා කළමනාකරණය හා ඔවුන්ගේ ආධ්‍යාත්මික සංවර්ධනය අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකට බැඳී පවතින බව බුදුසමය තුළින් පැහැදිලි වෙයි. එම පැහැදිලි කිරීම් වඩාත් අර්ථවත් කරනු වස් කළමනාකරණ විෂයෙහි අන්තර්ගත සංකල්ප බුදු සමයෙහි අන්තර්ගත සංකල්ප හා සමානකම් විමර්ශනය කර බැලීම වටී.

පිරිස් කළමනාකරණය මානව සම්පත් කළමනාකරණයයි. මෙය ආයතනයක් තුළ ආයතනික අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය වන මානව සම්පත අත්පත් කර ගැනීම, මනාව රඳවාගැනීම, සංවර්ධනය කරවීම, නිවැරදි කටුයතුවල යෙදවීම ආදී අංශ ඇතුළත් වැදගත් කළමනාකරණ ක්‍රියාවලියකි.

පිරිස් කළමනාකරණය පිළිබඳ බෞද්ධ සංකල්පය සැලකීමේ දී බුදුරදුන් භික්ෂු - භික්ෂුණී හා උපාසක - උපාසිකා යන සිව් පිරිස කළමනාකරණය කළ ආකාරය සැලකිල්ලට ගත යුතුය. බුදුරදුන්ගේ කළමනාකරණ ක්‍රියාවලිය නිශ්චිතව හඳුනා ගැනීම ඉහත සිව් පිරිසට අදාළ සංවිධාන කටයුතුවලින් හැකිවෙයි. උපාසක උපාසිකාවන් පිළිබඳ බුදුරදුන් දක්වූ කළමනාකරණ ක්‍රියාවලිය භික්ෂු - භික්ෂුණීන් වෙත දක්වූ ක්‍රියාවලිය තරම් දැඩි වූවක් නොවන බව පෙන්වයි. ඊට හේතුව පුද්ගලයකු බෞද්ධයකු වීම නිසා ඔහු සතු නිදහස අහෝසි නොවන අන්දමට පවත්වා ගැනීම අවශ්‍ය වීමයි. ඔහු බැඳ දමන දැඩි නීතිරීති පනවා නොමැත. පංචශීලය රැකීම පවා නිර්දේශ කොට ඇත්තේ සිය කැමැත්තෙන් ක්‍රියා කිරීම පිණිසය. එහෙත් බෞද්ධ භික්ෂූන් විෂයෙහි ඇති සංවිධානය මීට වඩා දැඩි එකක් විය. භික්ෂුවකගේ පෞද්ගලික හා සමාජික සමස්ත චර්යාවම බුදුරදුන්ගේ කළමනාකරණ ව්‍යූහය තුළට අන්තර්ගතය.

කණ්ඩායම් වශයෙන් ඵලදායක පොදු අරමුණක් ඉටුකරගැනීම පිණිස සංවිධානය වීමට මානව සම්පත් මෙන්ම භෞතික සම්පත්ද අවශ්‍යය. මෙම කණ්ඩායම්වල පොදු අරමුණ ඉටුකරගැනීමේ ක්‍රියාවලිය කළමනාකරණයයි. සංඝ සමාජයේ පොදු අරමුණ වන සියලු දුක්වලින් මිදී නිවන හඳුනා ගැනීම සඳහා උචිත පරිසරයක් නිර්මාණය කරගැනීම ධර්ම විනය තුළින් සිදුවෙයි. මෙය බුදුරදුන් කාලයේම භික්ෂු සංවිධානය තුළ ගොඩනැගුණු කළමනාකරණ කාර්ය පද්ධතියකි. පැවිදිබව ආරම්භයේ සිටම ක්‍රමවත්ව සකස් වූ නීති මාලාවක් හා ක්‍රියා පිළිවෙතක් එහි දක්නට තිබේ. මේවා බුදුන්වහන්සේ විසින් පිරිස් මනාව සංවිධානය කිරීමෙන් හා මෙහෙයවීමෙන් නිසි නායකත්වයක් ලබා දෙමින් සිදු කළ කළමනාකරණ ක්‍රියාවලියක් බව පැහැදිලිව පෙනේ.

පුද්ගලයකු කොතරම් ඥානවන්ත වුවත්, අධ්‍යාපනයෙන් කෙතෙක් පරිපූර්ණවූවත්, බුද්ධියෙන් මුහුකුරාගියත්, සිතෙහි සංවරයක් නොමැති නම් දුකින් මිදී සතුටක් ලබාගැනීම අසීරු වෙයි. යථා භූතඥාන අවබෝධයෙන් අධ්‍යාත්මය සංවර කර ගැනීමට බුදුරජාණන් වහන්සේගේ ධර්මය ඉතා උචිත වන අතර එමගින් මනා ආධ්‍යාත්මික කළමනාකරණයක් සිදු කෙරෙයි. බුදුරදුන් ආධ්‍යාත්මික කළමනාකරණය යනුවෙන් අදහස් කර ඇත්තේ මානසික සංවර්ධන ක්‍රියාවලියයි. එයින් ගම්‍ය වන්නේ සිත කෙලෙසුන්ගෙන් මුදාගෙන පිවිතුරු කර ගැනීමයි. මේ සඳහා බුදුන්වහන්සේ පෙන්වාදුන් භාවනා ක්‍රම ඉතා ප්‍රයෝජනවත් වෙයි. භාවනාව යන වදනෙහි අන්තර්ගත අර්ථය වන්නේ සිත වැඩීම යනුයි. එනම් සිත පිරිසිදු කිරීම හා දියුණු කිරීමයි. අද එංගලන්තයේ විශ්වවිද්‍යාලවල

සමහරක් පශ්චාද් උපාධි පාඨමාලාවලට විෂය කොටසක් ලෙස භාවනාව ඇතුළත්කර තිබීමෙන් පෙනීයන්නේ බුද්ධිමය වර්ධනය ඇතුළු මානසික සෞඛ්‍ය වර්ධනයට එයින් ලැබෙන ඵලය උසස් යැයි වැටහී ඇති නිසා විය හැකි බවයි.

දීඝ නිකායේ මහා සතිපට්ඨාන සූත්‍රයේ භාවනාව සම්බන්ධයෙන් බුදුන්වහන්සේ දේශනා කරන්නේ, ''ඒකායනෝ අයං භික්ඛවෙ මග්ගෝ සත්තානං විසුද්ධියා...''

''සතර සතිපට්ඨාන නම් වූ යම් දහමෙක් ඇද්ද, මෙය සත්වයන්ගේ විසුද්ධිය පිණිස ද දුක් දොම්නස් දුරුවනු පිණිස ද අරි අටහි මගට පැමිණෙනු පිණිස ද නිවන් පසක් කරනු පිණිසද එකම මග වෙයි'' යනාදි වශයෙනි.

තමන්ගේ කායික මානසික ක්‍රියාවන් සිදුවන අවස්ථාවන්හිදීම තමන් විසින් එය දැනගැනීම සතිපට්ඨානයයි. සිත විසින් මේ ක්‍රියාවන් පිළිබඳ යථා තත්ත්වය හඳුනාගැනීමයි. නිරන්තරයෙන් මෙය හුරු පුරුදු කරමින් සිත මේ සඳහා හැඩගැසිය යුතු වෙයි. එය භාවනාව වශයෙන් හැඳින්විය හැකියි. සිතින් ඈත් වී සිතට නොදැනෙන කිසිදු ක්‍රියාවක් මෙහිදී සිදු නොකෙරෙයි. සිත සමාධියට පත්වෙමින් ක්ලේශ දුරුකිරීමෙන් පුද්ගලයා පාරිසුද්ධියට පත්වෙමින් විමුක්තිය ළඟා කර ගැනීමට හැකිවීම මෙහි අවසාන ඵලයයි. මිනිසා හොඳ මනසකින් හා අවධානයකින් යුතුව යමක් කරයි නම් ඔහුට එය නොපිරිහෙලා නිසි අන්දමට සිදු කළ හැකියි. අමතක කිරීමක් හෝ අනාගත ප්‍රාර්ථනාවක් හෝ නොකර උද්‍යෝගිමත්ව හා ක්‍රමානුකූලව සෑම ක්‍රියාවක්ම සංවිධානය කරයි. භාවනාව මෙලෙසින් පුද්ගලයා යහපත් අන්දමට ක්‍රියාත්මක කරවයි. මෙය ආධ්‍යාත්මික කළමනාකරණයයි.

පුද්ගලයකු තම ධනය (ප්‍රධාන වශයෙන් ආර්ථික සම්පත්) මනාව හසුරුවාගෙන සාර්ථකව ජීවිතය ගෙනයාම සඳහා කළමනාකරණය සකස් කරගත යුත්තේ කෙසේද යන්න බොහෝ දෙනකු නිතර අසා හුරු පුරුදු දීඝ නිකායේ සිගාලෝවාද සූත්‍රයෙන් ද මනාව පෙන්නුම් කර ඇත. මෙහි එක් අංශයක් ලෙස ආර්ථික කළමනාකරණයට අදාළව තම ධනය (ආර්ථිකය) හසුරුවාගැනීම සඳහා තමාගේ ඉපයීම් කොටස් හතරකට බෙදා, පළමු කොටස පරිභෝජනය සඳහාත්, දෙවන හා තුන්වන කොටස් ව්‍යාපාරික කටයුතු හා ආයෝජන ආදිය සඳහාත්, හතරවන කොටස අනාගත ආරක්ෂාව පිණිස ඉතිරිකිරීම් සඳහාත් වෙන්කර ගැනීම සුදුසු බව මෙම සූත්‍රයෙහි සඳහන් කෙරේ.

දීඝ නිකායේ කූට දන්ත සූත්‍රයේ විස්තර කෙරෙන අන්දමට ආර්ථික ප්‍රශ්න වෙන් වෙන් ව නොගෙන හේතුව අනුව සැලැස්මක් සහිතව විසඳීම සිදුකළ යුතු අතර, ආර්ථිකයට අවශ්‍ය සැලසුම් පූර්ණ ලෙස ක්‍රියාත්මක කර අවශ්‍ය අභිමතාර්ථ ඉටුකරගත යුතු බව සඳහන් වෙයි. කූටදන්ත සූත්‍රයේ සඳහන් සොරු ජීවිකාව ගෙනයාමට යහපත් ක්‍රියාවන්ගෙන් තොරව සොරකමේ යෙදෙති. ශ්‍රමය අයහපත් අන්දමට යොමු කිරීම නිසා ඔවුන්ගේ යැපීම මෙන්ම ජීවිත ආරක්ෂාවද ගැටළුවක් විය. රජයෙන් ඔවුන්ගේ ගැටළු සහ ප්‍රශ්න ගැන කිසිදු අවධානයක් යොමු නොවිණි. රැකියා විරහිතවීම, ආරක්ෂාවක් නැතිවීම, ජීවිතය කෙරෙහි කලකිරීම ආදී සියල්ල නැති කිරීම පිණිස පොදු ආර්ථික ප්‍රශ්න සඳහා සැලසුමක් ඉදිරිපත් කර එමගින් විසඳුමක් සෙවීම අවශ්‍ය වේ. මෙම කූටදන්ත සූත්‍රය සංවර්ධනය පිළිබඳ සැලසුම් අවශ්‍යතා පැහැදිලි කරන්නකි. ඌන සංවර්ධන රටක නිර්ධන පන්තිය රාජ්‍ය විරෝධී අරගලයක් ඇතිකළ අවස්ථාවේ රජය ඒ සඳහා සැලැස්මක් සකස්කොට එමගින් රට සංවර්ධනය කළ අයුරු මෙම සූත්‍රයෙන් පෙන්වා දී තිබේ. එය රාජ්‍ය මූලික ආර්ථික සැලැස්මකි.

රාජ්‍ය පාලනය පිළිබඳ ග්‍රීක දාර්ශනික ප්ලේටෝගේ අදහස වූයේ ''පාලකයකු දාර්ශනිකයකු විය යුතුයි, නැතිනම් දාර්ශනිකයන් පාලකයන් විය යුතුය'' යන්නයි. පාලකයකු සෑමවිටම පරාර්ථය උදෙසා කටයුතු කළයුතු යැයි ඔහුගේ අදහස විය. එහෙත් ග්‍රීක දාර්ශනික ඇරිස්ටෝටල්ගේ අදහස වූයේ සමාජයකට රාජ්‍ය පාලනයක් අවශ්‍ය බවත්, දාර්ශනිකයන්ට රාජ්‍ය පාලනය ප්‍රායෝගිකව සිදුකළ නොහැකි බවත්, පවතින හොඳම කණ්ඩායමකට පාලනය බාර කළ යුතු බවත්ය.

මෙම දාර්ශනිකයන් දෙදෙනාගේ අදහස් සසඳන විට ප්ලේටෝ මතය බෞද්ධ ධර්මයට සමාන බව පෙනී යයි. සදාචාරය දේශපාලනයේ තිබිය යුතු අංගයක් ලෙස ප්ලේටෝද පෙන්වා තිබේ. බුදුදහමේ දශරාජ ධර්මයට අනුව, කටයුතු කළ රජවරුන්ගේ යහපත් ගති පැවතුම් ආදිය ප්ලේටෝ විසින් අගයන ලද ආදර්ශමත් රාජ්‍ය පාලකයන්ගේ ගතිගුණවලට සමාන බව පෙනෙයි. මේ පිළිබඳව බර්ට්‍රන්ඩ් රසල් දාර්ශනිකයාගේ අදහස වන්නේ රාජ්‍ය පාලනය පිළිබඳ ප්ලේටෝ දුරු අදහස් බෞද්ධ චින්තනයේ අඩංගු දේශපාලන දර්ශනයට සමාන බවයි.

හවායි විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ඩේවිඩ් කලුපහන තම මතය ඉදිරිපත් කරමින් කියා ඇත්තේ භාරත රාජ්‍ය ගොඩනැගීමේදී අසෝක අධිරාජයා කරුණාව, මෛත්‍රිය හා අවබෝධය නමැති ධාර්මික අදහස් පෙරදැරි කොට එය ගොඩනගා ඇති බවයි.

බුදුදහමෙහි චක්කවත්ති සීහනාද සූත්‍රයේ විස්තර කෙරෙන සක්විති රජු පිළිබඳ පරමාදර්ශය අසෝක අධිරාජයා අනුගමනය කර ඇති බව ඉතිහාසයෙන් පෙන්වයි. අසෝක රජුගේ බලය පැවතියේ ධර්මයට අනුව (ධම්මේන පාලනා) බව මෙහි ඇති වැදගත්කමයි. බුදු දහමේ පෙන්වා දී ඇති කළමනාකරණ සංකල්ප භාවිතයෙන් මනා රාජ්‍ය කළමනාකරණයක් ඇතිකරලීමෙන් ශ්‍රී ලංකාවේ අනාගතය සමෘද්ධිමත් කිරීමට පාලකයිනට හැකිවේවායි පතන අතර,

අනිවාර්යයෙන්ම අද අප භාවිත කරන කළමනාකරණ විද්‍යාව බුදුදහම ප්‍රධාන දේශීය කළමනාකරණ සම්ප්‍රදායක් අනුව දේශයට ගැළපෙන සේ සකස් කර භාවිත කළ යුතුය.

විශ්වවිද්‍යාලවල තිබෙන ඉඩකඩ අඩුවීමේ හේතුව නිසාම විශ්වවිද්‍යාලයක අභ්‍යන්තර ශිෂ්‍යභාවය ලබාගැනීමේ හැකියාව ගිලිහී ගියද නොපසුබට වීර්යයෙන් යුතුව බාහිරව අධ්‍යාපනය ලබා කළමනාකරණ අධ්‍යයන හා වාණිජ අංශයේ කේන්ද්‍රස්ථානයක් ලෙස සැලකීම ලබන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් අද ලබාගත් උපාධිය ඇසුරෙන් අප රටටත් මානව සමාජයටත් දයාව, මෛත්‍රිය, කරුණාව, පෙරදැරිකොට උසස් බුද්ධිමත් සේවාවක් ලබාදීමෙන් ඔබගේ අනාගතය දියුණු කර ගැනීමට ඔබ සැමට වාසනාව උදාවේවා යනු මගේ ආශිංශනයයි.

සැමදෙනට ස්තුතියි.

<u>2006.10.22</u>

# 24

# සංවර්ධන කාර්යයෙහිදී මිනිස් ශ්‍රමයේ වැදගත්කම ශ්‍රී ලාංකික විග්‍රහයක්

මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ

මෙම උපාධි ප්‍රදානෝත්සවය ඇමතීමට ආරාධනා කිරීම ගැන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමන්ට හා සනාතන සභාවටත් පීඨාධිපතිතුමා ප්‍රධාන ශාස්ත්‍ර පීඨයේ සාමාජික සාමාජිකාවන්ටත් පළමුවෙන්ම මාගේ ස්තූතිය පළකර සිටිමි. ආර්ථික සංවර්ධන කාර්යයේදී යොදාගනු ලබන ශ්‍රම වර්ග දෙකක් වෙයි. මිනිස් ශ්‍රමය ඉන් එකකි. අනික යාන්ත්‍රික ශ්‍රමයයි. යාන්ත්‍රික ශ්‍රමයට වඩා දිග ඉතිහාසයක් මිනිස් ශ්‍රමයට තිබේ. දැන් මිනිස් ශ්‍රමයට යාන්ත්‍රික ශ්‍රමය අභියෝගයක් වී තිබේ. මිනිස් ශ්‍රමය කළමනාකරණය දුෂ්කර වීම එයට හේතුවයි. යාන්ත්‍රික ශ්‍රමය ජය ගත්තොත් මිනිස් ශ්‍රමයට කුමක් වේද? සමාජ හිතකාමී පැවැත්මක් සඳහා ගතයුතු මඟ කුමක්ද? වඩා හොඳ ආර්ථික ප්‍රතිපත්තිය කුමක්ද? අපි මේ ප්‍රශ්න ගැන මඳක් සිතා බලමු.

## මිනිස් ශ්‍රමය

මිනිසා සමස්තයක් වශයෙන් ගත් කල සමාජගත සත්වයෙකි. එනිසා ඔහුට තමා මෙන්ම තමා අයත් සමාජය ද, පරිසරය ද වැදගත්ය. ජීවිතය තමාත්, සමාජයත්, පරිසරයත් මගින් මෙහෙයවන්නකි. නඩත්තු කරන්නකි. මේ නිසා ඇඩම් ස්මිත්ගේ ආත්මාර්ථකාමී ආර්ථික න්‍යාය සමාජයටත් පරිසරයටත් හානිකර නිසා තමාට ද හානිකරය. සමාජයෙන් ඉතා සුළු සංඛ්‍යාවක් වූ ව්‍යාපාරික ප්‍රජාව ආත්මාර්ථකාමීව ක්‍රියා කිරීම නිසා ඇති වී තිබෙන සමාජ හා පුද්ගල ව්‍යසනය මෙහිදී ඔබේ අවධානයට යොමු කරනු කැමැත්තෙමි.

විවෘත ආර්ථිකය තුළ මානව ශ්‍රමයට හිමි තැන පළමුව විමසා බලමු. කලෙක සිට ශ්‍රී ලංකාව විදේශීය නිෂ්පාදන අලෙවි කරන වෙළඳපලකි. විදේශ භාණ්ඩ විදේශීය මානව ශ්‍රමය, විදේශීය යාන්ත්‍රික ශ්‍රමය, විදේශීය මූලධනය හා විදේශීය ස්වාභාවික සම්පත් භාවිත කොට නිපදවන දේවල්ය. ඒවා අලෙවියෙන් ලැබෙන ලාභය එම භාණ්ඩ වෙළඳපලට සපයන ස්වදේශික හෝ විදේශික හෝ අන්තර් ජාතික ව්‍යාපාරිකයන්ටත් විශේෂයෙන් භාණ්ඩ නිපදවූ රටටත් ලැබෙයි. ඒ භාණ්ඩ නිපදවූ රටේ මානව ශ්‍රමයට ලැබෙන මූල්‍යමය වටිනාකම පමණක් නොව ශ්‍රමාභිමානය ද සහතික කර තිබේ. මෙසේ විදේශීය භාණ්ඩවලින් පිරි වෙළඳ පොළක් ශ්‍රී ලංකාවේ පවත්වාගෙන යාමේදී මෙරට ශ්‍රමිකයන් මුහුණපාන ආර්ථික ප්‍රශ්නයක් තිබේ. වෙළඳපොලේ ඇති භාණ්ඩ මිලදී ගැනීමට ප්‍රමාණවත් ආර්ථික වටිනාකමක් ඔවුන්ගේ ශ්‍රමයට නොලැබීමයි.

එය මෙරට බහුතරයකට තිබෙන ගැටලුවයි. ඊළඟට දේශීය නිෂ්පාදනවල මිල විදේශීය නිෂ්පාදනවල මිලට වඩා වැඩිවීම නිසා දේශීය නිෂ්පාදනය බිඳ වැටීම දක්නට ලැබේ. එමඟින් දේශීය මානව ශ්‍රමය භාවිතයෙන් තොර වෙයි. මෙරට නිපදවන සහල්වලට වඩා අඩු මිලකට පිටරට සහල් ආනයනය කර වෙළඳපොලට යැවීමෙන් මෙරට වී ගොවිතැනට බලවත් පහරක් වදී. වෙනත් ආහාර ද්‍රව්‍ය සම්බන්ධව ද මේ තත්ත්වය ප්‍රත්‍යක්ෂ ලෙස දක්නට ලැබේ. මේ නිසා අපේ රටේ මානව ශ්‍රමය අපතේ යාම

සාමාන්‍ය දෙයක් බවට පත්ව තිබේ. පවතින විවෘත ආර්ථිකය තුළ ස්වදේශීය මිනිස් ශ්‍රමයට මූල්‍යමය අගයක් නොලැබෙන විට රටේ බහුතරය දිළිඳු තත්ත්වයට පත්වීම නොවැළැක්විය හැකිය. දැනට රටපුරා පවතින අධික භාණ්ඩ මිල දරාගත නොහැකි බහුතරය මන්දපෝෂණයෙන් පෙළෙන නිසා ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වය ද පිරිහෙමින් පවති. වැඩි වැඩියෙන් විදේශීය ඖෂධ වර්ග මෙරටට ගෙන්වීමට මෙය හේතු වන්නේය. මේ තත්ත්වය තේරුම් ගැනීමට ඉන්දියාව, චීනය වැනි රටවල් සමත් වුවත් අපේ රටේ වගකිව යුත්තන් අසමත් වූ බවයි අනාවරණය වී තිබෙන්නේ.

රටක ජනතාවට අවශ්‍ය භාණ්ඩ ඒ රටේම නිපදවනවා නම් හා එසේ නිෂ්පාදනයට ඒ රටේ මානව ශ්‍රමය යොදා ගන්නවා නම් එම ශ්‍රමිකයන්ගේ සහභාගීත්වය නිසා ඔවුන්ගේ ශ්‍රමයට වටිනාකමක් ලැබෙයි. එපමණක් නොව එම වටිනාකමින් යැපීමට ඔවුන්ට අවස්ථාව ලැබෙයි. ශ්‍රමාභිමානය ඇතිවී තෘප්තිමත් වීමට ද මුදල් ඉපයීම සඳහා නීති විරෝධී ක්‍රියාවල යෙදීම අවම වීමට ද එය හේතු වෙයි. සාමකාමී ශිලාචාර පැවැත්මක් මඟින් සමාජ ඒකාබද්ධතාව සහතික කිරීමට ද එයින් හැකි වන්නේය.

රටක බහුතරයේ මානව ශ්‍රමය නිෂ්පාදන කාර්යයට සහභාගි කර ගන්නේ නැතිනම් සමාජය තුළ දරිද්‍රතාව වර්ධනය වෙයි. එවැනි තත්ත්වයක් යටතේ අපරාධ වැඩිවීම නොවැළැක්විය හැකි බව බුදුන් වහන්සේ විසින් පෙන්වා දී තිබේ. අද මුද්‍රිත මාධ්‍යවල පළවන වාර්තාවලින් වැඩිහරිය කාමුකත්වය හා අපරාධ යන වර්ග දෙකට අයත්ය. ඒවා අභිරුචියෙන් කියවන පාඨකයන්ගේ සංඛ්‍යාව ද ඉහළ ගොස් තිබේ. දැනටමත් මුළු රට පුරාම අපරාධ අතින් වර්ධනයක් දක්නට ලැබේ. රජය ආර්ථික අතින් අමාරු තත්ත්වයක පවතින නිසා පිටරටවලින් ණයට හා පිනට මුදල් ලබාගැනීම ද වර්ධනය වෙමින් පවති. රටේ මුදල්වල වටිනාකම අඩු වෙමින් පැවතීමත් භාණ්ඩ මිල වැඩිවීමත් නිසා බහුතරය බරපතල ආර්ථික අසහනයකට පත්ව සිටින බව පෙනීයයි. එවැනි අය අතර ශ්‍රමාභිමානයට හෝ තෘප්තියට හෝ සදාචාරයට තැනක් තිබිය නොහැකිය. සමාජ ව්‍යසනයට මුල එයයි.

## මිනිස් ශ්‍රමයට වටිනාකමක් ලබාදීම

මානව ශ්‍රමයට සාධාරණ වටිනාකමක් ලැබෙන සේ කටයුතු කිරීම රජයේ වගකීමයි. පුද්ගලික ව්‍යවසාය සඳහා මූලධනය ණය වශයෙන් හෝ ලබාදී ජනතාව නිෂ්පාදන කාර්යයට හවුල් කරගත යුතුය. මේ වගකීම වෙනුවෙන් රජයෙන් සිදුවන්නේ ද විදේශීය මානව හා යාන්ත්‍රික ශ්‍රමයට ආවැඩීමයි.

දේශීය නිෂ්පාදන කාර්යයට වැඩි වැඩියෙන් ශ්‍රමිකයන් හවුල් කරගැනීම මඟින් ඔවුන්ගේ ශ්‍රමයට මූල්‍යමය අගයක් ලැබේ. එය තහවුරු කිරීමට ඔවුන්ගේ නිෂ්පාදනවලටද සාධාරණ මිලක් ලැබිය යුතුය. ලංකා ඉතිහාසයේ ස්වර්ණමය යුගය ක්‍රිස්තු වර්ෂ දහවන සියවස අගභාගයට කලින් ශත වර්ෂ දහයකටත් වැඩි කාලයක් පැවතුණි. ඒ නිසා රත්රන්වලින් ගණුදෙනු කළ හැකි විය. මස්ස, අඩමස්ස, කහවණුව, අඩ කහවණුව යන රන් කාසි වර්ග හතරට අමතරව එකල රන්, කලන් වශයෙන් දී භාණ්ඩ මිලදී ගැනීමට හැකි විය. භාණ්ඩවලට ද හොඳ මිලක් පැවතුණි. එකල කිරි එළදෙනකගේ මිල කහවණු 8-12 දක්වා විය. සාමාන්‍යයෙන් කහවණුවක රත්රන් වටිනාකම අද භාවිත වන රන් පවුමකින් අඩක් සේ ගණන් බැලුවත් එකල එළදෙනකගේ වැඩිම වටිනාකම රු. 129900/- ක් පමණ විය. ගවයන් ඇති කරන අයගේ ශ්‍රමයට මූල්‍යමය අගයක් ලැබුණේ එසේය. එකල බැංකුවල පොලී අනුපාතය 50% ක් දක්වා විය. පොළියෙන් පමණක් ධනවත් වූවන් ගැනද අසන්නට ලැබේ. එකල ජීවිතය කොතරම් සැපපහසු හා සාමකාමී වී ද යත් සූක්ෂම හා මහා පරිමාණ වායුසමීකරණ මඟින් නිවාස හා නගර තුළ උෂ්ණත්වය අඩු කර ගැනීමට ක්‍රියා කර තිබේ. වාරි තාක්ෂණයෙහි යෙදුණු

අපේ ඉංජිනේරුවන්ගේ ශ්‍රමයට විදේශවල පවා ඉල්ලුමක් විය. එකල ජීවිතයේ සෑම අංශයකම දියුණුවක් තිබිණි. එය විදේශිකයන් මෙරටට ආකර්ෂණය වීමට ද හේතු විය.

බුදුදහමේ ආභාසයෙන් ලත් ඒ දියුණුව මෙරට පුරාවස්තුවලින් පවා අනාවරණය වෙයි. බුදුදහම උගන්වන්නේ ආත්මාර්ථ, පරාර්ථ දෙකම වැදගත් බවයි. බුදුන්වහන්සේ තම පළමු ශ්‍රාවක කණ්ඩායමට උපදෙස් දුන්නේ බහුතරය නැතිනම් සියලු දෙනාගේ හිත සුව පිණිස චාරිකා කරමින් මිනිසුන් දැනුවත් කරන ලෙසයි. මිහිඳු හිමියන් ප්‍රධාන ඉන්දියානු ධර්මදූතයන් හා මෙරට භික්ෂූන් වහන්සේලා ඒ අන්දමට ක්‍රියා කළ නිසාත් රජවරුන් උන්වහන්සේලාගේ මඟපෙන්වීම යටතේ ක්‍රියා කළ නිසාත් අනුරාධපුරය මෙරට ස්වර්ණමය යුගය විය.

## අල්පේච්ඡතා ආර්ථිකය

බෞද්ධ අල්පේච්ඡතාව මූලික ආර්ථික සිද්ධාන්තයකි. එය ආත්මාර්ථකාමීත්වය පාලනය කරන අතර ජනහිතකාමී ආර්ථික සංවර්ධනයකට මඟ පෙන්වයි. මෙම ආර්ථික සිද්ධාන්තයට අනුව ලැබෙන ආදායමින් කොටසක් පරිභෝජනයට ද, කොටස් දෙකක් ආයෝජනයට ද, කොටසක් තැන්පතුවක් සඳහා ද වෙන් කළ යුතුය. මේ තුළින් හඳුන්වාදෙන ආර්ථිකය මාධ්‍යමික ආර්ථිකය ලෙස හඳුනාග ැනීමට ප්‍රකට ආර්ථික විද්‍යාඥයකු වූ ෂූමාකර් ද සමත් විය. අන්තගාමී නොවූ ජනහිතකාමී ආර්ථිකයක මුහුණුවර මෙහි තිබෙන බව මහාචාර්ය ජගත් වික්‍රමසිංහ විසින්ද පෙන්වා දී තිබේ.

## මහා පරිමාණ කර්මාන්ත නිසා වන විපත්

බුදුන් වහන්සේ ආත්මාර්ථකාමි ආර්ථික සිද්ධාන්තය කෙලින්ම ප්‍රතික්ෂේප කරති. විවෘත ආර්ථිකයට පදනම් වී ඇති ආත්මාර්ථකාමී ආර්ථිකය හැඳින්වීමට උන්වහන්සේ යොදාගත් වචනය මහිච්ඡතා යන්නයි. මහිච්ඡතා නිෂ්පාදකයාට පමණක් විශාල වශයෙන් ප්‍රතිලාභ ලැබෙන ක්‍රමයකි. ෂූමාකර් මෙය වටහා ගෙන මහා පරිමාණ කර්මාන්තශාලා මඟින් යාන්ත්‍රික ශ්‍රමය වැඩි වැඩියෙන් යොදා භාණ්ඩ නිපදවීම හානිකර බව පෙන්වා දෙයි. එයින් මිනිස් ශ්‍රමය නොසලකා හැරීමට අමතරව පරිසර හානියක් ද සිදු වන බව ඔහුගේ පිළිගැනීමයි. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් එම හානිය සිදුවන ආකාරය පර්යේෂණ මඟින් තහවුරු කර තිබේ. ඒ හැර තවත් හානියක් වෙයි. මේවායේ ක්‍රියාකාරීත්වය නිසා තරගකාරී ලෙස භාණ්ඩ නිපදවා වෙළඳපොලේ අලෙවියට ද තරගයක් ඇතිකර තිබේ. අවශ්‍ය ප්‍රමාණයට වඩා භාණ්ඩ නිපදවීම මේ තත්ත්වය යටතේ සිදුවේ. එනිසා සීමිත ස්වාභාවික සම්පත් ඉක්මණින් අවසන් වේ. මේ සම්පත්වලින් ඉදිරි පරම්පරාවලට යැපීම සඳහා ඇති අයිතිය එයින් නැතිව යයි. මහා පරිමාණ කර්මාන්ත ශාලාවලින් අහසට මුදාහරිනු ලබන අම්ලය නිසා අම්ල වැසි පවා ඇති වී පොළව නිසරු බවට පත්වෙයි. එනිසා මහා පරිමාණ කර්මාන්තශාලා පරිසර සෞඛ්‍යයටද හානිකරයි. අනෙක් වරද නම් එවැනි කර්මාන්තශාලාවල මිනිස් ශ්‍රමය අඩුවෙනුත් යාන්ත්‍රික ශ්‍රමය වැඩියෙනුත් භාවිත වීම නිසා මිනිසුන් අතර දරිද්‍රතාව ඇතිවීමයි. මේ තත්ත්වය වළක්වා ගැනීමට කළ යුත්තේ මධ්‍යම හා කුඩා ප්‍රමාණයේ කර්මාන්තශාලා ප්‍රයෝජනයට ගනිමින් මිනිස් ශ්‍රමයට ප්‍රධාන තැන දී භාණ්ඩ නිපදවීමයි.

## ශ්‍රී ලංකාවේ ආර්ථික තත්ත්වය

අඩසිය වසක් තරම් කාලයක් අපේ රටේ පාලනය ගෙන ගිය අය අනුගමනය කළේ ඇඩම් ස්මිත් වැනි ආර්ථික විද්‍යාඥයන්ගේ මඟපෙන්වීම අනුව ඇති වූ ජාත්‍යන්තර මූල්‍ය ආයතනවල උපදෙස්ය.

බටහිරින් අප උගත් ආර්ථික විද්‍යාව තවමත් ඒ ආකාරයෙන්ම ඉගෙනීම හා උගැන්වීම සිදුවෙයි. මේ වන විට එය දේශීය සම්ප්‍රදායන් සමඟ ගළපා දේශීත්වයට පත්කර ගැනීම අවශ්‍යව තිබුණත් එවැන්නක් වී නැති බව ආචාර්ය ගාමිණී කොරයාද පෙන්වා දෙයි. මෙය මෙරට පවතින අධ්‍යාපන ක්‍රමයේ බරපතල වරදකි. ක්‍රි.පූ. 250 දී මෙරටට ඉන්දියාවෙන් ලබාදෙන ලද ශ්‍රේණි 18 කට අයත් කාර්මික අධ්‍යාපනය දේශීයත්වයට පත්වීමට අවුරුදු 50 ක් ගතවූයේ නැත. දේශීය බුද්ධිමතුන්ට නිදහසේ කාර්මික අධ්‍යාපනය දියුණු කිරීමටත් සමහරවිට ඉන්දියානු ගුරුන්ට ඉහළින් නව අදහස් ක්‍රියාවට නැංවීමටත් අවස්ථාව තිබුණි. එම අවස්ථාවෙන් ප්‍රයෝජන ගත් දුටුගැමුණු රජු ක්‍රි.පූ. 2 වන සියවසේ දී මහල් 9 කින් යුත් ලෝවාමහාපාය ඇතුළු මහා පරිමාණ ගොඩනැගිලි රැසක් කරවීය. ලෝවාමහාපායෙහි කාමර 1000 ක්ද, කූටාගාර 100 ක්ද, මැද මණ්ඩපයක් හා ශාලාද විය. එය උසින් අඩි 200 ක්ද, පළලින් අඩි 200 ක් ද වූ බව පිළිගෙන තිබේ. එවැනි සමමිතික ගොඩනැගිලි තැනීමට එතරම් අතීතයක ශ්‍රී ලාංකියන්ට හැකි වුවත් බටහිර රටවලට සමමිතික ගොඩනැගිලි පිළිබඳ සිද්ධාන්තය විත්‍රුවියස් විසින් හඳුන්වා දුන්නේ ක්‍රි.පූ. පළමුවන ශත වර්ෂයේදීය. මෑතකදී අනුරාධපුර ජේතවනාරාමයෙන් හමු වූ මිලි මීටර 8 ක් දිග එක් රන් කැටයමක නෙළුම් මල් 14 ක් කැටයම් කර තිබේ. මේ සූක්ෂ්ම කැටයම නිපදවීමට සූක්ෂ්ම දර්ශකයක ආධාරය අත්‍යවශ්‍යය. මෙවැනි නිර්මාණවලින් අනාවරණය වන්නේ එකල සූක්ෂ්ම දර්ශක පවා භාණ්ඩ නිෂ්පාදනයේදී ප්‍රයෝජන ගත් බවයි. තවමත් මෙහි කාලය පිළිබඳ නිශ්චිත අදහසක් නැතත් එය ක්‍රි.ව. 10 සියවස අගභාගයට වඩා පැරණි බව කිව හැකිය.

ආර්ථික සංවර්ධනය පිළිබඳ විමසා බලා සාර්ථක ප්‍රතිඵල ලබාගත් චීනය, ඉන්දියාව, මැලේසියාව, සිංගප්පූරුව වැනි රටවලින් පාඩම් ඉගෙන ගෙන මේ රටේ ආර්ථිකය ගොඩනැගීමට මෙතෙක් උනන්දුවක් දක්වා නැත. ඒ වෙනුවට දිගටම කරන ලද්දේ බටහිර ආර්ථික න්‍යායයන් අන්ධානුකරණයෙන් භාවිත කිරීමයි. බටහිර රටවල්වල නිෂ්පාදනය කරන ලද භාණ්ඩ අලෙවි කිරීමේ වෙළඳපොළවල් සඳහා තුන්වන ලෝකයේ රටවල් යොදාගෙන තිබීම අප රටේ වගකිවයුත්තන්ට පෙනී ගොස් ඇති බවක් නොපෙනේ. මේ තත්ත්වය යටතේ දේශීය ආර්ථික සංවර්ධනයක් බලාපොරොත්තු විය නොහැකිය. රටේ දරිද්‍රතාව යම්තම් හෝ මඟහරවා ගැනීමට අවශ්‍ය විදේශ විනිමය සොයාගැනීම සඳහා මේ රටේ කාන්තාවන් මැදපෙරදිග ගෙවල්වල මෙහෙකාර සේවයට තල්ලු කර තිබේ. ඔවුන්ගෙන් අපේක්ෂිත විදේශ විනිමය ප්‍රමාණය රුපියල් කෝටි 30,000 ක් බව කියනු ලැබේ. මෙසේ උපයන විනිමය විශාල වශයෙන් භාවිත වන්නේ විදේශීය නිෂ්පාදනය මෙරටට ගෙන්වා අලෙවි කොට විදේශීය මිනිස් ශ්‍රමයට, යාන්ත්‍රික ශ්‍රමයට, මූලධනයට හා ස්වාභාවික සම්පත්වලට වාසි සැලසීමටයි. අද වන විට අපේ රුපියලේ වටිනාකම වේගයෙන් පහත වැටී ඇති බව භාණ්ඩ මිලදී ගැනීමට යන ඕනෑම කෙනෙකුට පහසුවෙන් වටහා ගත හැකිය. 1972 දී ශ්‍රී ලංකා රු. 15 කින් ස්ටර්ලින් පවුමක් මිලදී ගත හැකි විය. අද ස්ටර්ලින් පවුමකට රු. 200කට වඩා ගෙවීමට සිදු වී තිබේ. එකල ඉන්දියානු රුපියලේ අගය ශ්‍රී ලංකා රුපියලේ අගයට වඩා ශත 10කින් අඩු විය. අද ඉන්දියානු රුපියලේ අගය ශ්‍රී ලංකාවේ රුපියලට වඩා දෙගුණයකටත් වඩා වැඩිය. මෙයින් අනාවරණය වන්නේ අපේ රුපියලේ අගය වේගයෙන් පහළ බැස ඇති බවයි. රුපියලේ වටිනාකම අඩුවීමට සාපේක්ෂව රජයේ හා පුද්ගලික අංශවල ශ්‍රමිකයන්ට ජීවන වියදමට ප්‍රමාණවත් වැටුපක් ලබාදීමට රජය සමත් වී නැත. මේ නිසා දේශීය නිෂ්පාදකයාත්, පාරිභෝජකයාත්, ශ්‍රමිකයාත් අමාරුවට වැටී සිටින බව පෙනී යයි. මෙහි ප්‍රතිඵලය වන්නේ රටේ දරිද්‍රතාව වර්ධනය වී ඒ හේතුවෙන් දාමරිකත්වය ඉහළ යාමයි.

## නිගමනය

රටක ආර්ථික සංවර්ධනයේදී මිනිස් ශ්‍රමය නිෂ්පාදනය සඳහා යොදාගැනීම අත්‍යවශ්‍යය. දේශීය සම්පත් විශේෂයෙන් අමුද්‍රව්‍ය අරපරිස්සමෙන් භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදාගත යුතුය. මෙරට විදේශීය නිෂ්පාදන අලෙවි කරන වෙළඳපොලක් ලෙස පවත්වාගෙන යාම අවම කොට දේශීය නිෂ්පාදන සඳහා වෙළඳපොල විවෘත කළ යුතුව තිබේ. මේ සියල්ල කිරීම සඳහා මූලික වශයෙන් අවශ්‍ය වන්නේ බටහිරින් අප උගත් ආර්ථික සිද්ධාන්ත දේශීය සම්ප්‍රදායන් සමඟ සංසන්දනය කොට දේශයට හිතකර ආර්ථික ක්‍රමයක් හඳුන්වා දීමයි. එම ආර්ථික ක්‍රමය යටතේ රට සංවර්ධනය කළ යුතුයි. එවැනි ආර්ථික ප්‍රතිපත්තියක් යටතේ ශ්‍රමිකයාත්, සමාජයත් පරිසරය හා දේශීය ස්වාභාවික සම්පතුත් මැනවින් කළමනාකරණය කළයුතු වේ.

අසා සිටි ඔබ සැමට බෙහෙවින් ස්තුතියි.

<u>*2007.01.31*</u>

# 25

# ව්‍යාපාරික කටයුතු හා ජීවිතයේ සාර්ථකත්වය

## මහාචාර්ය කේ. යු. කමල්ගොඩ

ප්‍රළමුවෙන්ම උපාධි ප්‍රදානෝත්සවය ඇමතීමට මට අවස්ථාව ලබාදීම වෙනුවෙන් මගේ හෘදයංගම ස්තූතිය කරුණාකර පිළිගන්න. පසුගිය වර්ෂ 38 තුළ දී පරිපාලකයෙකු, ගුරුවරයෙකු, පුහුණුකරුවෙකු සහ කළමනාකරුවෙකු ලෙස ලත් මගේ අත්දැකීම් තුළින් මා පසක් කරගත් වැදගත් කාරණයක් වනුයේ ඉගෙන ගැනීමට අවසානයක් නොමැති බවයි. මා ජීවිත කාලය පුරා ලත් අත්දැකීම් තුළින් ලත් දැනුම් සම්භාරයට විවිධ අය දායක වී ඇත. එහෙත් ඒ අතරින් එක් සුවිශේෂී කාරණයක් මාගේ විශේෂ අවධානයට ලක් වී ඇත.

දක්ෂතාවන් කැටිකොට ගත් අපගේ තරුණ පරම්පරාවට අතිමහත් පරිශ්‍රමයන් සමගින් වුවද තම ඉලක්කයන් නිසියාකාරයෙන් ළඟා නොකරගත හැක්කේ මන්ද? එම කාරණය අද දවසේ තේමාව ලෙස තෝරා ගනිමි. සාර්ථකත්වයේ රහස කුමක්ද? සාමාන්‍ය පිළිගත් අදහස වනුයේ උපතින් ලත් සහජ දක්ෂතා සාර්ථකත්වයට තුඩුදෙන බවය.

සත්‍ය වනුයේ සහජ දක්ෂතා සහ සාර්ථකත්වය අතර කිසිම සම්බන්ධයක් නොමැති බවයි. මේ සම්බන්ධයෙන් පෘථුල පරාසයක් තුළ කෙරෙනු ලැබූ ගවේෂණයන්ගෙන් තහවුරු වී ඇත්තේ බුද්ධිමත්භාවය, පෞරුෂත්වය, චරිත ලක්ෂණ හෝ උපන් කුසලතා ආදී දෑ කෙනෙකුගේ දක්ෂතාවට දායක නොවන බවයි. මයිකල් ජේ. හෝවේ, ජේන් ඩබ්. ඩේවිඩ්සන් සහ ජෝන් ස්ලූබෝඩා යන බ්‍රිතාන්‍ය පර්යේෂකයන් විසින් නිගමනය කරනු ලැබ ඇත්තේ ඔවුන්ගේ පර්යේෂණ අවසානයේ ගොනු කරගත් සාක්ෂි මත විශිෂ්ටත්වය සහජ දක්ෂතාවේ හේතු ඵලයක් නොවන බවයි.

ඉගැනුම් ක්‍රියාවලිය ස්වභාවයෙන්ම බෑරෑරුම් ස්වාභාවයක් ගනී. ආරම්භය ඉතා වේගවත් වන අතර අතරමඟ වේගය අඩාල වී අවසානයේ සම්පූර්ණයෙන්ම නවතා දැමීමට බොහෝ දෙනෙක් පෙළඹෙති.

නමුත් මේ අතරින් ඇතැමෙක් වර්ෂ දශක ගණනාවක් නොකඩවා වෙහෙස වී විශිෂ්ටත්වයට එළැඹෙති. මෙහිදි නිරායාසයෙන්ම පර්යේෂණයන් සඳහා මතුවන ප්‍රධාන ගැටලුව වන්නේ ඇතමෙක් තම දක්ෂතා වර්ධනය කරගනිද්දී බහුතරයට නොහැකි වන්නේ මන්ද යන්නයි.

ඇමෙරිකා එක්සත් ජනපදයේ ෆ්ලොරිඩා ප්‍රාන්ත විශ්වවිද්‍යාලයේ මහාචාර්ය කේ. ඇන්ඩස්, එරික්සන් සහ සහායක පර්යේෂකයන් විසින් ක්‍රීඩා, සංගීත, චෙස් සහ ව්‍යාපාර ඇතුළු බොහෝ විෂය ක්ෂේත්‍රයන්ගේ අතිවිශිෂ්ටයන් සම්බන්ධයෙන් කෙරෙනු ලැබූ ගැඹුරු පර්යේෂණයන්හි නිගමන අපගේ තේමාවට වැදගත් වේ. පර්යේෂණයේ ප්‍රධාන නිගමනය වන්නේ යම් කාර්යයක් විශිෂ්ට ලෙස ඉටු කිරීමට හේතුපාදක වන්නේ වෙහෙස වී වැඩ කිරීම විනා වෙනයම් හේතුවක් නොවන බවයි. එමගින් පොදුවේ පිළිගැනුණු ලැබෙන සහජ දක්ෂතා සංකල්පය මිත්‍යාවක් බවට තහවුරු කර ඇත.

විශිෂ්ටයන් තම තත්ත්වයට ළඟාවී ඇත්තේ කාලාන්තරයක් පුරා කැප වී කරනු ලැබූ නිරන්තර පුහුණුව තුළිනි. අතිබහුතරයක් සාධකයන් මේ බව තහවුරු කර ඇත. ජාතික හෝ ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමට ලක් වූ පුද්ගලයන් අතුරෙන් බහුතරය එම තත්ත්වයට පත් වී ඇත්තේ දශකයට නොඅඩු අප්‍රතිහත කැපවීම් තුළිනි. පර්යේෂකයන් මෙය ''දශක රීතිය'' ලෙස හඳුන්වයි. දකුණු කැලිෆෝනියා විශ්වවිද්‍යාලයේ ජෝන් හෝන් සහ කැලිෆෝනියා ප්‍රාන්ත විශ්වවිද්‍යාලයේ හිරෝමි මසුනාගා දක්වන්නේ ''දශක රීතිය'', හුදෙක් දළ ඇස්තමේන්තුවක් වන අතර බොහෝ පර්යේෂකයන්ට අනුව දශක රීතිය අවමය මුත් සාමාන්‍යය නොවන බවය. ''සාහිත්‍ය හා සංගීතය'' වැනි ක්ෂේත්‍රයන්හි විශිෂ්ටයන් තම ජයග්‍රාහී ස්තම්භයට ළඟා වී ඇත්තේ වසර 20 ක 30 ක පමණ දැඩි කැපවීම තුළිනි.

ඒ අතරනිදු සමහරෙක් කාලාන්තරයක් පුරා කැප වී තම කාර්යයන්හි නිරත වුවත් ඔවුහු සමාජයේ නිසි පිළිගැනීමට ලක් නොවී සැඟවී සිටිති. කුමක්ද අඩුවී ඇත්තේ? කැපවී වැඩ කිරීම පමණක් මෙහිදී ප්‍රමාණවත් නොවේ. නිරන්තර ප්‍රගතිය ඉලක්ක කරගත් කැපවී වැඩ කිරීම සාර්ථකත්වයේ රහසයි. පර්යේෂකයන් මෙය හඳුන්වන්නේ ''නිරන්තර පුහුණුව'' වශයෙනි. යම්කිසි කාර්යයක වඩා හොඳ ප්‍රතිඵල ලබාගැනීමට අඩුපාඩු මකා දමමින් එම කාර්යයන් නැවත නැවත ඉටු කිරීමට අවශ්‍ය වේ. මෙහිදී අපේක්ෂිත මට්ටම දිගින් දිගටම පවත්වාගැනීම අත්‍යවශ්‍යම සාධකය වේ.

එරික්සන් සහ ඔහුගේ සහායක පරීක්ෂකයන්ගේ නිගමනය වී ඇත්තේ ගුරු කුලයට අනුව, විශිෂ්ටතම වයලීන කණ්ඩායම පැය 10000ක් අධික නිරන්තර පුහුණුවක්ද, දෙවැනි තැන හා තුන්වැනි තැන් කණ්ඩායම් පිළිවෙළින් පැය 7500 හා 5000 ක නිරන්තර පුහුණුවක් කර ඇති බව යි. මෙය විකුණුම, ශල්‍ය හා ක්‍රීඩා වැනි සියලු ක්ෂේත්‍රයන්ට අදාළ කාරණයකි. සාර්ථකත්වයේ මුදුන් මල්කඩ කරා ළඟාවීමේ මාර්ගය වනුයේ නිරන්තර පුහුණුව තුළින් ලබන අඛණ්ඩ ප්‍රගතිය වේ.

උදාහරණයක් ලෙස තම පාසලේ පැසිපන්දු කණ්ඩායමෙන් වරක් ඉවත් කළ මයිකල් ජෝඩන් නිරන්තර පුහුණුව තුළින් පැසිපන්දු ක්‍රීඩාවේ අමරණීය නාමයක් බවට පත්විය. ලූසියානෝ පවරෝටි නම් ලෝක ප්‍රසිද්ධ සංගීතඥයා මෙසේ පැවසීය. ''මාගේ පුහුණුව දිනකින් අතපසු වුවහොත් එය මට දැනේ. දින දෙකකින් අතපසු වුවහොත් එය මාගේ බිරිඳට දැනේ. දින 3 ක් වූ විට මුළු ලොවම එය දනී. මාස 18 දී තම පියා විසින් ගොල්ෆ් ක්‍රීඩාව හඳුන්වා දුන් ටයිගර් වුඩ්ස් නම් ළදරුවා වසර 18 දී එක්සත් ජනපද ආධුනික ගෝල්ෆ් ශූරතාවය දිනාගන්නා ලද්දේ අවුරුදු 15 ක නිරන්තර පුහුණුව තුළිනි.

මෙම පසුබිම ඇතිව අප ව්‍යාපාර කළමනාකරණය දෙස බලමු. මෙහිදී වන්නේ අවිනිශ්චිත පරිසරයක් තුළ ජනිත වන්නා වූ අසම්පූර්ණ තොරතුරු මත තීන්දු තීරණ ගැනීමය. ව්‍යාපාරික සාර්ථකත්වය සඳහා ඉතා වැදගත් වන්නේ නිවැරදි ආකල්පයකි. වාර්තා ඉදිරිපත් කිරීම, මූල්‍ය වාර්තා විග්‍රහයන්, අලෙවිකරණ උපාය මාර්ග, සැලසුම්, කේවල් කිරීම ආදී සියල්ලම දියුණු කළහැකි හැකියා වේ. කාර්යයක් වඩා හොඳින් කරගැනීමේ ආකල්පය හුදෙක් කාර්යයක් ඉටුකර ගැනීමට වෙර දැරීමට වඩා වැදගත් වේ.

මෙවැනි ආකල්පවලින් සැදුම්ලත් පුද්ගලයන් අවධානය යොමු කරන්නේ සිදුවන්නේ කුමක්ද? අවශ්‍ය තොරතුරු මොනවාද? සහ ප්‍රතිචාර කුමක්ද? යන කාරණා සම්බන්ධවයි. ඒ අනුව ඔවුන් තමන්ගේ චර්යාත්මක වෙනස්කම් සිදු කරනු ලබන බව පර්යේෂණයන් තුළින් තහවුරු කර ඇත. අවශ්‍ය වන්නේ නිවැරදි දැක්මක්, එය ඉටු කර ගැනීමට සැලැස්මක් හා එය ක්‍රියාත්මක කිරීමයි.

වඩාත්ම වැදගත් වන්නේ කාර්යයක් වඩා හොඳින් කිරීමට ඇති ආකල්පයයි. ක්‍රියාකාරකම් වර්ධනය කිරීමට ප්‍රතිපෝෂණය වැදගත් වේ. ප්‍රතිපෝෂණ ලැබෙන තෙක් බලාසිටිනු වෙනුවට විවිධ මූලාශ්‍රයන්ගෙන් ප්‍රතිපෝෂණය ලබාගත යුතුය. අදාළ ප්‍රතිපෝෂණයන්ට අනුකූලව චර්යාවද හැඩගස්වා ගතයුතුය. ඩාර්වින් වරක් පැවසූ පරිදි අවසානයේ ඉතිරි වනුයේ වඩාත් ශක්තිවන්ත හෝ වඩාත් බුද්ධිමත් ජීවී විශේෂය නොව වඩාත් හොඳින් වෙනස්වීම්වලට හැඩ ගැසිය හැකි ජීවී විශේෂයකි.

කෙසේ වුවත්, විශිෂ්ටත්වය හඹායෑම දීර්ඝකාලීන ක්‍රියාවලියක් ලෙස හඳුනාගැනීම ඉතා වැදගත් වේ. ඉඳහිට කරන උත්සාහයන් තුළින් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කරගත නොහැක. සහජ කුසලතා හා සාර්ථකත්වය අතර කිසිදු සම්බන්ධයක් නොමැත. විශිෂ්ට කුසලතා දක්වන කුඩා ළමයින් පිටුපස උද්යෝගිමත් දෙමාපියන් ඇත. කුඩාකල විශිෂ්ට දක්ෂතා දැක් වූ බොහෝ දෙනෙක් පසු කාලයේදී එවැනි දක්ෂතා දැක්වීමට අසමත් වෙති. එලෙසම බෙහෙවින් සාර්ථක වූ පුද්ගලයන්ගෙන් බොහෝමයක් ඔවුන්ගේ ජීවිතයේ මුල් කාලයේදී කිසිදු දක්ෂතාවක් පෙන්වා නොමැත.

යථාර්ථය වනුයේ ජීවිතයේ සාර්ථකත්වය හා පාසලේ සාර්ථකත්වය අතර සහ සම්බන්ධතාවක් පැවතිය නොහැකි බවයි. පාසලේ ඇගයීම් ආර්ථික සාර්ථකත්වය මැනීමට හොඳ මිනුම් දණ්ඩක් නොවේ. බොහෝ විට පාසල් අධ්‍යාපන ක්‍රමය මඟින් අවදානම් දැරීම අධෛර්යමත් කරයි. අධ්‍යාපන ක්‍රමය මඟින් ධෛර්යමත් කරනුයේ ආරක්ෂාකාරීව ක්‍රියා කිරීමයි. එහි ප්‍රතිඵලය වනුයේ පාසල් තුළ සාර්ථක වන බොහෝදෙනා පසුකාලීනව අවදානම් දැරීමට අකමැති වීමයි. ඩේවිඩ් ඔගෙල්වි පවසනුයේ දක්ෂතාවක් බොහෝදෙනා හමුවන්නේ විප්ලවකරුවන්, රැඩිකල්වාදීන් හා ගතානුගතික සිතිවිලිවලින් බැහැරවූවන් අතර බවය.

විශිෂ්ටත්වය කරා කෙරෙන අරගලය අඛණ්ඩ ක්‍රියාවලියක් වේ. අතරින් පතර කෙරෙන උත්සාහය තුළින් අපේක්ෂිත ප්‍රතිඵල ළඟාකර ගත නොහැක. නෝනාවරුනි, මහත්වරුනි ඔබ දැන් සිතනුයේ විශිෂ්ටත්වයට පැමිණිය හැක්කේ කෙසේද? මෙහිදී අපට අලෙවිකරණය පිළිබඳ විශාරදයෙකු වන පිලිප් කොට්ලර්ගේ උපදෙස් වැදගත් වේ. ඔහුගේ නිර්දේශය වන්නේ අප ජීවිත කාලපරිච්ඡේද 3 කට ගතකොට ඇති බවයි. පළමුවැන්න හඳුන්වන්නේ 1965-1980 RAF කාලයයි. (Ready, Aim, Fire) දෙවන කාලය හඳුන්වන්නේ RFA (Ready, Fire Aim) වශයෙනි. RFA උපාය මාර්ග මැනවින් භාවිත කළ රෝස් පෙරට් ඔහුගේ EDS කම්පැනිය 1980 General මෝටර්ස් වෙත විකුණා දැමුවත් General Motors එවිට සිටියේ Ready, Aim, Aim, Aim යන පියවරේය. 1995 දී පමණ සිදු වූ තවත් විශේෂ වෙනසක් වූයේ මෙය FFF උපාය මාර්ගයට ප්‍රවේශවීමය. එනම් Fire, Fire, Fire යන්නය.

FFF එළඹුම හොඳින් භාවිත කරනු ලැබුවේ Micorsoft සමාගමයි. අන්තර්ජාල අලෙවිකරණ විශාරදයෙකු වන සෙත් ගොඩ්වින්ට අනුව මයික්‍රොසොෆ්ට් සමාගමේ සාර්ථකත්වයේ රහස වනුයේ අසාර්ථකත්වයට හා විචාරයන්ට නිර්භය වීමයි. මයික්‍රොසොෆ්ට් සමාගම නිරන්තරයෙන්ම අසාර්ථක නිෂ්පාදනයන් නිතර වෙළඳපොළට ඉදිරිපත් කළ අතර ඒවා සම්බන්ධයෙන් දැඩිලෙස විචාරයට භාජනය වුනි. නමුදු ඔවුන් පිළිගත හැකි නිෂ්පාදනයකට ළඟාවන තුරු ඔවුන්ගේ නිෂ්පාදනයන් නිරන්තරයෙන්ම ඉදිරිපත් කර ඇත.

වොල්මාට් සමාගමේ නිර්මාතෘ සෑම් වෝල්ටන් ගැන හැඳින්වීමක් කිරීමේදී කිවහැක්කේ ඔහු කිසිදිනක අසමත්වීම ගැන කිසිදු පැකිලීමක් නොමැති බවය. පණිවිඩය ඉතා පැහැදිලිය. ඔබ තවමත් පටන්ගෙන නැත්නම් දැන්මම පටන් ගන්න. හැම්ලට් මෙන් වාසි අවාසි ගනිමින් නොසිටින්න. පළමු

පියවර තබන්න. ගොඩ සිට පිහිනිය නොහැක. වැරදි සිදුවීම්වලට බිය නොවන්න. අසාර්ථක උත්සාහයන්වල අත්දැකීම් අනාගත සාර්ථකයන් කෙරෙහි උපකාර කරගත හැක. කෙසේ වුවත් කාර්යයන් හොඳින් ඉටුකරගැනීම පමණක් නොසෑහේ. සාර්ථකත්වය ඇතිවන්නේ ඔබ කොතරම් හොඳින් ඔබගේ හැඟීම් කළමනාකරණය කරගත්තේද හා ඔබගේ තාර්කික චින්තනයක් සමඟ ගළපා ගන්නේ ද යන්න මත ය.

සාම්ප්‍රදායික බුද්ධි පරීක්ෂණයන් මඟින් කෙරෙන සාර්ථකත්ව මැනීම වෙනුවට නව සංකල්පයක් වන භාවාත්මක බුද්ධිය (Emotional Intelligence - EI) ඉදිරියට පැමිණ ඇත. තාර්කිකත්වය වෙනුවට භාවාත්මක බුද්ධිය හැඟීම් මත පදනම් වේ. පුද්ගල අවබෝධතාව ස්ව පුද්ගල පාලනය හා සානුකම්පිත-භාවය භාවාත්මක බුද්ධියේ මූලික ගුණාංගයි. තත්කාලීන පර්යේෂණයන් මඟින් හෙළිවන්නේ පුද්ගලයන්ගේ දක්ෂතා මැනීමට භාවිත කරනු ලබන බුද්ධි පරීක්ෂණ ඔවුන්ගේ ජීවිත සාර්ථකත්වය උපකල්පනය කිරීමට යෝග්‍ය නොවන බවයි.

බොහෝ විට ඔබටද පාසලේදී හෝ විශ්වවිද්‍යාලයේ දී හෝ අන්තර් පුද්ගල සබඳතාවලදී හෝ අසාර්ථක වන බුද්ධිමතුන් පිළිබඳ අත්දැකීම් තිබෙනු නොඅනුමානය.

බෙහෙවින් සාර්ථක කළමනාකරුවෝ යනු ගණකාධිකරණය හෝ සංඛ්‍යානයට හෝ ආර්ථික විද්‍යාවට හෝ පරිගණක විද්‍යාවට අතිදක්ෂ වූවෝ නොවෙති. යම් ආයතනයකට ඇතුළුවීමට ඔබට ඉහත කී හා වෙනත් ක්ෂේත්‍රයන්හි දක්ෂතා දැක්වීමට සිදුවුවද ඉන්පසු ඔබ කොතරම් හොඳින් ක්‍රියාත්මක වන්නේද යන්න තීරණය කරනු ලබනුයේ ඔබගේ භාවාත්මක මුහුකුරා යාමේ මට්ටමයි. පර්යේෂණයන්ට අනුව ජීවිතයේ සාර්ථකත්වය උදෙසා භාවාත්මක බුද්ධිය සාමාන්‍ය බුද්ධි පරීක්ෂණයට වඩා හතර ගුණයකින් පමණ වැදගත් වේ. ස්වයං විනය, පුහුණුවීම් හා අධ්‍යයනයන් තුළින් මෙම භාවාත්මක බුද්ධිය ජීවිත කාලය පුරා වර්ධනය කරගතහැකි වීම අපට සතුටට කරුණක් වේ.

හොඳින් ඉලක්කගත වුවද, ඉඳහිට කරන එළඹීම්වලින් අපේක්ෂිත ඉලක්කවලට එළඹිය නොහැකි බවට නැවත වරක් මතක් කරදෙනු කැමැත්තෙමි. නැවත නැවත සිදුවන පුහුණුවීම් මඟින් දුර්වලතා ධනාත්මක ශක්තීන් බවට පරිවර්තනය කරගත යුතුය.

ක්‍රියාකාරකම් වැඩි දියුණු කරගැනීමට දිනෙන් දින නිරන්තර පුහුණුව මඟින් ඇතිවන ආකල්පය චර්යාවන් ප්‍රතිපෝෂක මඟින් හැඩ ගැස්වීම, අසාර්ථකත්වයන් තුළින් දියුණුවීමේ මූලාශ්‍රයක් කරගැනීම, කාර්යයක් කිරීමේ එළඹුම හා භාවාත්මක පරිණතභාවය සඳහා යන ගමනේ පසු සැරසිල්ලක් කරගැනීම, සාර්ථකත්වයේ මූලාශ්‍රය වෙයි.

මයිකල් ඇන්ජලෝ වරක් පැවසූ පරිදි වඩාත්ම භයානක වන්නේ ඉතා ඉහළ බලාපොරොත්තු තබාගැනීම නොව ළඟාකර ගතහැකි බලාපොරොත්තුවක් තබාගෙන එය ඉටුකර ගැනීමයි. අසාර්ථකත්වය තුළ පවතින විශිෂ්ට පරිශ්‍රමයන් අප සාමාන්‍ය සාර්ථකත්වයට වඩා අගය කළයුතුය. වඩාත්ම වැදගත් වන්නේ ක්ෂේත්‍රයේ ක්‍රියාකාරියෙකු බවට පත්වීමයි. ටොම් පීටර් ජවසම්පන්න ''ක්‍රියාකාරිකයෙකු'' වීම සම්බන්ධයෙන් ඔහු සතු සාක්ෂි අපමණ විය. ඔහු ''පොහොසතෙක් විය'', ''ලෝක ප්‍රසිද්ධ විය'' ''කාර්යයන් නිවැරදිව ඉටුවිය'' යන පාඨයන් වෙනුවට ''ඔහු ක්‍රියාකාරිකයෙක් විය'' (He was a player) යන්න ඔහුගේ සොහොන් කොතේ සනිටුහන් කිරීමට ප්‍රිය කළේය.

උපාධි අපේක්ෂක, අපේක්ෂිකාවනි, ඔබ එසේ කළහොත් ඔබටත් ලෝකය සෙලවිය හැක.
අසා සිටි ඔබ සැමට ස්තූතියි.

<u>2007.01.31</u>

# 26

# මූලික දැනුම: විද්‍යාව, තාක්ෂණය, අධ්‍යාපනය සහ සමාජය මත එහි බලපෑම

## මහාචාර්ය කීර්ති තෙන්නකෝන්

මෙම උපාධි ප්‍රදානෝත්සවය ඇමතීමට ආරාධනා කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමන්ට හා සනාතන සභාවට මගේ ස්තූතිය පළකර සිටිමි. මෙහි පැමිණීම මට මහත් ප්‍රීතිය ගෙනදෙන කාරණයක් වන්නේ මා විශ්වවිද්‍යාලයීය ආචාර්යවරයකු ලෙස පළමු පියවර තැබුවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් වන හෙයිනි. ඊට ප්‍රථම කෙටි කාලයක් මා පාසල් ගුරුවරයකු ලෙස සේවය කළ අතර ඉන්පසු භෞතික විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධියක් හැදෑරීම පිණිස විදේශගත ව සිටියෙමි. මා 1972 දී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට පැමිණි විට, මෙම විශ්වවිද්‍යාලය හා මා මෙතෙක් දුන සිටි විශ්වවිද්‍යාලයන් අතර කැපී පෙනෙන වෙනසක් දුටිමි. විද්‍යා පීඨයේ සියලු අධ්‍යයනාංශ ඉතා සමීප සහයෝගයකින් කටයුතු කිරීමත්, ශාස්ත්‍රීය ඥානය පහසුවෙන් හුවමාරු කරගැනීමට යෝග්‍ය වන පරිසරයක් පැවතීමත් මා මෙහි දුටු විශේෂතාව යි. රසායන විද්‍යාව පිළිබඳ ව කුඩා කාලයේ මා තුළ පැවති උනන්දුව නැවත පිබිදුණේ මෙහි ප්‍රතිඵලයක් වශයෙනි. රසායන විද්‍යා අධ්‍යයනාංශ ගබඩාවලින් රසායන ද්‍රව්‍ය ''සොරකම්'' කොට භෞතික විද්‍යා අධ්‍යයනාංශයට ගෙනවිත් පර්යේෂණ කිරීමට මම පුරුදු වී සිටියෙමි. හැමවිට ම මගේ පළමු කැමැත්ත න්‍යායික භෞතික විද්‍යාව වූ නමුත්, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දී මා සිදුකළ පර්යේෂණ, රසායනවිද්‍යාව හා භෞතික විද්‍යාව යන විෂයයන් දෙක අතර වූ සීමාවක පර්යේෂණ කිරීම සඳහා මට මහත් විශ්වාසයක් ගෙන දුන්නේ ය. අභාවප්‍රාප්ත මහාචාර්ය පී.සී.බී. ප්‍රනාන්දු මහතාට මා ණයගැති වන්නේ, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට පැමිණෙනු වස් එතුමන්ගේ දිරිගැන්වීම නොතිබෙන්නට මා විදෙස් රටක නතර වීමට ඉඩ තිබූ බැවිනි. දෙවනුව ද මා එතුමාට ණයගැති වන්නේ මා හුදු විනෝදය සඳහා ආරම්භ කළ පර්යේෂණ නොනවත්වා කරගෙන යාමට එතුමන් අවසර ලබාදුන්  බැවිනි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මෙරට උසස් අධ්‍යාපනයේ අද්විතීය ස්ථානයක් උසුලයි. විද්‍යෝදය හා විද්‍යාලංකාර යන ලංකාවේ අභිමානවත් පිරිවෙන්, විශ්වවිද්‍යාලයන් බවට පත් කිරීමට මත්තෙන් ලංකාවේ පැවතියේ පේරාදෙණිය සහ කොළඹ මධ්‍යස්ථාන කොටගත් ලංකා විශ්වවිද්‍යාලය පමණි. නව විශ්වවිද්‍යාලයන් පිළිබඳ අදහස මතුවීමත් සමඟ ම එවකට සිටි උගතුන්ගේ අවධානයට ලක් වූ කාරණා කීපයක් විය. සුදුසුකම් ලත් ආචාර්ය මණ්ඩලයක් සොයා ගන්නේ කෙසේ ද, අධ්‍යයන ප්‍රමිතීන් පවත්වාගෙන යාමට අපට කෙතරම් දුරට හැකිවේ ද යනු මෙහි දී නැඟුණු ප්‍රශ්න යි. විශ්වවිද්‍යාලයක් ආරම්භ කිරීම එතරම් අපහසු කාර්යයක් නොවේ. බැරෑරුම් ම කාර්යය වන්නේ වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම එම ආයතන විශ්වවිද්‍යාලයන් බවට පත්කිරීමයි. කලින් කලට එක් වූ උපකුලපතිවරුන්, ආචාර්ය මණ්ඩලය හා පරිපාලකයන්ගේ මහත් වෙහෙසකර උත්සාහයන්හි ප්‍රතිඵලයක් ලෙස, වරින් වර ඇති වූ පසුබෑම් තිබියදීත් ඉහත අරමුණු සාර්ථක ව මුදුන් පමුණුවා ගැනීමට මෙම විශ්වවිද්‍යාලයට හැකි ව තිබේ.

අතිකුත් අභිනව විශ්වවිද්‍යාලයන්ට මුහුණදීමට සිදු වූ බාධාවන් ශක්තිමත් ව හා විප්ලවකාරී ලෙස ජය ගැනීමට මෙම විශ්වවිද්‍යාලයට හැකියාව ලැබුණි.

චීන කියමනකට අනුව ගසක් දස වසරක දී සම්පූර්ණයෙන් ම වැඩෙන මුත් ආයතනයක් ස්ථාවරභාවයට පත්වීමට වසර සියයක් ගතවෙයි. ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට නිතර පැමිණෙන මා එම භූමියේ පිහිටා ඇති වෘක්ෂයන් දිනෙන් දින උසින් උසට වැඩෙන අයුරුත් එම වේගයෙන් ම විශ්වවිද්‍යාලය ද ඉදිරියට පියවර තබන අයුරුත් දක ඇති අතර එය චීන කියමනට සහමුලින් ම ප්‍රතිවිරුද්ධ තත්ත්වයකි. ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය තවමත් අවුරුදු පනහක්වත් සම්පූර්ණ කොට නැත.

මා මෙහිදී මූලික දැනුම පිළිබඳ ව කතා කිරීමට තීරණය කළේ, එය භෞතික සම්පත්වලට වඩා වටිනාකමක් උසුලන හෙයිනි. අප ද ඇතුළු ව බොහොමයක් සංවර්ධනය වෙමින් පවතින රටවල් සියලු මනුෂ්‍ය ක්‍රියාකාරකම්වල දී මූලික දැනුමෙහි ඇති වැදගත්කම අවබෝධ කොට ගෙන නැත. මා මෙහි දී නිතර විද්‍යාත්මක දැනුම ගැන සඳහන් කරන මුත් මූලික ඥානය හැම විට ම විද්‍යාව සමඟ සබඳතාවක් ඇති බව ඉන් නොහැඟවේ. කිසිවකුටත් විද්‍යාව නිර්වචනය කිරීමට හෝ එය කලාවෙන් වෙන් කරනු වස් නිශ්චිත කඩ ඉරක් ඇඳීම හෝ කළ නොහැකි ය. මෙහි දී දැනුම යන්නෙන් සියලු විෂය පථ හා යථාර්ථය වටහාගැනීමේ ඉලක්ක අදහස් කැරෙයි.

ලෝකයෙහි විවිධ ස්ථානවල සෑම අස්සක් මුල්ලක් නෑර ම වන සිදුවීම්, අතිමහත් වූ තොරතුරු සමුදායක් උත්පාදනය කරයි. ඈත දුර පිහිටි ස්ථානයන්ට පවා මේ තොරතුරු බෙදා හැරීම අර්ධ සන්නායක තුළින් බිහි වූ පරිගණක තාක්ෂණය මඟින් යථාර්ථයක් බවට පත් කොට තිබේ. එහෙත් මෙම තොරතුරු ඔබ දැනුම බවට පත්කර නොගන්නේ නම් ඒවායින් ඵලක් නැත. අවබෝධය සහ ප්‍රඥාව සඳහා මඟපෙන්වාලන සංකල්ප මෙන් ම අන්‍යෝන්‍ය වශයෙන් බැඳී පවතින තොරතුරු මෙහි දී දැනුම යනුවෙන් අදහස් කැරෙයි. ප්‍රශ්න විසඳාලීම සඳහාත් යම් යම් අවස්ථාවන්ට මුහුණදීම සඳහාත් දැනුම භාවිත කිරීමේ හැකියාව ප්‍රඥාව යි. අප එක්රැස් කරගන්නා තොරතුරු භාවිතය තුළින් නව දැනුම නිර්මාණය කිරීමට මඟ පාදන්නේ අප සන්තකයේ දැනටමත් පවතින්නා වූ දැනුම යි. පරිගණකයට මිනිස් මොලයේ මැදිහත් වීමකින් තොර ව තොරතුරු ඇසුරින් දැනුම උකහාගැනීමේ හැකියාවක් ඇතැයි යන්නට සාධක නැත. එහෙයින් තොරතුරු ගවේෂණය සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම හෝ ඒ සඳහා මිනිසුන් පුහුණු කිරීම පමණක් ම ප්‍රමාණවත් නොවේ. තමා අභිමුව පවතින තොරතුරු ඇසුරෙන් දැනුම උකහාගැනීමට අපගේ මානව සම්පත හුරුකළ යුතු ය. දත්ත අධ්‍යයනය කරමින් එය නව දැනුම බවට පරිවර්තනය කරනු වස් අප සතු ව පවතින බලවත් ම උපකරණය නම් මූලික දැනුම යි. ඉතා සීමිත වූ පරිසරයක නිරීක්ෂණයන් හා බැඳී පවතින ප්‍රායෝගික දැනුම මෙන් නොව මූලික දැනුම සුවිශාල වපසරියක් අවශෝෂණය කරයි. එය තවදුරටත් තොරතුරු ලබාගැනීමට මෙන් ම දැනුම සංවර්ධනය කරගනු සඳහා නිගාමී සහ අනුගාමී තර්කනය භාවිත කරයි. පොදුවේ ගත්කල ප්‍රායෝගික දැනුම පිළිතුරු සපයන්නේ ''කෙසේ ද'' යනුවෙන් නඟනු ලබන ප්‍රශ්නයන්ට ය. එහෙත් මූලික දැනුම ''කෙසේ ද'' යන්නට මෙන් ම ''ඇයි'' යන ප්‍රශ්නයට ද පිළිතුරු සපයයි. මූලික දැනුමේ ඇති සාධනීය ලක්ෂණය වනුයේ එය ''ඇයි'' යන ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට උත්සාහ දැරීමේ දී ''කෙසේ ද'' යනුවෙන් නඟනු ලබන ප්‍රශ්න රැසකට ද නිරායාසයෙන් ම පිළිතුරු සපයන බැවිනි. මෙය තාක්ෂණික මෙන් ම සමාජීය සංවර්ධනයේ ද පූර්විකාව වී ඇත. මේ අනුව කිසිදු තර්කයකින් තොර ව ම නූතන ලෝකයේ, ජීවිතයේ ගුණාත්මක භාවය නංවාලීමේ ගාමක බලවේගය බවට පත්වන්නේ මූලික විද්‍යාත්මක දැනුම යි.

මෙම කරුණු සනාථ කිරීම සඳහා අතීතයෙන් කොතෙකුත් උදාහරණ ගෙනහැර දැක්විය හැකි ය. විවිධ සතුන්ගේ මලපහ, කොම්පෝස්ට් පොහොර හා ඛනිජමය ද්‍රව්‍ය තුරු ලතාවන්ගේ වැඩීම වේගවත් කරන බව දුටු පෞරාණික ගොවීහු, තම අස්වැන්න වැඩි කරගනු සඳහා මේ ද්‍රව්‍ය පසට එක් කළහ. ''මෙම පොහොර වර්ග අස්වැන්න වැඩිකළේ ''ඇයි'' දැයි ප්‍රශ්න කළ නූතන විද්‍යාව තුරු ලතාවන්ගේ වර්ධනය සඳහා නයිට්‍රජන්, පොටෑසියම්, පොස්පරස් සහ අනිකුත් කුඩා පෝෂක ගණනාවක් අත්‍යවශ්‍ය බව සොයාගත්තේ ය. මෙම සොයාගැනීම්වලට අදාළ ව පසුකාලයේ දී මතු වූ ප්‍රශ්න රාශියක් පෙරනොවූ විරූ ප්‍රායෝගික වටිනාකමකින් යුත් නවසොයාගැනීම් රාශියකට මඟ පෑදුවේ ය. එක් උදාහරණයක් ගෙනහැර දක්වතොත් ජර්මන් ජාතික රසායන විද්‍යාඥයකු වූ ෆ්‍රිට්ස් හේබර්, වායුගෝලීය නයිට්‍රජන්, ඇමෝනියා බවට පත්කිරීමට හැකි උත්ප්‍රේරකයක් සොයාගත්තේ ය. නයිට්‍රජන් භාවිතයෙන් පොහොර නිෂ්පාදනය කරන සියලු වාණිජ ආයතන භාවිත කරනුයේ හේබර් හඳුන්වාදුන් ක්‍රමවේදය යි. හේබර්ගේ ක්‍රමවේදය නොතිබෙන්නට වත්මන් මනුෂ්‍ය ජනගහනය පෝෂණය කිරීම අසීරු කරුණක් වනු ඇත. තවත් ප්‍රකට උදාහරණයක් වන්නේ ලුවී පාස්චර් විසින් කරන ලද පර්යේෂණය යි. ලෝකය යටත් කර ගැනීමේ පිපාසයෙන් පෙළුණු, තෙවන නැපෝලියානු අධිරාජයා තම අරමුණ සඳහා බාධාවක් වේ යැයි සිතූ සිය නාවික හමුදාවේ ඇති වූ කැරැල්ලක් පිළිබඳ ව මහත් සේ කම්පාවට පත් විය. නැව්වල ගබඩාකොට තිබූ වයින් නරක් වීම මෙම කැරැල්ලට හේතු වී තිබූ අතර අධිරාජයා මේ සඳහා පාස්චර්ගේ සහාය පැතුවේ ය. මෙය සියුම් ලෙස අධ්‍යයනය කළ පාස්චර්, වයින් නරක් වීමට බල පෑ හේතුව හා එය කල්තබා ගැනීමේ ක්‍රමවේදයට අමතර ව මෙතෙක් නොහඳුනාගත් ඉතා සියුම් ජීවීන් විශේෂයක් ද සොයා ගත්තේ ය. මෙහි ප්‍රතිඵලයක් ලෙස බොහෝ රෝග සඳහා ප්‍රතිකාර මෙන් ම රෝගකාරක ආසාදන වළක්වාලීමේ ක්‍රමවේදය සොයා ගැනිණි. මෙම කටයුත්ත හමාර කළ පාස්චර් සිය විද්‍යාගාර මේසය ඉදිරියේ පහත දැක්වෙන වැකිය ලියා තැබූ බව කියැවේ.

''යමෙක් විද්‍යාවේ ප්‍රායෝගික භාවිතය ගැන පමණක් සිතන විට, ඔහුගේ නිර්මාණශීලීත්වය වැනසී යයි.''

''මෙහි දී පාස්චර්'' ප්‍රායෝගික ඉලක්ක සඳහා යොමු වූ පර්යේෂණවල වැදගත්කම අවතක්සේරු කළා නොවේ. ඔහු විසින් විග්‍රහ කරනු ලැබ ඇත්තේ අසීමිත ලෙස කරන විද්‍යාත්මක විමසීමෙහි ඇති වැදගත්කම යි. න්‍යායාත්මක අංශය ගැන ගැඹුරු දැක්මක් ඇති පාස්චර්ට පරීක්ෂණවල ප්‍රතිඵල කල්තියා හඳුනාගැනීමේ සහජ ඉවක් තිබිණි. සමහර විට ඔහු, තමා ගැන ම සඳහන් කරමින් මෙසේ පවසා තිබේ.

''සූදානම් වූ මනසට වාසනාව පවා ආශිර්වාද කරයි.''

තොරතුරුවලින් බහුල වූ ලෝකයක වෙසෙන අපට අවශ්‍ය වන්නේ සූදානම් වූ මනස් ඇති ස්ත්‍රීන් සහ පුරුෂයෝ ය. ''සූදානම් වීම'' යනුවෙන් අදහස් කරන්නේ, යමෙකුගේ විෂය පථයෙහි ඇති සියලු ම දේ දැනගැනීම හෝ විෂය කරුණු ගැන පරිපූර්ණ වීම නොවේ. යමෙකුට අවබෝධ කොටගත හැක්කේ, ඔහු හෝ ඇය ඉදිරියේ ඇති දැනුම් සම්භාරයෙන් අල්ප මාත්‍රයක් පමණි. ''සූදානම් වූ මනසක්'' ඇත්තා තමන් දකින දේ විනිවිද දකින අතර ඔහුට හෝ ඇයට අවශ්‍ය දැනුම් කොටස්, අවශ්‍ය අවස්ථාවට අනුකූල ව උපුටා ගනියි. අයින්ස්ටයින් ගණිතඥයෙක් නොවේ. එහෙත් ඔහුගේ මනස සුවිශේෂී ලෙස සාමාන්‍ය ප්‍රමාණයට වඩා සකස් ව තිබිණි. ඔහුට, ගුරුත්වාකර්ෂණ න්‍යායයන් සඳහා අවශ්‍ය වන ගණිත කරුණු හඳුනාගන්නටත්, ඒවා ගොනු කොට ගන්නටත් හැකිවිය.

අධ්‍යාපනයේ අරමුණ ''මනස සකස් කිරීම යි'' එනම්, දැනීම ලබාගැනීමටත්, ගැටළු විසඳීම සඳහා අවශ්‍ය ප්‍රඥාව ලබාගැනීමටත්, සමාජ නිරවුල්භාවය පවත්වාගෙන යාම සඳහා දායක වීමටත් ය. දැනීම ලබාගැනීමට අවස්ථා සකස් කොට දෙමින්, අධ්‍යාපනය මිනිසා අවිද්‍යාවෙන් මුදවාලයි. සෑම විෂය ක්ෂේත්‍රයක ම අඩංගු මූලික දේ එය යි; න්‍යායාත්මක ව්‍යුහයක් සහිත ව මනස සූදානම් කොට තියුණු කරන්නේ අධ්‍යාපනය යි.

අධ්‍යාපනයේ ඇති මෙම මූලික අරමුණ නොසලකා, විෂයයන්හි ඇති මූලික කරුණු අවබෝධ නොකොට, කළ විෂය සංශෝධනයක් දැනට බලපැවැත්වෙයි. ඇතැම් දෙනා පාසල්වල ඉගැන්වූ විෂයයන් ''ප්‍රයෝජනවත්'' සහ ''අප්‍රයෝජනවත්'' ලෙස කොටස් දෙකකට වෙන් කරති. එක්තරා විෂය ප්‍රතිසංස්කරණ කමිටුවක් විසින් භෞතික විද්‍යාව, සංස්කෘත හා ඉතිහාසය යන විෂයයන් ''අප්‍රයෝජනවත්'' විෂයයන් වශයෙන් ගොනුකොට ඇතැයි කියැවේ. වෛද්‍ය විද්‍යාව හැදෑරීමට, උසස්පෙළ භෞතික විද්‍යාව අත්‍යවශ්‍ය මූලික සුදුසුකමක් නොවේ ය යන තීරණයට එළඹීමට ඉහත කී වර්ග කිරීම් මෙන් ම වෙනත් කරුණු ද හේතු විය.

වෛද්‍යවරුන්ට භෞතික විද්‍යාව ගැන යම් අවබෝධයක් තිබිය යුත්තේ, උසස් තාක්ෂණයෙන් යුත් වෛද්‍ය මෙවලම් භාවිත කිරීමට පමණක් ම නොවේ. රුධිර පීඩනය මැනීම වැනි කරුණු සඳහාත් භෞතික විද්‍යාව ගැන දැනුම අවශ්‍ය වෙයි. භෞතික විද්‍යාව, ඉතාම නිවැරදි රෝග විනිශ්චය ලබාදීම සඳහාත් වෛද්‍යවරයකුට පුහුණුවක් ලබා දෙයි. සමහරු වෛද්‍යවරුන් මුණගැසීමට යාමට පෙර ඔවුන්ගේ නමට අගින් ඇති ඉංග්‍රීසි අකුරු දෙස බැලීමට පුරුදු ව සිටිති. අනාගතයේදී, ඒ ඉංග්‍රීසි අකුරුවලට අමතර ව උසස් පෙළ විභාගයට හැදෑරූ විෂයයන් ගැනත් සොයා බැලීම ප්‍රඥාවන්ත දෙයක් විය හැකි ය.

මූලික උපාධි විෂය පථයට, ව්‍යවහාරික පථ එකතු කිරීම, මෑතකදී සිදු වූ තවත් ප්‍රවණතාවකි. මෙවන් පාඨමාලා හදාරන උපාධිධාරීන්, කර්මාන්ත ක්ෂේත්‍රයට වඩාත් සුදුසු යැයි කියති. මෙය නිවැරදි තර්කයක් ද? එය සනාථ කිරීමට අප සතු ව සාධක තිබේ ද? කර්මාන්ත ක්ෂේත්‍රය ඉල්ලා සිටින්නේ තියුණු සහ ඕනෑම අවස්ථාවකට සුදුසු ලෙස වෙනස් විය හැකි මනස් සහිත පුද්ගලයන් ය. මෙම තත්ත්වය ලබාගත හැක්කේ මූලික විද්‍යා කරුණු මඟිනි. ඔබ එම මූලික කරුණු අවබෝධ කරගත් විට ඕනෑම අවස්ථාවකට සුදුසු පරිදි මුහුණ දීම ඉතා පහසු වේ. සමහර විෂය සංශෝධනවලදී මෙවැනි අවශ්‍යතා පවා නොසලකා හැර ඇත.

විෂය කරුණු අතර අන්තර් සම්බන්ධය යමෙකුගේ දැනුම පළල් කළ ද එය කළ යුත්තේ මූලික දැනුම විනාශ කිරීමෙන් හෝ මූලික දැනුම නැතිකිරීමෙන් නොවේ. ගණිතය පිළිබඳ මූලික පසුබිමකින් තොර ව යමෙකුට භෞතික විද්‍යාව පාඨමාලාවක් සාර්ථක ව හැදෑරිය හැකි ද? පෙර මා සරසවි සිසුවකු ලෙස සිටි සමයේ භෞතික විද්‍යා අංශවලට ගණිතය ආගන්තුක විෂයයක් විය.

පූර්ව අවශ්‍යතා සපුරාලනු වස්, ගණිතය ශ්‍රී ලංකාවේ භෞතික විද්‍යා විෂය පථයට මුල්වරට එකතු කරන ලද්දේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසිනි. තවමත් මෙම විශ්වවිද්‍යාලය, එම සම්ප්‍රදාය එලෙස ම පවත්වා ගෙන යාම ගැන මම සතුටු වෙමි. ඇත්තෙන් ම ඉලෙක්ට්‍රොණික විද්‍යාව හැදෑරිය යුත්තේ භෞතික විද්‍යා විෂය ප්‍රගුණ කිරීමෙන් පසුව ය. ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ නව නිපුණතාවන්ගෙන් පිරිපුන් පුද්ගලයන් සුළු ගණනක් මට හමු වී ඇත. ඔවුහු ඉලෙක්ට්‍රොණික විද්‍යාව පිළිබඳ ''කෘත්‍රිම'' පාඨමාලා හදාළ අය නොවෙති, අලුත් අලුත් දේ ගැන සොයන්නට ඇති ආශාව නිසා ම ඉලෙක්ට්‍රොණික උපකරණ සමඟ ''සෙල්ලම්'' කළ අය වෙති. මේ අයට නියමිත කාලවල දී

මූලික විද්‍යා කරුණු ගැන අවබෝධයක් ලබා දී තිබුණේ නම් ඔවුන් විස්මිත නිමැවුම් කරන දක්ෂයන් වන්නට ඉඩ තිබිණි.

දැන් අප විසින් ආර්ථික වාසි බලාපොරොත්තුවෙන් තොරතුරු තාක්ෂණයට වැඩි බරක් දී තිබේ. අපේ අසල්වැසි ඉන්දියාව මෙය නිසි පරිදි යොදාගැනීමෙන් ඉන් සාර්ථකත්වය ලබා තිබේ. ශිෂ්‍යයන් මෙයට ආකර්ෂණය වී ඇත්තේ වාසිදායක රැකියා අවස්ථා ලබාදෙන නිසා ය. ප්‍රයෝජනවත් නිපුණතා ලබාදෙමින් අපේ මානව සම්පත් දියුණු කරන නිසා, මෙම ආයෝජනය සාධාරණීකරණය කළ හැකි ය. එහෙත් මෙම තොරතුරු සම්බන්ධීකරණ තාක්ෂණය පිටුපස ඇති අභියෝගාත්මක දියුණුව අප විසින් අමතක කරනු ලැබ ඇත්තේ ය. දශක ගණනක් තුළ කරන ලද සංකීර්ණ මූලික භෞතික විද්‍යා පර්යේෂණවලින් පෝෂණය වූ ක්වොන්ටම් ඉලෙක්ට්‍රොණික විද්‍යාව විසින් බිහි කරන ලද ට්‍රාන්සිස්ටරය කරණ කොටගෙන තොරතුරු තාක්ෂණය යථාර්ථයක් බවට පත් විය. ට්‍රාන්සිස්ටරය යනු විසි වන ශතවර්ෂයේ සිදු වූ හොඳම සොයාගැනීම යි. එය මනුෂ්‍යයාගේ ජීවන තත්ත්වය උසස් කරලීමට දායක විය. අපි මේ ආකාරයෙන් මූලික දැනුමින් පෝෂිත උසස් අධ්‍යාපනයකට සිසුන් ද උනන්දු කළ යුතු වෙමු. එවිට විද්‍යාව බටහිර රටවල මෙන් ස්ථිර වශයෙන් ම අපේ සංස්කෘතිය හා තදින් බැඳුණු අංගයක් වන්නේ ය. විද්‍යාව හා තාක්ෂණය සමග බැඳී ඉස්මතු වී එන වෙනත් පැති ද අපට නොතකා හළ නොහේ.

කාන්තාවන්ගේ ඇඳුම් ආයිත්තම්වල විලාසිතා මෙන් ම විද්‍යාවේ ද විලාසිතා එමට ය. ඒ විලාසිතා ආශා ඉස්මතු කරයි. එය මිනිස් ස්වභාවයේ අංගයකි. අවංක හා එකඟතාවකින් යුතු ව අනුගමනය කරන්නේ නම් විලාසිතා අයහපත් දෙයක් නොවේ. දශක දෙකකට පමණ පෙර විද්‍යාවේ විලාසිතාව වූයේ ජීව තාක්ෂණය යි. මෙහි දී අප කරන කියන තරමට සාපේක්ෂ ව ඉන් කොපමණ ඵල ලබා ඇද්ද? අද විද්‍යාවේ විලාසිතාව බවට පත් වී ඇත්තේ ''නැනෝ'' තාක්ෂණය යි. කාර්මික විප්ලවයේ ප්‍රතිඵලවලට සම වූ ප්‍රතිඵල ''නැනෝ'' තාක්ෂණයෙන් ලැබිය හැකි ය. කාලය මෝරන විට විලාසිතා එයි. ඔබ ඒවා සුදුසු පරිදි තෝරා ගන්නට දක්ෂ නම් ඒවායේ වටිනාකම ගණනය කළ නොහේ. ''නැනෝ'' තාක්ෂණය සම්බන්ධයෙන් මේ සාර්ථකත්වය ලැබෙන්නේ මූලික විද්‍යාව පිළිබඳ නිපුණතාවෙනි.

අධ්‍යාපනයට කොතෙක් ආයෝජනය කොට තිබුණ ද අධ්‍යාපන මට්ටම අතින් අප තවමත් දුප්පත් යැයි ඇතැමෙක් සිතති. උසස් පාසල් අධ්‍යාපනය හදාරා උපාධිධාරීන් ලෙස අපේ විශ්වවිද්‍යාලවලින් පිටවෙන අයට රැකියා ලබාගැනීම ඉතා දුෂ්කර යැයි ද ඔවුහු කියති. මේ උපාධිධාරීන් කර්මාන්ත ක්ෂේත්‍රයට හා කෘෂිකර්මයට අදාළ අධ්‍යාපනයක් ලබා නොමැති බැවින් ඔවුනට ආර්ථිකයට දායක විය නොහැකි යැයි ද ඔවුහු තවදුරටත් කියති. එහෙයින් අපේ අධ්‍යාපන ක්‍රමය දැඩි ලෙස සංශෝධනය කළ යුතු ය.

සැබවින් ම අධ්‍යාපනය උදෙසා අප විසින් කොට ඇති ආයෝජනය මුලුමනින්ම සාධාරණීකරණය කළ හැකි ය. තව ද ඉන් අපට ඉමහත් ප්‍රතිලාභ ද ලැබී තිබේ. සාක්ෂරතාව පමණක් නොව නාගරික ජන කොට්ඨාශවල මෙන් ම ගම්බද සාමාන්‍ය අධ්‍යාපන තත්ත්වය ද ඉතා උසස් මට්ටමක පවතියි. සංවර්ධනය වෙමින් පවතින බොහෝ රටවල, පිළිගතහැකි මට්ටමේ අධ්‍යාපන මට්ටමක් පෙන්නුම් කරන්නේ නගරවල පමණි. දුගීභාවයෙන් පෙළුණ ද අපේ ජනතාවට බොහෝ දේවල් පිළිබඳ හොඳ අවබෝධයක් තිබෙන බව පෙන්නුම් කරයි. අපේ ජනගහනයෙන් විශාල කොටසක් සාමාන්‍ය සෞඛ්‍ය ක්‍රම පිළිපදිති. එච් අයි වී වයිරසයේ අඩු ව්‍යාප්තියක් තිබීම අප ජනතාවගේ ඒ අවබෝධයට කදිම නිදසුනකි. මිනිස්සු අධ්‍යාපනය අගය කරති. ඔවුහු සිය දරුවනට අධ්‍යාපනය ලබාදීම තම මූලික

වගකීමක් ලෙස ද සලකති. වැරැද්ද ඇත්තේ අන් තැනක යි. ''අදාළ දෙයට පමණක්'' සීමා වූ යෝජිත අධ්‍යාපන සංශෝධන ක්‍රියාත්මක කළහොත් අප වැටෙන්නේ නරක තැනින් ඊටත් වඩා නරක තැනකට යි. මේ වනතෙක්, අපේ විශ්වවිද්‍යාලවලින් බිහිවන උපාධිධාරීහු හොඳ තත්ත්වයක සිටිති. විෂය නිර්දේශය අදාළ ප්‍රමිතීන්ට අනුකූල නොවුවා නම්, ඔවුන් විදේශ අධ්‍යාපනය මනා ලෙස අවසන් කොට ගන්නේ කෙසේද? සැබවින් ම බරපතල ගැටලුව ලෙස පෙනී යන්නේ අවස්ථා හිඟ වීම යි. මෙවැනි අවස්ථා සුළු සුළු වෙනස්කම් පමණක් කොට කෘත්‍රිම ලෙස නිර්මාණය කළ හැකි නොවේ. ඒ සඳහා, දැනට පවතින කර්මාන්ත සහ ඉදිරියේ දී ඇති කරන කර්මාන්ත සුදුසු මං පෙත් ඔස්සේ ගෙනයාමට සමත් ශක්තිමත් පර්යේෂණ සම්ප්‍රදායක් බිහි විය යුතු ය.

නූතන ආර්ථික තත්ත්ව පදනම් ව ඇත්තේ ස්වාභාවික සම්පත්වලට වඩා මානව සම්පත්වල තිබෙන දැනුම් සම්භාරයේ ශක්තියෙනි. අපේ ආර්ථිකමය දුර්වලතාවට බොහෝ විට හේතු වන්නේ විද්‍යාත්මක පසුබැස්ම යි. උසස් අධ්‍යාපනයේ තත්ත්වය හොඳින් තබාගන්නේ නොමැති ව අපට තරඟකාරී තාක්ෂණයට ඇතුළු විය නොහැකි ය.

ප්‍රථම උපාධි මට්ටමෙන් අපට සෑහීමට පත්විය හැකි තත්ත්වයක් තිබුණ ද පශ්චාද් උපාධි මට්ටමෙන් වෙනස්කම් කිරීම හා නව පණක් ලබාදීම අවශ්‍ය ය. මෙහි දී ද මූලික විද්‍යානුකූල හා න්‍යායාත්මක ඥානයේ වැදගත්කම අවතක්සේරු කොට කෙලින් ම ව්‍යවහාරික නව සොයාගැනීම්වලට යාමට උත්සුක නොවිය යුතු ය. ඇමරිකා එක්සත් ජනපදයේ පශ්චාද් උපාධි සඳහා යන අපේ උපාධිධාරීනට සිය පර්යේෂණ කටයුතු ඇරඹීමට ප්‍රථම අවුරුද්දක් හෝ දෙකක් මූලික විෂය ක්ෂේත්‍රයක් ගැඹුරු ලෙස අධ්‍යයනය කිරීමට සිදුවේ. ඇමරිකා එක්සත් ජනපදයේ පශ්චාද් උපාධි අධ්‍යාපන මට්ටමේ විශිෂ්ටත්වය මෙන් ම ඔවුන්ගේ තාක්ෂණික ප්‍රගතියට ද හේතුකාරක වන්නේ මෙම මූලික දැනුමට ඔවුන් දී ඇති ප්‍රමුඛත්වය යි. අපගේ විද්‍යා අධ්‍යාපනය සම්බන්ධ පශ්චාද් උපාධි පාඨමාලා බොහොමයක් ම විශේෂිත වූ අවස්ථාවලට පමණක් සුදුසු පරිදි නිර්මාණය කරගත් ඒවා ය. පසුගිය වසර කිහිපය තුළ ස්වාභාවික විපත් බොහොමයක් සිදු වූ බැවින් ස්වාභාවික විපත් පාලන පාඨමාලා හිටිහැටියේ ම බිහි වී තිබේ.

අපගේ සාමාන්‍ය අධ්‍යාපන තත්ත්වය බෙහෙවින් ඉහල මට්ටමක පැවතුණ ද ගුණාත්මක භාවයෙන් හා විශිෂ්ටත්වයෙන් එය බොහෝ දුරස් ව ඇත.

බටහිර ලෝකය විද්‍යාව භාවිත කොට ධනවත් වූ ආකාරය සහ අපට එසේ කිරීමට නොහැකි වූයේ මන්ද යන්න විශ්ලේෂණය කිරීමෙන් යම් දෙයක් ඉගෙන ගත හැකි ය. වසර දෙදහසකට පමණ පෙර ශ්‍රී ලංකාව තාක්ෂණය සහ සංස්කෘතිය අතින් ඉතාමත් ම දියුණු වූ රටක් විය. අපගේ වාර්මාර්ග පද්ධතිය, සිවිල් ඉංජිනේරු තාක්ෂණය හා යකඩ වැඩ කිරීමේ හැකියාව සියලු තත්කාලීන ශිෂ්ටාචාරවල තත්ත්වය අභිභවා ගියේ ය. ලාංකික ලෝහ මෙවලම්වල මිල ආසියාවේ බොහෝ ප්‍රදේශවල ඉතා ඉහළ වූ අතර පෙරදිග එවැනි තාක්ෂණික හැකියාවන් තිබුණේ ඉතා සුළු රටවල් කීපයකට පමණි. මේ සියලු දියුණුවීම් අයත් වූයේ විද්‍යානුකූල නොවූ ප්‍රායෝගික තාක්ෂණය නම් වූ ප්‍රභේදය යටතේ ය. විද්‍යාවේ මූලයන් මුලින් ම දක්නට ලැබුණේ පෙරදිග ය. ඉන් පසු ඊට වඩා ප්‍රමාණයකට ග්‍රීසියේ හා අරාබියේ ය. ස්වභාව ධර්මයේ නොතේරෙන දෑ අවබෝධ කොට ගැනීමට මුලින් ම ගණිතය හා තර්ක ශාස්ත්‍රය භාවිත කළෝ ග්‍රීක්වරු ය. ප්ලේටෝ විසින් පරීක්ෂණ පවත්වා දැනුම ලබා ගැනීම ප්‍රතික්ෂේප කළත් ඔහුගේ ශිෂ්‍යයකු වූ ඇරිස්ටෝටල් පරීක්ෂණ කිරීමට ඇල්මක් දැක්වූයේ ය. ග්‍රීසියේ බුද්ධිමය බලපෑම බටහිරට සංක්‍රමණය වූ අතර ඇරිස්ටෝටල්ගේ දර්ශනය විශාල බලපෑමක් කොට බොහෝ කාලයක් එහි රැඳුණේ ය. ග්‍රීක විද්‍යාත්මක බලපෑමක් අපගේ ප්‍රදේශයට කිඳා නොබැස්සේ

මන්ද? දුරස්ථභාවය එක හේතුවක් විය හැකි ය. එහෙත් එයටත් වඩා හේතු වූයේ අපගේ පෙරදිග සංස්කෘතිය, පිටින් ආ දෑ භාර ගන්නට දක්වන අකමැත්ත ය. ග්‍රීක දර්ශන ශාස්ත්‍රය හා ගණිත ශාස්ත්‍රය ඉන්දියාවට ද ආවේ ය. උගත් ඉන්දියානු ශාස්ත්‍රවේදීන් කැමැත්තෙන් ම ඒවා ග්‍රහණය කොට ගත්ත ද ඒවා කරපින්නා ගත්තේ නැත. එකල බටහිර සංස්කෘතික රික්තකයක් වූ බැවින් ග්‍රීක සංකල්ප ඉතා පහසුවෙන් ඔවුන්ගේ සමාජයට කිඳා බැස්සේ ය. ග්‍රීසියෙන් අනිත් යුරෝපීය රටවල්වලට ආ ඥානය කෙටි කලක් එහි තිබී විද්‍යාව සේ මල් පල ගැන්විණි. විද්‍යානුකූල ක්‍රමවේදය අවබෝධ වීමෙන් ව්‍යවහාරික තාක්ෂණය, විද්‍යාව මත පදනම් වූ තාක්ෂණයක් බවට හැරවිණි. අපරදිග ආර්ථික දියුණුවට මූලික ම හේතුව වූයේ මෙය යි. අපට මෙය මෙසේ කිරීමට නොහැකි වූයේ අපේ දුබලතාවක් නිසා නොව යම් සිද්ධිදාමයක් නිසා ය. බටහිර විද්‍යාව හා තාක්ෂණය දියුණුවෙමින් පවතින යුගයක අපි යටත් විජිතයක් ව සිටියෙමු. මෙය අප රටෙන් ම බිහි වූ ඥානය දියුණු කරවීමට තුඩුදුන් තත්ත්වයක් නොවේ. එහෙත් යටත් විජිත යුගයේ විද්‍යාව අප රටට ද ආවේ ය. බටහිරින් ආ වෙනත් දේ අගය කළා සේම අපි විද්‍යාව ද අගය කළෙමු. එංගලන්තයේ අධ්‍යාපනය ලැබූ රදළ පන්තියේ කීප දෙනෙකුට මිස විද්‍යාව විශේෂයෙන් ම ඉංග්‍රීසි නොදත් සාමාන්‍ය ජනයා අතරට ගියේ ඉතා අඩුවෙනි. ලංකාවට ම උරුම වූ විද්‍යානුකූල සංකල්පවලට වැඩි අනුබලයක් නොලැබිණි. මාර්ටින් වික්‍රමසිංහ, මිනිසාගේ පරිණාමය පිළිබඳ ව කෘතියක් බිහිකළ විට ඔහු, බටහිර අධ්‍යාපනය ලැබූ උගතුන්ගේ අවමානයට ලක්විය. ඉතා උසස් ශාස්ත්‍රීය අගයකින් යුතු මේ කෘතිය ස්වභාව ධර්මයට ඇල්මක් දක්වූ ඉතාමත් ම නිර්මාණශීලී ශ්‍රී ලාංකිකයකුගේ නැවුම් සිතිවිලි දාමය පිළිබිඹු කරයි. විද්‍යාවේ පණිවිඩය මෙරට බුද්ධිමතුන්ට ලබා දීම සඳහා විශාල මෙහෙයක් කළේ මෙම විශ්වවිද්‍යාලයේ කුලපතිවරයකු වූ ආචාර්ය ඊ.ඩබ්ලිව්. අදිකාරම් මහතා යි. ඔහුගේ ග්‍රන්ථ, පුවත්පත් ලිපි සහ නවීන විද්‍යා නම් විද්‍යා සඟරාව ද 1950 මුල් භාගයේ විශාල උද්යෝගයක් ඇති කළේ ය. පරමාණුව පිළිබඳ ව හිරෝෂිමා සිද්ධියට අවුරුදු කීපයකට පසු ව ඔහු විසින් රචිත කෘතියක් විය. එය පරමාණුව ගැන දැන ගැනීමට අවශ්‍ය වූ සියලු ම දෙනාට පරමාණුක විද්‍යාව ඉගැන්වූයේ ය.

නිදහසට පසු බලයට පත් රජයන්, අධ්‍යාපනය හා විශ්වවිද්‍යාලයන් වර්ධනය කිරීමට මූල්‍ය සම්පත් නිර්ලෝභී ව ලබාදීම නිසා අපට සියලු සේවා සඳහා අවශ්‍ය විද්‍යානුකූල හා තාක්ෂණික දැනුමක් ඇති පුද්ගලයන් බිහි කිරීමට හැකි වී තිබේ. එහෙත් ස්වදේශීය පර්යේෂණ සංස්කෘතියක් බිහිකිරීමට, විද්‍යාත්මක නිර්මාණශීලීතාව ජීවිතයේ කොටසක් බවට පත් කොට ගනිමින් සාමාන්‍ය තත්ත්වයන් අභිභවා යෑමට අප අසමත් වී ඇත. විද්‍යාව යනු නියත වශයෙන් ම ජාත්‍යන්තර වූ දෙයකි. එහි දියුණුව සඳහා ලෝකයේ වෙනත් ප්‍රදේශවල සිදුවන දේ ගැන දැනගැනීම හා තත්කාලීනයන් සමඟ සහසම්බන්ධතාව ඉතා අවශ්‍ය ය. මෙසේ සිතනවා වෙනුවට අප ඇතැම් අය විශ්වාස කරන්නේ අධ්‍යාපනයේ සහ පර්යේෂණයේ අරමුණ විය යුත්තේ දැනට අත්‍යවශ්‍ය ව්‍යවහාරික අවශ්‍යතා සපුරා ගැනීම බව ය. බුද්ධියට ආමන්ත්‍රණය කරන වැදගත් ම පර්යේෂණ, ධනවත් රටවලට පමණක් යෝග්‍ය යැයි ඔවුහු සිතති. මෙසේ සිතීමට සැඟවුණු හේතුව විය හැක්කේ වඩාත් දුෂ්කර සහ අභියෝගාත්මක කටයුතු කෙරෙහි යොමු වීමට ඇති බියගුලුකම විය හැකි ය. සැබවින් ම අපගේ සංස්කෘතිය මඟින් අපට එවැනි අභියෝගවලට මුහුණ දීමට අවශ්‍ය ශක්තිය ලබා දී ඇත. අවශ්‍ය වන්නේ පුද්ගලයන් තුළ වූ සහජ හැකියාවන් දියුණු කොට ඔවුන් නිවැරදි මාර්ගයේ යෑමට දිරි ගන්වන අයුරින් අපගේ ප්‍රතිපත්ති නැවත සකස් කිරීම ය.

විද්‍යාවේ සොයාගැනීම් අප මවිත කරවයි. සෙලියුලර් දුරකථන, පරිගණක යන්ත්‍ර, අභ්‍යවකාශ යානා, බෙහෙත් වර්ග, නවීන කෘෂිකාර්මික නිෂ්පාදන මෙම ප්‍රභේදයට අයත් වෙයි. මීටත් වඩා පුදුමාකාර වන්නේ මේ සියලු ම දේට පදනම දැමූ විද්‍යාත්මක දැනුම යි. අප රටේ බුද්ධි ප්‍රබෝධයකට හා තාක්ෂණික දියුණුවීමකට අත්‍යවශ්‍ය කාරණයක් වන්නේ සමාජයට විද්‍යාත්මක දැනුමේ බලය

අවබෝධ කරවීම සහ න්‍යායාත්මක විද්‍යාව කරා අධ්‍යාපනය හා පර්යේෂණ යොමු කරවීම යි. අපගේ පුවත්පත්, සඟරා, විද්‍යුත් මාධ්‍ය සහ විද්‍යාත්මක සංවිධාන කීපයක් සාමාන්‍ය ජනතාවට හා ශිෂ්‍යයන්ට විද්‍යා දැනුම ලබාදීමට බොහෝ උපකාර වී ඇත. එහෙත් මෙම බොහෝ වැඩ සටහන් විද්‍යාවේ පෙනෙන්නට ඇති ඵලයන් මත අවධානය යොමු කිරීමක් ලෙස හැඳින්විය හැකි ය. විද්‍යාවේ අනිත් ප්‍රභේදය ජනතාව අතරට මෙසේ ගෙන යෑම එවැනි ම වැදගත්කමින් යුක්ත ය. නැණවත් සිත් සතන් විද්‍යාව කෙරෙහි ඇද ගැනීමට මෙය රුකුලක් වනු ඇත.

ඇමෙරිකානු විද්‍යාඥ රිචඩ් ෆේන්මන් වරෙක මෙසේ කියා ඇත. ''යම් විනාශයකින් සියලු ම විද්‍යාත්මක ඥානය නැති ව ගියහොත් ඊළඟ පරම්පරාව අවදි කිරීම සඳහා අපට යොදා ගත හැකි කෙටි ම නමුත් වැඩි ම දත්ත ප්‍රමාණයක් ඇති පණිවිඩය කුමක් ද?''

ෆේන්මන් පැවසුවේ අප ඔවුනට කිව යුත්තේ සියලු දෑ පරමාණුවලින් සමන්විත වී ඇති බව ය. පරමාණුවේ ආකෘතිය තේරුම් ගැනීම කූඨ ප්‍රාප්තියට පත් වූයේ ක්වොන්ටම් යාන්ත්‍ර විද්‍යාව සොයා ගැනීමෙනි. එය අපට අයත් නිශ්චිත ම න්‍යාය යි. න්‍යායාත්මක විද්‍යානුකූල දැනුමට අනාවැකි කීමේ බලය ඇත. යම් දෙයක් කළහොත් සිදුවන්නේ කුමක් දැයි එයට කිව හැකි ය. අනාවැකි කීමේ බලවත් ම ක්‍රමය ඇත්තේ ක්වොන්ටම් යාන්ත්‍ර විද්‍යාවට ය. එයින් කළ සියලු ම අනාවැකි සත්‍ය වී හෝ සත්‍ය බවට සනාථ වී ඇති අතර කිසිම දෙයක් ප්‍රතික්ෂේප වී නැත.

ඉංජිනේරු විද්‍යාවේ හා ව්‍යවහාරික විද්‍යාවේ ඉදිරි සැලසුම් සකස් කොට ගැනීමට අවස්ථාවක් ලැබෙන්නේ අනාවැකි කීමට බලය ලත් න්‍යායයන් අප සතුවීම නිසා ය.

සමාජ විද්‍යාවන්හි පුරෝකථන න්‍යායන් නොමැත| එබැවින් සංකීර්ණ පද්ධතීන් මත සියුම් සැලසුම් ස්ථාපිත කිරීමේ දී බැරෑරුම් වැරදි සිදු කොට ඇත. සමාජ පද්ධතීන් වර්ධනය වනුයේ හෝ වඩා සැලසුම්සහගත වනුයේ දරදඬු සැලසුම් ඒ මත පැටවීමෙන් නොව වෙළෙඳපොළ බලවේගයන් විසින් මෙහෙයවනු ලබන පරිණාමයන් හරහා ය. ප්‍රගතිගාමී පරිණාම හැසිරවීම සඳහා අනාගත දැක්මක් සහිත ලිහිල් සැලසුම් පැවතීම වඩා ආරක්ෂා සහිත ය.

ඇතැම් විට, පරීක්ෂණයකින් තොර ව නිවැරදි තීරණයක් ගැනීම සඳහා න්‍යායික දැනුම ඉවහල් වේ. පරීක්ෂණ කළ නොහැකි විට සහ හදිසි අවස්ථාවන්හි දී, න්‍යායික දැනුම උපයෝගී කොටගෙන කළ යුතු හොඳම දේ තීරණය කිරීමට සිදුවෙයි. ශල්‍ය වෛද්‍යවරයකු බොහෝ විට, විශේෂයෙන් තමා කලින් අත් නොවිඳි ප්‍රශ්න හමුවේ තීරණ ගැනීම සඳහා සිය න්‍යායික දැනුම උපයෝගී කරගනියි.

අප සමාජය තුළ බොහෝ අනර්ථකාරී ප්‍රතිඵල ලබාදෙන එක් දුර්වලතාවක් වනුයේ මිථ්‍යා විශ්වාස හා ඇදහිලි කෙරෙහි ඇති නැඹුරුතාව යි. ඉතා සැලකිල්ලෙන් ඒවා අධ්‍යයනය කළහොත් ඉන් ඇති කරන පෞද්ගලික පාඩුව මෙන් ම ජාතියකට දැරීමට සිදුවන වියදම ද කොතෙක් දැයි සොයාගත හැකි ය. මතවාද පැතිරීම ද මේ ආකාරයෙන් ම සමාජයකට බලපායි. මතවාදයක් යනු යම් පිරිසක් විසින් ඇතිකරගන්නා ලදුව ඔවුන් විසින් සමාජයට කාවැද්දීමට උත්සාහ ගනු ලබන්නා වූ වටිනාකමකි. සනාථ කොට නැති සංකල්ප සමූහයක එකතුවකි. සමාජ ව්‍යසන වන ත්‍රස්තවාදය, ජාතිවාදය සහ ආගමික උන්මාදය මෙවැනි මතවාදාත්මක චින්තනයන්ගෙන් ආරම්භ වූ ඒවා ය. මූලික දැනුම මතවාදාත්මක මායාවට විරුද්ධ වනුයේ එය සත්‍යය අසත්‍යයෙන් ද ස්වයං වර්ධනය වීමේ හැකියාව එසේ වර්ධනය වීමේ නොහැකියාවෙන් ද වෙන්කොට හඳුනා ගැනීමට පුද්ගලයකුට උපකාර වන බැවිනි.

වසර ගණනාවක දුෂ්කර ක්‍රියාවකින් පසු ප්‍රථම වරට උපාධියක් හිමිකර ගන්නා ඔබ ඉමහත් අස්වැසිල්ලක් ලබන බව නිසැකය. මෙවැනි අවස්ථාවක දී ස්වභාවයෙන් ම වෙනත් වෙනස් සිතිවිලි ද ඔබගේ මනසට ගලා එනු ඇත. සුදුසු රැකියාවක් සොයා ගන්නේ කෙසේද? ජීවිතය දියුණුව කරා ගෙන යන්නේ කෙසේ ද? මේ ප්‍රශ්න සඳහා කිසිවකුට නිශ්චිත පිළිතුරක් දිය නොහැකිවා මෙන් ම මේවා සාක්ෂාත් කොට ගැනීම සඳහා අනුගමනය කළ යුතු පැහැදිලි ක්‍රියාමාර්ග පද්ධතියක් ද නැත. තමා ලබාගන්නා දේ තම උත්සාහය සහ හොඳ දෙයක් ලැබීමේ අහඹු අවස්ථාව මත රඳා පවතියි. ලුවී පාස්චර් කියූ පරිදි ''සූදානම් වූ මනසට වාසනාව පවා ආශිර්වාද කරයි'' යන්න මම යළිදු සිහිපත් කිරීමට කැමැත්තෙමි.

අප සිතනවාට වැඩියෙන් අවස්ථා හා වාසනාව අපට ඇති අතර ඒවා ලබා ගැනීමට අප සූදානම් විය යුතු ය. ''සූදානම'' යනු විමසිලිමත් බව සහ වැඩි වැඩියෙන් දැනුම සහ කුසලතා වර්ධනය කර ගැනීම යි. යමක් ලබා ගැනීමට දරන උත්සාහයේ දී පරාජය වන අවස්ථා ද තිබේ. මෙයට හේතුව ඉතා සරල එකකි. යම් ඉලක්කයක් සපුරා ගැනීමට සාමාන්‍යයෙන් ඔබට ඇත්තේ එක් ක්‍රමයක් හෝ ක්‍රම ඉතා ස්වල්ප ගණනක් වන අතර එය මඟහැරී යාමට ක්‍රම බොහෝ සංඛ්‍යාවක් ඇත. වඩා වැදගත් වන්නේ පරාජයේ දී පසුබට නොවීම යි. ඇල්බට් අයින්ස්ටයින් වරක් කී පරිදි ''සෑම පරාජයක් අබියස ම හොඳ අවස්ථාවක් ද පවතියි'' අයින්ස්ටයින් බොහෝ පරාජයන් ලැබූවෙකි. ඔහුගේ ඉලක්කය වූයේ ගුරුවරයකු වීම යි. ඉන් පරාජය වූ ඔහු තම පියාගේ මැදිහත් වීම මත ස්විට්සර්ලන්තයේ බුද්ධිමය දේපළ පිළිබඳ කාර්යාංශයේ ලිපිකරුවකු ලෙස රැකියාවක් ලබා ගත්තේ ය.

ඔබට අවශ්‍ය දේ ලබා ගැනීමට ඔබ සූදානම් ව හා කැප වී සිටී නම් නිසැක ව ම ඔබ ජය ලබයි. මා ඔබට සුභ පතන අතර ඔබේ අනාගත කටයුතු සාර්ථක වේවා යි ද පතමි.

ස්තුතියි.

<u>*2007.01.31*</u>

# Basic Knowledge: It's Impact on Science, Technology, Education and the Society in General

**Prof. Keerthi Tennakoon**

I thank the Vice-Chancellor and the Senate of University of Sri Jayewardenepura for inviting me to address this convocation assembly. It is a pleasure for me to be here because Jayewardenepura was where I laid my first step as a university teacher. Before that I was a school teacher for a while and then a graduate student in physics abroad. When I came to Jayewardenepura in 1972, I noticed a distinct difference here and at the universities that I was acquainted with. Departments in the Faculty of Science closely interacted with each other, an environment conducive to the exchange of ideas. As a result, my childhood interest in chemistry was rekindled. I used to 'steal' chemicals from the Chemistry Department Stores and bring them for the Physics Department to do experiments. Although my first love remained theoretical physics, what I did at Jayewardenepura gave me much confidence to do experimental research in a borderline area between physics and chemistry.

I am also indebted to late Professor P.C.B .Fernando, for encouraging me to join the Physics Department, Jayewardenepura, if not for him I would have ended up abroad. Secondly, Professor P.C.B. Fernando permitted me to continue the things I started for the fun of it.

Jayewardenepura University occupies a landmark position in the history of higher education in our country. Before the two prestigious Pirivenas, Vidyodaya and Vidyalakara were granted university status, we had only one university, the University of Ceylon at Colombo and Peradeniya. When the idea of new universities came up, academic circles expressed concern. Questions that arose were how to find qualified staff?, can we maintain academic standards?. It is not difficult to commission universities by the stroke of a pen. The tumultuous task would be to develop them up to the true meaning of a university. Owing to the painstaking efforts of successive Vice-Chancellors, academic staff and administrators, this task has been impressively accomplished, despite set backs that erupted from time to time. The obstacles which the other new universities had to face were resisted more strongly and radically by this university.

According to a Chinese saying, a tree can be fully grown in a decade, but it takes a century to condition a social establishment. In my frequent visits to the Jayewardenepura University, I have noticed trees in the premises growing taller and taller and the university keeping pace with the trees a contradiction to the famous Chinese saying! Jayewardenepura University is still less than a half a century old.

I decided to speak on the subject of basic knowledge because it is worthier than material resources. Again, the importance of basic knowledge in all sectors of human activity has not been realized in many developing countries including ours. I may often make reference to scientific knowledge; this does not mean that basic knowledge always connects to science. No one can define science or fix the line demarcating science from arts. In this context knowledge covers all domains and aims to understand the reality.

Things that happen in every nook and corner of the world generate enormous heaps of information. Semiconductor based computer technology made it possible to disseminate this information to the remotest locations. However, stock piles of information remain useless, unless you assimilate them to knowledge. Knowledge is the integrated and correlated set of the bits of information which leads to understanding and wisdom. Wisdom is the ability to use knowledge to solve problems and face situations. The knowledge we already possess paves the way towards creation of new knowledge from the information acquired. There is no indication that a computing machine can extract knowledge from information without the intervention of the human brain. As such, providing facilities and training people for information retrieval alone would not be adequate. Our human resource needs to be educated to gather knowledge from the available information. The most powerful tool we have for processing information and converting it to new knowledge is basic knowledge. In contrast to empirical knowledge, which correlates observations within relatively narrow limits, the basic knowledge extends correlations to vast domains. It uses inductive and deductive reasoning to gain more information and further knowledge. In general empirical knowledge answers questions posed with the word "how". Whereas the basic knowledge addresses questions "how" and "why". A great virtue of basic knowledge is that in attempting to find answers to questions "why", we encounter a whole host of problems of the type "how" and their solutions. This has been the prelude to technological and social advancement. Thus the prime motive force behind the upliftment of the quality of life in modern times is indisputably the basic scientific knowledge. Many examples can be drawn from history to prove the point. Ancient farmers having noticed that animal dung or compost and certain minerals in the soil promoted plant growth, applied these materials to the soil to obtain better yield from their crops.

Modern science posed the question. "why did such manures work" and found that Nitrogen, Potassium, Phosphorus and several other micronutrients are essential for plant growth. A series of questions that arose later, pertaining to these findings led to many discoveries of unprecedented practical value. To name one, the German chemist Fritz Haber found a catalyst for converting atmospheric nitrogen to ammonia. All commercial nitrogenous fertilizers derive their nitrogen from the Haber process. If not for the Haber process, the existing human population would not be sustained. Another glaring example is Louis Pasteur's research. Thinking it would seriously affect his desire to conquer the world, the emperor Napoleon III was so worried about a mutiny in his navy. The cause of mutiny had been the spoilage of wine stored in the ships and he begged Pasteur for help. Pasteur having looked into the problem, not only found the cause of spoilage of the wine and ways of preventing it, but also discovered unknown forms of microscopic life. Remedies for many diseases and basic principles of healing and preventing pathogenic infections followed from his work. Having done all this, Pasteur is said to have inscribed the following words in front of his laboratory desk. "The moment one thinks only

of practical applications of science, the sprit of originality is killed". Pasteur was not undermining the importance of mission oriented research. He had commented on the value of unlimited scientific inquiry. Pasteur being more a theoretician with a deep insight even foresaw the results of experiments. Perhaps referring to himself, Pasteur also said "chance favors the prepared mind". In a world flooded with information, we need men and women with prepared minds. Preparation of the mind does not mean mastery of a lot of things or knowing 'everything' in his or her discipline. One individual can comprehend only a miniscule of the ocean of knowledge in front of him. A prepared mind sees through things and knows how to extract those portions of knowledge appropriate to a given situation. Einstein was not a mathematician, but his mind was extraordinarily well prepared and he readily identified those areas of mathematics required to formulate the theory of gravitation. The purpose of education is the preparation of the mind to gain knowledge and wisdom to solve problems and contribute to maintain social order. Education liberates the man from ignorance, paving the way to accesses of knowledge.

In all disciplines, it is the basic component with a theoretical structure that prepares and sharpens the mind. Instead of providing for this primary purpose of education, there is a widespread tendency to reform curriculum by replacing basics by 'so-called relevant stuff. Some divide subjects taught in schools into two sets, "useful" and "useless". A curriculum reforms committee is said to have classified Physics, Sanskrit and History under the latter category. These classifications, as well as other reasons. may have influenced the decision to scrap Physics as an essential prerequisite in the A-level, to enter our medical schools. Doctors require some exposure to Physics not only to manage high—tech instruments they use. But also to understand more routine things like measuring blood pressure. Again, Physics, trains the mind of a doctor to arrive at the best diagnostic decision. When consulting doctors, some people look at the letters after their names. In future it may be wiser to find out what subjects they have done in the A-level. There is also a tendency to adulterate basic undergraduate curriculum with applied areas. Thinking has been, those who go through such courses fit more to the requirements of industry. Is this a valid argument? Do we have any evidence to support this? Industry requires sharp minds adaptable to any situation. It is basic science that imparts this quality and once you acquire it, specialization is rather an easy task. Some of these curriculum revisions also have ignored prerequisite requirements. Although an interdisciplinary touch helps to broaden ones horizons, this should never be done at the expense of basic prerequisites. Can anyone meaningfully follow a course in Physics without a background in some essential areas of mathematics? Long ago, when I was an undergraduate student, mathematics was foreign to our Departments of Physics. The University of Jayewardenepura was the first to introduce mathematics within to the Department of Physics to meet the prerequisite needs. I am glad that this aspect of Physics teaching is now very well taken care of in this university. Similarly Physics should precede electronics. The few individuals with highly innovative electronic skills that I have come across are not those who have followed synthetic courses in electronics. They are the ones who had played with electronic gadgetry for mere curiosity. Such persons if exposed to basic science at the appropriate time would do marvels.

We now place much emphasis on information and communication technology envisaging economic returns. Our neighbor India has succeeded in this venture. Students find it attractive because of the lucrative employment opportunities. Investment in this sector is justified as it develops our human

resource imparting useful skills. What we have forgotten are the most challenging developments behind information and communication technology. Communication technology became possible after decades of intensive research in fundamental physics leading to quantum electronics and invention of the transistor - the greatest invention of the twentieth century and one which contributed most towards exalting the quality of life. We should also encourage advanced studies of this nature. Only then will science get permanently imprinted on our culture like in the West. Again, we cannot ignore emerging areas of science and technology attuned in other places. Just as in ladies dress there are fashions in science. Fashion arouse desire, a part of human nature. Grabbing a fashion is not a bad thing if it is concertedly and honestly pursued. About two decades ago it was biotechnology. How much have we achieved in this sector in proportion to the amount of talking, travel and investment. Poor performance undoubtedly re-flects lack of emphasis on building a strong indigenous research culture in this field and shying away from excellence. Now it is nanotechnology, a fashion proliferating everywhere in the world. Nanotechnology offers tremendous opportunities comparable to the outcome of the industrial revolution. Fashions come when the time is ripe and they are invaluable, if you are smart enough to adopt them. In the case of technological fashions smartness comes from your basic science competence.

Some say although we have invested so much on education, we are still poor. They further argue that the students who complete upper school and the graduates we turn out from our universities find it hard to gain employment. Our graduates are unable to contribute to the economy because they have not done the things relevant to the needs of industry and agriculture. Therefore our education system should be revised drastically. Actually, our investment in education is fully justified and it has paid off rich dividends. Not merely literacy, the level of general education in both city and village communities stands quite high. In most developing countries, a reasonable level of awareness is seen only in the cities. Many attributes of our society reflect signs of good awareness. Despite poverty a large portion of our population maintain fair sanitary conditions. Incidence of HIV happens to be very low, again a sign of being aware. People value education and consider educating their children as a primary responsibility. The fault lies elsewhere, if the suggested educational reforms of doing only the relevant are implemented, we will go from bad to worse. Up to now, graduates we turn out from our universities are good. If the curriculum was irrelevant, how can they do so well when they go abroad? The real problem seems to be the lack of opportunities. Opportunities cannot be created artificially via minor adjustments. For this, a strong research base has to originate to push new industries and expand existing ones.

Modern economies base their strength on knowledge of the human resource rather than on the wealth of the natural resources. Our economic weakness owes much to scientific back wardens. Although our general educational standards continue to be quite high, we shy away when it comes to quality and excellence. We cannot enter into the competitive technology and research needed to boost it, without maintaining quality and standards in higher education. Unlike undergraduate education, which still stands fair, our postgraduate education needs to be revamped and energized. Here again we should not underestimate the importance of basic science or theoretical knowledge and jump into applied innovations. Our graduates who find places for postgraduate studies in the United States of America go through rigorous course work in basic disciplines for a year or two before going into thesis research. The enviable success of the US postgraduate educational system and its technological

achievements owes much to emphasis on basics. Our postgraduate science education is largely confined to a number of handpicked synthetic courses to fit various situations. As there had been a number of natural disasters during the past few years. Postgraduate courses in disaster managements have come forth instantaneously. Disaster management is a highly complex subject which requires high skills and advanced knowledge in engineering, geology and geophysics, climatology, community medicine, sociology ect. Can we do all these in a crash course on disaster management? What universities need to do is to divert a concerted effort to strengthen the research and education in these areas.

It is instructive for us to examine how the west used science to become rich and why we failed. More than two thousand years ago we were one of the most technologically and culturally advanced nations. Our irrigation systems, civil construction works and metallurgy surpassed contemporary civilizations. Sri Lankan steel tools were highly priced in many parts of Asia and only few other countries in the East possessed similar technological capabilities. All these advancements come under the category of empirical technologies with no science. Seeds of science first appeared in the East and later to a more he appreciable extent in Greece and Arabia. Greeks were the first to adopt mathematical and logical reasoning to understand puzzles of nature. Plato rejected experimental method but he a his pupil Aristotle indulged in experimentation as well. The intellectual influence of Greece diffused further west and Aristotle's philosophy dominated and persisted there for a long time. Why didn't the Greek scientific influence filter down to our region? Distance may be one reason. But more than that; the pressure of the rich eastern culture pushed away anything from outside. Greek philosophy and mathematics did reach India. Although readily assimilated by the learned Indian scholars, it did not establish there. As the West was nearly a cultural vacuum at that time, the Greek thinking readily sucked into their society. Knowledge that came from Greece to other European countries incubated there for sometime and burst into science. Realization of scientific method changed empirical technology to one based on science. This was the primary cause of the economic advancement of the west. The reason why we failed to turn empirical technology to a one based on science was a matter of circumstance, not our inferiority. When science and technology began flourishing in the West, we were under colonial interference, a situation not very conducive to indigenous intellectual stimulation. Nonetheless, science came to our land during the time of colonial occupation. Science was valued as we value other foreign commodities. Except for few elitists who received education in England, science barely reached the educated laymen, especially those not conversant in English. Scientifically oriented indigenous thinking did not receive encouragement. When Martin Wickramasinghe wrote a book on evolution he was ridiculed by some elitist dons. This book of very high literary quality reflects the original thinking of one of the most creative Sri Lankans who loved nature. A man who lent an exemplary service in passing the message of science to the intelligentsia in the country was late E.W. Adikaram, a former Chancellor of this University. His books, newspaper articles and the science magazine " Naveena Vidya' created much entusiahsism in the early nineteen fifties. The book on the atom, written by him a few years after the Hiroshima incident introduced atomic theory to the interested laymen.

After independence, with successive governments generously investing in education and expansion of universities, we have succeeded in producing a scientific and technical work force to meet almost all routine service requirements. However, we have failed to inculcate an indigenous research culture,

nurture scientific creativity and go beyond the routine. Science is truly international, exposure to what happens elsewhere in the world and the interaction with peers contributes greatly to its progress. Instead of taking things in that spirit, some of us tend to believe that our objective in education and research should be to meet the immediate practical needs, the most intellectually stimulating issues are considered as matters for the affluent nations. A hidden reason behind such thinking could be a reluctance to engage in more challenging endeavors. Culturally, we are intellectually inclined and endowed with powers to face challenges. The policy needs to be adjusted to nurture the inherent talent of our human resource in the right direction.

The visible achievements of science amaze everyone. Material items such as cellular phones, computers, space vehicles, medicines, modern agricultural products belong to this category. Even more amazing are the scientific theories which enabled all these. Making the public aware of the power of scientific theories and promoting education and research in theoretical science is an absolute necessity for technological advancement and intellectual awaking of a nation. Our newspapers, magazines, electronic media and a number of scientific organizations have contributed greatly to disseminate science to the general public and students. However, most of these programs fall into the former category in highlighting visible achievements of science. Popularization of the other aspect of science deserves an equal importance. This would help in motivating and attracting the most talented minds to science.

The American physicist Richard Feynman once said, 'If some cataclysm destroyed all existing scientific knowledge, what should be the shortest and the most informative message that we pass to the next generation for them to wake up'?. Feynman argued, we should tell them that matter is constituted of particles. The understanding of the atomic constitution of matter - the most important key to all science and technology originated from analysis of experimental data within a theoretical framework. Elucidation of structure of the atom, culminated in the discovery of quantum mechanics - the most precise theory ever to be formulated. Theoretical scientific knowledge possesses predictive power, you can foretell, what is going to happen if you do something. The predictive power is extreme and most precise in the case of quantum mechanics. All its predictions have been verified or remain to be verified and none refuted.

In engineering and applied sciences, planning is possible as you have theories possessing predictive power. If you cannot determine the outcome of what you propose to do, there will be no guarantee that your plan can be successfully implemented. Social sciences have no predictive theories; thus serious mistakes have been made in imposing intricate plans on complex social systems. Social systems develop or become more orderly via evolution dictated by market forces rather than by imposition of rigid plans. It is safer to have flexible plans with some vision to direct the progressive evolution.

Sometimes theoretical knowledge helps one to make the right decision without resorting to a test. In circumstances where you cannot do experiments and in emergency situations, the best course of action has to be decided by theoretical considerations. A surgeon frequently uses his theoretical knowledge to make decisions, especially in the problems which he had not experienced previously.

A weakness in our society leading to most damaging consequences is adherence to myths and occult beliefs: Basic knowledge clears people of occult thinking and myths. The loss to an individual or the cost to a nation resulting from such beliefs would be tremendous if carefully assessed. Breeding of ideologies similarly confronts the society. An ideology is a set of concepts of unproven validity adopted by a group who wishes to impose it on the society. Many social evils such as terrorism, racism and religious fanatism originate from ideological thinking. Basic knowledge stands against ideological brain washing because it assists one to distinguish the truth from the untruth and the viable from the non-viable. Most of you, who have obtained a degree for the first time after years of hard work feel relieved. Naturally other thoughts will also come to your mind. How to find good employment? How to succeed in life? No one can give definite answers to the above questions and there are no clear cut prescriptions to achieve these. Achievements depend on your effort and the chance of getting something good. I will once again remind what Louis Pasteur said "chance favors the prepared mind". Chances and opportunities are more abundant than we tend to think and in order to grab them you must be prepared. Preparation means alertness and acquisition of more and more knowledge and skills. Efforts towards achievement, naturally leads to failures as well. The reason is simple. In general you have just one single or very few ways of reaching a given goal and almost innumerable ways of missing it. The most important thing is not to get discouraged, when you encounter a failure. Albert Einstein once said "beside every failure there is an opportunity". Einstein had to face many failures. His ambition was to become a teacher in a school and having failed, managed to find a clerical position in the Swiss patent office with his father's influence.

If you are prepared and strive to achieve what you wish, you will certainly succeed. I congratulate you and wish you success in future endeavors.

Thank you.

*2007.01.31*

# 27

# නිදහස් අධ්‍යාපනය

## මහාචාර්ය මැන්දිස් රෝහණධීර

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2007 උපාධි ප්‍රදානෝත්සව දේශනය පැවැත්වීමට මට ආරාධනා කිරීම පිළිබඳව පීඨාධිපතිතුමා ඇතුළු ශාස්ත්‍ර පීඨයේ සාමාජික භවතුන්ට සනාතන සභාවේ හා පාලක සභාවේ සාමාජික භවතුන්ට හා උපකුලපතිතුමාට පළමුවෙන්ම මගේ කෘතඥතාව පිරිනමා සිටිමි.

මේ දේශනය සඳහා කවර මාතෘකාවක් තෝරාගත යුතුදැයි මා දින කිහිපයක් කල්පනාවේ යෙදී සිටින විට නිදහස් අධ්‍යාපනයේ පියා නමින් ජාතියේ ප්‍රණාමයට පත්ව සිටින ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා පිළිබඳ වාර්ෂික අනුස්මරණ උත්සවය ගැන පසුගිය මාසයේ මඟින් සන්නිවේදනය වූ තොරතුරුවලට මගේ අවධානය යොමු විය. තවද වර්තමාන රජය නිදහස් අධ්‍යාපනය කප්පාදු කිරීමට සැරසෙන බවද එහෙයින් නිදහස් අධ්‍යාපනය සුරැකීම සඳහා දිවයින පුරා ජනතාව පෙළගස්වමින් ඒ පිළිබඳ ජනතා පෙත්සමක් අත්සන් කරවා පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමාට පිළිගැන්වීමේ ක්‍රියාමාර්ගයක් දියත් වී ඇති බවද මාධ්‍ය මඟින් දැනගන්නට ලැබිණි.

මේ අනුව මගේ දේශනය සඳහා ''නිදහස් අධ්‍යාපනය'' යන්න කාලෝචිත මාතෘකාවකැයි මට හැඟී ගියේය. 1946 වසරේ සිට ගත වූ දසක හයක් තරම් කාලයක් තිස්සේ මේ රටේ ජාතික අධ්‍යාපන ගමන් මඟ හැඩ ගැස්වූ නිදහස් අධ්‍යාපනය සමඟ ස්වභාෂා මාධ්‍යය ද එකට ඇදී තිබේ. එහෙයින් මගේ අද දේශනයේ මාතෘකාව නිදහස් අධ්‍යාපනය හා ස්වභාෂා මාධ්‍යය යනුවෙන් හැඩගස්වා ගතිමි.

මේ මාතෘකාව මෑත ඉතිහාසයේ සුළි සුළං රැල්ලක් මෙන් වරින් වර මතුවෙමින් යට යමින් මතු වෙවී යට යමින් මුළු මහත් ජනතාව ප්‍රකම්පනයට පත් කළ ප්‍රපංචයක් බව ඔබට මතක ඇතැයි සිතමි. නිදහස් අධ්‍යාපනය කප්පාදු කිරීම, නිදහස් අධ්‍යාපනය වැළලීම, නිදහස් අධ්‍යාපනය සුරැකීම යන ශීර්ෂ පාඨ රැගත් උද්ඝෝෂණ - විශේෂයෙන් විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් පෙරමුණෙහි සිටි උද්ඝෝෂණ මෑත ඉතිහාසයේ නොයෙක් වර මතුවිය. එකක් දෙකක් පමණක් ඔබගේ අවධානයට යොමු කරනු කැමැත්තෙමි.

### නිදහස් අධ්‍යාපනය නමැති ඊශ්වර දෑහැන

1981 වර්ෂයේ අධ්‍යාපන ධවල පත්‍රිකාව නමින් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා මාලාවක් එවක පැවැති රජයේ අධ්‍යාපන ඇමතිවරයා විසින් ඉදිරිපත් කරන ලදුව ඒ යෝජනා ක්‍රියාත්මක වුවහොත් නිදහස් අධ්‍යාපනය වැළලී යතැයි පුළුල් ජනතා උද්ඝෝෂණයක් දියත් විය. විශේෂයෙන් විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් හා ගුරුවරුන් මේ උද්ඝෝෂණයේ පෙරමුණ ගෙන ක්‍රියා කළ අතර විශ්වවිද්‍යාල කලක් වසා තබන්නට ද සිදු විය. ඒ තත්ත්වය අනුව රජයට ඒ ප්‍රතිසංස්කරණ යෝජනා ප්‍රසිද්ධියේ ඉල්ලා අස් කරගන්නට සිදු වූ අතර ඒවායේ ඇතැම් අංග ක්‍රියාත්මක කරන්නට සිදු වූයේ අප්‍රසිද්ධියේය.

ඉක්බිතිව උතුරු කොළඹ රාගම මුදල් ගෙවා ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබාදෙන පෞද්ගලික වෛද්‍ය විශ්වවිද්‍යාලයක් ඇරඹීමේ ක්‍රියා මාර්ගයක් දියත් විය. මේ නිසා ගම්බද හා නගරබද දුගී දුප්පත් ජනතාවගේ දූ පුතුන්ට බාලාංශයේ සිට විශ්වවිද්‍යාල ප්‍රවේශය තෙක් ස්වභාෂා මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබා විශ්වවිද්‍යාලයට පිවිස වෛද්‍ය විද්‍යාව හදාරන්නට ඉඩ සලසා දුන් නිදහස් අධ්‍යාපනයට මරු පහරක් වැදෙති'යි ප්‍රබල උද්ඝෝෂණයක් දියත් විය. විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් ගුරුවරුන් පමණක් නොව වෛද්‍යවරුන් ද පෙරමුණ ගත් මේ උද්ඝෝෂණය නිසා මුදල් ගෙවා ඉංග්‍රීසි මාධ්‍යයෙන් වෛද්‍ය උපාධි ලබා දෙනු සඳහා උතුරු කොළඹ රාගම සැලසුම් කරමින් තිබූ පෞද්ගලික විශ්වවිද්‍යාලය නතර කර දමන්නට රජයට සිදු විය.

1946 සිට ගත වූ වසර 20 තුළ නිදහස් අධ්‍යාපනය ක්‍රියාත්මක වී ශිෂ්‍යයන් දහස් ගණනින් විශ්වවිද්‍යාල මට්ටමට පැමිණෙමින් තිබූ කාලයේ විශ්වවිද්‍යාලවල ඉඩකඩ මදි වීම නිසා එවක පැවැති රජයට විශ්වවිද්‍යාල ප්‍රවේශ ප්‍රතිශතය පිළිබඳ වැදගත් තීරණයක් ගන්නට සිදු විය. උපාධිධාරී පුහුණු ආචාර්යවරුන්, විද්‍යාගාර, පුස්තකාලය ආදී අධ්‍යාපන සම්පත් බහුල කොළඹ, නුවර, යාපනය ආදී නාගරික දිස්ත්‍රික්කවලින් විශ්වවිද්‍යාලවලට තේරී පත්වන ශිෂ්‍ය සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩිවිය. එහෙත් ඊට සාපේක්ෂව මොණරාගල, සබරගමුව, හම්බන්තොට, මුලතිව්, මන්නාරම වැනි අධ්‍යාපන සම්පත් විරල දිස්ත්‍රික්කවලින් තේරෙන ශිෂ්‍ය සංඛ්‍යාව බෙහෙවින් අඩුවිය. ඒ අනුව උසස් අධ්‍යාපන වරප්‍රසාද පිළිබඳව එකී සම්පත් විරල ගම්බද දිස්ත්‍රික්කවල දරුවන්ට සිදු වූ අසාධාරණය මඟහැරවීමේ අරමුණින් විශ්වවිද්‍යාල ප්‍රවේශ විභාගයේ ප්‍රතිඵල ප්‍රමිත කොට දිස්ත්‍රික්ක සඳහා ශිෂ්‍ය ප්‍රවේශ (Quota) සලාක ක්‍රමයක් ක්‍රියාත්මක කරන්නට සිදු විය. එහෙත් එමඟින් ශිෂ්‍යයන්ගේ - විශේෂයෙන් නාගරික දිස්ත්‍රික්කවල ශිෂ්‍යයන්ගේ කුසලතා අවප්‍රමාණ වන බැවින් ඒ දිස්ත්‍රික් සලාක ක්‍රමය ප්‍රතිසංවිධාන කරනු සඳහා විශ්වවිද්‍යාලයීය මහාචාර්යවරයකුගේ සභාපතීත්වයෙන් යුත් කොමිටියක් පත් කරන ලදී. විශ්වවිද්‍යාල ප්‍රවේශ ලකුණු මට්ටම් ක්‍රමයෙන් ඉහළ දමා අවසානයේ දී ශිෂ්‍යයන් ලබාගන්නා ලකුණු මත පමණක් ප්‍රවේශ වරප්‍රසාද ලබා දිය යුතු බවට ඒ කොමිටිය මඟින් නිර්දේශ ඉදිරිපත් කෙරිණ. මේ නිසා එතෙක් සම්පත් විරල දිස්ත්‍රික්කවලට ලබා දී තිබූ ප්‍රවේශ සංඛ්‍යාව අඩුවීම හේතුවෙන් ගම්බද ළමයින්ට උරුම කොට තිබූ නිදහස් අධ්‍යාපනය කප්පාදු වෙතැයි ප්‍රබල උද්ඝෝෂණයක් දියත් විය. එය කොතෙක් ප්‍රබලව මතුවී ද යත් ඒ කොමිටි වාර්තාව ද ප්‍රසිද්ධියේ ප්‍රතික්ෂේප කරන්නට එවක රජයට සිදුවිය. මේ සිදුවීම් කෙරෙහි අවධානය යොමු කරන විට නිදහස් අධ්‍යාපනය වනාහි එයට වැටකොටු බඳින කවර රජයක් වුවද දවා අළු කරන්නට පසුපස හඹා එන ඊශ්වර දැහැනක් බවට පත් වී ඇත. මෙබඳු අන්තෝ ජටා බහී ජටා ඇති කරන ඇතුවත් බැරි නැතුවත් බැරි නිදහස් අධ්‍යාපනය යනු කවරේ ද? මේ සඳහා මත පළ කරන තර්ක ඉදිරිපත් කරන බොහෝ අය නිදහස් අධ්‍යාපනයේ ආරම්භය වර්ධනය හා අභිප්‍රේතාර්ථ ගැන ගැඹුරින් සවිස්තරව සිතා ඇද්දැයි සලකා බැලිය යුතු ය.

## නිදහස් අධ්‍යාපනය යනු නොමිලයේ අධ්‍යාපනය ලබාදීම පමණක් ද?

නිදහස් අධ්‍යාපනය යනු නොමිලයේ අධ්‍යාපනය ලබාදීමය යන්න බෙහෙවින් ජනප්‍රිය හා සුලභ නිර්වචනයයි. එය සැබෑය. එහෙත් 1946 වසරේ සිට නිදහස් අධ්‍යාපන ක්‍රියාවලිය දියත් වන්නට පෙර අවුරුදු 100 ක් තරම් කාලයක් මේ රටේ නොමිලයේ ලබාදුන් අධ්‍යාපන ක්‍රමයක් පැවතිණි. 1831 තරමේ සිට ක්‍රියාත්මක වූ කෝල්බෲක් ප්‍රතිසංස්කරණ අනුව බ්‍රිතාන්‍ය පාලනයට සිවිල් නිලධරයන් පුහුණු කරවා ගැනීමේ අරමුණින් ජනගහනයෙන් 07% තරම් වූ ඉඩම් හිමි ප්‍රභූ රදල පන්තියේ දරුවන්ට මුදල් අයකර ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබා දුන් අතර ඉතිරි 93% තරම් වූ දුගී ජනගහනයේ දරුවන්ට හෝඩිය පන්තියේ සිට ජ්‍යෙෂ්ඨ 10 පන්තිය තෙක් රජයේ වියදමින් එනම්

නොමිලයේ අධ්‍යාපනය ලබාදෙනු ලැබිණ. එසේ බලන කල 1946 සිට ආරම්භ වී දියත්වුණු නිදහස් අධ්‍යාපන ක්‍රියාමාර්ගයේ අරමුණ නොමිලයේ අධ්‍යාපනය ලබාදීම ය යන්න ඉතා සරල විග්‍රහයක් පමණකි. 1946 වන විටත් අවුරුදු 100 ක් තරම් කාලයක් තිස්සේ නොමිලයේ අධ්‍යාපන ක්‍රමයක් 93% ජනගහනයට ලැබුණු හෙයිනි. එසේ වුවද 1946 සිට ක්‍රියාත්මක වන නිදහස් අධ්‍යාපන ක්‍රමය අනුව ජනගහනයෙන් 93% ක් පමණ දුගී ජනතාවට නොමිලයේ අධ්‍යාපන ලැබීමේ වරප්‍රසාදය අවප්‍රමාණ කිරීමක් මින් අදහස් නොකෙරේ.

## මධ්‍ය විද්‍යාල අධ්‍යාපනය

නිදහස් අධ්‍යාපනය යන්නෙන් අදහස් කෙරුනේ පස්වන පන්තියේ ශිෂ්‍යත්ව තරග විභාගයෙන් සමත් වූ විශේෂයෙන් ගම්බද දුප්පත් පවුල්වල දරුවන් සීමිත ගණනකට රජයේ මධ්‍ය විද්‍යාල මඟින් නොමිලයේ ලබා දුන් අධ්‍යාපනය බවට ඇතැමෙක් තර්ක ඉදිරිපත් කරති. එයද අර්ධ සත්‍ය තර්කයක් මිස පූර්ණ නිර්වචනයක් ඉදිරිපත් කෙරෙන තර්කයක් නොවන බව විමසා බලන විට පෙනී යයි.

දිවයිනේ විවිධ පළාත්වල ගම්බද ප්‍රදේශ කේන්ද්‍රගත කොටගෙන 1943 වසරේ පමණ රජයේ මධ්‍ය විද්‍යාල සීමිත සංඛ්‍යාවක් පිහිටුවන ලදී. මුලින් ම මතුගම, වීරකැටිය, ඉබ්බාගමුව ආදී තැන්වලින් විද්‍යාල 20 කින් පටන් ගෙන 1944 වන විට 54 පමණ වූ මේ මධ්‍ය විද්‍යාල එවකට එංගලන්තයේ පැවැති ද්විතීය අධ්‍යාපන පාඨශාලා මාදිලිය අනුකරණයෙන් අළුතින් පිහිටුවන ලද ඉංග්‍රීසි මාධ්‍ය පාඨශාලා ක්‍රමයකි. එම නගරබද ව පැවති රාජකීය සැන්තෝමස්, සැන් පීටර්ස් වැනි ඉංග්‍රීසි පාඨශාලා මෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබා දී රාජ්‍ය පාලනයට සහභාගීකරවා ගනු සඳහා සිවිල් සේවකයන් බිහිකිරීමේ අරමුණින් ඇරඹුණු විද්‍යාල වර්ගයකි. නිදහස් අධ්‍යාපනය යනුවෙන් හැඳින්වෙන්නේ 1946 සිට ඇරඹි දියත් වුණු අධ්‍යාපන ක්‍රියා මාර්ගය ය. එහෙයින් ඊට පෙර 1943, 44 අවදියේ ඇරඹුණු මධ්‍ය විද්‍යාල අධ්‍යාපනය නිදහස් අධ්‍යාපනය යනුවෙන් සපුරා හැඳින්විය හැකිදැයි තර්ක කළ හැකිය. එහෙත් ගම්බද දුප්පත් පවුල්වල දරුවන්ගෙන් තෝරා ගත් සීමිත සංඛ්‍යාවකට හෝ 5 ශිෂ්‍යත්ව ක්‍රමය මඟින් මධ්‍ය විද්‍යාලවලින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබා දී ඔවුන්ට රජයේ සිවිල් සේවය බඳු උසස් පදවිවලට දොර ඇර දීමට ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර ශ්‍රීමතාණන්ගෙන් ඉටු වූ උත්කෘෂ්ට සමාජ මෙහෙවර අබමල් රේණුවකින් වත් අවප්‍රමාණ කිරීමක් මින් අදහස් නොවේ.

1931 ඇරඹී සර්වජන ඡන්ද ක්‍රමය ජාතික සංවර්ධනයේ වැදගත් විෂය පථ කේන්ද්‍රගත කොට ගෙන ක්‍රියාත්මක වූ කාරක සභා ගණනකින් සමන්විත වූ ව්‍යවස්ථාදායක රාජ්‍ය මන්ත්‍රණ සභාව හා කාරක සභාපතිවරුන්ගෙන් හා බ්‍රිතාන්‍ය විධායක ලේකම්වරුන් තිදෙනෙකුගෙන් සමන්විත විධායක අමාත්‍ය මණ්ඩල ක්‍රමයක් නිසා ප්‍රථම වරට ගම්බදව හා නගරබදව විසිරී සිටි දුගී දුප්පත් පුළුල් ජනතාවගේ හඬ ව්‍යවස්ථාදායකයේ හා විධායකයේ රැව් දෙන්නට විය. මෙවක අධ්‍යාපන කාරක සභාපති ධූරය ඉසුලූ ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහතා ඒ වන විට බාලාංශයේ සිට ජ්‍යෙෂ්ඨ පන්තිය (10 පන්තිය) තෙක් ස්වභාෂා මාධ්‍ය අධ්‍යාපනයේ යෙදී සිටි ජනගහනයෙන් 93% පමණ දුප්පත් ගැමි දරුවන්ට උසස් අධ්‍යාපනයට හා රජයේ රැකියාවලට දොර වැසී තිබීම හේතුවෙන් ඇති වූ අසාධාරණය මඟහැරවීමේ විධි උපක්‍රම ගැන අතිශය සංවේදීව සිටි බව පැහැදිලිව පෙනී යයි. 5 ශිෂ්‍යත්ව මඟින් ගමකින් තෝරාගත් දරුවන් කිහිප දෙනෙකුට මධ්‍ය විද්‍යාල අධ්‍යාපනය ලබාදීමේ මහඟු ජාතික මෙහෙවර දියත් වූයේ ඒ අනුව ය.

එසේ වුවද බාලාංශයේ සිට 5 වන පෙළ දක්වා ස්වභාෂාවෙන් ඉගෙන 5 වන පන්තියේ ශිෂ්‍යත්ව තරඟ විභාගයෙන් මධ්‍ය විද්‍යාලයට තේරී එහිදී 6 වන පංතියේ සිට තම ගෙදරදොරේ පාසලේ භාවිතා නොවූ ඉංග්‍රීසි භාෂාවෙන් අධ්‍යාපනය ඇරඹූ දරුවන්ට විෂය ඉගෙනීමට වන නුහුරු නුපුරුදු ඉංග්‍රීසි භාෂාව ඉගැනීමේ බැරෑරුම් කාරියට හුරුවන්නට කලක් ගතවිය. ඔවුන් බොහෝ දෙනෙකුට තම පිබිදෙන යෞවනයේ වසර තුනක් හෝ හතරක් තරම් කල් 6, 7 පන්ති දෙකේ 6A, 6B සහ 7A, 7B යනුවෙන් අවුරුදු හතරක් වශයෙන් ගත කරන්න සිදුවීමේ අසාධාරණය අධ්‍යාපන කොමිටියේ අවධානයට යොමු විය.

මේ සමඟම දරුවන්ට තම මවු බසින් අධ්‍යාපනය ලබා දිය යුතු බවට අධ්‍යාපන විශේෂඥයන් ප්‍රමුඛ සමාජ සුධාරකයන් විසින් ප්‍රබල ලෙස මත ඉදිරිපත් කරමින් තිබිණ. මේ පසුබිම යටතේ අධ්‍යාපනය හා අධ්‍යාපන වරප්‍රසාද පුළුල් ජනතාවට මුදාහැරීමේ ක්‍රම වේද ගැන පරීක්ෂා කර බලා වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස 1943 දී රාජ්‍ය මන්ත්‍රණ සභාව විසින් විශේෂ අධ්‍යාපන කොමිසමක් පත් කරන ලදී.

## විශේෂ අධ්‍යාපන කොමිසම - 1943

ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතා මේ කොමිසමේ සභාපති වූ අතර ඒ. රත්නායක, ආචාර්ය එන්.එම්. පෙරේරා, එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක, රසික් ෆරීඩ්, ජේ. ආර්. ජයවර්ධන යනාදී මන්ත්‍රීවරුද අයිවර් ජෙනින්ංස් වැනි විද්වත්හු ද මේ කොමිසමට අයත් වූහ. ජී.පී. මලලසේකර, ඊ. ඩබ්ලිව්. අදිකාරම්, එල්.එච්. මෙත්තානන්ද වැනි විද්වත්හු ද කොමිසමට විශේෂ යෝජනා එවමින් අධ්‍යාපනය කෙසේ විය යුතුද, අධ්‍යාපන මාධ්‍යය කුමක් විය යුතුද, අධ්‍යාපනයේදී ආගමික අංශ කර්මාන්ත හා කෘෂිකාර්මික අංශ කෙරෙහි අවධානය යොමු වන්නේ කෙසේද ආදී ප්‍රශ්නවලට පිළිතුරු ඉදිරිපත් කළහ.

විශේෂ අධ්‍යාපන කොමිසම ලද තොරතුරු ගළපා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා මාලාවක් සකස් කරන ලදුව, කොමිසමේ සභාපති සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතා ඒ යෝජනා රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඉදිරිපත් කරමින්, 1944 මැයි 31 වන දා දේශනයේ කෙළවරදී මෙසේ පැවසීය.

''ගරු සභාපතිතුමනි ගඩොලින් තැනූ රෝමය මම කිරිගරුඬින් නිර්මාණය කළෙමියි'' ඔගස්ටස් අධිරාජයා සාඩම්බරයෙන් පැවසීය. මිල වැඩි කොට තිබූ අධ්‍යාපනයේ මිල අඩු කළ බවත් වසා තැබූ පොතක් පරිදි අපට දිස්වූ අධ්‍යාපනය විවෘත ලියවිල්ලක් බවට පත් කළ බවත් ධනවත් අයට උරුමව තිබූ අධ්‍යාපනය දිළිඳු අයගේ උරුමයක් බවට පත් කළ බවත් රාජ්‍ය මන්ත්‍රණ සභාවට සාඩම්බරයෙන් පැවසීමට හැකි වුවහොත් ඒ ආත්ම වර්ණනය ඔගස්ටස් අධිරාජයාගේ ආත්ම වර්ණනයට වඩා කොතරම් ශ්‍රේෂ්ඨද?

''දේශනය අවසන් වූ විට ''උත්කෘෂ්ඨ දේශනයකි. ගාම්භීර දේශනයකි'' යනුවෙන් මට ඇමතිවරුන්ගෙන් තුති පිරිනැමුම් සහිත පණිවිඩ ගලා එන්නට විය. ඊටත් වඩා මගේ දේශනය ගැලරියේ සිට අසා සිටි ඉන්දියානු අධ්‍යාපන විශේෂඥයකු වූ ඇනී මා වෙත කඩිසර ගමනින් පැමිණ මා බදා වැළඳගෙන ඔබතුමා ඉන්දියාවේ උපන්නා නම් ඉන්දියානුවන් ඔබට දෙවියකු සේ සලකාවි'' යැයි පැවසීය.

අධ්‍යාපනය, බාලාංශයේ සිට විශ්වවිද්‍යාලය තෙක් නොමිලයේ හෙවත් රජයේ වියදමින් ලබාදිය යුතුය යන්න කොමිසමේ බහුතරයේ මතය විය. එහෙත් අධ්‍යාපනය සඳහා තෝරා ගත යුතු භාෂා මාධ්‍යය පිළිබඳව බරපතල ප්‍රශ්න මතුවෙමින් තිබිණ. විශේෂයෙන් මිෂනාරි පාඨශාලාවල ප්‍රධානීහු ''අපගේ පාසල්වල දරුවන්ට නම් ඉංග්‍රීසි මාධ්‍යයෙන්ම අධ්‍යාපනය දිය යුතුය. සිංහල හෝ දෙමළ භාෂා අධ්‍යාපනයට සුදුසු මාධ්‍යය නොවේ. සිංහල සාහිත්‍යය හා දෙමළ සාහිත්‍යය කුණුහරුපවලින් පිරී තිබේ. ඔබට අවශ්‍ය ඔබේ දරුවන්ට කුණුහරුප උගන්වන්න නම් ඒ භාෂාවලින් අධ්‍යාපනය ලබා දෙන්න. අපේ පාසල්වල කිතුණු දරුවන්ට නම් අප ශිලාචාර ඉංග්‍රීසි භාෂාවෙන්ම උගන්වමු'' ආදී වශයෙන් ප්‍රබල අභියෝග මතුවෙමින් තිබිණ. එහෙත් ඉහත සඳහන් කළ මලලසේකර, අදිකාරම්, මෙත්තානන්ද වැනි උගත්තු මේ රටේ දරුවන්ට බාලාංශයේ සිට විශ්වවිද්‍යාලය තෙක් ඒ දරුවන්ගේ මව් භාෂා මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබා දිය යුතු යැයි ප්‍රබල ලෙස ප්‍රතිතර්ක ඉදිරිපත් කළහ.

1945 ඔක්තෝබර් මාසය වන තෙක් කාලය තුළ කොමිසමට ඉදිරිපත් වූ කරුණු අනුව බාලාංශයේ සිට විශ්වවිද්‍යාලය තෙක් අධ්‍යාපන මාධ්‍යය ස්වභාෂා විය යුතුය යන මතයට කොමිසමේ කිහිප දෙනෙකු එරෙහිව සිටි බව පැහැදිලිව පෙනෙන්නට විය. ඒ අනුව සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර, ඒ. රත්නායක, ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා, රසික් ෆරීඩ් යන මහතුන් ස්වභාෂා මාධ්‍යයට එරෙහිව සිටි සාමාජිකයන් දෙතුන් දෙනාට නොදැනෙන සේ උපායශීලීව අවසන් කොමිසන් සභා රැස්වීමේදී

1. අධ්‍යාපනය බාලාංශයේ සිට විශ්වවිද්‍යාලය තෙක් රජයේ වියදමින් නොමිලයේ ලබාදිය යුතුය.
2. ඒ අධ්‍යාපනය දරුවන්ගේ මව් භාෂා මාධ්‍යයෙන් ලබා දිය යුතුය.

## නිදහස් අධ්‍යාපනය ස්වභාෂා මාධ්‍යය

1946 ජනවාරි සිට ක්‍රියාත්මක වී දිවයිනේ සියලුම පාඨශාලාවල විශේෂයෙන් ඉංග්‍රීසි මාධ්‍ය පාඨශාලා ඇතුළුව 1946 සිට 1952 දක්වා කාලය බාලාංශයේ සිට පස්වන පන්තිය තෙක් වසරින් වසර ස්වභාෂා මාධ්‍යයට පෙරළෙමින් වුත් 1952 වර්ෂය වන විට යළිත් ස්වභාෂා විරෝධී උද්ඝෝෂණ මතු විය.

''අපගේ පාසල්වල හයවන පන්තියේ සිට ස්වභාෂාවෙන් උගන්වන්නට අප සූදානම් නැත. අධ්‍යාපන මට්ටම පහත වැටෙන හෙයින් 6 සිට නම් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්විය යුතු'' යැයි තර්ක කරමින් පෙත්සම් ඉදිරිපත් කළහ. එහෙත් ඉහත සඳහන් කළ මලලසේකර වැනි ස්වභාෂා ප්‍රේමීහු යළිත් ප්‍රබල ලෙස පෙත්සම් ඉදිරිපත් කරමින් ප්‍රතිඋත්තර සැපයූහ.

මේ නිසා එවක පැවති රජයේ අධ්‍යාපන ඇමතිව සිටි ඊ.ඒ. නුගවෙල මහතාට බාලාංශයේ සිට විශ්වවිද්‍යාලය තෙක් අධ්‍යාපනය නොමිලයේ ස්වභාෂාවෙන් දිය යුතුය යන්න බාලාංශයේ සිට 6 දක්වා ස්වභාෂාවෙන් දිය යුතුය. එසේම ඉංග්‍රීසි මාධ්‍යය පිළිබඳව පැවති උද්වේගය සංසිඳුවනු සඳහා තුන්වන පන්තියේ සිට ඉංග්‍රීසිය ද්විතීය භාෂාවක් ලෙස ඉගැන්විය යුතුය යනුවෙන් නියෝගයක් නිකුත් කරන්නට සිදු විය. එපමණක් නොව හයවන පන්තියේ සිට 7, 8, 9, 10 පන්ති දක්වා ස්වභාෂාවෙන් නිදහස් අධ්‍යාපනය දිය යුතු බවට අධ්‍යාපන ඇමතිවරයාට වසරින් වසර නියෝග නිකුත් කරන්නට සිදුවිය. 1957 වන විට දිවයිනේ සියලු පාඨශාලා ඉංග්‍රීසි පාඨශාලාද ඇතුළු ජ්‍යෙෂ්ඨ පන්තිය දක්වා ද 1958, 59 වසර වන විට විශ්වවිද්‍යාල ප්‍රවේශ පන්ති ද ස්වභාෂා මාධ්‍යයට හැරී තිබිණි. මෙසේ 1946 සිට ඇරඹි ස්වභාෂා මාධ්‍ය නිදහස අධ්‍යාපන ක්‍රියාමාර්ගය 1959 වන විට විශ්වවිද්‍යාලයේ දොරටුව තෙක් ගමන් කොට තිබිණි.

## අසිරිමත් කඩඉම - 1959

1959 වන විට දිවයිනේ සියලුම මධ්‍ය විද්‍යාල මහා විද්‍යාල ආදියේ ස්වභාෂා මාධ්‍යයෙන් උගත් දරුවන් දහස් ගණනක් විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනයට තේරීමේ දොරටුවට පැමිණ සිටියහ. එතෙක් කල් ඉංග්‍රීසි පාඨශාලා අතළොස්සක මුදල් ගෙවා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙන එවක පැවති එකම විශ්වවිද්‍යාලයට පිවිසෙමින් සිටි 300 පමණ දරුවන් වෙනුවට 1959 දී දහස් ගණනක් විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා හරි ගැසී සිටියහ. පේරාදෙණියේ පැවති එකම විශ්වවිද්‍යාලයේ එබඳු දහස් ගණනක් වැද්ද ගැනීමට පමණක් නොව ස්වභාෂාවෙන් විශ්වවිද්‍යාල අධ්‍යාපනය සැලසීමට ද සූදානමක් නොතිබිණි. එවකට බලයට පැමිණි සිටි එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක රජයට මෙය ප්‍රබල දේශපාලන ප්‍රශ්නයක් සේ ඉදිරිපත් විය. අධ්‍යාපන ඇමතිව සිටි ඩබ්ලිව්. දහනායක මැතිතුමා පේරාදෙණිය මේ ශිෂ්‍ය පරම්පරාව බාර ගැනීමේ සූදානම් නොවූ විට ඒ වන විට ප්‍රමුඛ ප්‍රාචීන අධ්‍යාපන මධ්‍යස්ථාන දෙක වූ විද්‍යෝදය, විද්‍යාලංකාර දෙකේ අධිකාරීත්වයෙන් මේ දහස් ගණනට ස්වභාෂා මාධ්‍යයෙන් උසස් අධ්‍යාපනය ලබා දිය හැකිදැයි විමසූ විට තමන් එයට සූදානම් බව පිරිවෙන දෙකේ අධිකාරීහු ප්‍රකාශ කළහ. 1959 විද්‍යෝදය හා විද්‍යාලංකාර විශ්වවිද්‍යාල දෙක බිහි වුණේ එසේ ය.

ඒ වන විට මේ විශ්වවිද්‍යාල දෙකේ උසස් මට්ටමින් විශ්වවිද්‍යාලයේ විෂය ඉගැන්වීමට සුදුසු ගුරුවරු නොසිටියහ. එහෙත් අධිකාරීන් විසින් තාවකාලිකව බාහිර කථිකාචාර්යවරුන් බඳවාගෙන මුල් අවුරුදු තුනක් හතරක් ගත වන වට සුදුසුකම් ලත් ආචාර්ය මණ්ඩල සකස් කරවා ගත හැකි විය. නව විශ්වවිද්‍යාල සිංහල මාධ්‍යයෙන් විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබාදෙන විට පේරාදෙණියේ ලංකා විශ්වවිද්‍යාලයටද එසේ කරන්නට සිදු විය. එහෙත් විද්‍යාල වෛද්‍ය විද්‍යාල ඉංජිනේරු විෂය ක්ෂේත්‍රවල කලක් යන තෙක් ඉංග්‍රිසි මාධ්‍යයම භාවිතා කරන්නට සිදු විය. 1965 අධ්‍යාපන ඇමති ධූරය ඉසිලූ අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල මැතිතුමා එකී විද්‍යා විෂයන්ද ස්වභාෂාවෙන් ඉගැන්විය යුතු බවට නියෝග නිකුත් කළ තැන් සිට 1965 සිට 1970 කාලය තුළ සියලුම විෂය පථවල ස්වභාෂාවෙන් නිදහස් අධ්‍යාපනය ලබා උපාධිධාරීහු දහස් ගණනින් පිටව සිටියහ. මේ සංඛ්‍යාවක් අතර බහුතරය කලා උපාධිධාරීහු වූහ.

1970 වන විට විශ්වවිද්‍යාල ගණනකින් ජාතියට විසුරුවා ලූ දහස් ගණන් උපාධිධාරීන්ට රැකියා සැපයීමට රජයට නොහැකි විය. එහෙයින් දහස් ගණනක් වූ රැකියා විරහිත උපාධිධාරීන් සිරගතව සංවිධාන කොට ප්‍රබල කැරැල්ලක් දක්වා මෙහෙයවන්නට තරුණ උපාධිධාරි නායකයෝ සමත් වූහ. ඔවුහු 1970 මැතිවරණයේ දී ක්‍රියාකාරීව ශ්‍රී ලංකා, සම සමාජ, කොමියුනිස්ට් පක්ෂවලින් සමන්විත සමඟි පෙරමුණ ජයග්‍රහණය කරවා වසරක් ගතවන්නට මත්තෙන් රජය පෙරළනු සඳහා 1971 අප්‍රියෙල් 5 වෙනිදා දඩි බිඩි විප්ලවයක් ඇරඹූහ. පැවැති රජය බලය යොදා එය මර්දනය කොට කැරළිකරුවන් ඔවුන්ගේ විශ්වවිද්‍යාලවලම පුනරුත්ථාපන සිර කඳවුරුවල ගාල් කළහ. නිරපරාදේ තරුණ ජීවිත දහස් ගණනක් ජාතියට අහිමි විය.

විශ්වවිද්‍යාල සිර කඳවුරුවල සිටි තරුණ උපාධි අපේක්ෂකයන් 1972 වන විට පුනරුත්ථාපනය කොට නිදහස් කිරීමෙන් පසු විශ්වවිද්‍යාල අධ්‍යාපනය දෙස විවිධ චෝදනා එල්ල වන්නට විය. ''සියල්ලටම මුල ස්වභාෂාවෙන් අධ්‍යාපනය දීමය'' ''බහුල වශයෙන් කලා විෂයන්ගෙන් අධ්‍යාපනය දීමයි'' ''විශ්වවිද්‍යාලවල නිදහස් කලා අධ්‍යාපනය සීමා කළ යුතුය'' වැනි මත පැතිරෙන්නට විය. විශේෂයෙන් සමඟි පෙරමුණ තුළ සිටි ලංකා සම සමාජ පක්ෂයේ මැති ඇමතිවරු පැවති නිදහස ස්වභාෂා මාධ්‍ය අධ්‍යාපනය දෙස ප්‍රකෝපව බලන්නට පටන් ගත්හ.

එවක අධ්‍යාපන ඇමති ධූරය ඉසුලු ආචාර්ය බදියුද්දීන් මහමුද් මහතාට මේ පිළිබඳ වගකීම පැවරිණ. අධ්‍යාපනයට මුදල් වෙන් කෙරෙන්නේ සම සමාජ පක්ෂයේ ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා මුදල් ඇමතිතුමා විසිනි. මේ අනුව අධ්‍යාපන ඇමතිතුමාට උසස් අධ්‍යාපනය විධිමත් කිරීමේ සුවිශේෂ කමිටුවක් 1972 දී පත් කරන්නට සිදු විය. විශ්වවිද්‍යාලය ආචාර්ය, මහාචාර්යවරුන්ගෙන් සමන්විත ඒ කමිටුවට මා ද අයත් වූ අතර මාස 6 ක් තරම් සුළු කාලයකදී වාර්තාවක් සපයන්නට සිදු විය.

කොමිසමේ බහුතර මතයට අනුව ඉදිරිපත් වුණ යෝජනාවලට එක එල්ලේ එකඟවීමට මට හැකියාවක් නොතිබිණ. ඒ විද්‍යෝදය, විද්‍යාලංකාර වැනි නව විශ්වවිද්‍යාලවල ස්වාධීන වර්ධනයට එකී යෝජනා හානිකර ප්‍රතිඵල ගෙන දෙන හෙයිනි. ඇතැම් අය කොමිසමෙන් ඉවත් වන ලෙස ද මගෙන් ඉල්ලා සිටියහ. එහෙත් පැවති දේශපාලනමය ආර්ථික හා සංස්කෘතික තත්ත්වයන් යටතේ ඒ යෝජනාවලින් ඇති විය හැකි හානි අවම කිරීමේ අරමුණින් මම තනිව ස්වාධීන වාර්තාවක් ඉදිරිපත් කළෙමි.

1. පවතින තත්ත්වයන් අනුව තනි විශ්වවිද්‍යාල හා අනුබද්ධ මණ්ඩප ක්‍රමයට තාවකාලිකව එකඟ වන බවද
2. එහෙත් නොබෝ කලකින්ම මණ්ඩප බවට පත් කෙරෙන විශ්වවිද්‍යාල ස්වාධීන විශ්වවිද්‍යාලයන් බවට පත්විය යුතු බවත් ඊට ඇති ඉඩකඩ නොඇහිරෙන ලෙස විෂයන් අධ්‍යයනාංශ හා පීඨ විධිමත් කිරීම් සලකා බැලිය යුතු බවත් මම ප්‍රකාශ කොට සිටියෙමි.

මේ කොමිසමේ යෝජනා අනුව පැවති විශ්වවිද්‍යාල ඒකාබද්ධ කොට තනි විශ්වවිද්‍යාලයක් සැලසුම් කොට පැවති විශ්වවිද්‍යාල මණ්ඩප බවට පත්කොට ඒ ඒ විෂය පථ අධ්‍යයනාංශ හා පීඨ ප්‍රතිසංවිධානය කිරීම සිදු විය. රැකියාභිමුඛ අයුරින් විෂය පථ සංශෝධනය කෙරිණි. වසර දෙක තුනක් ගත වන විට මේ ක්‍රමය අසාර්ථක බව පැහැදිලිව පෙනෙන්නට විය. 1980 තරමේ සිට නැවත පෙර පැවති විශ්වවිද්‍යාල ක්‍රමයට පරිවර්තනය විය. මේ පිළිබඳව අතුරු අනතුරු වාසිදායක හානිකර දේ තව කොතෙකුත් ඇත. එහෙත් තවදුරටත් ඒවායේ හැසිරෙන්නට කල් මද හෙයින් නුදුරු අනාගතයේ ඇතිවිය හැකි තුන්වන කැරැල්ලක් පිළිබඳ හෝඩුවාවක් පෙන්වමින් මට නතර වන්නට සිදුවේ.

## තුන්වන කැරැල්ලක පෙර නිමිති

දුගී ජනගහනයේ දරුවන්ට කන්නන්ගර සිරිමතාණන් උරුමකොට දුන් ස්වභාෂා මාධ්‍ය නිදහස අධ්‍යාපනයට හා තරඟකාරීව ධනවත් දරුවන් සඳහා මුදල් අයකර කෙරෙන ඉංග්‍රීසි මාධ්‍ය අධ්‍යාපන ක්‍රමයක් ප්‍රබල ලෙස ඉදිරිපත් වෙමින් තිබේ. හරියට කන්නන්ගර මහතා පටන් ගත් 1945 ට පෙර තිබූ තත්ත්වය ම යළි උදා වී ඇත. ඉංග්‍රීසි මාධ්‍ය ජාත්‍යන්තර පාඨශාලා ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල උසස් අධ්‍යාපන ආයතන හා ඈඳීගෙන උපාධි ලබාදෙන ආයතන බිහිව තිබේ.

ධනපති දෙමවුපියන් තම දූදරුවන් විශාල මුදල් කන්දරාවක් වියදම් කොට මේ ජාත්‍යන්තර විදුහල්වලට යවා ඉක්බිති විදේශ ගත කොට ඉංග්‍රීසි මාධ්‍යයෙන් උපාධි ලබාගැනීමට විවිධ පියවර දියත් වෙමින් තිබේ. ඒ අතර ලෝකාවේශය හෙවත් විශ්ව ගම්මානය වැනි මතවාද ද ප්‍රචාරය වෙමින් පවතී. මෙසේ විශ්ව ගම්මානයට සුදුසු වනු සඳහා ඉංග්‍රීසි මාධ්‍ය අධ්‍යාපනය ලද ධනපති පන්තියේ ජාතියේ දරුවන් නොබෝ කලකින් සිය මවු බිමට පැමිණ ලෝකාවේශ විශ්ව ගම්මානවලට ශ්‍රී ලංකා දායත්වය සැපයීමේ කාර්යයට සැදී පැහැදී සිටින රජයේ හා පෞද්ගලික අංශයේ රැකියාවල්

ඩැහැගන්නා විට නිදහස් අධ්‍යාපනය ස්වභාෂා මාධ්‍යයෙන් උගත් තරුණ පිරිස දහස් ගණනකට රැකියා විරහිතව සුසුම්ලන්නට සිදුවේ. රාජ්‍ය බලය ලබාගැනීමේ තරඟයේ නියැළී සිටින කිසියම් දේශපාලන පක්ෂයකට මේ රැකියා විරහිත දහස්ගණන් උපාධිධාරීන් සංවිධානය කොට තුන්වන කැරැල්ලක් බිහිකිරීමේ තත්ත්වය අත ළඟම එන බවට අනතුරු ඇඟවීමට මම කැමැත්තෙමි. නිදහස් අධ්‍යාපනය හා ස්වභාෂා මාධ්‍යය යන මාතෘකාව යටතේ වූ මගේ දේශනය මින් නතර කරමි. අද රටට බසින අපේ මේ උපාධිධාරීන්ට මේ පණිවිඩය දෙමින් මම නතර වෙමි.

ස්තුතියි.

<u>*2007.11.26*</u>

# 28

# විද්‍යාව හා මනුෂ්‍යත්වය: 21 වැනි ශත වර්ෂයේ අභියෝග

## මහාචාර්ය එරික් කරුණානායක

ප්‍රිය උපාධිලාභීනි, උපාධි ප්‍රදානෝත්සව දිනය ඔබට, ඔබේ මව්පියනට, නැදෑ හිතවතුන්ට සන්තුෂ්ටි ජනක දිනයකි. අද ඔබ උපාධිධාරීන් වන දිනයයි. එහෙත් අද ඔබ විශ්වවිද්‍යාල උපාධියක් ලැබීමෙන් ඔබේ අධ්‍යාපනය අවසන් නොවේ. සැබැවින් ම අද ඔබ දිවි පුරා ලබන අඛණ්ඩ අධ්‍යාපනය ආරම්භ කරනු ඇත. වෘත්තීය මාවතකට ප්‍රවිෂ්ට වීම සඳහා අවශ්‍ය මූලික දැනුම හා නිපුණතාවන් දැන් ඔබ ලබා ඇත. ඔබට මෙම අධ්‍යාපනය ලබාගත හැකි වූයේ අප රටේ පවතින ''නිදහස් අධ්‍යාපනය'' නිසා ය. මේ පිළිබඳව මිනිත්තු කිහිපයකට ඔබේ අවධානය යොමු කරවීමට මම කැමැත්තෙමි. මගේ නිහතමානී අදහසට අනුව නිදහස් අධ්‍යාපනය නමින් හැඳින්විය හැකි දෙයක් නැත. ඒ අධ්‍යාපනය සඳහා කවුරුන් හෝ මුදල් සපයන නිසා ය. ඈත ගම්බද පළාත්වල වෙසෙන හරමානිස් අප්පුහාමි, ජෝන් සිඤ්ඤෝ හා උක්කු මැණිකා ආදී සියලු දෙනා ම ඔබේ අධ්‍යාපනය සඳහා මුදල් ගෙවා ඇත. කෙටියෙන් කීවොත් අධ්‍යාපනය සඳහා මුදල් සැපයෙන ඒකාබද්ධ අරමුදලට ඍජුව හෝ වක්‍රව බදු ගෙවන සියලු දෙනා විසින් මුදල් සපයන ලදී. මෙම නිදහස් අධ්‍යාපනය සියලු දෙනාට ම එක සේ සැපයිය යුතු ද යන්නත් ප්‍රශ්නයකි. මසකට රුපියල් ලක්ෂ කිහිපයක් ආදායම් ලබන පවුල්වල දරුවනුත් මසකට රුපියල් 30,000ක හෝ 3000ක ආදායම් ලබන පවුල්වල දරුවනුත් එකසේ මෙම වරප්‍රසාදය ලබති. මෙහි සමාජ අසාධාරණයක් නැත් ද? ඔබ, විශ්වවිද්‍යාලයේ ගත කළ කාලය තුළ එහි විද්‍යාගාර පහසුකම්, පුස්තකාල පහසුකම්, ක්‍රීඩා පහසුකම්, නේවාසික පහසුකම් ආදී නොයෙකුත් පහසුකම්වල අඩුපාඩුකම් දකින්නට ඇති. මෙම පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ඔබ උගත් ශාස්ත්‍රාලයට ඔබෙන් ලැබිය හැකි දායකත්වය ගැන සිතන්න. මා අදහස් කරන්නේ අරමුදල් සැපයීම පමණක් නොවේ. ඔබේ දෙමව්පියන් සහ මහජනතාව මෙවැනි දේ පිළිබඳව දරන වැරදි අවබෝධයන් පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම ද ඉතා වැදගත් වේ.

විශ්වවිද්‍යාලය ඥාන ගර්භයක් සේ සැලකේ. නව දැනුම නිපදවීම හා දැනුම පතළ කිරීම විශ්වවිද්‍යාලයක වැදගත් කාර්යභාරයන් වේ. මේ නිසා විශ්වවිද්‍යාලවල ආචාර්යවරුන් සහ සිසුන් සියලු දෙන අප රටේ මහජනතාවගේ ජීවන තත්ත්වයන් සංවර්ධනයට අවශ්‍ය පර්යේෂණ කටයුතුවල නියැලීම අවශ්‍ය වේ. අප රටේ බදු ගෙවන්නන්ගේ වියදමින් ඔබට ස්වාභාවික විද්‍යාව හා වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධිධාරීන් විය හැකි විය. ඔබට මෙම ආයෝජනය ආපසු ගෙවිය හැක්කේ කෙසේ ද? අද දින ගෞරව උපාධි ලැබූ අය, මා සිතනා අන්දමට, දැනටමත් පිටරට විශ්වවිද්‍යාලවල දර්ශන උපාධි පාඨමාලා හැදෑරීමට අයදුම් කොට ඇත, නැතහොත් අයදුම් කරනු ඇත.

අප රටේ නිදහස් අධ්‍යාපන ක්‍රමය දියුණු රටවලට දක්ෂ තරුණයන් සපයන ක්‍රමයක් වී ඇත. අවස්ථාවන් සපයන්නේ නම් ඔබලා අතුරින් කී දෙනෙක් අප උපන් මේ රට තුළ ම එහි සංවර්ධනයට අදාළ විද්‍යාත්මක ව්‍යාපෘතිවල නියැලී දර්ශනසූරී පාඨමාලා හදාරයි ද? මෙය ඔබගේ හෘදය සාක්ෂියට අනුව ඔබ ම පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්නයකි.

දශක දෙකකට වැඩි කාලයක් මා වෛද්‍ය විද්‍යා සිසුනට උගන්වා ඇත. අද ඔබ එම ගෞරවණීය වෘත්තියට එළඹෙනු ඇත. ඔබ සියලු දෙන හිපොක්‍රටීස්ගේ දිවුරුම ගැන දන්නවා ඇතැයි සිතමි. 1505 දී ප්‍රථම බටහිර ආක්‍රමණිකයන් ලෙස පෘතුගීසීන් මෙරටට පැමිණෙන විට ශ්‍රී ලංකාව තුළ නවීන වෛද්‍ය විද්‍යාව නොතිබිණ. එහෙත් ශ්‍රී ලංකාවේ සියලු දෙන රෝගාබාධවලින් තොර වූ අය නොවූහ. ඔවුන්ගේ රෝගාබාධ සියල්ල ස්වාභාවිකව සුව වූවේ ද නොවේ. රෝගීන් සුවකිරීම සඳහා අප රටේ සිටියේ ආයුර්වේද හෝ වෙනත් පාරම්පරික වෙදුන් පමණි. මිනිසුන්ට මෙන් ම සතුන්ට ද වෙදකම් කරන වෛද්‍යවරුන් ඔවුන් අතර ගමේ පන්සලේ සංඝයා වහන්සේලා, ගම් ප්‍රධානීන් හා පාරම්පරිකව වෙදකමට උරුමකම් ලැබූ අය වූහ. ඔවුන් සියලු දෙනා සතුව උතුම් ගුණයක් විය. ඔවුන් වෛද්‍ය ශාස්ත්‍රය භාවිත කළේ හුදු මුදල් උපැයීමේ අපේක්ෂාවෙන් නොවේ. ගමේ ආයුර්වේද වෛද්‍යවරයකුගේ දෙවූ පුත් වශයෙන් උපන් මම, අපේ පියා ඔහු ලැබූ බුලත් හුරුළු දෙස බැලුවේ දිනය අවසානයේ බව ආඩම්බරයෙන් මතක් කරමි. බොහෝ බුලත් හුරුළුවල බුලත් හැර වෙනත් දෙයක් නොවී ය. එය සම්ප්‍රදායක් විය. රෝගීන් සුව කිරීම දේවත්වයට පමණක් දෙවැනි විය. වෛද්‍ය විද්‍යා උපාධිධාරීන්ට සිතට ගැනීම සඳහා යම් පණිවිඩයක් ලැබුණා යයි මම සිතමි.

කුලපති ස්වාමීන් වහන්ස, මා ඉතා සංවේගයට පත් කරවන කරුණක් ඇත. එක් ශිෂ්‍ය කොටසක්, ඇතැම් විට තම කණ්ඩායමටම අයත් තවත් ශිෂ්‍ය කොටසකට එරෙහිව ප්‍රචණ්ඩකාරී වීම අදහාගත නොහැකි ය. ප්‍රචණ්ඩත්වයෙන් මා අදහස් කරන්නේ ඇතැම් විට ජීවිතාන්තය දක්වා කෙනෙකු ආබාධිතයකු කරන නැත්නම් මරණයට පත් කරවන කායික හිංසාවයි. සියලු ම සිසුන් ප්‍රචණ්ඩත්වයට සම්බන්ධ නොවේ. එහෙත් කුඩා ගොම පිඩකින් කිරි කළය ම දූෂණය වන බව ඔබට වැටහෙනු ඇත. අප රටේ බදු ගෙවන්නන්ගේ උදව්වෙන් විශ්වවිද්‍යාලවල දොරවල් විවෘත වන්නේ තරුණ පරපුරේ හොඳම කොටසට යැයි පිළිගැනේ. අපේ රට වෙනත් ආගම් සමඟ සහජීවනයක් පවතින බෞද්ධ රටකි. අවිහිංසාව බෞද්ධ දර්ශනයේ මුදුන් ගලකි. අන් සියලු ආගම් ද සර්ව කරුණාව හා දයාව උගන්වයි. ආදරණීය දෙමාපියනි, උපාධිලාභීනි, මිනිසා තම සගයන් වෙත පෙන්වන අමානුෂික හැසිරීම නැවැත්වීම සඳහා අපට වැදගත් කාර්යයක් ඇත. ඔබේ ජීවිතයේ හොඳම කාලය කුමක් දැයි කෙනෙක් මගෙන් ප්‍රශ්න කළොත්, ඒ මා විශ්වවිද්‍යාලයේ ගතකළ අවුරුදු හතර යැයි මම වහා පිළිතුරු දෙමි. ඔබ සියලු දෙනටත් එම පිළිතුරු දිය හැකි ද? ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය තුළ ගතකළ කාලය තුළ ඔබ ප්‍රචණ්ඩ ක්‍රියාවලට සම්බන්ධ වී ද?

කුලපති ස්වාමීන් වහන්ස, මගේ දේශනයේ ඉතිරි කොටස තුළ විද්‍යාව හා මනුෂ්‍යත්වය ගැන කතා කිරීමට කැමැත්තෙමි. ජීවිත කාලයෙන් වැඩි කොටසක් විද්‍යාව වෙනුවෙන් ගත කළ අප වැන්නන් බොහෝවිට කරන වරදක් නම් විද්‍යාත්මක සංස්කෘතිය සදාකල් පැවැති සාරධර්ම පද්ධතියක් වී යැයි සැලකීමයි. විද්‍යාත්මක සංස්කෘතිය ශක්තිමත් වන්නේ විවෘත බව, පර්යේෂණ මෙවලම් හුවමාරුව, විශේෂඥ තුල්‍ය විචාර, පර්යේෂණ ප්‍රකාශන ආදිය පිළිබඳ අපගේ අඛණ්ඩ අවධාරණය නිසයි. 1660 දී පිහිටුවනු ලැබූ බ්‍රිතාන්‍ය රාජකීය සංගමය තම Philosophical Transactions නම් සඟරාව මඟින් නව විද්‍යාත්මක සොයාගැනීම් පළ කිරීම ආරම්භ කිරීමත් සමඟ නවීන විද්‍යාවේ විවෘත ප්‍රකාශනයන් පිළිබඳ සම්ප්‍රදායන් සහ චර්යාධර්ම ආරම්භ විය. විද්‍යාවේ විවෘත බව පෝෂණය වී පර්යේෂණ ප්‍රකාශනය විද්‍යාඥයන්ට තම අදහස් හා සොයා ගැනීම් සගයන්ගේ විධිමත් පිළිගැනීම් සඳහා ඉදිරිපත් කිරීමේ මාවතක් බවට පත් විය. මෙමඟින් විද්‍යාත්මක සොයා ගැනීම් මහජන විචක්ෂණයට භාජන වීමේ සහ ස්වාධීනව සනාථ කිරීමේ ප්‍රබල හා කාර්යක්ෂම සම්ප්‍රදායක් බිහි විය. එය අපේ ලෝකය වෙනස් කිරීමට හේතු විය.

විද්‍යාත්මක දැනුම පුරෝකථනය කළ නොහැකි අන්දමින් සංවර්ධනය හා සංයෝග වීමත් සමඟ මිනිසාගේ අවශ්‍යතාවන් සඳහා ස්වාභාවික ලෝකය නොසිතූ විරූ අන්දමින් පරිවාරණය කිරීමේ හැකියාවක් මිනිසාට ලැබිණ. පර්යේෂණවල ප්‍රගතියේ අනපේක්ෂිත බව 1926 දී ජේ. බී. එස්. හැල්ඩේන් විසින් සරලව සංක්ෂිප්ත කළේ මෙසේ ය. ''අකුණු කුණාටුවත් උණත් යන දෙකෙහිම දර්ශකයන් වූයේ වීදුරු නළ තුළ ඇති රසදිය කඳන් ය. මෙය පුරෝකථනය කළ හැකි වූයේ කවර දිවැසිවරයකුට ද?'' නුවණැත්තන් අනාගතය පිළිබඳ අපේක්ෂාවෙන් ගොඩ නගන අතර අනාවැකි කියන්නේ මෝඩයන් යැයි වරක් නොබෙල් ත්‍යාගලාභී පීටර් මැඩවාර් ලියා ඇත. X - කිරණ, විකිරණශීලතාව, අධි උෂ්ණත්ව අධිසන්නායක ජීවය නිර්මාණය කරන අණුවේ ද්විත්ව හිලික්ස් ව්‍යුහය සොයා ගැනීම අපේ සමාජය වෙත නොසිතූ විරූ බලපෑම් කළ සොයා ගැනීම්වලට නිදර්ශන කිහිපයකි.

එසේ වුවත් රාජ්‍ය ආයතන සහ නීති සම්පාදකයන් විසින් විද්‍යාවෙන් ලබාගත හැකි ප්‍රතිලාභ ගැනත් පර්යේෂකයන් පිළිබඳ අපේක්ෂාවනුත්, විශේෂයෙන් ඔවුන්ගේ පූර්ව මර්ෂිත සොයා ගැනීම් පිළිබඳව ඇති කරගනු ලබන අපේක්ෂාවනුත් වඩ වඩාත් තීව්‍ර වේ යැයි යන අපහසුදායක හැඟීම් ද අප තුළ පවතී. මිනිස් ජීවිතයේ ගුණාත්මක බව කෙරෙහි විද්‍යාව බලපාන ආකාරය ගැන මහජනයා දැනුවත් කිරීම උගත් සමාජවල අවශ්‍යතාවක් වන්නේ එනිසයි.

විද්‍යාඥයෝ වෘත්තිකයන් ලෙස වැදගත් සාරධර්ම උගන්වති. අවංක බව, නව අදහස් ගැන ආශා කිරීම, පොදු යහපත සඳහා දැනුම බෙදා ගැනීම අන් අය විසින් කරනු ලබන හරි වැරදි බැලීම්වලට ගරු කිරීම මේවා අතර වේ. මෙම ''විද්‍යා චර්යාව'' නිසා විද්‍යාව ප්‍රජාතන්ත්‍රවාදයට උත්ප්‍රේරකයක් වේ. විද්‍යාවත් ප්‍රජාතන්ත්‍රවායත් විසම්මුතියට ඉඩ සලසමින් එමඟින් ශක්තිමත් වේ. විද්‍යාවෙහි ඔප්පු කිරීමේ අවශ්‍යතාව ප්‍රජාතන්ත්‍රවාදයේ සාධාරණත්වයට සමාන කළ හැකි ය. ප්‍රජාතන්ත්‍රවාදය විද්‍යාවේ සාරධර්මවලින් රුකුල් ලබන අතර විද්‍යාව ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රතිපත්තිවලින් පෝෂණය වේ.

20 වැනි ශත වර්ෂයේ අවසාන දශක පහ තුළ භෞතික විද්‍යාවන් මෙන් ම ජෛවීය විද්‍යාවන් ද අපූර්ව ප්‍රගතියක් ලැබීය. ප්‍රමුඛස්ථානයේ සොයා ගැනීම් හා ප්‍රවර්ධනයන් අතර ලේසර් තාක්ෂණය, සන්නිවේදන තාක්ෂණය, පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය, DNA වල ව්‍යුහය සොයා ගැනීම, ප්‍රවේණි කේතය හෙළිදරව් කර ගැනීම, ජාන තාක්ෂණයේ ප්‍රවර්ධනය, පොලිමරේස් දාම ප්‍රතික්‍රියාව සහ මිනිස් ජීවය සැලසුම් කරන මානව ජීනෝමයේ බිලියන 3.2 ක් වන රසායනික අණු ලක්ෂණ කියවීමේ මස්තක ප්‍රාප්තිය ද විය.

මෙම ප්‍රගතීන් මිනිස් ජීවිතවල ගුණාත්මක බව කෙරෙහි පුරෝකථනය කළ නොහැකි සේ, සිතිය නොහැකි සේ, පෙර නොවූ විරූ සේ, බලපාන බවට සැකයක් නැත, මානව ජිනෝම ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමෙන් සියලු ම මනුෂ්‍යයන් සියයට 99.9 ක් සමාන බවටත් අප්‍රිකාවෙන් සම්භවය වූ බවටත් ප්‍රබල විද්‍යාත්මක සාක්ෂි ලැබිණ.

ජිනෝම විද්‍යාවේ ශීඝ්‍ර ප්‍රගතිය සහ ඉන් ලබා ගත හැකි භාවිතයන් පිළිබඳ ක්ෂණික බැල්මකින් 21 වන ශත වර්ෂයේ ප්‍රමුඛතම විද්‍යාව ජීව විද්‍යාව වන බවට අනාවැකි කීමට නිරීක්ෂකයන් පොළඹවයි. මානව ජිනෝම ව්‍යාපෘතිය සහ අනෙක් ජිනෝම පර්යේෂණ මඟින් ජනනය වූ තාක්ෂණ හා සම්පත් මඟින් දැනටමත් ජීව විද්‍යාවේ පුළුල් බලපෑම් ඇති කරයි. වර්තමාන විද්‍යා ප්‍රකාශන දෙස බලන කෙනෙකුට නවීන විෂය ක්ෂේත්‍ර නාමාවලි රාශියක් හමු වනු ඇත. අණුක වෛද්‍ය විද්‍යාව, ක්ෂුද්‍රජීව ජිනෝම විද්‍යා, DNA අනන්‍යයනය, ජෛවපුරා විද්‍යාව, මානව විද්‍යාව, ජෛව පැසුරුම,

ජෛව තාක්ෂණය හා නැනෝ වෛද්‍ය විද්‍යාව ඒ අතුරින් කිහිපයකි. මේ අතරම, විද්‍යාඥයෝ තම සමාජ වගකීම් ගැන ද අපරීක්ෂාකාරී නොවෙති. මානව ජිනෝම ව්‍යාපෘතියේ ආචාරධර්ම, නෛතික හා සමාජීය (ELSI) සම්බන්ධයන් ගැන කෙරෙන අධ්‍යයනය විද්‍යාඥයන් සමාජ වගකීම් ගැන ඇති සැලකිලිමත් බව පෙන්වන හොඳ නිදර්ශනයකි. ඇත්ත වශයෙන් ම ජිමී වොට්සන් විසින් මානව ජිනෝම ව්‍යාපෘතියේ අරමුදල්වලින් 10% ක්ම ELSI ව්‍යාපෘතිය සඳහා වෙන්කරන ලදි. වර්ෂ 2020 වන විට ඇමෙරිකානු ඩොලර් 1000 ක පමණ වියදමකින් ඕනෑම පුද්ගලයෙකුගේ ජිනෝම අනුපිළිවෙල දැන ගැනීමට අවශ්‍ය තාක්ෂණය බිහිවනු ඇතැ යි දැන් අනාවැකි පළවේ. මෙය ඔබේ වෛද්‍යවරයා විසින් ඔබේ රෝග විනිශ්චය සඳහා පරිගණකයට ඇතුළු කරන කුඩා චිප් එකක් ලෙස ලබා ගත හැකිවනු ඇත. මෙමගින් වෛද්‍යවරුනට අනාගතයේ දී පුද්ගල - පුනාකාර ක්‍රමයකට යොමු වීමට හැකි වනු ඇතැයි අනාවැකි පළ වේ. මෙම ප්‍රගතිය DNA වල ව්‍යුහය හෙළිදරව් කර ගැනීමේ ඍජු ප්‍රතිඵලයකි.

මා මුලින් සඳහන් කළ පරිදි සියලු ම මිනිසුන්ගේ ජිනෝම 99.9% කින් සමාන වුවද ඒවාහි වෙනස්කම් ද පවතී. මෙම වෙනස්කම් රෝග විනිශ්චයේදී හා ප්‍රතිකාර කිරීමේදී ප්‍රයෝජනයට ගනිමින් පවතී. මේවා 21 වැනි ශත වර්ෂයේ අභියෝග වේ. පුද්ගල ජිනෝමවල අනන්‍ය අනුපිළිවෙළ දැනගත හැකි වීම ආචාරධර්ම පිළිබඳ ගැටලු ද මතු කරයි. නිදසුනක් වශයෙන් කෙනෙකු ජීවිතයේ පසු අවස්ථාවකදී දියවැඩියාවට නැතහොත් හෘදය රෝගවලට භාජන වීමේ වැඩි හැකියාව පුරෝකථනය කළ හැකි වනු ඇත. මෙම තොරතුරු එවැන්නන්ගේ ජීවිත රක්ෂණ සඳහා වැඩි වාරික මුදලක් ලබා ගැනීම සඳහා රක්ෂණ සමාගම් වෙත සැපයිය යුතු ද?

විද්‍යාව හා තාක්ෂණය මෙහි අපූර්ව ප්‍රගතිය ලබා ඇති නමුත්, ලෝක බැංකුවේ හිටපු උපසභාපති කෙනෙකු වන ඉස්මායිල් සෙරගෙල්ඩින්ට අනුව, වර්තමානයේ මිනිසුන් බිලියන 1.2ක් දිනකට ඩොලරයකටත් අඩු ආදායම ලබන අය වෙති. බිලියන එකක් මිනිසුන්ට පිරිසිදු ජලය ලබා ගත නොහැකි ය. බිලියන 2 කට වැඩි මිනිසුනට අවශ්‍ය තරම් සනීපාරක්ෂක පහසුකම් නොමැත. මිලියන 700 කට වැඩි ජන සංඛ්‍යාවක්, බොහෝ සෙයින් ස්ත්‍රීන් හා ළමුන් දිනකට සිගරට් පැකට් 3 ක දුම්බීමට සමාන ජෛව ස්කන්ධ පෝරණුවලින් සිදුවන වායු දූෂණයෙන් පීඩා විඳිති. 40000 ක පමණ සංඛ්‍යාවක් කුසගින්න හා සම්බන්ධ ආබාධවලින් දිනපතා මිය යති. මිලියන 2500 ක් (ලෝක ජනගහනයෙන් 40% ක්) මැලේරියා රෝග අවදානමට ලක් වී ඇත. මිලියන 1100 ක් ත්වචීය සහ වසා බරවා රෝග අවදානමට ලක්වී ඇත.

මෙම මිනිස් පීඩාවන්ට මුළුමනින් ප්‍රතිවිරුද්ධව ලෝක ජනගහනයෙන් ඉහළ 20% ක් ලෝක ආදායමෙන් 85% ක් භුක්ති විඳිති. ඉතිරි 80% දෙනා 15% ක ආදායමෙන් යැපෙන අතර පහළ 20% යැපෙන්නේ 1.3% කිනි. ලෝකයේ පොහොසත්ම තිදෙනා ලෝකයේ දුප්පත්ම රටවල් 47 ක දළ දේශීය නිෂ්පාදනවල එකතුවට වැඩි ධනයකට හිමිකම් කියන බව ත්‍රාස ජනක ය.

කුලපති ස්වාමීන් වහන්ස, උපාධිලාභීනි, දෙමව්පියනි, මිනිස් අයිතිවාසිකම්, මිනිස් ගෞරවය, ගෝලීය සමාජ සාධාරණත්වය ඇත්තේ කොහි ද? මේවා 21 වන ශතවර්ෂයේ විද්‍යාව හා තාක්ෂණයේ අභියෝග වනු ඇත. ඒවා ඔබගේ අභියෝග වනු ඇත. අධිෂ්ඨානයෙන්, වගකීමෙන් හා කැපවීමෙන් මුහුණ දිය යුතු අභියෝග වේ. ඔබ ලැබූ දැනුම ප්‍රථමයෙන් අප උපන් මේ රටේ අභිවෘද්ධිය සඳහා යොමු කළ යුතු ය. ඒ සඳහා ඔබට හැකියාව ඇත. ජාතික අභියෝගවලින් මිදී සරුබිම් කරා නොදුවන්න. දෙවැනි ලෝක යුද සමයේ බ්‍රිතාන්‍ය අග්‍රාමාත්‍ය වූ වින්ස්ටන් චර්චිල් වරක් ජාතිය අමතා

ප්‍රකාශ කළේ ''එංගලන්තයෙන් ඔබට කළ හැකි දේ නොඅසන්න. ඔබෙන් එංගලන්තයට කළ හැකි දේ අසන්න'' යනුවෙනි.

ප්‍රිය උපාධිලාභීනි, ඔබත් මෙම ප්‍රශ්නයට පිළිතුරු දිය යුතු වේ. 21 වන ශත වර්ෂයේ අභියෝගවලට සාර්ථකව මුහුණ දී අපට මේ රට සාමයෙන් හා සෞභාග්‍යයෙන් පිරි දේශයක් කළ හැකි නම් එය ලොව පාරාදීසයක් වෙනු ඇත. ඔබ මෙරට අනාගත පාලකයෝ ය. මෙම අභියෝගවලට ඔබ සාර්ථකව මුහුණ දිය යුතු ය. ඔබට එය කළ හැකි බව මගේ පූර්ණ විශ්වාසයයි.

ස්තුතියි.

<u>*2007.11.26*</u>

# 29

# වත්මන් ශ්‍රී ලංකා සමාජයේ උපාධිධාරියා සතු වගකීම හා කාර්යභාරය

මහාචාර්ය පූජ්‍ය ගතාරේ ධම්මපාල හිමි

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධිලාභීන්ට උපාධි සහ සහතික පත්‍ර පිරිනමන මේ මොහොතේ මෙකී විද්‍යාර්ථීන් සතු කාර්යභාරය පිළිබඳ සොයා බැලීම වැදගත් කොට සලකමු. උපාධිධාරියා යනු සුවිශේෂ පුද්ගලයෙක් නොවේ. ඔහු කිසියම් සමාජ ප්‍රස්තරයක් නියෝජනය කරන වියතුන්ගේ ගණයට අයත් වන පුද්ගලයෙකි. අද විශ්වවිද්‍යාල මගින් මේ වර්ගයේ උගත් තරුණ තරුණියෝ දහස් ගණනක් වසරක් පාසා බිහි කෙරෙති. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් බාහිර උපාධිධාරීන් 17000ක් පමණ පිරිසක් වසරක් පාසා බිහි කරනු ලබන බව කියැවේ. කැලණිය, රුහුණ හා පේරාදෙණිය විශ්වවිද්‍යාලවලින් ද එබඳු සංඛ්‍යාවක් බිහි වෙයි. මේ විද්‍යාර්ථීහු උපාධියෙන් පසු ගුරු පත්වීම් ලැබ ආචාර්යවරුන් ලෙස රජයේ හෝ පෞද්ගලික ආයතනයක සේවය කරති, නැතහොත් රජයේ ආයතනවල විවිධ තනතුරු සඳහා බඳවා ගනු ලැබෙති. මෙකී උපාධිධාරීන් අභ්‍යන්තර බාහිර වශයෙන් වර්ග කිරීමට අපි පුරුදුව සිටිමු. මේ නම් කිරීම කෙතරම් අර්ථාන්විත දැයි අපි නොදනිමු. ඔවුන් පරීක්ෂණයට පෙනී සිට ඇත්තේ එක්කෝ අභ්‍යන්තර වශයෙන් විය හැකිය. නැතහොත් බාහිර වශයෙන් විය හැකිය. උපාධිය අභ්‍යන්තර වුවත් බාහිර වුවත් මේ සියලුදෙනා ලබා ඇත්තේ සමාන උපාධියකි. සමාන ලකුණු ප්‍රමාණයක් හෝ සමාන ශ්‍රේණියකි. නිර්දේශානුකූල විශ්වවිද්‍යාලය ආචාර්ය මණ්ඩලයක් මගින් පිළියෙල කරනු ලබන ප්‍රශ්න පත්‍රවලට ඒ හැමදෙනාම සාර්ථක ලෙස පිළිතුරු ලිවිය යුතුය. නියමිත විෂයන්ට අදාළ පාඨමාලාව නියමිත කාලවකවානුව තුළ අභ්‍යන්තර ලෙස හෝ බාහිර ලෙස හෝ හැදෑරිය යුතුය. අභ්‍යන්තර ශිෂ්‍යයාට නියමිත පාඨමාලාව විශ්වවිද්‍යාලය තුළ හැදෑරීමට පහසුකම් සපයා ඇති අතර බාහිර ශිෂ්‍යයන්ට විශ්වවිද්‍යාලයෙන් පිටත පුද්ගලයන් විසින් හෝ බාහිර ආයතන මඟින් හෝ අධ්‍යයන පහසුකම් සලසා ඇත. බාහිර සිසුන් පාඨමාලාව හැදෑරීම සඳහා මුදල් ගෙවිය යුතුය. පන්තිවලට සහභාගි වීම ගැන විශේෂ නීතිරීති බාහිර සිසුන්ට සෘජුවම පනවා නැතත්, විශ්වවිද්‍යාලවල බාහිර විභාග ඒකකය මගින් ඇතැම් නිර්දේශ ඉදිරිපත් කර ඇත. බාහිර ශිෂ්‍යයෝ ඒවා පිළිපැදීමට බැඳිසිටී. මෙබඳු කරුණු කිහිපයක් හැරුණු විට අභ්‍යන්තර බාහිර භේදය යථාර්ථයක් නොවේ. එකම පරීක්ෂණයක දී ලබන ලකුණු කීපයක වෙනස මෙකී බෙදීමට හේතු කාරක වෙයි. ලකුණු කීපයක පරතරය උපාධිධාරියාගේ බුද්ධිය පිළිබඳ සුවිශේෂත්වය පළ කරන්නක් නොවේ. අභ්‍යන්තර ශිෂ්‍යයා බාහිර ශිෂ්‍යයාට වඩා කුසලතා පිරි අයකු බවත් මින් ප්‍රකාශ නොවේ. ඔවුන් ද කුසලතා පූර්ණ අය ලෙස සැලකීමේ වරදක් නැත. අදින් පසු ඔබ හැමදෙන රජය මගිනුත් මහා සමාජය මගිනුත් සලකනුයේ උපාධිධාරීන් වශයෙනි. අභ්‍යන්තර බාහිර උපාධිධාරීන් වශයෙන් නොවේ. අභ්‍යන්තර බාහිර භේදය හුදු නාම මාත්‍රයක් බවට පත් වේ.

මෙහිලා ඔබ උපාධි ලැබූ විශ්වවිද්‍යාලයේ අතීත තොරතුරු බිඳක් සොයා බැලීම වැදගත් ය. ඔබ ගුරුකුලයේ විශිෂ්ට ඉතිහාසය ඔබට ආත්මාභිමානයක් ගෙන දෙනු ඇත. ඔබ කවුරුත් දන්නා පරිදි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වූ කලී මාළිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන 1959 දී විශ්වවිද්‍යාලය තත්ත්වයට උසස් කිරීමෙන් ඇති වූ නව විද්‍යාස්ථානයයි. විද්‍යෝදය පිරිවෙන ආරම්භ කරන ලද්දේ පණ්ඩිත ශිරෝමණී හික්කඩුවේ සුමංගල නාහිමියන් විසිනි. 1873 දී විද්‍යාධාර සභාවේ ද ආධාර

ඇතිව අරඹන ලද මෙකී ආයතනයෙන් අපේක්ෂා කරන ලද්දේ එවකට අභාවයට ගොස් පැවති භික්ෂු අධ්‍යාපනය නංවාලීමය. අනුරාධපුර පොලොන්නරු යුගයන්හි හා දඹදෙණි කෝට්ටේ යුගවල ද නැගෙමින් බසිමින් පැවති පිරිවෙන් අධ්‍යාපනය නුවර යුගයේ බෙහෙවින් පිරිහීමට පත් විය. 1815 දී ඉංග්‍රීසි පාලකයන් යටතේ එය තවත් පහළ තත්ත්වයකට පැමිණියේය. නුවර යුගයේ ධර්ම ශාස්ත්‍ර ප්‍රදීපය දැල්වීමට ඉදිරිපත් වූයේ වැලිවිට සරණංකර හිමිපාණෝ ය. ලංකාව පුරා විසිරී පැවති උගතුන් හා පොතපත ද එකලස් කර ධර්ම ශාස්ත්‍රීය දැනුම බෙදාගෙන පොතපත සුලභ කිරීමේ දැවැන්ත ව්‍යාපාරය අරඹන ලද්දේ උන්වහන්සේ විසිනි. නියමකන්දේ විද්‍යාස්ථානය පදනම් කරගෙන සාමණේර බණ දහම් පොතේ සිට අටුවා ටීකා සහිත ත්‍රිපිටක ධර්මයත්, තර්ක ව්‍යාකරණ ඉතිහාසය ඡන්දෝලංකාර ඇතුළු ශාස්ත්‍රාන්තරයන් පිළිබඳ නව ප්‍රබෝධයක් ඇති කිරීමෙහි ලා සරණංකර සංඝරාජයන්ගෙන් සැලසුණේ අපරිමිත මෙහෙයකි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ධර්ම ශාස්ත්‍ර පිළිබඳ නව දියුණුවක් ඇතිවෙමින් පැවතිණි. එහෙත් එකී දියුණුව සිංහල රාජ්‍යයේ බිඳවැටීමත් සමග වියැකී ගියේය. ඒ අතරම මහනුවර අවට හා දකුණු පළාතේ ද වයඹ හා කොළඹ පළාත්වලද ශේෂව පැවැති ධර්ම ශාස්ත්‍රිය අධ්‍යාපනය නව මඟකට ගැනීමට පශ්චාත් නුවර යුගයේත් කොළඹ යුගයේත් වියත් හිමිවරු පෙරමුණ ගෙන ක්‍රියා කළහ.

රත්මලානේ පරම ධම්මචේතිය පිරිවෙනේ වලානේ ශ්‍රී සිද්ධාර්ථ නා හිමියන් යටතේ ධර්ම ශාස්ත්‍රීය අධ්‍යාපනය ලැබූ හික්කඩුවේ සුමංගල, රත්මලානේ ධර්මාලෝක හා රත්මලානේ ධර්මාරාම නා හිමිවරුන් ඇරඹූ විද්‍යෝදය විද්‍යාලංකාර දෙපිරිවෙන ශාඛා අනුශාඛා සහිතව පැතිරී ගියේය. මේ පිරිවෙන් දෙකෙහි ශාඛා දිවයිනේ නන් දෙස විහිදෙන්නට වූ අතර එමඟින් ගුරුකුල දෙකක් පැන නැගුණි. මුල්කාලයේ දී දිවයින පුරා පැතුරුණු මේ පිරිවෙන්වල විෂය මාලාව ප්‍රාචීන භාෂා අධ්‍යයනයට මුල් තැන ලැබෙන සේ සකස් විය. මේවා මුළුමනින් පාලි, සංස්කෘත, ප්‍රාකෘත, ව්‍යාකරණ, ඡන්දෝලංකාර වැනි විෂය ඉලක්ක කරගත් දැනුම ලබා දීම පරමාර්ථ කරගෙන පිහිටුවනු ලැබිණි. සාම්ප්‍රදායික පිරිවෙන් අධ්‍යාපනයේ හැඩරුවට පටහැනි නොවන පරිදි මේවායේ අධ්‍යාපන රටාව ගොඩ නැගුණි. මේවායේ අධ්‍යාපන කටයුතු භාර වූයේ බොහෝ ඇසූ පිරූ තැන් ඇති භික්ෂූන්ට ය. ඒ ඒ විෂය පිළිබඳ විශේෂ දැනුමක් ලබා සිටි ඔවුන්ට විෂයට අදාළ කොටස් කටපාඩමින් කීමට හැකි විය. ව්‍යාකරණ ග්‍රන්ථ හා නිඝණ්ඩු ද එකල උගතුන්ට කට පාඩම් තිබුණි. පිරිවෙන්වල පැවැති එකී ඉගැන්වීම් පිළිවෙළට අනුකූල ලෙස විභාග ද පවත්වන ලදි. විභාගවලින් සමත්ව තමන් ඉගෙනගත් දෑ කටපාඩමින් කියවිය හැකි අර්ථ දැනෙන සේ ශබ්ද නඟා කියවිය හැකි උගතුන්ට ඒ ඒ පිරිවෙන්හි ගුරුපත්වීම් ලබා ගත හැකි විය. ගුරුවරුන්ගේ ඇතට ඇසෙන ශබ්දයත් මිහිරි කටහඬත් ශිෂ්‍යයන්ගේ සිත් ඇඳ බැඳ ගැනීමට බෙහෙවින් හේතු විය.

කලින් සඳහන් කළ පරිදි විශ්වවිද්‍යාල උපාධිධරයා විෂය දැනුමෙන් පිරිපුන් අයෙකි. සාමාන්‍ය උපාධිධරයා විෂය තුනක් පිළිබඳ විශේෂ සමත්කමක් විදහා පායි. විශේෂවේදියා ප්‍රධාන විෂයයක් ද අනුවිෂයයක් ද හදාරා ඇත. මේ විෂය පිළිබඳ නිර්දේශානුකූල ප්‍රශ්න පත්‍ර දැනුමකට ඔහු හිමිකම් කියයි. ගුරු මුවෙන් දැනගත් දේ පිළිබඳව බාහිර පොතපත කියවාලත් දැනුමෙන් තමන්ට පැහැදිලි අවබෝධයක් ඇති කරගත යුතුය. එම දැනුම ප්‍රබල හා ස්ථාවර එකක් විය යුතුය. තමාගේ පෞරුෂ වර්ධනයට ද මේ දැනුම ඉවහල් වනු ඇත. පෞරුෂය යනුවෙන් අදහස් කරන්නේ පුද්ගලයා සතු විශේෂත්වයකි. විශාරද භාවයකි. විශේෂත්වය තමා ඕනෑකමින් ගොඩනගාගත් එකක් හෝ මානසික ශක්තිය හා බුද්ධිය මගින් ඉස්මතු වූ තත්ත්වයක් හෝ විය හැකිය. කිසියම් විවාදාපන්න මතභේදාත්මක කරුණක් ඉදිරියේ ස්වීයත්වය රැකගෙන ඉදිරිපත් විය හැක්කේ පෞරුෂය ඇති අයෙකුටය. එසේ නැති තැන්හි ඔහු පසු බසී. තමා තුළ සහජයෙන් පිහිටා ඇති ශක්තීන් ගැන යමෙකුට විශ්වාසයක් නැති නම් ඔහු පෞරුෂයෙන් තොර අයෙකු ලෙස ගිණිය යුතුය. මව්පියන් විසින් දරුවනට දිය යුතු

දායාදය නම් වියතුන් ඉදිරියේ නොසැලී සිටීමට ඉවහල් වන පරිදි ශිල්ප දීම යැයි ලෝකෝපකාර කතුවරයා පළ කරයි. ප්‍රබලයන් හා දුබලයන් අතර පරතරය බැහැර ලිය හැක්කේ පෞරුෂය මගිනි. දැනුම අවබෝධය හා ස්ථාවරත්වයට පෞරුෂය හේතු වෙයි.

විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපකුලපති අපවත් වී වදාළ වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමියෝ වරක් විශ්වවිද්‍යාලයීය සිසුන් අමතා විශ්වවිද්‍යාල ශිෂ්‍යයා ගවේෂණශීලී විය යුතු යැයි ද විචාරශීලි විය යුතු යැයි ද විප්ලවවාදී විය යුතු යැයිද ප්‍රකාශ කළහ. මෙය විශ්වවිද්‍යාල ශිෂ්‍යයාට පමණක් නොව විශ්වවිද්‍යාල උපාධිධරයාට ද එක සේ ගැළපෙන කියමනකි. ගවේෂණශීලි බව විද්‍යාර්ථියකු සම්බන්ධ වැදගත් ලක්ෂණයකි. ගවේෂණය නම් සොයා බැලීමය. ගව+ඒෂණ යන වචන දෙක එක්වීමෙන් ගවේෂණ යන්න නිපදී ඇත. ගවයන් සෙවීම යනු එහි අරුතය. පුරාණ කාලයේ කෘෂකයන්, නැති වූ ගවයන් සෙවීම සඳහා භාවිත කළ වචනයෙහි සාමාන්‍ය තත්ත්වය ඉක්මවා කරනු ලබන සොයා බැලීම මින් කියවේ. සාමාන්‍ය සමාජයේ නැති වූ භාණ්ඩයක් සෙවීම වගේම සැඟවී ඇති දෙයක්, රහස් හෝ ගුප්ත වස්තුවක් සොයා යාම ගවේෂණයයි. වචනයක අප්‍රකට අරුතක් සොයා යාම වුවද ගවේෂණයකි. විවාදාපන්න කරුණක් හෝ සංසිද්ධියක් ගැන ගැඹුරින් සොයා බැලීමද මෙයට අයත්ය. ලංකාව අවට මුහුදු තීරයේ තෙල් ගවේෂණය ද එබඳු සොයා බැලීමකි. සියලුම ගවේෂණ ඒකාකාර නොවේ. එකම විධික්‍රමයක් ඒ සඳහා භාවිත නොවේ. ඒ සියල්ල එබඳු පරමාර්ථයක් ඉලක්ක කොට ඇති බව කිව යුතුය.

විචාරශීලීභාවය බුද්ධිමතුන්ට අදාළය. යමෙකු කියූ පමණින් එ ගැන වැඩිදුරටත් හාරා බලන්නේ නැතිව මතුපිටින් විමසා බලා නිගමනවලට බැසීම බුද්ධිමතාට නොගැළපේ. බුද්ධිමතාගේ කාර්යය විය යුත්තේ හැම විට යමක් ගැඹුරෙන් සොයා බැලීමය. මේ ආකාර සොයා බැලීම ඉවහල් වනුයේ සත්‍ය ගවේෂණයකට ය. යමෙකු කියූ කරුණක් ගැන වුවද පොතක සඳහන් කරුණක් ගැන වුවද ඒ සැණෙන් භාරගත යුතු නැත. එය සැබෑවක්ද, මුසාවක් ද සොයා බැලීම අවශ්‍යය. මෙසේ තමා අවට ඇති හැම දෙයක් ගැනම විචාර පූර්වකව සලකා බැලීම වැදගත් වේ. එය බුද්ධිමතුන් සතු වගකීමකි. බුදුරජාණන් වහන්සේ වදාළේ ධර්මයක වුවත් තමන්ගේ ආදි පුරුෂයන් විසින්, ගුරුන් විසින් පවත්වාගෙන ආවේ යැයි කියා හෝ සත්‍ය යැයි කියා හෝ වැටහෙතැයි කියා හෝ භාර නොගත යුතු බවයි. මේ කරුණ කල්පනාවට ගැනීම උපාධිධාරියකු සතු කාර්යයකි. ඔහු මේ ගැන නොසිතන්නේ නම් තමා වරක් ගත් තීරණය වෙනස් කිරීමට සිදු වේ. වරක් කියූ දෙයට පටහැනි දෙයක් කියන්නෙක් වෙයි. එයින් ඇති වන පාඩුව ගැන පසුතැවිල්ලට පත්වීමට සිදු වෙයි. බුද්ධිමතා තීරණයක් ගත යුත්තේ යම්කිසි ගැටළුවක සෑම අංශයක් ගැනම සුපරීක්ෂාකාරීව බැලීමෙන් පසුවය.

උපාධිධරයෙකු සමාජය දෙස බැලිය යුත්තේ පුළුල් දෘෂ්ටියකිනි. ඔහුට පුළුල් මානසිකත්වයක් තිබිය යුතුය. සාමාන්‍යයෙන් සමාජයේ වෙසෙන බොහෝ දෙනා පුරුදු වී සිටින්නේ සමාජය දෙස පටු දෘෂ්ටියකින් බැලීමටය. නොගැඹුරු මනසකින් බැලීමටය. සමාජය වූ කලි සංකීර්ණ වූවකි. එහි නරක මිනිසුන් මෙන්ම හොඳ මිනිස්සු ද වෙති. හොරුන්, මිනීමරුවන් මෙන්ම උපාසකයෝ ද වෙති. ප්‍රබුද්ධ මනසක් ඇතියන් ලෙස බුද්ධිමතා සමාජය දෙස විවිධ කෝණවලින් බැලිය යුතුය. හැම තරාතිරමකම පුද්ගලයන් සමාජයක් තුළ වෙසෙන බව මෙහිදී ඔහුට අවබෝධ වනු ඇත. සමාජය දෙස ක්‍රෝධ සහගතව බලනවා වෙනුවට දයා සිතින් බැලීමට යමකු හුරු වන අයුරු දැකිය හැකිය. මේ ආකාරයට බුද්ධිමතා යථාර්ථවත් ලෙස ලෝකයත් සමාජයත් හඳාරන්නේ නම් ඔහු තුළ දයාවත් කරුණාවත් වගා කිරීම අසීරු නොවේ.

උපාධිධරයෙකු වශයෙන් යමකු සම්ප්‍රදායවාදියකු විය යුතු යැයි කියනු ඇත. උගත්කමක් සම්ප්‍රදායවාදයත් එකක් නොවේ. උගත්කම සම්ප්‍රදාය සමග ඒකාබද්ධ වී පවත්වන්නේ යැයි ඇතැමෙක් කල්පනා කරති. සම්ප්‍රදාය යනු ජනතාවක් විසින් දීර්ඝකාලීනව පවත්වාගෙන එනු ලබන සිරිත්-විරිත්, විශ්වාස හා චර්යා සමූහයකි. නාට්‍ය සම්ප්‍රදාය, ගීත සම්ප්‍රදාය වැනි තැන්හි නාට්‍යය නැතහොත් ගීතය සම්බන්ධ පිළිගැනුම් ගැන කියවේ. තවදුරටත් එකී නාට්‍යය වෙසෙසන විට උඩරට නාට්‍ය සම්ප්‍රදාය, පහතරට නාට්‍ය සම්ප්‍රදාය යනු එකක්ම නොවේ. ''ගිය මහ අනුව යන'' අරුත මේ පදයෙන් වාච්‍ය වේ. අනුකරණය හා ගතානුගතිකත්වය එක්ව ගමන් කරයි. මුලින් කළ කතාබහක් පසුව අනුකරණය කළ හැකිය. කිසියම් සිද්ධියක් අනුකරණය කළ හැකිය. අනුකරණය නාට්‍යයට ද සම්බන්ධ වූවකි. නාට්‍යය යනු අනුකරණයකැයි දක්වා ඇත. අත් පා චලනය ඉඟි බිඟි පෑම ආදී කුඩු මහත් ක්‍රියාකාරීත්වයන් මගින් සමාජයේ විවිධ ස්ත්‍රී පුරුෂයන් අනුකරණය කළ හැකිය. කලින් සිටියකු කළ කී දෙයක් පසුව එන අයෙකු විසින් අනුකරණය කිරීම මහත් හපන්කමක් නොවේ. යමක් අලුතින්ම නිර්මාණය කිරිම සමාජය විසින් අගය කොට සලකනු ලැබේ. අලුතින් යමක් නිර්මාණය කිරීම නිර්මාණ කුශලතාව ලෙස හැඳින්වේ. නිර්මාණ කුශලතාව කවිය නාට්‍යය වැනි කලා විෂයක නව නිපැයුම් හඟවයි. නවකතාවක හෝ කෙටිකතාවක මේ නිර්මාණශීලී බව දැකිය හැකිය. වස්තු බීජයේ සිට සිද්ධි මාලාව චරිත වේදිකාව මත රඟ දැක්වීමෙන් එකී සිද්ධිය සජීවීත්වයට පත් කිරීම තෙක් ක්‍රියාවලිය නාට්‍ය ස්වභාවයයි.

සමාජය තුළට පිවිස ඇති සමාජයේ ඉදිරි ගමනට හානිකර මතවාදයන් බැහැර කිරීමට ක්‍රියාමාර්ගයක් ගැනීම බුද්ධිමතුන්ට පැවරෙන වගකීමකි. සමාජය විවිධ මතවාදයන්ගෙන් වෙළී ඇත. අප අතර විවිධ මතවාද දක්නට ලැබේ. සමාජය ඒවාට ප්‍රතිගාමී හංවඩුව දී ඇත. ඇතැම් මත ප්‍රතිගාමී යැයි කියා එකවිට බැහැර කෙරේ. ප්‍රගතිශීලී හංවඩුව ද දෙන්නේ එපරිද්දෙනි. වඩාත් ආධානග්‍රාහී මතවාද දේශපාලන ක්ෂේත්‍රයට අයත්ය. අප වැළඳ ගන්නා දේශපාලන මතවාද කෙතරම් උග්‍රවන්නේ දැයි කිවහොත් ඒ වෙනුවෙන් දිවි පුදන්නට පවා මැලි නොවන බව කිව යුතුය. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියන් වශයෙන් අපට ඇතැම් දේශපාලනික හෝ ආගමික මතවාදයන් පිළිගැනීමටත් ඒ වෙනුවට අපේ සබඳතා ගොඩනගා ගැනීමටත් නිදහස තිබේ. එහෙත් ඒවා දැඩි ලෙස වැළඳ ගත යුතු නොවේ. ඡන්ද කාලවලදී දේශපාලන මතභේද පදනම් කරගෙන කලිකලහ, මිනීමැරුම් සිදු කර ගන්නා අයුරු දැකිය හැකිය. ජාතිය, ආගම, භාෂාව වැනි දෑ මිනිසාට ඉතිහාසයෙන් උරුම වූ දායාදයි. ඒවාට ගරු බුහුමන් කළ යුතුය. ඉන් ගත හැකි ප්‍රයෝජන අප නිවැරදිව හඳුනාගෙන එකී ප්‍රයෝජන ගත යුතුය. බුදුරදුන් ධර්මය සම්බන්ධයෙන් දේශනා කර වදාළ කරුණක් මෙහි දී අප සැලකිල්ලට ගතයුතුය 'කුල්ලූපමං වො භික්ඛවේ ධම්මං දේසිස්සාමි' යනුවෙන් දේශනා කර ඇති පරිදි ධර්මය පහුරකට උපමා කොට ඇත. අප පහුර භාවිත කරන්නේ ගඟෙන් එතෙර වීමටය. මගියා එය බැහැර ලා ගමනේ ඉදිරියට යයි. මතවාද සියල්ල අවබෝධය සඳහා ය. කර ගසා ගෙනයාම සඳහා නොවේ. ඒ වෙනුවෙන් කලිකලහ උපදවා ගත යුතු නැත. තමන්ගේ මතවාදය නිවැරදිය, අනුන්ගේ මතවාදය වැරදි ය, යැයි නොසිතිය යුතුය.

වත්මන් ශ්‍රී ලංකා සමාජය තුළ මුල් බැසගත් ඇතැම් දුර්මත බැහැරලීමට බුද්ධිමත් තරුණ පිරිස් යොදා ගැනීම අද අවශ්‍ය කාර්යයකි. ලංකාව 1815 දී ඉංග්‍රීසීන්ට යටත් වීමේ සිට ගත වූ දිගු කාලපරිච්ඡේදයේ නිදහස පිළිබඳ විවිධ අවස්ථා පසු කර ඇත. 1948 දක්වා ලංකාව පැවතුණේ යටත් විජිතයක් වශයෙනි. යටත් විජිතවාදී මානසිකත්වයෙන් ක්‍රියාකරන්නන් වත්මනෙහි ද අප රට තුළ නැතුවා නොවේ. එනිසා යටත් විජිතවාදී මානසිකත්වයෙන් බැහැර වී ස්වාධීන නිර්මාණශීලි චින්තනයකට යොමු විය යුතුය.

තරුණ බුද්ධිමතුන් වශයෙන් උපාධිධාරීන්ට පැවරෙන වගකීම් රැසකි. සමාජය වෙළා ගත් අපරාධ හා සමාජ විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් ගතයුතු පියවර ගැන ඔවුන් අවධානයෙන් සිටිය යුතුව ඇත. අද විවිධ හේතු නිසා මිනීමැරුම් මංකොල්ලකෑම් සහ වෙනත් අපරාධ සංඛ්‍යාව දිනෙන් දින වැඩිවෙමින් පවත්නා බව කවුරුත් දන්නා කරුණකි. මේ අපරාධ සංඛ්‍යාව අඩු කිරීම හෝ අවම කිරීම සම්බන්ධයෙන් මෙකී තරුණ උපාධිධාරීන්ට ගත හැකි මඟ කෙබඳු දැයි සොයා බැලීමට කාලය එළඹ ඇත. අපරාධකරුවන් පසුපස හඹා ගොස් ඔවුන් අල්ලා නීතිය හමුවට පැමිණවීම පොලිසිය ඇතුළු අපරාධ පරීක්ෂකවරුන්ට පැවරී ඇති වගකීමක් ලෙස සලකා නිහඬ වීම සුදුසු නැත. රජය නින්දේ පසු වන්නේ නම් ඒ පිළිබඳව හඬක් නඟා ඔවුන් අවදි කරවීමට නව ක්‍රියාමාර්ගයක් ගැනීමට උගත් තරුණ තරුණියන්ට වගකීමක් ඇත. නිති පන්සිල් රකින ආගමික වතාවත් නිරතුරුව පිළිපදින ජනතාවක් ඇති ලංකාව වැනි රටක සිදුවන බිහිසුණු අපරාධ සංඛ්‍යාව කාගේ වුවත් සිත් සසල කරවයි. ආගමික නායකයන්ගේ ද ජනතා හිතකාමීන්ගේ ද සිත් යොමු කරලීම අරමුණු කර ක්‍රියාශීලී වැඩ පිළිවෙළක් දියත් කිරීමට මෙකී බුද්ධිමතුන්ට සෙසු අයට වැඩි ශක්තියක් ඇති බව කිව යුතුය. මත්පැනට හුරු වී සිටින වැඩිහිටි හා තරුණ පිරිස් ඉන් මුදවාලීමේ ප්‍රායෝගික වැඩපිළිවෙළක් ළමා සංවිධානවල ද උදවු උපකාර ඇතිව සකස් කිරීමට මේ උපාධිධාරීන්ට හැකි වෙතැයි සලකමු. අද නගරබදව මෙන්ම ගම්බදවද ළමා පිරිස් දුම්වැටිවලට ද මත්ද්‍රව්‍ය භාවිතයට ද හුරු වී ඇත. මේ සදාචාර විරෝධී ක්‍රියා මැඩලීමට වැඩිහිටියන්ට වැඩි හැකියාවක් උගත් තරුණ පිරිස සතුව ඇත. මේ තරුණ පිරිස් එක්රැස් කර ඔවුන් සතු කාර්යභාරය පෙන්වා දිය යුතුය. තරුණ හා ළමා පිරිස් දැනුවත් කිරීමෙන් අපරාධ නිවාරණය සම්බන්ධ ඵලදායී මගක් උදාකළ හැකිය.

මෙතෙක් දක්වන ලද කරුණු අනුව උපාධිධාරීන්ට පැවරී ඇති වගකීම් සමුදාය අතිමහත් බව පෙනී යයි. එහෙත් ඒ ගැන සාකච්ඡා කෙරෙන්නේ ස්වල්ප වශයෙනි. උපාධිධාරීන්ගේ දැනුමෙන් සහ හැකියාවෙන් ප්‍රයෝජන ගැනීමට විධිමත් වැඩ පිළිවෙළක් දියත් කිරීම රජය සහ අනෙකුත් සංවිධාන සතු වගකීමකි. ඒ සඳහා ඔබගේ අවධානය යොමු කරන මෙන් මතක් කරමු. උපාධිධාරීන් වශයෙන් රාජ්‍ය හෝ පෞද්ගලික අංශයන්හි රැකියා අපේක්ෂාවෙන්ම කාලය මිඩංගු නොකර ස්වශක්තියෙන් හා දැනුමෙන් පරිපූර්ණ මිනිසකු ලෙස ඵලදායි කාර්යයක නියැලීම ඔබ සතු වගකීමක් බව මේ අවස්ථාවේ අදිටන් කරගන්නා ලෙස සිහිපත් කරමු.

<u>*2007.12.11*</u>

# 30

# දැනුම මත පදනම් ආර්ථිකය හා සමාජ සාධාරණත්වය උදෙසා කළමනාකරණ පීඨ උපාධිධාරීන්ගේ මෙහෙවර

මහාචාර්ය නාරද වර්ණසූරිය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2007 උපාධි ප්‍රදානෝත්සව දේශනය පැවැත්වීමට මා වෙත කරන ලද ආරාධනය මට දක්වන ලද ඉමහත් ගෞරවයක් කොට මම සලකමි. මේ කාර්යය සඳහා මට ආරාධනය කිරීම පිළිබඳ ව කළමනාකරණ අධ්‍යයන සහ වාණිජවිද්‍යා පීඨයේ පීඨාධිපතිතුමාට සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයට මාගේ ස්තූතිය පුද කර සිටිමි. මා මෙම විශ්වවිද්‍යාලයේ උපකුලපති වශයෙන් සේවය කළ වකවානුව තුළ ඔබගේ අධ්‍යයන පීඨය සමඟ සමීප සබඳතා පැවැත්වීමට අවස්ථාවක් මට ලැබුණ අතර, ඔබ විසින් එකී කාලය තුළදී වර්ධනය කර උගන්වන ලද නිර්මාණශීලී හා ප්‍රගතිශීලී විෂය ධාරා පිළිබඳව මම හොඳින් දැන සිටියෙමි.

ඔබගේ විද්‍යා පීඨය කළමනාකරණ අධ්‍යයන අංශයෙහිලා ශ්‍රී ලංකාව තුළ පුරෝගාමීකයන් වූ අතර කළමනාකරණ විෂය ධාරාවට ඇතුළුවන විශ්වවිද්‍යාල සිසුන්ගේ හරය ඔබ පීඨයට ඇදී එන බව ද මා දන්නා කාරණයකි.

රජයේ මෙන් ම පෞද්ගලික ක්ෂේත්‍රයේ අවශ්‍යතාවන්ට ගැළපෙන විවිධ විෂය ධාරා වැඩිම ප්‍රමාණයක් ඉදිරිපත් කර ඇති පීඨය වන්නේ ද ඔබ පීඨය යි.

ඔබ පීඨය විසින් මෙහෙයවන මේ හැම විෂය ධාරාවක ම විශේෂ ලක්ෂණ හා ශක්තීන් ගැබ්ව ඇති බවත් ඒවා වර්ධනය කිරීමට ඔබ අධ්‍යයන කාර්ය මණ්ඩලය බලවත් වෙහෙසක් දරා ඇති බවත් මා දන්නා කරුණකි. මෙකී අධ්‍යයන ක්ෂේත්‍රයන්හි නිර්මාණාත්මක පැතිකඩක් නිරීක්ෂණය කිරීමටත්, ඒවාට ඍජු ව ම සහභාගී වී ක්‍රියා කිරීමටත් අවස්ථාව ලද මා නියතයෙන් ම විශ්වාස කරන්නේ හැකියාවන් ප්‍රශස්ත මට්ටමින් කළඑළි දැක්වීමට හැකි මෙවැනි පාඨමාලාවන් හැදෑරූ ඔබ සියලු දෙනා සැබවින් ම වාසනාවන්ත ශිෂ්‍ය කණ්ඩායමක් බව ය.

ශ්‍රී ලංකාව ආශ්‍රයෙන් කථා කරන විට මට කිවහැක්කේ ඔබ ''විශිෂ්ට ගණයට'' අයත් වන කණ්ඩායමක් බවයි. කළමනාකරණ වාණිජ ක්ෂේත්‍රයේ විශේෂ විෂය ධාරාවක පුහුණුව සම්පූර්ණ කර ගෞරවණීය විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලැබ අනාගතය එළිපත්තේ සිටින ඔබ සැමට ඔබගේ ඉදිරි ජීවිතයේ සාර්ථකත්වය ප්‍රාර්ථනා කරන අතර කළමනාකරණ වෘත්තිය අද ලෝකයේ මුහුණ පා සිටින අභියෝගාත්මක වූත්, කල්පනාකාරී ව සලකා බැලිය යුතු වූත් කරුණු කිහිපයක් ගැන ඔබගේ සිතිවිලි යොමු කිරීමට මම අදහස් කරමි.

මෑත කාලයේදී විශ්වවිද්‍යාලයක ඇති සමාජයීය වැදගත්කම දැනුම මත පදනම් වූ ආර්ථිකය නමැති රාමුව තුළ පිහිටා ඇත. සුභසාධක රාජ්‍ය සංකල්පය බිඳවැටීමත් සමග ගෝලීය නිදහස් වෙළඳපළේ වර්ධනය සිදු වූ අතර දැනට අනුගමනය කිරීමට ඇති එකම සමාජ අනුරුව දැනුම මඟින් මෙහෙයවනු ලබන ආර්ථිකය යි.

දැනුම මත පදනම් ආර්ථිකයන් වශයෙන් අර්ථ දක්වනුයේ, දැනුම නිර්මාණය, පැතිරීම හා භාවිතය මඟින් වැඩෙන හා සංවර්ධනය වන ආර්ථිකය යි. දැනුම මත පදනම් ආර්ථිකයන් කුළුණු හතරක් මත පිහිටා ඇත. මේවා අතර මුල් වනුයේ දැනුම කාර්යක්ෂම ලෙස නිර්මාණය කර බෙදා හැරීමට හා ඒවා ප්‍රයෝජනයට ගැනීමට අනුබල දෙන වෙළඳ පරිසරයකි. තොරතුරු කාර්යක්ෂම ව හුවමාරු කර ගැනීමට, ඒවා බෙදාහැරීම හා සැකසීම සඳහා ගතික යටිතල පහසුකම් සහිත අදහස් හුවමාරු පද්ධතියක් පිහිටවීම දෙවැන්න යි. දේශීය පරිසරයට ගැළපෙන පරිදි දැනුම නිර්මාණය කිරීම, අවශෝෂණය කිරීම හා සුදුසු සේ සකස් කර ගැනීම සඳහා නවතම ක්‍රම භාවිත කරන විශ්වවිද්‍යාල, පර්යේෂණ ආයතන හා කාර්මික ආයතන සමූහයක පැවැත්ම, තෙවැන්න වන අතර දැනුම නිර්මාණය කිරීමට හා එය ප්‍රායෝගික වශයෙන් වැඩ කටයුතුවල භාවිත කළහැකි පුහුණු ශ්‍රම හමුදාව සිවු වන අත්‍යවශ්‍ය කුළුණ යි.

ඔබ අද නවකයන් වශයෙන් එකතු වන්නේ එවැනි සුදුසුකම් ලද නිපුණතා ඇති අවශ්‍යතාවන් අනුව හැඩ ගැසීමේ හැකියාව ඇති ශ්‍රම බල හමුදාවකට යි. මේ සමාජයීය අනුරුවෙහි ඔබගේ කාර්යභාරය වන්නේ රැකියා අවස්ථා ඔබ සොයා පැමිණෙන තෙක් බලා සිටීම නොවේ. ඔබෙන් අපේක්ෂා කරනුයේ රැකියා අවස්ථාවන් හඹා ගොස් ඒවා තම ග්‍රහණයට ගැනීම යි. ඔබට අවස්ථා නැත්නම් ඔබ අවස්ථා නිර්මාණය කළයුතු යි. සිතා බලා ගනු ලබන අවදානම්වලට මුහුණ දීමට තරම් ඔබ එඩිතර විය යුතු යි. අනතුරුවලට මුහුණදීමේ ශක්තිය ඔබට තිබිය යුතු යි. සැකෙවින් ප්‍රකාශ කරන්නේ නම් ඔබේ ජීවිතයටත්, වැඩ ලෝකයටත්, ඔබ තුළ ව්‍යවසායකත්ව දැක්මක් තිබිය යුතු ය.

කෙසේ වෙතත් මෙම සංවර්ධන රටාවේ හිඩැසක් වශයෙන් පවතින එක් පැතිකඩක් ඇත. එනම් සමාජ හා ආර්ථික සාධාරණත්වය කෙරෙහි යොමුවක් නොතිබීම යි. ආර්ථික වශයෙන් තරගකාරී සමාජයක් නිර්මාණය කිරීම කෙරෙහි දක් වූ දැඩි අවධානය නිසා සාධාරණ හා යුක්තිසහගත සමාජයන් පිළිබඳ අදහස් සෝදා පාලුවට ලක් ව ඇත. ආර්ථික වර්ධනය කරා යන ගමන හුදෙක් අන්තයක් බවට පත් ව ඇත. දුප්පත් ජනතාව සමාජ ආරක්ෂණ දැලකින් ආවරණය නොකර ඇති කළ නිදහස් වෙළෙඳපල ප්‍රතිපත්තිය ඇත්තන් හා නැත්තන් අතර පරතරය වැඩි කිරීමට හේතු වී ඇති අතර නැත්තවුන් තවදුරටත් කොන්කිරීම මෙහි ප්‍රතිඵලය වී ඇත.

ලෝක ඉතිහාසයේ වැඩිම ආර්ථික වර්ධනයක් පෙන්නුම් කළ කාලවකවානුව වනුයේ විසිවන ශතවර්ෂයෙහි අවසන් දශක දෙක ය. එහෙත් ඒවායේ යහපත් ප්‍රතිඵල නැත්තවුන් වෙත උරුම වූ බවක් නොපෙනේ. මේ වකවානුව තුළ වර්ධනය වූ ධනයෙන් 90% සාන්ද්‍රණය වී ඇත්තෙ ජනගහනයෙන් ධනවත් කොටස වූ 10% වෙත ය. මූර්ත වශයෙන් ගත් කල ඇති නැති පරතරය පුළුල් වී ඇතිවා පමණක් නොව, දුප්පතුන් තවත් දුප්පත් වී ඇත.

ඇමෙරිකානුවන් මිලියන 45ක් ඇතුළු ව ලෝක ජනගහනයෙන් 40% ක් දරිද්‍රතාවේ ඉමෙන් පහළ මට්ටම්වල ජීවත් වන අය යි. වසරකට දළ ජාතික නිෂ්පාදිතයෙන් 6% - 8% අතර වර්ධනයක් ඇතැයි උදම් අනන ඉන්දියාවේ මිලියන 380 ක් ජීවත් වන්නේ දිනකට ඩොලර් එකකට වඩා අඩු ඉපයීම් ලබමිනි.

දැනුම මත පදනම් ආර්ථිකයේ ඇති මේ කළු පැල්ලම අනුවේදනීය ලෙස මතුකර දැක්වූ අයෙකි, බිල්ගේට්ස් (Bill Gates). නූතන ලෝකයේ සිටින විශිෂ්ටතම ව්‍යවසායකයකු වන මොහු හාවඩ් විශ්වවිද්‍යාලයට බැඳී ටික කලක් එහි අධ්‍යාපනය ලැබූවකු වන අතර මෘදුකාංග නිෂ්පාදන වෘත්තියට අවතීර්ණ වී ව්‍යාපාර ලෝකයේ අතිවිශාල ප්‍රසිද්ධියක් ලැබූවෙකි. පසුකලෙක එම විශ්වවිද්‍යාලයේ ම උපාධි ප්‍රදානෝත්සව සභාව අමතමින් ඔහු මෙසේ කියා සිටියා. ''හාවඩ් විශ්වවිද්‍යාලයේ මා ගත කළ කාලය තුළ මා මතකයේ වඩාත් හොඳින් රැඳී තිබෙන්නේ ඒ ආයතනය තුළ මා දුටු ජවය හා බුද්ධි

බල මහිමය යි. එම අත්දැකීම වරෙක ප්‍රීතියෙන් ඉපිල යාමටත් වරෙක බියෙන් හා අධෛර්යයෙන් හැකිලියාමටත් හේතුවූ නමුත් හැම විටම එය අභියෝගාත්මක වූවා.''

''හාවඩ් විශ්වවිද්‍යාලයට ඇතුළුවීමට ලැබීම විශේෂ වරප්‍රසාදයක් සේ මම සලකනවා. එම ආයතනයෙන් මා උපාධිය සම්පූර්ණ කිරීමට පෙර බැහැර ගිය නමුත් එහි ගතකළ කාලය තුළ මා ඇති කර ගත් මිතුදම් හා මා ක්‍රියාත්මක කළ අදහස් මා තුළ බලවත් විපර්යාසයක් ඇති කළා. එහෙත් එම කාලය දෙස ආපසු හැරී බලන විට මට පශ්චත්තාප වීමට හේතු වූ කරුණක් තියෙනවා. එනම් මා හාවඩ් විශ්වවිද්‍යාලයෙන් පිටව ගියේ ලෝකයේ පැවති අප්‍රසන්න අසමානකම් ගැන නිසි දැනුමක් නොමැතිව යි. සෞඛ්‍යය, ධනය සහ දියුණුවීමට අවස්ථාවක් ලබාගැනීම සඳහා තිබූ ඉමහත් අසමානකම නිසා බලාපොරොත්තු සුන් වූ ජීවිත ගතකිරීමට ලක්වන කෝටි සංඛ්‍යාත ජනයා ගැන මා කිසිසේත් දැන සිටියේ නැහැ.''

''හාවඩ්හිදී මා ආර්ථික විද්‍යාව හා දේශපාලන විද්‍යාව ගැන නව අදහස් ඉගෙන ගත්තා. විද්‍යා අංශයේ නව දියුණුව ගැන මා දැනුවත් වූවා. මනුෂ්‍යත්වයේ ශ්‍රේෂ්ඨතම අභිවෘද්ධියට හේතු වන්නේ මෙකී සොයාගැනීම නොවන බවත්, මෙකී සොයාගැනීම කොතෙක් දුරට සමාජයේ පවතින අසමානතාව පිටුදැකීමට යොදා ගන්නේ ද යන සාධකය මත බවත් ප්‍රජාතන්ත්‍රවාදය මගින් හෝ සාර්ථක මහජන අධ්‍යාපන මගින් හෝ ප්‍රශස්ත සෞඛ්‍ය සේවාවන් මගින් හෝ පුළුල් ආර්ථික අවස්ථාවන්ට මඟ පෑදීම මගින් හෝ වේවා අසමානතා අඩුකිරීම උසස්ම මානව කාර්ය සාධනය සේ මම දකිනවා.''

ධනය එක්රැස්කිරීම සඳහා වූ මේ අසංරෝධිත උත්සාහයේ ආදීනවවලින් දියුණු ලෝකය මුක්ත වී නැහැ. ඇමෙරිකානු නිදහස් සටනේ පුරෝගාමියකු වූ තෝමස් ජෙපර්සන් (Thomas Hefferson) 1802 දී කළ ඔහුගේ දූරදර්ශී දැක්ම පිළිබිඹු කරන ප්‍රකාශයක් කරා යමු. එය මෙසේ යි.

''රටකට එරෙහි ව නැගී සිටි හමුදාවකට වඩා එම රටේ බැංකු ආයතන රටෙහි නිදහසට තර්ජනයක් විය හැකි යයි මා විශ්වාස කරනවා. අමෙරිකානු ජනතාව යම් දිනක මුදල් නිකුත් කිරීමේ බලය පෞද්ගලික බැංකු වෙත පවරා දෙයි ද (පළමුකොට උද්ධමනය මගින් ද දෙවනුව අවප්‍රමාණය කිරීම මගින් ද) එම බැංකු සහ බැංකු වටා වර්ධනය වන වෙනත් සංස්ථාපිත ආයතන මිනිසුන්ගේ සියලු ම වත්පොහොසත්කම් ශූන්‍ය කිරීම මගින් සිය මුතුන් මිත්තන් විසින් සටන් කොට දිනාගත් භූමියෙහි නිවාස අහිමියන් ලෙස දිනක අවදිවීමට මඟ පාදන බව මට නිසැක යි.''

මොහු විසින් එදා කළ ප්‍රකාශයෙන් ගම්‍ය වූ අදහස අද මූල්‍ය ලෝකයේ සිදුවන දේ පිළිබඳ අනාවැකියක් මෙන් දැනේ.

මාග්‍රට් තැචර් (Margaret Thatcher) සහ රොනල්ඩ් රේගන් (Ronald Reagan) ගේ පාලනයන් යටතේ ගෝලීය නිදහස් ආර්ථිකයේ නිර්බාධක රැල්ල මගින් නිදහස් වූ කාලය තුළ, මෙයට පෙර ඉතා ගෞරවාන්විත ව සහ සුපරීක්ෂාකාරී ව ක්‍රියා කළ බැංකු, මූල්‍ය ආයතන, උගස් හා ගොඩනැගිලි සමාගම්, රක්ෂණ සමාගම් ආදිය සුපරීක්ෂාකාරී ව ම කටයුතු කිරීමෙන් බැහැර ව, අතිධාවනකාරී ලෙස කෙටි කාලකයකදී උපරිම ලාභ ලැබීමේ චේතනාව පෙරදැරි කරගෙන කටයුතු කරන්නට පෙළඹිණ. සංස්ථාපිත ලෝකයේ ඉහළ ම තැන්වල සිටින්නන් විසින් ගතහැකි අවදානම පිළිබඳ සාමූහික වශයෙන් ම අධිතක්සේරුවක් කිරීමටත්, නොසැලකිලිමත් ලෙස කටයුතු කිරීමටත් පෙළඹී ඇත. සංස්ථාපිත වගකීම පරයා සංස්ථාපිත අලජ්ජබව ඉස්මතුවී ඇත.

ගෝලීය වශයෙනුත්, දේශීය වශයෙනුත් දූනට අපට දක්නට ලැබෙන මූල්‍ය ආයතනවල බිඳවැටීමට හේතුව ඉහළ හා මධ්‍යම තැන්වල සිටින කළමනාකරුවන් සමාජ හා සදාචාරාත්මක අගයන් පිළිබඳව දූක් වූ ඌන අවධානය යි.

නූතන කළමනාකරණ අධ්‍යාපනයේ අනර්ඝත්වය හා සංවිධානය සාර්ථක ව ළඟා කර ගැනීමට අවශ්‍ය සාධකයක් වශයෙන් සදාචාරාත්මක අගයන් හා සමාජ සාධාරණත්වය කෙරෙහි සැලකිල්ලක් නොදූක්වීම ගෝලීය මූල්‍ය ප්‍රශ්නයටත්, සමාජයෙහි ඇති නිදන්ගත අසමානත්වයනටත් හේතු පාදක වූ බව බොහෝ දෙනා සිතීම පුදුමයට කරුණක් නොවේ.

මීට වසර පහකට පෙර විශේෂයෙන් එන්රන් (Enron) සහ වර්ල්ඩ් කොම් (World com) වැනි වෙළඳ ආයතනයන් අපකීර්තියට ලක්වූ අවස්ථාවේ ද ඇමෙරිකාවේ තිබූ ව්‍යාපාර පාසල් (Business School) සමාජය තුළ දෝෂ දර්ශනයට ලක්විය.

මෙයට හේතු වූයේ මේ සිද්ධීන් සම්බන්ධ චෝදනා ලද කූට කළමනාකරුවන් බොහෝ දෙනා රටේ පිළිගත් ව්‍යාපාර පාසල්වල MBA උපාධි ලබාගත් අය වීම යි. මේ අවස්ථාවේදී ඇමෙරිකාවේ සංස්ථාවල ඇති සදාචාරාත්මක ක්ෂයවීමට ඇති එකම විසඳුම MBA උපාධි ලබා සේවය කරන වයස 35ට අඩු සියලු දෙනා සේවයෙන් පහකිරීම ය යන විචාරක මතය බොහෝ දෙනාගේ පිළිගැනිමට ලක් විය.

ව්‍යාපාර ආචාරධර්ම (Business Ethics) සඟරාවේ මෑතකදී පළවූ වාර්තාවක් අනුව Financial Times පත්‍රයේ වර්ගීකරණය අනුව ලොව විශිෂ්ට ගණයේ MBA පාඨමාලා පනහකින් ආචාර විද්‍යාව පිළිබඳ වෙන ම පාඨමාලාවක් පවත්වනුයේ 25% ක පමණි. 1988ට වඩා මෙය 5 ගුණයකින් වැඩිවීමකි. කෙසේ වෙතත් ඔවුන්ගෙන් තුනෙන් එකක් පමණ සංස්ථාපිත සමාජයීය වගකීම, ආචාර ධර්ම සහ තිරසාර පැවැත්ම යන මාතෘකා MBA උපාධියේ කොටසක් වශයෙන් උගන්වන බව හෙළිවිය. මේවා අත්දූකීම් පාදක ඉගෙනීම් ක්‍රමවේදය මඟින් හෝ ගැලී කටයුතු කිරීමේ තාක්ෂණය මඟින් ඉගැන්වීම කළේ ආයතන කිහිපයක පමණයි.

සංස්ථාපිත සමාජයීය වගකීම වෙත නූතනයේ යම් නැඹුරුවක් දක්වා ඇතත් එය හුදෙක් පසු සිතිවිල්ලක් වශයෙන් පමණක් ක්‍රියාත්මක වන බව පෙනේ. මෙය ක්‍රියාවට නංවන ආයතන එය හුදෙක් වාචික සංකල්පයක් වශයෙන් පමණක් පවත්වාගෙන යාමට පෙළඹී ඇති බවක් පෙනී යයි.

තවමත් බොහෝ දෙනා අනුමගනය කරන්නේ නිදහස් වෙළඳ පොළ න්‍යායේ න්‍යායාචාර්ය වශයෙන් සැලකෙන නොබෙල් ත්‍යාගලාභී මිල්ටන් ෆ්‍රිඩ්මන්ගේ (Milton Friedman) ව්‍යාපාරයක ඇති එකම වගකීම වනුයේ ලාභ වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම යි යන ඉගැන්වීම යි. ඔවුන් අනුගමනය කරන්නේ වක්‍රෝක්තියෙන් සඳහන් කර ඇති කෙසේ හෝ දිනිය යුතු ය යන win win සංකල්පයකට අනුව ය. ඔවුන් ලාභ උපරිම කරගන්නේ වෙළඳ නාමය සියුම් ලෙස වර්ධනය කරමින් එය සමාජ යහපත සඳහා යැයි කරන උතුම් ක්‍රියාවක් සමඟ සූක්ෂම ලෙස සම්බන්ධ කරමිනි. රෝග බෝවීම මර්දනය කර ගැනීම සඳහා අත්සේදීම වැදගත් බව අපට කියාදෙන සුප්‍රකට ගෘහස්ථ සබන් නිෂ්පාදකයාගේ වෙළඳ දූන්වීම මීට කදිම උදාහරණයක් සපයයි.

කළමනාකරණ අධ්‍යාපනයට සදාචාර යොමුවක් හා සමාජ හා ආර්ථික සාධාරණත්වය පිළිබඳ වගකීමක් අන්තර්ගත විය යුතු බව මේ සම්බන්ධයෙන් විචාරශීලි ව බලන ඕනෑම කෙනෙකුට පෙනී යා යුතු යි. එහෙත් එය හුදෙක් නීතියෙන් ගැලවීමට කරන සුළු වෑයමක් වශයෙන් නොව හර වටිනාකමින් යුතුවූ පද්ධතියට කාවැද්දිය යුතු අත්‍යවශ්‍ය සාධකය යි.

ආර්ථික වර්ධනය යනු සංවර්ධනය සඳහා ඇවසි මූල සාධකයක් මිස එය අන්තයක් නොවන බව වටහාගත යුතු යි. සංවර්ධනයේ දර්ශකයන් වශයෙන් ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදනයෙහි ඇති සීමාවන් වටහා ගෙන, මානව සංවර්ධන දර්ශකය (HDI) වැනි විකල්පයන් මෙන් ම ආර්ථික අසමානත්වය පිළිබිඹු කරන ලොරන්ස් වක්‍ර (Lorenz curve), ගිනි සංගුණකය (Gini Coefficient) වැනි දෑ ගැන දැනුවත් ව සිටීම යහපත් ය. සහස්‍රයේ සංවර්ධන අරමුණු (MDG) ලැයිස්තුගත කිරීමට කළමනාකරණ උපාධිධරයකුට නොහැකි නම් එය ලජ්ජාවට කරුණකි. මිල්ටන් ෆ්‍රීඩ්මන් (Milton Friedman) හා ඔහුගේ න්‍යායයන් ගැන ඔවුන් දන්නා තරමට අමර්ත්‍යා සෙන් (Amartya Sen) සහ ඔහුගේ න්‍යායයන් ගැන ද ඔවුන් දැනසිටිය යුතු ය.

විෂය ධාරාවට මෙවැනි නවතම සංකල්ප හා රටාවන් ඇතුළත් කිරීම වැඩි යහපතක් ඉටු කිරීමට හේතුවිය හැකිවන අතර විශ්වවිද්‍යාල තුළ ආකල්ප හා වටිනාකම වර්ධනයට බෙහෙවින් බලපාන සාධකයන් වන්නේ විෂය බාහිර ක්‍රියාකාරී කටයුතු බව අප දැන සිටිය යුතු ය.

මේ සන්දර්භය තුළ 20 වන ශතවර්ෂයේ ජර්මන් ජාතික කාල් ජැස්පර්ස් (Karl Jaspers) නමැති දාර්ශනිකයා නූතන විශ්වවිද්‍යාලයක කාර්යභාරය පිළිබඳ පළකළ අදහස් ගෙන දැක්වීම යෝග්‍යයයි හැගේ.

ජැස්පර්ස් විශ්වවිද්‍යාලය දුටුවේ එකිනෙකට බැඳුණු මධ්‍යස්ථාන තුනකින් සමන්විත ආයතනයක් ලෙසට යි. සමාජයට අවශ්‍ය වෘත්තිකයන් පුහුණු කරන පුහුණු මධ්‍යස්ථානයක් වශයෙන් ද, සමාජයේ ප්‍රශ්න නිරාකරණය කිරීම සඳහා පර්යේෂණ කටයුතු කරන ''පර්යේෂණ මධ්‍යස්ථානයක්'' වශයෙන් ද නිදහස් චින්තනයකට අවැසි නිදහස් පරිසරයක් සැපයෙන සංස්කෘතික මධ්‍යස්ථානයක් වශයෙන් ද හේ විශ්වවිද්‍යාලය දුටුවේය. මේ කටයුතු තුන ම ඉතාමත් සියුම් ව එකිනෙකට සම්බන්ධව තිබිය යුතු බවත් ඔහුගේ අදහස විය.

අවාසනාවට මෙන් හුදෙක් ආර්ථික සාර්ථකත්වය පිළිබඳ පමණක් සැලකිල්ල යොමුවීම නිසා විශ්වවිද්‍යාලය මගින් ඉටුකළ යුතු තෙවැනි කාර්යය ගැන වැඩි සැලකිල්ලක් අප දක්වා ඇත. ශ්‍රී ලංකාවේ බොහෝ දෙනාගේ මතය වන්නේ අප විශ්වවිද්‍යාලය සමාජ, දේශපාලන හා ආර්ථික ප්‍රශ්න පිළිබඳව අර්ථවත් වාද විවාද පැවැත්වීමෙන් ඇත් වූ අදහස් හා වටිනාකම පිළිබඳ විවෘත සාකච්ඡා පැවැත්වීමට ප්‍රමාණවත් ඉඩකඩ සපයා නැති ආයතන බව යි. මෙහි පවතින බුද්ධිමය පරිසරය ස්වාධීන චින්තනයට සුදුසු තත්ත්වයක් ඇතිකර නැත. ශිෂ්‍ය අන්තගාමීත්වය හා ප්‍රචණ්ඩත්වය සහ බැඳුණු අවිචාරවත් චින්තනයකට සිසුන් පොළඹවන උපසංස්කෘතියක් බිහිවීම නිසා විශ්වවිද්‍යාලයට හිමිවිය. යුතු විශ්වසනීය, සදාචාරාත්මක දේශපාලන බලවේගයක් වශයෙන් ක්‍රියා කිරිමට ඇති හැකියාව අඩපණ කර ඇත. මෙම තත්ත්වය පිළිබඳ ආචාර්ය මණ්ඩලය ද තරමක් දුරට වගකිය යුතු ය. මෙහිලා කැපීපෙනෙන ලෙස කටයුතු කරන ආචාර්යවරුන් කිහිප දෙනෙකු හැරුණ විට බොහෝ ආචාර්යවරු මෙවැනි ක්‍රියාකාරකම්වලින් ඈත්ව සිටිති. නැතහොත් ඒවා ගැන නොසැලකිල්ලෙන් කටයුතු කරති. ශිෂ්‍යයන් සමඟ විවෘත පරිසරයක අදහස් හුවමාරු කර ගැනීමට නොහැකි තත්ත්වයක පසුවෙති. නැතහොත් එසේ කිරීමට කැමැත්තක් නොදක්වති. මේ අතර අන්තගාමී ශිෂ්‍ය නායකත්වය ඔවුන්ගේ සෝෂාකාරී, අතාර්කික හා ප්‍රචණ්ඩකාරී ක්‍රියා මාර්ග නිසා ඔවුන් ඉදිරිපත් කරන සමාජ සාධාරණත්වය හා නිදහස් අධ්‍යාපනය පිළිබඳ අදහස් සමාජය තුළ පිළිගැනීමට ලක් කිරීමට අපොහොසත්ව ඇත.

මේ අංශයෙන් සලකා බලන කල ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියට ඔවුන්ගෙන් රටට ඉටුවිය යුතු සමාජ මෙහෙවර ඉටුකිරීමට අපොහොසත් ව ඇත්තේ රටේ කර්මාන්ත ප්‍රවර්ධනයට ඇවසි

උපාධිධාරීන් බිහිකිරීමට අපොහොසත් වීම නිසා නොවේ. සමාජය ප්‍රවේසම්කාරීව ධනාත්මක පරිසරයක් කරා උත්ප්‍රේරණය කිරීමට ඇති නොහැකියාව නිසා ය. මෙම කාර්යය ඉටු කිරීම සඳහා විශ්වවිද්‍යාලය හැර වෙනත් විකල්ප යාන්ත්‍රණයක් හෝ ආයතනයක් නොමැත. එච්.ජී. වේල්ස් (H.G. Wells) මහතා විසින් ප්‍රකාශිත ''නූතන මානව ඉතිහාසය වඩවඩාත් ම අධ්‍යාපනය හා විනාශය අතර තරඟයක් බවට පත් වී ඇත.'' යන කියමන වෙන කිසිදාකට වඩා අද සමාජයට අදාළ වේ.

මා හිතවත් උපාධිධාරිනී, මවිසින් ඔබට දියයුතු අවසන් පණිවිඩය කුමක් ද? මම යළිත් වරක් බිල්ගේට්ස් (Bill Gates) හාවඩ් විශ්වවිද්‍යාලයේ උපාධි ප්‍රදාන උත්සව සභාව අමතමින් උපාධිධරයන්ට දුන් පණිවිඩයට ඔබවට ගෙනයනු කැමැත්තෙමි.

බොහෝ දේ ඔබට ලැබී ඇති බැවින් ඔබෙන් ද අප බොහෝ දේ බලාපොරොත්තු වෙමු. දක්ෂතාව, වරප්‍රසාද හා අවස්ථා වශයෙන් ඔබට ලැබී ඇති දේ ගැන සලකා බලන විටත් ලෝකය ඔබෙන් ඉල්ලුම් කළ යුතු දේ අසීමිත ය.

මීට අවුරුදු 30 කට පසු ඔබ යළිත් හාවඩ් විශ්වවිද්‍යාලයට පැමිණේයැයි මම බලාපොරොත්තු වෙමි. එසේ පැමිණ ඔබේ දක්ෂතාවෙන් හා ඔබගේ ජවයෙන් ඔබ කර ඇති දෑ ආවර්ජනය කරන්න. මම විශ්වාස කරනවා ඔබ එය විනිශ්චය කිරීමේදී හුදෙක් ඔබ වෘත්තීය වශයෙන් ලබාගත් සාර්ථකත්වය ගැන පමණක් නොතකා ලෝකයේ පවතින ගැඹුරුතම අසමානකම් පිළිබඳව ඔබ කටයුතු කළ ආකාරය පිළිබඳවත් මෙනෙහි කළ යුතුයි කියා. මනුෂ්‍යත්වය පමණක් ඔබ හා පොදුව ඇති අන් සෑම අයුරකින් ඔබට අසමාන වූ සහ ඈත් වූ මිනිසුන්ගේ අවශ්‍යතාවන් ගැන ඔබ කොතරම් සංවේදී වූවා ද යන්න මෙනෙහි කරන්න.

ප්‍රිය උපාධිධරයනි,

ඔබ සියලුදෙනා ශ්‍රී ලංකාවේ පුරෝගාමී කළමනාකරණ පීඨයෙන් පිටව යන උපාධිධාරීන් පන්තියකි. මා ඔබට දෙන පණිවිඩය මෙය යි.

උපාධිධරයකු වශයෙන් ඔබ හුදෙක් ඔබේ විෂය පථයෙන් විශිෂ්ටයකු වීම ප්‍රමාණවත් නොවේ. ඔබගේ පෞරුෂයෙන් ද විශිෂ්ටයකු විය යුතු ය. ඔබට මේ තාක් කල් රැක බලාගත් සමාජය සාරවත් කිරීම සඳහා ස්වාධීන ව සිතා බලා ධෛර්ය සම්පන්න ව කටයුතු කළයුතු ය. කෙටියෙන් කිවහොත් ඔබ අලුත් ආරක කළමනාකරණ උපාධිධරයෙක් විය යුතු ය. ඔබගේ සහ ඔබ සංවිධානයේ සාර්ථකත්වය සඳහා කටයුතු කරන අතර ම ඔබට වඩා වරප්‍රසාද අල්ප වූ නමුත් ඔවුන්ගේ දහඩිය මහන්සියෙන් ඔබගේ අධ්‍යාපනයට දායක වූ අය වෙනුවෙන් යමක් කිරීමට ද ඔබ ඉදිරිපත් විය යුතු ය. බ්ලේස් පැස්කල් (Blaise Pascal) නැමැති කීර්තිධර ප්‍රංශ ගණිත ශාස්ත්‍රඥයා සහ ධර්මාචාර්යවරයා ප්‍රකාශ කළ පරිදි මිනිසා යනු සුරදූතයෙක්වත් මෘගයෙක්වත් නොවේ. එහෙත් අභාග්‍යයට හේතුව සුරදූතයෙකුගේ භූමිකාව ගත යුත්තා මෘගයෙකුගේ භූමිකාව රඟපෑමයි.

මා විශේෂයෙන් අමතන්නේ ඔබ අතර ඇති දක්ෂයන්ට යි. කිසි දිනෙක මෘගයකුගේ භූමිකාවකට පෙළඹෙන්න එපා. ව්‍යාපාර ලෝකයේ ඇති සර්වපිත්තල සහ ආටෝපයන්ගෙන් ඔබ මුසපත් නොවන්න. වැදගත් වන්නේ බාහිර පෙනුම නොව අන්තර්ගතය බව සිහි තබාගන්න. ඔබ තරු ඇල්ලීමට ප්‍රයත්නයක් දැරුවත් ඔබේ දෙපා ස්ථිර වශයෙන් ම පොළොව මත තබාගෙන කටයුතු කරන්න. ඔබට මම යළිත් වරක් ඔබගේ අනාගත කාර්යයන්හිදී ජයග්‍රහණය ප්‍රාර්ථනය කරමි.!

<u>*2008.12.01*</u>

# Responsibility of Managment Graduates

**Prof. Narada Warnasuriya**

I am deeply honoured by the invitation to deliver the Convocation Address. I thank the Dean and the academic staff of the Faculty of Management Studies and Commerce for having invited me. During my term as Vice-Chancellor I have had very close contacts with your Faculty and I am aware of the many innovative and progressive academic programmes that have been developed and delivered during this period. I am also aware, that your Faculty is the pioneer in undergraduate management education in Sri Lanka which continues to attract the cream of the students entering the management stream.

It is also the Faculty which offers the widest variety of special courses in different aspects of management and commerce catering to the requirements of both state and corporate sectors. I know that each and every one of these courses have their special features and strengths and that the academic staff has developed them through great difficulties. Having had the pleasure of directly participating in or observing many of their innovative aspects I am convinced that you are a truly fortunate group of graduates who have benefited from an outstanding academic programme designed to bring out the best in you. I would say that in the Sri Lankan context you are an elite group. On this day, having completed your training in a specified discipline of management or commerce, you stand on the threshold of your future as qualified graduates of a prestigious university. While wishing you success, I would like to offer you some challenging and sobering thoughts on the role of the management profession in the world today.

The recent emphasis on the social importance of the university is set within the framework of a knowledge economy. With the demise of the welfare state and the ascendancy of global free market, there seems to be only one social model to aspire to which is summed up in the phrase "knowledge driven development".

A knowledge economy has been defined as one that creates, disseminates and uses knowledge to enhance its growth and development. The four pillars of a knowledge economy are a business environment that provides incentives for efficient creation, dissemination and use of knowledge, a dynamic information infrastructure that facilitates effective communication, dissemination and processing of information, an efficient innovation system of universities, research institutes, industries and other organizations which facilitates the creation, assimilation and adaptation of knowledge to suit local needs and last but not the least an educated and skilled workforce that can create and use knowledge.

It is such a qualified, skilled and adaptable work force that you are joining as new recruits. In this societal model you are not expected to wait until employment opportunities come to you. You are expected to chase after opportunities and capture them. If no opportunities exist, you are to create

your own. You have to be bold and adventurous and take calculated risks. In short you have to be entrepreneurial in your outlook to life and work.

However there has been one aspect which has been glaringly absent in this paradigm of development. That is a concern for social and economic justice. The obsession with the creation of an economically competitive society has been at the expense of a just and equitable society. The pursuit of efficiency in economic growth has become an end to itself. Market liberalization without providing a social safety net to the poor has widened the gap between the rich and the poor and the poor are being further marginalized.

The last two decades of the 20th century witnessed the largest economic expansion in the history of the world. But the benefits have hardly accrued to the poor. In fact 90% of the increased wealth has been concentrated in the top 10% of the population. Not only has the gap widened, in real terms, the poor have become poorer. 40% of the world's population including 45 million in the United States, live below the poverty line. In India which is boasting a 6-8% per annual growth rate of its GDP, 380 million people live on less than one dollar a day.

This blot on the knowledge economy was recently highlighted poignantly by one of the greatest entrepreneurs of our time, Bill Gates. In his convocation address to the Harvard University where he had studied before dropping out for a career in software development, he said "What I remember above all about Harvard was being in the midst of so much energy and intelligence. It could be exhilarating, intimidating, sometimes even discouraging but always challenging.

It was an amazing privilege and though I left early I was transformed by my years at Harvard by the friendships I made and the ideas I worked on. But taking a serious look back, I do have one big regret. I left Harvard with no real awareness of the awful inequities in the world, the appalling disparities of health, wealth and opportunity that condemn millions of people to lives of despair.

I learned a lot here at Harvard about new ideas in economics and politics. I got great exposure to the advances being made in sciences.

But humanity's greatest advances are not in discoveries but in how these advances are applied to reduce inequity. Whether through democracy, strong public education, quality health care or broad economic opportunity reducing inequity is the highest human achievement."

The developed world has not been immune from the ill effects of this unbridled quest for wealth creation.

Thomas Jefferson one of the founding fathers of American independence had visionary foresight when he, said in 1802.

"I believe that banking institutions are more dangerous to our liberties than standing armies. If the American people ever allow private banks to control the issue of their currency first by inflation and then by deflation the banks and the corporations that grow up around the banks will deprive the people of all property until their children wake up homeless in the continent their fathers conquered.

These words seem prophetic in the light of what is happening in the world of finance today. The deregulation and privatization of the global free market economy which gained momentum under Margaret Thatcher and Ronald Reagan has permitted many previously respectable banks, financial institutions, mortgage companies, building societies or insurance companies to throw caution to the wind in their zealous pursuit of maximizing yields in the shortest possible time. There has been a collective failure of oversight and misjudgment of risk at the highest echelons of the corporate world. Corporate greed has clearly exceeded corporate responsibility.

In the collapse of financial institutions which we are witnessing both globally and locally there is little doubt that laxity of ethical and social values in top and middle management has been an important underlying factor.

It is not surprising that many have seen a link between the problems of global finance, its chronic inequities as well as the acute crises and a failure of modern management education to instill a concern for ethical values and social justice as an integral part of the quest for excellence and organizational success. Five years ago business schools, particularly in America came under attack following the corporate scandals that erupted at firms such as Enron and World.com. Many of the corporate villains indicted boasted MBAs from top business schools. At that time many agreed with one commentator who said that the only solution to the ethical problems of corporate America was to fire everyone under thirty five with a MBA.

In spite of this a recent survey of the 50 top MBA programmes globally as rated by the Financial Times, published in the journal of Business Ethics reveal that only 25% teach ethics as a stand alone course. This is a five fold increase since 1988. However one third of them require some coverage of corporate social responsibility, ethics and sustainability as a part of the MBA. Few of them teach these by experiential learning or immersion techniques.

Even the recent movement towards corporate social responsibility has been an after thought and the manner in which it is practiced by most corporate entities provides only lip service to the concept.

Most still follow the guru of the free market Nobel laureate Milton Friedman who said "The only social responsibility of business is to increase its profits. They practice what is euphemistically referred to as a "win win" strategy which aims to maximize profits by covertly linking a subtle brand promotion to the claimed good deed. A public campaign to minimise infections by handwashing launched by a reputed manufacturer of household soap is a case in point.

It should be apparent to any critical observer that an ethical orientation and a concern for social and economic justice need to be ingrained into management education not in a minimalist fashion with a view to merely complying with legal requirements but as an integral part of its core values.

There should be an awareness that economic growth is only a pre-condition for development and not an end in itself. An appreciation of the limitation of GDP per capita as an indicator of development and familiarity with other indicators such as the Human Development Index (HDI) and measures of economic disparity such as Lorenz curves and Gini coefficients would be desirable. It would be a shame if any management graduate is unable to list the Millennium Development Goals (MDG).

As much as they know of Milton Friedman and his work they should know of Amartya Sen and his work.

While inclusion of these concepts and newer paradigms in the course content may help to change for the better, we know that acquisition of attitudes and values while in a university is greatly influenced by extra- curricular activities.

In this context it is pertinent to reflect on the view of Karl Jaspers a leading German philosopher of the twentieth century on the role of a modern university.

He saw it as comprising of three interconnected centres, a “training centre” to produce society's professionals, a “research centre” to solve its problems and a “cultural centre" to provide a liberal environment for its thinkers. Jaspers envisaged the three roles merging imperceptibly with each other as a composite whole.

Unfortunately in our thrust towards organizational success in mere economic terms we have neglected the third role. Many feel that Sri Lankan Universities have ceased to be centres which promote genuine dialogue and debate on social, political and cultural issues. We do not provide an adequate space for free and open discussion of ideas and values. The intellectual environment is not conducive to independent thinking. Student radicalism and violence coupled with a sub culture of indoctrination have crippled the universities role as a credible moral and political force. The academic staff are at least partly to blame for this situation. With a few notable exceptions they are detached and indifferent. They seem unable or uninclined to communicate with students in an open environment. The radical student leadership by the stridency, irrationality and the violence of their outbursts have done little to further societal acceptance of the causes they espouse, including social justice and free education.

In this context it is fair to say that Sri Lankan Universities are failing in their obligation so society not so much because of their inability to produce graduates that industry requires but as much because of their failure to navigate society safely and to catalyze a positive social transformation, for which there is no alternative mechanism or institution. The statement of H. G. Wells that “Human history is more and more a race between education and catastrophe” has never been more true than in today’s context.

So my dear graduates, what is my final message to you? I would like to take you back to what Bill Gates had to say to the graduating class at Harvard.

"From those to whom much is given, much is expected. When you consider what you have been given in talent, privilege and opportunity there is almost no limit to what the world has a right to expect from you.

I hope you will comeback to Harvard 30 years from now and reflect on what you have done with your talent and your energy. I hope you will judge yourself not on your professional accomplishments alone but also on how well you have addressed the world's deepest inequities, how well you treated people a world away who have nothing in common with you but their humanity"

You are the graduating class of the pioneer management faculty in Sri Lanka. I have this to say to you.

As a graduate you are not merely expected to be master of your subject. You must also be a master of yourself with an ability to think independently and act courageously to enrich the society which has sustained you thus far. You must be one of a new breed of management graduates who while striving for both personal and organizational success have a concern for the less advantaged members of society whose sweat and toil contributed to your education.

Blaise Pascal a renowned French mathematician and spiritualist once said "Man is neither angel nor beast and the misfortune is that he who would act the angel act the beast".

I speak especially to the academic high flyers. Resist the temptation to be a beast. Do not be overawed by the glitz and tinsel of the corporate world. Remember that it is not the style that matters but the substance. You may reach for the stars but have your feet firmly planted on the ground.

Once again I wish you success in your future endeavours.

*2008.12.01*

# 31

# කළමනාකරණ උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිය

## මහාචාර්ය එම්. ඩබ්ලිව්. වික්‍රමාරච්චි

ආචාර්ය ඊ. ඩබ්ලිව්. අදිකාරම් මහතා විසින් 13.12.1979 දින පවත්වන ලද උපාධි ප්‍රදානෝත්සව දේශනයෙන් උපුටා ගත් කොටසකින් මගේ දේශනය ආරම්භ කරන්නට මට ඉඩ දෙන්න. ''විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය විය යුත්තේ ''සික්ඛා'' යන පාළි වචනයෙන් මැනවින් ප්‍රකාශ වන ඉගෙනීමත්, හික්මීමත් එකවිට ඇති කරන අධ්‍යාපනය යි. කරුණු ඉගෙනීමෙන් පමණක් නොව හික්මීමෙන් ද යුත් ඒ පූර්ණ අධ්‍යාපනය ශිෂ්‍යයන්ට ලබාදීමට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමත් වේවා යැයි මම ප්‍රාර්ථනා කරමි.''

තවත් සංකල්පයක් ඊට එකතු කර ''උගත්, හික්මුණු සහ රැකියාවෙහි යෙදවිය හැකි කළමනාකරණ උපාධිධාරීන්'' ලෙස එය ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි.

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයීය කළමනාකරණ අධ්‍යාපනය, 1959-1960 අධ්‍යයන වර්ෂය තුළ දී විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ කලා පීඨය තුළින් බිහි විය. මහාචාර්ය ලීනස් ද සිල්වා මහතා, එවකට විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ උපකුලපති, වැලිවිටියේ සෝරත නාහිමියන්ගේ අනුග්‍රහයෙන් යුතුව, රාජ්‍ය සහ පෞද්ගලික අංශයන් ගෙන් තෝරාගත් කණ්ඩායම් දෙකක් සඳහා රාජ්‍ය පරිපාලන සහ ව්‍යාපාර පරිපාලන ප්‍රථම උපාධි පාඨමාලා දෙකක් ඇරඹීය. ඇතුළත් වීමේ විභාගය සඳහා වැඩ කිරීමේ පළපුරුද්ද, ඉල්ලුම් කිරීමට එක් සුදුසුකමක් විය. මහාචාර්ය කේ.පී. මුකර්ජි මහතා, ඉන් පසුව, ආර්ථික විද්‍යා, රාජ්‍ය සහ ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශයේ අංශාධිපති විය. පසුව, මහාචාර්ය ධර්මසේන ද සිල්වා මහතාගේ මූලිකත්වයෙන් කළමනාකරණ අධ්‍යාපනය, අධ්‍යයනාංශ මට්ටමේ සිට පීඨ මට්ටම දක්වා දියුණු කරන ලදී.

මිනිසා විසින් දියුණු කරන ලද වෙනත් දැනුම් ක්ෂේත්‍රයන් සමඟ සසඳන විට කළමනාකරණයට විශ්වවිද්‍යාලයීය විෂයක් ලෙස ඇත්තේ කෙටි ඉතිහාසයකි. කෙසේ වුවද දියුණු රටවල මෙන් ම දියුණු වෙමින් පවතින රටවල ද කළමනාකරුවන් අතර එය ඉතා ජනප්‍රිය දැනුම් ක්ෂේත්‍රයක් බවට පත් වී ඇත. සමහර මානව ශාස්ත්‍ර, සමාජ විද්‍යා, ස්වාභාවික විද්‍යා සහ ව්‍යවහාර විද්‍යා පාඨමාලා කළමනාකරණ අධ්‍යාපනයේ වටිනාකම හඳුනා ගෙන එහි සමහර අංශ එම අධ්‍යයන පාඨමාලාවන්ට ඇතුළත් කර ඇත. මෙය නූතන ගෝලීය ප්‍රවණතාවකි. අද කළමනාකරණ අධ්‍යාපනය, ලංකාවේ විශ්වවිද්‍යාල වැඩි ගණනක පාඨමාලාවක් හෝ අධ්‍යයනාංශයක් හෝ පීඨයක් ලෙස ස්ථාපිත වී ඇත. දෙපාර්තමේන්තු 11 ක් තුළ විහිදී ඇති, ආචාර්යවරුන් 160 කින් ද, සිසුන් 4000 කින් ද සමන්විත ඉතා ශක්තිමත් කළමනාකරණ පීඨයක් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය (කලින් විද්‍යෝදය) තුළ බිහි වී ඇත.

කළමනාකරණ පීඨයෙන් බිහි වූ උපාධිධාරීන්ගෙන් සමහරෙක් ජාතික මෙන් ම ජාත්‍යන්තර තලයේ ද රාජ්‍ය සහ පෞද්ගලික අංශවල ප්‍රමුඛ තනතුරු දැරීම සතුටට කරුණකි. කෙසේ වෙතත්, කළමනාකරණ උපාධිධාරීන්ට දීර්ඝ කාලයක් තිස්සේ ආර්ථික විද්‍යා, ගණකාධිකරණ සහ වාණිජ විද්‍යා ගුරුවරුන් ලෙස රාජ්‍ය සේවයට එක්වීමට සිදු විය. අලෙවිකරණය, මානව සම්පත්

කළමනාකරණය, ගණකාධිකරණය, බැංකුකරණය වැනි වෘත්තීය කළමනාකරණ පාඨමාලා ද ලංකාවේ ඇත. විශ්වවිද්‍යාලයීය කළමනාකරණ අධ්‍යාපනයට අමතරව මෙම වෘත්තීය පාඨමාලා හැදෑරූ උපාධිධාරීන්ට කෙටි කාලයක් තුළ ඉහළ තනතුරු ලබා ගැනීමට හැකි වී ඇත. රජය විසින් පාසල් ගුරුවරුන් ලෙස උපාධිධාරීන් බඳවා ගැනීම සීමා කරන ලද අවස්ථාවලදී සිංහල මාධ්‍යයෙන් කළමනාකරණ උපාධිය හැදෑරූ වැඩි දෙනෙක් රැකියා වියුක්තිකයන් හෝ ඌන රැකියා නියුක්තිකයන් බවට පත් වූහ. කළමනාකරණ අධ්‍යාපනය ක්‍රමිකව සිංහල මාධ්‍යයෙන් ඉංග්‍රීසි මාධ්‍යයට වෙනස් වීමත් සමඟ කළමනාකරණ උපාධිධාරීන්ගේ රැකියා වියුක්ති අනුපාතය අඩු විය. මෙම වෙනස්වීමේ සාධාරණීය බව සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණකි. අද පවතින තත්ත්වය තුළ ද අපේ සමහර උපාධිධාරීන්ට ගැළපෙන රැකියාවක් ලබා ගැනීම සඳහා දිගු කලක් බලා සිටීමට සිදුවන අතර රජයේ උපාධිධාරීන් පුහුණු කිරීමේ වැඩ පිළිවෙළ තුළ ද කළමනාකරණ උපාධිධාරීන් බඳවා ගැනීම දැකිය හැකි ය. එහෙත් ආර්ථික වර්ධන ක්‍රියාවලිය තුළ කටයුතු කිරීම සඳහා කළමනාකරණ උපාධිධාරීන් සැලකිය යුතු ප්‍රමාණයක් අවශ්‍ය වේ. මෙම පරතරය අප උපාධිධාරීන් තුළ තිබුණත්, දේශීය හා විදේශීය වෙළෙඳපළට අවශ්‍ය පරිදි කළමනාකරණ උපාධිධාරීන් සැපයීමේ හැකියාව කළමනාකරණ හා වාණිජ විද්‍යා පීඨයට ඇත.

පාඨමාලාවල ගුණාත්මක බව සහ අදාළ බව දියුණු කිරීම සඳහාත්, එමගින් උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිය වැඩි කිරීම සඳහාත් කළමනාකරණ ප්‍රථම උපාධි පාඨමාලා පීඨ මණ්ඩල දැක්ම පදනම් කර ගත් උපක්‍රමශීලී ක්‍රියාදාමයක් මඟින් ප්‍රතිව්‍යුහගත කිරීම වැදගත් වේ. ඉගැන්වීම, පර්යේෂණ කටයුතු, ආධුනිකත්ව පුහුණුව, කුසලතා වර්ධනය, ව්‍යවසායකත්ව කටයුතු සහ උපාධිධාරීන් දේශීය සහ විදේශීය රැකියා සඳහා මෙහෙයවීම යනාදියට අදාළව මා සතු හතළිස් වසරක (40) අත්දැකීම් පදනම් කරගෙන අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීමට මට අවසර දෙන්න කළමනාකරණ ක්ෂේත්‍රයේ විද්‍යාර්ථීන්ට, උපාධිධාරීන්ට, විශ්වවිද්‍යාල සිසුනට මෙම අදහස් ගැන සිතා බලා ඊට අමතරව, දියුණු රටවල කළමනාකරණ අධ්‍යාපනයේ සිදු වී ඇති වෙනස්කම්වලට අදාළව පළ වී ඇති පර්යේෂණ ලිපි කියවා බලා, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ අධ්‍යයන පරමාර්ථ සහ උපක්‍රම දියුණු කිරීම ගැන සිතා බැලිය හැක.

පරිසරය සැලකිය යුතු වේගයකින් වෙනස් වේ සංකීර්ණ වේ. දැනුම ලබාදීමේ, දැනුම සොයා ගැනීමේ, දැනුම ප්‍රායෝගිකව යොදවා ගැනීමේ සහ ශිෂ්‍ය වටිනාකම් වැඩි කිරීමේ අවශ්‍යතාවට අනුව කළමනාකරණ අධ්‍යයන ක්ෂේත්‍රය පුළුල් කිරීම කළ යුතු වේ. මෙය ප්‍රතිපත්ති තීරණය කරන්නන්, අධ්‍යාපනය ලබා දෙන්නන් සහ පර්යේෂකයන් විසින් අවබෝධ කරගත යුතු වේ.

කළමනාකරණ හා වාණිජ විද්‍යා පීඨය, එහි කෙටි ඉතිහාසය තුළ, කළමනාකරණ ක්ෂේත්‍රයේ අතුරු ක්ෂේත්‍ර 11 ක් රාජ්‍ය, ව්‍යාපාර, වාණිජ, දේපළ පරිපාලන සහ තක්සේරු ශාස්ත්‍ර, ගිණුම්කරණ, මූල්‍ය, මානව සම්පත්, අලෙවිකරණ, ව්‍යාපාර ආර්ථික විද්‍යා, තොරතුරු තාක්ෂණ සහ තීරණ විද්‍යා ලෙස හඳුනා ගෙන ඇත. මේවා දියුණු කළ ක්‍රියාදාමයේ සහ ප්‍රතිඵලවල යම් යම් අඩුපාඩු තිබුණත්, මෙම අතුරු ක්ෂේත්‍ර බිහිවීම දකුණු ආසියාවේ විශ්වවිද්‍යාලයක් විසින් ලබා ගන්නා ලද සාර්ථක ප්‍රතිඵලයකි.

කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ විද්‍යා පීඨයේ මෙහෙයුම් ප්‍රකාශය කෙරෙහි ඔබේ අවධානය යොමු කිරීමට මට ඉඩ දෙන්න.

"ශ්‍රී ලංකාවේ කළමනාකරණ අධ්‍යාපනයේ විශිෂ්ටතම මධ්‍යස්ථානය බවට පත්වීම, ඉගෙනීමේ සහ ඉගැන්වීමේ උපරිම ප්‍රමිතියනට ළඟාවීම, පාණ්ඩිත්‍යය සහ පර්යේෂණ ප්‍රවර්ධනය, පෞද්ගලික අංශය, රාජ්‍ය අංශය සහ පුළුල් සමාජය සමඟ අන්තර් ක්‍රියාකාරීත්වය මඟින් න්‍යාය සහ පරිචය ඒකීකරණය සඳහා කැපවීම."

විශිෂ්ටතම මධ්‍යස්ථානය බවට කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යාපීඨය පත්වීම සඳහා විශ්වවිද්‍යාල පද්ධතියට ඇතුළුවීමට උත්සාහ කරන සිසුන්ගේ, ඔවුන්ගේ දෙමව්පියන්ගේ සහ ගුරුවරුන්ගේ, ව්‍යාපාර සමාජයේ, රාජ්‍ය ආයතනවල, සහ කළමනාකරණ ක්ෂේත්‍රයේ අනුවෘත්තීය ආයතනවල පිළිගැනීම ලබා ගත යුතු ය. අප ඉගෙනීමේ සහ ඉගැන්වීමේ ක්‍රියාදාමයේ උපරිම ප්‍රමිතියට අනුව කටයුතු කරන්නේ නම්, අප උපාධිධාරීන්ට ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් රජයේ සහ පෞද්ගලික අංශයේ වගකිවයුතු කළමනාකරණ තොරතුරු දරමින් සමාජයීය මෙහෙවරක් කිරීමට හැකිවිය යුතුය. කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයෙන් බිහි කරන ලද සමහර උපාධිධාරීහු එවැනි වැදගත් තනතුරු හොබවති. අපේ අරමුණ විය යුත්තේ අපේ උපාධිධාරීන් 100% ක්ම එවැනි උසස් මට්ටමේ තනතුරු හෙබවිය හැකි අය බවට පත්කිරීමය. මේ සඳහා කළ යුතු වන්නේ දැනට ක්‍රියාත්මක වන අධ්‍යාපන ක්‍රමයේ පරමාර්ථ සහ ක්‍රමවේදයන්වල වෙනස්කම් කීපයක් ඇති කිරීමය. ඒ සඳහා කළමනාකරණය සහ එහි අතුරු ක්ෂේත්‍රවලට අදාළව කළමනාකාරවරුන්, ව්‍යවසායකයන්, දැනුම බෙදාහරින්නන් සහ උපදේශකවරුන් සහ දැනුම සොයන්නන් බිහි කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

## කළමනාකාරවරු:

සංවිධානවල සිටින, ඒවායේ පරමාර්ථ ඉටු කර ගැනීමේ අරමුණින් කටයුතු කරමින් වගකීම් දරන පුද්ගලයන් කළමනාකාරවරුන් ලෙස හැඳින්විය හැක. අද ලංකාවේ සිටින කළමනාකාරවරුන්ගෙන් වැඩි කොටසක් කාර්ය ලෝකයේ තත්-වරද ක්‍රමය සහ ස්වඅධ්‍යයන ක්‍රමය තුළින් බිහි වූ අය වෙති. විශ්වවිද්‍යාල මඟින් පවත්වනු ලබන ප්‍රථම උපාධි මට්ටමේ කළමනාකරණ අධ්‍යයන පාඨමාලාවලට සහභාගී වීමට ඔවුනට අවකාශ ලැබෙන්නේ ඉතා කලාතුරකිනි. පෞද්ගලික අංශයේ ව්‍යාපාර ආයතන විසින්, සෑහෙන කාලයක් තුළ, හුදෙක් උපාධි සහතිකය මත පමණක් විශ්වවිද්‍යාලයීය කළමනාකරණ උපාධිධාරීන් විධායක තනතුරුවලට බඳවා ගැනීමට මැලිකම දක්වන ලදී. රජය ද රාජ්‍ය සේවයට උපාධිධාරීන් බඳවා ගැනීමේ දී කළමනාකරණ උපාධිධාරීන්ට විශේෂ සැලකිල්ලක් නොකරයි. සිය ආයතනවලට කළමනාකරණ උපාධිධාරීන්ගෙන් විශේෂ ප්‍රතිලාභයක් ලැබෙන්නේ නම්, ඔවුන් සේවයට බඳවා ගැනීමට පෞද්ගලික හා රාජ්‍ය ආයතන මැලි නොවනු ඇත. කළමනාකරණ උපාධිධාරීන් අන්‍යයන්ට වඩා වැඩි වෙළඳපොළ වටිනාකමක් ඇති අය ලෙස බිහි කිරීම, විශ්වවිද්‍යාල කළමනාකරණ ක්ෂේත්‍රයේ කටයුතු කරන විද්වතුන්ගේ යුතුකමකි. විශ්වවිද්‍යාල කළමනාකරණ උපාධිධාරීනට වැඩි අගයක් ඇති වෙළෙඳපළ වටිනාකමක් හිමි විය යුතු ය. ඒ සඳහා උසස් කළමනාකරණ න්‍යායාත්මක දැනුම, කළමනාකරණ කටයුතු කිරීම සඳහා අවශ්‍ය කුසලතා සහ නිවැරදි වෘත්තීය ආකල්ප සහ වටිනාකම් ඔවුන් සතු විය යුතු වේ.

## ව්‍යවසායකයන්:

කළමනාකාරවරු ආයතනයක සේවකයෝ වෙති. ආයතන නිර්මාණය කරන්නන් සහ රැකියා සපයන්නන් ව්‍යවසායකයෝ වෙති. දියුණුවන රටවලට රැකියා නිර්මාණය කිරීම ඉතා වැදගත්ය. ඒ අනුව කළමනාකරුවනට වැඩියෙන් ව්‍යවසායකයෝ අවශ්‍ය වෙති. අද ලංකාවේ සාමාන්‍ය රැකියා

අවස්ථා අඩු ය. බොහෝ උපාධිධාරීනට සුදුසු රැකියා නොලැබේ. මේවා වෙළඳපළ අරමුණු කර නොගෙන පවත්වා ගෙන යන විශ්වවිද්‍යාල අධ්‍යාපන ක්‍රමයේ ප්‍රතිවිපාක දෙකකි. විශ්වවිද්‍යාල කළමනාකරණ අධ්‍යාපන ක්‍රමය ව්‍යවසායකයන් බිහි කිරීමේ අරමුණින් යුතුව සකස් විය යුතු වේ. කළමනාකරණ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම මඟින් මෙය කළ හැක. ව්‍යවසායකයන් බිහි කිරීම ද එක් පරමාර්ථයක් විය යුතුය. මේ සඳහා විෂය ඒකක තුළට න්‍යායාත්මක දැනුම සහ එහි ප්‍රායෝගිකත්වයට අමතර ව ව්‍යවසායකත්ව හැඩ ගැස්ම ඇතුළත් කිරීම වැදගත් වේ.

## දැනුම බෙදා හරින්නන් සහ කළමනාකරණ උපදේශකවරු:

කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ විද්‍යා පීඨය, සැලෙන කාලයක් තුළ, පාසල් ගුරුවරුන් සහ විශ්වවිද්‍යාල සහ කාර්මික විද්‍යාල කථිකාචාර්යවරුන් බිහි කළේය. සමහර කළමනාකරණ උපාධිධාරීන්ට විදේශීය විශ්වවිද්‍යාලවල කථිකාචාර්ය තනතුරු ලැබී තිබීම සත්‍යයකි. රට තුළ රැකියාවේ යෙදී සිටින කළමනාකරණ කථිකාචාර්යවරුන්ට පෞද්ගලික අංශයේ අධ්‍යාපන ආයතනවලින් ද සැලකිය යුතු ඉල්ලුමක් ඇත. කථිකාචාර්යවරුන්ගේ පෞද්ගලික ඉපයීම් සලකා බලන විට, ඔවුන්ගේ දැනුම සහ පළපුරුද්ද කළමනාකරණ උපදේශකවරුන් ලෙස නොව පෞද්ගලික අංශයේ අධ්‍යාපනය සපයන්නන් ලෙස උපයෝගී කර ගන්නා බව පෙනේ. දියුණු රටවල කළමනාකරණ කථිකාචාර්යවරුන්ගේ දැනුම සහ පළපුරුද්ද ලංකාවේ රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල කළමනාකරණ උපදේශකවරුන් ලෙස උපයෝගී කර ගැනීම දැකිය හැක. අප පීඨයේ ආචාර්යවරුන් ද කළමනාකරණ උපදේශන ක්ෂේත්‍රයට සම්බන්ධ වීම වැදගත් වේ.

## දැනුම සොයන්නන්:

නව දැනුම සෙවීම විශ්වවිද්‍යාල ක්‍රමයේ මූලික කාර්යයකි. දිගු කාලයක් තුළ ලංකාවේ කළමනාකරණ අධ්‍යාපනය, දැනුම බෙදා දීම මුල් කරගෙන තිබූ අතර නව දැනුම සොයා ගැනීම කෙරෙහි අඩු අවධානයක් යොමු කෙරිණි. කළමනාකරණ ක්ෂේත්‍රයේ පර්යේෂණ සම්මන්ත්‍රණයන් සංවිධානය කිරීම මෑතක දී ඇති වූ වර්ධනයකි. ආචාර්ය උපාධි සුදුසුකම් ඇති ආචාර්යවරුන්ගේ අඩු බව සහ පර්යේෂණ අවධානය අඩුවෙන් ඇති ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති පාඨමාලාවලට ඇති ජනප්‍රියත්වය, පර්යේෂණ ලෙස පොදුවේ හඳුන්වන දැනුම සෙවීම පහත් මට්ටමක තිබීමට හේතු වී ඇත.

අනාගතයේ දී ප්‍රතිලාභ සෘජුව සහ වක්‍රව ලබා ගැනීම වෙනුවෙන් විෂයයක දැනුම රැස් කර තබා ගැනීම කරනු ලැබේ. යම්කිසි විෂයයක මිනිස් වර්ගයාට ඇති අනාගත ප්‍රතිලාභ හඳුනාගත නොහැකි වන්නේ නම් එවැනි විෂයයක් සමාජය තුළ රඳා පැවැත්ම සැක සහිත ය. එම විෂය කරුණු සමාජ සහ භෞතික වෙනස්වීම අනුව වෙනස් වී නොතිබීමට මීට ප්‍රධාන හේතුව ලෙස දැකිය හැක. කළමනාකරණ දැනුමේ අනාගත ප්‍රතිලාභ එම දැනුම ප්‍රායෝගිකව යොදා ගැනීමේ හැකියාව මත රැඳී ඇත. දියුණු රටවල කළමනාකරණ අධ්‍යාපනයේ ප්‍රවණතාව වටිනාකම වැඩි කිරීමේ ප්‍රධාන අංශ තුනක් වෙත යොමු වී ඇත. මේවා දැනුම අයත් කර ගැනීම සහ රඳවා ගැනීම, කුසලතා දියුණුව, සහ වෘත්තීය හැඩගැස්ම ලෙස දැක්විය හැක.

## දැනුම අයත් කර ගැනීම සහ රඳවා ගැනීම:

විෂයයක ඇතුළත් වන කරුණු සංකල්ප, න්‍යායයන්, මූලධර්ම, රීති, ක්‍රියාදාම, ප්‍රමිති සහ සාධකවලින් සමන්විත වේ. මේවායේ ගති ලක්ෂණ දැන ගැනීම, දැනුම ලබාගැනීම ලෙස සැලකිය

හැක. දැනුම ලබාගත් පසු, එය හඳුනාගත හැක; විශ්ලේෂණය කළ හැක; රැස්කර තැබිය හැක. සම්ප්‍රදායානුකූල අධ්‍යාපනය තුළ, දැනුම රැස්කර තැබීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත. දැනට පවතින අධිවේගී පරිසරය වෙනස් වන රාමුව තුළ දැනුම රැස් කිරීමට වඩා ''ඉගෙනීම සඳහා ඉගෙනුම'' කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු වේ. ඒ අනුව අභියෝගයන්ට සහ අවදානම්වලට මුහුණ දීමට හැකි වන ලෙස ඉගෙනීමේ ක්‍රියාවලිය අඛණ්ඩව ඉදිරියට ගෙන යා හැක. විෂයයක දැනුම ගබඩා කර තබා ගැනීම සඳහා දියුණු වී ඇති තාක්ෂණ ක්‍රම උපකාරී කර ගත හැක. කළමනාකරණ පාඨමාලාවක දැනුමේ සංයුතිය සාමාන්‍ය කළමනාකරණ දැනුම, විශේෂ කළමනාකරණ දැනුම, අදාළ විෂය දැනුම සහ සාමාන්‍ය දැනුම යන අංශවලින් සමන්විත වේ.

## කුශලතා සංවර්ධනයඃ

කළමනාකරණ පීඨ මඟින් සාර්ථක කළමනාකරුවන් සහ ව්‍යවසායකයන් බිහි කිරීම සඳහා විශ්වවිද්‍යාලයීය කළමනාකරණ අධ්‍යාපන ක්‍රමය තුළ දැනුම ලබා ගැනීම සහ පවරා දීමට අමතරව කුශලතා සංවර්ධනයට ද වැඩ පිළිවෙළක් තිබිය යුතු වේ. ''ශිල්ප'' සහ ''ශාස්ත්‍ර'' යනු අතීතයේ සිට දකුණු ආසියානු අධ්‍යාපන ක්‍රමය තුළ තිබූ මූලික සංකල්ප දෙකකි. ''ශිල්ප'' යනු කුශලතාය. වර්තමානයේ පවතින විදේශීය පාලකයන්ගෙන් ලැබුණු අධ්‍යාපන ක්‍රමය තුළ මූලික පරමාර්ථය රජයේ පරිපාලන කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය පුද්ගලයන් බිහි කිරීම යි. මෙම අධ්‍යාපන ක්‍රමය තුළ කුශලතා වර්ධනයට ඇත්තේ අඩු පිළිගැනීමකි. උසස් අධ්‍යාපනය හඳුන්වා දුන් යුගයේ කලා විෂයයන් කෙරෙහි මූලික අවධානය යොමුව තිබූ අතර කුශලතා වර්ධනය කාර්මික විද්‍යාලවල සහ එවැනි වෙනත් අධ්‍යාපන ආයතනවල කාර්යභාරයක් ලෙස සලකන ලදි. එසේ වුවත්, පසුකාලීන ව හඳුන්වා දෙන ලද වෛද්‍ය, ගෘහ නිර්මාණ, කෘෂිකර්ම සහ ඉංජිනේරු වැනි පාඨමාලාවල කුශලතා වර්ධනයට සැලකිය යුතු තැනක් ඇත. අද ලංකා ආර්ථිකයට එහි ඵලදායිතාව වර්ධනය කිරීම සඳහා කළමනාකරණ උපාධිධාරීන් අවශ්‍ය වේ. ගෝලීය ආර්ථිකයේ තරඟකාරීත්වයට මුහුණ දීම සඳහා රාජ්‍ය අංශයට මෙන් ම පෞද්ගලික අංශයට ද දැනුම, කුශලතා සහ නිවැරදි ආකල්ප ඇති කළමනාකරුවන් අවශ්‍යව ඇත. පෞද්ගලික අංශයේ ආයතන විසින් පුහුණු වන කළමනාකරුවන් බඳවා ගැනීමේ දී වෘත්තීය සුදුසුකම්වලට ප්‍රමුඛතාව දීම දැකිය හැක. වෘත්තීය කළමනාකරණ ආයතන සිය පාඨමාලා තුළ කුශලතා වර්ධනයට විශේෂ තැනක් දීම ඊට හේතු වේ. පාරවල් ගානේ පෙළපාලි යෑමෙන් හෝ කළමනාකරණ උපාධිධාරීන්ට රැකියා දිය යුතු ලෙස රජයට බල කිරීමෙන් ආර්ථිකයේ ඵලදායිතාව දියුණු කළ නොහැක. රැකියා ලබාගත හැකි කළමනාකරණ උපාධිධාරීන් බිහි කිරීම සඳහා කුශලතා වර්ධනයේ වැදගත්කම කළමනාකරණ ආචාර්යවරුන් විසින් තේරුම් ගත යුතු වේ. අවස්ථානුකූලව වෙනස්වීමේ හැකියාව, සන්නිවේදනය, තුලනාත්මක විශ්ලේෂණය, අන්තර් පුද්ගල සම්බන්ධතා සහ පෞද්ගලික හැකියාවන්ට අදාළ කුශලතා උපාධිධාරීන් තුළ තිබිය යුතු ය. පෞද්ගලික හැකියාවනට අදාළ කුශලතා යටතේ නිර්මාණාත්මක හැකියාව, ආචාර ධර්ම අනුව හැසිරීම, නායකත්වය, අභිප්‍රේරණය, ප්‍රස්ථිතිය, කම්පනය, සමාජ වගකීම්වලට සංවේදී වීම සහ යාවජීව ඉගෙනුමට කැපවී සිටීම ඇතුළත් කළ හැකි වේ.

## වෘත්තීය හැඩ ගැස්මඃ

විශ්වවිද්‍යාල කළමනාකරණ අධ්‍යාපනයට යොමු වීමට පෙර සිට ම, දේශීය සහ විදේශීය වෘත්තීය කළමනාකරණ ආයතන ශ්‍රී ලංකාවේ කාර්ය පදනම් කරගත් වෘත්තීය කළමනාකරණ අධ්‍යාපනයේ නියුක්තව සිටී. ඒ අනුව, ව්‍යාපාරික සමාජය වෘත්තීය සුදුසුකම්වලට ප්‍රමුඛතාව දෙමින් සිටී. වර්තමානයේ විශ්වවිද්‍යාලවල කළමනාකරණ පාඨමාලා ඇත. වෘත්තීය කළමනාකරණ සුදුසුකම්

ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාලයීය කළමනාකරණ සිසුනට සහ උපාධිධාරීන්ට වෘත්තීය ආයතන යටතේ ද කළමනාකරණ අධ්‍යාපනය නැවත හැදෑරීමට සිදුව ඇත. විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථීන්ට වෘත්තීය සුදුසුකම් සහ කළමනාකරණ ක්ෂේත්‍රයේ ප්‍රායෝගික පළපුරුද්ද නොතිබිය හැක. එහෙත්, කළමනාකරණ ක්ෂේත්‍රයේ ඉතා හොඳ න්‍යායාත්මක දැනුමක් සහ පර්යේෂණ පළපුරුද්ද ඔවුන් සතුව ඇත. මෙය කළමනාකරණ වෘත්තීය අංශය දියුණු කිරීමට ද ඉතා වැදගත් වෙයි. ශාස්ත්‍රීය අභ්‍යාස කටයුතුවල යෙදීමට ප්‍රායෝගික කළමනාකරුවනට කාලය නොලැබේ; අවශ්‍ය පුහුණුව ද නොමැත. කළමනාකරණ විද්‍යාර්ථීන් සහ වෘත්තිකයන් එකම විෂයයේ අංශ දෙකක් ලෙස දැක්විය හැක. තරුණ පරම්පරාවට උපරිම පහසුකම් ලබාදීම සඳහා වෘත්තීය කළමනාකරණ ආයතන සහ විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය කළමනාකරණ දෙපාර්තමේන්තු අතර ආසන්න සම්බන්ධතාවක් තිබීම වැදගත් වේ. විශ්වවිද්‍යාලවල කළමනාකරණ උපාධිධාරීනට කළමනාකරණ අධ්‍යාපනය නැවත හැදෑරීමකින් තොරව අදාළ වෘත්තීය ආයතනයේ අවශ්‍ය ප්‍රායෝගික දැනුම ලබාගත් පසු සාමාජිකත්වය ලබා ගැනීමට අවස්ථාව තිබීම ක්ෂේත්‍රයේ දියුණුවට හේතු වනු ඇත.

දීර්ඝකාලීනව, කළමනාකරණ අධ්‍යාපනය විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථීන් විසින් සපයන, වෘත්තීය හැඩ ගැස්ම සහ ප්‍රායෝගික පළපුරුද්ද වෘත්තීය කළමනාකරණ ආයතන මඟින් සැපයෙන ක්‍රමයක් සකස් විය යුතුය. මූලික සුදුසුකම් ඇති අයෙකුට කළමනාකරණ අධ්‍යාපනය ලබා ගැනීමට අවශ්‍ය නම් ඔහුට හෝ ඇයට එය ලබා ගත හැකි වන සේ විශ්වවිද්‍යාල අධ්‍යාපන ක්‍රමය ප්‍රතිව්‍යුහගත විය යුතු වේ. නූතන ගෝලීය ප්‍රවණතාව මෙම සහයෝගීතාව අරමුණු කර ගෙන දියුණු වෙයි.

ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරණයේ දී බැරැක් හුසේන් ඔබාමාගේ ජයග්‍රහණය උදෙසා ඔහුගේ අනුගාමිකයෝ ''අපට අවශ්‍ය වෙනස'' යන සංකල්පය භාවිත කළහ. ''අපට අවශ්‍ය වෙනස'' යන සංකල්පය සමාජයක් දියුණුව කරා ගෙන යාම පිණිස ඉතා වැදගත් වේ. කළමනාකරුවන්, ව්‍යවසායකයන්, දැනුම බෙදාහරින්නන් සහ කළමනාකරණ උපදේශකයන්, සහ දැනුම සොයන්නන්, ඔවුන් අතර අවශ්‍ය සමබරතාව ඇතිව බිහි කිරීමෙන් විශ්වවිද්‍යාල කළමනාකරණ පාඨමාලා තුළින් විශිෂ්ට දායකත්වයක් ලබා දිය හැක. මෙය ඉටු කර ගැනීම සඳහා දැනුම සහ අවබෝධය, කුශලතා වර්ධනය, සහ ඉගෙනුම සඳහා ඉගෙනුම සහිත වෘත්තීය හැඩගැසුම් කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. කළමනාකරණ අධ්‍යාපනයට සම්බන්ධ වන විද්‍යාර්ථීන්ගෙන්, පරිපාලකයන්ගෙන් සහ උපාධි අපේක්ෂකයන්ගෙන් මෙම අදහස් ගැන අවධානය යොමු කරන මෙන් ඉල්ලමි.

<u>*2008.12.01*</u>

# Employability of Management Graduates

**Prof. M.W.Wickramarachchi**

Let me begin my delivery with a quotation from the convocation address of Dr. E.W. Adikaram held on 13-12-1979."Education in the University should be that which is so beautifully expressed in that Pali word, sikkha which produces both learning and discipline simultaneously. I earnestly hope and trust that the University of Sri Jayewardenepura will impart to the students that integrated education which is both learning and discipline."

I would prefer to add another concept and present them as "Learned, Disciplined and Employable Management Graduates"

The origin of university management education in Sri Lanka dates back to the academic year 1959-1960 of the Faculty of Arts of Vidyodya University. Under the patronage of Ven. Welivitiye Soratha Maha Thero, then Vice-Chancellor of Vidyodaya University, Professor Linus de Silva established two undergraduate degree programs in Business Administration and Public Administration for two selected groups of students from the private and public sectors, respectively. Working experience was a criterion to apply for the admission test. Subsequently, Professor K.P. Mukarji became the Head of the Department of Economics, Business and Public Administration. Later, Professor Dharmasena de Silva was mainly responsible for the development of management education from department level to faculty status.

Management has a short history as a university discipline in comparison to other fields of knowledge developed by man. However, it has become a very popular area of knowledge among the business executives in developed as well as developing countries. Some academic programs in humanities, social sciences, natural sciences and applied sciences have recognized the value of management education for their students by incorporating some areas of management in their educational programs. This is the current global trend. Today, management education in Sri Lanka is available in most of the universities as programs, departments or faculties. University of Sri Jayewardenepura (former Vidyodaya University) has the strongest faculty of management education in Sri Lanka with about 4000 students and 160 academic staff members distributed among 11 departments.

It is heartening to note that some graduates of the Faculty of Management Studies and Commerce (FMSC) hold prominent positions in the private as well as public sectors, nationally and internationally. However, for a long period, a majority of the management graduates found employment in the government service as teachers of Economics, Commerce (Business Studies) and Accountancy. Those who have combined their university management education with professional education such as marketing management, personnel management (HRM), accounting, banking etc. rose to important positions within a short period. When the Government had to delay the recruitment of graduates as school teachers, the majority of the management graduates who did their studies in the Sinhalese medium became underemployed or unemployed. With the gradual conversion of management education from Sinhalese medium to English medium, the rate of unemployment and underemployment

among the management graduates got reduced. The justification of this conversion is an issue to be addressed, separately. Even now, some of our graduates have to wait for a long period to find suitable employments and we have seen the recruitment of management graduates by the Government under the graduate trainee schemes. The country needs more management graduates to be used in the process of economic development. Despite this gap prevailing in the products of FMSC, it has the potential resources to produce management graduates for local as well as international markets.

Restructuring of undergraduate management education on a vision driven strategic process is required to improve the quality and relevance of the programs and employability of graduates. So, let me present some views, on the basis of my forty years of academic experience involving teaching, research, internship, skills development, entrepreneurship and guiding graduates for local and foreign employments. The university academics, graduates and undergraduates of management could contemplate on these ideas and refer research articles on changes in university management education system in developed countries, which could be useful in modifying educational objectives and strategies of FMSC.

Policy makers, educators and researchers should understand the requirement of the society for the expansion of the field of management relevant to imparting of knowledge, seeking of knowledge, practical application of knowledge and value addition to students, in the current complex and rapidly changing environment.

The FMSC, through its short history of existence, has identified eleven sub areas of management education: Business, Public. Commerce, Estate Management and Valuation, Accounting, Finance, Human Resources, Marketing, Business Economics, Information Technology, and Decision Sciences. Some management practitioners in Sri Lanka consider this as a significant achievement by a South Asian university, though there are some weak elements inherited in the process and output.

Let me highlight the mission statement of the Faculty of Management Studies and Commerce.

"To be the Centre of Excellence for Management Education in Sri Lanka. It is committed to the highest standards of learning and teaching, promotion of scholarship and research and integration of theory and practice through interaction with private and public sector entities and wider society."

To be the Center of Excellence, the FMSC should get recognition from the students seeking admission to the university system, their parents and teachers, the business community, public sector institutions and professional institutions in their specialized areas of operation in a competitive environment. If we are committed to the highest standards of learning and teaching, our products must be able to serve the society through employment in responsible management positions in the business and public sectors, nationally and internationally. Some of FMSC products are already holding such important positions. The target should be to reach 100% employability leading to high management positions.

What we need is some modifications to already adopted policies, objectives and strategies in the education system. In order to achieve this, emphasis has to be made to produce managers, entrepreneurs,

knowledge distributors & management consultants, and knowledge seekers in general and functional areas of management.

## Managers:

Managers are the people responsible for directing the efforts aimed at helping organizations to achieve their goals. Today, the majority of the managers in Sri Lanka are products of the self- learning mode developed through trial and error method in the world of work. Rarely, they get opportunities to follow formal management education programs conducted by the university system at undergraduate level. For a long period, private sector business organizations have been reluctant to recruit university management graduates to executive positions purely on the basis of the degree qualification. The Government does not give preference to management graduates in absorbing them to management positions. University academics involved in management education should work towards obtaining recognition from the private and public sector institutions that could use management graduates for the benefit of their organizations. They must feel that the management graduates are more valuable than others. University management graduates should have marketable values. They should possess sound theoretical knowledge in management, skills for handling managerial work and right professional attitudes and values to suit managerial positions.

## Entrepreneurs:

While managers are employees of organizations, entrepreneurs are creators of enterprises and employments. Developing countries need more entrepreneurs than managers to create employments. Insufficient employment opportunities for the people in general and lack of suitable jobs for the university graduates in particular are two main outcomes of the non-market oriented university education system. University management education system has to be oriented towards producing entrepreneurs. It could be achieved by improving the management education system. Sound theoretical knowledge, practical applicability of such knowledge, and entrepreneurship orientation in the management courses of the degree programs are required to produce successful entrepreneurs.

## Knowledge Distributors and Management Consultants:

For a long period, the FMSC has been producing knowledge distributors as school teachers, and lecturers of universities and technical colleges. It is true that some of our management graduates have found employments as lecturers in foreign universities. Even the locally employed management academics have a demand from the private educational institutions. When it comes to private income earning of lecturers, their knowledge and experience are used in the private sector as educators and not as management consultants. In developed countries knowledge and experience of management academics are used by the government and private sector organizations as management consultants. Even in Sri Lanka, foreign academics can be seen functioning as consultants to companies and government departments. Involvement of our local management academics in management consultancy positions have to be improved.

## Knowledge Seekers:

Seeking of new knowledge is one of the major functions of the university system. For a long period management education in Sri Lanka was focused more on transferring of knowledge and less in seeking of new knowledge, which is commonly known as research. Organizing of research seminars on management is a recent development. Insufficient number of lecturers with PhD qualifications and popularity of MBA programs with less research orientation may be the main reasons for this low level of development in seeking knowledge.

Knowledge of a discipline is gathered and accumulated for the purpose of receiving future benefits directly or indirectly. If future benefits of a discipline to mankind cannot be identified, survival of such a discipline in the society is doubtful. Lack of change in the contents of a discipline in relation to changes of the social environment and physical environment can be identified as the main reason for its inability to survive. Future benefits of management knowledge depend on the practical applicability of it. The present trend in management education of developed countries is to consider three main segments, which contribute towards value addition: acquisition and accumulation of knowledge, skill development and professional orientation.

## Acquisition and accumulation of knowledge:

The subject matter of a discipline consists of concepts, theories, principles, rules, procedures, standards, facts and the study and understanding of their characteristics can be considered as acquisition of knowledge. After acquiring knowledge, it can be understood, analyzed and accumulated. Under the traditional system of education major emphasis has been to the accumulation of knowledge. In the prevailing rapid changing environment more emphasis has to be given to learning to learn aspects of gathering knowledge, so that the process of learning could be continued to face challenges and risks. Developed technologies can be used to store the knowledge of a discipline. In the management education process, the components of knowledge consist of general subject knowledge, specialized subject knowledge, knowledge of related areas and general knowledge.

## Skill Development:

If management faculties wish to produce successful managers and entrepreneurs, the education system should possess procedures to develop skills, in addition to acquisition and transferring of knowledge. "Shilpa" and "Shasthra" are two basic concepts that prevailed in the South Asian education system from the early days. "Shilpa" means skills. Under the colonial system of education, which is still being practiced in our country, the main objective had been to produce people to be used in handling the administrative work of the government. At the initial stage of higher education in Sri Lanka, the main emphasis was on arts subjects and skills development was not considered as significant. Skills development was handed over to technical colleges and other similar educational institutions. However, in some subsequently introduced disciplines such as medicine, architecture, agriculture and engineering, skill development has been considered as significant. Today, the Sri Lankan economy needs management graduates to improve its productivity. The private sector as well as the government sector needs

managers with knowledge, skills, and proper attitudes to be competitive in the global economy. One of the main reasons to give preference to professional qualifications in recruiting management trainees by the private sector organizations have been skill development component included in such programs. By protesting on streets or forcing the government to provide employments for the management graduates, productivity of the economy cannot be improved. Management educators should understand the significance of the skills in producing employable management graduates. They should possess skills relevant to adaptation to situations, communication, negotiation, critical and analytical ability, interpersonal relations as well as personal capacities. Creative thinking, vision, research, enquiry, integrity, ethical conduct, leadership, motivation, persistence, empathy, sensitive to social responsibilities and commitment to life-long learning can be included under the personal capacities.

## Professional Orientation:

In Sri Lanka, prior to involvement of universities in management education, foreign and local professional management institutions have been engaged in providing a system of work based professional management education. Thus the business community has been giving preference to professional qualifications. At present, universities conduct management degree programs. Management students and graduates of universities have to repeat their education under the professional institutions. University academics in management may not possess professional qualifications and practical experience in management. However, they have possessed the best theoretical knowledge and research experience in management, which are required for the development of professions. Practicing managers do not have sufficient time and skills to get involved in academic exercises. Academics and professionals of management are two wings of the same discipline. In order to provide the best management programs for the younger generation, what is required is a close relationship between the professional management institutions and university academic departments of management. Management graduates of universities should have a clear path to become practitioners and members of professional institutions without repeating courses of studies they have already been exposed to.

In the long-run, a system should be developed in Sri Lanka to provide management education by the academics of universities and professional orientation and practical experience by the professional management institutions. If a person with required basic entry qualifications wants to get a management education, facilities should be available in the university system to accommodate him/her. On the other hand, professional management institutions should be prepared to accommodate him/her after his/her university education. The present global trend is towards such existence of cooperation.

The concept of "Change We Need" has been applied by supporters of Barack Hussein Obama to bring him to victory at the presidential election in the USA. "Change We Need" is a very significant concept to lead the society towards development. Management educational programs of universities could contribute immensely by producing managers, entrepreneurs, knowledge distributors and management consultants, and knowledge seekers with a proper balance among them. In order to achieve this, attention has to be paid to knowledge and understanding skills development, and professional orientation with learning to learn. I would like to request the academics, administrators, graduates and undergraduates involved in university management education to ponder and debate over these thoughts that I have placed before you.

*2008.12.01*

# 32

# පිරිපුන් ආර්ථික පුනරුදයකට මඟ පෑදූ සීගිරිය හා අනාගත ශ්‍රී ලංකාවේ සංවර්ධනයට එයින් ගත හැකි උපායමාර්ග

මහාචාර්ය විමල් විජේරත්න

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2007 උපාධි ප්‍රදානෝත්සව දේශනය පැවැත්වීමට මට ආරාධනා කිරීම පිළිබඳව පීඨාධිපතිතුමා ඇතුළු ශාස්ත්‍ර පීඨයේ සාමාජික භවතුන්ට, සනාතන සභාවේ පාලක සභාවේ සාමාජික භවතුන්ට හා උපකුලපතිතුමාට පළමුවෙන් ම මගේ හෘදයංගම කෘතඥතාව පිරිනමමි.

මේ දේශනයට මා තෝරා ගැනීම මගේ ජීවිතයේ මා ලද අනර්ඝතම වූ සම්මානය ලෙස සලකමි. මම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙක්මි. පළමුවන උපාධියත් අනතුරු ව සියලු පශ්චාද් (ශාස්ත්‍රපති, දර්ශනසූරී) උපාධීන් මා ලැබුවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සංඛ්‍යාත රත්නාකරයෙනි. එය මට ශුද්ධ භූමියක් ද වෙයි. කුමක් නිසා ද යත් නිදහස් නිවහල් ආකල්පවලින් යුතු ව අනාසක්ත ව ලෙව දෙස බැලීමට මා පුරුදු පුහුණු වූයේ මේ උතුම් ක්ෂේම භූමියේ ඇසුර මා ලද නිසා ය.

මේ දේශනයේ මාතෘකාව ලෙස මා තෝරා ගත්තේ **පිරිපුන් ආර්ථික පුනරුදයකට මඟ පෑදූ සීගිරිය හා අනාගත ශ්‍රී ලංකාවේ සංවර්ධනයට එයින් ගත හැකි උපාය මාර්ග** යන්න යි. පළමුවන කාශ්‍යප මහ රජුන් විසින් මිහි මත ආලකමන්දාව/සීගිරිය නිර්මාණය කරන ලද්දේ ධනයට අධිපති දේවත්වය - කුවේරත්වය - තමනට ආරෝපණය කොට ගෙන, ඉන්දීය බටහිර සමුද්‍ර මාර්ගය ඉලක්ක කොට කල්‍යාණි (කොළඹ) වරායත් ඉන්දීය නැඟෙනහිර සමුද්‍ර මාර්ගය ඉලක්ක කොට හල්ල තීර්ථ (යාපනේ වල්ලිපුරම් වරාය) පට්ටනයත් ජාවා දේශීය සමුද්‍ර මාර්ගය ඉලක්ක කොට සමන්ත පට්ටන (නැඟෙනහිර සමන්තුරේ) වරායත් යන දේශීය වරායවල් තුන රේගු බද්දෙන් නිදහස් කරමින් ද එකී වරායවල් වටා විදේශීය වෙළෙඳුනට අවශ්‍ය සියලු පහසුකම් සලසමින් ද විදේශීය වෙළෙඳුන් ලංකාවට ආකර්ෂණය වීමට සලස්වා, ශ්‍රී ලංකාව කේන්ද්‍ර කොට ජාත්‍යන්තර වෙළෙඳාම පිණිස භාවිතයට ජාත්‍යන්තර මුදල් ඒකකයක් / රන් කහවණුවක් / ස්වර්ණ මුද්‍රිකාවක් නිකුත් කිරීමට බව අන්තරාලීන ශිලා ලිපිවල සඳහන් ය. එකී රන් කහවණුවේ දෙ පැත්තේ වූ සලකුණුත් එකී සලකුණුවලින් අපේක්ෂිත අර්ථත් එහි මූල්‍ය අගයත් එකී ශිලා ලිපිවල වැඩිදුරටත් ඇතුළත් ය. මේ සුවිශේෂ රන් කහවණුවේ මූල්‍ය අගය, හතරක් නම් එම රන් කහවණුව හැදීමට ගිය වියදම එයින් 1/4 කි. ඒ අනුව මේ රන් කහවණුව සංසරණය වුණු සෑම වාරයක් පාසා ම රාජ්‍ය භාණ්ඩාගාරයට එක් රන් කහවණුවකින් පමණක් ලැබුණු ශුද්ධ ලාභය 3/4 කි. මෙය උදාහරණයකින් පැහැදිලි කරන්නේ නම් මේ රන් කහවණුවේ මූල්‍ය අගය රුපියල් විසිදහසක් නම් එහි නිෂ්පාදිත වියදම රුපියල් පන්දහස (රු. 5000/) කි. ඒ අනුව මේ රන් කහවණුව හුවමාරුවුණු සෑම වාරයක් පාසා ම එක රන් කහවණුවකින් පමණක් රාජ්‍ය භාණ්ඩාගාරයට රුපියල් පසළොස් දහසක (රු. 15000/-) ශුද්ධ ලාභයක් ලැබිණ. වසර දහඅටක් පුරා පැවති ඒ මහ රජුන් ගේ පාලන සමයෙහි මුල් වසර හතරේ දී එකී රන් කහවණුව

හරහා අත්පත් කරගත් යථෝක්ත වෙළෙඳ වාසිය පදනම් කරගනිමින් ඉපැයූ ශුද්ධ ලාභය, රන් කහවණු මිලියන හැත්තෑව (70,000,000), වසරකට මිලියන දහය බැගින් වියදම් කොට වසර සතකින් මිහිබට ආලකමන්දාව/සීගිරිය නිර්මාණය කොට අවසන් කළ බව යථෝක්ත ලිපිවල සඳහන් වේ. සීගිරි නිර්මාණයේ එවක ඇස්තමේන්තු වියදම රන් කහවනු මිලියන හැත්තෑවකි. සීගිරි කාශ්‍යප මහ රජුන් ගේ පාලන සමයෙහි එකී ආකර්ෂණීය වාණිජ ප්‍රතිපත්තිය - ආර්ථික ක්‍රියාදාමය - පදනම් කොට ගෙන විස්මයාවහ නවෝදයක් ශ්‍රී ලංකා ද්වීපයට උරුම වූයේ ය. එය අද තෙක් අඛණ්ඩ ව පැවතියේ නම් අප ගේ මාතෘභූමිය මේ මිහිතලයේ පවතින සමෘද්ධිමත් සුවිශේෂ දේශය වනු නිසැක ය. ඊර්ෂ්‍යාකාර කුහක ඇතැම් ජාත්‍යන්තර කුමන්ත්‍රණකාරීන්, එවැනි ම වූ දේශීය මන්දබුද්ධික කුමන්ත්‍රණකාරීන්ගේ උදව් ලැබ යුද්ධයෙන් අපරාජිත වූ සීගිරි කාශ්‍යප මහ රජුන් උපක්‍රමශීලී ව වස දී ඝාතනය කොට එතුමන් ස්ථාපිත කළ යථෝක්ත වාණිජ ප්‍රතිපත්තියත් යථෝක්ත රන් කහවණුව සහිත ව ලක්දිව ලබා තිබූ කුවේරත්වයත් වනසා දැමූ බව අන්තරාලීන ශිලාලිපිවල විස්තරාත්මක ව දක්වෙයි. එකී ශිලා ලිපි අනුව සීගිරි කාශ්‍යප මහ රජ, තම පියා - ධාතුසේන මහ රජුන් - ඝාතනය නො කළේය. යුද්ධයෙන් දිනිය නො හැකි වූ සිය වැඩිමහල් පුතුනට - කාශ්‍යප මහ රජුන්ට - මුහුණ දිය නොහී ධාතුසේන මහ රජු හලාවත දී හුදෙකලා ව තම තාවකාලික කුටිය තුළ දී සිය අසිපතින් ගෙල සිඳ ගෙන ජීවිතය හානිකොට ගත් පුවත ද එකී සෙල්ලිපිවල දක්වෙයි. ධාතුසේන මහ රජුන් ගේ මරණය, කාශ්‍යප මහ රජුන් වෙත උපක්‍රමික ව පවරා එතුමන් පිතෘ ඝාතකයකු බවට ප්‍රසිද්ධ කොට ඔහු ගේ චරිත ඝාතනය සිදු කළහ යි සිතීමට අවකාශ ඇත. සීගිරිය වැනි සුවිශේෂ සියුම් කලාත්මක වාස්තුවිද්‍යා නිර්මාණයක් ලොව අටවෙනි පුදුමය ලෙස ලොවට දායාද කළා වූ සුසංවේදී ප්‍රතිභා සම්පන්න කලාකරුවකු වූ සීගිරි කාශ්‍යප මහ රජුන්, පාලන බලයක් නැති, වයස්ගත අසරණ සිය පියා ඝාතනය කරති යි සිතා ගැන්ම පවා අසීරු ය.

සීගිරි කාශ්‍යප මහ රජුන් විසින් කුවේරත්වය ආරෝපණය කොට ගනිමින් නිකුත් කළ, අප ගේ මාතෘ භූමියට භෞතික සමෘද්ධිය කැඳ වූ ඒ අසිරිමත් රන් කහවණුව සොයා මා විසින් වසර ගණනක් පුරා සිදු කරගෙන ගිය ගවේෂණයේ ප්‍රතිඵල අනුව එම රන් කහවණුව ලෙස මට පෙනුණු, එහි විශාලනය කරන ලද ආකෘතිය මේ වැදගත් මොහොතේ ඔබට හඳුන්වා දීමට කැමැත්තෙමි. මගේ විශ්වාසය පරිදි අනුරාධපුර මඟුල් උයනේ තිසා වැවට මුහුණ දී සිටිනා ඉරියව්වෙන් එහි ගල් කුලක කොටා ඇති විවිධ ලකුණින් සමන්විත වූ, අඩි හයක (06) විෂ්කම්භය සහිත කවාකාර හැඩයෙන් යුත් කැටයම එකී රන් කහවණුව නියෝජනය කරයි. එහි අද විද්‍යමාන වන්නේ රේඛා කරණයෙන් ගලේ කෙටූ එකී රන් කහවණුවේ පාදමේ නෂ්ටාවශේෂයකි. සූර්ය තාපයෙන් ද වර්ෂාවෙන් ද අභිභූත ව විනාශභාග් ව පවත්නා එහි අවශේෂ ව ඇති රේඛා ද නිර්මාණ ලක්ෂණයෙන් අනූන ය. එකී ශිලා රේඛා මත, එම රන් කහවණුව අදාළ විවිධ ද්‍රව්‍ය උපයෝගී කර ගනිමින් ජීවමාන ආකාරයෙන් එදා නිර්මාණය කරන්නට ඇත. ගල් කුළුවල කුහර සාදා එම ගල් කුළුත් කුහරත් පදනම් කොට ගෙන එහි මත විවිධ වූ වාස්තුවිද්‍යාත්මක නිර්මාණ බිහි කිරීම සීගිරියේ දක්නට ලැබෙන සම්ප්‍රදාය යි. සීගිරියේ ගල් කුළුවල දක්නට ලැබෙන විවිධ රටා අනුව හාරා ඇති කුහර පේළි, එහි ගිය ඔබේ අත්දකීමට නිසැක ව ම හසු විය යුතු ය. එකී වාස්තුවිද්‍යා නිර්මාණ, කාලයා ගේ ඇවෑමෙන් නෂ්ටාවශේෂ භාවයට පත් ව ඒවායෙහි අන්තිම ගඩොළු පෙළත් බදාමත් ගැළවී ගිය පසු ගලේ ඉතිරි වූ කුහරයි මේ. මෙවන් ගල් කුහර අනුරාධපුර මඟුල් උයනේ ද දක්නට ලැබීම සීගිරියේත් මඟුල් උයනේත් එකිනෙක අතරත සුවිශේෂ සම්බන්ධයක් පවතින බවට කදිම සාධකයකි. එකී මඟුල් උයනේ දක්නා පොකුණු, ඇළ මාර්ග, හා සෙසු වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ සීගිරියෙහි ද දැකිය හැකිවීම සුවිශේෂ ය.

මඟුල් උයනේ දක්නට ලැබෙන ඉහත කී කවාකාර ගල් කැටයම බෙල් මහතා ගේ නිරීක්ෂණයට අනුව සක්වළ චක්‍රය වේ. මාර්ටින් වික්‍රමසිංහ මහතා ගේ පරිකල්පනය පරිදි තාන්ත්‍රිකයන් ගේ මදන පූජාව පිළිබඳ ගුප්ත සලකුණකි. මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ මහතා ගේ විශ්වාසයට අනුව යෝගාවචරයන් ගේ භාවනා කමටහනකි. කොළඹ කටුගෙයි සේවයේ නියුක්ත ව සිටි ඩබ්ලිව්.ඒ. සිල්වා සූරීන් ගේ නිරීක්ෂණය පරිදි කුවේර ගේ නව නිධිය නියෝජනය කරන්නක් හෝ කුවේර ගේ සුවිශේෂ ස්වාමීත්වය විදහා දක්වන්නක් හෝ වෙයි. මේ මත අතරින සිල්වා සූරීන් ගේ මතයට කිසියම් දුරකට මම ද එකඟ වෙමි. එහෙත් ඒ සම්පූර්ණයෙන් නො වේ. පෙර මෙහි සඳහන් කළා මෙන් සීගිරි කාශ්‍යප මහ රජුන් නිකුත් කළ රන් කහවණුවේ ආකෘතිය ලෙස මෙය මම සලකමි. එකී රන් කහවණුවේ කුවේර ගේ නව නිධියත් ධනපති - ධනද කුවේර ගේ සුවිශේෂ ස්වාමීත්වයත් නිරූපණය වීම අපේක්ෂා කළ යුත්තක් ම වන්නේ ය. එයින් තොර ව, කුවේරත්වය ආරෝපණය කොට ගත් සීගිරි කාශ්‍යප මහ රජුන් ගේ රන් කහවණුව ප්‍රභවය නොවන බැවිනි.

කුවේර ගේ නව නිධිය අමරකෝෂයෙහි මෙසේ දක්වේ.

මහාපද්මශ්ච පද්මශ්ච - ශංඛිමකරච්ඡපෞ
මුකුන්දකුන්දනීලාශ්ච - ඛර්වශ්ච නිධයෝ නව

එනම්, (1) මහා පද්ම (2) පද්ම (3) ශංඛ (4) මකර (5) කච්ජප (6) මුකුන්ද (බෙරය - සංගීත) (7) සර්ප (8) නිලා, නිල් දලු (9) වාමන යන නවය යි.

යථෝක්ත කවාකාර කැටයමේ මැද වූ, කව සතකින් පරික්ෂිප්ත තිත, කෙමිය සහිත සප්ත භූමක (1) මහා පද්ම නිධිය ද එම මහා පද්ම නිධියෙහි වාම පාර්ශවයේ උඩ කෙළවරේ කව සතරකින් පරික්ෂිප්ත තිත, කෙමිය සහිත (2) පද්ම නිධිය ද එම කවයේ බාහිර වටයේ ශංඛ ද්වයය (3) ශංඛ නිධිය ද එකී බාහිර වටයේ ඇති මෝරා (මකර > මුවර > මෝරා) (4) මකර නිධිය ද එම වටයේ ම පෙනෙන කැස්බෑවන් දෙදෙනා (5) කච්ජප නිධිය ද යථෝක්ත පද්ම නිධියට අධෝභාගයෙහි ත්‍රිපාද ස්වරූපයෙන් යුක්ත චතුරස්‍රය (6) මුකුන්ද (බෙරය - සංගීත) නිධිය ද එකී බාහිර වටයේ පෙනෙන විදුලි ආඳා (7) සර්ප නිධිය ද ත්‍රිපාද ස්වරූප ඇති මුකුන්ද - සංගීත - නිධියට මතු පිටින් දිග හැරී ඡත්‍ර දෙකක ස්වරූපයෙන් පෙනෙන සංකේත ද්වියය (8) නීලඃ එනම් නිල් දලු නිධිය ද බාහිර වටයේ පෙනෙන දක්ෂිණ පාර්ශවයට ශීර්ෂය බර කළ ක්‍රීඩාපරවශ ස්වරූපයෙන් යුත් මුහුදු සිංහයා වාමනාකාර ව බැවින් (9) වාමන නිධිය ද නියෝජනය කරති යි සිතමි.

තව ද රවුම් සතකින් පරික්ෂිප්ත ව මැද තිතක් සහිත ව සංකේතයෙන් යළි, සප්ත කූට පර්වත වළල්ලෙන් වට ව මහා මේරුව නිරූපිත බවත් එයින් සීගිරි කාශ්‍යප මහ රජුන් ආර්ථිකය පාලනය කළ පර්වත රාජ්‍යත්වය සාම්ප්‍රදායික ලකුණින් නිරූපිත බවත් පෙනේ. කවයේ වාම දක්ෂිණ පාර්ශ්ව ද්වයයෙහි දෙ කෙළවරේ පෙනෙන සංකේත ද්වයයෙන් චන්ද සූර්ය දෙ දෙනා නිරූපිත බවත් එයින් කාශ්‍යප මහ රජුන් ගේ කුවේරත්වය මිහිමත සියලු දේශයන් වෙත විහිදී පැතිර පවත්නා බවත් ප්‍රකට කරන බව සිතේ. සඳ හිරුට දෙ පැත්තෙන් පෙනෙන, හින්දු භක්තික ජාත්‍යන්තර වාණිජ ප්‍රජාව ගේ ගෞරවයට හා බහුමානයට පාත්‍ර වූ ලිංගික යෝනි සංකේතයෙන් ප්‍රජනන ශක්තිය නිරූපිත අතරත, එය, ස්ත්‍රී පුරුෂ සංසර්ගය වර්ෂණය සේ ද එම වර්ෂණයෙන් මිහිකතගේ ගැබෙහි බීජ ප්‍රරෝහණය සිදු වීමෙන් කෘෂිකර්මයේ අභිවෘද්ධිය ද සංකේතානුසාරයෙන් හඟවන බව පෙනේ. ස්ත්‍රී පුරුෂ සංසර්ගය, අන්තරාලීන ශිලා ලිපිවල එසේ අර්ථ ගන්වා ඇත. එයින් අභිප්‍රේත අර්ථය නම් ජලය මහීකාන්තාවට නිසි ඍතුවට ලබා දී මහීකාන්තාව සතු බීජ - කෘෂිකර්මය අභිවර්ධනය කිරීම වේ.

මේ කවයෙහි මධ්‍යය වටා ආයත චතුරස්‍රාකාර එලක විස්සක් ද ඒ එලක විස්ස මත එකක් සතරට බෙදූ රවුම් විස්සක් ද එසේ ම කවයේ බාහිර වට රවුමේ ක්‍රීඩා පරවශ ව වේගයෙන් පීනන කරදිය මත්ස්‍යයෝ විස්සක් ද නිරූපිතය හ. මෙයින් කිසියම් දුරකට සමාන අරමුණක් ත්‍රිවිධාකාර ස්වරූපයෙන් සන්නිවේදනය කෙරෙන බව මගේ විශ්වාසය යි. මේ සංකේත අරුත් ගන්වා ගැනීමට යථෝක්ත රන් කහවණුවේ අගය පිළිබඳ ව අන්තරාලීන ශිලා ලිපිවල ඇතුළත් කරුණු මේ හා සැසඳීම ප්‍රයෝජනවත් වේ. එහි සඳහන් පරිදි එක් රන් කහවණුවේ අගය රිදී කහවණු විස්සක් හෝ අක නමින් යුත් කහවණු විස්සක් - ''රජතකර්ෂාපණානාම් විංශතිර් වා අකනාමකර්ෂාපණද්වයමුලස්‍ය විංශතිර් වා'' හෝ වේ. පැරණි කල කහවණුව ස්වරූප දෙකකින් තිබූ බව ක්‍රි.ව. 05 ශතකයේ බුද්ධඝෝෂ තෙරුන් ලියූ විසුද්ධිමග්ගයෙහි සඳහන් ය. එනම් ආයතචතුරස්‍රාකාර ස්වරූපයෙන් යුතු කහවණුව හා පරමණ්ඩල රවුම් ස්වරූපයෙන් - යුතු කහවණුව යනුවෙනි. විසුද්ධිමග්ගයෙහි දිස්වන වාක්‍යය යි මේ.

''අජාතබුද්ධිදාරකෝ කහාපණං චිත්තවිචිත්ත දීඝචතුරස්සපරිමණ්ඩලභාවමත්තමේව ජානාති'', ලෝක ව්‍යවහාරය පිළිබඳ දැනුමක් නැති දරුවා කහවණු බඳුනක් දැක එය සිත් අදනාසුලු ලකුණින් යුත් දිගෙන් වැඩි චතුරස්‍ර - ආයතචතුරස්‍ර - හෝ වට රවුම් හෝ ලෙස හඳුනා ගනී යනු එහි සිංහල අනුවාදය යි. බුද්ධඝෝෂ තෙරුන්ගේ කාලය ද සීගිරි කාශ්‍යප මහ රජුන්ගේ කාලය ද ක්‍රි.ව. 05 ශතකය වේ. එහෙයින් යථෝක්ත කවාකාර කැටයමේ දිස් වූ ආයත චතුරස්‍රාකාර එලක විස්ස, ආයත චතුරස්‍රාකාර වූ රිදී කහවණු විස්සක අගය - එකී රන් කහවණුව - සතු බව සන්නිවේදනය කරයි. යථෝක්ත එලක විස්ස මත එක් එක් එලකයක මතුයෙහි එකක් සතරට බෙදූ, මධ්‍යම ප්‍රමාණයේ රවුම් විස්සකි. මෙහි අරමුණ කුමක් දැ යි සෙවීමට ඉපැරණි කහවණුවේ සංයුතිය කෙසේ පැවතියේ දැ යි සලකා බැලිය යුතු වේ. ඓතිහාසික මූලාශ්‍රය අනුව කහවණුව මාසක විස්සකි. මාසක පහකි පාදයකට. පාද හතරකි කහවණුවට. මාසකය, කාකනී හතරක ඒකකයකි. ''මාසො විංශතිභාගඃ තු ඥේයං කර්ෂාපණසකාකනී තු චතුරෝ භාගො මාසස්‍ය ච පණස්‍ය ච'' - යථෝක්ත එල විස්සක් වීමේත් එකී එලක මතුයෙහි වූ රවුම් විස්ස යළි එක් එක් රවුමක් සතරකට බෙදා දැක්වීමේත් හේතු මෙයින් තේරුම් ගත හැකි ය. සීගිරි කාශ්‍යප මහ රජුන් නිකුත් කළ එකී රන් කහවණුවේ මූල්‍ය අගය ඉතාමත් නිවැරදි ආකාරයෙන් එහි දිස්වෙන බව මෙයින් පැහැදිලි වෙයි.

තව ද එකී කවාකාර කැටයමේ බාහිර වටයෙහි මිරිදිය මසුන් බැහැර කොට, මූදු ඌරා, දාර කැස්බෑවා, මුහුදු අශ්වයා, උදලු මෝරා, දක්ෂිණාවර්ත හක් බෙල්ලා, මෝරා, මාගුරුවා, තල්මසා, මුහුදු සිංහයා, විදුලි ආඳා, කකුළුවා, මඩුවා, ලෙලි කැස්බෑවා, තලපතා, ඩොල්ෆින් ආදි කරදිය සුවිශේෂ මසුන් විස්සක් පමණ යොදා ගැනුණේ තවත් ප්‍රබල හේතුවක් නිසා ය. එනම්, මේ රන් කහවණුවේ විශේෂයෙන් මාර්ග ඔස්සේ විවිධ දේශයන් ගෙන් ලක්දිවට පැමිණුණු විදේශීය නාවික වෙළෙඳුන් සමඟ කෙරෙන ගනුදෙනුවල දී යොදා ගැනුණු හෙයින් එකී වෙළෙඳුන් ගේ සුපුරුදු මුහුදු ජීවිතයේ දී ඔවුන් ගේ සුවිශේෂ ආකර්ෂණයට ලක් වූ ස්වාභාවික වරණයෙන් රිදී පැහැගත් යථෝක්ත විසි කරදිය මත්ස්‍යයන් ගෙන් මේ රන් කහවණුවේ මූල්‍ය අගය රිදී කහවණු විස්සකින් සමන්විත වන බව ඔවුනට පහසුවෙන් සන්නිවේදනය වීමට සැලැස්වීම මෙහි අරමුණ වූ බව නිසැක ය. මෙ මඟින් ඇතැම් විටෙක අකුරු නොදත් නාවික වෙළෙඳුනට මේ රන් කහවණුවේ නිවැරදි අගය ඉතා පහසුවෙන් වටහා ගැනීමට හැකි වන්නට ඇත. තව ද සත් කුළ පවු සපිරිවර කොට ඇති මහා මේරුවේ බාහිර රවුම වටා වූ සප්ත සීදන්ත මහා සාගරයේ දක්ෂිණාවර්ත ව වේගයෙන් පීනා යන සේ නිරූපිත මේ විසි මත්ස්‍යයෝ, පර්වත රාජ - කුවේර සංඛ්‍යාත සීගිරි කාශ්‍යප මහ රජුන් ප්‍රදක්ෂිණා කරත්. ඒ අසහාය රාජ රාජ මහා රාජයාගේ ගෞරවාදරයට පත් වූ ධන කුවේරත්වය එයින් මැනවින් සන්නිවේදනය කොට ඇත.

කවාකාර වූ මේ රන් කහවණුවේ මූණත පැත්ත මේ ආකාරයෙන් නිරූපිත නමුදු එම රන් කහවණු අනිත් පැත්තට සිදු වූයේ කුමක් දැයි පිරික්සිය යුතු වේ. යථෝක්ත කැටයම, කටාරමකින් ආරක්ෂිතය. එයට හේතුව නම් වැසි දිය එකී නිර්මාණයට ළඟා වීම වළක්වා එය ආරක්ෂා වීමට සැලැස්වීමයි. එහෙයින් මේ කැටයම් ගල් ලෙනක පවතින්නට ඇති බව උපකල්පනය කළ හැකි ය. තව ද මේ කැටයම් අබියස කිසියම් පරතරයක් සහිත ව නටබුන් ආසනයක් වෙයි. එකී අසුන මත, යථෝක්ත රන් කහවණුවේ අනිත් පැත්ත ගඩොළු ආදී ද්‍රව්‍යයකින් නිම කොට තිබෙන්නට ඇත. එසේ නොවේ නම් මේ කාවාකාර කැටයම ඇති ගල් කුළ ම, එකී කහවණුවේ පැවති සීගිරි කාශ්‍යපයන්ගේ පර්වත රාජ්‍යත්ව සංඛ්‍යාත කුවේරත්වය ප්‍රකට කරන්නට ඇත.

යථෝක්ත රන් කහවණුව සීගිරියේ මෙ පරිදි නිර්මාණය නො කොට (එහි මූල්‍ය අගය වෙන ආකාරයකින් සීගිරියේ නිර්මිත බවට දක්නා සාධක පසුව දැක්වේ.) එය නිර්මාණය කිරීම අනුරාධපුරයේ තිසා වැව අසල වූ මඟුල් උයනේ ගල් කුළක් මේ සඳහා තෝරා ගනු ලැබූ සුවිශේෂ හේතුව කුමක් දැ යි විමසා බැලීම වටනේ ය. ක්‍රි.පූ. සිවුවන ශතකයෙහි පණ්ඩුකාභය රජු ලක්දිව එක් සේසත් කොට තම රාජ්‍යාභිෂේකය පිණිස ජලය ලබාගත්තේ ජයවාපී - එනම් තිසා වැවෙනි. ධාතුසේන රජු විසින් කලා වැවේ සිට තිසා වැවට ජලය ගෙන ගිය ඇළ - යෝධ ඇළ - නම් කොට ඇත්තේ ද ජය ගංගා යන නමිනි.

තිසා වැවට - ජය නම් වූ වාපියට - දියවර සැපයූ ඒ ඇළට ද මෙසේ ජය නාමය ම ලැබිණ. ජය ජයග්‍රහණ - දිග් විජය එයින් ප්‍රකට කෙරේ. ක්‍රි.පූ. දෙවන ශතකයේ දී ලක්දිව එක්සේසත් කිරීමෙන් පසු දුටුගැමුණු මහ රජු ද දිය කෙළිය පැවැත්වූයේ මේ තිසා වැවේ දී ය. ජල ක්‍රීඩාවට පෙර, එ රජු තිසා වැව අසල තැන්පත් කළ ජය කොන්තය යළි උගුළුවා ගත නොහී එකී ජය කොන්තය මැදි කොට මිරිස වැටි ථූපය බැඳි බව ඓතිහාසික මූලාශ්‍රයවල සඳහන් ය. තිසා වැවට සමාසන්න ව මිරිස වැටි දාගැබ අදත් විද්‍යමාන වෙයි.

යථෝක්ත මූලාශ්‍රයවල සඳහන් ආකාරයට විහාර මහා දේවීය ගේ කුසෙහි දුටුගැමුණු කුමරා පිළිසිඳ ගත් පසු ඒ දේවියට ඇති වූ දොළ දුකෙන් - එනම්, අනුරාධපුර එළාර රජු ගේ සෙන්පතියා ගේ ගෙල සිඳ අසිපත, අනුරාධපුර තිසා වැවෙන් ගෙනා දියෙන් සෝදා එකී දිය පානය කිරීමටත් එකී ගෙල සිය දෙ පයින් මැඩ ගෙන සිටිමින් ඉතිරි වූ, එකී තිසා වැව් දියෙන් ස්නානය කිරීමටත් උපන් තදබල ආසාවෙන් - ප්‍රකට වන්නේ ද ඒ දේවිය, තම කුස ඔත් දරුවා අනාගතයේ දී අනුරාධපුර එළාර රජු යුද්ධයෙන් දිනා, මුළු රට එක්සේසත් නංවා තිසා වැවේ ජල ක්‍රීඩා - ජල ක්‍රීඩා - ජය ක්‍රීඩා - කරන මොහොත ප්‍රාර්ථනා කරමින් සිටි බව ය. කාවන්තිස්ස රජු ගේ මෙහෙය වීමෙන් වේළුසුමන යෝධයා ඒ දේවිය ගේ දොළ දුක සන්තර්පණය කිරීමට අවශ්‍ය, ඇය ඉල්ලූ සියලු දේ අනුරාධපුරයෙන් රැගෙන වහා රුහුණට ගිය බවත් එයින් ඇය ගේ දොළ දුක සන්සිඳුණ බවත් එකී ඓතිහාසික මූලාශ්‍රයවල විස්තරාත්මක ව සඳහන් ය. එකක් පසු පස තවෙකක් දිව යන මේ ඓතිහාසික සිද්ධීන් ගෙන් හෙළි පෙහෙළි වන්නේ පුරාණ ලක්දිව මහ රජුන් ගේ සුවිශේෂ ජයග්‍රහණ කෙළවර වන්නේ තිසා වැවේ ජලයෙන් අභිෂේක කිරීමෙන් හෝ එහි ජල/ජය ක්‍රීඩාවෙන් හෝ පසු බව ය. අනුරාධපුරයේ ඇති සිය ගණනක් වූ වැව්වලින් මෙ පරිදි තිසා වැව, ලක්දිව මහ රජුන් ගේ සුවිශේෂ ජයග්‍රහණ සැමරූ පරිශුද්ධ, ගෞරවාර්හ ජන නිධිය බව නිසැක ය. සීගිරි කාශ්‍යප මහ රජු ද තමනට කුවේරත්වය ආරෝපණය කොට ගෙන එයින් තමන් අත්පත් කොට ගත් දේශ දේශාන්තරයෙහි ආර්ථිකයේ සිය අණසක පතුරුවා ලූ මේ රන් කහවණුව නිකුත් කිරීමේ විජයග්‍රාහී මොහොත, තිසා වැවට මුහුණ දී සිටිනා ඉරියව්වෙන් එකී රන් කහවණුව එහි ගල් කුලක නිර්මාණය කොට ලක්දිව මහ රජුන්ගේ ඓතිහාසික සම්ප්‍රදාය තමන් විසින් ද සලකුණු කළ බව නිසැක ය.

පැරණි ලක්දිව මහ රජුන් ගේ උයන - මඟුල් උයන - මේ ලෙසින් තිසා වැව ඇසුරු කොට පිහිටුවන්නට ඇත්තේ ද තිසා වැවේ වූ මේ සුවිශේෂ ගෞරවාර්හ භාවය හේතුකොට ගෙන බව පැහැදිලි ය. මේ මඟුල් උයන එ නමින් මතු නොව තව ද සුවිශේෂ අභිධානයකින් එනම් 'රන් මසු උයන' නමින් ද සිවුවන මිහිඳු මහ රජුගේ (ක්‍රි.ව. 956-972) වෙස්සගිරි පුවරු ලිපියෙහි ද දොළොස්වන ශතකයේ රචිත බෝධිවංශග්‍රන්ථිපදයෙහි ද හඳුන්වා තිබීමේ හේතුව මතු කොට ගැනීම මෙහි දී ප්‍රයෝජනවත් ය. පැරණි සිංහල සම්භාව්‍ය සාහිත්‍ය මූලාශ්‍රයන්හි රන් මසු යනු රන් කහවණු යන අරුත්හි යෙදී ඇත. ඒ අනුව 'රන් මසු උයන' යනු ස්වර්ණ මත්ස්‍ය උද්‍යානය ලෙසින් පමණක් නොව ස්වර්ණ මාසක උද්‍යානය/ස්වර්කර්ෂාපණ උද්‍යානය යනුවෙන් ද අරුත් නැගිය හැක්කකි. ''පඤ්චකහාපණසතසහස්සානි, ලක්ෂයක් මසුරන්'' යනුවෙන් දොළොස්වෙනි සියවසෙහි රචිත ජාතක අටුවා ගැට පදයෙහි ද සඳහන්ය. එහි මසුරන් යනු රන් මසු යන්නේ පද පෙරළියෙන් නිපන් (රන්මසු > මසුරන්) ව්‍යවහාරයකි. යථොක්ත සුවිශේෂ රන් කහවණුව, රන් මස්ස, රන් මසු (මසුරන්) ස්ථාපනය කළ ඉපැරණි මඟුල් උයන එකී ස්වර්කර්ෂාපණ මූල්‍ය ඒකකයේ නමින් යළි රන්මසු උයන අභිධානයෙන් වෙසෙසා හැඳින් වූ බව පැහැදිලිය. සීගිරි කාශ්‍යප මහ රජු එ පරිදි නව නාම ව්‍යවහාරයන් ගෙන් සුවිශේෂ ස්ථාන යළි නම් කිරීම මහාවංස අන්තරාලීන ශිලා ලිපි, පුවරු ලිපිවලින් ද තහවුරු වෙයි. ඓතිහාසික ඉස්සරසමණ විහාරය (වත්මන වෙස්සගිරිය) පිළිසකර කොට එම විහාරයට ගම්බිම් පිදූ සීගිරි කාශ්‍යප මහ රජු එකී විහාරය එතුමාගේ දියණියන් දෙදෙනා ගේ ද තමන් ගේ ද නම් එක් කොට තබමින් බෝධිඋප්පලවණ්නා කස්සපගිරිවිහාර, බෝධිඋත්පලවර්ණ කාශ්‍යප-ගිරිවිහාර, බෝඋපුල්වන් කසුප්ගිරි වෙහෙර යනුවෙන් යළි නම් කිරීම මේ සඳහා තව ද අභේද්‍යය වූ සාධකයකි.

දනට තහවුරු කොට ඇති රන්මසු උයනේ අනුමානිත මෑත සංස්කරණ කාලය ක්‍රි.ව. හයවන ශතකයට පමණ අයත් සේ සැලකේ. එකී සංස්කරණ කාලය සීගිරි කාශ්‍යප මහ රජුන් ගේ කාලයට එනම් ක්‍රි.ව. පස්වන ශතකයට සමාසන්න ය. ඉහත කී මඟුල් උයන සිය කුවේරත්වය ප්‍රකට කෙරෙන පරිද්දෙන් ප්‍රතිසංස්කරණය/අභිවර්ධනය කොට එහි යථෝක්ත රන් කහවණුවේ විශාලනය කරන ලද ආකෘතිය ස්ථාපනය කොට එහි නමින් 'රන් මසු උයන' යනුවෙන් යළි හැඳින්වූ සේ ගැනීම උචිත සේ පෙනේ. මේ අනුව රන්මසු උයනේ ගල්කුළක නිරූපිත කාවාකාර කැටයම් කාශ්‍යප මහ රජුන් නිකුත් කළ රන් කහවණුවේ ආකෘතිය බව නිගමනය කළ හැකි ය.

තව ද සීගිරි කාශ්‍යප මහ රජුන් තමන් විසින් ලක්දිවට දායාද කළ යථෝක්ත රන් කහවණුවේ මූල්‍ය අගය, වාස්තුවිද්‍යාත්මක වෙනත් කලාත්මක ලක්ෂණ අපූර්වාකාරයෙන් ඇසුරු කොට ගනිමින් සීගිරියේ ද නිර්මිත බවට සාධක දක්නට ලැබේ. සීගිරියේ බටහිර ද්වාරයෙන් ප්‍රවේශ ව දිය අඟලින් එත ර වූ තැනේදී, සීගිරි පර්වතයට ඍජු ව දිවෙන මංපෙතෙහි දෙ පාර්ශවයේ නිර්මිත ආයත චතුරස්‍රාකාර ස්වරූපයක් ගත් පරිකල්පිත ජල උද්‍යාන සංකීර්ණයේ අරමුණ ද සංවර්ධිත, යථෝක්ත සුවිශේෂ රන් කහවණුයේ මූල්‍ය අගය වාස්තු විද්‍යා ස්වරූපයෙන් කලාත්මක ව සන්නිවේදනය කිරීම බව පෙනේ. මේ ජල උද්‍යාන සංකීර්ණය ආයත චතුරස්‍රයකි. ආයත චතුරස්‍රාකාරය ලක්දිව ප්‍රචලිත කහවණු වර්ග දෙකකින් එක් කහවණු වර්ගයක ස්වරූපය බව මෙහි පෙර සඳහන් විය. ඓතිහාසික මේ මූල්‍ය ඒකකයේ ආයත චතුරස්‍රාකාර හැඩය වර්තමානයේ පවා ලොව පුරා සංසරණය වන මුදල් නෝට්ටුවලට ද පිවිසී තිබීම විස්මයජනක ය. මෙහි ප්‍රභවය සෙවීම තව ද පර්යේෂණයකට අවතීර්ණ වීමකි. අති පෞරාණික ඉන්දුනිම්න, ඊජිප්තු, හොවැංහෝ සහ දෙගම්මැදි ශිෂ්ටාචාරවල සාමූහික බලපෑමකින් මෙය සිදුවන්නට ඇත.

තව ද ජල උද්‍යානගත ආයත චතුරස්‍රයේ දක්ෂිණ පාර්ශවයේ ඒකක විස්සකි. එයට සමාන්තර ව එහි වාම පාර්ශවයේ ද ඒකක විස්සකි. එහි මාධ්‍යයේ පාදාකාර වූ ඉංග්‍රීසි L අකුරේ ස්වරූපය ගත් සුවිශාල පොකුණු සතරකි. මේ ආකාරයට මේ ජල උද්‍යාන සංකීර්ණයේ මුඛ්‍ය ලක්ෂණ ත්‍රය වන්නේ (1) ආයත චතුරස්‍රාකාර හැඩය (2) විස්සේ ඒකක හා (3) පාද ස්වරූප වූ පොකුණු සතර වේ. මේ ත්‍රිලක්ෂණය ම එනම් (1) ආයත චතුරස්‍රාකාර හැඩය (2) විස්සේ ඒකක (3) පාද සතර, සාම්ප්‍රදායික කහවණුවක ද අංගලක්ෂණ වූ බව මෙහි පෙර දක්විණ. මේ විස්සේ සමුච්චය වූ කලී ඓතිහාසික කහවණුවේ මූල්‍ය අගය වන මාසක විස්ස නියෝජනය කරයි. එහෙත් මෙහි එකී විස්ස වම දකුණ දෙපැත්තේ විස්ස බැගින් දක්වා එය ද්විගුණ (20 + 20 = 40) කොට නිර්මිත ය. ඉන් සන්නිවේදනය කොට ඇත්තේ එතෙක් පැවැති සාම්ප්‍රදායික කහවණුවේ ව්‍යවහාරික මූල්‍ය අගය සීගිරි කාශ්‍යප මහ රජුන් විසින් අලුතෙන් නිකුත් කළ මේ රන් කහවණුවේ දී ද්විගුණත්වයට පත් කළ පුවත විය හැකි ය. යථෝක්ත පාද ස්වරූප වූ පොකුණු සතරෙන් එකී කහවණුව පාද හතරකින් යුක්ත බව අඟව යි. ඓතිහාසික මූලාශ්‍රය පරිදි කහවණුව මාසක විස්සකි. මාසක පහකි පාදයකට, පාද සතරකි කහවණුවකට.

යථෝක්ත නිර්මාණය ජලයෙන් පිරී උද්‍යාන සංකීර්ණයක ස්වරූපය ගැනීම වූ කලී සීගිරි කාශ්‍යප මහ රජු පර්වත රාජත්වයට - මේඝකූට රාජත්වයට - වලාකුළු මහ රජ බවට - එනම් සුදුසු කලට වැසි වැස්සවීමේ බලයට - තමන් පිවිසි බව අවධාරණය කිරීම විය හැකි ය. මෙය මතු නොව සීගිරියේ ඇති සැම වාස්තුවිද්‍යා නිර්මාණයක් ම කුවේරත්වයට අදාළ අංග ලක්ෂණයක් තමන් සතු කොට ගෙන ඇත.

පෙරදිග හා අපරදිග සමුද්‍ර මාර්ග සන්ධියක පිහිටියා වූ ද මුතුපර ද මැණික් ද උපදින්නා වූ, සම්පත් සහිත වූ ස්වාභාවික සෞන්දර්යයෙන් හෙබි මේ අසිරිමත් දිවයින ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානය බවට අනුවර්තනය කොට එහි භාණ්ඩ හුවමාරුවේ දී භාවිත කළ යුතු ජාත්‍යන්තර වාණිජ අගයෙන් පිරිපුන් මුදල් ඒකකයන් නිකුත් කොට එයින් ලැබූ වාසියෙන් ශ්‍රී ලංකාව අභිවර්ධනය කිරීමට සීගිරි කාශ්‍යප මහ රජුන් තැබූ ඒ ආශ්චර්යාවහ දෑවැන්ත පියවර අවංක ව ගැඹුරින් අධ්‍යයනය කොට එකී අභිවෘද්ධිය නවීන යුගයට ගැළපෙන පරිද්දෙන් ස්ථාපනය කර ගත යුතු පිළිවෙළ කුමක් දැයි තම මවු බිමට අවංක ව ආදරය කරන ලාංකික විශ්වවිද්‍යාලයීය විද්වතුන් ගේ සාකච්ඡාවට ලක්විය යුතු මොහොත එළඹ ඇතැයි සිතමි. නිදහස ලබා වසර හැටක් ඉක්ම ගිය ද දශකයෙන් දශකය මේ මාතෘ භූමිය මුහුණපාන ගැටලු අනන්ත ය, සංකීර්ණය. විශ්වවිද්‍යාලයක් යනු රටට අවශ්‍ය අවංක, පිරිපුන් විද්වතුන් බිහි කරන්නා වූ ස්වර්ණ භූමියක් සේ ම දේශය මුහුණ දෙන ගැටලුවලට අර්ථවත් විසඳුම් ලබා දිය හැකි ප්‍රඥා චක්ෂුසයෙන් හෙබි හරවත් අත්දැකීම් බහුල බහුශ්‍රුත ආචාර්යවරුන් නිතර ගැවසෙන ශුද්ධ භූමියක් ද වෙයි. පෙර දවස ලක්දිව පැවති එවැනි අධ්‍යාපන ආයතන වූ මහා විහාරය හා අභයගිරිය වැනි ශුද්ධ භූමිවලින් ඒ යුතුකම මේ මාතෘ භූමියට මැනවින් ඉටුවිණ. එයට අභේද්‍ය වූ එක් උදාහරණයක් නම්, සීගිරි කාශ්‍යප මහ රජුන්, ලංකාව ජාත්‍යන්තර ආකර්ෂණීය වාණිජ මධ්‍යස්ථානය බවට කෙසේ පත් කර ගත හැකි දැ යි විමසූ ප්‍රශ්නයට අභයගිරි විහාරයේ අධිපති සංඝ ස්ථවිරයන් වහන්සේ දුන් පිළිතුර යි.

*''අභයගිරිසංඝස්ථවිරස්තු වාණිජෛර් ඍජුං ආගන්තුං ශක්‍යාන පට්ටනානි නිශ්ශුල්කපට්ටානංවා කාරයිතව්‍යානි ති ච පශ්චිමේ ජම්බුද්වීපේ වාණිජෛර් පශ්චිමපාරෙ කල්‍යාණි පට්ටනං ඍජුං ආගන්තුං ශක්‍යං ඉති ච පූර්ව - ජම්බුද්වීපේ වාණිජෛර් උත්තරපාරෙ හල්ලතීර්ථපට්ටනං ඍජුං ආගන්තුං ශක්‍යං ඉති ච යවද්වීපේ වාණිජෛර් පූර්වපාරේ මෘට්ටිකාකපාටපට්ටනං වා සමන්තපට්ටනං වා ඍජුං ආගන්තුං ශක්‍යං ඉති වාකථයත්.''*

*''මහ රජ, විදේශීය වෙළෙඳුනට සිය රටවල්වල සිට මහ මුහුද ඔස්සේ ලංකාවට ඍජු ව පැමිණිය හැකි වරායවල් රේගු බද්දෙන් නිදහස් කළ යුතු ය. බටහිර ඉන්දියවේ සිට ලංකාවට පැමිණෙන වෙළෙඳුනට ඍජු වරාය නම් කැළණිය (කොළඹ) වේ. නැගෙනහිර ඉන්දියාවේ සිට ලංකාවට පැමිණෙන වෙළඳුන්ට ඍජු වරාය නම් හල්ලතීර්ථ පට්ටන (යාපනේ වල්ලිපුරම්) යයි. යවද්වීපයේ - ජාවා රටේ සිට ලංකාවට පැමිණෙන වෙළෙඳුනට ඍජු වරාය නම් මෘට්ටිකාකපාටපට්ටන - මඩකලපුව - සමන්තුරේ පට්ටන - සමන්තුරේ - වරාය වේ. මේ වරායවල් තුන රේගු බද්දෙන් නිදහස් කිරීමෙන් විදේශීය වෙළෙන්දෝ ලක්දිවට ආකර්ෂණය වෙත්.''*

අභයගිරි සංඝරාජයන් වහන්සේ ගේ සිංහ නාද ස්වරූප වූ මේ පිළිතුරට අනුව සීගිරි කාශ්‍යප මහ රජහු යථෝක්ත වරායවල් තුන රේගු බද්දෙන් නිදහස් කළාහු ය. ලංකාව ඉමහත් ආර්ථික සමෘද්ධියට පත් විය. ඒ ආර්ථික ප්‍රගමනයේ උදාර ලක්ෂණ වූ පරිසර හිතකාමීත්වය, සෞන්දර්යය, ආචාරශීලීත්වය නිරාකූලත්වය, සමබර බව, ඒකාග්‍රතාව, හරවත් බව, ප්‍රෞඪත්වය හා ගාම්භීර්‍යය සීගිරියේ වාස්තුවිද්‍යා නිර්මාණයන් ගෙන් අදත් පිළිබිඹු වෙයි.

අප ගේ මාතෘභූමිය දනට මුහුණ පා ඇති ත්‍රස්ත උපද්‍රවයෙන් නිරවුල් වූ පසු මේ යට ගිය ඉතිහාසය යළි වත්මනට ගැළපෙන ආකාරයට යොදා ගත හැකි උපාය මාර්ග කවරේ ද යි ලක්දිව විශ්වවිද්‍යාලයීය ආචාර්යවරයන් ගේ අවධානයට යොමු වේවා. මේ කුඩා දිවයින වටා ත්‍රිකුණාමලය වැනි ස්වභාවික සුවිශාල වරායවල් ද අලුතෙන් නිමවෙමින් පවත්නා හම්බන්තොට වරාය, නැගෙනහිර ඔලුවිල් වරාය වැනි වරායවල් ද මේ සඳහා උපයෝගී කොට ගත හැකි ස්වර්ණමය නිධාන වේ.

අද දින උපාධි ලැබූ ඔබතුමන් සියලු දෙනා ගේත් ඔබතුමන්ලාට මැනවින් ශිල්ප ශාස්ත්‍ර ප්‍රදානය කළා වූ මේ වේදිකාවේ අසුන් ගෙන සිටින මගේ කල්‍යාණ මිත්‍ර වූ ආචාර්යවරයන් ගේත් අවධානය විශේෂයෙන් මේ වෙනුවෙන් යොමු වේවා යි ප්‍රාර්ථනා කරමින් මේ දේශනය සමාප්ත කිරීමට අවසර පතමි.

ස්තූතියි.

*2008.12.02*

# 33

# “විජ්ජා උප්පතතං සෙට්ඨා”

# විද්‍යාව හෙවත් දැනුම ලොව පහළ වන වස්තු අතුරින් ශ්‍රේෂ්ඨතම වස්තුව වේ

මහාචාර්ය ආනන්ද ගුණසිංහ

අද දින ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි ප්‍රදානෝත්සවයේ දී මෙම විද්වත් පිරිස අමතා දේශනයක් කිරීමට මට ආරාධනය කිරීම ගැන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමන් ඇතුළු විශ්වවිද්‍යාලයේ සියලු බලධාරීන්ට මගේ අවංක ස්තූතිය පුද කිරීමට කැමැත්තෙමි. තවද, මම ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ප්‍රථම ශිෂ්‍යයා වෙමි. ඒ පරම භාග්‍යය ලැබූ මට මෙබඳු උපාධි ප්‍රදානෝත්සවයක දී ප්‍රධාන දේශනය පැවැත්වීමට අවස්ථාවක් ලැබීම ද භාග්‍යයක් කොට සලකමි. මෙම දේශනය සඳහා මා තෝරා ගත්තේ ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ, දැන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආදර්ශ පාඨය වූ ''විජ්ජා උප්පතතං සෙට්ඨා'' යන මාතෘකාව ය. මේ පාඨයේ අර්ථය වන්නේ ''විද්‍යාව හෙවත් දැනුම ලොව පහළ වන වස්තු අතුරින් ශ්‍රේෂ්ඨතම වස්තුව වේ'' යන්න ය. බුදුදහමෙහි දැක්වෙන මෙම අධ්‍යාපන සංකල්පය පෙරදිග අධ්‍යාපනික දාර්ශනිකයන්ගේ ද චිර සම්භාවනාවට පාත්‍ර වූවක් බව ''විද්‍යා දදාති විනයං'' යන්න ඔවුන්ගේ අධ්‍යාපන ක්‍රමයෙහි ප්‍රධාන ම මූලධර්මය වී තිබීමෙන් පැහැදිලි වේ. මෙහි ''විද්‍යා දදාති විනයං'' යන්නෙහි අර්ථය වන්නේ ''ඉගෙනීමෙන් හික්මීම ගෙන දෙයි'' යන්න යි. මෙම මාතෘකාව යටතේ මා කියන්නට අදහස් කරන්නේ විද්‍යාව හෙවත් දැනුමත් විනය හෙවත් හික්මීමත් යන දෙක විශ්වවිද්‍යාලයකින් දෙනු ලබන අධ්‍යාපනයේ පරමාර්ථ අතර තිබිය යුතු විශේෂ පරමාර්ථයක් විය යුතු ය යන්න ය. මෙම කාරණය විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර වශයෙන් ඉගෙනුම ලබන ශිෂ්‍ය ප්‍රජාවට මෙන් ම බාහිර වශයෙන් ඉගෙනුම ලබන ශිෂ්‍ය ප්‍රජාවට ද එක සේ බලපාන ප්‍රධාන සාධකයක් ලෙස මම විශ්වාස කරමි.

විශ්වවිද්‍යාලය යනු, රටේ තිබෙන අධ්‍යාපන ආයතන අතර ඇති උසස් ම අධ්‍යාපන ආයතනය යි, උසස් අධ්‍යාපනය ලැබීමේ වරම් ලැබ දිවයිනේ නන් දෙසින් පැමිණි දක්ෂ ශිෂ්‍ය පිරිසක් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර වශයෙන් ඉගෙනුම ලබති. ඒ හැරුණු කල, තවත් පිරිසක් ආර්ථික හෝ අධ්‍යාපනික සම්පත්වල ඌනතා නිසා හෝ වෙනත් හේතු නිසා හෝ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර ශිෂ්‍යභාවය ලැබීමේ වරප්‍රසාදය අහිමි වී බාහිර වශයෙන් විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය ලබති. රටේ තිබෙන සමාජ ප්‍රශ්න, ආර්ථික ප්‍රශ්න, දේශපාලන ප්‍රශ්න ආදි නානාවිධ ප්‍රශ්නවලට විසඳුම් සෙවීමේ අභියෝගවලට මුහුණ දීමට මෙන් ම රටේ විවිධ ක්ෂේත්‍රයන්හි භාරධූර වගකීම් දැරීමට ප්‍රාගුණ්‍යයක් ඇති පිරිස වන්නේ ද මෙම ශිෂ්‍ය ප්‍රජාව ය. විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනයේ පරමාර්ථය විය යුත්තේ හුදෙක් විෂය මූලික කරුණු ඉගෙනීමට පමණක් සීමා නො කොට ඒ ඉගෙනීමත් ආධ්‍යාත්මික ශික්ෂණයත් එකට එක්ව සිදුවන ආකාරයේ අධ්‍යාපනයක් ඔවුන්ට ලබා දීම ය. හික්මවීම මගින් චරිත හැඩගැස්සවීම අධ්‍යාපනයේ කාර්යයකි. හික්මුණු මිනිස් පරපුරක් බිහි කිරීම එහි ඇති උත්කෘෂ්ට අභිප්‍රාය වේ.

වර්තමාන විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය හා එහි අධ්‍යාපන පරමාර්ථ දෙස බලන විට පෙනීයන එක් වැදගත් කාරණයක් තිබේ. එනම් එම අධ්‍යාපන පරමාර්ථ බොහෝ දුරට සිසුන්ට විද්‍යාත්මක මූලධර්ම ඔස්සේ විද්‍යාව, තාක්ෂණය, සන්නිවේදනය, කළමනාකරණය, ජෛව තාක්ෂණය ආදී විෂයයන් ඉගෙනීමටත් ඒ තුළින් ඔවුන්ට දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය ඇති කර ගැනීමටත් ඉඩකඩ සැලසීම අරමුණු කොට ගෙන  සැකසී තිබෙන බව ය. විද්‍යාත්මක හා තාක්ෂණය අතින් දියුණු වන වර්තමාන ලෝකයට අවශ්‍ය වන්නේ එබඳු උගතුන් බව ඇත්ත ය. එහෙත් ශිෂ්‍ය ප්‍රජාවට දෙනු ලබන ඒ දැනුම, ආකල්ප, කුසලතා ආධ්‍යාත්මික ශික්ෂණය සමග එකට සමව සිදු වේ දැයි යන්න අප විසින් අවංකව ම සිතා බැලිය යුතු ඉතා වැදගත් කාරණයකි.

මගේ හැඟීමේ හැටියට නම් උගත්කමේ උසස් ගුණාංගයක් වන හික්මීම යන ගුණාංගය අද අපේ විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනයෙන් තරමක් දුරට ගිලිහී යමින් පවති. මෙය පොදු සමාජ ආකල්පයකි. හික්මීම සිසුන් තුළ රෝපණය කිරීම විශ්වවිද්‍යාලයකින් දෙනු ලබන අධ්‍යාපනයේ විශේෂ පරමාර්ථයක් නොවන්නේ නම් එම අධ්‍යාපනය සමහර විට අංග සම්පූර්ණ අධ්‍යාපනයක් වේදැයි යන්න ද සැක සහිත ය. එසේ නම් ඒ සඳහා අප විසින් කළ යුතු වන්නේ ඉගෙනීම හා හික්මීම යන අංශ දෙක එකට එක්ව යන අන්දමේ අධ්‍යාපන රටාවක් ඔවුන් වෙත යොමු කිරීම ය. මෙය තරමක් දුරට දුෂ්කර කාර්යයක් විය හැකි ය. එසේ ද වුවත් හික්මීම නම් චරිතාංගය අපේ විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනයෙන් ගිලිහී යාමට තුඩු දී ඇති හේතු සොයා බලා එතැනට පිළියම් යෙදීම විශ්වවිද්‍යාලයේ වගකීමක් ලෙස මම විශ්වාස කරමි. මේ සඳහා කළ යුතු පිළියම කුමක්දැයි සිතන විට මගේ අවධානය යොමු වන්නේ ඉගෙනීම හා හික්මීම මුල්කොට ගත් පෙරදිග අධ්‍යාපන ක්‍රමය කෙරෙහි ය.

පෙරදිග අපි, පෙරදිග අධ්‍යාපනයේ චිරාගතව පැවත ආ අධ්‍යාපන ක්‍රමය අනුව අතීතයේ සිට ම අපේ රටේ අධ්‍යාපන රටාව හැඩගස්සා ගෙන සිටියෙමු. එම අධ්‍යාපන ක්‍රමය තුළින් වර්තමාන විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනයේ ගුණාත්මකභාවයට හා ප්‍රමාණාත්මකභාවයට මහගු ආලෝකයක් ලබාගත හැකි වෙතැයි මම තරයේ ම විශ්වාස කරමි. මම ද පෙරදිග අධ්‍යාපනය ලැබූ අයෙක් වෙමි. එහෙත් මා මේ අදහස ඉදිරිපත් කරන්නේ හුදෙක් ම එම අධ්‍යාපනයෙන් යම් ශික්ෂණයක් සාක්ෂාත් කරගත් කෙනෙක් හැටියට ම නොවේ. සැබවින් ම මා මේ අදහස ඉදිරිපත් කරන්නේ පෙරදිග අධ්‍යාපනයේ අධ්‍යාපන රටාව කාලයේ අන්තරයෙන් සීමා නොවී සර්වකාලීන ව සර්වසාධාරණ ව සාධනීය අධ්‍යාපන පරමාර්ථ එළි දක්වන අධ්‍යාපන ක්‍රමයක් ලෙස මට හැඟෙන හෙයිනි. ඒ නිසා අපේ විශ්වවිද්‍යාලයවල අධ්‍යාපන පරමාර්ථවලට පෙරදිග අධ්‍යාපන සංකල්පවල ඇති උසස් ගුණාංග උකහා ගතහොත් එය අපේ විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනයෙන් ගිලිහී යමින් තිබෙන හික්මීම වැනි ගුණාංග අපේ අධ්‍යාපන පරමාර්ථ අතරට එකතු කර ගැනීමට මහගු පිටිවහලක් වෙති යි මම දැඩිව විශ්වාස කරමි.

පෙරදිග අධ්‍යාපනයේ මූලික ම අධ්‍යාපන ලක්ෂණයක් නම් දැනුම හා හික්මීම යන අංශ දෙකින් එකක් අනෙකින් වෙන් කොට ගත නොහැකි ලෙස එකිනෙකට බද්ධ වී පැවතීම ය. හුදෙක් ඉගෙනීම පමණක් කෙනෙකු සම්භාවනයට පාත්‍ර වීමට සාධකයක් වෙති යි යන අදහස පෙරදිග අධ්‍යාපන දාර්ශනිකයන් විසින් බැහැර කරන ලද්දකි. ඔවුන්ගේ පිළිගැනීම වූයේ ඉගෙනීම හා හික්මීම එකට බද්ධ ව පැවතිය යුතු අංශ දෙකක් විය යුතු බව ය. පෙර උගත්කම මැනීමේ මිනුම්දණ්ඩ වූයේ හික්මීම හා ඒ අනුව හැසිරීම ය. මෙය තරයේ ම ප්‍රකාශ කරන ලද්දේ බුදුන්වහන්සේ විසිනි. ධර්මය බොහෝදුරට උගෙන (බහුම්පි චේ සහිතං භාසමානෝ) ඒ අනුව නො හැසිරෙන තැනැත්තා අනුන්ගේ ගවයන් රකින ගොපල්ලකු වැනි යයි උන්වහන්සේ ධම්මපදයේ දී ප්‍රකාශ කළහ. බුදුරදුන් එසේ ප්‍රකාශ කළේ එබඳු චර්යාමය වෙනසක් ඇතිකර නො ගන්නා තැනැත්තා මිහිරි පස්ගෝරසයට හිමිකම් නොකියන තැනැත්තෙකු වන හෙයිනි. මෙයින් හෙළි වන්නේ උගත්කමට දැනුම පමණක්

තිබීම ප්‍රමාණවත් නොවන බව ය. ඒ දැනුම අනුප්‍රායෝගික වශයෙන් හික්මීම තිබීම ද අත්‍යවශ්‍ය සාධකයක් වන බව ය.

ඉගෙනීම හා හික්මීම යන අංශ දෙක එකට සම ව සිදුවන අයුරු සිතා බැලීමට පළමු ව ඉගෙනීම යනු කුමක්දැයි තේරුම් ගත යුතු ව ඇත. ඉගෙනීම යනු පත පොත කියවීම, ශාස්ත්‍ර ගවේෂණය ආදී ශිල්ප ක්‍රමවලින් දැනුම් සම්භාරයක් ඇතිකර ගැනීම ය. ඉගෙනුම විධිමත් ලෙස ලබාගත හැකි ශිල්ප ක්‍රම හතරක් පිළිබඳ ව බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් වේ. ඒ, ශ්‍රවණය කිරීම (සුණාති), සිතා බැලීම (චින්තේති), ගැටළු විමසීම (පුච්ඡති), ලේඛනගත කිරීම (ලිඛති) යන ක්‍රම හතර ය. මේවා උගත්කම ගෙන දීම අරමුණු කොට ගෙන පෙරදිග අධ්‍යාපනයේ හැඩ ගැසුණු මූලධර්මයන් ය. මෙම මූලධර්ම හා සිය දක්ෂතා අනුව විෂයයක් හෝ විෂයයන් කීපයක් ඉගෙනීමෙන් කෙනෙකුට උගතෙකු වන්නට පුළුවන. එහෙත් ඒ ඉගෙනුම ගුණවත්කමින් පෝෂණය වී නොමැති නම් එය ආත්මාර්ථකාමී වූත්, දයාව, කරුණාව, හා මෛත්‍රිය ආදී උසස් මිනිස් ගුණධර්මයන් විරහිත වූත් එකක් වන්නට පුළුවන. එබඳු උදාර මිනිස් ගුණධර්ම විරහිත වූ උගතාගෙන් මිනිස් සමාජයේ ප්‍රගමනයට පිහිටක් වෙතැයි සිතිය නොහැකි ය. අද උගත් යයි සම්මත සමහර අය සමාජ විරෝධී, විනය විරෝධී, සදාචාර විරෝධී, නානාවිධ විෂමාචාරකම් කරන්නවුන් බවට පත් ව සිටිනු දක්නට ලැබෙන්නේ ඔවුන්ගේ ඒ ඉගෙනුම හික්මීමෙන් ලබා ගත යුතු වූ දයාව, කරුණාව හා පරාර්ථකාමීත්වය ආදී උසස් මිනිස් ගුණාංගවලින් පෝෂණය වී නොමැති නිසා ය. හික්මීමක් නොමැති උගතුන් නිසා වර්තමාන ලෝකයෙහි මනුෂ්‍ය ප්‍රජාවට එරෙහි ව සිදුවෙමින් පවතින ව්‍යසනකාරී ක්‍රියාවන් දෙස බලන කෙනෙකුට මේ කාරණය මනාව පැහැදිලි වේ. මේ නිසා මිනිස් සමාජයට හිතකර වන උගතෙකු වීමට නම් සැබවින් ම ඒ උගත්කම ආධ්‍යාත්මික ශික්ෂණය තුළින් ලබන කායික, වාචසික, මානසික සංවරයෙනුත් දයාව, කරුණාව ආදී ගුණාංගවලිනුත් සංවර්ධනය වූවක් විය යුතුය.

මෙහිදී ආධ්‍යාත්මික ශික්ෂණය යනු කුමක් ද? එම ශික්ෂණය ඉගෙනීමේ ක්‍රියාවලිය සමඟ එකට සිදුවන්නේ කෙසේද යන කාරණා තේරුම් ගත යුතු වේ. ආධ්‍යාත්මික ශික්ෂණය යනු මනුෂ්‍ය චිත්ත සන්තානයෙහි පහළ වන්නා වූ ආවේගාත්මක හැඟීම් පාලනය කර ගැනීමේ හැකියාව ය. මේ වූකලී ආකස්මික බලවේගයක බලපෑමක් නිසා හට ගන්නා වූ තත්ත්වයක් නොවේ. මේ වනාහී අභ්‍යන්තරික පෙළඹවීම් නිසා ඉගෙනීමට සාපේක්ෂක ව මිනිස් මනසෙහි පහළ වන්නා වූ සුවිශේෂී තත්ත්වයකි. මේ සුවිශේෂි තත්ත්වය ඉගෙනීම හා එක්ව නිසර්ගව මෙන් ම ස්වයං ක්‍රියාකාරී ව සිද්ධ වන්නක් මිස කවර හෝ ප්‍රේරණයක් නිසා ඇතිවන තත්ත්වයක් නොවේ. විද්‍යාව හෙවත් ඉගෙනීම පදනම් කොට ගෙන විනය හෙවත් හික්මීම ස්වයං ක්‍රියාකාරීව සිද්ධ වන්නක් බව පෙරදිග අධ්‍යාපන සම්ප්‍රදායෙහි පිළිගැනීම වේ. ''විද්‍යා දදාති විනයං'' යනුවෙන් පෙරදිග සාහිත්‍යයෙහි උපදේශාත්මක කෘතියක් වන 'හිතෝපදේශ' නම් කාව්‍යයෙහි අවධාරණය කෙරෙන්නේ ඒ පිළිගැනීම නිසා ය. මෙසේ ආධ්‍යාත්මික ශික්ෂණය තුළින් කායික, වාචසික හා මානසික සංවරයට පත්කරවනු ලැබූ උගතකු තුළ තිබිය යුතු චරිතාංග දහයක් ''ප්‍රත්‍යශතක'' නම් සංස්කෘත ග්‍රන්ථයෙහි පළමුවැනි ශ්ලෝකයෙහි මෙසේ දක්වා තිබේ.

*අක්‍රෝධමාරෝග්‍ය ජිතේන්ද්‍රියත්වම් -දයා ක්ෂමා සර්ව ජනප්‍රියත්වම්*
*නිර්ලෝභි දාතා භයශෝකමුක්තිර් - ඥානප්‍රභේදා දශලක්ෂණානි*

මේ ශ්ලෝකයෙන් ප්‍රකාශ වන්නේ *ක්‍රෝධ නැතිබව, නීරෝග බව, දයාවන්ත බව, ඉවසීම, සියල්ලන්ට ප්‍රිය වීම, ලෝභ නැති බව, ත්‍යාගශීලි බව, දිනන ලද ඉඳුරන් ඇති බව, භය නැති බව, ශෝක නැති බව යන මේ ගුණාංග දහය සැබෑ උගතකුගේ චරිත ලක්ෂණ විය යුතු බව ය. මේ ගුණාංග දහය අතුරින් ක්‍රෝධ නැති බව, දයාවන්ත බව, ඉවසීම යන ගුණාංග තුනෙන් තමාගේ*

*චිත්තාභ්‍යන්තරයෙහි පහළ වන්නා වූ ආවේගාත්මක හැඟීම් පාලනය කර ගැනීමේ හැකියාව ද නීරෝග බව යන ගුණාංගයෙන් ශාරීරික, වාචසික, මානසික සංවරය ද අනුන්ට ප්‍රියවීම, ඉවසීම, ත්‍යාගශීලි බව යන ගුණාංග තුනෙන් මිනිස් සමාජයෙහි හැසිරීමට අවශ්‍ය වූ ගුණාංග ද දිනන ලද ඉඳුරන් ඇති බව කීමෙන් ආධ්‍යාත්මික චරිත සංවර්ධනය ද, භය නැති වීම, ශෝක නැති වීම යන දෙකෙන් විනිර්මුක්ත වූ බව කීමෙන් ආධ්‍යාත්මික චරිත ශක්තියේ වර්ධනය ද සිදුවන බව ධ්වනිත ය.*

උගත් පුරුෂයකු සතු විය යුතු මෙකී උදාර චරිතාංග ගැන සිතන විට විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ප්‍රථම විශ්වවිද්‍යාලයාධිපති ධුරන්ධරව වැඩ විසූ පණ්ඩිත ශිරෝමණි වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමිපාණන් වහන්සේගේ මුවින් නිතර නිතර පිටවුණු එක් අපූරු සංස්කෘත පාඨයක් මගේ සිහියට නැගේ. එනම් ''උදාර චරිතානාං තු වසුධෛව කුටුම්භකම්'' යන්න යි. මෙහි අර්ථය සමස්ත ධරණි තලය ම උදාර චරිත ඇති පුරුෂයන්ගේ කුටුම්බය වේ'' යන්න ය. සැබවින් ම ශ්‍රී සෝරත නාහිමිපාණෝ ඉහත කී උදාර චරිතාංගවලින් උපලක්ෂිත වූ පුරුෂෝත්තමයෙක් වූහ.

මෙසේ ආධ්‍යාත්මික ගුණ ධර්මවලින් හික්මුණු නුවණැති උගත් තැනැත්තාගෙන් මිනිස් ප්‍රජාවට පිහිටක් මිස අවැඩක් සිදු නොවේ. පරාර්ථචර්යාව හෙවත් පරහිතකාමීත්වය අගය කරන හෙතෙම සදාචාර විරෝධි ක්‍රියාවල නිරත නොවෙයි. මිනිස් ප්‍රජාවට එරෙහිව දඬු මුගුරු ආදිය අතට නො ගනී. (නිහිත දණ්ඩෝ, නිහිත සත්ථෝ) විෂමාචාරකම් කිරීමට ලජ්ජා වේ. දයාවෙන් යුක්ත වෙයි. මිනිස් සමාජයට ඉතා අනුකම්පාවෙන් කටයුතු කරයි. එබඳු උගතා රජුට ද වඩා සම්භාවනාවට පාත්‍ර වන්නෙකු බවත් ලොව සෑම තැන දීම සැමගේ ගරු බුහුමන්වලට පාත්‍ර වන්නෙකු බවත් (විද්වාන් සර්වත්‍ර පූජ්‍යතේ) පෙරදිග සාහිත්‍යයෙහි සඳහන් වේ.

ඉගෙනීම හා හික්මීම යන අංශ එකට එක්ව යන අන්දමට හැඩගැසී ඇති මෙම අධ්‍යාපන ක්‍රමය හුදෙක් භෞතික දියුණුව පමණක් පරමාර්ථ කොට ගත් බටහිර රටවල විශ්වවිද්‍යාලයවලින් දෙනු ලබන අධ්‍යාපනය තුළ සතුටුදායක ලෙස සිදුවේද යන්න සැක සහිත ය. අපේ රටේ විශ්වවිද්‍යාලයවලින් දෙනු ලබන අධ්‍යාපනය ද භෞතික දියුණුව කෙරෙහි නැඹුරුවක් දක්වන බව පෙනෙන නමුත් පෙරදිග අධ්‍යාපනයට උරුමකම් කියන අපේ විශ්වවිද්‍යාලවල අධ්‍යාපනයෙන් අපේක්ෂිත අධ්‍යාපන පරමාර්ථ භෞතික දියුණුව මෙන් ම ආධ්‍යාත්මික දියුණුව ද පරමාර්ථ කොට ගත් අධ්‍යාපන ක්‍රමයක් වේ නම් එය අපේ ශිෂ්‍ය ප්‍රජාවට මෙන් ම පොදුවේ මනුෂ්‍ය ප්‍රජාවට ද සාර්ථක ප්‍රතිඵල උදා කරන අර්ථවත් හා ඵලදායි අධ්‍යාපන ක්‍රමයක් වෙතැයි යනු මගේ හැඟීම යි.

මේ අධ්‍යාපන පරමාර්ථය සාර්ථක ව ඉටු කිරීමට සුදුසුකම් ඇති විශ්වවිද්‍යාලයකි, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. අද ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය යන නමින් හැඳින්වෙන මෙම විශ්වවිද්‍යාලය එදා හැඳින්වුණේ විද්‍යෝදය විශ්වවිද්‍යාලය යන නමිනි. එදා විද්‍යෝදය විශ්වවිද්‍යාලය ආරම්භ වූයේ පෙරදිග අධ්‍යාපනයේ කේන්ද්‍රීය අධ්‍යාපන ආයතනයක් වූ විද්‍යෝදය පිරිවෙණ ප්‍රභව කොට ගෙන ය. එදා විද්‍යෝදය නමින් හැඳින්වුණු අද ජයවර්ධනපුර නමින් හැඳින්වෙන මෙම විශ්වවිද්‍යාලයේ ආදර්ශ පාඨය වන ''විජ්ජා උප්පතතං සෙට්ඨා'' යන්න අනුව බලන විට පෙනෙන්නේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ආරම්භ වූ අවධියේ දී එහි අධ්‍යාපන පරමාර්ථ පෙරදිග අධ්‍යාපනයේ මූලික ම පරමාර්ථය වූ ඉගෙනීම හා හික්මීම යන මූලධර්මවලට අනුරූපී වූ බව විය හැකි ය. එබැවින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ඉගෙනීමෙන් හා හික්මීමෙන් සමලංකෘත උගත් මිනිස් පරපුරක් බිහි කිරීමට අත්‍යන්තයෙන් ම සුදුසුකම් ඇති විශ්වවිද්‍යාලයක් බව ඉඳුරු පැහැදිලි ය. එය එසේ සිදුවන දැක්ම මගේ පරම අභිලාෂය වේ.

ඔබ සැමට සුභ අනාගතයක් උදා වේවා!

<u>*2008.12.22*</u>

# 'Vijjâ Uppatatan Settha' Knowledge is the Greatest of all Valuable Things that Arise in the World

**Dr. Ananda Gunasinghe**

First of all let me thank the Vice Chancellor and the authorities of Sri Jayewardenepura University for inviting me to deliver the convocation address to the external graduates who are passing out today. I happen to be the first student of the Vidyodaya University-which I consider to be a great good fortune in my life. It is equally fortunate that I am asked to deliver this address. It is fitting that I should say something today about the motto of the Vidyodaya University, which is now the Sri Jayewardenepura University. The broad meaning of this motto, *Vijja Uppatatän Settha* is that knowledge is the greatest of all valuable things that arise in the world. Other philosophers of education in Asia proclaimed *Vidya Dadati Vinayam* (knowledge confers discipline) as the core concept of their educational thought, and that is a clear endorsement of this Buddhist educational concept. In brief, what I propose to say about this common concept is that *Vijja* or knowledge as well as *Vinaya* or discipline should occupy a central place in the ideals of university education, which applies equally to all students of the university; external as well as internal.

The university is the highest educational body of a country. A talented group of students from all parts of the island have been fortunate enough to be selected to pursue higher education as internal students of the university. Another set of students, who have lost that opportunity either due to lack of economic or educational resources or due to any other reason, pursue the path of higher education as external students of the university. It is this community of students, internal and external, that will be called upon to face the challenge of finding solutions to the many problems of the country; be they social, economic, political or whatever and to be the human resource with competence to shoulder the heavy responsibility of leadership in various fields of life in the country. The ideal of university education should be to give these stewards of the future a training that is not limited to the acquisition of factual knowledge, but includes that inward or spiritual dimension which confers character, undoubtedly a purpose of education, the supreme intention of which is to produce a generation of disciplined human beings.

One significant thing strikes us when we look at today's university education and the purposes to which it is devoted. That is that those purposes are primarily structured so as to provide space for students to develop knowledge, attitude and competence through the study of various fields of science, technology, communication and management etc., based on modern, scientific principles. It is undeniable that the modern world, which is making rapid progress in science and technology, needs persons who are equipped with such knowledge. But it is important that we sincerely examine whether this knowledge and the attitudes and skills it generates also concurrently bestow on them : that inward and spiritual discipline that we think is so desirable.

I must say that I feel that the quality of discipline, which is a hallmark of learning, has undergone erosion to a certain extent in university education in our country. This is the common perception in society. If planting the seed of discipline in students is not a very special purpose of university education, it is doubtful if that education is complete in all respects. If so what has to be done is to direct the student community towards an educational pattern in which learning and discipline go hand in hand. Of course this will be a difficult task. Nevertheless, I firmly believe that it is the responsibility of the university to discover the causes that have gone into the erosion of discipline from university education. It is from there that the remedial process must originate. When we speak about remedial action, our attention naturally turns to the educational system of the East, which is based on a harmonious blend of learning and discipline.

From ancient times the educational system of our country was patterned on the lines of the traditional Asian system. I firmly believe that the traditional educational system can be a light of incomparable value as we search for ways and means to upgrade education in the modern university in terms of both quality and quantity. I say this not simply because I have imbibed a certain discipline from the Asian system of education of which I happen to be a product. Rather it is because I sincerely feel that it is a system that reveals the most constructive aspects of a universal ideal of education, unfettered by limits of time and place. That is why I firmly believe that if the educational aims of the modern university are informed by the constructive features of the Asian educational philosophy, it will be of immense help in the effort to restore to our system the missing dimension of discipline and other such values.

The most fundamental feature of Asian education is the indissoluble bond between learning and discipline. The idea that learning alone will bring worth and respect to a person is one that the Asian philosophy of education has firmly rejected. It was their conviction that learning and discipline are two aspects of education that must consistently remain linked together. The test of learning was discipline, and behaviour that was consonant with it. It was the Buddha who most emphatically gave expression to this belief. In the Dhammapada, he says that the man who has mastered the words of Dhamma but does not live according to them is like a cow herd who guards another man's cattle. What this tells us is that what is merely confined to knowledge is not true learning. The practical ingredient of discipline is indispensable.

Before we consider how learning and discipline would take place simultaneously, we have to ask ourselves "What is learning?" The Buddhist literature mentions four methodologies of Learning: Listening *(sunati),* reflection *(cinteti),* questioning *(pucchati)* and documentation *(likhati).* These are principles that Eastern educational traditions developed for the purpose of acquiring erudition. Within the limits of one's innate abilities, one may become a learned person by the application of these principles. However, his learning, unless it is nurtured by virtue, could prove to be self-centred and devoid of exalted human qualities such as compassion and kindness. It is inconceivable that a learned man bereft of those great human qualities could contribute to the progress of society. The fact that some people who are conventionally regarded as educated have become perpetrators of various anti-social and immoral aberrations of conduct is because their education has not been nourished by the human qualities of mercy, kindness and commitment to the welfare of others; all of which are associated with discipline. This becomes obvious to anybody who sees the disasters that have bedeviled humankind because of learned persons who are devoid of discipline. Therefore, if one wants to become an educated

people who is of service to society, his education should indeed be fortified with restraint of word, deed and thought and qualities like compassion and kindness that flow out of inward or spiritual discipline.

So, we have to find out what is spiritual discipline, and how does it become integrated with the process of education. Spiritual discipline means the ability to guide and control the powerful emotions and passions lying in the human mind. It is a distinct condition that naturally arises in a human being in the course of right education. It is propelled by the mind's own potentialities and is not the result of any fortuitous outside influences or compulsions. It is the position held by the Asian educational tradition that discipline in this sense arises spontaneously in the course of right education, hence the assertion in the famous didactic work Hitopadesa: "Learning begets discipline" *(vidya dadati vinayam).*

The popular Sanskrit didactic work Pratyasataka enumerates ten qualities of character that should be found in a learned person of discipline instilled by inward restraint: lack of hatred, healthiness, control of the senses, mercy, forbearance, ability to win the hearts of people, lack of greed, generosity, fearlessness and freedom from sorrow. *(akrodhamarogya-Jitendriyartvam/daya ksama sarva janapriyatvam/ nirlobhi dãtã bhayasokamuktir/jnanaprabhedã dashalaksanani)*

When one reflects on these exalted qualities of character, one is reminded of a charming Sanskrit verse which was always on the lips of the late Venerable Pandit Welivitiye Soarata Nayaka Thero, founder Vice Chancellor of the Vidyodaya University*:"udaracaritanam tu/vasudhaiva kutupnbakam''* which means that to those of high character the entire world is one's family. Ven. Sorata was in every sense an embodiment of all the noble qualities mentioned above.

The learned person who is thus disciplined by virtuous qualities of mind promotes the welfare of mankind, not its detriment. He will not take up arms against other human beings, *(nihitadando nihitasttho).* Such a learned man, according to our classics, is honoured everywhere in the world *(vidvan sarvatra pujyate).*

I doubt whether modern universities that emulate their western counterparts, which are predominantly interested in external progress, can provide such a harmonious educational system in which learning and discipline are equally promoted. However the Asian educational system is part of our heritage. If we strive to revive the ideals of that system; it should be possible for us to develop a meaningful and successful model of university education to the benefit of not only our student community but also to mankind in general.

Sri Jayewardenepura University is ideally placed to do such a task. As we know, it started out as the Vidyodaya University. Its parent institution was the Vidyodaya Pirivena, well known as a center of Asian education. The motto of Sri Jayewardenepura University is an indication that at its inception it had the same vision of education as the classical Asian vision. Hence it is perfectly clear that this university is ideally suited to produce a generation of educated human beings equipped in equal measure with learning and discipline. It is my fervent hope to see this being realized.

I congratulate the new graduates of the university and wish them a bright and prosperous future.

*2008.12.22*

# 34

# උපාධිධාරී බුද්ධිමතුන්ගේ වගකීම සහ සමාජ මෙහෙවර

## මහාචාර්ය දයාසිරි ප්‍රනාන්දු

ගරු කුලපති ස්වාමීන්වහන්ස, උපාධි ප්‍රදානෝත්සවය ඇමතීමට ඔබ වහන්සේගෙන් ලද ආරාධනය ම විශාල භාග්‍යයක් ලෙස සලකනවා. මෙවන් දුලබ අවස්ථාවක් මට ලබාදීම ගැන ඔබ වහන්සේට බොහෝ සෙයින් ස්තුතියි. ගරු කුලපති ස්වාමීන්වහන්ස, අපට හුරු පුරුදු දසුනක් වන සැහැල්ලු උපාධි අපේක්ෂකයන් වෙනුවට, උපාධි ලෝගුවෙන් සැරසී සිනාමුසු මුහුණින් අද මෙතැන සිටින මේ තරුණ තරුණියන් දැකීමත් මට මහත් සතුටක්.

ආදරණීය උපාධිධරයනි, අද දිනය ඔබේ ජීවිතයේ ඉතාම වැදගත් දිනයක් අතිගරු කුලපති ස්වාමීන්වහන්සේ අතින් ඔබ උපාධිය ලබන්නේ අද දිනයි. වසර ගණනාවකට ඉහත දී මමත් ශිෂ්‍යාධාර පහසුකම්ලාභී උපාධි අපේක්ෂකයෙක්. අද වැනි දිනයක මමත් මාගේ උපාධි ලෝගුව හැඳ ඔබ වාගේ ම ශාලාවේ සිටියා. ඒ නිසා ඔබේ හදවතේ ඇති හැඟීම් කොයි වගේ ද කියා මා දන්නවා. ඔව්, අද දිනය ඔබට ඉතාම වැදගත් දිනයක්. ඒ වගේ ම ප්‍රේක්ෂකාගාරයේ සිට ආඩම්බරයෙන් ඔබ දෙස බලා සිටින ඔබේ දෙමාපියන්ටත්, පවුලේ අයටත් අද වැදගත් දිනයක්. ඔබට මඟ පෙන්වූ ගුරුවරුන්ටත් අද බොහොම වැදගත් දිනයක්. ඇත්ත වශයෙන්ම, මෙම උත්සවයට සහභාගී වී, ඒ සතුට බෙදා හදා ගන්නට ලැබීම ගැන මා බෙහෙවින් සතුටට පත් වෙනවා.

ගරු කුලපති ස්වාමීන්වහන්ස, මේ කථාව පවත්වන්නට මට ආරාධනාව ලැබුණු මොහොතේ, හෙන්රි ජයසේනයන්ගේ වේදිකා නාට්‍යයක පේළි කිහිපයක් මට සිහිපත් වුණා. වසර ගණනාවකට ඉහත දී එම නාට්‍යයේ බලධාරී චරිතය රඟපෑමට මම ද වාසනාවන්ත වුණා. එහි කියවෙනවා, ''කාගෙද මේ සිසු දරුවා? අපගෙයි මේ සිසු දරුවා. කවුද එහෙම කියන්නේ? හැමදෙනාම කියන්නේ?'' ඔව්, ඇත්ත වශයෙන්ම, උපාධිධාරී නෝනාවරුනි, මහත්වරුනි, ඔබ අපේ සිසු දරුවන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිසු දරුවන්. ඔබ ආ ගමන් මඟ දෙස හැරී බලන්න. එවිට ඔබට පෙනේවි ඔබ දිගු ගමනක් ඇවිත් තිබෙන බව. ඔබ ආ ඒ මඟ ආරම්භයේ දී, ඔබ දෙස ඉතාමත් උනන්දුවෙන් බලා සිටි අය ඔබට පෙනේවි. ඒ ඔබට නිතරම ආශිර්වාද කළ ඔබේ දෙමාපියන් සහ පවුලේ උදවියයි ගමන ආරම්භයේ ඉන්නේ.

අනතුරුව, දැනුම සහ ප්‍රඥාව සොයා ඔබ ආ මේ ගමනේ, ඔබේ ගුරුවරුන් සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් ද ඔබ ළඟින් සිටියා. ඔබේ ගමන් මඟ අතරමඟ නතර කරන්නට වෙහෙසුණ අයත් සිටින්නට ඇති. අප එවැනි දේත් බලාපොරොත්තු විය යුතු යි. ඒවා අමතක කරන්න. ''ඩිස්පියුටඩ් පැසේජ්'' යන පොතෙහි ලොයිඩ් ඩග්ලස් ගේ වදන් සිහිපත් කරන්න. ''ඔබ පාඩම් ඉගෙන ගන්නේ ඔබව වර්ණනා කරන අයගෙන් විතරම ද? ඔබට මඟ අවුරා සිටි අයගෙන් ඔබ ඊටත් වඩා පාඩම් ඉගෙන ගත්තේ නැත් ද?'' අද, ඔබේ ගමනේ ඉලක්කය වෙත පැමිණ ඇති මේ මොහොතේ, ඔබ දෙස බලා සිටින, තවත් මිනිසුන් කණ්ඩායමක් සිටිනවා නොවේ ද? ඒ තමයි අපේ රටවැසියන්. ඔබේ අධ්‍යාපන වියදම් දරා සිටි මහජනතාව. ඔබේ දෙමාපියන්, ඔබේ ගුරුවරුන් වගේම මේ රටේ ජනතාව යන සියලු දෙනාම ඔබෙන් කිසිවක් අපේක්ෂා කරනවා. උපාධි අපේක්ෂකයකුව සිටි

ලෝකය සහ සුදුසුකම් ලද උපාධිධාරියකු ලෙස අද ඔබ පා තබා ඇති ලෝකය අබියස ඔබ සිටින මේ මොහොතේ ඔවුන් සියලු දෙනාම ඔබ දෙස බලා සිටිනවා.

උපාධිධාරී නෝනාවරුනි, මහත්වරුනි, දැන් ඔබ මේ අළුත් ලෝකයට පා තබන්නේ දැනුම හා ප්‍රඥාව ලද උගතුන් හැටියට බව මතක තබා ගැනීම වැදගත් කාරණයක්. ඔබට අවස්ථාව තිබුණා ඔබ සමඟ ඉගෙනගත් අය හා මෙන්ම, උගතුන් හා එක්ව කටයුතු කරන්නට, හොඳ පත පොතෙහි මෙන් ම පුස්තකාලවල ඇසුර ලබන්නට ඔබට අවස්ථාව ලැබුණා. ඒ නිසාම මේ අළුත් ලෝකයට පළමු පියවර තබන මේ මොහොතේ ඔබ ගැන පැහැදිලි වැටහීමක් ඔබ තුළ තිබිය යුතුය. ඔබ වෙනුවෙන් ම, රට වෙනුවෙන් ද පැහැදිලි දැක්මක් ඔබ සතු විය යුතුයි. ඒ සමඟ ම ඔබට ඇති සමාජ වගකීමත් බොහෝ විශාල යි.

ඔබ අතරින් සමහරෙක් ඉතා දක්ෂයන් වන විට, තවත් සමහරෙක් එතරම් දක්ෂ නොවන්නටත් ඇති. නමුත්, වෙන් වෙන් ව නොව, එකමුතු වීමෙන් සමාජයට දායකත්වයක් ලබා දීමට ඔබ සැමට හැකි බව මතක තබා ගන්න. ''පිල්ග්‍රිම්ස් ප්‍රෝග්‍රස්'' යන පොතෙහි ජෝන් බනියන් ගේ' වදන් සිහියට ගන්න; ''අඳුරු වළාවන් දිය බිඳු ගෙනෙද්දී පැහැබර වළාවන් කිසිවක් ම නොගෙනේ. ඔව්, ඒ වලාකුළු අඳුරු වුවත්, පැහැබර වුවත් රිදී දිය බිඳු පහළට ගලා හැලෙන්නට උපකාරී වේ. මහ පොළොව අස්වැන්න ගෙන දෙන්නේ ඒ වළාකුළු දෙවර්ගයට ම ප්‍රශංසා කරමිනි.''

නුදුරු කාලයේ දී ම ඔබ රැකියාවක නිතර වී ආදායම් උපයන්නට පටන් ගනීවි. එලෙනර් රූස්වෙල්ට් ගේ වචනයෙන් කියවෙන ආකාරයට; ''ලැබෙන දෙය ඔබ සතුටින් භාර ගත යුතුයි. එහි දී වඩා වැදගත් වන්නේ ඔබට හැකි උපරිමයෙන් කටයුතු කිරීම යි.''

උපාධිධාරී නෝනාවරුනි, මහත්වරුනි, සේවාදායකයා සහ සේවකයා යනුවෙන් රැකියාවක් කොටස් දෙකකින් යුතුයි. දෙපාර්ශවයට ම එකිනෙකා කෙරෙහි වගේම, සමාජමය වශයෙන් ද වගකීමක් තිබෙනවා.

සමාජමය වගකීමක් කියන්නේ ආචාරධර්ම හෝ මතවාදී සංකල්පයක්. රාජ්‍ය හෝ වේවා, සංස්ථාවක් හෝ වේවා, ආයතනයක් හෝ තනි පුද්ගලයෙක් හෝ වේවා, සැමදෙනාටම සමාජමය වගකීමක් තිබෙනවා. හැමදෙනාම කථා කරන්නේ ''සංස්ථාමය සමාජ වගකීම්'' ගැනයි. එය තමා හැම දෙනාගෙම මුව රැව්දෙන අළුත් ම කතාව. කිසිම රැකියාවක දී සේවාදායකයාට දිය හැක්කේ මොනවාදැයි සිතීම සුදුසු නැහැ. රැකියාවට ඔබගෙන් දිය හැක්කේ මොනවාද කියන එකත් ඒ හා සමානව ම වැදගත් වෙනවා. වෙනත් වචනයකින් කියනවා නම් අප හැමදෙනාම ''පුද්ගලික සමාජ වගකීමක්'' තිබෙනවා.

උතුම් වෘත්තියයන් හැටියට සලකන රැකියා දෙකක් දෙස බලන්න. වෛද්‍ය හා ගුරු වෘත්තීන්, ඒ වෘත්තීන් තිබෙන්නේ මුදල් හා ධනය රැස් කරන්නට නොවෙයි. ඒ වෘත්තීන් තිබෙන්නේ අන් අය සුවපත් කරන්නටත්, දැනුම ලබා දෙන්නටත් වගේම, ඒ වෘත්තියේ නියැලෙන්නන්ට විශාල මානසික තෘප්තියක් ලබා දෙන්නත් ය. වෛද්‍යවරයෙක් හෝ ගුරුවරයෙක් හෝ වීම දිව්‍යමය අවස්ථාවක්. අපේ මුතුන්මිත්තන්ගේ කාලයේ එම වෘත්තියේ නියැළුණු සේවාදායකයන් සිටියේ නැහැ. නමුත් ඒ වෘත්තීන් දෙකේ ම සේවාදායකයන් සිටිනවා. ඒ තමයි සෞඛ්‍ය හා අධ්‍යාපන අමාත්‍යාංශයන්. අප අද දකින, නිමක් නැති ගැටුම්වලට හේතු වී ඇත්තේ අවශ්‍යතාවන්ට අනුව, සම්ප්‍රදාය එසේ වෙනස් වීම යි. මහජනතාව වෛද්‍යවරුන් හා ගුරුවරුන් හඳුනන්නේ උගතුන් හැටියට යි. ඒ නිසාම ඉල්ලීම්

ද සාධාරණ විය යුතුයි. ඒවා හොඳින් සලකා බැලිය යුතුයි. ප්‍රශ්න හා ගැටළු විසඳීමේ දී අත්‍යවශ්‍ය වන්නේ සාකච්ඡාවන් හා කතිකාවන් මිස, ඉතා සුළු හේතූන් සඳහා ඉදිරිපත් වන වෘත්තීය සමිති ක්‍රියා මාර්ගයන් නොවෙයි. සියලු දෙනාට ම, සාධාරණ ලෙස ලබාදීම සහ ලබාගැනීම දෙපාර්ශවය තුළ ම ඇත්තේ නැහැ. අපි බොහෝ විට දකින්නේ ''රොබින් හුඩ් හා ෆ්‍රයර්'' වැනි තත්ත්වයන්. යටත් වන්නට දෙපැත්තම අකමැතියි. මේ නිසා දෙපැත්තකින් ම පෙළෙන්නේ කවුදැයි යන්නට ඔවුන්ට සිහිපත් වන්නේ නැහැ. ඒ අසරණ රෝගීන් හා අහිංසක පාසල් දරුවන්. බොහෝ විට ඔවුන් ගිරයට අසු වුණ පුවක් ගෙඩිය වගෙයි. උගතුන්ට එය නොපෙනෙන්නේ කොහොම ද, ඔවුන් එය දන්නවා නම්, අසරණ රෝගීන් වාට්ටුවල තනිකර, නොසලකා හැර, වෘත්තීය සංගමයකින් ගත් ක්‍රියා මාර්ග යන් පසු පස සෞඛ්‍ය සේවකයන් යන්නේ කොහොමද? එසේත් නැතිනම්, තමන්ගේ ලෙඩ දුකට බෙහෙත් ගන්නට බාහිර රෝගී අංශයට පැමිණ සිටින සිය ගණනක් රෝගීන් ප්‍රතික්ෂේප කරන්නේ කොහොමද? හදිසි රෝගීන්ට වෙදකම් කරන බව නම් ඔවුන් කියනවා. නමුත් හදිසි රෝගීන් යැයි කියා ඔවුන් හඳුන්වන්නේ කවුරුන් ද? හදිසි අවස්ථාවන් කියන්නේ මොනවාද? අපේ වීර සෙබලුන් බොහොමයකට වෙද හෙදකම් කරන වව්නියාවේ රෝහල සම්බන්ධයෙන් මෑතක දී වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයන් ගැන අසන්නට ලැබීම කණගාටුව උපදවන පුවතක්. යුද පෙරමුණේ සටන් වදින සෙබළකුට සිදුවන ඕනෑම සුළු ආබාධයක් වුණත්, හදිසි අවස්ථාවක්ම තමයි. කවුද සෙබළා කියන්නේ? තමාගේ යෞවන කාලයේ සුන්දර දේවල් පසෙක ලා, රට රකින්නට ඉදිරියට ගිය ඔබ වාගේ තරුණයන්. ඒ වාගේම සාමාන්‍ය පුද්ගලයෙකුට දැනෙන සුළු පපුවේ අමාරුවක් පවා ඔවුන්ට ඉතා බරපතල රෝගී තත්ත්වයක්. කවුද මෙය තීරණය කළ යුත්තේ? උතුම් වෘත්තීන්හි නියැලෙන උගතුන් මීට වඩා වෙනස් ආකාරයකට හිතන්ටත් ක්‍රියා කරන්නටත් පුරුදු පුහුණු විය යුතුයි.

ගුරු වෘත්තීය ගෙන බැලුවත් එය එසේ ම විය යුතුයි. ''දරුවනේ, අද මම ඔයාලට උගන්වන්නේ නැහැ'' එහෙමත් නැති නම්, ''වෘත්තීය සමිති උපදෙස් අනුව, ''මම හෙට දින අසනීප වෙනවා'' ''මම හෙට අසනීප නිවාඩු වාර්තා කරනවා'' කියා ගුරුවරයකු කොහොමද ඔහුගේ සිසු දරු දැරියන්ට කියන්නේ? එහෙම කරද්දී ඔවුන් උගන්වන්නේ මොනවා ද? වංකකම නොවේ ද? ''මම උත්තර පත්තර බලන්නේ නැහැ'' කියා කොහොමද ඔවුන් කියන්නේ? කොහොමද දරුවන්ට බෙහෙවින් වැදගත් වන විභාගවල ප්‍රතිඵල වුවමනාවෙන් ම පමා කරන්නේ? එසේ එම දරුවන්ට මෙසේ සලකන්නට තරම් ඒ අහිංසක දරුවන් කළ වරද මොකක් ද? වෘත්තීය සමිති ක්‍රියාමාර්ගවලට සහයෝගය දක්වන්නට ගුරුවරුන් වගේම අධ්‍යයන කාර්ය මණ්ඩල විසින් අහිංසක දරුවන් ඒවාට ඇදගෙන ගිය අවස්ථා ගැන අපට අසන්නට ලැබී තිබෙනවා. මේවා හරි දේවල් ද? අප මොනවාද අපේ දරුවන්ගේ සිත්වලට කා වද්දන්නේ?

වෛද්‍යවරයෙක් හැටියට අවුරුදු 40 ක් රාජ්‍ය අංශයේ සේවය කළ මා, වෘත්තීය සමිති ක්‍රියා මාර්ග යන් නිසා, එක් දවසක් හෝ මගේ සේවය නතර කර නැහැ. කොළඹ FMTA හි සභාපති හැටියට මමත්, වෘත්තීය සමිති නායකයෙක් හැටියට කටයුතු කර තිබෙනවා. ඒ කාලයේ දී විශ්වවිද්‍යා කාර්ය මණ්ඩලය විසින් වෘත්තීය සමිති ක්‍රියා මාර්ග ගත් අවස්ථාවක් තිබුණා. නමුත්, සිසුන් ගේ විභාග නිසා, මා අපේ සමිතියට, එයට එක් වන්නට ඉඩ දුන්නේ නැහැ. මොකක් ද ඊට හේතුව? මගේ ''පුද්ගලික සමාජ වගකීම්'' මොනවා ද කියා මා දැන සිටියා. අසරණ ජනතාවට බලපාන මෙවැනි ක්‍රියාවලදී ''නැහැ - බැහැ'' කියන්නට අපට ශක්තියක් තිබිය යුතුයි.

මෙහි තවත් පැත්තක් තිබෙනවා. බලන්න පෞද්ගලික වෛද්‍ය සේවය හා පුද්ගලික අමතර පන්ති දෙස. ඔවුන් ඒවා පවත්වාගෙන යන ආකාරය හරි ද? අපට බොහෝ විට අහන්නට ලැබෙනවා මෙයින් පීඩාවට පත්වන අයගේ විරෝධය සහ නොසතුට. මෙම වෘත්තීන්වල නියැලෙන සමහරු

කොයිතරම් පහත් තත්ත්වයට වැටී ඇත්දැයි අප දන්නවා. ඒ විදිහට ක්‍රියා කරන්න ඒ අයගේ ඒකායන බලාපොරොත්තුව මුදල් රැස්කිරීම පමණයි. කෝ ඔවුන්ගේ ''පුද්ගලික සමාජ වගකීම?''

මම කැමතියි අපේ වෛද්‍ය උපාධිධාරීන්ගෙන් සුවිශේෂී ඉල්ලීමක් කරන්න. වෘත්තිමයකුගේ ඇඳුමෙන් සැරසුණු ව්‍යාපාරිකයෙකු ලෙස නොවී, සැබෑ වෘත්තිමයකු ලෙස ඔබගේ ජීවිතය ගෙන යාමට ඔබ අදම අධිෂ්ඨාන කරගන්න.

උපාධිධාරි නෝනාවරුනි, මහත්වරුනි, සමස්ත රාජ්‍ය සේවයට ද මෙය පොදුවේ බලපාන කාරණයක්. නිලධාරිවාදයට මෙන් ම, විවිධ අමාත්‍යාංශවලටත් එය එසේ මයි. මහජනතාවට සේවය කරන විවිධ පුද්ගලයන්ගෙන් යුත් මණ්ඩල සහ සංස්ථාවලට ද එය එසේ මයි. කෝ ඔවුන්ගේ ''පුද්ගලික සමාජ වගකීම්?'' දිවංගත ජනාධිපති ප්‍රේමදාස මැතිතුමා කීවාත් මෙන් ''සෑම ලිපි-ගොනුවක් තුළ ම ඇත්තේ මනුෂ්‍යයෙකි'' අසරණ ජනතාව හිරිහැරයට පත් කිරීමත්, ඔවුන් ප්‍රාණ ඇපකරුවන් බවට පත්කර, තමන්ගේ ඉල්ලීම් ලබා ගැනීමත්, සමාව නොදිය හැකි අපරාධ හැටියට යි මා දකින්නේ.

ඊට අමතරව, තම තමන්ගේ හැකියාවන්ට අනුව නාස්තිය හා දූෂණය අවම කිරීමත් ඔබගේ ''පුද්ගලික සමාජ වගකීමක්''. එය ඔබට ලෙහෙසියෙන් කළ හැකි ය. පුංචි උදාහරණයක් ගනිමු. කන්තෝරුවල වැඩ කරන කී දෙනෙක් නම් තමන්ගේ කන්තෝරුවට අයිති ලියන කඩදාසි, පෑන් පැන්සල් ගෙදර ගෙනයනවා ද? එසේම, සෞඛ්‍ය අංශයේ කීදෙනෙක් නම් රෝගීන්ට දෙන්නට තිබෙන රෝහලේ බේත් හේත් ගෙදර ගෙනයන වරදට යොමු වී තිබෙනවා ද? මේ උදාහරණ නාස්තිය හා දූෂණය යන මහ සාගරයෙන් ගත් පුංචි දිය බිඳක් විතරයි. ඔබේ අළුත් ජීවිතය පටන් ගැනීමේ දී ම, එසේ ගෙදර ගෙනියන නරක පුරුද්දට ''තිත'' තබනු ඇතැයි මම විශ්වාස කරනවා.

උපාධිධාරී නෝනාවරුනි, මහත්වරුනි, ඔබේ වගකීම ඇත්තේ රැකියාවට පමණක් ම නොවෙයි. ඔබ උපාධිධරයකු වීම දක්වා ආ මෙම ගමන් මගේ ඔබ දිරිමත් කළ, ඔබට සහයෝගය දැක් වූ සෑම සියලු දෙනා වෙනුවෙන් ම ඔබට ''පුද්ගලික සමාජ වගකීමක්'' තිබෙනවා. අමතක කරන්න එපා, ඔබේ දෙමාපියන් සහ පවුලේ උදවිය ඔබේ ඒ ගමන්මග ආරම්භයේ දී ඔබ ළඟින් ම සිටි බව. ඔවුන්ට අපේක්ෂාවන් තිබෙනවා. ඔබටත් ඒ සම්බන්ධ වගකීමක් තිබෙනවා. ඔබට දැනුම හා ප්‍රඥාව ලබා ගැනීමට උදව් උපකාර කළ ගුරුවරුන් අමතක කරන්න එපා. ඔවුන්ගේ බලාපොරොත්තු සඵල වන ලෙස ජීවත් වන්නටත් ඔබ ගේ වගකීම් කොටස ඉටු කරන්නටත් හිතට ගන්න. ඔබේ ගුරුවරුන්ට නිතරම ගෞරව කරන්න. ඔවුන්ගේ සේවයට සැමවිටම කෘතගුණ සලකන්න. ඒ වාගේම මේ රටේ ජනතාව ගැනත් සිහිපත් කරන්න. ඒ සැමදෙනාම ඔබ වෙනුවෙන් බලා සිටි අයයි. පාසලේ දී වගේම, විශ්වවිද්‍යාලයේ දීත්, ඔබ ආ මේ දිගු ගමනේ දී ඔබ හැමදෙනාටම පිහිට වුණේ ඔවුන්ගේ මුදල් බව අමතක කරන්න එපා. එය බොහොම වැදගත් කාරණයක්. ඔබ හැමදෙනා ගැනම ඔවුන් තුළ ඇති බලාපොරොත්තු අතිවිශාලයි. ඒ වගේම ඔවුන් සම්බන්ධයෙන් ඔබටත් ලොකු වගකීමක් තිබෙනවා. ඔවුන් බලාපොරොත්තු වන එක් දෙයක් තමය; ඔබ මේ රටට සේවය කරාවි, ඔබේ උගත්කමෙන් මේ රටේ ජනතාවට සෙත සැලසේවි කියන එක. ඔබ සේවය කළ යුත්තේ ශ්‍රී ලංකාවට මිස වෙන කිසිම රටකට නොවෙයි. මේ තමයි ඔබේ මව්බිම. ඒක තමයි සත්‍යය. මුදල් හා ධනයෙන් ඔබේ ඇස් ගිනි කණ වැටෙන්නට හරින්න එපා. පිටරටට යන්න. හැකි තරම් හොඳින් ඉගෙන ගෙන, ඒ උගත් දෙයින් මව් රටට සේවය කරන්න ආපසු එන්න. ඔබේ වෘත්තීය ජීවිතය සකස් කළේ මේ රටයි. දිවංගත අමාත්‍ය ලක්ෂමන් කදිරගාමර් මැතිතුමා වරක් ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ දී කියා සිටියේ මෙහෙමයි, ''ඔව්, ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලය කියන්නේ කේක් එක මත තවරාපු අයිසිං තට්ටුවක් වගෙයි.

නමුත් ඒ කේක් එක පිළිස්සුවේ මගේ රටේ දී යි.'' කදිරගාමර් මැතිතුමාගේ පුද්ගලික වගකීම ඉෂ්ට කරන්නට ආපසු ලංකාවට ආවා. අවසාන හුස්ම පොද දක්වා ම මේ රටට සේවය කළා.

උපාධිධාරී නෝනාවරුනි, මහත්වරුනි, දවස අවසානයේ දී හැරී බලන කොට, සතුට රැඳී තිබෙන්නේ තමන් හරි හම්බ කළ මුදල් සම්භාරය මත නොවෙයි, තමන් ලැබූ ආත්ම තෘප්තිය මත යි. ''මම උපරිමයෙන් මට කළ හැකි සේවය ලබා දුන්නා. ඒ ගැන මා සතුටටත් සෑහීමටත් පත් වෙනවා'' යැයි කියන්නට ඔබවට හැකියාව තිබිය යුතුයි. උපාධිධාරී නෝනාවරුනි, මහත්වරුන එසේ කියන්නට හැකි තෘප්තියක්, අවංකවම, මා ලබා තිබෙනවා. ඒ වගේම ඔබලාත් ඉදිරි ජීවිතයේ දි, එසේ කියන්නට හැකි අන්දමින් තෘප්තිමත් වේ යැයි මා සිතනවා.

උපාධිධාරී නෝනාවරුනි, මහත්වරුනි, අපේ රටේ ඉගෙන ගත් අයගෙන් අනෙක් රටවල් එලනෙලා ගන්නවා දකීම බොහෝම දුක හිතෙන කාරණාවක්. මෙසේ සැප සම්පත් සොයා වෙන රටවලට ඇදී යන අය මහා මන්දිර සෑදුවත්, සැප වාහනවල ගමන් කළත්, ඔවුන් ඒ රටවල දෙවන පුරවැසියන් බව අමතක නොකළ යුතුයි. ගරු කුලපති ස්වාමීන්වහන්ස, නිල්ල සොයා එතෙරට ඉගිලෙන මේ කුරුල්ලන් වැඩිදෙනෙක්, තමන්ගේ විශ්‍රාමික ජීවිතය ගෙවන්නට ආපසු මව්බිම කරා ඇදී එන හැටි හරිම අපූරු දෙයක්. තමන්ගේ ණය ගෙවා ඉවරයි කියා හෝ යුතුකම් කොටස කළේ යැයි කියා හෝ කිසිවෙකුටත් කියන්නට බැහැ. එහි ඊට වඩා වැඩි යමක් තිබෙනවා. ඔබ මේ තත්ත්වයට එනතුරු, ඔබට පිහිටට හිටි අය බොහෝමයි. ඔබ මෙලොවට උපන් මොහොතේ පිහිටට ආ වෛද්‍යවරයා, වින්නඹු අම්මා, ඔබේ පවුලේ අය, ඔබව රැකබලා ගත් අය, ඔබට කෑම බීම පිළියෙල කළ අය, ඔබේ කිළිටි රෙදි සේදූ අය, පාසලට, විශ්වවිද්‍යාලයට ගමන් පහසුව සැලසූ අය - ඔව් ලැයිස්තුව නම් බොහොම දිගයි. ඒ හැම දෙනාට ම ඔබ ණය ගැතියි. ඉතින් මෙය රුපියල් ශත අතර ගැටළුවක් නොවෙයි. එය ඔබේ ''පුද්ගලික සමාජ වගකීම'' සම්බන්ධ ප්‍රශ්නයක්.

ඔබ මේ උපාධියත් රැගෙන මේ ශාලාවෙන් පිටතට ගොස් නව දිවියක් අරඹන මොහොතේ, ඔබ දෙස දෑස් අයාගෙන බලා සිටින අපේ රටට අයත් ඒ හැමදෙනාම වෙනුවෙන් ඉටු කළ යුතු වගකීම් රැසක් ඔබට තිබෙනවා. විලියම් තෝමස් ගේ වචනයෙන් කියනවා නම්, ''අපට, අපේ රට වෙනුවෙන් දිය හැකි ශ්‍රේෂ්ඨතම ත්‍යාගය, එසේත් නැති නම් අතිඋතුම් ම ත්‍යාගය නම් අපේ උපරිම සේවය යි. එයින් අදහස් වෙන්නේ අපේ දැනේ හැකියාව හා ඥානය පමණක් ම නොවෙයි. අපේ සිහින, අපේ සියුම් අභිප්‍රායයන් හා අපි අපට ම ගිවිස ගත් උදාර පොරොන්දුත් ඊට එක් විය යුතුයි.''

ගරු කුලපති ස්වාමීන්වහන්ස, මා නැවත වරක් ඔබ වහන්සේටත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයටත් බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මගේ මේ දේශනයෙන්, මේ අලුත් උපාධිධරයන්ගේ සිත් තුළ ''පුද්ගලික සමාජ වගකීම'' කියන බීජුවටය වපුරන්නට මට අවස්ථාව ලබා දීම ගැන මා සතුටු වෙනවා. ඒ වරප්‍රසාදය ලබා දීම ඉතාමත් අගය කොට සලකනවා.

ආදරණීය උපාධිධරයනි, ඔබ සැමට පිදෙන මගේ ශුභාසිංශන පිළිගන්න. ශ්‍රී ලංකාව තුළ ඔබ සියලු දෙනාටම සතුටින් පිරි ජීවිත උදා වේවා කියා ඉත සිතින් ම මම ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේ ම, ඔබෙන් අපේ රටට යහපතක් ම සැලසෙන බව මගේ අවංක විශ්වසායය. ඔබලාගේ සත්කාර්යයන් රටට ආලෝකයක් වේවා! ඔබ සැම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් බිහි වූ උපාධිධරයන් බව ලෝකයාට පසක් වන්නට එය ම හේතු වාසනා වේවා!

<u>*2008.01.02*</u>

# 35

# චරිත සංවර්ධනය, පෞරුෂ සංවර්ධනය හා උසස් අධ්‍යාපනය

## මහාචාර්ය ආරියපාල පෙරේරා

ශ්‍රී ට අඩ සිය වසරකට පෙර විද්‍යෝදය හා විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයන් පිහිටුවීමෙන්, සිංහල භාෂාවෙන් පාසල් අධ්‍යාපනය ලැබූ ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පන්තියේ ජනතා දූ පුතුන්ට හිමිකර දුන් ජාතික හා අධ්‍යාපනික මහා දායාදයේ පනස් වසර සමරණ, නැතහොත් විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ස්වර්ණ ජයන්තිය උත්සවාකාරයෙන් සිහිපත් කරන මේ වසරේ මෙම ජාතික විශ්වවිද්‍යාලයන් ආරම්භ කිරීමෙන් අපේක්ෂා කළ අභිමතාර්ථයන් රටේ - ජාතියේ ප්‍රගමනය සඳහා කොතෙක් දුරට සාධනය වී ඇද්දැයි පුනරාවර්ජනා කිරීමට කාලය දැන් පැමිණ ඇතැයි විශ්වාස කරමි.

වර්ෂ 1959 ජනවාරි මස පළමු වන දා නිල වශයෙන් විද්‍යෝදය විශ්වවිද්‍යාලය ප්‍රතිෂ්ඨාපනය කළ ද ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව සඳහා සිසුන් 11 දෙනෙකු තෝරාගෙන මහා විද්වත් සභාවක් මැද දී ප්‍රථම විශ්වවිද්‍යාලයාධිපතීන් වහන්සේ වූ පණ්ඩිත ශිරෝමණි වැලිවිටියේ ශ්‍රී සෝරත නා හිමිපාණන් විසින් ''බෞද්ධ සංස්කෘතියෙන් ශ්‍රී ලාංකිකයන්ට හිමි වූ විශිෂ්ට දායාද'' මැයෙන් පැවැත් වූ ශාස්ත්‍රීය දේශනයෙන් කොළඹ නිදහස් මන්දිරයේ දී 1959 පෙබරවාරි මස 18 වැනිදා විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන කටයුතු නිල වශයෙන් ආරම්භ කරන ලදි.

ඉන්පසු 1960 වසරේ අගෝස්තු හත් වැනිදා විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපාධි ප්‍රදානෝත්සවය ගංගොඩවිල විශ්වවිද්‍යාල භූමියේ තාවකාලික ව තැනවූ උපාධි ප්‍රදානෝත්සව ශාලාවේ දී ප්‍රථම කුලපති ධූරය හෙබ වූ අග්‍රාණ්ඩුකාර තැන්පත් ශ්‍රීමත් ඔලිවර් ගුණතිලක උතුමාණන්ගේ ප්‍රධානත්වයෙන් අති උත්කර්ෂවත් ආකාරයෙන් සිදුවිය. සිංහල අකුරු ඉංග්‍රීසියෙන් ලියූ කඩදාසිය බලාගෙන ශ්‍රීමත් කුලපතිතුමන් ''විදියෝදය විශිව විදියාලයේ උපාධිය පරදානෝත්සවය ආරම්භ කරමි'' යැයි සිංහලෙන් කථා කළ විලාශය කාගේත් මුවගට සිනහවක් ඉපදවීමට සමත්විය. එදා උසස් පෙළ සිසුවෙකු ව සිටි මට මේ අගනා ඓතිහාසික අවස්ථා දෙක ම දැක බලාගන්නට ලැබීම මාගේ ජීවිතයේ අනුස්මරණීය වාසනාවක් ලෙස සලකමි.

මීට හතළිස් අට වසරකට පෙර එදා පැවැත් වූ ප්‍රථම උපාධි ප්‍රදානෝත්සව දේශනයේ දී මහාචාර්ය සෙනරත් පරණවිතාන සූරීන් පළ කළ වැදගත් කරුණක් අද මාගේ දේශනයට ද පසුබිම කර ගනිමි. ''ශ්‍රී ලංකාව විශ්ව කීර්තියට පත්වීමට බලපෑ ප්‍රධාන සාධකය වන්නේ සිංහල-බෞද්ධ සංස්කෘතිය යි'' යන්නයි ඒ.

එය වනාහි මහින්දාගමනයේ සිට අද දක්වා වසර දෙ දහස් තුන් සිය දහසයක් තිස්සේ අඛණ්ඩ ව පැවත ආ ජාතික හා ආගමික චින්තන ප්‍රවාහයේ ශක්තිය යි. එසේ ම සිංහල බෞද්ධයා තුළ දීර්ඝකාලීන ව - ස්ථාවර ව මේ ශක්තිය තහවුරු කරන්නට මිහිඳු මාහිමියන් දුර දක්නා නුවණ මෙහෙයවා ගත් ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලය බව ද කෙසේවත් අපට අමතක කළ නො හැකිය. වෙනත් වචනවලින් කිවහොත් බුදු සමයේ ආගමනයත් සමඟ අපට හිමි වූ භෞතික සංස්කෘතියට වඩා ප්‍රබල

ලෙස චරිත සංවර්ධනයට හා පෞරුෂ වර්ධනයට බෞද්ධ සංස්කෘතියේ අභෞතික සංස්කෘතිය ශක්තිය බලපා තිබේ.

ආරම්භක දිනයේ සිටම මිහිඳු මාහිමියෝ සිංහලයන්ගේ චරිත සංවර්ධනයට අදාළ විවිධ ප්‍රතිපදාවන් පහදා දෙමින් බුදුදහම ජනතාවගේ හදවතට කාවැද්දූහ. තෙරුවන් සරණ යාමේ පටන් නිවන් මඟ සපුරන බෞද්ධ ශ්‍රාවකයාගේ ශ්‍රද්ධා - බුද්ධි උදාර චරිත ලක්ෂණයන් චුල්ලහත්ථිපදොපම සූත්‍රයෙන් ද ආත්මාර්ථකාමී, මසුරු, ලෝභී, කුහක චරිත ලක්ෂණ ප්‍රේතවස්තු දේශනාවෙන් ද පරිත්‍යාගශීලී, නිර්ලෝභී, මෛත්‍රී සිත් ඇති, දේවත්වයට පත්වීමට සුදුසු, උදාර චරිත ලක්ෂණ විමානවත්ථු දේශනාවෙන් ද මෙලොව - පරලොව නිසි අවබෝධයෙන් ක්‍රියාකිරීමට අවශ්‍ය මඟ පෙන්වීම් දේවදූත සූත්‍රයෙන් ද ඥානවන්ත - අඥාන පුද්ගල ගතිලක්ෂණ විවරණයක් බාල - පණ්ඩිත සූත්‍රයෙන් ද දේශනා කිරීමෙන් උත්සාහ කොට ඇත්තේ සිංහල බෞද්ධයාගේ චරිත සංවර්ධනයට හා පෞරුෂ වර්ධනයට අදාළ නිර්ණායක තේරුම් කර දීම යි.

'චරිතය' යන්න හැසිරීම, පුහුණුව, සහජ - පාරම්පරික ගතිගුණ, චර්යා රටාව, සිතන මතන ආකාරයට ක්‍රියාත්මකවීම, පිළිගත් ජීවන රටාවකට හුරුවීම වැනි පුළුල් පරාසයක් සඳහා අර්ථවත් වෙයි. මිනිසා මුහුණ දෙන විවිධ සමාජ පසුබිම්වල දී යටිහිතේ අනුශය වශයෙන් තැන්පත් වී තිබෙන අසම්මත හැඟීම් උත්සන්න වී චරිතය කෙලෙසාගන්නා ක්‍රියාවලට පෙළඹීම් ද සමාජයේ විරල නැත. අපගාමී චර්යාවන්ට හුරු වී හීන පෞරුෂයක් ඇති ව සාපරාධී ක්‍රියාවලට යොමු වන එවැනි පුද්ගලයන් නිසි පරිදි සමාජානුයෝජනය කිරීම ආගමේත්, අධ්‍යාපනයේත් අපේක්ෂාව විය යුතුය.

පෞරුෂය ඊට වඩා පුළුල් අරුතක් දක්වයි. බුද්ධියෙන්, චින්තනයෙන්, අත්දැකීමෙන්, අවබෝධයෙන්, අභ්‍යාසයෙන්, නො පසුබස්නා උත්සාහයෙන් ගොඩනගාගත්, මේරු, මනෝ භෞතික ශක්තිය පෞරුෂය යි. ආත්මශක්තිය යනුවෙන් අර්ථවත් වන්නේ ද මේ ගුණාංගය යි. බෞද්ධයා තම පෞරුෂය හා චරිතාදර්ශ සංවර්ධනය කරගැනීමට බුදුරදුන්ගේ පරමාදර්ශී ''විජ්ජා'' - බුද්ධිමය හැකියා වන ද ''චරණ'' - චර්යාමය හැකියාවන් ද පූර්වාදර්ශී නායකත්ව ලක්ෂණ ලෙස අනුගමනය කරයි.

බුදුසමයේ දායාදය ලැබීමෙන් පසුව ශ්‍රී ලාංකික සිංහල - බෞද්ධයන් වර්ධනය කරගත් ගුණාත්මක ජීවන හර පද්ධතියේ ශක්තියෙන් සත්‍යක්‍රියා කොට මහා ප්‍රාතිහාර්යයන් පෑ අවස්ථා ද රජවරුන් සක්විති රජුන් ලෙසත්, ධාර්මික රාජ්‍ය පාලනය බෝධිසත්ව චර්යාවක් ලෙසත් ගරු බුහුමන් ලැබූ අවස්ථා ද ලංකා ඉතිහාසයේ විරළ නැත.

මෙවැනි පරමාදර්ශ සැපයූ පුරෝගාමී චරිත රාශියක් ඒ ඒ යුගවල අවශ්‍යතා මත නිර්මාණය විය. ආගමික අනුශාසකත්වය- ගුරු උපදේශනය හා නායකත්වය සැපයූ වන්දනීය - පූජනීය චරිත ද, රට ජාතිය ආපදාපන්න වූ අවස්ථාවල මතු වී ආ ජාතික - වීර චරිත ද රාජ්‍ය පාලනය ආගමික කාර්යයක් ලෙස සැලකූ භක්තිමත් බෞද්ධෝපාසක - බෝසත් චරිත ද සමාජයේ ගරු බුහුමනට ලක් වූ ගුරු - දෙගුරු කුලදෙටු චරිත ද සිංහල බෞද්ධයන්ට පුරෝගාමී නිර්ණායකයන් සපයා ඇත.

සියවස් ගණනක් ඇවෑමෙන් මුළු රට ම බටහිර අධිරාජ්‍යවාදීන්ට යටත් වී දැඩි පීඩනයකට හා පරිහානියකට පත් ව තිබූ යුගයේ දී පවා සිංහල බෞද්ධයාගේ චරිතය හා පෞරුෂය නො පිරිහී තිබූ බවට රොබට් නොක්ස් කරන ප්‍රකාශය හොඳ නිදසුනකි.

''ජාතියක් වශයෙන් සිංහලයා ඉතා ශිෂ්ටසම්පන්න ය. මද්‍ය පානය නො බොන්නේය. සොරකම් පිළිකුල් කරන්නේ ය. ගෙරිමස් මුවෙහි නො තබන්නේය. සිංහලයා ඉතා විනීත ය. ආගන්තුක සත්කාරයෙහි තත්පර ය. ස්වදේශීන් හට මෙන්ම කරුණාවෙන් විදේශීන්හට ද සලකන්නේය. ඉන්දියාවේ දී මට දකින්නට ලැබුණු හැම මිනිස් සංහතියකට ම වඩා මේ සිංහලයෝ ඉතා කරුණාවන්ත මනුෂ්‍ය කොට්ඨාශයකි. මොවුහු ඉතා කඩිසරයෝ ය. හුරුබුහුටි ගුණ ඇත්තෝ ය.''

රොබට් නොක්ස් සිංහල බෞද්ධයන් පිළිබඳ ව මෙසේ ප්‍රකාශ කරන්නේ ස්වාධීනත්වය අහිමි වූ යටත් විජිතයක විසූ සිංහලයන් පිළිබඳව ය. ඔහු ගුණ වණන සිංහල බෞද්ධයා ප්‍රාණඝාතයෙන්, සොරකමින්, කාම දුශ්චරිතයෙන්, මත්පැනින් වෙන් වූ කාරුණික, අනුන්ට සලකන, පන්සිල් රකින බෞද්ධයා මිස අන් කිසිවෙක් නොවේ.

එහි එසේ වුවද කාලයාගේ ඇවෑමෙන් සිංහල - බෞද්ධකම විනාශ කරන්නටත්, ගිහි - පැවිදි සම්බන්ධය දුරස් කරන්නටත්, බේබදුකමට, සල්ලාලකමට හා පරගැතිකමට විශේෂ සැලකිලි දක්වමින් බටහිර අධිරාජ්‍යවාදීන් සිදු කළ කෙළවරක් නැති තාඩන පීඩනවලට එරෙහිව ලංකාවේ විවිධ සමාජ මට්ටමේ පුද්ගලයන් සංවිධානය වී සන්නද්ධ කැරළි කෝලාහල, පරසතුරු ඝාතන ආදිය සිදු කළේ දේශපාලන බලකාමයකින් තොරව ''රට ජාතිය ආගම යන තෙරුවන රැක ගැනීම සඳහා ය'' යන පරමාර්ථය පෙරටුකොට ගනිමිනි.

කෙසේ හෝ ලංකාවට නිදහස ලැබීමෙන් පසුව ද ශ්‍රී ලංකාවේ පරිපාලනය අධිරාජ්‍යවාදී ගැත්තන්ගේ ඕනෑ එපාකම් ඉටු කරනා ආකාරයට ම සිදුවීම නිසා අනාගත දේශපාලන ගමන්මග වෙනස් කරන්නට පෙරමුණ ගත් එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා සිංහලය රාජ්‍ය භාෂාව කරන බවටත්, බුද්ධශාසනය හා බෞද්ධ අධ්‍යාපනය නගා සිටුවන බවටත් ප්‍රතිඥා දී 1956 දී බලයට පත්විය. විවිධ බාධා නිසා එය දුෂ්කර කාර්යයක් වූවත් 1959 දී විද්‍යෝදය හා විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයන් පිහිටවූයේ එතුමාගේ දේශපාලන පොරොන්දු ඉටු කිරීමක් වශයෙනි.

සිංහල මාධ්‍යයෙන් උසස් අධ්‍යාපනය ලබන්නට සරසවි වරම් ලබන ග්‍රාමීය තරුණ පෙළ ජාතික - ආගමික චින්තනයට නැඹුරු කිරීම සඳහා බෞද්ධ සංස්කෘතිය අනිවාර්ය විෂයයක් කිරීමටත්, විශ්ව දැනුම ළඟා කර ගත හැකි වන සේ ඉංග්‍රීසි භාෂාව ද අනිවාර්ය විෂයයක් කිරීමටත්, ප්‍රථම විශ්වවිද්‍යාලයාධිපතීන් වහන්සේ දුර දක්නා නුවණින් තීරණය කොට ඊට සරිලන පාඨමාලා සංවිධානය කරවූහ.

තරුණ පෙළ පහසුවෙන් විප්ලවීය චින්තනයේ ඉත්තන් කරගෙන කපටි දේශපාලනඥයන්ගේ අතාකොලු බවට පත් කරගැනීමෙන් වළක්වා ගතයුතු බවත් විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් ශාස්ත්‍රීය විචාර බුද්ධියට හා මානුෂික දායාවට මුල්තැන දෙන උගතුන් විය යුතු බවත් උන්වහන්සේ නිතර අවධාරණය කළහ.

1961 වර්ෂයේ පළ කළ විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රීය ප්‍රකාශනය වූ ''සරසවිය'' සඟරාවට ලිපියක් සපයන ශ්‍රී සෝරත නාහිමියෝ මේ විශ්වවිද්‍යාලයේ සිසුන් පිළිබඳ ව තම අපේක්ෂාව මෙසේ ලියා පළ කළහ.

1. විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් ගවේෂණශීලී විය යුතුය.
2. විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් විවේචනශීලී විය යුතුය.
3. විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් සත්‍යගරුක විය යුතුය.

4. විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් යුක්තිගරුක විය යුතුය.
5. විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් විප්ලවකාරී විය යුතුය.

මෙසේ මවු බිමේ අනාගතය ගොඩනැඟීමට විශ්වවිද්‍යාලයෙන් බිහිවිය යුතු උගතුන්ගේ චරිත ලක්ෂණ පහක් උන්වහන්සේ දුටහ. ශාස්ත්‍රීය බුද්ධියෙන් යුත් ගවේෂණශීලී චරිත ද, අනුන්ගේ මතවාද ඉවසමින් තර්කානුකූල ව විවාදයට ලක් කළ හැකි විවේචනශීලී චරිත ද අසත්‍යයෙන් අගතිගාමී නොවන සත්‍යගරුක චරිත ද නීතිය යුක්තිය සම්ප්‍රදාය ගරුකරන යුක්තිගරුක චරිත ද අසාධාරණයට - අවනීතියට එරෙහි ව නැගී සිටින සමාජවාදී දර්ශනයකින් මෙහෙයවන විප්ලවකාරී චරිත ද උපාධිධාරීන් සතු විය යුතු බව අවධාරණය කළහ.

එහෙත් අපේ රටේ අභාග්‍යයකට දෝ ආරම්භක විශ්වවිද්‍යාලයාධිපතීන් වහන්සේ ජීවත් ව සිටියදී ම පෙරට ආ ශිෂ්‍ය නායකයෝ උන්වහන්සේ මුලින් දැක්වූ මහාර්ඝ චරිතාදර්ශ හතර ම පසෙකට දා ශිෂ්‍ය නායක සටන් පාඨය කරගත්තේ ''විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් විප්ලවකාරීන් විය යුතුය'' යන තේමා පාඨය පමණි. එදා මෙදා අතරතුර ගත වූ පනස් වසරක කාලය තුළ දී මේ විප්ලවකාරී සටන් පාඨය රටටත්, අධ්‍යාපනයටත් කෙතරම් විනාශකාරී ශාපයක් වුයේදැයි ඔප්පු කිරීමට ඉතිහාසයෙන් පෙන්විය හැකි නිදසුන් අපමණ ය.

1961 වර්ෂයේ ගංගොඩවිල විශ්වවිද්‍යාල භූමියේ උපවාසයක යෙදුණු පැවිදි ශිෂ්‍ය නායක වටිනාපහ සරණසිරි හිමියන්ගේ මාරාන්තික සත්‍යග්‍රහයත්, දෙමළ භාෂාවට නිසි තැන ලබාදීමේ - සිංහල භාෂා පනතට බණ්ඩාරනායක අගමැතිතුමා ගෙන ආ සංශෝධනයට එරෙහි ව විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරයෙකු ව සිටි පාර්ලිමේන්තු මන්ත්‍රී කේ.එම්.පී. රාජරත්න මහතා ගාලු මුවදොර පාර්ලිමේන්තු මන්දිරයේ පෝටිකෝවේ ආරම්භ කළ මාරාන්තික උපවාසයට සහාය දැක්වූ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය හිමිනමකගේ හදිසි අපවත්වීමත් නමෝවිත්තියෙන් අප විශ්වවිද්‍යාලයේ ආරම්භ වූ විප්ලවීය ක්‍රියාකාරකම්වල අසුබ ප්‍රතිඵල විය.

පැවිදි ශිෂ්‍යයන්ට මුල්තැන දුන් විද්‍යෝදය විශ්වවිද්‍යාලයට ගිහි සිසුන් සම මට්ටමින් ඇතුළත් කර ගන්නා ලද්දේ 1963 වර්ෂයේදී ය. පැවිදි ශිෂ්‍යයන්ට වෙන්කර තිබුණු පොදු පහසුකම් වරප්‍රසාද බලෙන් හිමිකරගත් ගිහි සිසුන්, පොලු මුගුරු ගල් මුල්වලින් සන්නද්ධ ව පැවිදි සිසුන් සමග සිදුකළ මහා කෝලාහලය මුලු විශ්වවිද්‍යාල භූමිය ම යුද බිමක් බවට පත් කෙළේය. පොලීසිය පැමිණ තුවාල ලබා සිටි සිසුන් තිස් ගණනක් රෝහල් ගත කිරීමෙන් පසු තාවකාලික ව විශ්වවිද්‍යාලය වසා දැමීමට ද සිදුවිය.

1966 වසරේ දී ඊරියගොල්ල අධ්‍යාපන ඇමතිතුමා විශ්වවිද්‍යාල පනත සංශෝධනය කොට විද්‍යෝදය හා විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයන්ට කාන්තා පක්ෂයට ද ඇතුළුවීමට ඉඩ සලසා දෙනලදි. විශ්වවිද්‍යාලයීය අනුබද්ධ ආයතනවල බාහිර උපාධි පාඨමාලාවලට ලියාපදිංචි වී සිටි ශිෂ්‍යාවන් 60 කට මුල්වරට විද්‍යෝදය විශ්වවිද්‍යාලයට ඇතුළුවීමට අවසර ලැබුණි. මේ නිසා ශිෂ්‍ය සටන් වෙනුවට විද්‍යෝදය සරසවි බිමට නුහුරු ආදර සටන්, පෙම් සටන් ද ආරම්භ විය. උසස් පෙළ විභාගයෙන් සුදුසුකම් ලබන ශිෂ්‍යාවන් 1967 වර්ෂයේ සිට විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගත යුතුය යි ශිෂ්‍යයෝ පෙළපාලි ගියහ. එය සාර්ථක විය. කල්යාමේ දී විශ්වවිද්‍යාලය තුළ පැවිදි ශිෂ්‍ය හා ගිහි පිරිමි ශිෂ්‍ය සංඛ්‍යා ඉක්මවා ශිෂ්‍යාවන්ගේ සංඛ්‍යාව මුල්තැනට පත්විය. (අද උපාධි ලබන මේ පිරිසගේ නාම ලේඛනය ද එයට එක් නිදසුනකි)

උසස් අධ්‍යාපනයෙන් අපේක්ෂිත විචාර ශීලී - බුද්ධිමත් - විද්වත් චරිතාදර්ශ මුලුමණින්ම බිඳ වැටී සන්නද්ධ ශිෂ්‍ය දේශපාලන අරගල භයානක සේ පෙරමුණට ආ අවස්ථාව වූයේ 1971 අප්‍රේල් සන්නද්ධ කැරැල්ල යි. එහි සියලු සංවිධාන කටයුතු, සැලසුම්, පුහුණු කිරීම්, බෝම්බ හා අවි ආයුධ රැස් කිරීම්, කැරලි හමුදාවකට අවශ්‍ය නිල ඇඳුම් සකස් කිරීම්, ගබඩා කිරීම් වැනි සියලු මෙහෙයවීම් සිදුවූයේ විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය නේවාසිකාගාර තුළදී ය.

මගේ ජීවිතයට ද මේ සිද්ධි මාලාව දෛවයේ සරදමක් වූයේ එකල සෝරත නේවාසිකාගාරයේ පාලක ලෙස මා සේවය කළත් සියලු නේවාසිකාගාරවල පාලනය ශිෂ්‍ය නායක මහින්ද විජේසේකර මහතා බලෙන් ලබා ගැනීම නිසාය. රෑ බෝවීගෙන එන විට නේවාසිකාගාරවලට පිටතින් පැමිණෙන තරුණ පිරිස් මධ්‍යම රාත්‍රියේ සිට අලුයම දක්වා බණ්ඩාරනායක ශාලාව පිටුපස පිට්ටනියට රෑ ස්කොට සටන් අභ්‍යාස හා අවි-ආයුධ පුහුණුව මාස ගණනක් තිස්සේ ලබා දෙන ලදි. ඊට විරුද්ධ ව කිසිදු පියවරක් ගැනීමට නො හැකි වන අයුරින් මහින්ද විජේසේකර මහතා ශිෂ්‍ය බලය සංවිධානය කර තිබිණි. ප්‍රධාන අවි- ආයුධ ගබඩාව තිබූයේ ලේඩි මාග්‍රට් රොබට්ස් භික්ෂු නේවාසිකාගාරයේ සිවිලිම මතය. එම අංශය භාරව සිටියේ මීතිපේ සෝභිත හිමියන් බව ත්‍රස්ත විමර්ශන විශේෂ අධිකරණයේ දී රජයේ ප්‍රධාන සාක්ෂිකරු ලෙස සාක්ෂි දෙමින් ඔහු කියා සිටියේය.

සන්නද්ධ අරගලය තවත් රවක් මට දෛවයේ සරදමක් වූයේ විශ්වවිද්‍යාලයෙන් අධ්‍යාපන චාරිකාවක් පිටත් ව යාපනයේ නාග විහාරයේ ගත කළ 1971 අප්‍රේල් 4 වෙනිදා රාත්‍රියේ දී ය. එදින රාත්‍රි 12.00 ට පමණ දසතින් ඇසුණ නො නවතින වෙඩි හඬ හා බෝම්බ හඬ මැද්දේ පොලිස් හමුදාවක් නාග විහාරයේ විශ්‍රාම ශාලාවට කඩා වැදී අප සියලු දෙනාම මරා දමන බවට තර්ජනය කර, යාපනයේ පොලිස් මූලස්ථානයට ගෙන ගොස් ඒ අවට මරා දමා තිබුණු සිවුරු පොරවාගත්, නිරුවත් හා අඩ නිරුවත් සිසුන්ගේ මෘත ශරීර පෙන්වමින් ''තොපිටත් මේ ටික තමයි අද සිද්ධ වෙන්නේ'' යයි කියමින් තර්ජනය කරන ලදි.

පොලීසිය මෙසේ දරුණු ලෙස කිපී සිටියේ මේ වන විට උසාවි නියෝගයක් මත රෝහණ විජේවීර යාපනයේ සිරගෙයි රිමාන්ඩ් භාරයේ සිටි නිසා කොළඹින් බස් රිය ගණනාවකින් පැමිණි විශ්වවිදාල හා පාසල් සිසුන් හිරගෙදරට පහර දී රෝහණ විජේවීර නිදහස් කර කොළඹට ගෙන ඒමටත් ඒ සමගම යාපනයේ පොලිස් මූලස්ථානය ඇතුළු ලංකාව පුරා පොලිස් ස්ථානවලට දැඩි ප්‍රහාර එල්ල කිරීමටත් සැලසුම් කොට ක්‍රියාත්මක කර තිබුණු බව ඒ වනවිට පොලීසිය දැන සිටි නිසා ය.

ආචාර්ය මණ්ඩලයේ එදා සේවය කරමින් සිටි ආචාර්ය වල්පොළ පියනන්ද හිමියෝ ඉදිරිපත් වී යාපනයේ පොලිස් අධිකාරීතුමාට කරුණු පැහැදිලි කර, අප විශ්වවිද්‍යාලයෙන් අධ්‍යාපන චාරිකාවක් සඳහා පැමිණි පිරිසක් මිස කළකෝලාහල කරන්නට නො පැමිණි බවත් දිසාපතිතුමාට දැන්වුවහොත් වැඩි දුරටත් සත්‍ය දැන ගත හැකි බවත් කියා සිටියහ. පොලිස් පණිවිඩයක් මත ටික වේලාවකින් එහි පැමිණි යාපනයේ මහ දිසාපතිතුමා හා අධ්‍යාපන අධ්‍යක්ෂකතුමා අප පිළිබඳව සහතික කොට නිදහස් නො කෙළේ නම් අද ඔබ අමතන්නට මා ජීවතුන් අතර නො සිටින්නට ඉඩ තිබුණි.

කෙසේ හෝ අඳුරු නීතිය මැද්දේ යාපනයේ සිට ගංගොඩවිලට එන්නට දෙ දිනක් ගත විය. අප එන විට විශ්වවිද්‍යාලය වසා දමා හමුදා කඳවුරක් බවට පත් කර තිබිණ.

විද්‍යෝදය විශ්වවිද්‍යාල භූමිය තුළ සිදු වූ අදූරදර්ශී විප්ලවීය දේශපාලන ශිෂ්‍ය සටන්වල ඛේදජනක අඳුරු මතක සටහන් ඇත්තේ එකක් දෙකක් නොවේ. 1988-1990 දෙවන සන්නද්ධ විමුක්ති අරගලය දියත් වූ කාලයේ හා ඉන් පසුව සරසවි භූමියෝ දී ශිෂ්‍ය ජීවිත තුනක් ඝාතනය කරනවා දකින්නට තරම් අපි අවාසනාවන්තයෝ වීමු. වරක් විරුද්ධ දේශපාලන කල්ලියක ශිෂ්‍යයකු අල්ලා පිහියෙන් ඇන සාහසික ලෙස මරා දැමීමත් තවත් වරක විප්ලවයට එරෙහි වූ ශිෂ්‍යයෙකුට තද බල ලෙස පහර දී තලා පෙළා සුමංගල මන්දිරය ඉදිරිපිට ගහක බැඳ දමා පසුව වෙඩි තබා ඝාතනය කිරීමත් ඊටත් මෑත භාගයේ කළමනාකරණ පීඨ ගොඩනැගිල්ලේ දී දේශපාලන විරුද්ධ අදහස් දැරූ ශිෂ්‍යයෙකුගේ හිසට පරිගණකයකින් පහර දී මරා දැමීමත් නිදහස් අධ්‍යාපනය ලබන විචාරශීලී - බුද්ධිමත් - උදාර චරිතවලට හිමිකම් කිවයුතු විශ්වවිද්‍යාල සිසුන් අතින් සිදු නො වියයුතු සාපරාධී පාපකර්මයන් නො වේ ද?

විශ්වවිද්‍යාල සිසුන්ගේ අදූරදර්ශී සන්නද්ධ අරගලය නිසා 1971 කැරැල්ලේ දී සිංහල බෞද්ධ තරුණ-තරුණියන් හා තරුණ හිමිවරුන් 60,000 ක් පමණ ඝාතනය වූ බවත්, 1988-1990 කැරැල්ලේ දී රෝහණ විජේවීර උඩරට වතු පරිපාලකයකු ලෙස වෙස් වලාගෙන සුපිරි ජීවිතයක් ගත කරද්දී ඔහුගේ ම ගෝලයන් විසින් පාවා දී ඝාතනය කිරීමෙන් කැරැල්ල නිම වන තුරු වටිනා තරුණ ජීවිත ලක්ෂයකට අධික සංඛ්‍යාවක් ජාතියට අහිමි වූ බවත් වාර්තා විය.

මෙසේ විද්‍යෝදය ඉතිහාසයේ 50 වසරක කඳුළු කතාවලින් සමහරක් ඔබ වෙත ඉදිරිපත් කෙළේ උසස් අධ්‍යාපනයෙන් ජාතියට දායාද කළ යුතු උසස් පෞරුෂය හා චරිතාදර්ශයන් සෝදාපාළු වී අපේක්ෂා භංගත්වයට පත් වීමත්, විශ්වවිද්‍යාල තුළ දී මනසේ පුරවා ගෙන සිටින හිස් සටන්කාමීත්වය උපාධිධාරීන් ලෙස සමාජගත වීමේ දී ඔබටත් - සමාජයටත් වැදගත් වන බව අවබෝධ කර දීමටත් ය.

පළමු වන ශ්‍රේණියේ සිට උසස් පෙළ දක්වා පාසල් පොත්පත් නිල-ඇඳුම් හා වෙනත් පහසුකම් ජනතාවගේ මුදලින් නොමිලයේ ලබාදෙන සම්පූර්ණ පාසල් අධ්‍යාපනයත්, වෛද්‍ය විද්‍යා උපාධිය දක්වා විශ්වවිද්‍යාලවලින් උසස් අධ්‍යාපනය හා පශ්චාද් උපාධි අධ්‍යාපනයත් නොමිලයේ ලබාදෙන ලොව එක ම රට ශ්‍රී ලංකාව බව කිසිදා ඔබ අමතක නො කරන්න.

තුන් වසරක් හෝ සිවු වසරක් තිස්සේ විශ්වවිද්‍යාලයේ පවත්නා සියලු සම්පත්වල හිමිකරුවන් වෙමින් ද බොහෝ දෙනෙක් ශිෂ්‍යත්ව හෝ ශිෂ්‍යාධාර ලබමින් ද රටේ ජනතාවගෙන් නොමිලයේ ලබාගත් මේ මහා උපකාරයට ඔබ දක්වන ප්‍රති උපකාරය කුමක්දැයි සිතන්නට හොඳ ම දවස උපාධිධාරීන් ලෙස ඔබ සමාජයට පිවිසෙන අද දිනය බව ද සිහි කරන්න.

තවදුරටත් ඔබ කපටි දේශපාලනඥයන්ගේ අනුගාමිකයන් නො වියයුතු අතර, අප විශ්වවිද්‍යාලයේ උසස් පරමාර්ථයන් වන ගවේෂණශීලි - විවේචනශීලි - සත්‍යගරුක - යුක්තිගරුක - බුද්ධිමත් - බෞද්ධ සංස්කෘතියට අනුව හැඩ ගැසුණු ප්‍රගතිශීලී අදහස් ඇති පුරවැසියන් වීමට අද සිට කල්පනා කරන්නට ඔබට ආරාධනා කරමි.

අද දින උපාධි ලබන, ජාතියේ මහා ශක්තියක් වන, මේ සියගණනක් උගත් තරුණ දූ පුතුන්ට ශ්‍රී ලාංකික සිංහල - බෞද්ධයන්ට හිමි ජාතික, ආගමික, චරිතාදර්ශවලින් හා පෞරුෂයෙන් පරිපූර්ණ ව රටට-ජාතියට උදාර සේවයක් කිරීමට ශක්තිය හිමිවේවායි! සුබාසිරි පතමි.

<u>*2009.12.27*</u>

# 36

# තොරතුරු තාක්ෂණ යුගයේ උසස් අධ්‍යාපනය

මහාචාර්ය සමරජීව කරුණාරත්න

## උසස් අධ්‍යාපනයේ අනාගතය

විසි එක්වන සියවසේ දී අප ප්‍රවිෂ්ට ව ඇත්තේ දැනුම පදනම් කර ගත් ආර්ථිකයකටය. මෙම නව ආර්ථිකයට නිතිපතා වර්ධනය වන දැනුම යොදා ගනිමින් විවිධ අවශ්‍යතා පරිපාලනය කළ හැකි මානව සම්පත් අවශ්‍ය වේ. එවැනි මානව සම්පත් බිහි කිරීමට විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවලට පැවරී ඇත්තේ විශාල වගකීමකි. මෙම ආයතනවලට ඇතුළත් වීමේ මහඟු බලාපොරොත්තුවෙන් පසුවන සිසු සිසුවියන්ගේ සංඛ්‍යාව මෙම තත්ත්වය මනාව පිළිබිඹු කරයි.

අප දන්නා ආකාරයට, සාම්ප්‍රදායික විශ්වවිද්‍යාලවල විවිධ බාධක නිසා මෙම වගකීම් ඉටු කිරීමට දැඩි අපහසුවක් තිබේ. නූතන සමාජයට අවශ්‍ය ව ඇත්තේ ශීඝ්‍රයෙන් වර්ධනය වන තාක්ෂණ දැනුමයි. එම දැනුම පූර්ණ වශයෙන් ලබා දීමට අවශ්‍ය භෞතික සම්පත් මෙන් ම විශේෂඥ දැනුම ද සම්ප්‍රදායික විශ්වවිද්‍යාල සතු ව නොමැති බව කවුරුත් පාහේ දන්නා කරුණකි. විශ්වවිද්‍යාලවලට ඇති ප්‍රතිපාදන සීමිතය. තව ද ඒවා දැඩිව වෙනස් කිරීමට අපහසු දින දර්ශනයක් ද ඇති බැවින්, ඉගැන්වීම හෝ ඉගෙන ගැනීම නම්‍යශීලී ලෙස කිරීමට ඇති ඉඩකඩ බොහෝ සේ මදය.

දැඩි විෂය සංකලන, සපුරාලිය යුතු පෙර අවශ්‍යතා වෙනස් කිරීම්වලට නිරන්තරයෙන් පැන නැගෙන ශිෂ්‍ය විරෝධතා ආදිය නව ආර්ථිකයකට අවශ්‍ය දැනුම ලබා දීමේ මංපෙත් අසුරාලයි.

සාම්ප්‍රදායික විශ්වවිද්‍යාලවලට අපමණ ක්‍රියාකාරකම් සමුදායක් ඉටු කිරීමට සිදු වී ඇත. ඒවායින් සමහරක් නම්,

1. විෂය අන්තර්ගතය නිර්මාණය කිරීම
2. ඉගැන්වීම
3. ශිෂ්‍ය ඇගයීම්
4. පරිපාලනය
5. අදාළ ගුණාත්මක තත්ත්ව සැකසීම
6. ආයතන ඇගයීම

උසස් අධ්‍යාපනයේ ඊනියා ජනතාකරණය නැතහොත් ශිෂ්‍ය සංඛ්‍යාවේ ඉහළ යෑමත් සමඟ කාර්යක්ෂම සහ ඵලදායී ලෙස එම සියලු කාර්යයන් ඉටු කිරීමට විශ්වවිද්‍යාලය වැනි තනි ආයතනයකට අපහසු බව බොහෝ කාලයක සිට අවබෝධ වී ඇත. එසේ ම විශ්වවිද්‍යාලවලට තෘතීයික අධ්‍යාපන මට්ටමේ සිදුවන සැබෑ වෙනස්කම්වලට ප්‍රතිචාර දැක්වීමට ද සිදු වී තිබේ. සම්ප්‍රදායික විශ්වවිද්‍යාලවල දැනට පවතින ආයතන කේන්ද්‍රීය ඉගැන්වීමේ ආකෘතිය ඉවත ලා විශ්වකරණීය වූ ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ව්‍යුහයක් කරා යොමු වීමට අවශ්‍ය ව ඇත.

මේ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමේ ක්‍රමවේදය විශ්වවිද්‍යාල සීමාව ඉක්මවා යන අතර වෙනත් ආයතන රැසක් ඒ සඳහා සහභාගි කර ගත යුතු ව ඇත. රාජ්‍ය සහ පෞද්ගලික විශ්වවිද්‍යාල, මාධ්‍ය ආයතන, ප්‍රකාශකයන්, තත්ත්ව විශේෂඥයන්, වෙළෙඳපොළ තාක්ෂණ සේවා සපයන්නන් සහ ඍජු හා වක්‍ර ලෙස අධ්‍යාපන සේවා සපයන්නන්, සියල්ලම පද්ධතියක් ලෙස ක්‍රමවත් ව අන්තර්ග්‍රහණය කළ යුතු ව ඇත.

මේවා සියල්ල ම අවශ්‍ය පරිදි ඒකරාශී කිරීම කළ හැක්කේ කෙසේ ද?

සමහර විට මෙය ඉටු කර ගැනීමේ හොඳම ක්‍රමය තොරතුරු භාවිතය සහ සන්නිවේදන තාක්ෂණය මනා ලෙස භාවිතයට ගැනීමයි. අප දකින ආකාරයට එය සංඛ්‍යාංක තාක්ෂණය පදනම් වූ ක්‍රමවේදයක් විය හැකිය. විශේෂයෙන් ගෝලීය සංඛ්‍යාංක ඉගෙනීමේ යටිතල පහසුකම් (DELI) වැනි නව ඉගෙනීමේ අවශ්‍යතා ලබා ගැනීමේ හොඳම ක්‍රමය අන්තර්ජාල භාවිතයයි. එවැනි යටිතල පහසුකමක් ඍජු හා වක්‍ර ඉගෙනීම සඳහා සුවිශේෂී වූ මෙවලම් පද්ධතියක් සපයයි. තව ද, සම්පත් දායකයන් මෙන් ම, සගයන් අතර සහසම්බන්ධතාව පවත්වා ගෙන යාමට ඇති හැකියාව ඉගෙනීමේ ක්‍රියාවලියේ වර්ධනයට අඛණ්ඩ ප්‍රතිපෝෂණ සපයයි.

සාම්ප්‍රදායික විශ්වවිද්‍යාලවල මෙන් නොව, සංඛ්‍යාංක ගෝලීය ඉගෙනීමේ යටිතල පහසුකම්වල දී විෂය අන්තර්ගතය සහ බෙදා හැරීම, උපදෙස් මාලාව පරිපාලනය, තත්ත්ව සහතිකය, ඇගයීම, සම්මත සැකසීම එහි ගුණාත්මක බව සහතික කිරීම වැනි විවිධ ක්‍රියාකාරකම් අන්තර් ජාලය හරහා ගෝලීයකරණය කළ හැකිය.

සංඛ්‍යාංක තාක්ෂණය මගින් හෙට දවසේ ඉගෙනීමේ අවශ්‍යතා සපුරාලීම.

## ඉගෙනීමට ප්‍රවේශය

අද අන්තර්ජාලය හරහා ඕනෑම තැනක සිටින ඕනෑම අයෙකුට ඕනෑම වේලාවක දී ඉගෙනීමට අවශ්‍ය විෂය අන්තර්ගතයන් සහ අදාළ උපදෙස් සැපයිය හැකිය. අවශ්‍ය නම් ශිෂ්‍යයන් දවසේ පැය 24 පුරා ම අන්තර්ජාල පුළුල් පරාස ප්‍රවේශ පහසුකම් තිබේ නම්, විෂය කරුණුවලට ප්‍රවේශ විය හැකිය. කවුරුත් දන්නා පරිදි මේ සඳහා පෞද්ගලික පරිගණකයක් අත්‍යවශ්‍ය වේ. මේ සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට දේශන ශාලා සහ ශ්‍රවණාගාරවලට එක්රොක් වීම අවශ්‍ය නොවේ. ගෙදර දී නේවාසිකාගාරවල දී හෝ වෙනත් ඕනෑම තැනක දී ඔවුන්ට පරිගණකයෙන් විෂය කරුණුවලට ප්‍රවේශ විය හැකිය. ගෙදර දී අන්තර්ජාල පහසුකම් නොමැති අවස්ථාවල දී ශිෂ්‍යයන්ට එවැනි පහසුකම් ඇති ස්ථානයකට වෙනත් සුදුසු DVD හෝ CD වැනි සුදුසු මාධ්‍යයට විෂය කරුණු පිටපත් කර පසුව තමාට පහසු වන පරිදි නිවසට පැමිණ තම පරිගණක යන්ත්‍රයෙන් ඒවා අධ්‍යයන කළ හැකිය.

## අධ්‍යාපනයේ ගුණාත්මක බව

ශිෂ්‍යයා ලෝකයේ කවර තැනක ජීවත් වුවත්, අන්තර්ජාලය හරහා ඔහුට ලෝකයේ හොඳ ම සම්පත් කරා ප්‍රවේශ විය හැකිය. තොරතුරු තාක්ෂණය බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ මගින් හොඳම දේශකයෝ ශිෂ්‍යයන් වෙත ඕනෑම වේලාවක ඕනෑම තැනකට ගෙන යනු ලැබෙති. ඉතා විශාල දැනුම් සම්භාරයක් අන්තර්ජාලයේ පවතින අතර දිනපතා ම තව තවත් බුද්ධිමය සම්පත් එයට එකතු වේ. අනාගතයේ දී සාමාන්‍ය හෝ විශේෂ කරුණු සහිත සම්පූර්ණ සංඛ්‍යාංක දැනුම් පුස්තකාල සහ විවිධ උපදෙස් මාලා බහුල වශයෙන් අන්තර්ජාලයේ පවතිනු ඇත. අධ්‍යාපනයේ වර්ධනයට සංඛ්‍යාංක ගෝලීය අධ්‍යාපන යටිතල පහසුකම් උපාංග රැසකි. එනම්, පිරික්සුම් යන්ත්‍ර, අන්තර්ජාල පහසුකම් සපයන මෘදුකාංග, බහු මාධ්‍ය යෙදීම සඳහා සංයුක්ත තැටි හා වීඩියෝ තැටි, අන්තර්ජාල පදනම් කර ගත් සම්මන්ත්‍රණ යනාදිය අධ්‍යාපනයේ ගුණාත්මක භාවය වර්ධනය කිරීම සඳහා දායක වේ.

## අධ්‍යාපන වියදම

සංඛ්‍යාංක ගෝලීය අධ්‍යාපන යටිතල පහසුකම් තහවුරු වීමත් සමඟ වියදම අනිවාර්යයෙන් ම පහත වැටේ. මා මෙහි දී වියදම ගැන කතා කරන්නේ දියුණු රටවල අධ්‍යාපන වියදමට සාපේක්ෂකවය. විෂය අන්තර්ගතය සූදානම් කිරීම සඳහා දරන මූලික වියදම පුළුල් පරාස අන්තර්ජාල ප්‍රවේශය සැපයීම සඳහා යන වියදම මිලියන ගණනක් වූ අන්තර්ජාල භාවිත කරන්නන් අතර බෙදී ගිය විට එක ශිෂ්‍යයෙකුට දැරීමට සිදුවන වියදම බෙහෙවින් අඩු වේ. තවදුරටත් පුදුමයට කරුණක් වන්නේ, සංඛ්‍යාංක උපකරණවල මිල ඒවායේ කුඩාකරණයත් අතිශය සංයුක්ත වීමත් සමඟ පහත වැටීමයි. උදාහරණයක් ලෙස අතීතයේ දී 4000 MB දෘඪ තැටියක් ගෙන යන ලද්දේ ලොරියකය. එහෙත් වර්තමානයේ දී 4000 MB දෘඪ තැටියක් කෙනෙකුගේ ගමන් මල්ලේ රැගෙන ආ හැකිය.

සිලිකෝන් මයික්‍රෝ චිෂයේ ක්‍රියාකාරකම් සෑම මාස 18 කට වරක් ම කිසිදු වියදමකින් තොරව දෙගුණ වන බව කියවේ. සංඛ්‍යාංක දෘඪකාංගවල වියදම පහත වැටෙමින් පවතින අතර, ශිෂ්‍යයන්ට අවශ්‍ය වනුයේ අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා අඩු වියදම් දෘඪකාංගයි. මෙහි ඇති වාසිය වනුයේ ආයතන කේන්ද්‍රීය අධ්‍යාපනය සඳහා වැය වූ ප්‍රවාහන වියදම තවදුරටත් අවශ්‍ය නොවීමයි. සන්නිවේදන ප්‍රවාහනය වඩා ලාභදායක බැවින් තවදුරටත් වියදම අඩුවේ.

## අනාගත අධ්‍යාපනය

සංඛ්‍යාංක ගෝලීය අධ්‍යාපනය යටිතල පහසුකම්වල දී පාඨමාලා පුළුල් පරාසයක අධ්‍යාපන රටාවන්ට අනුවර්තනය වන අයුරින් සහ ඉල්ලුමට සරිලන පරිදි ස්වයං පාලිතය. පුළුල් පරාසයක විශේෂඥ දැනුමක් ඇති අය විසින් උපදෙස්මාලා සම්පාදනය කරනු ලැබේ. ඇතැම් දේ ශික්ෂණාත්ම සංඝටකවල තත්ත්වයට ආකෘතිගත කෙරේ. එනම්, දේශන මඟ පෙන්වීම්, නිබන්ධන, පැවරුම් සහ පරීක්ෂණ, අනික්වා බෙහෙවින් සුවිශේෂී වේ. උදාහරණ ලෙස පාඨ්‍ය ග්‍රන්ථ, තුල්‍යයන්ට සම්බන්ධ බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ ඇතුළු ද්විමාන, ත්‍රිමාන මාධ්‍ය රූප, සම්පත් පුද්ගලයන් සමඟ අන්තර් ක්‍රියාකාරකම් යනාදියයි.  සපයන්නන් සහ අන්තර් ග්‍රහණය කරන්නෝ, ශිෂ්‍යයන්ගේ අවශ්‍යතාවන් හා ප්‍රමුඛතාවන්, ඔවුන්ගේ දියුණුව හා ප්‍රතිචාර පිළිබඳව ද හොඳින් අවබෝධයක් ඇති අය වෙති. ඔවුහු එම අධ්‍යාපන ද්‍රව්‍ය පැයෙන් පැය හෝ දිනපතා හෝ යාවත්කාලීන කරති. විෂය අන්තර්ගත නිර්මාණකරුවන් සහ මෘදුකාංග ඉංජිනේරුවෝ අවශ්‍යතා අනුව පාඨමාලා සකස් කොට සති කිහිපයකින් ලෝකය පුරා බෙදා හරිති. එමෙන් ම බෙදාහරින්නෝ විෂය අන්තර්ගතය, බෙදා හැරීම, ඇගයීම, තත්ත්ව සහතිකය ආදිය මගින් අධ්‍යාපන ක්‍රියාවලියේ සියලු අපේක්ෂාවන් සැපයුම්කරුවන් සහ පාරිභෝගිකයන් අන්‍යෝන්‍ය වශයෙන් ග්‍රහණය කර ඇත. විශ්වවිද්‍යාල, විෂය අන්තර්ගතය පිළිබඳ විශේෂඥයන්, තාක්ෂණ ව්‍යාපාර, එම ව්‍යාපාර භාවිත කරන්නන් සහ ස්වාධීන විද්වතුන් යන සියල්ලෝම සංඛ්‍යාංක ගෝලීය අධ්‍යාපන යටිතල පහසුකම්වල කොටස්කරුවෝ වෙති.

සංඛ්‍යාංක ගබඩාකරණය මගින් පොත්පත්, චිත්‍ර, සිනමාපට යනාදි අන්තර් සම්බන්ධතා අධ්‍යයන සම්පත් ගබඩාකර තිබේ. ඇත්ත වශයෙන් ම ආචාර්ය ජෝන් ටේලර් (සභාපති (IEE 98/99) මහතාට අනුව දැනට ලියැවුණු, රචනා කරන ලද, රඟ දක්වන ලද, අඳින ලද, නැතහොත් විශිෂ්ට ලෙස වාර්තා ගත කරන ලද සියලු දේ ඉදිරි 20 වර්ෂය ඇතුළත සංඛ්‍යාංක ආකෘතියට ඇතුළත් කරනු ලැබේ. ඒවාට ගෝලීය තොරතුරු භාවිතය තුළින් ප්‍රවේශ විය හැකිය. ලොව පුරා තොරතුරු බෙදා හැරීම සඳහා සම්ප්‍රේෂණ තාක්ෂණය අත්‍යවශ්‍ය විප්ලවයකි. නව අධිවේගී අධිධාරිතාවක් සහිත දෘෂ්ටි තන්තු සම්ප්‍රේෂණ තාක්ෂණයට තත්පරයකට කොටස් මිලියන දහසක (terabit) වේගයකින් තොරතුරු ගෙන යා හැකිය. එනම්, මුළු පුස්තකාලයක ම තොරතුරු තත්පර 20 ඇතුළත බෙදා හැරිය හැකිය.

## නිගමනය

සංඛ්‍යාංක තාක්ෂණය අධ්‍යාපන ක්‍රමවේදය විප්ලවීය මඟකට යොමු කොට තිබේ. අපි සංඛ්‍යාංක ගෝලීය යටිතල පහසුකම්, එනම් ශිෂ්‍ය කේන්ද්‍රීය සත්‍ය ගෝලීය අන්තර්ජාල අධ්‍යාපන සේවාවන් සමාජයේ ඉගෙනීම් අනාගත අරමුණු සාර්ථක කර ගැනීම සඳහා පදනමක් ලෙස සලකමු. මෙය වර්තමායේ ආයතන කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමවේදය අභිභවා යයි. එපමණක් නොව එය සම්ප්‍රදායික විශ්වවිද්‍යාලයක ආකෘතිකරණයෙන් සැකසුණු විශ්වවිද්‍යාල ද අභිභවා යයි.

මෙම ශත වර්ෂයේ අධ්‍යාපන අවශ්‍යතාවන් සපුරාලීමට පියවරෙන් පියවර දැනට ගොඩ නඟමින් පවතින සංඛ්‍යාංක ගෝලීය අධ්‍යාපන යටිතල පහසුකම් අධ්‍යාපන තේමාවේ දියුණු වන වෙළඳපොළට සීමා වී ඇත. මෙහි දී ලෝකය පුරා විසිරී සිටින මිලියන ගණන් ශිෂ්‍යයෝ පෞද්ගලිකවත් අධ්‍යාපනික ආයතනික සම්පත් සමගත් අන්තර් සම්බන්ධතා පවත්වති. විෂය අන්තර්ගත පුළුල්පථ ගොඩබිම සන්නිවේදනය හා චන්ද්‍රිකා තාක්ෂණය මගින් අන්තර් ජාලය ඔස්සේ බෙදා හරිනු ලැබේ.

සංඛ්‍යාංක ගෝලීය අධ්‍යාපන යටිතල පහසුකම් ශිෂ්‍යයන්ට පහත සඳහන් කරුණු ලබා දේ.

1. විවිධ අධ්‍යාපන රටා සහ අධ්‍යාපන අවශ්‍යතා සඳහා යොමුවීම.
2. ජීවිතය පුරා අධ්‍යාපනය ලැබීම සහ වෘත්තීය සංවර්ධනය ඇති කර ගැනීම.
3. ජාත්‍යන්තර අධ්‍යාපනය නිවස තුළදීම ලැබීම.
4. අවසාන වශයෙන් තොරතුරු යුගයේ කාර්යක්ෂම සාමාජිකයකු ලෙස නිරතවීම.

එනම්,
ව්‍යාපාර - e ව්‍යාපාර,
වාණිජ - e වාණිජ,
ආණ්ඩුව - e ආණ්ඩුව,

කෙටියෙන් කිවහොත් සංඛ්‍යාංක ගෝලීය අධ්‍යාපන යටිතල පහසුකම් අනාගත සමාජයට විශාල පිරිසකගේ අධ්‍යාපන අවශ්‍යතා තෘප්තිමත් කිරීමට උදව් කෙරේ. ඉදිරි වර්ෂ 20 දී බිහිවන පරම්පරාව අන්තර්ජාලයට ඇබ්බැහි වූ, තිරයට ඇලුණු මිනිස් සන්නිවේදනයට අකැමැති පිරිසක් වනු ඇතැයි ඇතැම්හු මත පළ කරති. මේ අතර පිරිසක් සයිබර් අවකාශය නොසන්සුන් පරිසරයක් සහ සෘජු ප්‍රජාව නැතහොත් අන්තර්ජාල ප්‍රජාව සාමාන්‍ය ප්‍රජාව මෙන් ම හොඳ යයි සලකති.

## පශ්චාද් රචනය

1999 දී මම මොරටුව විශ්වවිද්‍යාලයේ උපකුලපති වශයෙන් සේවය කරද්දී මෙම දේශනයේ කොටසක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පැවැත් වූවෙමි. එම අවදියේ DGLI පිළිබඳ කතා කිරීම සිහිනයකි. එහෙත් අද DGLI හි ඇතැම් කොටස් නියමිත ලෙස ස්ථානගත වී ඇති අතර සම්පූර්ණයෙන් ම ක්‍රියාත්මක වෙමින් පවතී. උදාහරණයක් වශයෙන් ඇමරිකාවේ මිනොසොටා විශ්වවිද්‍යාලයේ පාඨමාලා හයසීයයකට අධික ප්‍රමාණයක් අන්තර් ජාලය ඔස්සේ පවත්වාගෙන යනු ලැබේ. එමෙන් ම සම්භාව්‍ය Massachusetts තාක්ෂණික ආයතනයේ පාඨමාලා විශාල ප්‍රමාණයකට නොමිලයේ ප්‍රවේශ විය හැකිය. එමෙන් ම ලංකාවේ තොරතුරු තාක්ෂණය පිළිබඳ ආයතනයේ පාඨමාලා විශාල ප්‍රමාණයක් අන්තර්ජාලය ඔස්සේ අධ්‍යාපන කළමනාකරණ පද්ධතිය (LMS) යටතේ සිසුනට ප්‍රවේශ විය හැකිය. එහි දී ඔවුන්ට ඔවුන්ගේ කැමැත්ත පරිදි ග්‍රහණය කළ හැකිය. එමෙන් ම ශිෂ්‍යයන්ට ගැටලුවලට අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් පිළිතුරු ලබා ගත හැකි අතර, විභාගවලට ද අන්තර්ජාලය හරහා මුහුණ දිය හැකිය. මෙයින් පෙනී යන්නේ DGLI තවදුරටත් සිහිනයක් නොවන බවයි. කාලය සමඟ ක්‍රමයෙන් එය ප්‍රායෝගික බවට පත් කර ඇත. ඊළඟ දශකයේ දී මෙම ක්‍රමවේදය අපගේ අධ්‍යයන ක්‍රමවේදය සඳහා ද අප වැනි රටවල වඩා උසස් අන්දමින් භාවිත කළ හැකිය.

## පශ්චාද් රචනය 11

අප රටේ පරිගණක භාවිතය ගැන කතා නොකළහොත් මගේ කථාව අසම්පූර්ණ යයි මම සලකන්නෙමි. ලංකාවේ පළමු සංඛ්‍යාංක පරිගණක ක්‍රමය ආරම්භ වූයේ 1967 දීය. එය ස්ථාපිත කරන ලද්දේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ (SEC) ය. එය ලංකාවේ එකල පැවති විශාලතම සිවිල් ඉංජිනේරු ගොඩනැංවීමේ අයතනය විය. කීර්තිමත් ආචාර්ය ඒ.එන්.එන්. කුලරත්න මහතා එහි ප්‍රධානියා වූයේය. SEC ආයතනයේ වෘත්තිකයින් 15,000 ක් පමණ වූ අතර, ඉංජිනේරුවන් 300 ක් පමණ ද, ගෘහ නිර්මාණ ශිල්පීන් සහ අනෙකුත් ඉංජිනේරු කුසලතා ඇති අය ද සේවය කළහ.

තරුණ ඉංජිනේරුවරයෙකු වශයෙන් සහ එහි කළමනාකරු වශයෙන් එම මුල්ම පරිගණකය ස්ථාපිත කිරීමේ වාසනාව මට හිමි විය. මූලික වශයෙන් අප එය භාවිත කරන ලද්දේ තොරතුරු පද්ධති කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, මූල්‍ය සම්පත් කළමනාකරණය, බඩු ලැයිස්තු අන්තර්ගතය සහ සිවිල් ඉංජිනේරු ව්‍යාපෘති කළමනාකරණය සඳහායි. ඊළඟ පියවරේ දී මෙම පරිගණක පද්ධතිය භාවිත කරන ලද්දේ සිවිල් ඉංජිනේරු නිර්මාණ, විදුලි බල පද්ධති සකස් කිරීම සහ ජාතික ආර්ථිකයේ ආර්ථික සැලසුම් සකස් කිරීම සඳහා ය. මේ මගින් කරන ලද ඉතාම සංකීර්ණ සිවිල් ඉංජිනේරු සැලැස්ම වනුයේ කළුතර චෛත්‍යයයි. එය කුහරමය ව්‍යුහයක් වන අතර, එය ජාතික ස්මාරකයකි. එහෙත් එහි ඉතිහාසය හා සැලැස්මේ ඇති පරිගණකමය සංකීර්ණතාව පිළිබඳව මහජනතාව දැනුවත් නැත. 1968 දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ තුන් ලක්ෂ හැට දහසකගේ විභාග ලකුණු ලැබී සති දෙකක් තුළ ප්‍රතිඵල නිකුත් කිරීමට හැකිවිය.

මේ ක්‍රමය අනුගමනය කිරීමට පෙර ඒ සඳහා මාස හයක කාලයක් ගත විය. මෙම වගකිව යුතු කාර්යභාරය කරන ලද්දේ පරිගණක භාවිතයේ ළදරු අවධියේ දීය. එකල උසස් පරිගණක භාෂාවන් හෝ අන්තර්ජාතික මාධ්‍ය රූප නොතිබුණි. එවැනි මූලාරම්භයකින් පසු වර්තමානයේ දී අපට 25% සිට 30% වූ පරිගණක භාවිතයකට අවකාශ ඇත. පෞද්ගලික පරිගණකය සොයා ගැනීම ගැන අප ස්තුතිවන්ත විය යුතුය. වර්තමානයේ දී අපි වසරකට ඇමෙරිකානු ඩොලර් මිලියන 250 ක ආදායමක් තොරතුරු තාක්ෂණ පිටරට යැවීමෙන් උපයමු. ඉදිරි වසර හතර පහ තුළ දී වසරකට ඇමෙරිකානු ඩොලර් බිලියනයක් ඉපයීමට බලාපොරොත්තු වෙයි. වර්තමානයේ දී ප්‍රායෝගික වශයෙන් සියලු ම විශ්වවිද්‍යාලවල තොරතුරු තාක්ෂණ පීඨ, දෙපාර්තමේන්තු හෝ ඒකක ඇති අතර, ඉදිරි දශකය තුළ දී නියත වශයෙන් ම DGLI හි සාමාජිකයන් වීමට හැකිවනු ඇත. තොරතුරු යුගයේ අධ්‍යාපනය අවසන් නොවේ. අනාගතයේ අධ්‍යාපනික ක්‍රමවේදය වනුයේ නොනවතින වෘත්තිය සංවර්ධනය නැතහොත් ජීවිත කාලය පුරාම අධ්‍යාපනය ලැබීමයි. මේ නිසා අනාගතයේ දී දැනුවත් සමාජයේ ඉල්ලීම්වලට සරිලන පරිදි අධ්‍යාපනය සකස් කිරීමට සම්ප්‍රදායික විශ්වවිද්‍යාලවලට අපහසු වනු ඇත. එවැනි අනාගත සමාජයක අධ්‍යාපන අවශ්‍යතා සපුරාලිය හැක්කේ DGLI ක්‍රමවේදය මගිනි.

## අවසානය

ඔබ උපාධිය ලබා ගත් අද දිනයේ ඔබ ඇමතීමට ලැබීම මට ලොකු සතුටකි. මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සව කථාව කිරිමට ආරාධනා කිරීම ගැන ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ස්වර්ණා පියසිරි මහත්මියට ස්තුතිවන්ත වෙමි. මගේ කථාව අසා සිටි ඔබ සැමට මගේ ස්තුතිය පුද කරමි.

*2009.12.27*

# 37

# පුද්ගල අභිවෘද්ධිය උදෙසා දැනුම හා කුසලතාවන්හි අවශ්‍යතාව

මහාචාර්ය කුසුමා කරුණාරත්න

මානව වර්ගයාගේ ආරම්භයේ සිටම, මිනිසා සිය ඉදිරි ගමන සඳහා නිරන්තරයෙන්ම දැනුම හා කුසලතා වර්ධනයෙහි නිතර විය. ආදි මානවයා සිය බාහු බලය වර්ධනය කරගනු වස් පාෂාණ සහ ලීදඬු භාවිතය මගින් තම හැකියාවන් දියුණු කර ගැනීමට පුරුදු පුහුණු විය. ඉන් අනතුරුව සතුන් දඩයම් කිරීම හා වෙනත් කාර්යයන් සඳහා අවශ්‍ය උපකරණ නිමවා ගනිමින් ඒවා ප්‍රයෝජනයට ගැනිමට ඔවුහු යොමු වූහ. කාලයාගේ ඇවෑමෙන් සිය ආහාර ලබා ගැනීම සඳහා වගා කටයුතු පිළිබඳ දැනුමක් ලද පසුව ක්‍රමක්‍රමයෙන් ගොඩනැගිලි ඉදි කිරීමට ද සමත් වූ ඔවුන්ට සතුන් යොදා ගනිමින් භාණ්ඩ ප්‍රවාහනයට හා ගමනාගමනයට අවශ්‍ය වන පරිදි රෝදය නිර්මාණය කර ගැනීමට හැකි විය.

මෙලෙසින් කාලය ගෙවී යද්දී මිනිසා වාෂ්ප බලය සොයා ගැනීමත් සමග මහා පරිමාණ කටයුතු සඳහා වාෂ්පබල යන්ත්‍රය නිපදවා ගැනීමෙන් ලෝකයේ කාර්මික විප්ලවයකට මග පෑදුණි. පසුගිය ශතවර්ෂයක කාලයක් තුළ ලොව පුරා සියලු තාක්ෂණ විධි සහ ක්‍රමයන්හි අසීමිත වර්ධනයක් දක්නට ලැබිණ. ඒ සමඟම සමස්ත මිනිස් ක්‍රියාකාරකම් පද්ධතියෙහි ප්‍රතිඵල ලෙස අතිවිශාල පරාසයක නිෂ්පාදන බිහි විය. බලශක්ති, ප්‍රවාහන, සන්නිවේදන, ගමනාගමන, අභ්‍යවකාශතරණය, පරිගණකය ඉන් සමහරකි. මේ සියල්ල මිනිසාගේ විවිධාකාර දැනුම හා කුසලතා වර්ධනයේ ප්‍රතිඵල ලෙසින් බිහි වූ ඒවාය.

පුරාතනයේදී මිනිසා කුසලතා හා දැනුම ලබා ගත්තේ හුදෙක් අත්හදාබැලීම් මගින් හෝ ඉබේටම හමු වූ දේ මඟිනි. ආදිතම මානවයා මුලින්ම ගල් පතුරු සහ ලී කැබලි යොදා ගැනීමෙන් කළ අත්හදාබැලීම් ඔවුන්ට සිය බාහුබලය පිළිබඳව හඳුනා ගැනීමට උපකාරී විය. එමඟින් ඔවුන් සොයාගත් එක් දෙයක් නම් අත්පා මෙහෙයවා සතුරකුට හෝ වෙනත් ප්‍රචණ්ඩ සත්වයකුට පහර දෙනවාට වඩා ලී කැබලි හෝ ලී දඬුවලින් සතුරාට වඩාත් ප්‍රබල ප්‍රහාරයක් එල්ල කොට පරාජය කළ හැකි බවයි. එය ද වඩාත් ආරක්ෂිත දුර ප්‍රමාණයක සිට සිදු කළ හැකි බවයි. ආතර් සී. ක්ලාක් මහතාගේ 'A Space Odyssey' චිත්‍රපටයෙහි මෙය මැනවින් නිරූපණය වෙයි.

වසර දහස් ගණනින් කාලය ගෙවී යද්දී දැනුම හා කුසලතා ලබා ගැනීමේ මාර්ග වඩා විධිමත් ස්වරූපයක් ගන්නට විය. මෙහි එක් මූලික අවස්ථාවක් ලෙස දක්නට ලැබෙන්නේ ශිෂ්‍යයකු හෝ ශිෂ්‍ය පිරිසක් ආචාර්යවරයාගේ නිවසේ නවාතැන් ගෙන විධිමත් ලෙස දැනුම ලබා ගැනීමයි. අප සතු පැරණි සාහිත්‍යයෙන් කියවෙන පරිදි, දිසාපාමොක් ආචාර්යවරයා වෙත ගොස් එසේ ශිල්ප හැදෑරීමක් සිදු වී ඇත. එපමණක් නොව, ශිෂ්‍ය කණ්ඩායමේ සිටි දක්ෂතම ශිෂ්‍යයා ඉගෙනීම නිම කරන අවස්ථාවේදී විශේෂ සැලකීමක්, නැතහොත් විශේෂ ත්‍යාගයක් ලෙස ගුරුවරයා තම රූමත් දියණිය ඔහුට විවාහ කර දීම චාරිත්‍රයක් ලෙස ද පැවති බවට මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රගේ

මනමේ නාට්‍යයේ එන පුවත වැනි අවස්ථා සාක්ෂි දරයි. වර්තමානයේ මෙවැනි සම්ප්‍රදායයක් නොපවතින අතර ඒ වෙනුවට දක්ෂතම ශිෂ්‍යයාට රන් පදක්කමක් හෝ ත්‍යාගයක් හිමි වීමේ අවස්ථාව උදා වෙයි. එදා පැවති ආකාරයට ගුරුවරයාගේ නිවසේ සිට අධ්‍යාපනය ලැබීමේ සම්ප්‍රදාය යුරෝපීය රටවල පවා පැවතුණ බව පෙනේ. ඇරිස්ටෝටල් නම් වූ සුප්‍රකට දාර්ශනිකයා, ගුරුවරයා සිය නිවසේ ආලින්දයේ හෝ ගෙළයනේ සිට ශිෂ්‍යයන්ට ඉගැන්වූ බව කියවෙයි. අද අප අසා ඇති 'Lyceum' යන වචනයෙන් එලෙසින් ශිෂ්‍යයන්ට ශිල්ප ලබා දුන් ස්ථානය හැඳින්වී ඇත.

කල්ගත වන විට විධිමත් ලෙස දැනුම ලබා දීම සඳහා පාසල් හා වෙනත් ඉගැන්වීමේ ආයතන බිහි විය. පළමුව පෞද්ගලික ආයතන ලෙසත් අනතුරුව රජයේ පාඨශාලා ලෙසත් එම ස්ථාන පවත්වාගෙන යන ලදි. ඉන් පසුව සියලුම රටවල පාහේ විශාල ශිෂ්‍ය සංඛ්‍යාවකට පොදුවේ අධ්‍යාපනය ලබාදීම සඳහා පාසල් ක්‍රමයක් ඇති විය. ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට උසස් අධ්‍යාපනය ලබාදීම සඳහාත් උසස් මට්ටමේ පුහුණු කිරීම් සඳහාත් විශ්වවිද්‍යාල ක්‍රමයක් බිහි විය. එමෙන්ම වර්තමාන සමාජයටත් අවශ්‍ය වන වෘත්තිකයන් පුහුණු කිරීම ද මෙම ආයතනවලින් සිදු විය. මෙලෙසින් සෑම රටකම පාහේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් විශාල සංඛ්‍යාවකට දැනුම ලබාදීම සඳහා එලෙස ඉගැන්වීමේ ක්‍රමයක් ආරම්භ වූයේ මන්ද? ඊට හේතුව නම් මිනිස් සමාජය ඉදිරියට ගමන් කිරීමේදී දැනුම හා කුසලතා ඇගයීමට ලක් වී තිබීමයි. වෙනත් වචනවලින් කිවහොත් වර්තමාන සමාජයේ දැනුම ලැබීමට හැම කෙනෙකු තුළම පිපාසාවක් ඇති වී තිබීමයි.

ශ්‍රී ලංකාව තුළ ජීවත් වන ජනතාව අතරන් බහුතරයක් බෞද්ධාගමික පසුබිමකට අයත් වෙති. බුදුදහම හා බෞද්ධ දර්ශනය ගැන දැනුමක් ඇති ඔබ හොඳින්ම දන්නා කරුණක් නම් බුදුදහම අනුව දැනුම හා ඥානය උත්තරීතර බවයි. එය බෞද්ධ භික්ෂූන් වහන්සේලාට පමණක් නොව ගිහි සමාජයට ද අදාළ වන්නකි. මෙහිදී ඔබට, බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වන කතා පුවතක් ගැන මතක් කර දෙන්නට කැමැත්තෙමි. බුදුන් වහන්සේ වැඩ විසූ එදවස දීඝජානු නම් තැනැත්තෙක් උන්වහන්සේ හමුවීමට ගොස් මෙසේ ඇසීය. ''බුදුරජාණන්වහන්ස, අපි වනාහි අඹුදරුවන් පෝෂණය කරමින් ගිහිගෙයි වසන පෘථග්ජනයෝ වෙමු. අපට මෙලොව හා එයින් මතු ද සතුටින් කල් ගත කළ හැකි දහමක් දේශනා කොට වදාළ හැකිද?'' ඊට පිළිතුරු වශයෙන් බුදුන්වහන්සේ, යම් පුද්ගලයකුට මෙලොව ජීවිතය සතුටින් ගත කිරීමට අවශ්‍ය වන ප්‍රධාන කරුණු හතරක් දේශනා කළ සේක.

1. යම් තැනැත්තෙක් තමන් නියැළී සිටින කවර රැකියාවක හෝ බෙහෙවින් දක්ෂ විය යුතුය. එමෙන්ම කුසලතා සම්පන්න විය යුතුය. කාර්යක්ෂම විය යුතුය. උද්යෝගිමත් විය යුතුය. ශක්ති සම්පන්න විය යුතුය.
2. තමා මැනවින් උපයා ගත් වස්තුව ආරක්ෂා කර ගත යුතුය.
3. විශ්වාසවන්ත, උගත්, ගුණවත්, ස්වාධීන, ඥානවන්ත කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කළ යුතුය.
4. තම මුදල් සාධාරණ ලෙස වැය කළ යුතුය.

අනතුරුව උන්වහන්සේ මෙම ජීවිතයෙන් ඔබ්බට පුද්ගලයාගේ සතුටට හේතුවන කරුණු හතරක් ද වදාළ සේක.

1. යම් තැනැත්තෙක් සදාචාරාත්මක, ආධ්‍යාත්මික, බුද්ධිමත් ඇගයීම් පිළිබඳව විශ්වාසය තැබිය යුතුය.
2. පරපණ නැසීම, සොරකම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීම, බොරු කීම හා සුරා පානය යන පස් පවින් වැළකිය යුතුය.

3. ත්‍යාගශීලී විය යුතුය.
4. ඥානවන්තභාවය වර්ධනය කරගත යුතුය.

මෙම කරුණුවලින් පැහැදිලි වන පරිදි බුද්ධ දේශනාවෙහි ද දැනුම හා කුසලතා ලබා ගැනීමේ අවශ්‍යතාවට වැදගත් තැනක් හිමි වෙයි. බුද්ධිමත් ක්‍රියා කලාපයක නිරත වීම හා ඥාන වර්ධනය සඳහා උත්සුක වීම මොලොවදීත් ඉන් ඔබ්බටත් පුද්ගලයාගේ සතුටට හා අභිවෘද්ධියට හේතු වන මූලික සාධක වන බව මෙයින් ප්‍රකට වෙයි.

සාමාන්‍ය ජීවිතය පිළිබඳව අවධානය යොමු කළහොත් පැහැදිලි වන කරුණක් නම්, බොහෝ අවස්ථාවන්හිදී දැනුම ඇගයීමට ලක් වී ඇති බවයි. දැනුම ලබා ගැනීමට සමාජය යොමු කරවීම අතීතයේ පටන්ම සිදු වී ඇති බවයි. අප හැම හොඳින් දන්නා පද්‍යයක් උපුටා දක්වතොත්,

තිබූ තැනක සොර සතුරන් ගත නොහෙනා
එසැඩ මනාවත් වතුරෙන් වල නොහෙනා
කෝප වුවත් රජ මැතිඳුන් ගත නොහෙනා
උගත මනා සිල්පයමයි මත රැකෙනා
*(වදන් කවි පොත, 30 පද්‍යය)*

යන මේ පද්‍යයෙන් කියවෙනුයේ ශිල්ප ඉගෙනීමෙහි, දැනුම ලබා ගැනීමෙහි වටිනාකමයි. සොර සතුරන් විසින් හෝ සොබාදහම විසින් හෝ කෝපයට පත් පාලකයන් විසින් හෝ උදුරාගත නොහැකි, සොරගත නොහැකි, තමන්ගේ මතු පැවැත්මට උපකාරී වන දේ නම්, තමන් ලබා ගන්නා දැනුම හා ශිල්ප ඥානයයි.

දැනුම ලබා ගැනීමෙහි අවශ්‍යතාව හා වටිනාකම මේ අයුරින් පැහැදිලි කළ හැකි වන අතර අප එලෙසින් දැනුම ලබා ගන්නට මෙතරම් උනන්දුවක් දක්වන්නේ මන්ද යන්න ගැන ද විමසා බලමු. අතීත යුගවලදී, සමාජය සංශෝධනය කොට යහමඟට යොමු කරවීමේ අභිප්‍රායෙන් යුතුව ශාස්ත්‍ර ඥානය හා පොදුවේ දැනුම ලබා ගැනීමට මූලික වශයෙන් යොමු වූයේ පැවිදි පක්ෂයයි. ගිහි සමාජය අතරින් උසස් අධ්‍යාපනය ලැබීමට නැඹුරුව සිටියේ ප්‍රභූන් හා ධනවතුන් බව පැහැදිලිය. ඔවුන්ට අධ්‍යාපනය ලැබීමේ අවශ්‍යතාව වූයේ හුදෙක් දැනුම ලබා ගැනීම සඳහාය.

වර්තමානයේ අප දකින පරිදි විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන කිසිවකුත් හුදෙක් දැනුම ලබා ගැනීම සඳහාම ඉගෙනීමෙහි නිරත නොවන තරම්ය. අද විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් උසස් අධ්‍යාපනය ලබන්නේ ආර්ථික හා සාමාජික අවශ්‍යතා හා ප්‍රගතිය අරමුණු කොටගෙනය. වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, ගෘහ නිර්මාණ ශිල්පය වැනි විෂය ක්ෂේත්‍රයන්හි අධ්‍යාපනය ලබන ශිෂ්‍ය පිරිස පාඨමාලා අවසානයේ දී ඒ ඒ ක්ෂේත්‍රයෙහි වෘත්තිකයන් වීමේ අරමුණින් එම විෂයයන් හදාරණ අයයි. සෙසු විෂය ක්ෂේත්‍රවලට අදාළව උසස් අධ්‍යාපනයෙහි නිරතව සිටින්නන් ද උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව කවර හෝ වෘත්තියක නියැලීමට යොමු වන අය බව අපි දනිමු. එවන් අරමුණක් සැබවින්ම සාධාරණ වූවකි. එසේ වුව ද ලෝකයේ කිසිදු රටකට, එහි පවත්නා රජයකට සෑම සියලු උපාධිධාරීන්ටම නිශ්චය වශයෙන් රැකියා ලබාදීම කළ නොහැක්කකි. මේ හේතුවෙන් සෑම රටකම පාහේ අඩු වැඩි වශයෙන් රැකියා විරහිත උපාධිධාරී පිරිසක් දක්නට ඇත. කවර රටක වුව ද සියලුම උපාධිධාරීන් රැකියා නියුක්තිකයන් කළ හැකි ආර්ථිකයක් නොමැති තරම්ය.

සංවර්ධිත රටවල විශ්වවිද්‍යාල අධ්‍යාපනය අපේක්ෂා කරන ශිෂ්‍ය සංඛ්‍යාව අප රට සමඟ සසඳන විට දසගුණයක් පමණය. ඒ සමඟම එම රටවල ඒක පුද්ගල ආදායම ද අප රටේ ඒක පුද්ගල ආදායමට වඩා දසගුණයකින් පමණ වැඩිය. සංවර්ධිත රටවල තත්ත්වය සමඟ සසඳන විට අප රටේ විශ්වවිද්‍යාලවලට වසරකට බඳවාගත යුතු ශිෂ්‍ය සංඛ්‍යාව 20,000 නොව 200,000 විය යුතුය. එහෙත් මෙය කළ නොහැකි දෙයක් මෙන්ම, එසේ කළහොත් එය විපත්තිදායක වන්නක් ද වෙයි. එවැනි විශාල ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවා ගැනීමට අවශ්‍ය යටිතල පහසුකම් අප සතුව නොමැත. එමෙන්ම අපරදිග රටවල මෙන් එවැනි උපාධිධාරීන් විශාල සංඛ්‍යාවක් අන්තර්ග්‍රහණය කර ගැනීමට තරම් ප්‍රබල ආර්ථික ශක්තියක් ද අප සතුව නොමැත. මෙම සංසන්දනය මා ඉදිරිපත් කළේ එම තත්ත්වය පැහැදිලි කිරීමටයි.

දැනට විශ්වවිද්‍යාලවලට බඳවාගනු ලබන 18,000 - 20,000 වන ශිෂ්‍ය සංඛ්‍යාව සම්බන්ධයෙන් වුවද, විශේෂයෙන් කලා, වාණිජ හා සමාජීය විද්‍යා විෂයයන් හදාරා විශ්වවිද්‍යාලයෙන් පිට වන උපාධිධාරීන් රැකියා විරහිතව සිටීමේ ගැටළුවලට අද අපි මුහුණ පා සිටිමු. මේ පිළිබඳ පවතින සිද්ධිදාමය ගැන මොහොතක් අවධානය යොමු කරමු. කලා, වාණිජ හා සමාජීය විද්‍යා උපාධිධාරීන් අතුරෙන් බහුතරයක් ගම්බද පරිසරයෙන් හෝ අර්ධ නාගරික පෙදෙස්වලින් පැමිණෙන අයයි. ඔවුන් අඩු ආර්ථික පහසුකම් සහිත ජීවන රටාවකට යොමු වූ අය බව ද කිව හැකිය. එම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දෙමාපියන්ගේ ප්‍රාර්ථනය වන්නේ ද තම ජීවන තත්ත්වයට වඩා සතුටුදායක තත්ත්වයකට තම දරුවන් පත් වනු දැකීමයි. ඒ සඳහා තම දූපුතුන් විශ්වවිද්‍යාලයට ඇතුළත් කරවා ඔවුන් අපේක්ෂා කරන්නේ තම දරුවන් උපාධිධාරීන් වූ පසු හොඳ රැකියාවක් සමඟ හොඳ ආදායමක් ද ලබන අය බවට පත් වීමයි.

ඇතැම් අවස්ථාවලදී එවැනි ශිෂ්‍යයන් සාර්ථක ලෙස විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබා ගන්නා නමුත් දෙමාපියන්ගේ අගහිඟකම් නිසා අතරමගදී අධ්‍යාපනය කඩාකප්පල් කර ගන්නා අවස්ථා ඇත. කලකට පෙර සිංහල නවකතාකරුවන් අතින් රචනා වූ ඇතැම් නවකතාවල මෙම ඛේදනීය තත්ත්වය පිළිබිඹු කර තිබුණි.

70 දශකය මැද භාගයේදී ඒකීය විශ්වවිද්‍යාලයක්ව පැවති මෙරට විශ්වවිද්‍යාල පද්ධතියෙහි පාලන කටයුතු සඳහා වූ පාලක මණ්ඩලය (Board of Governors) විසින් මෙවැනි තත්ත්වයන්ට විසඳුමක් වශයෙන් ශිෂ්‍යයන්ට ණය ලබාදීමේ ක්‍රමයක් ආරම්භ කරන ලදි. උපාධිය හිමිකර ගැනීමෙන් අනතුරුව රැකියාවක් ලබා ගත් පසුව එම ණය ගෙවා දමනු ඇතැයි අපේක්ෂා කෙරිණ. එහෙත් සිදු වූයේ අනපේක්ෂිත ලෙස ශිෂ්‍යයන් වැඩිදෙනෙකු එම ණය මුදල ආපසු නොගෙවූ හෙයින් එම සහන ක්‍රමය සාර්ථක නොවීමය. එකල රුපියල් මිලියන හතළිහක් පමණ වූ (අද වටිනාකමින් රුපියල් බිලියන දෙකේ සිට හතර දක්වා පමණ වූ) මුදලක් ඒ වෙනුවෙන් වැය විය.

අනතුරුව ලලිත් ඇතුලත්මුදලි මැතිතුමාගේ සංකල්පයකට අනුව මහපොළ ශිෂ්‍යත්ව ක්‍රමය ආරම්භ විය. එමගින් ආර්ථික දුෂ්කරතා සහිත ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට විශ්වවිද්‍යාල අධ්‍යාපනය අවසන් වන තුරු අවශ්‍ය වියදම් සඳහා ආපසු ගෙවීමකින් තොරව ශිෂ්‍යත්ව ආධාර ලැබිණ. මේ අනුව විශ්වවිද්‍යාල අධ්‍යාපනය නොමිලේ ලද හැකි, නැතහොත් ඒ සඳහා රජයෙන් මුදල් ගෙවන ලද නිදහස් අධ්‍යාපනයක් ලෙස ක්‍රියාත්මක විය.

මෙය සැබවින්ම ආර්ථික දුෂ්කරතා තිබූ ශිෂ්‍ය පිරිසට බෙහෙවින් හිතකර වූවක් විය. එවැනි දුෂ්කරතා රහිත ඇතැම් ශිෂ්‍යයන් ද මෙම ශිෂ්‍යත්ව ලබා ගත් අතර ඒවා අනිසි ලෙස භාවිතය ද සිදු

විය. විශ්වවිද්‍යාලවලට තෝරාගනු ලැබූ ශිෂ්‍යයන්ගෙන් බහුතරයකට එම ශිෂ්‍යත්ව හිමි වූ නිසා එය රජය විසින් දක්වන ලද කාරුණික අනුග්‍රහයක් බව අමතක කරමින් එම ශිෂ්‍යත්ව තමන්ට හිමි විය යුතු අයිතියක් ලෙස සලකා දැඩි ඉල්ලීම්වල නිතර වීමට ඔවුහු පෙළඹුණහ. මෙය මහපොළ ශිෂ්‍යත්ව අරමුදලට සම්බන්ධ නිලධාරීන්ගේ පුදුමයට හේතු වූවක් විය. කෙසේ වෙතත් මෙම ශිෂ්‍යත්ව ක්‍රමය ආර්ථික දුෂ්කරතා සහිත ශිෂ්‍යයන්ට විශ්වවිද්‍යාල අධ්‍යාපනය අහිමි වන්නට තිබූ අවස්ථා මහ හරවමින් ඔවුන්ට බෙහෙවින් උපකාරී වූ ආධාර ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක විය.

විශ්වවිද්‍යාල උපාධිය ලබාගත්, නමුත් වෘත්තීයාභිමුඛ විෂයයන් හදාරා නොතිබුණ ශිෂ්‍යයන්ට රැකියා ලබා ගැනීමේ දුෂ්කරතාව පැන නැඟුණි.  ඔවුන්ට පහසුවෙන් රැකියා ලබා ගැනීමට තිබූ බාධක හා අඩුපාඩු පැහැදිලි නමුත් එම ප්‍රශ්නය විසඳීමට සුදුසු පියවර ගැනීමක් සිදු නොවීය. විශේෂයෙන්ම කලා හා වාණිජ්‍ය විෂයයන් හැදෑරූ ශිෂ්‍යයන්ට රැකියා ස්ථානවලදී සුදුසු දැනුම මෙන්ම කුසලතා ද නොතිබූ නිසා ඔවුන් සේවයේ යෙදවීමට ආයතනවල නිලධාරීහු පසුබට වූහ.

වෘත්තීය පුහුණු කිරීමේ ආයතනවල මෙන් විශ්වවිද්‍යාලවලදී ශිෂ්‍යයන් නිශ්චිත රැකියා සඳහා පුහුණු කිරීමක් සිදු නොවුවද උපාධිධාරීන් සතුව තිබිය යුතු යම් අදාළ සුදුසුකම් ඔවුන් වෙත නොවීම අවාසිදායක විය. ඒ අතුරෙන් කිහිපයක් නම්, (i) කැපවීම හා උද්යෝගය නොතිබීම (ii) සේවා ස්ථානයේ ඉහළ නිලධාරීන් සමඟ ද සම තත්ත්වයේ සේවකයන් සමග හා පහළ නිලධාරීන් හෝ සේවකයන් සමඟ ද සුහද සබඳතා පැවැත්වීමට අසමත් වීම (iii) සේවයට අවශ්‍ය තරම් ඉංග්‍රීසි දැනුම නොතිබීම (iv) නූතන තාක්ෂණයට ප්‍රමාණවත් තරම් හුරු නොවීම (v) අලුතෙන් පුහුණු කරවනු ලැබීමට ඇති අකැමැත්ත යන මේවාය.

පෞද්ගලික ව්‍යවසායකයන් හැකි තරම් දුරට සිය ආයතනයට ලාභ ලැබීමත් අපේක්ෂා කිරීම සාමාන්‍ය ස්වභාවය වන බැවින් ඉහත දක් වූ ඌනතා සහිත උපාධිධාරීන් ඔවුන්ට බරක් ලෙස දැනෙන්නට විය. රජයේ ආයතනවල පුරප්පාඩු පිරවීම රජය මඟින් වසර කීපයක් තුළ නතර කොට තිබීම නිසා උපාධිධාරීන්ට රජයේ සේවයට ඇතුළත් වීමේ අවස්ථා මගහැරී යාමෙන් රැකියා විරහිත භාවය තවදුරටත් සංකීර්ණ මුහුණුවරක් ගත්තේය. උපාධිධාරීන් අතුරෙන් විශේෂයෙන්ම කලා උපාධිධාරීන්ගේ ක්ෂේම භූමිය වූයේ රජයේ සේවයයි. ගුරු වෘත්තියට හා වෙනත් රජයේ සේවාවන්ට ඔවුහු වඩාත් සුදුසු වූහ.

අනතුරුව පත් වූ රජයට මේ සම්බන්ධයෙන් මැදිහත් වෙමින් රැකියා විරහිතව සිටි මෙන්ම විශ්වවිද්‍යාලවලින් පිටවෙමින් සිටි උපාධිධාරීන්ට ද රැකියා ලබා දීමෙන් එතෙක් පැවති උපාධිධාරී රැකියා වියුක්ති ගැටළුවට විසඳුමක් දෙන ලදි. පසුගිය සිවු වසරක කාලය තුළ රජය විසින් උපාධිධාරීන් 40,000 කට පමණ රැකියා ලබා දීමෙන් එම ප්‍රශ්නයට විසඳුමක් දුන් නමුත් එවන් විශාල පරිමාණයේ රැකියා නියුක්තිය රජයට ඉමහත් බරක් විය.

විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් අද දරන මතය නම්, මෙරට විශ්වවිද්‍යාලවලින් පිට වන විශාල සංඛ්‍යාවක් වන උපාධිධාරීන්ට රැකියා ලබාදීම රජයේ වගකීම බවයි. පසුගිය වකවානුව තුළ ඔවුන් අගනුවර සහ වෙනත් පෙදෙස්වල පැවැත්වූ පෙළපාලි හා විරෝධතා මීට නිදසුන්ය. ලොව කිසිදු රටකට උපාධිධාරීන් සියයට සියයක් සඳහා රැකියා ලබාදීම කළ නොහැකිය. ඉන්දියාව, චීනය වැනි රටවල ද ඇතැම් විට උපාධිධාරීන්ගේ සංඛ්‍යාවෙන් සියයට පනහකටවත් රජයේ රැකියා ලද නොහැකි තත්ත්වයක් පවති. මෙය අප රටේ උපාධිධාරීන්ගේ රැකියා වියුක්තිය සාධාරණීකරණයට යොදා ගත හැකි සාධකයක් නොව යථාර්ථය ඉදිරිපත් කිරීමකි.

රැකියාවක් ලබා ගැනීම සඳහා උපාධිධාරීයෙක් තම අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව විවිධ දක්ෂතා, කුසලතා ඇත්තකු විය යුතුය. සිය මාතෘ භාෂාවට අමතරව ඉංග්‍රීසි බසින් ද යම් තරමක් දුරට හෝ අදහස් හුවමාරු කර ගැනීමේ හැකියාව තිබිය යුතුය. අප හැම දන්නා පරිදි ඉංග්‍රීසි භාෂාව අද විශ්ව භාෂාවක් බවට පත්ව ඇත. 'විශ්ව ගම්මානය' නමැති සංකල්පය සමඟ ඉංග්‍රිසි බස නොදැනීමෙන් අප වර්තමාන ලෝකය තුළ කොන් වන්නට ඉඩ ඇත, හුදකලා වන්නට ඉඩ ඇත.

සිංහල සමාජය තුළ එදා සිටම පිළිගත් මතයක් වූයේ විවිධ භාෂා දන සිටීම අවශ්‍ය බවයි. එය උගත්කමේ ලක්ෂණයක් බවට පිළිගැනීමක් විය. විවිධ භාෂා නොදත්තවුන්, ''නොවියත් හුදී ජනයන්'' ලෙස අමාවතුර කතුවර ගුරුළුගෝමී හඳුන්වා ඇත්තේත්, ද්‍රවිඩ, සංස්කෘත, පාලි භාෂා නොදත්තවුන් ''දද සත'' (අනුවණ ජනයා) ලෙස සුභාෂිතය කර්තෘ අලගියවන්න මුකවෙටිතුමා සඳහන් කර ඇත්තේත් මේ හෙයිනි.

සුභාෂිතයේ එන,

පහළ පොරාණ ඉසිවර මුවෙනි මන නඳ
දෙමළ සකු මගද නො හසළ සතට දද
පුවළ නීති සත ගත පද අරුත් ලෙද
සිහළ බසින් සැකෙවින් කියමි පද බැඳ
*(සුභාෂිතය, 5 පද්‍යය)*

යන පද්‍යය, වෙනත් භාෂා නොදත් අය නූගතුන් ලෙස සැලකීම දාහත්වන සියවස පමණ කාලයේදී පැවති බවට නිදසුනකි. දැනුමැති පුද්ගලයකු යනු විවිධ භාෂා ඥානය ඇත්තෙක් ද වන්නේය යන්න මෙයින් හැඟෙන්නකි. මෙරට මුල්ම විශ්වවිද්‍යාලය එනම් ලංකා විශ්වවිද්‍යාලයෙහි ඉගැන්වූ පාඨමාලා අතර භෞතික විද්‍යාව, රසායන විද්‍යාව වැනි ඇතැම් විෂයයන්ගෙන් විශේෂ උපාධි ලැබීම සඳහා ඉංග්‍රීසි භාෂාවට අමතරව ජර්මන් හා ප්‍රංශ භාෂා ඉගෙනීමට ද ශිෂ්‍යයන්ට සිදු විය.

වර්තමානයේ වුවද, අර්ථවත් ලෙස රැකියා නියුක්තිය සඳහා උපාධිධාරීන් ඉංග්‍රීසි බස භාවිතය හා එමගින් අදහස් හුවමාරුව අතිශයින්ම වැදගත් වෙයි. මුළු ලෝකයම තොරතුරු තාක්ෂණ විප්ලවයකට යොමු වී සිටින වත්මන් අවධියේදී, සියලු වාණිජ හා කාර්මික ක්ෂේත්‍රවල තොරතුරු පරිගණකගත වෙමින් පවතිද්දී උපාධිධාරීන් ද යම් ප්‍රමාණයකට හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රවීණත්වයක් ලබා සිටිය යුතුය. කාර්මික හා වාණිජ අංශයන්හි විවිධ මට්ටම් පිළිබඳ අවබෝධයක් ලබා සිටිය යුතුය. විශ්වවිද්‍යාලයන්හි පවත්නා සම මට්ටම් තත්ත්වය වාණිජ හා කාර්මික ආයතනයන්හි ක්‍රියාත්මක නොවන බව අවබෝධ කර ගත යුතුය. එවැනි ආයතනවල සාර්ථක ලෙස රැකියාවල නිරත වීම උදෙසා උපාධිධාරීන් තුළ ආකල්පමය වෙනසක් ඇතිවිය යුතුය.

අද මෙරට උපාධිධරයන් ඇතැම් රැකියාවලට නුසුදුසු වීමේ සම්පූර්ණ වරද හා වගකීම හුදෙක් උපාධිධරයන් වෙත පමණක් පැවරීම සාධාරණ නොවේ. වර්තමානයේ බොහෝ රටවල් විශ්වවිද්‍යාල උපාධිධාරීන් රැකියා සඳහා සුදුසු තත්ත්වයකට පත් කරවීමේ විවිධ ක්‍රම අනුගමනය කරමින් පවති. ඉන්දියාව, මලයාසියාව වැනි රටවල උපාධිධාරීන් මාස හයක හා වර්ෂයක යන විවිධ කාල සීමාවන් තුළ 'රැකියාවලට සුදුසු' ලෙස පුහුණු කරවීමේ වැඩ පිළිවෙළ පවති.

කෙසේ වුවද, අප රට තුළ උපාධිධාරීන් හා රැකියා නියුක්තිය ගැන සැලකීමේදී ඉහත දැක්වූ කරුණුවලට අමතරව ශිෂ්‍ය ජීවිතය ගත කරන කාල සීමාව තුළදී ඔවුන් විනයගරුක ලෙස හැසිරීමෙන් සේවා යෝජකයන්ගේ ප්‍රසාදය දිනාගත යුතුය. විශ්වවිද්‍යාලය තුළදී මෙන්ම ඉන් පිටතදී ද ඔවුන්ගේ

හැසිරීම ශික්ෂණයකින් යුතුව සිදු විය යුතුය. මහජනතාව මෙන්ම පෞද්ගලික ආයතන ද ඔවුන් කෙරෙහි දක්වන ආකල්ප යහපත් ඒවා බවට පත් කර ගැනීම කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු විය යුතුය.

පෞද්ගලික අංශයන්හි හෝ වෙනත් රජයේ ආයතනවල පවා සේවා යෝජකයන්, විශ්වවිද්‍යාල භූමියේ හා අවට පරිසරයේ අපිරිසිදු දර්ශන, ප්‍රචණ්ඩ හැඟීම් මතු වන සේ සකසා ඇති අවිනීත යෙදුම් සහිත පෝස්ටර් යනාදිය ප්‍රදර්ශනය වනු දකින විට, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් යනු කරදරකාරී පිරිසක්ය යන හැඟීම් ඇතිවීම නොවැළැක්විය හැකිය. මෙහි අවාසනාවන්ත තත්ත්වය නම් එවැනි අයහපත් ක්‍රියාවන්ට යොමු වන පිරිස විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් අතරින් අතළොස්සක් පමණක් වුව ද සියලු ශිෂ්‍යයන් පිළිබඳව එකම නිගමනයකට බැසීමට බාහිර සමාජය යොමු වීමයි. මෙවැනි තත්ත්වයක් මත කවර ව්‍යාපාරිකයකු වුවද විශ්වවිද්‍යාලවලින් පිට වන උපාධිධාරීන් තම ආයතනයේ සේවයේ බඳවා ගැනීමට පෙර දෙවරක් සිතා බලනු ඇත. 'නැති කරදර ඇති කර ගැනීමක්' යන අරුත් දෙන ''අහක යන නයින් තම වස්ත්‍රය තුළට දමා ගැනීමක්'' වැනිය යන ප්‍රස්තාව පිරුළ මෙහිදී එවැනි ව්‍යවසායකයන්ගේ සිතුවිලිවලට අදාළ වනු ඇත.

වසර 1950 ගණන්වලදී විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් දෙස සමාජය ගෞරවාන්විත ආකල්පයක් දැක්වූයේ ඔවුන් සැබවින්ම රටේ අනාගත නායකයන් විය හැකි පුද්ගලයන් ලෙසත් උසස් තනතුරු දරන්නන් විය හැකි ලෙසත් සලකමිනි. එහෙත් අවාසනාවකට මෙන් වර්තමානයේදී එම ආකල්පයට පරස්පර විරෝධී හැඟීමක් සමාජයේ ඇතමුන් තුළ පැවතීම ඛේදජනකය.

වසර කීපයකට පෙර අප දුටු වීදි නාට්‍යයක දර්ශනයක් මෙහිදී සිහිපත් කළ හැකිය. ගමෙන් පැමිණෙන වැඩිහිටියකුගේ සහායට එන තරුණයකු විශ්වවිද්‍යාලය සොයා ගන්නේ බිත්තිවල ඇඳ තිබෙන සටන් පාඨ හා අලවා ඇති පෝස්ටර් මගිනි. ''....... වහා සේවයේ පිහිටුවව්'', .... අකුලා ගනිව්'', ''........ දියව්'' වැනි සටන් පාඨ කියවන ස්වරූපයෙන් තරුණයා එය සැබවින්ම විශ්වවිද්‍යාලය බව තමා කැටුව එන වැඩිහිටියාට පවසන අවස්ථාව නාට්‍යාකාරයෙන් රඟදැක්වුණේ ද එවකට විශ්වවිද්‍යාලය පිළිබඳව පැවති කිසියම් මතයක් නිරූපණය කරමිනි. මෙය අසා සිටින ඔබෙන් අප බලාපොරොත්තු වන්නේ හුදෙක් සමස්ත විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රජාවම අයහපත් තත්ත්වයකට වැටී ඇතැයි සිතන්නට නොවේ. සුළු පිරිසකගේ එබඳු නොසැලකිලිමත් ක්‍රියාදාමයන් නිසා පොදුවේ උපාධිධාරීන්ට රැකියා ලබා ගැනීමේදී ඇති වන ගැටළු සහගත තත්ත්වය ගැන සංවේදී ලෙස සිතා බැලීමයි. අභ්‍යන්තර ශිෂ්‍යයන් වේවා බාහිර උපාධි පාඨමාලා හදාරන ශිෂ්‍යයන් වේවා කළ යුත්තේ විශ්වවිද්‍යාල පද්ධතිය අවමානයට ලක් කිරීමට නොව එය ඉහළ තලයකට නංවා ලන සේ කටයුතු කරමින් එමගින් රජයේ මෙන්ම පෞද්ගලික ආයතනවලත් ප්‍රසාදය දිනා ගැනීමෙන් රැකියා ලබා ගැනීමේ අවස්ථා වර්ධනය කර ගැනීමට උත්සාහ දැරීමයි. පොදුවේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් හා උපාධිධාරීන් යහපත් විනයගරුක හැසිරීමක් ඇති පිරිසක් බවට ඔබ ආදර්ශයෙන් රටට පෙන්නුම් කළ යුතුයි.

අනිකුත් බොහෝ ආයතනවල මෙන් විශ්වවිද්‍යාලවල ද දර්ශනය (Vision) හා අරමුණ (Mission) පිළිබඳ ප්‍රකාශන ඉදිරිපත් වීම සිදු වෙයි. එසේ වුවද විශ්වවිද්‍යාලයක ඇගයීම් හා සාරධර්ම, එහි අත්පොතේ ඇති ඉහත ප්‍රකාශනවලට සීමා කළ නොහැකිය. විශ්වවිද්‍යාල ගුරුශිෂ්‍ය සියලු දෙනාම එම ඇගයීම් හා සාරධර්ම, රැකියා ලබා ගත හැකි ආයතනවලට මෙන්ම පොදුවේ සමාජයටම, ක්‍රියාවෙන් ප්‍රදර්ශනය කළ යුතුය. එමඟින් වර්තමානයේ එවැනි ආයතනවල විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් පිළිබඳ පවත්නා අවාසිදායක හැඟීම් දුරු කරලිය හැකි වනු ඇත.

ඔබ දැන් ජීවත් වන්නේ තාක්ෂණික වශයෙන් ශීඝ්‍රයෙන් ඉදිරියට යමින් සිටින සමාජයකය. ඔබ මෙතෙක් ඇතැම් විෂය පිළිබඳව ලබාගෙන ඇති දැනුම යල් පැනගිය දැනුමක් බවට වේගයෙන් පත් වෙමින් ඇත. එබැවින් ඔබ වහ වහා නව දැනුම සොයා යා යුතුය. එමගින් ඔබේ දැනුමේ කාලීන බව හා වැදගත් බව හිමි කර ගැනීමට ප්‍රයත්න දැරිය යුතුය. දැනට භාවිත වන නිරන්තර වෘත්තීය ශක්‍යතා වර්ධනය' (CPD) , (Contnuin Professional Development) වැනි නව යෙදුම් සහ 'ජීවිත කාලය පුරා අධ්‍යාපනය' (Life - long Education) වැනි ඒවා අප හමුවේ ඇති නවතම සංකල්ප වෙයි.

අතිශය තරඟකාරී ලෝකයක, සාර්ථකත්වය ළඟා කර ගත හැකි තවත් ක්‍රමයක් නම් බහුවිධ කුසලතා අත්පත් කර ගැනීමයි. එලෙස බහුවිධ කුසලතා සහිත වීම වෘත්තිකයකුගේ තත්ත්වය තහවුරු කරලයි. අප දන්නා පරිදි එවැනි බොහෝදෙනා නිදසුන් ලෙස ගතහොත් ඉංජිනේරු වෘත්තිකයන්, ගණකාධිකරණය, කළමනාකරණය වැනි බහුවිධ දැනුම හා කුසලතා හිමිකර ගැනීම මගින් සිය වෘත්තියෙහි වැඩි සාර්ථකත්වයක් අත්විඳිමින් සිටිනු දැකගත හැකිය. උපාධිධාරීන් සුදුසු පරිදි පශ්චාද් උපාධි අධ්‍යයන සඳහා යොමු වීම මඟින් ද මෙබඳු අතිරේක කුසලතා හා උසස් වීම් ලබා ගනිමින් සාර්ථක වෘත්තීය ජීවිතවලට එළඹීම සිදු විය හැකිය.

අතීතයේ දිනවල මෙරට උපාධිධාරීන්ට පශ්චාද් උපාධි ලබා ගැනීම සඳහා එංගලන්තය, ඇමෙරිකාව වැනි විදේශීය රටවලට යාම අත්‍යවශ්‍ය වී තිබිණ. මෙරට විශ්වවිද්‍යාලවල පශ්චාද් උපාධි අධ්‍යයන කටයුතු කරන ලද්දේ සීමිත වශයෙනි. එවැනි පාඨමාලා පැවැත්වීම සඳහා විශ්වවිද්‍යාලවලට, එහි ආචාර්ය මණ්ඩලවලට කිසිදු අමතර ප්‍රතිපාදන ලැබීමක් සිදු නොවීය.

කල් පසු වන විට තත්ත්වය වෙනස් වන්නට විය. පශ්චාද් උපාධි අධ්‍යයන හා අදාළ පාඨමාලා පැවැත්වීම වඩාත් ප්‍රචලිත වූ අතර ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ද සැපයිණ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඇතැම් විශ්වවිද්‍යාලවල පශ්චාද් උපාධි පීඨ ආරම්භ වීම, විශ්වවිද්‍යාලවල පශ්චාද් උපාධි අධ්‍යයන පාඨමාලා ප්‍රචලිත වීම හා ජනප්‍රිය වීම පිළිබඳ සාක්ෂි ලෙස දැක්විය හැකිය. අද අපට දක්නට ලැබෙන පරිදි විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගෙන් සියයට දහයේ සිට සියයට තිහ දක්වා සංඛ්‍යාවක් පශ්චාද් උපාධී අධ්‍යයන හා පර්යේෂණවල නියැලී සිටිති. මෙය සැබැවින්ම අප රටේ සංවර්ධනයට උපකාරී වන තත්ත්වයකි. මෙරට වාණිජ්‍යය හා ආර්ථිකය, දියුණු රටවල් හා යම් තරමකට හෝ සමගාමීව පවත්වා ගැනීමට මෙම පශ්චාද් උපාධි පර්යේෂණ ද බොහෝ දුරට හේතුවනු ඇත.

අද දින ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර ශිෂ්‍යයන්ට උපාධි පිරිනැමෙන මෙම උපාධි ප්‍රදානෝත්සවයේ දේශනය පවත්වමින් මෙම අවස්ථාවට සහභාගි වීමට ලැබීම ගැන මම ඉමහත් සතුටට පත්වෙමි. එසේම විශ්වවිද්‍යාල මගින් පැවැත්වෙන බාහිර උපාධි පාඨමාලා පිළිබඳව ද විශේෂයෙන් යමක් මෙහිදී සඳහන් නොකළහොත් එය අඩුවක් යයි සිතමි.

බාහිර උපාධි පාඨමාලා පැවැත්වීම, ඇතැම් විශ්වවිද්‍යාලවලට පොදු වූවකි. විදේශීය විශ්වවිද්‍යාල ගැන සලකන විට, ලන්ඩන් විශ්වවිද්‍යාලය මගින් දශක ගණනක් පුරාම බාහිර උපාධි පාඨමාලා පවත්වා ගෙන යනු ලැබීය. අභ්‍යන්තර වශයෙන් දේශනවලට සහභාගි නොවී බොහෝ අය එම බාහිර උපාධි ලබා ගත්හ. මෙම උපාධි පාඨමාලා වැඩි වශයෙන් කලා, සමාජීය විද්‍යා හා කළමනාකරණය වැනි ක්ෂේත්‍රවලට අදාළ විය. ප්‍රායෝගික පුහුණුව, පරීක්ෂණාගාර පුහුණුව හෝ වෛද්‍ය සායන ප්‍රායෝගික පුහුණුව අවශ්‍ය නොවන පාඨමාලා සම්බන්ධයෙන් මෙම බාහිර උපාධි පිරිනැමීම සිදු විය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය බාහිර උපාධි සඳහා ශිෂ්‍යයන් විශාල සංඛ්‍යාවක් ඇතුළත් කරගනිමින් සිටින බව අපි දනිමු. කෙසේ නමුත් අභ්‍යන්තර ශිෂ්‍යයන්ගේ සමත් වීමේ සංඛ්‍යාව සමග සසඳන විට බාහිර ශිෂ්‍යයන්ගේ සාමර්ථ්‍යයෙහි ප්‍රතිශතය අඩු වීම පුදුමයට කරුණක් නොවන්නේය. මෙයට එක් හේතුවක් ලෙස මා දකින්නේ බාහිර ශිෂ්‍යයන් අතුරෙන් වැඩිදෙනා හෝ කිසියම් සංඛ්‍යාවක් දැනටමත් රැකියාවල නිරතව සිටින බැවින් උපාධි පාඨමාලාව වෙනුවෙන් ඔවුන්ගේ කැප වීම අභ්‍යන්තර ශිෂ්‍යයන්ට වඩා අඩුවීමයි. ඒ සමඟම අභ්‍යන්තර ශිෂ්‍යයන්ට මෙන් විශ්වවිද්‍යාලය තුළම දිනපතා දේශනවලට සහභාගී නොවීමෙන්, දැනුම ලබාගැනීමට ඇති අවම පහසුකම් හේතු කොටගෙන ද මෙසේ විය හැකිය. ඇතැම් විට මෙම බාහිර ශිෂ්‍යයන් රැකියාවල නිරත වෙමින්, විවාහකව දරුවන්ගේ හා නිවෙස්වල කටයුතු පිළිබඳ වගකීම් බහුල වීම නිසා ද කාලවේලා මඳ වීමෙන් මෙසේ වනු ඇත.

විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ අවශ්‍යතාව හා ඒ ගැන උනන්දුව අද දිනෙන් දින වැඩිවෙමින් පවති. ඒ අනුව, බාහිර උපාධි පාඨමාලා පැවැත්වීම මඟින් ශිෂ්‍යයන්ට මහඟු මෙහෙවරක් ඉටු කිරීමට විශ්වවිද්‍යාලවලට අවකාශ ඇත. බොහෝ විට අප රටේ තරුණ පෙළට විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමි වන්නේ හුදෙක් ඔවුන්ගේ දැනුම හෝ කැප වීම මඳ වීම නිසාම නොවේ. විශ්වවිද්‍යාලවලට බඳවා-ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාවේ සීමිත බව මීට එක් හේතුවකි. බාහිර උපාධි පාඨමාලා සාර්ථක ලෙස පවත්වාගෙන යාමටත් ශිෂ්‍යයන් වැඩි සංඛ්‍යාවකට එයින් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමටත් වඩාත් සුදුසු වන පරිදි බාහිර උපාධි පාඨමාලා හා ඒවා පැවැත්වෙන ක්‍රමය ද කලින් කලට සංශෝධනය විය යුතුය.

මා සිතන පරිදි එම තත්ත්වය ඉහළ නංවාලීමට උපකාරී විය හැකි එක් ක්‍රමයක් නම් බාහිර ශිෂ්‍යයන් සඳහා ද සීමිත ප්‍රමාණයක හෝ විශ්වවිද්‍යාලය තුළ ඉගෙනීමක් ලැබිය හැකි පරිදි දේශනමාලා කිහිපයක් හෝ සංවිධානය කිරීමට පියවර ගැනීමයි. එමගින් කිසියම් අධ්‍යයන සහායක් ඔවුන්ට ලබා දිය හැකි ක්‍රමයක් ඇතොත් එය ඉතා අගනේය. මෙය ඉටු කරගත හැකි එක් මාර්ගයක් නම් පිළිගත් සුදුසු ආයතනයක් හෝ ආයතන විෂය අන්තර්ගත සම්පාදනය කරන්නන් Academic Content Prociders ලෙස ලියාපදිංචි කොට, විශ්වවිද්‍යාලය විසින් එම ආයතන මඟින් ශිෂ්‍යයන්ට විෂය අන්තර්ගත (Academic Content) ලබා දීමට පහසුකම් සලස්වනු ලැබීමයි. මෙවැන්නක් සඳහා සාධාරණ මුදලක් අය කිරීමෙන් මෙය ක්‍රියාත්මක කිරීම පහසු වනු ඇත. එබඳු විෂය අන්තර්ගත සම්පාදනය කරන ආයතන අදාළ ශිෂ්‍යයන් ලියාපදිංචි කරගනිමින් එම කාර්යය ඉටු කිරීමට යොමු විය හැකිය. මෙවැනි ක්‍රමයක් මගින් බාහිර උපාධි ප්‍රදානය කිරීමේ ක්‍රමයක් උපාධි ලබන්නන්ගේ සංඛ්‍යාව මෙන්ම ඔවුන් ලබන දැනුමෙහි ගුණාත්මක භාවයත් වර්ධනය කර ගැනීමට ද හැකිවනු ඇත.

මෙම වැඩ පිළිවෙළ පෙර නොවූ විරූ නව ක්‍රමයක් නොවේ. පසුගිය කාලය තුළදී මෙන්ම වර්තමානයේ දී ද ලන්ඩන් විශ්වවිද්‍යාලය මගින් මෙවැනි ක්‍රමයක් ක්‍රියාත්මක වන අතර දැනට මොරටුව විශ්වවිද්‍යාලය මීට සමාන ක්‍රමයක් අනුගමනය කරමින් තොරතුරු තාක්ෂණය පිළිබඳ බාහිර උපාධි පිළිබඳ වැඩසටහනක් ක්‍රියාත්මක කරමින් සිටී.

මේ සඳහා යොදා ගතහැකි තවත් ක්‍රමයක් නම්, බාහිර උපාධි පාඨමාලාවලට අදාළ දේශන, අභ්‍යාස පන්ති ආදියට අවශ්‍ය වන විෂය අන්තර්ගතයන් අන්තර්ජාලයට එක්කොට ලියාපදිංචි වී සිටින ශිෂ්‍යයන්ට හඳුනා ගැනීමේ සලකුණක් (password) ලබා දී ඔවුන්ට ඒවා අධ්‍යයනය කිරීමට ඉඩ සැලැස්වීමයි. විශ්වවිද්‍යාල අධ්‍යාපනය පිළිබඳව ශිෂ්‍යයන්ගේ උද්යෝගය දැඩි වෙමින් පවතින වර්තමානයේ එම සමාජ අවශ්‍යතාව සපුරාලීමට නව ක්‍රමවිද්‍යාවන් සොයා ගත යුතුය. විශ්වවිද්‍යාල

පද්ධතියත්, පෞද්ගලික අංශයත්, අධ්‍යයන විෂය අන්තර්ගත සපයන්නන්, මෙන්ම තොරතුරු තාක්ෂණය ද යන මේ සියල්ල එක්තැන් කොට, කවර හේතුවක් නිසා හෝ විශ්වවිද්‍යාලවලට ප්‍රවේශ වීමට නොහැකිව සිටින ශිෂ්‍යයන් අතිබහුතරයක ඉගෙනීමේ අවශ්‍යතා සපුරාලීමට පියවර ගත යුතුය.

මාගේ දේශනයේ අවසානයට දැන් පිවිස ඇත. අද දින, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් බාහිර උපාධි ලබා ගන්නා ශිෂ්‍යයන් වෙනුවෙන් පැවැත්වෙන මෙම උපාධි ප්‍රදානෝත්සවයේදී මෙවැනි අදහස් කිහිපයක් ඔබ ඉදිරියේ ප්‍රකාශ කිරීමට අවස්ථාව උදාවීම සතුටට කරුණකි. අද වන විට ඔබ සියලුදෙනා දැඩි උත්සාහයකින් අධ්‍යයන කටයුතුවල නිරත වී මෙම උපාධි ලබා ගත්තා සේම ඉදිරියටත් පශ්චාද් උපාධි අධ්‍යයන හා පර්යේෂණ සඳහා උද්‍යෝගයක් ඇතිකර ගන්නා මෙන් ඉල්ලා සිටිමි. එමගින් තවදුරටත් දැනුම හා කුසලතා වර්ධනය කරගැනීමෙන් ඔබේ අනාගත ජීවිතය වඩාත් සාර්ථක කර ගැනීමට ඔබට හැකි වනු ඇත.

මැතකදී මා හට ඕස්ට්‍රේලියාවේ ප්‍රකට විශ්වවිද්‍යාලයක් වන මොනෑෂ් විශ්වවිද්‍යාලයේ ආදර්ශ පාඨයක් දැකගන්නට අවස්ථාව උදා විය. 'ANCORA INPARO' එනම්,''අපි තවමත් ඉගෙන ගනිමින් සිටිමු'' යන්නයි. අධ්‍යාපනය යනු ඔබ අප හැමදෙනා ජීවිත කාලය පුරාම ලබන්නා වූත්, ලබන්නට කැමති වන්නා වූත් දෙයකි. පොතපතේ දැනුම ලබා ගැනීමට අමතරව, ඔබේ කුසලතා දියුණු කර ගැනීමට නිරන්තරයෙන් දරන ප්‍රයත්නය ඔබේ අභිවෘද්ධියට නිසැකයෙන්ම හේතු වනු ඇත. එමගින් ඔබට වඩාත් සාර්ථක ලෙස රටේ ආර්ථිකයට හා සංවර්ධනයට දායක විය හැකිවනු ඇත.

මෙම දේශනය පැවැත්වීමට මට අවස්ථාව ලබා දීම වෙනුවෙන් උපකුලපතිතුමාටත් පාලක මණ්ඩලයට හා සනාතන සභාවටත් ස්තුතිවන්ත වෙමි. අද දින මෙහිදී උපාධි ලැබූ ඔබ සියලුදෙනාම ප්‍රීති ප්‍රමෝදයෙන් මෙන්ම ඉමහත් උද්‍යෝගයකින් ද දීප්තිමත් අනාගතයක් ප්‍රාර්ථනා කරමින් ද පසුවන බව අපි දනිමු. ඔබ සියලුදෙනාගේම එම සිහින සැබෑ කර ගනිමින් ප්‍රීතිමත් නව වසරකට පා තබමින් වාසනාවන්ත අනාගතයක් උදා කරගැනීමට හැකි වේවායි මම ප්‍රාර්ථනා කරමි.

<u>*2010.01.22*</u>

# 38

# සාර්ථකත්වය උදෙසා දේශයේ මුල් සොයා යමු

ආචාර්ය පී. ඒ. කිරිවන්දෙණිය

අද දින මේ වැදගත් අවස්ථාවට මට ආරාධනයක් ලැබීම මගේ ජීවිතයේ හා මගේ විශ්වවිද්‍යාලීය ජීවිතයේ ඓතිහාසික මෙන්ම ගෞරවනීය අවස්ථාවකි. මට පුද්ගලිකවත් මා නිරත වී සිටින සංවර්ධන ක්‍රියාවලියටත් දක්වූ විශාල පිළිගැනීමක් ලෙස මෙම අවස්ථාව මතක් කිරීමට කැමැත්තෙමි. මේ අවස්ථාවට මට ආරාධනය කළ උපකුලපතිතුමා සහ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයට මම ස්තුතිවන්ත වෙමි. තවද මේ ආරාධනය හා මෙම අවස්ථාව මම අගය කරනුයේ විදුදය සරසවියේ ආදි ශිෂ්‍යයෙකු ලෙසත් එම සරසවි මැණියන්ගෙන් පෝෂ්‍ය වී පන්නරය ලැබූ ශ්‍රී ලාංකික ජන සමාජයට විශේෂයෙන් පොදු ජනයාට යමක් කිරීමට මා ලැබූ සරසවි අත්දැකීම් ආවර්ජන කිරීමට මෙමඟින් අවස්ථාවක් ලැබීම නිසාය.

අද ඔබ හැම දෙන උපාධි වරම් ලබනුයේ ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර සිසුන් ලෙස අධ්‍යාපනය ලැබූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් වශයෙනි. ඔබ ලබන උපාධි සහතිකය බාහිරද අභ්‍යන්තර ද යනුවෙන් වර්ගීකරණයක් හෝ අවතක්සේරුවක් නොකෙරේ. උපාධියක් ලැබීමට අවශ්‍ය විෂය දැනුම ඔබ සපුරා ගත් බැවින් උසස් අධ්‍යාපනය ලත් උපාධිධාරී පිරිසක් ලෙස සමාජයට පිවිසෙන්නේ රටේ ජනගහනයෙන් ඉතා සුලු පිරිසකට ලැබුන වරප්‍රසාදයක් ලබා ගනිමිනි. එබැවින් කිසිවිටකත් ඔබට නොයෙකුත් හේතුන් නිසා විශ්වවිද්‍යාලයීය අභ්‍යන්තර ශිෂ්‍යයෙකු ලෙස අධ්‍යාපනය ලැබීමට නොලැබුනා යැයි හීනමානයක් හෝ පසුතැවීමක් ඇති කර ගැනීම අවශ්‍ය නොවේ.

අප ඔබ අගය කළ යුතුය. හේතුව තරඟයකදී ලකුණක් අඩුවීම නිසා හෝ වෙනත් හේතුවක් නිසා හෝ විශ්වවිද්‍යාලයට පිවිසීමට අවස්ථාව නොලැබ අධ්‍යාපනය අත් නොහැර අඛණ්ඩව තමන්ගේ අධ්‍යාපන කටයුතු කරගෙන යාමටත් එයින් ප්‍රතිපල ලබා ගැනීමටත් ඔබ තුළ තිබූ ධනාත්මක හැඟීම හා බුද්ධිය කොතරම් දැයි කෙනෙකුට තේරුම් ගැනීම පහසු වන නිසාය. වත්මන් සමාජය අධ්‍යාපනය ලබන ක්‍රම දෙකක් ඇත. එක් ක්‍රමයක් වන්නේ ප්‍රාථමික පාසල් අධ්‍යාපනයේ සිට විශ්වවිද්‍යාලය දක්වා වූ විධිමත් අධ්‍යාපන ක්‍රමයයි. අනෙක් ක්‍රමය වන්නේ තම ජීවිත තක්ෂිලාවෙන් අධ්‍යාපනය ලබන ක්‍රමයයි. පළමු ක්‍රමය පිළිබඳ අද කවුරුත් සෑහීමකට පත් නොවන අතර ඒ ගැන නිතර නිතර සංශෝධන, ප්‍රතිසංශෝධන සිදු කරනු ලැබේ. ඒ නිසාම අධ්‍යාපනය විශාල අවුල් සහගත තත්ත්වයකට පත් වී ඇති. මේ නිසා අධ්‍යාපනයේ මූලික අපේක්ෂාවක් වූ ගුණ නැණ බෙලෙන් යුතු පුරවැසියන් පිරිසක් බිහි වීම අඩාල වී ඇත. ශ්‍රී ලංකාවට නිදහස් අධ්‍යාපනය හඳුන්වාදෙන අවස්ථාවේ එදා රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සිටි එක් විද්වතෙක් කළ ප්‍රකාශය ඉතා වැදගත් ය. 'නිදහස් අධ්‍යාපනය සාර්ථක වූවාදැයි අපට මැනිය හැක්කේ අනාගත පාර්ලිමේන්තුවට එන හා එවන පිරිසගේ ස්වභාවය අනුවයි' මෙය කොයිතරම් ප්‍රශස්ත ප්‍රකාශනයක් දැයි අද පාර්ලිමේන්තු ක්‍රියාකාරිත්වය දෙස බැලීමේදී අපට මනාව වටහා ගත හැක. එනිසා මා කල්පනා කරන්නේ වත්මන් සාම්ප්‍රදායික අධ්‍යාපනය පූර්ණ පුරවැසියෙකු හෝ සාර්ථක වූ රටක් හෝ යහපාලනයක් ඇති රටක ගොඩනැගීමට දෙනු ලබන දායකත්වය ප්‍රමාණවත් නොවන බවයි. අධ්‍යාපනයෙන් රටට ලැබිය යුතු දායකත්වය උපරිම වශයෙන් ලබාදීමට පවතින අධ්‍යාපන ක්‍රමයට හැකි වී නැති බව මාගේ විශ්වාසයයි.

රටේ ඉදිරි ගමනට හවුල්වූවන් අතර ජීවිත තක්ෂිලාවෙන් අධ්‍යාපනය ලැබූ කිහිප දෙනෙක් පිළිබඳව මෙහිදී හඳුන්වා දීමට කැමැත්තෙමි. මේ රටේ මහා ගත්කරු ලෙස විරුදාවලිය ලැබූ මාර්ටින් වික්‍රමසිංහ සූරීන් ද කීර්තිමත් පුරාවිද්‍යා විශේෂඥයකු වූ ආචාර්ය සෙනරත් පරණවිතාන මහතා ද, පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමිපාණෝද, පූජ්‍ය වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමිපාණෝ ද, පූජ්‍ය යක්කඩුවේ පඤ්ඤාරත්න හිමිපාණෝ ද ඉන් කිහිප දෙනෙකි. අනුරාධපුර, පොළොන්නරු යුගයේ වාරි කර්මාන්තයේ විශේෂඥයන් වූ බුලතා සහ කවටයා ගැනද ජනප්‍රවාදයේ සහ ඉතිහාසයේ සටහන්ව ඇත. මේ කිසිවෙක් වත්මන් විශ්වවිද්‍යාල හෝ තාක්ෂණික ආයතනවලින් බිහි වූවෝ නොවෙති. පෙරදිග ඉතිහාසය දෙස බැලීමේ දී ද ඔක්ස්ෆර්ඩ් හා කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාල ගොඩනැගුණේ ද විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබූවෝ නොවෙති. අන්ධකාර යුගයෙන් යුරෝපය මුදවා ගත් සියලුම විද්වතුන් ජීවිත තක්ෂිලාවෙන් අධ්‍යාපනය ලැබූ අයයි.

එබැවින් සාර්ථක ජීවිතයකට පොතපතින් ලැබූ දැනුම පමණක් ප්‍රමාණවත් නොවන බවත් තම තමන්ගේ මහත් අධිෂ්ඨානයෙන් ගොඩනඟා ගන්නා වූ අත්දැකීම් ප්‍රයෝජනවත් වන බවත් පැහැදිලිය. අද උපාධිධාරියකු ලෙස සහතික ලබන ඔබ එම සහතිකය ඔබේ ජීවිතයට ආලෝකයක් ලබා දෙනු ඇතැයි කල්පනා කරමින් එය ආභරණයක් ලෙස පැළඳගෙන සිටිනවා වෙනුවට උපාධියෙන් ලද දැනුම උපකරණයක් ලෙස හඳුනාගෙන තම ජීවිතය සකස් කර ගන්නේ නම් ඔබ යහපත් සාර්ථක පුරවැසියෙක් වනු ඇත.

1965 විශ්වවිද්‍යාලයෙන් පිට වූ මා ගැන ඔබට යමක් ප්‍රකාශ කිරීම උචිත යැයි සිතමි. මට ආරාධනා කළ මගේ හිතවතුන්ද මගේ ජීවිත අත්දැකීම් ඔබ වෙත ප්‍රකාශ කිරීම පිළිබඳව සතුටු වනු ඇත. ඇත එපිට පිටිසර ගම්මානයක ඉපිද, සැතපුම් හත අටක් පයින් ගොස් උසස් අධ්‍යාපනය ලැබ විද්‍යෝදය විශ්වවිද්‍යාලයට ඇතුළත් වූවෙමි. එදා අපේ ගම විශ්වවිද්‍යාලය හෝ නැවුම් ලෝකය පිළිබඳව හෝ අවබෝධයක් තිබූ ගමක් නොවේ. එබඳු පරිසරයකින් බිහිවූ මා පිළිබඳව ඔබ නම් සැබෑවටම සිතනු ඇත්තේ රජයේ උසස් වැටුපක් ලබාගත හැකි සුව පහසු රැකියාවක් ලැබිය යුත්තෙකු ලෙසය. වාසනාවකට හෝ අවාසනාවකට මට කිසිවිටකත් රජයේ රැකියාවක් ගැන එතරම් උනන්දුවක් නොවීය. උගත් පාසැලේ ගුරුවරයකු ලෙස සේවය කොට පාසැලට ණය ගෙවීමට පමණක් මට වුවමනාවක් තිබුණි. ඒ සඳහා අවුරුදු කිහිපයක් රජයේ පත්වීමක් ලැබ ගුරුවරයකු ලෙස සේවය කොට එම අභිලාෂය මුදුන් පත් කර ගතිමි.

තරුණයකු ලෙස මගේ උත්සාහයෙන් මගේ ජීවිත බලාපොරොත්තු ඉටු කර ගැනීමට කැප වුණෙමි. දේශපාලන ව්‍යාපාරවල හා සමාජසේවා කටයුතුවලද නිරත වුණෙමි. මේ කිසිවක් මාගේ උපන් ගතිවලට ගැළපුනේ නැත. ඒ නිසා මගේ ගමට ගොස් ගැමියන් සමඟ විවිධ අත්හදා බැලීම්වල නිරත වූයෙමි. 1977 මෙරටට විවෘත ආර්ථික ක්‍රමය හඳුන්වා දුන් අවස්ථාවේ දුප්පත් ගැමියන්ට මුහුණදීමට සිදු වන ගැටළු අවබෝධ කරගත් මම ඒ සඳහා උපක්‍රමයක් ලෙස කුඩා මිනිසුන් හා එක්ව බැංකු ක්‍රමයක් ආරම්භ කළෙමි. එදා ගැමියන්ට රුපියල් පහක් සොයා ගැනීමට බැරිව පොල් ගස් උකස් කිරීමට සිදුවිය. සමහර ගොවියන්ට මේ පොල් ගස බේරා ගැනීමට රුපියල් පහක් නොමැතිව අවුරුද්දක් තරම් කාලයක් ගහේ පලදාව උකස්කරුට දීමට සිදුවිය. මේ ගැටලුවට විසඳුමක් ලෙස ඉතිරි කිරීමේ හා ණය දීමේ ක්‍රමයක් ආරම්භ කළෙමි. ගමේ පන්සල මුල් කරගෙන හාමුදුරුවරුන්ගේ මූලිකත්වයෙන් ඇරඹුන මේ වැඩ සටහන ගොවියාට අවශ්‍ය ණය මුදල් ලබා දුන්නේය. එවකට ගම්වල තිබනු ණය දෙන සමිතිද මේ වැඩසටහනට එක් විය. වසර කිහිපයක් ගත වන විට ඉතා ජනප්‍රිය වූ මේ ක්‍රමය රටේ මහා පරිමාණ ව්‍යාපෘතිවලට ද හවුල් කර ගත්තේය. නිවාස දශලක්ෂයේ

වැඩ සටහන එයින් එකකි. අද 'සණස' නමින් දේශීය හා විදේශීය වශයෙන් ජනප්‍රිය සූක්ෂම මූල්‍ය ක්‍රමයක් ගොඩ නැගී ඇත්තේ මේ සංකල්පය මතය.

සාර්ථක සිද්ධියක් ලෙස ''සණස'' ගොඩනගා නැගීමට කැප වූ කරුණු කිහිපයක් සඳහන් කිරීමට කැමැත්තෙමි.

බොහෝ අය කල්පනා කරන්නේ මුදල් නොමැතිව කිසිවක් කළ නොහැකි බවයි. නමුත් මිනිසුන් සතු විවිධ වූ සාරධර්ම හා නැති බැරිකම් හඳුනාගෙන ඒවා ඒකරාශි කිරීමට මුදල් අවශ්‍ය නොවන බව තේරුම් ගත යුතුය. මිනිසුන්ට ආදරය කරුණාව හා ගෞරවය දැක්වීම තුළින් මුදල් නොමැති අඩුව පිරිමසාගත හැකි බව අප තේරුම් ගත යුතුය. අවුරුදු සිය ගණනක් අප ජීවිත තුළ පැලපදියම් වී ඇති ගති ලක්ෂණ රාශිකරණය කිරීම මාගේ වැඩ සටහනේ ප්‍රථම කාර්යය විය. ගැමියන්ගේ අරපිරිමැස්ම, විවෘත බව, සරල ජීවිත අපේක්ෂාවන් ඉලක්ක කරගෙන වැඩ කළ නිසා අද අප සාර්ථක වී ඇත. සංවර්ධනයට අවශ්‍ය සමාජ ප්‍රාග්ධනය අසීමිතව අප රට තුළ ඇති බව සංවර්ධන විද්වතුන් තේරුම් නොගැනීම අවාසනාවකි. මේ රටේ බැංකු ස්ථාපිත කළේ රජය හෝ ධනවත් ව්‍යාපාරික ප්‍රජාවයි. නමුත් මා සමඟ සිටින්නේ මේ රටේ දුප්පත් අඩු ආදායම්ලාභී පිරිසයි. ඔවුන්ගේ බැංකුව අද රුපියල් කෝටි 160 ක ප්‍රාග්ධනයක් ඇති ආයතනයකි. මේ සාර්ථකත්වය තුළින් ඔබට දෙන පණිවිඩය නම් තමන්ගේ දේ හා තමන්ගේ මිනිසුන් කෙරෙහි විශ්වාසය තබන ලෙසය. බටහිරට ගැති බටහිර මතිමතාන්තරවලට ලැදි මනස වෙනස් කර ගැනීම සාර්ථකත්වයට හේතුවක් බවද මතක් කර දීම වැදගත් වේ.

උගත් විද්වතුනි,

ඇයි අපි අප ගැන අභිමානයක් ඇතිකර නොගන්නේ? සංවර්ධනයට උපදෙස් සොයා දේශදේශාන්තරවල සංචාරය කර අප මෙරටට ගෙන එන්නේ කුමක්දැයි විමසිලිමත් විය යුතුය. ලෝක බැංකුවේත් ආසියානු සංවර්ධන බැංකුවේත් උපදෙස් ලබා ගන්නා අපි කිසිවිටෙකත් මේ රටට ආවේණික දේ ගැන සොයා නොබලති. සිරිලක පෙරදිග ධාන්‍යාගාරයක් ලෙස පැවැති යුගය වචනයට සීමා වූවක් ලෙස සලකන්නන් එමටය. නමුත් තෝනිගල සෙල්ලිපිය හදාරණ විට ධාන්‍යාගාරයේ බැංකුවක් තිබුණ බවත්, එහි පොලිය නියම කර තිබූ බවත්, භාණ්ඩාගාරයෙන් බීජ සැපයූ බවත් (මූල්‍ය ධනය), පොලියෙන් පන්සල දියුණු කළ බවත් ඒ උපදේශකයන්ට කියා නොදෙන්නේ ඇයි? මෙය අපේ අවාසනාවයි. පරගැති මනස අපගේ කොඳු ඇට බිඳ දමා ඇත. එබැවින් අද උපාධි ලබන ඔබ ඔබේ ගම රට ඔබේ ඉරණම බව තේරුම් ගතහොත් ඔබට නොවරදින බව සහතිකය. මා සාර්ථක වූයේ ගම රට මා අමතක නොකළ බැවිනි. අද අපි සාමකාමී පරිසරයක ජීවත් වන්නේ බටහිර උපදෙස් පසුපස නොගොස් අපේ මතය, තීරණය හරි හෝ වැරදි වූවත් ඒ අනුව කටයුතු කළ නිසාය. එම නිසා ඔබ ඔබේ ඉරණම විසඳා ගන්නවා මිස අනුනට ඔබේ ඉරණම විසඳීමට ඉඩ නොදෙන්න. උගත් ඔබ එසේ සිතන්නේ නම් ඔබ පසුපස බොහෝ දෙනෙකු එනු ඇත.

නව යොවුන් වයස ඉක්මවූ ඔබටත් වැඩිහිටි අයටත් පුංචි කාලේ පෙර පාසැලේදී කියූ කවියක් මතක ඇතැයි සිතමි.

''බිංදු බිංදු එක් වෙලා ගංගා හැදෙනවා
ගංගා ගංගා එක්වෙලා මුහුද හැදෙනවා''

මුහුදේ ගංගා ආරම්භ වූ බවක් අසා තිබෙනවාද? ඒ නිසා වැඩ පටන් ගත යුත්තේ බිංදුවෙන්ය. හෙමිහිටය, කුඩාවටය. එදා මී කුණෙන් සිටුවරයෙක් වූ කථාවත් මෙදා රුපියල් 50ක් ගෙන ගමෙන්

කොළඹට පැමිණ සිටුවරයෙක් වූ කථාවත් ඔබ අසා ඇතැයි සිතමි. ටොයොටා සමාගම පුංචි බයිසිකල් ඩයිනමෝවක් නිපදවීමට දැරූ උත්සාහයක ප්‍රතිඵලයකි. මෙවැනි සාර්ථක චරිත, සාර්ථක සිද්ධි ඔබගේ ජීවිතයට ආලෝකයක් කර ගන්න.

එංගලන්තය දූපත් රාජ්‍යකි, ජපානය ද දූපත් රාජ්‍යයකි. ඔවුන් 20 වෙනි ශතවර්ෂය ජය ගත්තෝය. 21 වෙනි ශත වර්ෂයේ දූපතක ජීවත් වන අපට ලොව ජය ගත නොහැකි ද? මේ ගැන අපි නිතර නිතර සිහි කරමු. එමෙන්ම එයට අවශ්‍ය ක්‍රියා මාර්ග අප තුළින්ම සොයාගැනීමට උප උත්සාහ ගත යුතුය. අද උපාධි ලබන ඔබ සැම මේ සඳහා කැප වනු ඇතැයි මම විශ්වාස කරමි.

මෙම ගාම්භීර උත්සවයට සහභාගි වන ලෙස මා හට ඇරයුම් කළ ශ්‍රී ජයවර්ධනපුර සරසවියෙහි සියලු දෙනටම මම මාගේ හෘදයංගම ස්තූතිය පළ කරන්නෙමි. එමෙන්ම උපාධිලාභී ඔබ සැමට සාර්ථක දීප්තිමත් අනාගතයක් ප්‍රාර්ථනා කරමි. ස්ව උත්සාහයෙන් නැගී සිටීමට අවශ්‍ය ධෛර්යය හා ශක්තිය ඔබ සැමදෙනට ලැබේවා! යි මම අවසාන වශයෙන් ප්‍රාර්ථනා කරමි.

<u>*2010.01.22*</u>

# 39

# උපාධිධරයාගේ සමාබද්ධ වගකීම

## මහාචාර්ය විලී මෙන්ඩිස්

උපාධි ප්‍රදානෝත්සවයක් යනු වර්ෂ කිහිපයක් දුෂ්කරතා මධ්‍යයේ අධ්‍යාපනය ලබා උපාධි හිමිකර ගත්තවුන්ට උපාධිය පිරිනැමීමේ අවස්ථාවකි. මේ ගම්භීර අවස්ථාවට සහභාගි වන සෑම උපාධිධරයකුට ම මෙන් ම ඔවුන්ගේ දෙමවුපියන්ට, පවුලේ සාමාජිකයන්ට, මිත්‍රයන්ට හා සුහදයන්ට ද මෙය චිරස්මරණීය දිනයකි. මේ උත්සවය අවසන් වූ පසු සෑම උපාධිධරයෙක් ම ''ජීවන වෘත්ති ලෝකයේ'' මං සලකුණු රහිත මාර්ග සිතියම මත සිය චාරිකාව ආරම්භ කරයි. එහි ආරම්භක ස්ථාන අපැහැදිලි වනු ඇත. එහි අතුරුමාර්ගයන්හි තතු දැන ගැනීමට කිහිපවරක් එහාමෙහා ගමන් කළ යුතු වෙයි. අනික් අතට, ඔබ කණ්ඩායම බෙදුම්වාදී සට්ටනයේ දරුණු අනිශ්චිතතා-වන්ගෙන් නිදහස් වුණු අපේ ආදරණීය මාතෘභූමියේ අපේක්ෂාවන් නියෝජනය කරන්නෝ ය. ඇතැම් විට ඔබ කිහිප දෙනෙකු ඔබේ ගම් පෙදෙස්වල දී හිංසනය හේතුවෙන් ජනිත වූ මානසික කම්පන හා චිත්තවේගයන්හි පීඩාකාරී අත්දැකීම් ද විඳ තිබිය හැකි ය. අන්‍යයන් ද ජීවිතාශාව පිළිබඳ සුළු බලාපොරොත්තුවක් පමණක් ඉතිරි කර තබා ගනිමින් ජීවත් වීමේ කටුක හා බියජනක අත්දැකීම වින්දවුන් විය හැකි ය. කෙසේ වුව ද, වර්ෂ 2009 මැයි මාසය ඒ සියල්ල වෙනස් කර ශ්‍රී ලංකාව ''ආසියාවේ ආශ්චර්යය'' බවට පත් කිරීමේ අභිලාෂය ගොඩනඟා ඇත. ඔබ සියලුදෙනා අපේ රටේ පරිවර්තනයක් සඳහා දායක නො වුව හොත් එය සාක්ෂාත් කර ගත නොහැකි වනු ඇත. ශ්‍රී ලංකාවට ගමන් මඟ වෙනස් කරන්නන් අවශ්‍ය ය. ඔබේ කණ්ඩායම ඒ අභියෝගයන්ට මුහුණදීමේ දී පෙරමුණු බළ ඇණියකි.

උපාධි ප්‍රදානෝත්සවය උපාධිධරයාගේ වගකීම ගැන මෙනෙහි කිරීමට යෝග්‍ය අවස්ථාවකි. රටේ ආර්ථික සංවර්ධනය පිළිබඳ අපේක්ෂාවන් නොතකා කටයුතු කිරීමට ඔහුට නොහැකි ය. උපාධිධරයාගේ තවත් වගකීමක් වන්නේ සංවර්ධනයේ ප්‍රතිලාභ දිවයිනේ සතර දිසාවෙහි ම සර්වසාධාරණ ව පතළ කෙරෙන ආර්ථික වෘද්ධියක් අත්පත් කර ගැනීම කෙරෙහි සංවේදී වීම යි. දිවයිනේ සිදු වන අසමාන ධන ව්‍යාප්තිය හේතුවෙන් බස්නාහිර පළාතට ජාතික ධනයෙන් අඩකට වඩා හිමි වී තිබීමට පිළියම් යෙදිය යුතු ය. මේ උපාධි ප්‍රදානෝත්සවය ඔබට විශ්වවිද්‍යාලයේ ගත කළ සුන්දර ලෝකයෙන් මිදී සමාජයේ පවත්නා සැබෑ තත්ත්වයට ප්‍රවිෂ්ට වීමට සංඥාවක් වනු ඇත.

උපාධි ප්‍රදානෝත්සවය උපාධි අපේක්ෂකයා උපාධිධරයා බවට පත් වීම සංකේතවත් කරන අවස්ථාව යි. අද මේ උපාධිධාරීන්ට යහපත් පුරවැසියකු වී භාග්‍යවත් ජීවිතයක් ගත කිරීමේ විවිධාකාරයේ බලාපොරොත්තු හා ප්‍රාර්ථනා ජනිත වන දවසකි. එය අනාගත සේවායෝජකයාගේ මෙන් ම සමාජයේ ද බලාපොරොත්තු හා නො සැසඳෙනු විය හැකි ය. මේ බලාපොරොත්තු දෙකෙහි ගැළපුම සතුටුදායක ගැළපුමක් වනු ඇත. අනික් අතට එහි සිදුවන ගැටුම උපාධිධරයාට අසන්තුෂ්ටියට හේතුවක් ද ඔහුගේ වෘත්තිමය බලාපොරොත්තු මෙන් ම ජීවන අපේක්ෂා බිඳ දමන්නක් ද වේ. මේ සන්තුෂ්ටිදායක දිනයෙහි ඔබේ අනාගතයේ අවිනිශ්චිතතාව පිළිබඳ කරුණු දැක්වීම මගේ අරමුණ නො වේ. ඔබ ප්‍රවිෂ්ට වූ ''ජීවන වෘත්ති ලෝකයේ'' ස්වභාවය පිළිබඳ වටහා ගැනීමට ඔබ පරිණත වී සිටී. එසේ ද වුව, ඔබ මෙතෙක් ගෙවූ ශාස්ත්‍රාලයීය ජීවිතය විසින් පුබුදුවා ලූ ඔබේ ධී ශක්තිය තවත් ප්‍රමුදිත කිරීමට සංවාදයකට එය ඔබ කැඳවනු ඇත. අනාගතයේ එළඹෙන

කවර අවස්ථාවකට වුව මුහුණ දීමට යෝග්‍ය පරිද්දෙන් විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන් විසින් ඔබේ චින්තනය හැඩ ගස්වනු ලැබ තිබේ. පන්තිකාමරයේ දී ඔබ හදාළ පොතපතෙහි දී හෝ ශාස්ත්‍රීය අධ්‍යයනයන්හි නිරත වීමේ දී හෝ ඔබට හමු නො වුණු තවත් බොහෝ ගැටලුවලට මුහුණදීමට ඔවුහු ඔබට පන්නරය ලබා දුන්හ. මෙතෙක් දුර ආ ගමන හේතුවෙන් ඔබ විඩාපත් ව සිටින බව මා දන්නා නමුදු, මගේ මේ දේශනය ඔබේ මනසට තවත් ස්වල්ප වූ හෝ ප්‍රබෝධකයක් වනු ඇතැයි මම විශ්වාස කරමි.

ඔබ මේ වන විටත් රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ හෝ ''වෘත්තීය ලෝකයේ'' 'රැකියාව කළ හැකි තැනක්' සොයා ගෙන ඇතැයි, නැතහොත් ඉතා ඉක්මනින් සොයා ගනු ඇතැයි මම විශ්වාස කරමි. එසේ වූ විට ඔබට මුලින් ම තදබල ලෙස දැනෙන කරුණක් වන්නේ ඔබ කිසියම් සංවිධානයක කණ්ඩායමක සාමාජිකයකු වී ඇති බව යි. ඔබ හමුවේ ඇති අභියෝගය වන්නේ ඒ සංවිධාන ව්‍යුහයේ ස්ථානගත වීම යි. එහි ලා අවධාරණය කළ යුත්තේ ඔබ සිය ප්‍රගතිය සඳහා ඔබේ දායකත්වය බලාපොරොත්තුවෙන් ඔබට රැකියාවක් ලබා දුන් ආයතනයේ කාර්යපටිපාටියෙහි ක්‍රියාකාරී ඒකකයක් විය යුතු බව යි. එහි සමස්ත පාලන ව්‍යුහයේ ස්වරූපය ඔබේ නව පන්ති කාමරයේ දී උගන්නා පළමු වන පාඩම යි.

විශ්වවිද්‍යාලයෙන් ඔබ ලැබූ අධ්‍යාපනය හා පන්නරය අලුතෙන් පිවිසි සමාජයෙහි ඔබට හිමි ස්ථානය දිනා ගැනීමට පිටුබල වනු ඇත. මානව සම්පත්, සේවාදායක මෙහෙවර හෝ අනුග්‍රාහකයා වෙනුවෙන් කටයුතු කිරීම, නිෂ්පාදනය, අලෙවිය හා බෙදා හැරීම, මූල්‍ය ශක්‍යතාව, ආචාරධර්ම හා සංස්ථාපිත සමාජ වගකීම යන අංගවල විවිධ පාර්ශ්ව සහිත නව අත්දැකීම් හා කුසලතා අත්කර ගැනීමේ ප්‍රගති අනුපාතය ඊට අන්තර්ගත වෙයි. අර්ථාන්විත තෝරා ගැනීම හා නිවැරදි තීරණය සඳහා නව අත්දැකීම් හා කුසලතාවන්හි නිපුණත්වයක් ලැබීම අවශ්‍ය වෙයි. සංස්ථාපිත පාලන විධිය සංවිධානයක මූලිකාංගයකි. එය එහි තීරණ ගැනීමේ ව්‍යුහයේ තීරණාත්මක චරිත මෙන් ම එහි ප්‍රතිඵලවල ස්වරූපය ද පිළිබිඹු කරයි. උපාධිධරයා සංස්ථාපිත පාලන විධියෙහි කොටස්කරුවකු වීමට යෝග්‍ය අන්දමින් හැඩ ගස්වනු ලැබූවෙකි. කිසියම් ආයතනයකට සුවිශේෂී නිෂ්පාදන හා සේවා පිළිබඳ නව දැනුම ලබා ගැනීම ද ඒ හැඩ ගැස්වීමට ඇතුළත් වෙයි. එමෙන් ම, පාරිභෝගිකයාට හෝ සේවා දායකයාට පහසුකම් සැලසීමේ කාර්යාවලියට ද එය බැඳී පවතී. එසේ ම, මානව සම්පත නම් වූ අනිවාර්ය අංගයෙන් තොර වූ යම් ආයතනයක් ඇත්නම් එය සාර්ථක ආයතනයක් නොවේ. එසේ හෙයින්, එවැනි ආයතනයක සමාජ ගුණාංග සාමූහික කර්තව්‍යයන්හි සාරය බල ගැන්වීමට යෝග්‍ය පරිදි මානව සම්පත යොදා ගැනීමට අවශ්‍ය පරිදි තුලනය කර සලකා බැලිය යුතු වෙයි. එහෙයින්, උපාධිධරයකු විශ්වවිද්‍යාලයේ දී උගත් මානව සම්පත් කළමනාකරණය ඉතා වැදගත් මෙවලමක් වෙයි. එහි මූලිකාංගය වන්නේ තාක්ෂණය, කළමනාකරණය, කෞශල්‍යය හා සමෝධානයේ හැකියාව යි. මෙයින් ප්‍රකාශ වන්නේ උපාධිධරයා ඔහුගේ මනස පුළුල් කර ගැනීමට නව දැනුම අත්පත් කර ගැනීම තීරණාත්මක බව යි. නව අත්දැකීම් හා කුසලතා අත්කර ගැනීමෙන් උපාධිධරයා ලබන පරිණතභාවය අලුත් ශ්‍රී ලංකාවක් සඳහා තීරණාත්මක වෙනසක් ඇති කිරීමට හේතුවනු ඇත.

උපාධිධරයාගේ සැබෑ වගකීම වන්නේ සිය වෘත්තිය හෝ වෘත්තීය ස්ථානය හෝ හුදෙක් වැටුප ලබාගැනීම සඳහා වූවක් හෝ ඒ සඳහා කාලය ගත කරන ස්ථානයක් සේ නො සැලකීම යි. ශ්‍රී ලංකාව ආපසු නොහැරවෙන සංවර්ධන මාවතකට පිවිස සිටී. සමාජය උපාධිධරයාගේ වගකීම පිළිබඳ අපේක්ෂා ද අහස උසට දල්වාගෙන ඇත. ඉහත සඳහන් කරන ලද පරිදි සංවර්ධනයේ ප්‍රතිලාභ සමාජයේ සර්වසාධාරණ ව බෙදී යාම ද ඒ අපේක්ෂාවට ඇතුළත් ය. ඉදිරි දශක දෙක

ඇතුළත අලුත් ශ්‍රී ලංකාවක් ගොඩනැගීමේ ගෞරවය ඔබට හිමිවනු ඇත. අද දින මගේ දේශනය අලුත් ශ්‍රී ලංකාව ''ආසියාවේ ආශ්චර්යය'' බවට පත් කිරීමට කැප වීම සඳහා ඔබ පුබුදුවා ලීමකි.

ඔබේ වෘත්තීය තෘප්තිය ද මේ වෙනසට හේතු වනු ඇත. සේවා තෘප්තිය ඔප දැමූ මැණිකක් වැනි ය. එය ඔබේ ප්‍රත්‍යස්ථිතිය පරීක්ෂා කරයි. එය ඔබේ කාර්යය සඳහා වන කැපවීම මත රඳා පවතී. වෘත්තිය හෝ සේවාව වෙනුවෙන් වූ ඔබේ කැපවීම, උත්සාහය හා නිවැරදි ආකල්ප ඔබේ ආත්ම තෘප්තියට හේතු වෙයි. ඔබේ අපේක්ෂා සපල කර ගැනීමට අවශ්‍ය ප්‍රධාන සාධකය වන වෘත්තීය ආචාරධර්ම වර්ධනය වනුයේ එමගිනි. එය ඔබේ සේවාස්ථානයෙහි සමෘද්ධියට හේතුවක් ද ජාතිය ගොඩ නැඟීමට දායකත්වයක් ද වෙයි. එසේ නො වූ කල ඔබෙන් මාතෘභූමිය අපේක්ෂා කරන වගකීම ඉටු නො වේ. මානව ප්‍රාග්ධනය, විශේෂයෙන් ම නව උපාධිධරයන් වෘත්තීය සමාජයෙහි ගාමක බලවේගය ලෙසින් ප්‍රේරණය නො වූ කල ජාතියකට ඉදිරි ගමනක් නොමැත.

සංස්ථාපිත ආයතනයක උපාධිධරයන් හා සෙසු පිරිස් අතර පැවතිය හැකි අසමානතා සැලකිල්ලට ගත යුතු ය. එය ආයතනයේ ශේෂපත්‍රයන්හි මෙන් ම පාරිභෝගිකයන්ගේ වෙනස් වීම්වලින් ද නිරූපණය වෙයි. රාජ්‍ය ආයතන සම්බන්ධයෙන්, මහජනයාට එහි සේවා ප්‍රතිලාභ භුක්තිවිඳීමට හැකි විය යුතු ය. ඒ සඳහා වන ඇගයීම ඔබේ හද මනස දෙකෙහි තැන්පත් වෙයි. මේවා පොතපතින් උගත හැකි දේ නොවේ. උත්සාහය හා උද්‍යෝගය මාර්ගයෙන් ජනිත වන දේ ය. රාජ්‍ය සේවයේ මේ වෙනස්කමට මඟපෙන්වීම මෙන් ම ව්‍යාපාරික ලෝකයේ ප්‍රතිරූපයක් ගොඩනැඟීම ද උපාධිධරයාගේ වගකීම යි. ශ්‍රී ලංකාවට කලකට පෙර හිමි ව තිබූ ''ඉන්දියානු සාගරයේ මුතු ඇටය'' යන විරුදාවලිය යළි දිනාදීමට ඇති ප්‍රධාන මාර්ගය මෙය යි. මේ සඳහා වන මාර්ගය අමෙරිකානු ජනාධිපතිවරයකු වූ ජෝන් එෆ්. කෙනඩි මෙසේ පෙන්වා දී ඇත. ''රටෙන් මට හිමි විය යුතු දේ නො ව මගෙන් රටට ලැබිය යුතු දෙය කුමක් දැයි අසන්න.'' ආදරණීය උපාධිධරයනි, ශ්‍රී ලංකාව ඉතිහාසයේ සන්ධිස්ථානයකට පිවිස සිටී. ජනාධිපති කෙනඩියේ ප්‍රකාශය සිහි තබා ගැනීම අත්‍යවශ්‍ය ය. ඔබ ඔබේ මාතෘ භූමිය ''ආසියාවේ ආශ්චර්යය'' බවට පත් කිරීමට එකා මෙන් නැඟී සිටිනු ඇතැයි මම දැඩි ලෙස විශ්වාස කරමි.

ඔබට ඒ සඳහා කාලය එළඹ තිබේ. ඔබ අපේ රටට පෙර මඟ කියා පෑමට බිහි වූ අලුත් ම උපාධිධර පිරිස යි. තිස් වසරක් දිවයින පුරා විනාශය අත්පත් කර දෙමින් පැතිරුණු දරුණු අන්ධකාරයකින් මිදුණු මාතෘභූමියේ නව යුගය ගොඩනැඟීමට ඉදිරිපත් විය හැකි ඉතාම සුදුසු පිරිස ද ඔබ ය. මේ දිවයින සමෘද්ධියේ පදනමට ඔසොවා ලීමේ ගෞරවය ඔබට දිනාගත හැකි ය. උපාධිධරයන් වශයෙන් ඔබ ලැබූ ඥානය ඔබට අමතර වගකීමක් පවරා ඇත. සමාජය එයින් ඔබට වැඩි වටිනාකමක් දී ඇත්තේ ඔබෙන් ස්වර්ණමය ප්‍රතිදානයක් අපේක්ෂාවෙනි. උපාධි ප්‍රදානෝත්සවය නිමවී මේ ශාලාවෙන් බැහැර යන විට ඔබ අමතක නොකළ යුතු දෙයක් වන්නේ විශිෂ්ටභාවය හැඟ වීමට කොටස් විනිමය ක්ෂේත්‍රයේ යෙදුමකින් පවසත හොත් ඔබ ''විශ්වාසදායක ආයෝජනයක්'' වසයෙන් සලකනු ලැබ ඇති බව යි. එය අගය වැඩි වන්නක් මිස අඩුවන්නක් නොවේ. එසේ හෙයින්, ශ්‍රී ලංකාව යළි දළ දේශීය නිෂ්පාදිත ප්‍රතිශතය 3.5 ක් වූ දුගී තත්ත්වයට නො යන බව සහතික කිරීමට ඔබට හැකි වනු ඇත. මේ වර්ධන ප්‍රතිශතය සිවු ගුණයකින් වර්ධනය කිරීමේ අභියෝගය ඔබේ වෘත්තීය ජීවිතය තුළ දී ඔබට භාර ගත හැකි ය. ඔබ ඒ අභියෝගය භාර ගන්නා බව මගේ විශ්වාසය යි.

අද දින උපාධි ප්‍රදානය කරනු ලැබූ ඔබ සියලුදෙනා වෙත ම මගේ සුබ පැතුම් පිරිනමමි. ඔබේ අනාගතය වාසනාවන්ත වේවා යි ප්‍රාර්ථනා කරමි.

<u>2010.12.14</u>

# Corporate Responsibility of the Graduate

## Prof. Willie Mendis

The Convocation is an occasion to reward those who have earned to graduate after years of hard studies. It is a memorable day to each and every Graduand, who with their parents, family, friends and loved ones have graced this solemn event. As the ceremony ends, each Graduate will be embarking on the unchartered roadmap in the "world of work". It's milestones may initially be unclear, and the conditions of the pathway may need to be tested. On the other hand, your batch represents the expectations of our beloved Sri Lanka that is free from the grave uncertainties of a separatist conflict. Some of you have braved the shock and trauma of violence in your home areas. Others have experienced the fear of entering an economy that held little hope for a lifetime career. However, May 2009 has changed it all, with the advent of a vision to make Sri Lanka the "Wonder of Asia". It cannot be realized unless we all contribute towards our country's transformation. Sri Lanka needs gamechangers, and your batch in particular, are likely front liners in facing it's challenges.

The convocation is an opportunity to reflect upon the larger responsibility of the Graduate. He or she cannot be disconnected from the expectations of the country for advancing the growth of it's economy. It is also the Graduate's task to be sensitive to the importance of attaining economic growth with equity, which is central to spread the benefits of development across the country, from its south to north and from west to east The current disproportionate housing of nearly half the nation's wealth generation in favour of the Western Province has to be remedied at all cost. It is in this context that the occasion of the convocation represents an alarm bell or wake-up call to the new Graduates as they begin to experience the ground realities on leaving their happy years of university life.

The convocation is the occasion on which a University Student transforms from a Graduand to a Graduate. It is a day on which expectations of a variety of types emerge to give the Graduate hope for a better life as a good citizen. It's outcome has less to do with the expectations of a prospective employer or of the society at large. The convergence of these two expectations will nonetheless be a happy coincidence. On the other hand, it's clash can be worrisome for the Graduate whose career and livelihood may then fall behind to cause despair. My focus is not to address you on the negativity of your future on this happy day of the convocation. You all have matured sufficiently to be conscious of the "world of work" to which you have embarked. Nonetheless, it augurs well for you to engage in a discourse which further livens your intellect that has been fired up by the academic environment which you have enjoyed to date. Your Lecturers have moulded your minds to stand-up to any eventuality in the days, months, and years to come. However, they would have also counseled you on the many unknowns about which no textbook exist, or even found in a case study that you may have brilliantly analyzed in a research dissertation. I trust therefore that my address will give you that extra "little bit" which may influence your mindset, although I am conscious of the tired state you must be on this day.

Let me firstly imply that you have already found or will soon find a placement in the "world of work", whether in the Private Sector or in the State Sector. It's immediate impact is for you to recognize that you are one of a Team in the organisation. The challenge you face is to position yourself in its structure. The underlying feature is therefore to assemble the processes of governance in the organisation which would offer space for your contribution to its better performance. It's model of Corporate Governance becomes the first lesson in your new classroom. The team spirit which may have been nurtured in the University, favours you to innovate your space in the corporate body. It includes the learning curve in it's different aspects of human resources, client service or customer base, production, marketing and distribution, financial viability, ethics and corporate social responsibility. The challenges in mastering the learning curve are what favours a Graduate in making the appropriate choice and the right decision.

Corporate Governance is fundamental in any organisation. It not only reflects the key players in its decision making structure, but also the flow of the system for fashioning choices in its output. The Graduate is equipped to be a part of Corporate Governance. This however involves the acquisition of new knowledge of the products or services specific to the organisation. Further, it obligates the gathering of the processes which facilitates the output to the customer or client. In same, an essential ingredient is the human resources without which the corporate body becomes an empty shell. Their social attributes may therefore need to be assessed in recruitment to reinforce the spirit of teamwork. Hence human resources management which the Graduate may have learnt in the University becomes a critical tool. A key part of it will be to integrate technology with management skills. This implies a crucial part of the new knowledge that the Graduate will acquire to broaden his or her already cultivated mind. It is in this phase of the learning curve that the Graduate matures to be connected in making the paradigam shift to change Sri Lanka for the better.

The overarching responsibility of the Graduate is no longer regarding his work or place of work as a time serving exercise. Sri Lanka is now on a path from which it cannot revert to instability. It has therefore raised the barometer of expectation from a Graduate to a higher peak than ever before. It's challenges from equity considerations which I mentioned previously, must necessarily be a part of it. This is therefore a lifetime experience for those graduating today. I would love to see you in two decades from now to thank you for changing Sri Lanka for the better. My address today is to inspire you to prepare yourself with a report card which you can share with your own children in the future to show them the part you played in your work, that in turn made Sri Lanka the *"Wonder of Asia"*

Creating change for the better also lie in being satisfied with your job and of the work you do. The path to job satisfaction in a career is like one which has a cobbled stone surface. It tests your resilience, and not the other way round where you expect it to wear out. Underlying the latter is your commitment to whatever you have been tasked to perform. This is cushioned by what is called "hard work". Over time, it nurtures the right attitude towards your work, whether in your own domain, or towards your colleagues in the workplace. The combination of commitment, hard work and attitude comprise the essential ingredients for you to enjoy the blessings of your career. It cultivates the basics of work ethics that is pivotal for your expectations to succeed. In turn, it helps your workplace to prosper and to

contribute to nation building. In its absence, lethargy sets in where you expect everything and gives very little in return. No nation can forge ahead if its human capital, especially of the Graduates, are not driven by the force of work ethics.

The contrast in a corporate body that engages the Graduates, with others, must be easily measurable. It must get reflected in the balance sheet, and in the rise of the customer base. In the State Sector, the public must feel the service delivery, in good times and during want due to disasters. It's measurement must become ingrained in your hearts and minds. The basics of this cannot be expected from cramming textbooks. It should emerge from the principles of work ethics which I mentioned previously. A Graduate has to lead in this change in the Public Service and also in the mercantile image of the Business Sector. This is pivotal to recreate Sri Lanka's pre-conflict branding as the "Pearl of the Indian Ocean". The fundamental in this behavior is what a famous President of the United States of America, John F. Kennedy, exhorted to his people. He said, "Ask not what your country can do for you. Ask what you can do for your country".

My dear Graduates, Sri Lanka at this juncture of its history, needs you to be reminded of what President Kennedy said. I have no doubt that each one of you will rise to the occasion and pave the path for Sri Lanka to truly be the *"Wonder of Asia"*.

The time for such reflection is now. You are the brand new batch of Graduates to drive the economy of this country. As its pioneers in the emergent era of huge expectation after the end of a three decade long conflict which nearly decimated our beloved nation, you occupy a special niche. It should be your pride to lift this country to the pedestal being visualized for it to occupy. The knowledge you gained as a Graduate places an additional burden on your shoulders. It is a premium that the society at large has placed on your asset value, from which it expects a gilt-edged return. Accordingly, from the time you leave this hall, you cannot forget that you have been endowed with the label used by a Stock Exchange for its best, the "blue chip". It's value can only enhance, and not drop. You have thus the strength to ensure that Sri Lanka will never return to the poor 3.5% growth rate of its GDP. The choice is also yours to quadruple this rate of growth in your lifetime career. My bet is that you will make that choice. I wish to conclude by congratulating each one of you who have graduated today and wish you the very best in your future.

*2010.12.14*

# 40
# The Journey Towards Succsess
## Prof. Tuley De Silva

Vice Chancellors and the Dean of University of Sri Jayewardenepura, please accept my sincere gratitude for welcoming me into your midst long years after I left the University. It is a distinct honor and privilege to be with you today on this special occasion of the annual convocation of the Faculty of Applied Science. As much as I value and enjoy being here with you graduands, as future leaders, researchers and academics, you are sure to celebrate your accomplishments and plan for facing up to the challenges you will soon accept.

Let me first of all congratulate the graduands on their success. Your hard work has enabled you to be here today. As a former member of this Faculty, I am very proud of your accomplishments. I congratulate your families who supported and encouraged you right up to this day. Let me also take this opportunity to congratulate the Vice Chancellor, Dean, all the Faculty members, Students and Staff of this University and all those who have contributed to promote high educational standards. The dedicated hard work of the Dean and members of the Faculty to enrich your knowledge to enable you to make a valuable contribution to our society is greatly acknowledged.

I would like to reflect for a moment on the developmental history and past achievements of this University during the days I served as a Lecturer, Professor, Head of Department, Dean of this Faculty and for a short period President of the then Vidyodaya campus of the single University of Sri Lanka. I will not forget my relationship with the undergraduates as student counsellor, senior treasurer of the students union, senior student counsellor and a mentor. Let me also thank the Faculty for recognizing my contribution by the conferment of an honorary D.Sc.degree and appointing me as an Honorary Visiting Professor to enable me to continue my links with this great Faculty.

This faculty was set up as the first Faculty of Applied Science in the University system. This was a blessing in disguise as we got the opportunity to plan our courses differently to conventional Faculties of Science in Sri Lanka. Our faculty was first setup in the basement of the Sumangala Building with very limited laboratory space and lecture theatres. You will now realize how the faculty has expanded and progressed up to now. These were achievements of the past and present members of the Faculty and the students who successfully cleared many hurdles and obstacles right along.

Due to the centralized admission system, our Faculty was the third or forth choice for students. In other words the grades of our students at the GCE(A/L) were less than those gaining admission to established faculties. Our goal to make our graduates compete at equal level or better than those from conventional universities was achieved within a few years. Our faculty was the first to introduce applied science courses to the curriculum to train our undergraduates to suit the needs of employers.

By introducing courses such as statistics, food science, polymer science, fisheries, forestry, etc., we were able to raise the bar and encourage other Universities to do the same. Not only we revolutionized the curriculum content, we were the first to introduce postgraduate courses in sciences at Diploma and Master's levels to train employed graduates to perform better in their specific areas of work. We were also second to none in terms of research conducted by the Faculty members. In fact we were better in that our research was to solve problems pertaining to local industries and contribute to economic development. We pioneered research on Ayurvedic medicinal preparations by developing specifications for their standardization and quality control. Our graduates and postgraduates have performed very well in foreign universities and are well employed at leading institutions and industries here and overseas.

The fundamental reason for the pre-eminence of this University was its ability to initiate new courses to suit the demands of employers and impart knowledge to contribute to a knowledge based economy. This required accepting the need for collaboration and coordination, openness and partnership and continuous review and revision of what we know and experienced.

You are now reaping the benefits of our innovative approach as seen by the expansion of the number of applied science departments such as food science forestry, statistics etc. Thanks to our graduates who have performed so well in all spheres, presently this faculty is selected as the number one by many science students seeking admission to Universities.

Dear Faculty members, expand your role as a comprehensive learning institution, widen your networks, strengthen your research activities to focus on urgent requirements for economic development. Universities have a special obligation to conduct productive research in partnership with industries, businesses, and other scientific laboratories by sharing ideas, know how and facilities and exchanging insights and initiatives. Achievements will depend on goal oriented multidisciplinary research and not isolated individual research. It is also time to consider opening study and research opportunities for students from foreign universities to reach out and move forward to be amongst the leading Universities in the world.

Dear Graduands, You should be very glad that you are graduating today from a University that has set high standards and made an impact on the community. Be proud of that heritage. Some of you will become leaders equipped with know how, critical thinking skills and a broad outlook to contribute to economic and social development and good governance.

You are the most important part of a new generation that wants something better than what is now. You have made your mark already and are ready to explore a world that is eager to partner with you. Revive the multi-cultural heritage we owned, resolve any differences, direct attention to our common interests and requisites for economic growth, and conserve the environment to make Sri Lanka an example to other nations. I know that you are up to the task.

You all have been empowered by an education committed to independent and critical thought, inquiry, scrutiny and scientific problem solving. Throughout the careers you are about to commence, contribute your maximum to help make the country a better place for everyone. We need to minimize global warming and pollution and alleviate poverty and encourage cultural harmony. With the new developments in science in the future, it must be the duty of your generation to use them wisely for the benefit of every human being. The future is in the hands of every single of you and I trust that those are good hands to make the future bright and the world a better place to live.

Experience in attaining success cannot be replaced by academic qualifications alone. I like to share a few thoughts of experience of fifty years of my humble contribution to this University, science, education, industry and the international community on the attributes that will help you all to minimize failures and make your careers bright and successful.

First and foremost do not have regrets on missing your first preference of a profession as what you have achieved now can also be more rewarding, if you properly plan your future careers. Successful careers are attained through commitment, dedication, determination, self-reliance and hard work. Leadership, innovativeness and honesty make you to reach your goals faster.

> *Never let yourself be discouraged or dejected. Unpleasant things can happen to you that you have no control, do not let them bring you down but you must courageously overcome them. Consider every failure as a blessing in disguise. Failures and tragedies can bring about a change in you, learn and make the most of them when you face them. Always have something to look forward to no matter how harsh life gets, you will ultimately succeed.*

Before you decide on a career it is very important that you set your goals and select an opportunity that would provide that opening. After you have set goals you have a better chance of getting there. Begin with what you want to be "I want to move into senior management", find out the requirements and steps that can fulfill that dream. Map out what you need to do to achieve those goals and proceed gradually. Sometimes you may need higher degrees to reach that goal. Then plan for it and maintain an upward career path.

Always be proactive and optimistic in your approach and display your strong traits and character. Honesty, loyalty, confidentiality, ethical and moral behaviour and open mindedness are characteristics that would help you to reach your goals faster.

Job satisfaction is absolutely necessary if you are to give your maximum to the organization. It is thus necessary that you look out for a profession that you will enjoy and contribute willingly. If you are not fortunate to get what you dreamed of, try to make the best of what you have got by making innovative improvements. When you are open to usual hindrances to success such as complacency, lack of commitment and even loss of interest, bring back the same energy, ambition and confidence to continue to be productive and successful.

*Professionals need to be lifelong learners. They can exhibit their strengths to compensate weaknesses, take on new challenges and display good interpersonal and public relations. This can be achieved by participating* in Continuing Professional Development (CPD) programmes designed to upgrade knowledge and skills of professionals. These can consist of a range of short and long training programmes, which advance the development of requisite knowledge, skills and understanding for career advancement. Participate in CPD to improve and enhance your knowledge and skills and develop the personal qualities required for professional competence throughout your professional life. CPD is useful to optimize your career opportunities now and for the future.

Can I give you some important tips for career advancement? Do your very best every day and do more than expected. Prove yourself as a person who can be relied upon to perform as a team player, and who will strive to make a positive contribution to, and impact on, your company. Volunteer to take up more responsibilities, exhibit strong interpersonal and communication skills, think outside of the box and propose innovative interventions, become technically proficient by gaining new knowledge to keep up with the recent developments in the line of business.

Keep challenging and applying yourself, be helpful to your peers, your coworkers, your partners and your customers, and act with integrity in an ethical way to demonstrate that you can be trusted. Illustrate your credibility by being honest about your talents, knowledge, and skills and your willingness to share your experience and skills with others. One other quality that is important is diligence. It is dedication and attention to detail and follow up, not merely taking for granted that everything will work out in the end.

How about someone contemplating on a career change? Career change is normal and studies show that the average job-seeker will change careers several times over the course of ones professional lifetime. Some change careers because they dislike their job, their boss or their company. Those who feel unchallenged in the present position may also consider a change, if career advancement opportunities are not available at the workplace. If you are interested in changing your career, it is important to evaluate your present situation, likes and dislikes, explore career options and to choose a career that will match your skills, values and interests. Be cautioned that you may have to relocate and sometimes be satisfied with a lesser salary. Hence one has to identify the dislikes and likes in order to know the direction to change your career. You also have to leverage your current skills and experience to your intended career.

When you want to work more effectively with your supervisor, manager, coworker or customer you have to make your interpersonal relationships supportive, clear, and authoritative and use these resources for problem solving and conflict resolution. Maintain your boundaries and adhere to your principles, values and morals to earn the respect of others and preserve your self-respect. Many of us believe that we can establish good interpersonal relations if we compromise our principles and give in to pressure. But the opposite is true as you have exhibited your indecisive character.

Remember that you are graduating today from a University that has made a huge impact in the careers of many students and the society. I am sure that it has made a difference in your life too. The future of this University also depends on you, your accomplishments, your attitudes and your ability to be modest in the event of success. You are now a symbol of this Faculty of the University. Continue to make it glow brighter.

We have gathered here as one community to celebrate our University's accomplishments, reaffirm our connection to its past, and to re-commence our highest aspirations for its future. I am sure that all of us are committed to this common purpose and will contribute our utmost to its achievement.

Finally I leave you with the hope that you will remember the values, knowledge and history that has shaped you, gratefully remember those who have worked hard before you and readily share your knowledge and give your time for the benefit of others.

Let me end this with two quotations, one from a great scientist and the other from a great politician:

> *"Imagination is more important than knowledge. For knowledge is limited to all we now know and understand, while imagination embraces the entire world, and all there ever will be to know and understand."*
> *Albert Einstein, Nobel Laureate in Physics*

> *"Success is the ability to go from one failure to another with no loss of enthusiasm."*
> *Winston Churchill. Past Prime Minister of the United Kingdom*

Wish you all a very bright future. Thank you very much.

*2010.12.14*

# 41

# ඥාන සමාජයක කාර්යභාරය

මහාචාර්ය එම්. එම්. කරුණානායක

උපකුලපතිතුමන් හා පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිතුමියන් සනාතන සභාවත් උපාධි ප්‍රදානෝත්සව දේශනය පැවැත්වීම සඳහා මාහට ආරාධනා කිරීම මා ලද විශේෂ ගෞරවයක් සේ සලකමි. අද දින ඔබ ප්‍රථමෝපාධියෙන් ද පශ්චාද් උපාධි ඩිප්ලෝමාවලින් හා පශ්චාද් උපාධියෙන් ද පිදුම් ලැබීමේ සන්තුෂ්ටිදායක අවස්ථාවෙහි ඔබ හා එක්වීමට ලැබීම මා ලද භාග්‍යයක් බව කිව යුතු ය. ඔබේ අධ්‍යයන කාර්ය මස්තකප්‍රාප්තිය ද එයින් ඔබ අත්පත් කොට ගන්නා ජීවනාභිවෘද්ධිය ද පිළිබඳ ඔබේ උද්වේගී සංවේදනාවන් හේතුවෙන් ඔබ ලබන්නා වූ ප්‍රමෝදය ඔබ සමගින් එක් ව මම ද විඳ ගනිමි. අභිමානවත් විශ්වවිද්‍යාලය සමාජය පසුකොට ඔබ මහා සමාජයට ප්‍රවිෂ්ට වීම සංකේතවත් කෙරෙන මේ අවස්ථාවෙහි පවත්වනු ලබන මගේ මේ දේශනයේ දී ''ඥාන සමාජයක කාර්යභාරය'' පිළිබඳ ව කරුණු කිහිපයක් ඔබට මෙනෙහි කිරීමට සැලැස්වීම මාගේ අභිප්‍රාය යි.

## ඥාන සමාජය යනු කුමක්ද?

'ඥාන සමාජය' යන්න පළමු වරට ව්‍යවහාරයට පැමිණියේ වර්ෂ 1969 දී පීටර් ඩ්‍රකර් (Peter Drucker) විසින් සම්පාදිත The Age of Discontinuity නම් කෘතියෙනි. ඥානය නැතහොත් දැනුම සමාජයක ප්‍රධාන සම්පත බවට පත් වී ඇතැයි එහි ලා තර්ක කළ ඔහු අනාගතයේ බිහිවන විශාලතම ශ්‍රම බලකාය වන්නේ ඥාන ක්‍රියාකරුවන් ය යන මතය ද ඉදිරිපත් කළේය. ඔහු පවසන පරිදි අධ්‍යාපනය හා සංවර්ධනයත්, පුහුණුව හෙවත් අභ්‍යාසයත් ඥාන සමාජයක ප්‍රධානාංග සේ සැලකේ.

තදනන්තර ව රොබින් මැන්සෙල් (Robin Mansell) හා නිකෝ ස්ටෙර් (Nico Stchr) දෙපළ ද 'ඥාන සමාජය' යන සංකල්පය වර්ධනය කිරීමට දායක වූහ. මැනුඑල් කැස්ටල්ස් (Manuel Casrells) විසින් 1990 දශකයේ දී information society (විඥාපන සමාජය) යන යෙදුම හඳුන්වා දෙන ලදි. විඥාපන සමාජයක සමාජීය හා ආර්ථික කටයුතු සම්බන්ධයෙන් මෙන්ම පෞද්ගලික ජීවිත සම්බන්ධයෙන් ''ප්‍රවෘත්ති හෙවත් තොරතුරු කේන්ද්‍රීය හෙවත් ප්‍රමුඛ භූමිකාව ඉටු කරයි.'' ආර්ථික ප්‍රගතිය සම්බන්ධයෙන් සිදු කෙරෙන ඥාන භාවිතය හැඳින්වීම සඳහා ඇතැම් විද්වත්හු ''ඥාන ආර්ථිකය'' (knowledge cconomy) යන යෙදුම ව්‍යවහාර කරති. මේ දේශනයේ දී ඥාන සමාජය යන්න යොදා ගැනෙනුයේ මේ සියලු අර්ථ අන්තර්ගත වන පරිද්දෙනි.

ඥාන සමාජය යන්න ව්‍යවහාරයට ගැනීමට බොහෝ කලකට පෙර සිට මානව සමාජය විෂයෙහි ඥානයෙහි ඇති වටිනාකම මැනවින් හඳුනා ගනු ලැබ තිබිණි. අප විශ්වවිද්‍යාලයයේ ආදර්ශ පාඨය වන 'විජ්ජා උප්පතතං සෙට්ඨා' යන්න ඥානය හෙවත් විද්‍යාව (සංවිධානාත්මක ඥානය) සම්බන්ධ බෞද්ධ සංජානනය කැටිකොට දක්වන්නකි. ''සෑම ආර්ථික ක්‍රමයක් ම, කෙතරම් සරල ආර්ථික ක්‍රමයක් වුව ද, ගොවිතැන, කැණීම් හා ඉදි කිරීම වැනි කටයුතු සිදු කරන ආකාරය සම්බන්ධයෙන් ඒ සමාජයෙහි පවත්නා ඥානය මත පදනම් ව ඇති බව ජෝන් හෝටන් (Johe Houghton) හා පීටර් ශිහාන් (Peter Sheehan) පෙන්වා දෙති. ඒ අනුව යම් සමාජයක සමාජ ප්‍රාග්ධනය (social capital) සකස්

කරන්නේ ඥානය යි. එසේ නම්, ඥාන සමාජයක සුවිශේෂතා කවරේද යන්න කෙරෙහි අප අවධානය යොමු විය යුතුය. සාම්ප්‍රදායික සමාජයක ඥානය සංස්කෘතික වසයෙන් ඛණ්ඩනය වූවක් ද අවකාශීය ව පරිගත වූවක් ද වෙයි. වැඩිදුරටත් විස්තර කරත හොත්, සාම්ප්‍රදායික ඥානයේ ඉහළ අංග සේ සැලකෙන ශිල්පශාස්ත්‍ර, වෛද්‍යකර්මය, කෘෂිකර්මය වැනි දැනුම් අංග ප්‍රභූ සමාජය විසින් ආරක්ෂා කර පවත්වා ගනු ලැබූ ඒවා ය. එහෙත්, ඥාන සමාජයක ඥානය යනු ප්‍රධාන වසයෙන් ම පැතිරුණු ඥානයකි; නැතහොත් සමස්ත සමාජයට ම හිමි ඥානයකි. ජේම්ස් ජේ. ඩඩර්ස්ටාට්ඩ් (James J. Duderstadt) මෙසේ පවසයි.

''අද අපි පශ්චාත් - කාර්මික, ඥානය පදනම් කොටගත් සමාජයක් කරා වේගයෙන් පරිණාමය වෙමින් සිටින්නෙමු... මූල්‍ය හා භෞතික ප්‍රාග්ධනයට හිමි වූ ස්ථානය බුද්ධිවිෂයක ප්‍රාග්ධනය - බුද්ධි මහිමය - විසින් හිමි කර ගන්නා අවස්ථාවක් උදා වී ඇති බව පැහැදිලි ය. පැහැදිලිව ම අපි නව ලෝකයකට පිවිසෙමින් සිටිමු. එය දැනුම් යුගය යි. ඥානය - එනම් ශික්ෂිත ජනයා හා ඔවුන්ගේ අදහස් - ඊට පිවිසෙන ප්‍රධාන උපායමාර්ගික සම්පත වේ.''

## ඥාන සමාජයක ප්‍රගම්‍ය අංග

ඥාන සමාජයක ප්‍රගම්‍ය අංග කිහිපයකි. ඒ අතුරින් ඥාන සමාජය ගොඩ නැංවීමට හා පවත්වා ගැනීම සඳහා දක්ෂිණාර්ධගෝලයේ රාජ්‍යයන් කෙරෙහි තීරණාත්මක අංග සේ සැලකිය හැකි කිහිපයක් මෙහිලා හඳුන්වා දීමට මම අදහස් කරමි.

සාක්ෂර සමාජයකට විඥාපන සන්දේශන ශිල්පක්‍රමය තීරණාත්මක අංගයක් වෙයි. එසේ හෙයින් විඥාපන හා සන්දේශන තාක්ෂණික මාර්ග සඳහා පහසු ප්‍රවේශ මාර්ග සම්පාදනය කිරීම අත්‍යවශ්‍ය වේ. එහෙත් උත්තරාර්ධගෝලයේ රාජ්‍යයන්ට මෙන් නො ව දක්ෂිණාර්ධගෝලයේ රාජ්‍යයන්ට විඥාපන හා සන්දේශන තාක්ෂණික මාර්ග සඳහා පහසු ප්‍රවේශ මාර්ග විරල වන අතර ඒවා සුළු පිරිසකගේ ඒකාධිකාරය යටතේ පවතී. ප්‍රධාන ප්‍රශ්නයක් වන්නේ ලෝකයේ අප වෙසෙන කලාපයේ බහුතර ජනයාට විඥාපන හා සන්දේශන තාක්ෂණික මාර්ග සඳහා පහසු ප්‍රවේශ මාර්ග නොමැති වීම යි. මේ ගැටලුව ජය ගැනීම සඳහා විඥාපන හා සන්දේශන තාක්ෂණික මාර්ග සඳහා පහසු මාර්ග සහිත පොදු ස්ථාන සුලබ කිරීමට යුනෙස්කෝව මෙකී රටවලට උපදෙස් දී තිබේ. එහෙත් මෙවැනි උපක්‍රමයක සාර්ථකත්වය මෙබඳු රටවල අගනුවරින් ඈත ප්‍රදේශවලට විදුලිබලය වැනි භෞතික යටිතල පහසුකම් සැපයීමට ඒ රටවල් සතු ශක්‍යතාව මත රඳා පවති.

තවත් ප්‍රගම්‍ය අංගයක් නම් 'විඥාපන ප්‍රේරණීය' (information driven) ආයතනයන්හි පැවැත්ම යි. මෙයින් අදහස් කෙරෙනුයේ තීරණ හා ප්‍රතිපත්ති සම්පාදනය උදෙසා උපරිම වසයෙන් විඥාපනාංග යොදා ගන්නා ආයතන යි. මෙබඳු ආයතන විඥාපනාංග උත්පාදනය මෙන් ම සිය ආයතනික ජාල මාර්ගයෙන් ඒවා විතරණයේ ද නිරත වන ආයතන විය යුතු ය. එහෙත් සංවර්ධනය වෙමින් පවත්නා සමාජයන්හි විඥාපනාංග හා දත්ත විතරණය පහසු කාර්යයක් නො වේ. ඩන්, ඇට්කින් හා ටවුන්සෙන්ඩ් යන අය විසින් 1997 දී පෙන්වා දී ඇති පරිදි 'විඥාපන ප්‍රේරණීය මාර්ග රහිත හා නිලබලක්‍රමය විසින් ඒ සඳහා සුවිශේෂ අවරෝධයන් ජනනය කොට ඇති පරිස්ථිතීන්හි දත්ත විතරණය ප්‍රශ්නකාරී වෙයි. එපමණක් නොව, සාමූහික අභිමතාර්ථයන්ගෙන් තොර වීම හේතුවෙන් විඥප්තීන්හි අබාධ ප්‍රවාහය වළක්වාලනු ලැබ තිබේ.

ඥාන සමාජයක ඥානය පෘථුල පදනමක් සහිත වූවක් විය යුතු ය. සමාජයක සියලු කොටස්, සමාජ බහිෂ්කරණයට හා ආන්තිකකරණයට හේතු වන කොටස් පවා ඒ පදනමට අයත් විය යුතු වේ. ඥාන සමාජය විසටිත සමාජයක් විය නො හැකි ය. ශ්‍රිතීය සාක්ෂරතාවක් (functional literacy) සහිත ජන කොට්ඨාසය එවන් සමාජයක තථ්‍ය චිහ්නය වෙයි. ආවස්ථික සාක්ෂරතාව සඳහා විධිමත් අධ්‍යාපනය හා අවිධිමත් අධ්‍යාපනය යන පද්ධතීන්හි ක්‍රමවත් සන්ධානයක් අවශ්‍ය වේ. සෑම ස්තරයක ම යාවජීව අධ්‍යයනය දිරි ගැන්වීම අවශ්‍ය ය. පරිගණක ශික්ෂණය ආශ්‍රිත ඥානය හා සරල විද්‍යාව (soft science) විධිමත් අධ්‍යාපනයක් නොමැති අයට අවිධිමත් අධ්‍යාපනය මාර්ගයෙන් හඳුන්වා දීමෙන් ආර්ථික හා සමාජීය අභිවර්ධනය සඳහා යොදා ගත යුතු වේ.

ඥානය යන්නෙන් තාක්ෂණික හා විද්‍යාත්මක ඥානය පමණක් සැලකීමක් සෙසු ඥාන පද්ධති ඉන් ඉවත් කිරීමත් විශේෂයෙන් ම බටහිර රටවල දැකිය හැකි සාමාන්‍ය තත්ත්වය යි. ඥාන සමාජයක් සඳහා එවැනි අර්ථකථනයක් යෝග්‍ය නො වන බව දැන් හඳුනා ගෙන තිබේ. ක්ලිඑන් හා හර්ශ්වෙයිම් 1996 දී පෙන්වා දුන් පරිදි ඥානය යන්න ආනුභූතික දත්ත සංචිතයක් හෝ හුදු විද්‍යාත්මක දැනුම ලබා දීමක් හෝ පමණක් නො ව පාරම්පරික ව රාශිභූත වූ මානව ප්‍රඥාව ද ඇතුළත් වූවකි. සමාජය තථ්‍ය ඥාන පදනම් සමාජයක් බවට පත් කිරීම සඳහා අවකාශීය හා සංස්කෘතික වසයෙන් ප්‍රභින්න ඥාන පද්ධතීන් සමඟ නූතන තාක්ෂණ-විද්‍යාත්මක ඥානය සමකාලිකකරණය කෙරෙහි දැන් අවධානය යොමු වී තිබේ. ස්වදේශෝද්භව ඥානය ජනශ්‍රැත්‍යාගත ඥානය හා සාම්ප්‍රදායික ඥානයෙහි උපරිස්වරූප යනුවෙන් වර්ගීකරණය කළ හැකිය. ජනශ්‍රැත්‍යාගත ඥානය අවකාශීය ව සීමා වූ අදෘශ්‍යමාන ඥානයක් වසයෙන් පවත්නා අතර එය මානව ප්‍රගතිකරණය සඳහා පාදා භාවිතයට ගත යුතු වේ.

ඥාන සමාජයක් ඉගැන්වීම හා පර්යේෂණ සම්බන්ධ නව මාදිලියේ ප්‍රවේශයන් යොදා ගැනීමේ ශක්‍යතාව සහිත ක්‍රියාශීලී විශ්වවිද්‍යාලය හා තෘතීයික අධ්‍යාපන පද්ධතියෙහි ප්‍රතිෂ්ඨාව ලැබිය යුතු වේ. විඥාපන සන්දේශන ශිල්පක්‍රම භාවිතය වැදගත් වන නමුදු එය නිර්මාණාත්මක ඥානෝත්පාදන කාර්යයට යෙදවිය යුතු වේ. විශ්වවිද්‍යාලය හා උසස් අධ්‍යාපන ආයතන දේශීය ව හා 'අන්තර්ජාලය, සාමූහික සංවර්ධන පරිස්ථිති හා අතථ්‍ය සභා ආදිය' මාර්ගයෙන් දේශසීමාවන්ගෙන් බැහැරට යමින් ද ඥාන සමූහ ගොඩ නැගීම අතිශයින් වැදගත් වෙයි. මේ සඳහා කාර්යාරම්භයෙහි නිරත වන අතර ම ඒවා සාමාන්‍යකරණය කිරීමට ද දක්ෂිණාර්ධගෝලයේ රාජ්‍ය ක්‍රියා කළ යුතු වේ.

ඥාන සමාජ සූචක පිහිටුවීමේ අවශ්‍යතාව තවත් ප්‍රගම්‍ය අංගයක් වසයෙන් හඳුනා ගන්නා යුනෙස්කෝ ආයතනය වර්ෂ 2005 දී සම්පාදිත තෘතීයික අධ්‍යාපනය පිළිබඳ අන්තර්ජාතික වාර්තාවෙහි ඒ පිළිබඳ ව සඳහන් කරයි. ඥාන සමාජයක් කරා ගමන් කිරීමේ ප්‍රගතිය මැනීමේ දී විද්‍යා තාක්ෂණික දර්ශක මත පිහිටා කටයුතු කිරීමේ දැඩි ප්‍රවණතාවක් පවත්නා බැවින් ඥාන සමාජයන්හි සංයෝගී මාන සේ සැලකිය හැකි අධ්‍යාපනය, සංස්කෘතිය හා විඥාපනය වැනි අනෙකුත් මාන ප්‍රයත්න කරා යොමු විය යුතු බව වාර්තාව යෝජනා කරයි.

## ඥාන සමාජය සම්බන්ධ ප්‍රධාන ප්‍රශ්න

මීළඟට දක්ෂිණාර්ධගෝලයේ රාජ්‍යයන්හි ඥාන නිර්මාණ ව්‍යාපෘති හා සම්බන්ධ වන ප්‍රධාන ප්‍රශ්න කිහිපයක් කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වෙයි. උතුරු හා දකුණු වසයෙන් ඥානය බෙදී තිබීම මේ අතුරින් වැඩි අවධානය යොමු කළ යුතු ප්‍රශ්නයකි. මීට ප්‍රධාන හේතුවක් වන්නේ දකුණ සමඟ සසඳන විට උතුරු විඥාපන සන්දේශන ශිල්පක්‍රම සම්බන්ධයෙන් වාසි සහිත ස්ථානයක

පිහිටා සිටීම යි. ඥාන සමාජයක් කරා යන තේමාවෙන් වර්ෂ 2007 දී නිකුත් කරන ලද යුනෙස්කෝ වාර්තාව පෙන්වා දෙන්නේ විඥාපන සන්දේශ ශිල්පක්‍රම හා තාක්ෂණික මෙවලම් භාවිතය සඳහා පහසුකම් අතින් ඇති පරතරය (digital divide) සංවර්ධනය වෙමින් පවත්නා හා සංවර්ධිත රටවල් අතර පවත්නා ඥාන විතරණයෙහි බෙදීමට (knowledge divide) හේතු වී ඇති බවයි. මේ හේතුවෙන් අඩු සංවර්ධන මට්ටමක පවත්නා රටවල් තුළ ද ඥාන පරතරය වැඩිවීම සිදු විය හැකි බව ද එහි තවදුරටත් පෙන්වා දී තිබේ. විසම්බන්ධී සමාජයන්හි පැවැත්ම කෙරෙහි අනාගත ඥාන සමාජ බලපාන්නේ කෙසේ ද යන ප්‍රශ්නය ද එහි ලා මතු කෙරේ.

විඥාපන සන්දේශන මාර්ග සඳහා පහසු ප්‍රවේශ ඇති හා එසේ නොමැති කොටස් අතර පවත්නා වෙනස්කම් (knowledge divide) හේතුවෙන් ජනිත වූ ආන්තිකකරණය තීව්‍ර කෙරෙන තවත් සාධක ක්‍රියාත්මක වෙයි. උත්තරාර්ධගෝලයේ රාජ්‍යයන්හි විශ්වවිද්‍යාලය හා විද්‍යා තාක්ෂණික ආයතන ඥාන උත්පාදනය වෙළඳ භාණ්ඩයක් බවට පත් කිරීමට යුහුසුලු වනු දක ගත හැකි ය. මෙහි අන්තර්ගත නිහිතාර්ථය වනුයේ ඥාන වාණිජකරණය යි. ඥාන නිර්මිත සඳහා පාරිභෝගික අගයක් අපේක්ෂා කිරීම සංවර්ධනය වෙමින් පවතින රාජ්‍ය සම්බන්ධයෙන් අනර්ථයකි. මේ හා සමගාමී ව දක්ෂිණාර්ධගෝලයේ රාජ්‍යයන් කරා ඥාන සම්ප්‍රේෂණයෙහි ප්‍රමාදයක් ඇතිවීම වැළැක්වීම නොහැකි ය. මෙය ඥාන සමාජයක මුඛ්‍ය අපේක්ෂාව වන ඥාන විතරණය දුර්වල කරන්නකි. උත්තරාර්ධගෙ ර්ලයේ රාජ්‍යයන්හි විඥාපන හා සන්දේශන තාක්ෂණික මාර්ගාශ්‍රිත ව්‍යාපාර (knowledge industry) සඳහා උපස්තම්භක වන සම්බන්ධතා ජාලයක් විශ්වවිද්‍යාලය හා වෙනත් තාක්ෂණික ආයතනත් අදාළ ව්‍යාපාරත් අතර ක්‍රියාත්මක වුව ද දක්ෂිණාර්ධගෝලයේ රාජ්‍යයන්හි එවැනි කාර්යාවලියක් දක්නට නො ලැබේ.

විඥාපන සන්දේශන මාර්ග සඳහා පහසු පිවිසුම් සහිත හා රහිත කොටස් අතර පවත්නා වෙනස්කම් තීව්‍ර කරන තවත් සාධකයක් වන්නේ ඥාන විසරණය (knowledge diffusion) සම්බන්ධයෙන් මධ්‍යය හා පරිධිය අතර ඇති අසමානතාව යි. මෙයින් අදහස් කෙරෙන්නේ නව දැනුම මූලික වසයෙන් උත්තරාර්ධගෝලීය රාජ්‍යයන්හි දී උත්පාදනය වන බව හා අනතුරුව දක්ෂිණාර්ධගෝලීය රාජ්‍යයන් කරා විසරණය වන බව යි. ජර්ගන් හබර්මාස් Theory of Communicative Action නම් කෘතියෙන් 1981 දී පෙන්වා දුන් පරිදි මේ විසරණ කාර්යය මුදල හා බලය විසින් පාලනය කෙරෙන 'මාර්ගනිර්ණ මාධ්‍ය' (steering media) භූමිකාව මඟින් බල ගැන්වෙන්නකි. විඥාපන පාදක ඥාන විතරණය මේ වන විට මාර්ගනිර්ණ මාධ්‍ය පාලනය කෙරෙන බලවේගය බවට පත් ව තිබේ. ඥාන ස්ථාවරත්වය සඳහා වන අසම කාර්යාවලිය ද උත්තරාර්ධගෝලීය රාජ්‍ය හා දක්ෂිණාර්ධගෝලීය රාජ්‍ය අතර පවත්නා ඥාන පරතරයෙහි වෙනස්කම් තවදුරටත් පවත්වා ගෙන යාමට තවත් සාධකයක් වී ඇත. මේ ඥාන ස්ථාවරත්ව ක්‍රියාවලිය මුළුමනින් ම උතුරේ රාජ්‍ය විසින් සිදු කෙරෙන පර්යේෂණ මත පදනම් වෙයි. උතුරේ රාජ්‍ය විසින් ආරම්භ කොට පළ කෙරෙන හා අන්තර්ගතයෙහි ගුණාත්මකභාවය දැඩි ලෙස පරීක්ෂාවට ලක් කෙරෙමින් පවත්වා ගෙන යනු ලබන අන්තර්ජාතික මට්ටමෙහි ලා සැලකෙන ශාස්ත්‍රීය සංග්‍රහ මඟින් මේ සඳහා පහසුකම් සැපයෙයි. සිය ප්‍රකාශන එළි දක්වීමේ දී මේ අන්දමේ ම සැලකිල්ලකින් කටයුතු කරන අන්තර්ජාතික ප්‍රකාශය ආයතන ද උතුරේ රාජ්‍යයන්හි ක්‍රියාත්මක වෙයි. මේ වූ කලි පැහැදිලි ව ම, 'පර්යේෂණ සංස්කෘතිය' යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි තත්ත්වයෙහි ප්‍රතිඵලයකි. මෙය දකුණේ රාජ්‍යයන්හි ශාස්ත්‍රීය හා පර්යේෂණ ක්ෂේත්‍රයන්හි දැකිය නොහැකි ය.

## ශ්‍රී ලංකාවේ ඥාන සමාජයක් සඳහා ආරම්භක පියවර

වර්තමානයේ ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනයෙන් සාක්ෂරතා මට්ටම 98% කි. මේ මට්ටම වර්ෂ 2015 දී 100% තෙක් ඉහළ නැංවීම අපේක්ෂිත ය. සාක්ෂරතාව සහිත පුද්ගලයකු ලෙස සැලකෙන්නේ ''එදිනෙදා ජීවිතයට අදාළ කෙටි සරල වාක්‍යයක් කියවා අවබෝධ කොට ගැනීමට හා අර්ථය වටහා ගනිමින් ලිවීමට'' හැකියාව ඇත්තෙකි. කෙසේ වුව ද, මේ නිර්වචනය ශ්‍රිතීය සාක්ෂරතාව පිළිබඳ පූර්ණ අර්ථයක් නො දෙන්නකි. විධිමත් අධ්‍යාපන ක්‍රමයට අනුගත වීමට අපොහොසත් වූවන් හා පාසල් හැර යන්නන් සඳහා අධ්‍යාපන අවස්ථා ලබාදීමේ අවශ්‍යතාව සම්බන්ධයෙන් ජාතික අධ්‍යාපන කොමිසමේ අවධානය යොමු වී තිබේ. අවිධිමත් අධ්‍යාපන ක්‍රම මඟින් සන්තතික අධ්‍යාපනය සඳහා විකල්ප වැඩසටහන් ඉදිරිපත් කිරීම පිළිබඳව ද කොමිසම සිය සැලකිල්ල යොමු කරයි. සාක්ෂරතා මධ්‍යස්ථාන, ශ්‍රිතීය සාක්ෂරතා මධ්‍යස්ථාන හා ප්‍රජා අධ්‍යාපන මධ්‍යස්ථාන මඟින් අවිධිමත් අධ්‍යාපනය ලබාදීමේ වැඩ පිළිවෙළක් මේ වන විට ද ක්‍රියාත්මක වෙමින් පවතී.

ශ්‍රී ලංකාව ප්‍රබල ප්‍රාථමික හා ද්විතීයික පාඨශාලා පද්ධතියක් සහිත වීම වැදගත් තත්ත්වයකි. වර්ෂ 2001 දී විඥාපන තාක්ෂණය පාසල් විෂය මාලාවට එක් කරන ලද්දේ විඥාපන සන්දේශන ශිල්පක්‍රම මඟින් බලගැන්වුණු ශ්‍රී ලංකාවක් බිහි කිරීමේ අරමුණ ඇතිව ය. ද්විතීයික පාඨශාලාවන්හි පරිගණක ඉගැනුම් මධ්‍යස්ථාන දහසක් ස්ථාපනය කිරීම සඳහා ද්විතීයික අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. මේ ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ පහසුකම් අඩු හා යුද්ධයෙන් පීඩාවට පත් ප්‍රදේශයන්හි තෝරා ගත් පාසල්වල යටිතල පහසුකම්, සම්පත්, කළමනාකරණය, ගුරුවරුන් හා ඉගෙනුම් - ඉගැන්වීම් සම්පත් අපේක්ෂිත මට්ටමකට වැඩිදියුණු කිරීම සඳහා වැඩ පිළිවෙළක් ඉදිරිපත් කෙරිණි. වර්ෂ 2006 සිට ක්‍රියාත්මක වන අධ්‍යාපන සංවර්ධන වැඩසටහනෙහි ප්‍රධාන අරමුණක් වන්නේ මූලික හා ද්විතීයික අධ්‍යාපනය සඳහා සාධාරණ ප්‍රවේශ අවස්ථා වර්ධනය යි.

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ අධිකාරිය (ICTA) පිහිටුවීම විඥාපන සන්දේශන ශිල්පක්‍රම ව්‍යාප්තියට ගන්නා ලද ප්‍රමුඛ පියවරකි. අධිකාරිය මඟින් ඉ - ශ්‍රී ලංකා වැඩසටහන යටතේ පිහිටුවන ලද නැණසල මධ්‍යස්ථාන ජාලය ග්‍රාමීය ප්‍රදේශයන්හි විඥාපන සන්දේශන ශිල්පක්‍රම ප්‍රචලිත කිරීමට ගත් එක් පියවරකි. වර්ෂ 2005 දී 5% ක් පමණ වූ දිවයිනේ විඥාපන සන්දේශන ශිල්පක්‍රම ව්‍යාප්තිය මේ වන විට 30% ක මට්ටමට වර්ධනය වී තිබීම මේ වැඩපිළිවෙළේ සාර්ථකත්වය ප්‍රකට කරයි. මේ වර්ධනීය තත්ත්වය සිත් ඇද ගන්නාසුලු වුව ද එහි ලා ඇතැම් සංරෝධ ද වෙයි. ලෝක බැංකුවේ ශ්‍රී ලංකාව සඳහා වන සංවර්ධන සවිය (The Sri Lanka Devolpment Forum) (2007) මෙසේ දක්වා ඇත.

''සංවර්ධනය වෙමින් පවතින රටවල ඥාන ආර්ථිකයක් ගොඩනැගීමේ ප්‍රධාන අරමුණ සෑම පුරවැසියකුට ම සාධාරණ මිලකට විඥාපන සන්දේශන මාර්ග සඳහා ප්‍රවේශ පහසුකම් සැලකීමෙන් විද්‍යා තාක්ෂණික ජයග්‍රහණයන්හි ප්‍රතිඵල අසමාන ලෙස බෙදී යාම නිසා ජනිත වූ ඇති නැති පරතරය සමනය කිරීම යි. වර්තමාන ශ්‍රී ලංකාවේ පවත්නා අවාසිසහගත තත්ත්වයක් වනුයේ අන්තර්ජාල ප්‍රවේශ මාර්ග සීමා සහිත වීමත් දකුණු හා අග්නිදිග ආසියානු රටවල් හා සසඳන කල සම්බන්ධතා සඳහා ඉහළ මිලක් ගෙවීමට සිදු වීමත්ය.''

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලය පද්ධතිය හා අනුබද්ධ ආයතනවලින් සමන්විත තෘතීයික අධ්‍යාපන ක්ෂේත්‍රය විශිෂ්ට මට්ටමක පවතින්නකි. පරිගණකය පිළිබඳ ශ්‍රී ලාංකේය අන්තර් විශ්වවිද්‍යාල කමිටුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විඥාපන තාක්ෂණය පිළිබඳ ස්ථාවර කමිටුව ලෙස

කටයුතු කරයි. විශ්වවිද්‍යාලය කිහිපයක ම පරිගණක විද්‍යා අධ්‍යයනාංශ හෝ පරිගණක ඉංජිනේරු අධ්‍යයනාංශ හෝ ආරම්භ කර ඇති අතර වැඩි ගණනක් පීඨානුබද්ධ පරිගණක විද්‍යාගාරවලට අමතර ව පරිගණක මධ්‍යස්ථාන ද ආරම්භ කොට ඇත. අධ්‍යයනාංශ කිහිපයක් ම පරිගණක යෙදවුම් පාඨමාලා ද පවත්වයි NIBM, SLIDA, NIE හා SLITT වැනි ආයතන ද ඥාන සමාජයක් ඉලක්ක කර ගත් පාඨමාලා ක්‍රියාත්මක කරයි. විදේශ විශ්වවිද්‍යාලයවලට අනුබද්ධ ව පිහිටුවා ඇති පෞද්ගලික අධ්‍යාපන ආයතන ගණනාවක් ද ඥාන ආර්ථිකයේ අවශ්‍යතාවන්ට සංවේදී ව කටයුතු කරනු දක ගත හැකි ය. ඒවායේ අභිමතාර්ථය නම් බහුජන විඥාපනය, සන්දේශන ශිල්පක්‍රම හා මානව සම්පත් සංවර්ධනය වැනි ක්ෂේත්‍රවලට අයත් විෂය පිළිබඳ ප්‍රමුඛ ආයතන බවට පත් වීම යි. ඒවා ප්‍රධාන විද්‍යාත්මක ක්ෂේත්‍රයන්හි අවශ්‍යතා සපුරාලීමට අපේක්ෂා නො කරයි. ශ්‍රී ලංකාව ඥාන සමාජයකට පිවිසුම වේගවත් කිරීමේ අරමුණින් අනාගතයේ දී පෞද්ගලික විශ්වවිද්‍යාල බිහිවීමත් සමඟ තෘතීයික අධ්‍යාපන ක්ෂේත්‍රය තවදුර විවිධාංගීකරණයට ලක්වනු ඇත. අපේ විශ්වවිද්‍යාලය පද්ධතියෙහි ඇති ප්‍රකට ඌනතාවක් නම් පර්යේෂණ කටයුතු සඳහා අඩු ප්‍රමුඛතාවක් දක්වීම යි. පශ්චාද් උපාධි ආයතනවල හා පශ්චාද් උපාධි පීඨයන්හි ද පර්යේෂණවලට වඩා ඉගැන්වීම කෙරෙහි නැඹුරුවක් පවතී.

විද්‍යා හා තාක්ෂණික ආයතනවල ද පර්යේෂණ ප්‍රතිදාන අපේක්ෂිත මට්ටමට වඩා අඩු බව දක ගත හැකි ය. මේ තත්ත්වයට එක් හේතුවක් වන්නේ විද්‍යාත්මක හා තාක්ෂණික කටයුතු සඳහා යෙදවෙන ආයෝජන අවම මට්ටමක පැවතීම යි. එය දිවයිනේ දළ ජාතික ආදායමෙන් 0.13% කි. මෑත දී හඳුන්වා දෙන ලද විද්‍යා තාක්ෂණික ප්‍රතිපත්තිය (2011-2016) යටතේ මෙය වර්ෂ 2016 දී දළ ජාතික ආදායමෙන් 1.5% ක මට්ටමක් දක්වා වැඩි කිරීමට අපේක්ෂා කෙරේ. ජාතික සංවර්ධනය සඳහා මූලික හා ව්‍යවහාරික විද්‍යා අභිවර්ධනය, ධරණීය සම්පත් කළමනාකරණය හා කාලගුණ වෙනස්කම්වලට අනුකූලනය මේ කාර්යාවලියෙහි අරමුණු අතර වෙයි.

## ඥාන සමාජයක විශ්වවිද්‍යාලයන්හි භූමිකාව

ඥාන සමාජයක විශ්වවිද්‍යාලයන්හි භූමිකාව පිළිබඳ ව විශේෂයෙන් සලකා බැලීමට මම මෙහි ලා අපේක්ෂා කරමි. ඥාන සමාජයක් කරා සංලග්න වීමේ දී විශ්වවිද්‍යාලය ශික්ෂා සංවිධාන බවට පරිවර්තනය විය යුතු ය. එවැනි පරිවර්තනයක් සඳහා විශ්වවිද්‍යාලයන්හි නිත්‍ය ආයතනික සංසාධන ද ස්වයං නවීකරණ සංස්කෘතියක් නිර්මාණය ද අවශ්‍ය ය. මෙය කළ හැක්කේ අධ්‍යයනාංශ, පීඨ, සනාතන සභාව හා පාලක සභාව මෙන් ම පරිපාලනය ද අයත් වන විශ්වවිද්‍යාලයේ ගතික කළමනාකරණ යාන්ත්‍රණයෙහි ආයතනික ව්‍යවස්ථා මාර්ගයෙනි. සංඛ්‍යාත්මක වර්ධනය වන බාහිර ආයතන සමඟ කටයුතු කිරීම සඳහා මෙවැනි සංසාධන ක්‍රියාවලියක් අත්‍යවශ්‍ය වේ. යෝජිත පෞද්ගලික විශ්වවිද්‍යාලය සම්බන්ධයෙන් එවැනි තත්ත්වයක් අවශ්‍ය වේ. කෙසේ වුව ද, විශ්වවිද්‍යාලයන්හි එවැනි පරිවර්තන ක්‍රියාවලියක් මන්දගාමී හා කලින් කලබල පවත්වන ආධානග්‍රාහී සම්ප්‍රදායන් විසින් පාලනය කෙරෙන්නක් වනු ඇත. එමෙන් ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් පනවනු ලැබූ දැඩි සීමා ද ඒ කෙරෙහි බල පෑ හැකි ය. ඥාන සමාජයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වීමට යොමු වීමට නම් විශ්වවිද්‍යාලවලට වැඩි ස්වාධිකාර බලයක් අවශ්‍ය ය.

ඥාන සමාජයක දී විශ්වවිද්‍යාලයන්හි පර්යේෂණ කාර්ය සඳහා ඉහළ ප්‍රමුඛතාව සැලසිය යුතු ය. පූර්වයෙහි ද පෙන්වා දෙන ලද අන්දමට අපේ විශ්වවිද්‍යාලය මුළුමනින් ම ශික්ෂණ විශ්වවිද්‍යාලය වන අතර පර්යේෂණ සංස්කෘතියක් වර්ධනය වන්නේ මන්දගාමී ව ය. විධිමත් සැලැස්මකට අනුව පර්යේෂණ කිරීමට නම් මීට වැඩි ප්‍රතිබද්ධතා අවශ්‍ය වේ. පර්යේෂණ කෙරෙහි යොමු වූ පරිසරයක්

නිර්මාණය කිරීමට අවශ්‍ය පහසුකම් සම්පාදනයට විශ්වවිද්‍යාලය ප්‍රෝත්සාහී විය යුතු ය. පර්යේෂණයක් විවිධ විශේෂඥතා ඇති පුද්ගලයන්ගෙන් සමන්විත ක්‍රියාකාරී සමූහයන්හි අන්තර් ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලයක් විය යුතු ය. අන්තර් - විෂයක හා බහුවිෂයක පර්යේෂණ වැඩිදියුණු කිරීම ද එසේම වැදගත් ය. ශාස්ත්‍රීය ප්‍රකාශන එළි දැක්වීමට විශ්වවිද්‍යාලය විසින් පවත්වා ගෙන යනු ලබන කාර්යාවලිය ද විශ්වවිද්‍යාලය පර්යේෂණයන්හි වැදගත් හා අත්‍යවශ්‍ය අංගයකි. එමෙන් ම, විශ්වවිද්‍යාලය අන්තර්ජාතික මට්ටමේ සංගමන පර්යේෂණවලට ද දායක විය යුතු ය. ජේම්ස් ජේ. ඩඩර්ස්ටාඩ්ට (James J. Duderstadt) පෙන්වා දෙන අන්දමට ''පර්යේෂකයාගේ කුතුහලය සංසිඳුවීමට නො ව ජගත් අනුභූතීන්ට යෝග්‍ය පර්යේෂණ මාතෘකා තෝරා ගැනීමේ අවශ්‍යතාව උද්ගත වී තිබේ. ඥානයේ ස්වභාවය සිදු වී ඇති තත්ත්වය විමර්ශනය වෙනුවට නවෝත්පාදන බවට විතැන් වෙමින් පවති.''

තවත් වැදගත් අවශ්‍යතාවක් නම් ලංකාවේ විශ්වවිද්‍යාලය කාර්මික හා විද්‍යා තාක්ෂණික ආයතන සමග ප්‍රබල සම්බන්ධතා වර්ධනය කරගත යුතු වීම යි. මේවා සංවර්ධන අවශ්‍යතා සඳහා පර්යේෂණ ප්‍රතිඵල උරගා බැලීමට අවකාශ සැලසීමට සූදානම් ආයතන විය යුතු ය. විද්‍යා තාක්ෂණික ආයතන සමග පවත්වනු ලබන සම්බන්ධතා අන්‍යෝන්‍ය ප්‍රතිලාභ උදෙසා අදහස් හා සූචනාවලට ද්විත්ව-මාර්ගික ප්‍රවාහයක් සලසන්නක් ද විය යුතු ය. එය ඥාන සමාජයක අවශ්‍යතා සඳහා පර්යේෂණයන්හි නිරත විද්‍යාඥයන්ට මග හෙළි කිරීමකි. ජාතික විද්‍යා පදනමේ තොරතුරුවලට අනුව ලංකාවේ දී දශලක්ෂයක ජනගහනයක් සඳහා සිටිනුයේ පර්යේෂකයන් 237 ක් පමණක් වුව ද සංවර්ධිත රාජ්‍යයන්හි පර්යේෂකයන් සංඛ්‍යාවේ සාමාන්‍යය 3273 කි.

ඥාන සමාජයක් ගොඩ නැගීමේ ලා නූතන ඥානය හා ස්වදේශෝද්භව ඥානය සමායෝජනයෙන් වඩාත් පරිසමාප්ත ඥාන පද්ධති වර්ධනයට ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලය පියවර ගත යුතු ය. විශ්වවිද්‍යාලය මඟින් ක්‍රියාත්මක වන ස්වදේශෝද්භව ඥානය පරිලේඛනගත කිරීමේ කාර්යාවලියක් විකල්ප ඥාන නිර්මාණ කාර්යය සඳහා අර්ථාන්විත ආරම්භයක් වනු ඇත. එම කාර්යාවලිය ගැඹුරු අධ්‍යයන මඟින් ඉදිරියට ගෙන යා යුතු ය. මෙහි තීරණාත්මක අංශය විය යුත්තේ ස්වදේශෝද්භව ඥාන පද්ධතීන්හි සාරය ග්‍රහණය කරගනිමින් ඒවා නූතන ඥාන නිර්මාණ කාර්යයට යොදා ගැනීම යි. ශ්‍රී ලංකාව ද ඇතුළු සංවර්ධනය වෙමින් පවත්නා බොහෝ රටවල ස්වදේශෝද්භව ඥානය සඳහා බහුජාතික ව්‍යාපාරිකයන් ද හිමිකම් පවසන තත්ත්වයක් උදා වී ඇති බැවින් විශ්වවිද්‍යාලයන්ට මෙහි ලා ජාතික වගකීමක් ද පැවරෙයි.

නව ඉගෙනුම් සංස්කෘතියක් නිර්මාණය කිරීමට දායක වීම විශ්වවිද්‍යාලයවලට පැවරෙන අත්‍යවශ්‍ය කර්තව්‍යයකි. ඉඳහිට තැනක දෙකක හැරෙන්නට තවමත් විශ්වවිද්‍යාලයවල අනුගමනය කෙරෙනුයේ ගතානුගතික ඉගැන්වීම් ක්‍රමය යි. වඩාත් නිර්මාණාත්මක වූ, විශේෂයෙන් ම ශිෂ්‍යයාගේ විභවතාව සාක්ෂාත් කර ගත හැකි අන්තර්ක්‍රියාකාරී ශික්ෂණ මාර්ග දැන් හඳුනා ගෙන තිබේ. ඩයනා ලෞරිලාඩ් (Diana Laurillaed) විශ්වවිද්‍යාලයීය දැනුම බෙදා දීම පිළිබඳ පුනර්වාදී උපස්ථිතියක් හඳුන්වා දෙයි. එය අනුවාදය (න්‍යායට අදාළ භාවිතය (adaptation) හා ප්‍රත්‍යාවේක්ෂණය (භාවිතයට අදාළ න්‍යාය (reflection)) යනුවෙන් ක්‍රම දෙකකින් යුක්ත වූවකි. ශිෂ්‍යයා ගවේෂණය හා අනාවරණය සඳහා වූ ප්‍රයානයකට යොමු කරන ඉගැන්වීම් ක්‍රම ද හඳුනාගනු ලැබ ඇත. ඉගැන්වීම් කාර්යයේ දී විඥාපන සන්දේශන ශිල්පක්‍රම භාවිතය දැන් විශ්වවිද්‍යාලයන්හි සම්මත පරිචිතයකි. අවශ්‍ය වනුයේ නව ඉගෙනුම් මාර්ග විවර කිරීමට උචිත නිර්මාණාත්මක සංවේදයෙන් යුක්ත නවෝපක්‍රම භාවිතය යි.

විශ්වවිද්‍යාලය සමාජ වගකීම් සහිත ආයතනයක් විය යුතු පරිදි ම එය සිය සමාජ වගකීම පිළිබඳ නිදර්ශකයක් ද විය යුතු ය. සංවර්ධිත රාජ්‍යයන්හි සිය සමාජ වගකීම පැහැදිලි ව ප්‍රකාශ කළ විශ්වවිද්‍යාලය ද ඇත. එක්සත් රාජධානියේ සදර්ලන්ඩ් විශ්වවිද්‍යාලයය මේ සඳහා නිදර්ශනයකි. එහි ප්‍රජාව, ප්‍රදේශය හා පරිසරය වෙත සේවා සපයන ව්‍යාපෘති ආරම්භ කර ඇත. එය අප්‍රිකානු ගම්මානවලට ජීවන විපරිණාම ආවරණයක් වන පානය සඳහා පිරිසිදු ජලය සැපයීමේ ව්‍යාපෘතියකට ඉදිරිපත් වී සිටී. මෙවැනි කාර්ය සඳහා යොමු වීමේ දී ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයවලට මූල්‍ය සංරෝධයන්ට මුහුණ පෑමට සිදුවන නමුදු ප්‍රජා පාදක සංවර්ධන ව්‍යාපෘතීන්හි නිමග්න වන ආයතනවලට අවශ්‍ය තාක්ෂණික, සමාජීය හා චර්යාමය විශේෂඥභාවය සැපයිය හැකි ය. විශේෂයෙන් ම පශ්චාද් සංඝට්ටන සමයක එවැනි සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීමට ශ්‍රී ලංකාවට බොහෝ අවස්ථා එළඹී තිබේ. එවැනි වැඩපිළිවෙළක් අපේ විශ්වවිද්‍යාලය ශිෂ්‍යයන්ට ලෝකය පිළිබඳ සත්‍ය අත්දැකීම් ලබාගැනිමට මෙන් ම තමා උගත් දෙය අත්හදා බැලීමට ද මාර්ගයක් වනු ඇත.

## සමාලෝචනය

සමාජ ක්‍රියාධරයකු බවට පරිවර්තනය වීම සඳහා ඔබ මේ විශ්වවිද්‍යාලයයෙන් උපාර්ජනය කළ බුද්ධි කෞශල්‍යය, ශක්‍යතා හා නෛපුණ්‍යය දිවයිනේ සමාජාර්ථික අභිවෘද්ධිය වෙනුවෙන් පරිශීලනය කරනු ඇතැයි යන උද්‍යෝගී මනෝරථයෙන් යුතු ව මම මේ දේශනය සමාප්ත කරමි. ''විජ්ජා උප්පතතං සෙට්ඨා'' (උත්පාදිත සියල්ල අතුරින් ඥානය ශ්‍රේෂ්ඨ වේ) යන විශ්වවිද්‍යාලීය ආදර්ශපාඨය සංවේදනීයතාවෙන් ද අනෞද්ධත්‍යයෙන් ද යුතු ව සනාථ කිරීමට ඔබ සමත් වෙත්වා.

<u>*2010.12.14*</u>

# Engaging the Knowledge Society

**Prof. M. M. Karunanayake**

I consider it a singular honour to be invited by the Vice Chancellor, Dean, Faculty of Graduate Studies and the University Senate to deliver the convocation address. I am privileged to felicitate those of you who have been conferred your first degrees, postgraduate diplomas or the higher degrees today. I share with you, your sense of achievement and exuberance on this happy occasion. In my address I would like to provide some thoughts on the subject 'engaging the knowledge society', for you to reflect on, as you leave the portal of this prestigious university. What is a knowledge society?

It was Peter Drueker who used the term knowledge society for the first time in 1969 in his work titled The Age of Discontinuity. He argued *knowledge* has become the key resource that knows no geography. He surmised that in the future the largest working group will be the *knowledge workers*. In his view education and development, and to some degree training, is the central concern of a knowledge society.

Since then there have been others such as Robin Mansell and Nico Stehr who have contributed to the notion of a knowledge society. Manuel Castells in the late 1990s introduced the term information society. In an information society "information and access to information play a central role economically, socially and individually". There are others who refer to a knowledge economy in which knowledge is used to produce economic benefits. We may assume that these different definitions are subsumed by the term knowledge society. In my address I use the term knowledge society in its most inclusive sense.

The value of knowledge to human society has been well understood long before the term knowledge society came into vogue. In fact the university motto "among all that rise knowledge is greatest" sums up the Buddhist perception of knowledge. John Houghton and Peter Sheehan have shown "that all economies, however simple, are based on knowledge about how, for example, to farm, to mine or build". Therefore, knowledge forms the social capital of any community. What then is distinctive about a knowledge society? Knowledge in traditional society has been culturally fragmented and spatially circumscribed. Moreover, higher forms of traditional knowledge in science, medicine, agriculture, for example had been the preserve of elite groups. But in a knowledge society, knowledge is essentially distributed knowledge, which by extension is also shared knowledge. James J. Duderstadt (1997) states:

Today, we are evolving rapidly to a post-industrial, knowledge based society (…) It is clear that a transition is occurring in which intellectual capital -brain power- is replacing financial and physical capital the as key to our strength and well being. In a very real sense we are entering a new age, an Age of Knowledge, in which the key strategic resource necessary for prosperity has become knowledge that is educated people and their ideas.

## Imperatives of a knowledge society

There are many imperatives to be met in a knowledge society. I would like to highlight a few of them which I think are crucial, not only to create but also to sustain a knowledge society, with reference to the countries of the South.

An important imperative of a knowledge society is to have an ICT literate population. Hence it is necessary to provide easy access to information and communication technology. But in the South unlike in the North access to ICT is very much a prerogative of the few. A basic problem is that ICT technologies are not affordable to very many people in our part of the world. UNESCO has advocated an increase in the number of places of community access to information and communication technologies as one way of overcoming this constraint. But the success of such a strategy will depend on the capacity of the countries of the South to provide physical infrastructure, particularly power transmission, to peripheral areas.

Another imperative is to have institutions that are 'information driven'. Information driven institutions would make use of information to the fullest extent in their decision and policy making. Such institutions not only generate but also share information through institutional networking. But information and data sharing is not particularly easy in developing societies. As pointed out by Dunn, Atkins and Townsend (1997) data sharing is problematic in environments which are not 'information driven' and in which bureaucracy presents particular obstacles Furthermore free flow of information is prevented because the common goals are not shared.

In a knowledge society, knowledge has to be broad based. All segments of society including those subject to social exclusion and marginalization have to be drawn into it. The implication is that a knowledge society cannot be a dissociated society. A functionally literate population has to be a hallmark of such a society. Functional literacy calls for well formulated formal and non-formal systems of education. Life-long learning should be encouraged at all levels. It is important to take 'soft science' to those with little or no formal education, through non-formal education to make it possible for them to apply knowledge for economic and social advancement.

A general tendency particularly in the West is to define knowledge in terms of techno scientific knowledge to the exclusion of other knowledge systems. But the inadequacy of such a definition of a knowledge society has now been recognized. As pointed out by Klicn and Hirschheim (1996) knowledge is not limited to what can be learned from/empirical data collection or scientific deduction alone but includes human insight and wisdom accumulated over generations. Emphasis is now placed on the need to synchronize spatially and culturally divergent knowledge systems with modern techno scientific knowledge to make society truly knowledge based. Indigenous knowledge may be classified into folk knowledge and the higher forms of traditional knowledge. Folk knowledge exists as spatially confined invisible knowledge which has to be 'mined' and made use of for the betterment of mankind.

A knowledge society has to be supported by a vibrant university and tertiary education system with a capacity to adopt innovative approaches to teaching and research. Use of ICT is important but it

should be made to contribute to creative knowledge making. It is also vital for universities and higher educational institutions to develop knowledge clusters locally and across borders through 'web portals', collaborative development environments and virtual meetings' etc. While initiatives are evident in this direction in the countries of the South much remains to be done to generalize them.

UNESCO World Report on Tertiary Education (2005) recognizes the need to establish Knowledge Society indicators as yet another imperative. As there is an overwhelming tendency to depend on science and technology indicators to measure progress towards a knowledge society the report suggests that the measuring effort should focus on other constituent dimensions of knowledge societies-education, culture and communication as well.

## Issues pertaining to a knowledge society

Let me now look at some issues impinging on the knowledge building project in countries of the South. An important issue is the knowledge divide between the countries of the North and the South. One reason for this is that the North as compared to the South is advantageously placed in relation to information and communication technology. A UNESCO report on the theme Towards Knowledge Societies (2007) makes the point that while the digital divide is a reality a disturbing factor is that the knowledge divide between the most developed countries and the developing countries, particularly the least developing countries is liable to widen. Furthermore, within societies themselves, equally profound cleavages appear or are exacerbated. The report raises the question "how could the future knowledge societies settle for being dissociated societies"?

There are other processes that tend to exacerbate polarization across the knowledge divide. In the countries of the North the universities and institutes of science and technology are increasingly moving in the direction of making knowledge an industry. The implication is the commoditization of knowledge. The pricing of knowledge products may be to the disadvantage of many developing countries. An inevitable consequence of this is that there is a time lag in the acquisition of new knowledge by countries of the South. This is a process which undermines the very idea of a knowledge society that calls for knowledge sharing. The knowledge industry in the North is supported by strong networking between universities and institutes of science and technology on one hand and industry on the other that is not found in countries of the South.

At the same time another process that contributes to widen the knowledge divide is the centre-periphery system of knowledge diffusion. This means that knowledge is primarily created in the North and then diffused to the South. As propounded by Jurgen Habermas (1981) in his work Theory of Communicative Action this diffusion process is strengthened by the role of 'steering media' that is controlled by money and power. Information based knowledge dissemination has now become the most compelling element of the steering media. The knowledge divide between the North and South is further sustained by an asymmetric knowledge validation process. We find that the validation process is almost entirely with reference to the research establishment of the North. This has been facilitated by the many international research journals that originate in the North and the rigour with which papers for publication are assessed. There are also the international publishing houses of the North which are

similarly circumspect in bringing out publications. Obviously this is the outcome of the prevalence of what might be called a 'research culture' which is often absent in the academic and research environment of the South.

## Sri Lanka initiatives for a knowledge society

Sri Lanka at present has an adult literacy rate of 98 %. This is expected to rise to 100% by 2015. A literate person is defined as one "who can both read and write with understanding a short simple statement on his/her everyday life". However, this definition is deficient in terms of functional literacy. The National Education Commission (1997) has recognized the need to provide educational opportunities to those who have failed to enter formal education system or have dropped out. It has also stressed the need to prepare alternative structures through non-formal education for continuing education. There is now a coordinated effort to provide non-formal education through literacy centres, functional literacy centres and community learning centres.

Sri Lanka is blessed with a strong primary and secondary school network. The National Policy on Information Technology in School Education was established in 2001 with the objective of creating a new generation of ICT empowered Sri Lankans. The Secondary Education Modernization Project (SEMP) has been formulated to establish 1000 computer learning centres in secondary schools. Phase II of the Project in particular benefits schools in disadvantaged areas and conflict-affected areas, by developing infrastructure, resources, management, teachers, and teaching and learning resources of the target schools up to an acceptable level. The Education Sector Development Programme which has been implemented since 2006 lists the promotion of equitable access to basic and secondary education as one of its principal objectives.

On a more general level initiatives have been taken to promote ICT by setting up the Information and Technology Agency of Sri Lanka (ICTA). The rural tele-centre network (or Nenasala network) that has been set up under the e-Sri Lanka project by the ICTA is a means of popularizing ICT in rural areas. It is claimed that the ICT level in Sri Lanka has risen from around 5 % in 2004 to about 30 % at present. While these developments are impressive there are also constraints. The Sri Lanka Development Forum (World Bank 2007) comments:

A key aspect of building a knowledge economy in developing countries is the task of bridging the digital divide: that is, providing access to information and communication technology at an affordable price to all citizens. Sri Lanka is currently at a disadvantage with limited access to internet and very high prices for connectivity when compared to competitors in South and Southeast Asia.

In Sri Lanka the tertiary education sector is made conspicuous by the university system and the institutes affiliated to it. The Sri Lanka Inter University Committee on Computing (SLIUCC) functions as the UGC Standing Committee on Information Technology. Several universities have set up Departments of Computer Science or Computer Engineering while most universities have computer centres in addition to Faculty based computer laboratories. Computer applications are taught in academic programmes in many university departments. The needs of the knowledge society have led to the creation of other institutes that provide higher education programmes such as NIBM, SLIDA, NIE, and SLIIT. The large number of private institutions affiliated to overseas universities can be seen as a

response to the needs of the knowledge economy. Their main concern is with leading edge disciplines in the areas of mass communication, information technology and human resource development. They are not equipped to serve the key science sectors. The tertiary education sector will be further diversified in the near future with the setting up of private universities with foreign collaboration which is intended to provide a further fillip to Sri Lanka's transition to a knowledge society. A basic weakness in our university system is the low priority accorded to research. We are teaching universities more than research universities. There is a teaching bias even in Postgraduate Institutes and Graduate Faculties.

The research output of science and technology institutes is found to be less than adequate. One reason for this is the low investment in science and technology which has only been 0.13 per cent of the country's GDP. The recently announced Policy for Science and Technology (2011-2016) expects to raise this figure to 1.5 % of GDP by 2016. Its objectives include the promotion of basic and applied sciences for national development, sustainable resource management and adaptation to climate change.

## Role of the University in a Knowledge Society

I would now like to more specifically look at the role of the university in a knowledge society. In engaging the knowledge society the universities have to transform themselves into learning organizations. Such a transformation demands that the universities review the institutional processes on a regular basis and create within themselves a self renewing culture. This would make the institutional arrangements within the university- Department, Faculty, Senate and the Council and the general administration- more dynamic instruments of university management. Such a review process is necessary as the universities have to deal with an ever increasing number of external constituencies. The proposed establishment of private universities is a case in point. However, the transformation process in universities is slow and defined at times by rigid academic mindsets. But it is also due to the rigidities imposed by the University Grants Commission. The universities need greater autonomy to be flexible to respond to the challenges of the knowledge society.

Universities have to give high priority to research in a knowledge society. As already noted our universities are by and large teaching universities and a research culture has been slow to develop. There has to be more commitment to research with well formulated research agendas. The universities should foster a research culture to facilitate a research intensive environment. Research has to be the outcome of intensive interaction that takes place within knowledge clusters which bring together experts in a collective enterprise. The development of interdisciplinary and multidisciplinary research is equally important. University sponsored publication programmes need to be recognized as an essential and a vital requirement of university research. Universities also have to be partners in international collaborative research. James Duderstadt (1997) points out that in knowledge society there is "increasing pressure to draw research topics from the world of experience, rather than from the curiosity of scholars. Nature of knowledge is shifting from the analysis of what has been to the creation of what has never been".

Another issue of significance is that the universities in Sri Lanka have to develop strong links with industry and institutes of science and technology. It is industry that provides the opportunity to apply the findings of research to development needs. Links with institutes of science and technology would be facilitative of a two way flow of ideas and information for mutual benefit. It will also be a means of

training much needed research scientists in demand by the knowledge society. According to the National Science Foundation the researchers per million inhabitants in Sri Lanka is around 237 where as in developed countries the number averages 3273.

In engaging the knowledge society the Sri Lankan university should take the initiative to develop more inclusive knowledge systems that combine modern knowledge with indigenous knowledge. In fact the simple inventorying of indigenous knowledge undertaken as a university project would be a significant first step in an alternative knowledge building process. This should be followed up by in depth studies. What is important is to capture the essence of indigenous knowledge systems and input them into the modern knowledge building project. The universities have a national responsibility in this as multinationals have claimed a stake in accessing some aspects of indigenous knowledge in many developing countries including our own.

It is also a matter of urgency for the universities to subscribe to a new learning culture. With few exceptions university teaching follows the more conventional transmission method of knowledge transfer. More creative methods particularly interactive methods capable of realizing the potential of students are now called for. Diana Laurillard (2002) has commented on the importance of an iterative approach to university teaching which calls for the engagement of the two processes- adaptation (practice in relation to theory) and reflection (theory in relation to practice). There are also other methods of teaching which could be used to lead the student in a journey of exploration and discovery. The use of ICT in teaching is now standard practice in the universities but the need is to use new found tools with a sense of creativity to open up new paths of learning.

A university has to be a socially responsible institution and should be demonstrative of its social responsibility. In developed countries there arc universities that have formulated social responsibility statements. A case in point is the University of Sunderland UK which has launched projects in the service of the community, its city and its environment. In fact it had reached out to African villages to help provide clean drinking water which has had a life changing effect. While admitting that the universities in Sri Lanka are financially constrained they are in a position to provide technical, social and behavioural expertise to agencies engaged in community based development work. There are many opportunities in Sri Lanka for such development initiatives particularly in the post conflict situation. It will also enable the impressionistic undergraduates a true experience of life worlds and an opportunity to apply knowledge to practice.

## Concluding remarks

I conclude my address in the fervent hope that you will make use of the talents, skills and competencies acquired at this university to transform yourselves into knowledge workers for the social and economic betterment of our nation. May you uphold the university motto “among all that rise knowledge is greatest” with sensitivity and humility.

<u>*2010.12.14*</u>

# 42

# විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ වෙනස්වන ආකෘතිය පරීක්ෂා කොට බැලීම

## මහාචාර්ය ගාමිණී සමරනායක

උසස් අධ්‍යාපනය, විශේෂයෙන්ම විශ්වවිද්‍යාල අධ්‍යාපනය, ජාතියක කොඳු නාරටිය ලෙස සමාජයේ පුළුල් පිළිගැනීමකට ලක්ව තිබේ. විශ්වවිද්‍යාල අධ්‍යාපනය සෑම සමාජයකම ජීවත්වන්නන්ගේ ජීවිතවල ගුණාත්මකභාවය වැඩි දියුණු කරයි. ගෝලීය දැනුම් ආර්ථිකයක් මත පදනම්ව පවත්නා ශ්‍රී ලංකාව වැනි මධ්‍යම ආදායම් ලබන රටවල විශ්වවිද්‍යාල අධ්‍යාපනය තීරණාත්මක වැදගත් භූමිකාවක් රඟ දක්වයි. නූතනයේ, ආර්ථික සංවර්ධනය සහ ප්‍රජාතාන්ත්‍රික සංස්කෘතියක් ගොඩනැගීම සඳහා උසස් අධ්‍යාපනය අත්‍යවශ්‍ය අංගයක් ලෙස අප විසින් පිළිගනු ලැබේ. සැමටම සමාන ගුණාත්මක අධ්‍යාපන අවස්ථා ලබාදීම ඕනෑම සමාජයක සමාජ ආර්ථික සහ දේශපාලන සංවර්ධනය ව්‍යාප්ත කිරීම සඳහ අත්‍යවශ්‍ය ක්‍රමෝපායක් ලෙස මෙම වකවානුවේ දී පැහැදිලි ලෙස පෙනේ. විශ්වවිද්‍යාල සහ විශ්වවිද්‍යාල අධ්‍යාපනය එක් සිද්ධියක් නොව ක්‍රියාදාමයකි. විශ්වවිද්‍යාල අධ්‍යාපනය හුදකලා වූ සංසිද්ධියක් නොව එය ගෝලීය සහ ජාතික කොන්දේසිවලට යටත් වූ ප්‍රපංචයකි. කෙසේ වෙතත්, විශ්වවිද්‍යාලයක හෝ පිළිගත් ආයතනයක, ප්‍රථම උපාධි අපේක්ෂකයකු හෝ පශ්චාද් උපාධි අපේක්ෂකයකු ලෙස විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබාගැනීමේ අවස්ථාව සැමටම නොලැබේ. එමනිසා, මාගේ දේශනය, අප රටේ විශ්වවිද්‍යාල අධ්‍යාපනයට විශේෂ අවධානය යොමු කරමින්, විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ වෙනස්වන ආකෘතිය පරීක්ෂා කොට බැලීමට යොමු කරනු කැමැත්තෙමි. මධ්‍යම ආදායම් ලබන රටක් බවට පත්වෙමින් පවතින සහ වර්ධනය සහ බෙදා හැරීමේ සමානාත්මතාව තහවුරු කිරීම මගින් දිළිඳුකම තුරන් කිරීමේ අපේක්ෂාවෙන් පසුවන නූතන ශ්‍රී ලාංකේය සංදර්භයක් තුළ මෙය ඉතාමත් කාලීන මාතෘකාවකි.

සම්භාව්‍ය අකෘතියේ විශ්වවිද්‍යාල, මුලින්ම මධ්‍යකාලීන යුගයේ දී බටහිර ලෝකයේ බිහිවිය. බොලොක්ඤඤා (Bologna) 1088, පැරිස් (Paris) 1150, ඔක්ස්පර්ඩ් (Oxford) 1167, කේම්බ්‍රිජ් (Cambridge) 1209, යන විශ්වවිද්‍යාල බටහිර ලෝකය සම්බන්ධ උදාහරණ ලෙස පෙන්නුම් කළ හැක. 13 වන සහ 19 වන ශත වර්ෂ අතර සහ ඉන් පසු කාල පරිච්ඡේදයන් තුළ, සම්භාව්‍ය හෙවත් පැරණි විශ්වවිද්‍යාල ආකෘතිය පරිවර්තනයේ රැල්ලට හසු විය. විශ්වවිද්‍යාලය මුලින්ම ආරම්භ වූයේ වැඩවසම් සමාජයේ තෝරාගත් හෝ ප්‍රභූ ජන කොටසකට, දේවධර්මය, දර්ශනය, සහ අනෙකුත් ශාස්ත්‍රීය පාඨමාලාවන් උගන්වන ප්‍රභූ ආකෘතියක් ලෙසිනි. 19 වන ශත වර්ෂයේ විශේෂයෙන් ජර්මනියේ සහ පසුකාලීනව එක්සත් ජනපදයේ, පර්යේෂණ විශ්වවිද්‍යාල බිහිවීම, විද්‍යාව හා තාක්ෂණය හඳුන්වා දීම සහ වෘත්තීය අධ්‍යාපන ආයතනවල නැගී සිටීම විශ්වවිද්‍යාලයේ සම්භාව්‍ය භූමිකාව වෙනස්කිරීමට සමත් විය. බහුජන (mass) විශ්වවිද්‍යාල හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාල පද්ධතිය ස්ථාපිත වීම අලුතින් සොයා ගනු ලැබූ පෙර දී විශ්වවිද්‍යාල මට්ටමේ දී ඉගැන්වීම් අවශ්‍ය නොවන බවට සැලකූ විෂය ක්ෂේත්‍රයන් ඉගැන්වීම සඳහා විෂය නිර්දේශ පුළුල් කිරීමත් සමගම, සම්භාව්‍ය සහ ප්‍රභූ ආදී ආකෘතියේ විශ්වවිද්‍යාලය ඉවත්වීම ආරම්භ විය.

එක්සත් රාජධානියේ විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ගමන් පථය මගින් විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ වෙනස්වන ආකෘතිය විද්‍යමාන වේ. එක්සත් රාජධානියේ ඔක්ස්ෆර්ඩ් (Oxford) සහ කේම්බ්‍රිජ් (Cambridge) වැනි පැරණිතම විශ්වවිද්‍යාල සම්භාව්‍ය නැතහොත් ප්‍රභුවාදී ආකෘතිය නියෝජනය කරයි. 19 වන ශත වර්ෂයේ, වික්ටෝරියානු යුගයේ දී බිහි වූ මැන්චෙස්ටර් (Manchester) සහ බර්මින්හැම් (Birmingham) වැනි විශ්වවිද්‍යාල Red Brick ආකෘති ලෙස හඳුන්වන ලදි. 1960 දශකයේ දී බිහිවුණු විශ්වවිද්‍යාල සන වීදුරු (Plate glass) හෝ විශ්වවිද්‍යාල මණ්ඩප ලෙස හඳුන්වන ලදි. සසෙක්ස් (Sussex) එසෙක්ස් (Essex) එබඳු විශ්වවිද්‍යාල සඳහා උදාහරණ යි. නූතනයේ, බ්‍රිතාන්‍ය විශ්වවිද්‍යාල ආකෘතිය ජාත්‍යන්තර ආකෘතිය ලෙස හඳුන්වනු ලැබේ. ප්‍රභු ආකෘතියේ විශ්වවිද්‍යාලයන්හි, විවිධ වෘත්තීන්ට සහ මහජන සේවයට කැඳවා ගෙන යන ආකාරයේ සුදුසු වයස් කාණ්ඩයෙන් 6% පමණක් විශ්වවිද්‍යාල අධ්‍යාපනයට සහභාගී වූහ. 1960 දී මෙම සහභාගීත්වය 16% ක්මවා ගිය අතර එය බහුජන ආකෘතියකට සමීප විය. වර්තමානයේ 50% ට වඩා වැඩි සහභාගීත්වය ජාත්‍යන්තර ආකෘති ගණයට අයත් වේ. එක්සත් රාජධානියේ, ඇමරිකා එක්සත් ජනපදයේ, කැනඩාවේ සහ ජපානයේ විශ්වවිද්‍යාල ජාත්‍යන්තර ආකෘතියේ විශ්වවිද්‍යාල වේ. මීට අමතරව, බොහොමයක් විශ්වවිද්‍යාල ලෝක පූජිත (World Class) විශ්වවිද්‍යාල ලෙස ද හඳුන්වයි. උසස් අධ්‍යාපනයේ ගෝලීයකරණය හා ජාත්‍යන්තරකරණය, එහි අතිවිශාල ව්‍යාප්තිය, තාක්ෂණයේ බලපෑම, වෙළඳපලේ වර්ධනයවන භූමිකාව, උසස් අධ්‍යාපනය පුද්ගලීකරණය කිරීම, විෂය නිර්දේශ ප්‍රතිසංස්කරණය සඳහා වන විවිධ ප්‍රයත්න ආදිය විශ්වවිද්‍යාල ආකෘතියේ ස්වරූපය වෙනස් කිරීමට දායක විය.

විශ්වවිද්‍යාලයේ ආකෘතිය වෙනස් වීමත් සමගම, විශ්වවිද්‍යාලයෙහි අරමුණු සහ අපේක්ෂාවන් ද වෙනස් විය. 1963 දී, උසස් අධ්‍යාපනය සඳහා වූ රොබින්ස් කමිටුව (Robbins Committee) විසින් නිකුත් කරන ලද වාර්තාවෙන්, විශ්වවිද්‍යාල පද්ධතියේ අරමුණු හතරක් අර්ථ නිරූපණය කරන ලදි. ඉන් පළමු අරමුණ වූයේ කුශලතා මත ඉගැන්වීම, දෙවැන්න මගින් හුදු විශේෂඥයන් පිරිසක් බිහි කිරීම නොව මනසේ සාමාන්‍ය ශක්තිය උසස් කරමින් වඩා වැඩදායී ස්ත්‍රීන් සහ පුරුෂයන් බිහි කිරීම අරමුණු කර ඇත. තෙවැන්න වූයේ, ඉගැන්වීම පර්යේෂණයෙන් වෙන් නොකළ යුතුයි යන්නයි. අවසාන වශයෙන්, පොදු සංස්කෘතියක් සහ පොදු ප්‍රමිතිගත පුරවැසිභාවයක් සම්ප්‍රේෂණය කිරීම, පුළුල් වූ සංවර්ධනයක් උදෙසා දායකවීමක් ලෙස අර්ථ නිරූපණය කර ඇත. රොබින්ස් වාර්තාව විශ්වවිද්‍යාල පිළිබඳව වඩා ඉංග්‍රිසි දෘෂ්ටිකෝණයක් නියෝජනය කළේය. 19 වන ශත වර්ෂයේ මැද භාගයේ දී, ජෝන් හෙන්රි නිව්මන් (John Menry Newman) විසින්, වඩා පුළුල් වූ ලිබරල් අධ්‍යාපනයක් හඹා යෑම සඳහා විශේෂීකරණය වූ පුහුණුව යටත් අංගයක් ලෙස දක්වන ලද, විශ්ව දැනුමෙන් සපිරි ස්ථානයක් ලෙස විශ්වවිද්‍යාලය අර්ථ දක්වා ඇත.

ඔහුගේ කල්පනාව වූයේ දැනුම හඹා යා යුත්තේ දැනුම සඳහාම බවයි. ඔහුට අනුව සත්‍යය සොයා යාම යනු ශිෂ්ටත්වයට පත් පුද්ගලයාගේ පෞරුෂත්වය හැඩගසන සහ සදාචාරාත්මක සහ ආගමික අධ්‍යාපනයෙන් වෙන් කළ නොහැකි අධ්‍යාපනික පරමාදර්ශයේ කොටසකි. අධ්‍යාපනය මගින් පටු විශේෂඥයන් නොව සාමාන්‍ය පුද්ගලයන් බිහි කළ යුතු යැයි සහ පුළුල් වූ, රැකියා අවස්ථා සඳහා ගැළපෙන ලෙස මනස පුරුදු පුහුණු කළ හැකි බව කියවෙන බ්‍රිතාන්‍ය විශ්වාසය සංවර්ධනය කිරීමේ ලා ඔහුගේ අදහස් උපකාරී විය. විල්හෙල්ම් වොන් හම්බෝල්ට් (Wilhelm von Humboldt) ගේ විශ්වවිද්‍යාලය පිළිබඳ සංකල්පය ජර්මනියේ, සහ යුරෝපයේ අනෙකුත් කොටස්වල මෙන්ම පසුකාලීනව ඇමරිකා එක්සත් ජනපදයේ ද ආකෘතිය විය. ඔහුට අනුව විශ්වවිද්‍යාලය යනු පොදු කර්තව්‍යයක නිරත වූ ශිෂ්‍යයන්ගේ සහ විද්‍යාර්ථීන්ගේ සමාජයකි.

ආකෘතියේ සහ අපේක්ෂාවන්ගේ වෙනස්වීම මගින් විශ්වවිද්‍යාල පද්ධතියේ චරිතාංගයන් වෙනස්කමට ලක්විය. මෙම අංග අතුරින්, උසස් අධ්‍යාපනය විශ්ලේෂණය කිරීමේ දී විශ්වවිද්‍යාල ස්වතන්ත්‍රවීම (Autonomy) සහ අධ්‍යයන නිදහස (acadenic freedom) සහිත වීම චිරාගත සංකල්පය වේ. විශ්වවිද්‍යාල යනු ඉගැන්වීම සහ පර්යේෂණ සඳහා පහසුකම් සපයමින්, දැනුම පරිණාමය වීමේ දී උසස් ඉගෙනුමට සහභාගී විය හැකි සහ විභාග පැවැත්වීම මෙන්ම උපාධි ලබාදීමේ අධිකාරිය සහිත ආයතන වේ. මැග්නා අධිකාරී (Magna Charta Observatory) පත්‍රයෙහි අර්ථ දක්වා ඇති පරිදි විශ්වවිද්‍යාල ස්වතන්ත්‍රභාවය පහත පරිදි වේ. ''භූගෝලීය සහ ඓතිහාසික උරුමයන් හේතුවෙන්, සමාජයන්ගේ හදවත තුළ විවිධ ලෙස සංවිධානය වූ ස්වයංපාලන ආයතනයකි; පර්යේෂණ සහ ඉගෙනුම් උපක්‍රම මගින් එය සංස්කෘතිය නිර්මාණය කර, පරීක්ෂා කර, අගය කර දක්වයි. තම ලෝකය වටා ඇති අවශ්‍යතා හඳුනාගැනීමට හා සපුරාලීමට, එහි ඉගැන්වීම් හා පර්යේෂණ, සදාචාරාත්මකව සහ බුද්ධිමත්ව, සෑම දේශපාලන සහ ආර්ථික බලවේගයන්ගෙන් නිදහස් විය යුතුයි.''

විශ්වවිද්‍යාල ස්වතන්ත්‍ර වීම සඳහා වන උද්ඝෝෂණයන් අධ්‍යයන නිදහසකින් තොරව ඵල රහිත වේ. තමන් වෙත තීරණ ගැනීමේ හැකියාව ලබා දෙන ස්වතන්ත්‍රය පිළිබඳව බලධාරීන් කථා කළ ද, ගුරුවරුන් වඩා අගය කරනුයේ විශ්වවිද්‍යාලය තුළ පවත්නා අධ්‍යයන නිදහසයි. අධ්‍යයන නිදහසකින් තොර විශ්වවිද්‍යාල ස්වතන්ත්‍රය හුදු රැවටීමක් පමණක් වන අතර එය ඉතාමත් උද්වේගකර හිංසනයන්ට මුල පුරනු ඇත. එසේ හෙයින්, අධ්‍යයන නිදහස, විශ්වවිද්‍යාල ස්වතන්ත්‍ර සංකල්පය සමග ඉතාමත් සමීපයෙන් බැඳී ඇත. දර් එස් සලාම් ප්‍රකාශය (Dar Es Salam Declartion) ප්‍රකාර, නිදහස යනු, රාජ්‍ය හෝ වෙනත් පොදු බලධාරියකු පිළිබඳ භීතියකින් තොරව එවැනි බලවේග-යන්ගේ මැදිහත් වීමක් නොමැතිව, ඉගැන්වීම පර්යේෂණ පැවැත්වීම, ලේඛනය, ඉගෙනුම, තොරතුරු හුවමාරුව සහ බෙදා හැරීම, මෙන්ම සේවා සැපයීම ආදී කාර්යයන් සපුරාලීම සඳහා, තනිව හෝ සාමූහිකව අධ්‍යයන ප්‍රජාවේ සාමාජිකයන් වෙත ඇති අයිතියයි. එසේ ගත් කල, අධ්‍යයන නිදහස යනු අනවශ්‍ය මැදිහත්වීම්වලින් තොරව දැනුම හඹායෑම සඳහා ගුරුවරුන්, ශිෂ්‍යයන් සහ අධ්‍යයන ආයතන වෙත ඇති නිදහසයි.

මෙසේ විශ්වවිද්‍යාල යනු, අධ්‍යයන කාර්යයන් පවත්වා ගෙන යෑම සඳහා ස්වතන්ත්‍රභාවයක් සහිතව පවත්නා උසස් ඉගෙනුම් ආයතනයි. එය පොදුවේ විශ්වවිද්‍යාල ප්‍රජාවට අදාළ වේ. අධ්‍යයන නිදහස ඇතැම් විට මානව අයිතිවාසිකම්වල වැදගත් කොටසක් ලෙස අර්ථ දක්වා ඇත. නව දැනුම, නව පාඨමාලා මෙන්ම, ඕනෑම විෂය ක්ෂේත්‍රයක නිදහස් වර්ධනය ඇති කිරීමට අධ්‍යයන නිදහසට හැකි විය යුතුයි. මීට අමතරව, විවාදයක් විමර්ශනය කිරීමේ සහ යම් දෙන ලද විෂය ක්ෂේත්‍රයක පැතිකඩක් පර්යේෂණයට ලක්කිරීමේ හැකියාව අධ්‍යයන නිදහස විය යුතුයි. එලෙස, රටක පවත්නා සමාජ හෝ දේශපාලනික වටපිටාව මඟින් සිදුවිය හැකි බලපෑම්වලට හසු නොවී, යම් විෂය ක්ෂේත්‍රයක නිදහස් සහ සාධාරණ වර්ධනය, තම අධ්‍යයන නිදහස මඟින් උසස් කිරීමට විශ්වවිද්‍යාල අධ්‍යාපනයට හැකියාව ඇත. අධයයන නිදහස යනු හුදු මූලික වටිනාකමක් නො වේ. එය විවිධ ඡන්දදායකයන් සහ පාර්ශවකරුවන් සඳහා වන තම මෙහෙවර සපුරාලීම සඳහා උසස් අධ්‍යාපනය විසින් භාවිත කරනු ලබන මාර්ගයක් ද වේ. නිදහස යනු අයිතියක් සහ යුතුකමක් ද වනු ඇත.

ඉගැන්වීම්/ඉගෙනුම් ක්‍රියාවලිය, ශිෂ්‍යයන් සමග පවත්නා සම්බන්ධතාව, ශිෂ්‍යයන්ට උපදේශන සැපයීම, විෂය නිර්දේශ සංවර්ධනය, පශ්චාද් උපාධි ඉගෙනුම් සහ කෙටිකාලීන වැඩසටහන් තුළින් පවරා ඇති ප්‍රධාන වගකීම නොසලකා හැර තම පුද්ගලික ආදායම් අවස්ථා උපරිම කර ගැනීම පිණිස ලබා දී ඇති අවස්ථාවක් ලෙස ඇතැම් ආචාර්යවරුන්, අධ්‍යයන නිදහස වැරදි ලෙස අර්ථ

කථනය කරනු දැකිය හැක. ශිෂ්‍යයන්ට තම සමාසිකය තුළ ඉතා සමීප සම්බන්ධතාවක් පවත්නා ගෙන යෑමේ අවස්ථාව ගිලිහී යෑම හේතුවෙන් විශ්වවිද්‍යාලවල බොහොමයක් ගැටළු මතු වී ඇත.

එබැවින්ම, මෙම සංකල්පයන් සාකල්‍ය ලෙස සාක්ෂි දරන්නේ නැත. ඇතැම් අවස්ථාවන්හි දී සහ ඇතැම් ස්ථානයන්හි දී විවිධ වූ ස්වතන්ත්‍ර උපාධි පිරිනැමීම සහ අධ්‍යයන නිදහස ලබාදීම බහුලව භාවිතවන ක්‍රමයයි. විශ්වවිද්‍යාලයක් සම්පූර්ණයෙන්ම මහජන මුදලින් යැපෙන්නේ නම්, එය රජයට වගකිව යුතු බවට හැඟීමක් පවතී. පසුගිය කාලය තුළ ඇති වූ මතභේදයන් ගේ ප්‍රධානතම සාධකයක් වූයේ, ස්වතන්ත්‍රය (autonomy) සහ වගවීම (accoubtability) අතර ඇති සම්බන්ධයයි.

විශාල වගවීමක් තහවුරු කරනු වස්, බ්‍රිතාන්‍ය සහ නෙදර්ලන්තය වැනි රටවල් ස්වතන්ත්‍රය සීමා කර ඇති අතර නව පරිපාලන ව්‍යූහයක් ක්‍රියාත්මක කර ඇත. කාර්ය මණ්ඩලය තේරීම, ශිෂ්‍යයන් තේරීම, විෂය නිර්දේශය සහ අධ්‍යයන ප්‍රමිතීන් පාලනය, පර්යේෂණ වැඩ සටහන් පිළිගැනීම, අභ්‍යන්තර අරමුදල් වෙන් කිරීම සහ තම අරමුදල ජනනය කර ගැනීම වැනි ක්ෂේත්‍රයන් සඳහා ආයතනික ස්වතන්ත්‍රය සහ අධ්‍යයන නිදහසට අදාළ බව සලකනු ලැබේ. මෙවැනි සන්දර්භයක් තුළ, වෙළෙපොළ ප්‍රතිචාර්යතාව සහ විෂය නිර්දේශ සංවර්ධනය වැනි පාරිභාෂිතය අධ්‍යයනය කිරීම අවශ්‍ය වේ.

## වෙළඳපොල ප්‍රතිචාරය සහ විෂය නිර්දේශය

වෙළඳපොල යනු සේවාවක් හෝ නිපැයුමක් සඳහා වන සැපයුම හා ඉල්ලුම හමුවන මංසලකි. එබැවින් වෙළඳපොළ යනු, සැපයුම්කරුවන් ලෙස රාජ්‍ය විශ්වවිද්‍යාලයන්ගෙන් පිටව යන උපාධිධාරීන් සහ රැකියා අවස්ථා සඳහා සේවායෝජකයා විසින් උපාධිධාරීන් බලාපොරොත්තු වීමේ ඉල්ලුම් හමුවන අවස්ථාවයි. බොහෝවිට සිදුවන ආකාරයට, ඉල්ලුමට සරිලන සැපයුමක් නොමැති අතර උසස් අධ්‍යාපනයේ දී පවා ඉල්ලුමට සරිලන සැපයුමක් නොමැත. මෙම නොගැළපීම හේතුවෙන්, මෙම සපුරාලිය නොහැකි ඉල්ලුම ආයතනය තුළ ලබාදෙන පුහුණුව මගින් හෝ විදේශ උපාධි හෝ ඊට සමාන සුදුසුකම් මඟින් සපුරාලනු ඇත. සාරධර්ම පිළිබඳ තමන්ගේම උපකල්පනයන් සහ ප්‍රතිසංස්කරණ සඳහා වන විරෝධය සමග මෙම සැපයුම් අංශයේ පසුවන බහුතරය එම අඩුව අඛණ්ඩව පවත්වාගෙන යයි.

වෙළඳපොල දෙස ඉතා ඕනෑකමින් බලන කල, අප විසින් අවධානය යොමුකළ යුතු බොහොමයක් වැදගත් අංශ පවතී. පළමුව, තාක්ෂණික ප්‍රභවයක් ඇති රැකියා සඳහා වන ඉහළ නගින ඉල්ලුම පුහුණු උපාධිධාරීන්ගෙන් සපුරාලිය යුතුයි.

පුළුල් ලෙස බැලූ කල එවැන්නක් ලෙස සැලකෙන්නේ, විද්‍යාඥයන්, වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, කළමනාකරුවන් සහ ගණකාධිකරුවන් ය. මේ සෑම පුළුල් ප්‍රභේදයක්ම, නිරන්තරයෙන් වැඩිවන නිෂ්පාදන, සේවා සහ කෘෂිකාර්මික අංශයන්හි සම්බන්ධකම් දරනු ඇත. එබැවින් සැපයුම ඒ හා අනුකූලව අනුබද්ධ විය යුතු අතර විෂය නිර්දේශය ද වෙළෙඳපොල අවශ්‍යතාවට ප්‍රතිචාර දැක්විය යුතුයි. දෙවනුව, ඉගැන්වීම සහ රාජ්‍ය සේවා වැනි වෘත්තීන් සඳහා බොහොමයක් උපාධිධාරීන් බඳවා ගනු ඇත. මෙම අංශයන් සඳහා වන ඕනෑම මැදිහත්වීමක් රටේ ආර්ථික සංවර්ධනයට සම්බන්ධතාවක් පවතී. තෙවනුව, උසස් අධ්‍යාපනයේ නිත්‍ය පිළිවෙත ක්‍රියාත්මක කිරීම, ගවේෂණය කිරීම සහ නව්‍යකරණයේ විකල්ප ක්‍රියාවට නැංවීම ආදිය මගින් ආර්ථිකයට අගය එකතු කිරීමක් අවශ්‍ය වේ. තාක්ෂණික වශයෙන් සහ නව්‍යකරණයෙන් පිරිපුන්, කර්මාන්ත, කෘෂිකාර්මික සහ සේවා වැනි රටේ

ප්‍රධාන ආර්ථික අංශයන් තුළ පර්යේෂණ පැවැත්වීම අවශ්‍යම කාරණයක් වන අතර නව තොරතුරු සහ තාක්ෂණය මෙම අංශයන්ගේ වර්ධනය උද්දීපනය කරනු ලබයි. අපගේ දේශීය සම්පත් සඳහා වඩා විශාල අගය එකතු කිරීමක් සඳහා, තාක්ෂණික නව්‍යකරණයට අවධානය යොමු කරමින් අපගේ ආයතන මගින් දැනට ලබාදෙන පර්යේෂණ, පරීක්ෂණ මට්ටමේ පවතී.

අදාළ සේවාවන් සමඟ ඉල්ලුම් සාධකය සඳහා ප්‍රතිචාර ලබාදීමේ අනුකූලතාවක් ඇත. එසේ හෙයින්, පාරිභෝගිකයාගේ අපේක්ෂාවන් සමඟ ගැළපෙන නිපැයුම් සේවාවක් ඉල්ලුමට සරිලන ලෙස ලබාදීම මින් අදහස් කෙරේ. උපාධිධාරී ගුණාංග, සම්බන්ධතා සහ ප්‍රතිරූප වැනි අගය එකතු කිරීමේ අංග සමග අපේක්ෂාවන් ගිලී ඇත.

උපාධි වැඩසටහන්වල ශක්තිමත්භාවය, විශ්වවිද්‍යාල සහ සේවකයන්ගේ ප්‍රවර්තනය සහ රටේ ආර්ථිකය සඳහා අධ්‍යයන ආයතනයන්හි විෂය නිර්දේශ සංවර්ධනය සහ පර්යේෂණ පැවැත්වීම තීරණාත්මක සාධකයක් වී ඇත. වෙළඳපොලේ අවශ්‍යතාවන්ට අධ්‍යයන ආයතනයන්ගේ ප්‍රතිචාර්යතාව මත පදනම් වන ආර්ථික සංවර්ධනයට අදාළ මෙම අන්තර් බන්ධනයන් උසස් අධ්‍යාපනයේ වඩාත්ම තීරණාත්මක ක්ෂේත්‍රයයි. මෙවැනි තරඟකාරී වටපිටාවක් තුළ සාම්ප්‍රදායිකව සටහන් ලබාදීමේ කිසිදු ප්‍රයෝජනයක් නැත. ව්‍යාපාරයකදී හෝ රැකියාවකදී මතුවන ගැටළු සඳහා ආමන්ත්‍රණය කළ හැකි වඩා යහපත් ඉගෙනුම් ක්‍රියාවලියක් අවශ්‍ය වන නව්‍යකරණයේ අභියෝග යන්ට මුහුණදීමට අපොහොසත් අදක්ෂ උපාධිධාරීන් මේ මගින් බිහි වී ඇත. නූතනයේ, ලිබරල් වෘත්තීය නොවන අධ්‍යාපනයෙන් වෙන්ව කර්මාන්ත අංශය සමඟ ඉතා සමීප සම්බන්ධතාවක් පවත්වමින් වෘත්තීය විෂය නිර්දේශයක් සඳහා මාරු වීමට විශ්වවිද්‍යාල යොමු වී ඇත. ස්වීඩනය වැනි ඇතැම් රටවල, විශ්වවිද්‍යාලයේ පාලක සභාවට කර්මාන්ත අංශයේ නියෝජිතයන් ද සහභාගි කරවා ඇත. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අධ්‍යාපන සංවර්ධනය තුළ විශ්වවිද්‍යාලයක වෙනස්වන ආකෘතිය සහ එහි චරිතාංග අතර සම්බන්ධත්වය පරීක්ෂාවට ලක් කරයි.

## ශ්‍රී ලංකාවේ තත්ත්වය

1942 වර්ෂයේ දී, ලංකා විශ්වවිද්‍යාලය ස්ථාපිත කිරීම, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ආරම්භයයි. එම විශ්වවිද්‍යාලය පදනම වූයේ ඔක්ස්-බ්‍රිජ් (Ox-bridge) හෝ ප්‍රභූ ආකෘතිය මතයි. එය අධ්‍යාපන නිදහස සහිත ස්වතන්ත්‍ර ආයතනයක් විය. 1959 දී, ප්‍රමුඛ පෙළේ බෞද්ධ පිරිවෙන් දෙකක් උසස් කර ශ්‍රී ජයවර්ධනපුර සහ කැලණිය යන විශ්වවිද්‍යාල පිහිටුවීම මගින් ප්‍රභූ සහ දේශීය ආකෘතියේ මිශ්‍රණයකින් යුත් විශ්වවිද්‍යාල බිහි විය. වර්තමානයේදී, ශ්‍රී ලාංකේය විශ්වවිද්‍යාල බහුජන ආකෘතියක එළිපත්තේ සිටී. අනුබද්ධ විශ්වවිද්‍යාලයන්ගෙන් පරිණාමය වූ නව විශ්වවිද්‍යාල වඩාත් උචිත උදාහරණයන් ලෙස දැක්විය හැක. නිදහස් අධ්‍යාපනය පදනම් කොට ගෙන විශ්වවිද්‍යාල අධ්‍යාපනය ක්‍රියාත්මක වුවද, කාර්ය මණ්ඩල තෝරාගැනීම, ශිෂ්‍යයන් තෝරා ගැනීම සහ විෂය මාලා පාලනය සඳහා ඇති අයිතිය සුරක්ෂිත කරනු ඇත. වර්තමානයේදී, ශ්‍රී ලාංකේය විශ්වවිද්‍යාල පද්ධතිය, සම්ප්‍රදායික විශ්වවිද්‍යාල 14ක්, මණ්ඩප 3ක් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විෂය පථය තුළ පවත්නා විවෘත විශ්වවිද්‍යාලයකින් ද සමන්විත වේ. දැනට අභ්‍යන්තර සිසුන් 70,000ක් පමණ ලියාපදිංචි කර ගනිමින්, රට පුරා විසුරුණු විශ්වවිද්‍යාල ජාලයක් පවති. විවෘත විශ්වවිද්‍යාලය විසින් සිසුන් 30,000ක් ලියාපදිංචි කරගනු ලබන අතර අනෙක් විශ්වවිද්‍යාල එකොළහක බාහිර උපාධි වැඩසටහන් සඳහා සිසුන් 2,40,000ක් ලියාපදිංචි කරගනී. රටේ ආයෝජන මණ්ඩලයේ අනුමැතිය සහිතව පිහිටුවා ඇති රේඛීය ආයතනය (cross - border) 60-70 මගින් ශිෂ්‍යයන් 50,000ක් පමණ ලියාපදිංචි කරගනු ලැබේ. මෙසේ, විවිධ ක්‍රම යටතේ උසස් අධ්‍යාපන අවස්ථා සඳහා සිසුන්

80,000ක් පමණ වාර්ෂිකව ලියාපදිංචි වේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලංකාවේ දළ ලියාපදිංචි අනුපාතය (Gross Enrollment Ratio) 16%ක් පමණ ඇතැයි ඇස්තමේන්තු ගත කර ඇති අතර එය දකුණු ආසියාවේ ඉහළම අගයයි.

උසස් අධ්‍යාපනයේ ව්‍යාප්තියත් සමඟ, 1966 අංක 20 දරණ උසස් අධ්‍යාපන පනත මගින් උසස් අධ්‍යාපනය විධිමත් කිරීමට සහ සම්බන්ධීකරණය කිරීමට රජය මැදිහත් විය. මෙම පනත මගින්, උසස් අධ්‍යාපනය සඳහා වන ජාතික සභාව (National Councli for higher Edication) ඇති විය. උපකුලපතිතුමා උසස් අධ්‍යාපන අමාත්‍යතුමා විසින් පත් කරන ලද නිලධාරියෙක් විය. 1972 අංක 1 දරණ විශ්වවිද්‍යාල පනත මගින් විශ්වවිද්‍යාලවල රාජ්‍ය පාලනය වඩාත් ශක්තිමත් කරනු ලැබීය. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මගින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යභාරය වනුයේ ජාතික ප්‍රතිපත්ති අනුව යමින් සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය, පරිපාලනය විධිමත් කිරීම, ප්‍රමිතීන් පවත්වා ගැනීම, රාජ්‍ය අරමුදල් බෙදා හැරීම සහ වියදම් පාලනය කිරීමය. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කර උපකුලපතිවරුන් පත් කිරීම සහ ඉවත් කිරීමේ බලය ජනාධිපතිතුමා සතු වේ. මහජනයාට වගවිය යුතු හෙයින් සහ මූල්‍ය සහයෝගය හේතුවෙන් රජය විසින් විවිධ නියාමන නියෝජිත ආයතන සහ අනෙකුත් ආයතනය හරහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ඉතා සමීපව අධීක්ෂණය කරනු ලබයි. ඒවා පහත සඳහන් පරිදි වේ. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, විශ්වවිද්‍යාල සේවා අභියාචන මණ්ඩලය, විගණකාධිපති, පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සහ මහා භාණ්ඩාගාරයයි. උසස් අධ්‍යාපනය දේශපාලනීකරණය වීම සහ ශිෂ්‍ය සංගම් හරහා සංවිධානයෙන් පරිබාහිරව තරුණයන් විසින් මෙහෙයවන ලද කැරළි කෝලාහල සංස්ථාගත ස්වභාවය හේතුවෙන් විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ස්වායත්තභාවයට සහ අධ්‍යයන නිදහසට දැඩිව බලපෑම් ඇති වේ.

## නූතන උපනතීන්

ශ්‍රී ලාංකේය විශ්වවිද්‍යාලයන් විසින් මුහුණ දෙනු ලබන බලවත් අභියෝගයක් වනුයේ, නූතන ගෝලීය භූමිකාවේ වෙනස්වන අවශ්‍යතාවන්ට සරිලන පරිදි ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමයි. විශ්වවිද්‍යාල පද්ධතිය වෙළඳපොල වෙත දිශාගත වූ පද්ධතියන් කරා පරිණාමනය කිරීමට ලෝක බැංකුව විසින් මූල්‍ය සහයෝගය ලබා දී ඇත. එම විචල්‍යතා නම්: (අ) විෂය මාලාවේ සහ උපාධි පාඨමාලාවන්ගේ ව්‍යුහාත්මක වෙනස්කම් (ආ) නව්‍ය පාඨමාලා සහ එම විවිධ විෂය ක්ෂේත්‍රයන්ට අදාළ වැඩසටහන් හඳුන්වා දීම, (ඇ) නූතන ඉගැන්වීම් ක්‍රමවේදයන් පුළුල් ලෙස භාවිතය සහ විශේෂයෙන් තොරතුරු තාක්ෂණය භාවිත කිරීම, (ඈ) ඵලදායි කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන්, (ඉ) පර්යේෂණ ක්‍රියාකාරකම් ඉහළ දැමීම සහ ශක්තිමත් කිරීම, (ඊ) විශිෂ්ටත්වයේ මධ්‍යස්ථාන සමඟ සම්බන්ධතා ගොඩනැගීම, (උ) කාර්ය මණ්ඩල, පීඨ සහ අධ්‍යයනාංශයන්ගේ කාර්ය ඵලය ඇගයීම් සහ (ඌ) ප්‍රමුඛ විෂය ක්ෂේත්‍රයන්හි පහසුකම් උසස් කිරීම.

කෙසේ වුවද, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ස්ථාපිත විශ්වවිද්‍යාල පහළොව සහ මණ්ඩප තුන අතරින්, ඉගෙනුම් සහ ඉගැන්වීම සඳහා නව ප්‍රවේශ හඳුන්වා දීමේ හැකියාව පවත්නා විශ්වවිද්‍යාල ඇත්තේ අතළොස්සකි. දශක තුනක් පුරා පවත්නා ඉතා පැරණි සහ ස්ථාපිත විශ්වවිද්‍යාල වෙනස්වීම් සඳහා පසුබට වන අතර සිදුවෙමින් පවත්නා විචල්‍යතා සම්පූර්ණ කිරීම ද ඉතාමත් සෙමින් සහ අපහසුවෙන් සිදුවෙමින් පවති. මෙවැනි ආකල්ප සඳහා විවිධ හේතු

පවති. ඉන් පළමුවැන්න වනුයේ බ්‍රිතාන්‍ය සම්ප්‍රදායට අනුව හැඩ ගැසුණු ආචාර්යවරුන් සිටීමයි. දෙවැන්න නම් ඵලදායි වෙනසක් ඇති කිරීම සඳහා පවත්නා අල්ප සම්පත් ප්‍රමාණය වන අතර අවසාන වශයෙන්, මානව සම්පත් සංවර්ධනයේ නවතම ආකල්ප උදෙසා නැඹුරු වී ඇති සංවිධානාත්මක කාර්ය මණ්ඩල සංවර්ධන ක්‍රමෝපායන්ගේ හිඟකමයි.

කෙසේ වුවද, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයන්හි ඇතැම් පීඨ, තම උපාධිධාරීන්ට වෙළඳපොල බලවේගයන්වල දී සහ සේවා වියුක්තියේ දී ඇතිවන අභියෝග සඳහා මුහුණ දීමට හැකිවන අයුරින් නිපුණතා සංවර්ධනය කිරීමට මූලිකත්වය ලබාදෙමින් පවති. මෙකී විශ්වවිද්‍යාලයන්හි විෂය මාලාවක් වෙළඳපොල බලවේගයන්ගේ ඉල්ලුමට, ගැළපෙන ලෙස සකසා ඇති අතර, ඒවායේ වෘත්තීය මාර්ගෝපදේශනය, නිපුණතා සංවර්ධනය සහ දැනුම කළමනාකරණය ආදිය ද එලෙසම සකසා ඇත. මෙම විශ්වවිද්‍යාල විසින් දේශීය මානව සම්පත් සංචිතය වෙත අගය එකතු කළ හැකි ආකාරයේ පාඨමාලා එක් කිරීමට කටයුතු යොදා ඇත.

අළුතින් පිහිටුවන ලද විශ්වවිද්‍යාලයන් උත්සාහ දැරුවද වෙළඳපොල අවශ්‍යතාව සහ නිපදවන ලද උපාධිධාරීන්ගේ ආකාරය අතර තවත් විශාල හිඩැසක් දක්නට ඇත. කෙසේවෙතත්, විශ්වවිද්‍යාල මගින් නිපදවන උපාධිධාරීන් සහ අධ්‍යයන නිදහස මෙන්ම රටේ පවත්නා රැකියා අවශ්‍යතාව අතර පවත්නා හිඩැස අවම කිරීම පිණිස නව ක්‍රමවේදයන් අත්හදා බලා ඇත. එවැනි පර්යේෂණයන් අතර, තොරතුරු තාක්ෂණය සොයා ගැනීමත් සමඟම ඇති වූ විවෘත සහ දුරස්ථ ඉගෙනුම් වැඩ සටහන් හඳුන්වා දිය හැක. මෙම ක්‍රමය මගින් ප්‍රත්‍යක්ෂ වනුයේ, සාම්ප්‍රදායික විශ්වවිද්‍යාල සඳහා ශිෂ්‍යයන්ගෙන් සහ කාර්ය මණ්ඩලවලින් ලැබෙන පීඩනයයි. ඊට සමානව, විදේශ විශ්වවිද්‍යාලයන්ට අනුබද්ධ පුද්ගලික උසස් අධ්‍යාපන ආයතන, වඩා ඉල්ලුමක් පවත්නා ක්ෂේත්‍රයන් අදාළව විවිධ උපාධි පාඨමාලා පිරිනමමින් පවති. කෙසේ වෙතත් මෙම ආයතන, සමාගම් පනත යටතේ අයෝජන මණ්ඩලයේ ලියාපදිංචි, විශ්වවිද්‍යාලයන්ට වඩා, වාණිජ සංවිධාන ලෙස ක්‍රියාත්මක වේ. එසේ හෙයින්, ශ්‍රී ලාංකේය විශ්වවිද්‍යාලයන් විසින් මුහුණ දෙනු ලබන ප්‍රධාන අභියෝගය වනුයේ, අධ්‍යයන නිදහස සහ වෙළඳපොලට අනුකූල වූ විෂය මාලාව අතර කැපී පෙනෙන තුලනයක් ඇති කිරීමයි.

ශ්‍රී ලංකාවේ පවත්නා තවත් ප්‍රධාන ප්‍රතිරෝධයක් වනුයේ, විශ්වවිද්‍යාල අධ්‍යාපනය දේශපාලනීකරණය වීම හේතුවෙන් වෙනස් වීම සඳහා දක්වන විරෝධය සහ රටේ කැරලි කෝලාහලමය හිංසනය සමඟ විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ඇති තීරණාත්මක සම්බන්ධයයි.

වෙනත් දකුණු ආසියානු රටවල මෙන් නොව, ශ්‍රී ලංකාව තුළ, උසස් අධ්‍යාපන අංශයේ ව්‍යාප්තිය සඳහා විශාල ලෙස දායක වූ තරුණයන් විසින් මෙහෙයවන ලද දේශපාලන ප්‍රචණ්ඩත්වයන්ගෙන් හෙබි ඉතිහාසයක් සහ උගත් තාරුණ්‍යය අනුයුක්ත කර ගැනීම සඳහා ආර්ථික සහගාමී ව්‍යාප්තියේ සහ වෙනස්වීමේ ඌනතාවක් පවති. එම නිසා, රටේ සාමාජීය සහ දේශපාලන ප්‍රවණතා යන සන්දර්භය යටතේ, උසස් අධ්‍යාපනයේ ප්‍රතිපත්ති සහ වෙනස්කම් යන අංශයන් ඉතා හොඳින් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයි.

## සමාප්තිය

ව්‍යුහාත්මක සහ ප්‍රතිපත්තිමය වශයෙන්, ලොව පුරා, විශ්වවිද්‍යාලයන්ගේ සම්භාව්‍ය ආකෘතිය වෙනස් වෙමින් පවති. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළින් ගම්‍ය වන අත්දැකීම් වනුයේ, විශේෂයෙන්ම ජාතික සංවර්ධන ක්‍රියාවලියේ අවකාශයන් හැඩ ගැස්වීමේදී, විශ්වවිද්‍යාල පද්ධතිය

බලවත් පීඩාවන්ට සහ ආතතීන්ට යටත්වීම හේතුවෙන්, ගෝලීය වෙනස්කම් සමඟ සහගමනය අසීරු වී ඇත. සම්පත් හිඟකම හෝ සම්පත් ඵලදායීතාවයේ අඩුපාඩු, වෙනස්වීමට ඇති කැමැත්ත අඩුකම, සහ මෙරට සංවර්ධන ඉලක්කයන් සහ සමාජ ව්‍යූහයන් සඳහා උපයෝගී කරගත හැකි ගෝලීය ආකෘතීන්ගේ හිඟකම හේතුවෙන්, විශ්වවිද්‍යාල යල් පිනු හෝ අසම්බන්ධ ආයතන බවට පත්වීමේ තර්ජනයට මුහුණ පා ඇත. සමාජ පරිණාමයේ දී සහ දේශපාලන ස්ථාවරත්වයේ දී උසස් අධ්‍යාපනය විසින් ලබාදෙන ලද සහයෝගය අවතක්සේරුවට යටත් නොකළ යුතුයි.

ගෝලීය ප්‍රවණතාවන්ගෙන් හුදෙකලා නොවූ අපගේම විශ්වවිද්‍යාල ආකෘතියක් සංවර්ධනය කිරීමට හැකි වන අයුරින් පුළුල් ප්‍රතිසංස්කකරණවල අවශ්‍යතාව පවතී. පීඨ හෝ අධ්‍යනාංශ විසින් අල්ප ලෙස හුදෙකලාව ගනු ලැබූ බාහිර වෙනස්කම් තුළින් ආන්තික බලපෑමක් ඇත. ගෝලීය සහ ප්‍රාදේශීය විශ්වවිද්‍යාල අධ්‍යාපනය අතර තීරණාත්මක සම්බන්ධයක් ස්ථාපිත කරනු වස්, තීක්ෂණ බුද්ධියක්, සැලසුම්කරණයක්, වගකීම, කාර්යක්ෂමතාව සහ අධ්‍යයන ඵලදායිතාව වඩා දියුණු කරන අන්දමේ ක්‍රියාවලියක් අවශ්‍ය වේ. කෙසේ වෙතත්, මේ සඳහා වන සමාජීය සහ දේශපාලන වටපිටාව විචල්‍යතාවන්ට මහෝපකාරී විය යුතුයි. වාමාංශික අරගල දෙකක් සහ වසර 30 ක අඛණ්ඩ බෙදුම්වාදී යුද්ධයකට මුහුණ පෑ රටක් ලෙස, සැමට නිදහස් අධ්‍යාපනය ලබාදීමේ සංකල්පය මත පිහිටා ඇති පද්ධතියක ප්‍රබල වෙනස්කම් සිදු කිරීම අසීරු වේ. කෙසේ වුවද, ශීඝ්‍ර ලෙස වෙනස් වෙමින් පවත්නා රටක පසු නොබැස ඉදිරියට යෑම සඳහා සමස්ත පද්ධතියේම ඵලදායි  වෙනස්කම් ඇති කළ යුතු සාධක ලෙස මෙම අංශ හඳුනාගත යුතුයි.

<u>*2011.01.26*</u>

# 43

# ශාස්ත්‍රීය ක්ෂේම භූමිවලින් නික්ම ගෝලීය අභියෝගවලට පිළිතුරු සෙවීමේ අවශ්‍යතාව

මහාචාර්ය රංජිත් සේනාරත්න

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2012 වර්ෂයේ ව්‍යාවහාරික විද්‍යා පීඨයේ උපාධි ප්‍රදානෝත්සවයේ දී උපාධි ප්‍රදානෝත්සව දේශනය පැවැත්වීමට ඇරයුම් ලැබීම මා ලද ගෞරවයකි. උපාධි ප්‍රදානෝත්සවය ඕනෑම විශ්වවිද්‍යාල ශිෂ්‍යයකුගේ ජීවිතයේ සුවිශේෂ අවස්ථාවකි. එමෙන් ම එය ලොව සැම තැන්හිදීම පවුලේ සාමාජිකයන් සහ ප්‍රියයන් හා එක්ව ප්‍රීතියෙන් සමරනු ලබන අවස්ථාවකි. අද දින උපාධි ලබා ගන්නා උපාධිධාරීන්ට මගේ ආසිංසනය පිරිනැමීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. මාගේ දේශනය වන ශාස්ත්‍රීය ක්ෂේම භූමිවලින් නික්ම ගෝලීය අභියෝගයන්ට පිළිතුරු සෙවීමේ අවශ්‍යතාව යන්න උදක්ම අද දින මෙම ගෞරවාන්විත විශ්වවිද්‍යාලයෙන් ඔබ්බට යන ඔබ අරමුණු කරගෙන ඇත.

## විශ්වවිද්‍යාල වනාහි ජාතියේ බුද්ධ කෝෂ්ඨාගාර වේ

ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය විශ්වවිද්‍යාල 5ක් ක්‍රියාත්මක වන අතර මෙම විශ්වවිද්‍යාලයන්හි 4500ක් පමණ යුතු ආචාර්ය මණ්ඩලයක් නියුතු වේ. එම ආචාර්ය මණ්ඩලයන්හි 500 කට ආසන්න සංඛ්‍යාවක් මහාචාර්යවරුන් වන අතර 2000කට ආසන්න ආචාර්ය උපාධිධාරී හෝ ශාස්ත්‍රපති උපාධිධාරී ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු පිරිසක් සිටිති. මෙයින් ප්‍රසංසනීය ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් සංඛ්‍යාව අන්තර්ජාතික අත්දැකීම් සහිත බලාපොරොත්තු තැබිය හැකි විද්‍යාඥයින් වන අතර ඔවුහු සිය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රමගමණය වෙනුවෙන් සහ එම දැනුම බෙදාහැරීමේ ක්‍රියාවලිය වෙනුවෙන් කැප වී සිටිති. ජාතික විද්‍යා පදනම විසින් 2004 වර්ෂයේ දී සිදු කරන ලද අධ්‍යයනයකට අනුව විශ්වවිද්‍යාල ආචාර්යවරු ලංකාවේ සමස්ත පර්යේෂකයන් හා නිපැයුම්කරුවන් ගොන්නෙන් 60% කට වැඩි ප්‍රතිශතයක් නියෝජනය කරති.

මීට අමතරව, අපගේ විශ්වවිද්‍යාලයන්හි 60,000කට වැඩි උපාධිධාරීහු සහ 4000 කට ආසන්න ප්‍රශ්චාද් උපාධි අපේක්ෂකයෝ සංඛ්‍යාවක් ඉංජිනේරු, වෛද්‍ය, දන්ත වෛද්‍ය, පශු වෛද්‍ය, ස්වාභාවික විද්‍යා, කෘෂි විද්‍යා, මානව ශාස්ත්‍ර, සමාජීය විද්‍යා, කළමනාකරණ හා නීති ආදී වන නොයෙකුත් පීඨයන්හි අධ්‍යයන කටයුතුවල නියැලෙති. දිවයිනේ පාසල් ශිෂ්‍යයන්ගෙන් 2% ක් පමණ වන පිරිසක් පමණක් විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබාගැනීමේ භාග්‍යය දිනා ගනිති. එම නිසා, මෙම ශිෂ්‍යයන් රටේ තරුණ පිරිසෙහි සාරය නියෝජනය කරන බව නොඅනුමානය.

වර්තමානයේ දී, වසරකට රුපියල් මිලියන විසිදහසක්, එනම් රුපියල් බිලියන විස්සකට වැඩි මුදලක් වාර්ෂිකව උසස් අධ්‍යාපනය සඳහා මෙරට වැය කෙරේ. උපාධිධාරියෙකු බිහි කිරීම සඳහා රජය අවම වශයෙන් රුපියල් ලක්ෂ පහකට ආසන්න මුදලක් වැය කෙරේ. මෙම මුදල උපාධි පාඨමාලාව හා අධ්‍යාපනය විශ්වවිද්‍යාලය යන කරුණු මත අඩු වැඩි වෙයි. මීට අමතරව, අප නිදහස් යයි පවසන නමුත්, වසර 1 සිට 13 දක්වා වන පාසල් අධ්‍යාපනය ලබාදීම සඳහා විශාල මුදලක් වැය

කෙරේ. නොබෙල් සම්මානලාභී මිල්ටන් ෆ්‍රීඩ්මාන් (Friedman) ලොව නොමිලේ ලැබෙන කිසිවක් නොමැති බවත් සියලු දේ සඳහා කිසිවෙකු විසින් හෝ විසින් මිලක් ගෙවන බවත් පවසා ඇත. මෙය නිදහස් අධ්‍යාපනය විෂයෙහි සලකා බැලූ කල එය පොදු ජනතාවගේ දහදියේ වැර වෑයමේ හා ශ්‍රමයේ බලයෙන් රැකෙන බව පෙනී යයි. එයෙහින් විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් ඇතුළු සමස්ත විශ්වවිද්‍යාල ප්‍රජාවම තමන් සතු සමාජමය වගකීම පිළිබඳ සවිඥානික වී තමන් ජීවත් වන සමාජයේ ප්‍රගමනයට ඍජු දායකත්වයක් ලබා දිය යුතුය. අවම වශයෙන් එක් විශ්වවිද්‍යාලයක් හෝ එක් පළාතක් තුළ පිහිටා ඇති බැවින් සිය බුද්ධිමය හා යටිතල සම්පත් සංවර්ධන කාර්ය අරබයා යෙදවීමෙන් ජාතික සංවර්ධනයේ කොටස්කරුවන් වීමට විශ්වවිද්‍යාලවලට හැකියාවක් ඇත.

## දුරස්ථභාවයෙන් තොර වඩාත් ප්‍රජාමූලික වූ පැවැත්මක්

විශ්වවිද්‍යාල මහජන ආයතන වශයෙන් සලකන සමාජයක් තුළ, මහජන සුභසිද්ධිය සැලසීමට ක්‍රියා කිරීම වැදගත් හා අත්‍යවශ්‍ය වේ. ලොව පුරා රජය මහජන මුදලින් යැපෙන විශ්වවිද්‍යාල වඩාත් සමාජයට වැඩදායී ආයතන බවට පත්කිරීමට යත්න දරමින් සිටී. නිෂ්පාදන ක්ෂේත්‍රයන් හා වැඩ ලෝකයේ වෘත්තීන් නිපුණතා සහිත උපාධිධාරීන් අපේක්ෂා කරන අතර සමාජය සහ ප්‍රජාව උපාධිධාරීන්ගෙන් නිර්මාණශීලීත්වය හා දූනුවත් නායකත්වයක් හා කල්පනාකාරී වෘත්තීමය ශක්‍යතාවක් බලාපොරොත්තු වේ. මෙලෙස විවිධ සමාජ කොටස්කරුවෝ උපාධිධාරීන් වෙතින් විවිධ වූ නිපුණතා දූනුම හා උගත් දෙය තමන්ගේ හා රටේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමේ හැකියාව බලාපොරොත්තු වෙති. එම අපේක්ෂා ඉටු කිරීමට නම් විශ්වවිද්‍යාල ඉගෙනුම් හා පර්යේෂකයන්ට අමතරව සමාජයේ බුද්ධිමය, සමාජීය, ආර්ථික, පාරිසරික, ආධ්‍යාත්මික හා සංස්කෘතික අවශ්‍යතා ඉටුකිරීම කෙරෙහි සිය සම්පූර්ණ හා අඛණ්ඩ අවධානය යොමුකළ යුතුය.

ශ්‍රී ලංකාවේ සැලකිය යුතු ජනසංඛ්‍යාවක් මූලික පහසුකම් හා සේවා නොමැතිව ග්‍රාමීය ප්‍රදේශවල තවමත් ජීවත් වෙති. ග්‍රාමීය ප්‍රදේශයන්හි අතිමහත් ශක්‍යතා, කුසලතා හා නිපුණතා ප්‍රමාණයක් නිද්‍රෝපගතව පවතින අතර මෙම නිද්‍රෝපගත විභවතා ග්‍රාමීය සංවර්ධනය සඳහා යොදාගත යුතුය. ආචාර්ය අබ්දුල් කලාම් පැවසූ පරිදි බල ගන්වන ලද තරුණ සිත් සතන් ලොව ප්‍රබලතම සම්පත වේ. මෙම සම්පත අහසින්, පොළොවෙන් හෝ මුහුදු පත්ලෙන් සොයාගත හැකි අන් සියලු සම්පත්වලට වඩා ප්‍රබලය. අප රටේ මිලියන විස්සක් වූ සිත්සතන් තුළ අපරිමිත බලයක් ගැබ්ව ඇත. ග්‍රාමීය ප්‍රදේශයන්හි නිර්මාණශීලීත්වයෙන් හා උත්සුක බවින් කුළුගැන්වුණු බොහෝ තරුණ පිරිස් වෙති. ඔවුන්ගේ සැඟවුණු ශක්‍යතා හා යටපත්ව ඇති කුසලතා කරලියට ගෙන ආ යුතුය. දැල්වුණු පහනකට පමණක් තවත් පහනක් දැල්විය හැකිය. කෙතරම් විශාල වගකීමක් හා සදාචාරමය බැඳීමක් මෙරට බුද්ධිමතුන් හා වෘත්තිකයන් වෙත පැවරී ඇත්ද? මෙම වැදගත් මොහොතේ ග්‍රාමීය තරුණ පිරිස්වල නිද්‍රෝපගත ශක්තිය බලගන්වා එම කුදුමහත් ශක්තිය ජාතියේ දියුණුව පිණිස යොදා ගැනීමට ශ්‍රී ලංකාව සංවර්ධිත රාජ්‍යයක් කිරීමේ කවර ව්‍යායාමක් තුළ වුව ග්‍රාමීය ජනතාව බලගැන්වීම මුඛ්‍ය උපායමාර්ගයක් විය යුතුය. ග්‍රාමීය සංවර්ධනය ශ්‍රී ලංකාවට දූනුම් ආර්ථිකයක් බවට පරිවර්තනය කිරීමේ දී අවශ්‍යම අංගයකි.

එම නිසා විශ්වවිද්‍යාල හා අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන තමන් අයත් වන සමාජය සමග සක්‍රියව සම්බන්ධ වීම ඉතා වැදගත් වේ. එසේ බාහිර සමාජය සමග සම්බන්ධ වීම අවශේෂ කාර්යයක් නොව සිය මුඛ්‍ය පරමාර්ථයක් ලෙස සිතා කටයුතු කිරීමට විශ්වවිද්‍යාලයන්ට දැන් කාලය එළඹ ඇත. එබැවින් සමාජය හා සහසම්බන්ධ වීම විශ්වවිද්‍යාල හර පද්ධතියේ මූලිකාංගයක් වශයෙන් සැලකිය යුතුය. විශ්වවිද්‍යාලයන්ට තවදුරටත් සමාජයෙන් දුරස්ථව සිටීමට හැකි නොවේ. විශ්වවිද්‍යාල සමාජය

හා ප්‍රජාව මුහුණ දෙන ජීවනෝපාය, ලෙඩරෝග, දරිද්‍රතාව, නූගත්කම, කෘෂි කර්මාන්තය, නිෂ්පාදනය, ඵලදායිතාව, අධ්‍යාපනය හා පරිසරය ආදී ක්ෂේත්‍රයන්හි පැන නගින ගැටළු ක්‍රමානුකූල හා පරිපූර්ණ අධ්‍යයනයන්ට බඳුන් කර වඩාත් ප්‍රතිඵලදායී විසඳුම් ඉදිරිපත් කළ යුතුය. මෙම ක්‍රියාවලිය සාර්ථක වීමට නම් විශ්වවිද්‍යාල හා බාහිර සමාජය අතර අන්තර්ක්‍රියාකාරීත්වය අහඹු හෝ සීමාන්තික හෝ එකක් නොවිය යුතුය.

මෙහිදී අපගේ විද්‍යාඥයන්ට සමාජ විද්‍යාඥයන්ගේ කාර්යභාරය ඉටුකරමින් සමාජ පරිවර්තනයකට දායක විය හැකිය. මෙම නව ධූරයේදී විද්‍යාඥයන් සිය විශ්වවිද්‍යාල, පර්යේෂණාගාර හා ආයතනවලින් නික්ම සිය ප්‍රජාව මධ්‍යයට පැමිණ ප්‍රජා සාමාජිකයන් හා එක්ව පුළුල් කතිකාවන් හා ක්‍රියාකාරීත්වයන් ගොඩනැංවිය යුතුය. සිය දැනුමෙන් පොදු ජන යහපත උදෙසා කවර ප්‍රයෝජන ගත හැකිදැයි ඔවුන් තම තමන්ගෙන්ම ඇසිය යුතුය. අපගේ විද්වතුන් ධනාත්මකව සිතන නොබියව ජනතා හිත සුව පිණිස කටයුතු කරන ජනතාවට ඵලදායි සේවාවන් ලබා දෙන්නන් විය යුතුය. වෙනත් විදිහකට පවසතොත් ඔවුන් ප්‍රායෝගික ශාස්ත්‍රඥයන් විය යුතුය. අපගේ අතිගරු ජනාධිපතිතුමා විසින් ධීවර හා ජලජ සම්පත් ඇමතිවරයාව සිටි කාලයේ දී ස්ථාපනය කරන ලද සාගර විශ්වවිද්‍යාලය ධීවර හා ආශ්‍රිත ක්ෂේත්‍රයන්හි පුහුණුව ලත් මිනිස් බල අවශ්‍යතාව සපුරාලීම හා මෙම ක්ෂේත්‍රයන්හි නියැලෙන්නන්ගේ ජීවන තත්ත්වය හා සමාජ තත්ත්වය ඉහළ නැංවීම යන අරමුණු මුල් කරගෙන පිහිටුවන ලදි. එහෙයින් එහි මෙහෙවර ප්‍රකාශයෙන් වෘත්තීය හා ශාස්ත්‍රීය පාඨමාලා අන්තර්ගතය ධීවර ප්‍රජාව ධීවර ක්ෂේත්‍රය හා එහි කොටස්කරුවන් වෙනුවෙන් සේවය කරතියි යන්න ගැබ්ව ඇත.

## ප්‍රජාව සමග සහ සම්බන්ධ විය යුත්තේ ඇයි?

ප්‍රජාව හා සමාජය වෙනුවෙන් සේවය කිරීමට හැකි වීම ගෞරවයක් හා භාග්‍යයක් වේ. ජෝර්ජ් බර්නාඩ් ෂෝ ''මගේ ජීවිතය ප්‍රජාව සතු වේ. මට හැකි උපරිමය කිරීම මා ලද භාග්‍යයකි. මියෙන විට ඉතා ප්‍රයෝජනවත් පුද්ගලයෙකුව සිටීමට මට අවශ්‍යය. මන් ද යත් වෙහෙස වී වැඩ කරන තරමට මාගේ දිවිය ඵලදායක වේ. ජීවිතය මට කෙටි කලකින් දැවී යන පහනක් නොවේ. එය මොහොතකට මා අත රැඳෙන පන්දමකි. එය ඊළඟ පරපුරට දිගු කිරීමට පෙර හැකි තරම් දීප්තියෙන් බැබළවීම මාගේ අපේක්ෂාවයි.'' යයි පවසා ඇත. විශ්වවිද්‍යාලයක ශ්‍රේෂ්ඨත්වය මනිනු ලබන්නේ එහි සාමාජිකයන්ගෙන් සමාජයට, රටට, ලෝකයට සිදුව ඇති සේවය අනුවය. අමරිකා එක්සත් ජනපදයේ කෝනෙල් විශ්වවිද්‍යාලයේ හිටපු සභාපතිවරයෙකු වූ ෆ්‍රැන්ක් රෝඩ්ස් (Frank Rhodes) ''ප්‍රජාවකින් තොරව දැනුම ස්වචාරී වේ. හුදෙකලා වූ විද්‍යාර්ථියා පටු භාවයට ආධානග්‍රාහිත්වයට ගොදුරු වීමට වඩා ඉඩ ඇති වේ. තහවුරු නොකරන ලද සිතා ගැනීම් මත එල්බ ගන්නා ඔහු අධ්‍යාපනයේ අන්තර්ගත වන පාපුල වූත්, දැනුවත් වූත් ප්‍රතිවිරුද්ධ අර්ථකථනයන්ගෙන් අභියෝගයට ලක් වූ හා, විවිධ වූ ද විෂම වූ ද අත්දැකීම්වලින් යුක්ත වූ විකල්ප දෘෂ්ටිකෝණයන්ගෙන් සුපෝෂිත වූත් වචනයේ පරිසමාප්ත අර්ථයෙන් පරිපූර්ණ වූත් දැනුමකට හිමිකරුවෙක් නොවෙයි. ප්‍රජාවක් නොමැති තැන්හිදී සොයාගැනීම් සීමාන්තික වේ. ඒ තනි ඥාන ගවේෂකයාගේ චින්තනයේ නිර්මාණාත්මක ගුණයෙහි හෝ අද්විතීය භාවයෙන් වන මඳ බවක් නිසා නොව ඔහුගේ ඇයගේ නිගමන අභියෝගයට ලක් නොවීම හා තහවුරු නොවීම යන කරුණු හේතුවෙනි. පෞද්ගලික වූ දැනුම වනාහි අස්ථානගත වූ දැනුමයි'' යන්න පවසා ඇත. ප්ලේටෝ අපට මතක් කර දුන් පරිදි ''ශාස්ත්‍ර ඥානයේ හිණිපෙත්තේ සිටින අය තමන්ටම වෙන් වූ පරිසරයකට සීමා නොවිය යුතුය. ඔවුහු සිය උඩුමහල්තලවලින් බැස සාමාන්‍ය ජනතාව හා හැසිරිය යුතුය, ඔවුන් උහුලන දිවි බරෙහි රස විඳ බැලිය යුතුය. එවිට ඔවුන් ලද වසර ගණනක විශේෂ පුහුණුව හා ඒ සඳහා දැරූ වැරවෑයම සාධාරණීයකරණය වනු ඇත.''

අමෙරිකා එක්සත් ජනපදයේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලද ආචාර්ය උපාධියකින් ආඪ්‍යව මොහොමඩ් යූනුස් බංගලාදේශයේ බරසාර ආර්ථික න්‍යායයන් උගන්වමින් කල්ගෙව්වේය. අනතුරුව මෙවැනි ඉහළ මට්ටමේ ආර්ථික න්‍යායයන් ඉගැන්වීමේ ප්‍රයෝජනය ප්‍රශ්න කිරීමට පටන් ගත්තේය. විශේෂයෙන්ම විශ්වවිද්‍යාලය අවට ජනතාව දරුණු මන්දපෝෂණයකට ගොදුරුව මරණයට අත වනමින් සිටිනා කල්හි එවැනි ආර්ථික න්‍යායන්හි අදාළත්වය ඔහුට ප්‍රශ්නකාරී විය. මෙසේ දුක් විඳින ජනතාව වෙත ගිය යූනුස්ට අවබෝධ වූයේ කුඩා මූල්‍ය ආධාරයකින් දිළිඳු ජනතාවගේ ජීවිතයේ විශාල වෙනසක් කළ හැකි බවය. මෙම දැනුම ඔහු ලාභ අපේක්ෂා නොකරන සූක්ෂම ණය යෝජනා ක්‍රමයක් දිළිඳු ජනතාව වෙත හඳුන්වා දීමට මෙහෙයවූයේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වයේ හා ආදායම් මට්ටමේ විශාල වෙනසක් සිදු විය. 2006 දී යූනුස් ග්‍රාමීය බැංකු මගින් කරන ලද සේවය උදෙසා නොබෙල් සාම ත්‍යාගයෙන් පිදුම් ලැබුවේය.

ලෝකයේ බොහෝ ප්‍රදේශයන්හි විශ්වවිද්‍යාල සංවර්ධනයේ හා සම්පත් ජනනයේ උත්ප්‍රේරක හා නියෝජිතයන් බවට පත්ව තිබේ. ඔවුහු තම බුද්ධිමය හා යටිතල සම්පත් නිෂ්පාදන ක්ෂේත්‍රයන්හි වර්ධනය, ප්‍රදේශීය හා ජාතික සංවර්ධනය උදෙසා මෙහෙයවති. ඒ නිසා ඉතා විශිෂ්ට ලෙස සංවර්ධනය වූ නගර ආශ්‍රිතව නගරයේ බුද්ධිමය සමාජය හා සංස්කෘතික සචලතාව හා සංවර්ධනයට දායක වන්නා වූ විශිෂ්ට ගණයේ විශ්වවිද්‍යාල පවතී. දැනුම පදනම් වූ ගෝලීය ආර්ථිකයක් තුළ නගරයක වර්ධනය හා විශ්වවිද්‍යාලයක වර්ධනය අතර සබඳකමක් දක්නට ලැබීම පුදුමයට කරුණක් නොවේ. මෙම සහසම්බන්ධනයට පැහැදිලි උදාහරණ වශයෙන් අමරිකා එක්සත් ජනපදයේ කැලිෆෝනියා නගරය ආශ්‍රිතව ඇති ස්ටැන්ෆෝඩ් විශ්වවිද්‍යාලය, ඉන්දියාවේ පන්ජාබ් ප්‍රදේශය ආශ්‍රිතව ඇති පන්ජාබ් විශ්වවිද්‍යාලය, චීනයේ ෂැංහයි නගරය ආශ්‍රිතව ඇති ෆූඩන් (Fudan) විශ්වවිද්‍යාලය, ස්වීඩනයේ ගොතෙන්බර්ග් නගරය ආශ්‍රිතව ඇති චාල්මර්ස් (Chalmers) විශ්වවිද්‍යාලය හා සිංගප්පූරුවේ NUS විශ්වවිද්‍යාලය දැක්විය හැකිය.

ග්‍රාමීය ජනතාව අපගේ රට සංවර්ධිත රටක් බවට පරිවර්තනය කිරීමට යන ගමනේ දී සිය ශක්තියෙන් දායක වීමට සූදානම්ය. අපගේ ප්‍රජාව තුළ පාසල් අධ්‍යාපනය නොලද නමුත් ඉතා දක්ෂ හා බහුවිධ හැකියාවන් සහිත පුද්ගලයෝ වෙති. ඔවුහු ජීවන පර්යේෂණාගාරය තුළ අත්දැකීම් ලැබුවෝ වෙති. කිසිදු ආකාරයේ මූල්‍ය ආධාරයක් රජයෙන් නොලබන ඔවුහු සිය ශක්තිය, නිර්මාණශීලීභාවය, ධෛර්යය හා මූල්‍ය සම්පත් යොදාගෙන නව්‍යකරණ කාර්යයේ නියැලෙති. ඔවුන් විද්‍යාත්මක විශ්ලේෂණය පිළිබඳව විධිමත් පුහුණුවක් නොලබා ඇති නමුදු ඔවුන්ගේ නිරීක්ෂණ, විශ්ලේෂණ හා සංස්ලේෂණ විධිමත් පුහුණුවක් ලත් විද්‍යාඥයන්ගේ හැකියාවන්ට නො දෙවෙනිය. ඔවුහු බටහිරින් සංකල්ප ආනයනය නො කරන අතර බිම් මට්ටමේ සිට තමන්ටම අනන්‍ය වූ අදහස් හා නව්‍යකරණ විධි ජනිත කර ගනිති.

එම නිසා ප්‍රජාව සමඟ සහසම්බන්ධයක් ඇති කර ගැනීමෙන් විශ්වවිද්‍යාලයට හා ප්‍රජාවට අන්‍යෝන්‍ය වාසි රැසක් අත් වේ. කෙසේ නමුත් ඉතා අල්ප අවස්ථාවන් කිහිපයක දී හැරුණු කොට අපේ රටේ විශ්වවිද්‍යාල තවදුරටත් හුදෙකලා වූ ශාස්ත්‍රීය දූපත් ලෙස සාම්ප්‍රදායික අධ්‍යයනයන්හි හා පර්යේෂණයන්හි පමණක් නියැලේ. ඒවායින් උපාධිධාරීන් බිහි කිරීම හැරුණු කොටගෙන ජනතාව වෙත ලබාදෙන ප්‍රතිලාභයක් නොමැති තරම්ය. විශ්වවිද්‍යාලවලින් ප්‍රජාව වෙත ලබාදිය හැකි අපරිමිත සේවය සලකා බැලීමේ දී ඒවා තවදුරටත් හුදෙකලා වූ ශාස්ත්‍රීය දූපත් ලෙස පැවතීම සාධාරණීකරණය කළ නොහේ. විශ්වවිද්‍යාල මෙම තත්ත්වයෙන් මිදී විශ්වවිද්‍යාලයන්හි පැවැත්ම තහවුරු කිරීමට තම වෙහෙස මහන්සියෙන් ශ්‍රමයෙන් දායකත්වය සපයන ග්‍රාමීය ජනතාවගේ ජීවිත නංවාලීම සඳහා දායකත්වයක් ලබා දිය යුතුය.

එම නිසා විශ්වවිද්‍යාල ප්‍රජාව සමග අත්‍යන්ත සම්බන්ධතාවක් ගොඩනගා ඒ අනුසාරයෙන් ග්‍රාමීය තරුණ පිරිස් තුළ පවත්නා සැඟව ගිය දක්ෂතා හා නිර්මාණාත්මක ශක්තීන් ප්‍රයෝජනයට ගැනීමට හා ග්‍රාමීය ප්‍රදේශයන්හි පවත්නා උපයෝජනයට නොගත් හා නිසි පරිදි ප්‍රයෝජනයට නොගත් මානව හා ස්වාභාවික සම්පත් රටේ දියුණුව උදෙසා ප්‍රශස්ත උපයෝජනයකට බඳුන් කරවීම සඳහා නිසි ක්‍රමවේදයක් සහ ක්‍රියාකාරී සැලසුමක් නිර්මාණය කළ යුතුය.

## අපගේ විශ්වවිද්‍යාලයන්ට කෙසේ ප්‍රජාව සමඟ අත්‍යන්ත සම්බන්ධතාවක් ගොඩ නගාගත හැකිද?

ප්‍රජාව සමග අත්‍යන්ත සම්බන්ධතාවක් ගොඩනගා ගැනීම සඳහා අපගේ විශ්වවිද්‍යාල සහමුලින්ම ප්‍රතිනිර්මාණකරණයට හා ප්‍රතිස්ථානගත කිරීමට සිදුවනවා පමණක් නොව උපාධි පාඨමාලා ප්‍රජාව සමග සහසම්බන්ධයක් ඇති කරගැනීම විශ්වවිද්‍යාල හර පද්ධතියේ මුඛ්‍ය හරයක් හා විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ හා පර්යේෂණ ක්ෂේත්‍රයේ අත්‍යාවශ්‍යතාවක් බවට පත් වන පරිද්දෙන් ප්‍රතිව්‍යුහගත කළ යුතුය. පළමුව ප්‍රජාව සමග සහසම්බන්ධනයක් ඇති කරගැනීමට ඇති වාතාවරණයක් සකස් කර ගත යුතුය. මෙහිදී ප්‍රජා සේවාවන් සැපයීම විශ්වවිද්‍යාලයන්හි ප්‍රධාන කාර්යභාරයක් බව හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය අනිවාර්ය වේ. අනතුරුව ප්‍රජාව සමග සම්බන්ධතා පවත්වාගෙන යාමට සුදුසු වාතාවරණයක් නිර්මාණය කිරීම හා පවත්වාගැනීමට අවශ්‍ය වන ආයතනික ව්‍යුහ, පද්ධති, ක්‍රියාවලීන් සහ වැඩසටහන් ස්ථාපනය කළ යුතුය. මෙහිදී, අධ්‍යයන කාර්ය මණ්ඩලය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රීය අභිමතාර්ථ හා පර්යේෂණ කාර්යභාරයන් හා මනාව සැසඳෙන්නා වූ ප්‍රජා පාදක කාර්යයන් ධෛර්යමත් කිරීමට එම කාර්යයන් ඉටුකිරීමට අවශ්‍ය පහසුකම් සැලසීමටත් විද්‍යාර්ථීන් ඒ වෙත යොමු කිරීමටත් වගබලා ගත යුතුය.

වර්තමානයේ දී සමහර විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල සාමාජිකයන් දැනටමත් ප්‍රජාව සමග වැඩදායි සම්බන්ධතා වර්ධනය කරගෙන ඇති අතර ඔවුහු එමගින් ප්‍රජා සංවර්ධනයට සැලකිය යුතු දායකත්වයක් සපයති. කෙසේ නමුත් විශ්වවිද්‍යාලයන්හි අධ්‍යයන හා පරිපාලන කාර්යමණ්ඩලයන්හි සැලකිය යුතු කොටසක් ප්‍රජා සේවය විශ්වවිද්‍යාලයක ද්විතීයික හෝ නාමමාත්‍රික අභිමතාර්ථයක් පමණක් බවත් එවැනි වැඩකටයුතු උදෙසා වැඩසටහන් වෙන් කළ නොයුතු බවත් විශ්වාස කරති. සමහර දෙනා තවමත් විශ්වාස කරන්නේ විශ්වවිද්‍යාල බිම් මට්ටමෙන් ඈත් වූ වෙසෙසි පැළැන්තියක ආයතන විය යුතු බවය. එබැවින් ප්‍රජාව සමග සහසම්බන්ධයක් ගොඩනගා ගැනීමේ කාර්ය සාර්ථක වීමට නම් පරිපූර්ණ වූ ආකල්පමය වෙනසක දැඩි අවශ්‍යතාව පෙනී යයි. මීට අමතරව, ප්‍රජාව මුහුණ දෙන ප්‍රශ්න බහුවිධ වන අතර විෂයාන්තර හා විෂය සමගාමී ප්‍රවේශයක අවශ්‍යතාව පෙන්නුම් කරයි. එහෙත් විශ්වවිද්‍යාල තවමත් අන්තර් විෂයික සාමූහික ක්‍රියාකාරීත්වයක් නොපෙන්වමින් විෂයික සීමා මායිම්වලට නතුව පවතී. එහෙයින් ඵලදායි ප්‍රජා සහසම්බන්ධතාවක් ගොඩනගාගැනීම සඳහා අධ්‍යයන අංශ හා පීඨ වශයෙන් පවත්නා වූ දරදඬු බෙදීම් පසෙක ලා අදහස්, දක්ෂතා හා සම්පත් නිදහසේ බෙදාගත හැකි නම්‍යශීලී හා අන්තර් සබඳතා පවත්වා ගත හැකි පරිසරයක් පීඨ හා අධ්‍යයන අංශ තුළ සකස් කර ගත යුතුය. ප්‍රජාව සමග සහසම්බන්ධයක් ඇති කර ගැනීමේ සම්ප්‍රදාය සමාග්‍රහණය කරවීමේ දී හා ආයතනගත කිරීමේ දී අපට අභියෝගයන් කිහිපයකට මුහුණ දීමට සිදුවනු ඇත.

මෙම සහසම්බන්ධය ඵලදායී හා බලපෑම් සහිත එකක් වීමට නම් එය විශ්වවිද්‍යාලයේ මෙහෙවර ප්‍රකාශයන්හි අන්තර්ගත විය යුතු අතර අධ්‍යයන කාර්ය මණ්ඩලයට පැවරෙන වගකීම් සමුදාය හා බඳවාගැනීමේ හා උසස් වීම් ලබාදීමේ පටිපාටිය විද්‍යාර්ථීන්ගේ ඉගෙනුම් අත්දැකීම් සහ බාහිර ආයතන හා දක්වන සබඳතා මගින් ද එය විද්‍යාමාන විය යුතුය. ප්‍රජා සේවය හා සංවර්ධනයට

සම්බන්ධ අනිවාර්ය වූ හා ඒකක අගය සහිත පාඨමාලා හා පැවරුම් ශිෂ්‍යයන් ප්‍රජාවට සේවය කිරීමට යොමු කරමින් ශාස්ත්‍රීය පුරවැසියන් බවට පත් කිරීමේ දී වැදගත් වේ. වඩාත් අවධාරණයෙන් කිව යුතු වන්නේ සමාජමය ක්‍රියාකාරීත්වයන් විශ්වවිද්‍යාලයෙන් සැපයෙන හුදු සේවාවක් වශයෙන් පමණක් නොවිය යුතු අතර එම කාර්යයන් විශ්වවිද්‍යාලයේ සමාජමය වගකීම් සමුදායේ අනන්ත කොටසක් ලෙස සැලකිය යුතුය.

තවදුරටත් ඵලදායී වූ සහසම්බන්ධනයක් ගොඩනගා ගැනීමට උපාධි පාඨමාලාවන් පන්ති කාමරයේ දී ලබාගන්නා වූ දැනුම ප්‍රායෝගික භාවිතයක් කරා ගෙන යන්නා වූ 'ආධුනිකත්ව' ප්‍රවේශයකට අනුව සකස් කළ යුතු වේ. වෛද්‍ය සිසුන් දක්ෂ වෛද්‍යවරුන් වීම සඳහා රෝහල් සහ ශල්‍යාගාර තුළ පුහුණුව ලබාගන්නා වූ ආකාරයෙන් ම අනෙකුත් උපාධි අපේක්ෂකයන් ද තම විෂය පථයට අදාළ රජයේ ආයතන හා ප්‍රජා සංවිධානයන්හි කටයුතු කරමින් සාර්ථක වෘත්තිකයන් වීමට අවශ්‍ය ප්‍රායෝගික දැනුම, අත්දැකීම් හා කුසලතා වර්ධනය කර ගත යුතුය. එවැනි වැඩසටහන් මගින් බිහි වන උපාධිධාරීන් ප්‍රදේශීය ප්‍රජාව සමග ජීවත් වෙමින් ඔවුන් වෙතින් දැනුම ඒකරාශී කරගනිමින් ඔවුන්ගේ ගැටළු නිරාකරණයටත්, ප්‍රජා සංවර්ධනයටත් ප්‍රජාවට ප්‍රතිලාභ ලැබෙන්නා වූ සැලසුම් ක්‍රියාත්මක කිරීමටත් නිතැතින්ම පෙළඹෙනු ඇත. එවැනි උපාධිධාරීන්ට ග්‍රාමීය ප්‍රජාව වෙත සමාජ සංචලතාව, ශක්‍යතා වර්ධනය, ප්‍රාග්ධන වර්ධනය, තාක්ෂණ හුවමාරුව, නිපුණතා වර්ධනය, ඵලදායි සම්බන්ධතා හරහා ස්වයං රැකියාවක් අත්කර දිය හැකිය.

ප්‍රජාව හා දක්වන සහසම්බන්ධතාව තවදුරටත් සාර්ථක කර ගැනීමටත් වර්ධනය කර ගැනීමටත් ග්‍රාමීයව ප්‍රජා සේවා පිහිටුවා එම මධ්‍යස්ථාන හා විශ්වවිද්‍යාල අතර සම්බන්ධීකරණ තොරතුරු සන්නිවේදන තාක්ෂණය ඔස්සේ කළ හැකිය. ශිෂ්‍යයන්ට හා ආචාර්යවරුන්ට මෙම මධ්‍යස්ථානයන්හි රැඳී සිටිමින් ගම්වාසීන් දැනුවත් කිරීම පුහුණුව ලබා දීම ඔවුන් හා එක්ව කටයුතු කිරීම හා අධ්‍යයන කටයුතු කිරීම සඳහා අවස්ථාව හිමි වේ. මෙමගින් ශිෂ්‍යයන්ට හා ආචාර්යවරුන්ට ග්‍රාමීය ජනතාව දිනපතා මුහුණ දෙන ගැටළු, ඔවුන්ගේ චින්තනය, ආකල්ප අවශ්‍යතා, බලාපොරොත්තු සහ අපේක්ෂාවන් පමණක් නොව ප්‍රජාව තුළ දක්නට ලැබෙන සමාජ, සංස්කෘතික සහ දේශපාලන ලක්ෂණ හඳුනා ගත හැකි වේ. මෙම දැනුම ග්‍රාමීය ජනතාව මුහුණ දෙන ගැටළු සඳහා සාර්ථක පිළියම් සෙවීමේ දී අතිශයින් වැදගත් වේ.

## සරසවි ගම්මාන ඇති කිරීම

අපගේ විශ්වවිද්‍යාල බොහෝමයක කලා, වාණිජ හා විද්‍යා පීඨ ඇත. මේ අතරින් සමහර විශ්වවිද්‍යාල සතුව වෛද්‍ය, ඉංජිනේරු, කෘෂි විද්‍ය හා අනෙකුත් අධ්‍යයන ක්ෂේත්‍රයන්ට අදාළ පීඨ ද ඇත. මෙවැනි පීඨයන්ට තම ප්‍රදේශයන්හි සංවර්ධනය නොවූ ග්‍රාම කිහිපයක් ක්ෂේත්‍ර පරීක්ෂණාගාර වශයෙන් තෝරා ගත හැකිය. ශිෂ්‍යයන්ට හා ආචාර්ය මණ්ඩල සාමාජිකයන්ට සිය විශේෂ දැනුම හරහා ගම් වැසියන්ගේ සංවර්ධන කාර්යයන්ට දායක විය හැකිය. ඔවුනට ඔවුන් සතු දැනුම කුසලතා හා අත්දැකීම් ගම්වැසියන් මුහුණ දෙන්නා වූ ගැටළු සඳහා පිළියම් සෙවීමටත්, ගම් වැසියන්ගේ සනීපාරක්ෂාව, සෞඛ්‍ය තත්ත්වය, පෝෂණය තත්ත්වය, ජීවනෝපාය, පරිසරය යන සාධක ඉහළ නැංවීමටත් උපයෝගී කරගත හැකිය.

මෙවැනි ව්‍යාපෘති මගින් ආදර්ශ ගම්මාන පිහිටුවනු ඇති අතර ඒවායේ සාර්ථකත්වය මෙවැනි ව්‍යාපෘති තව තවත් බිහි වීමට මං පාදනු ඇත. ආදර්ශ ගම්මාන බිහි කිරීමේ දී එකතු කරගන්නා දැනුම හා අත්දැකීම් ද ඉගෙන ගන්නා පාඩම ද විශ්වවිද්‍යාල අතර හුවමාරු කරගත හැකිය. සුදුසු වෙනස්කම් සහිතව දැනුම, අත්දැකීම් හා පාඩම් නොයෙක් සන්දර්භයන්හි දී ප්‍රයෝජනයට ගත හැකි වනු ඇත. මීට අමතරව විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට හා ශිෂ්‍යයන්ට මෑත දී අරඹන ලද වැදගත් සංවර්ධන කාර්යයන්හි උපායමාර්ගික කොටස්කරුවන් වෙමින් ඒවායේ සාර්ථකත්වයට මඟ පෑදිය හැකිය.

මෙලෙස වැඩදායි සහසම්බන්ධයක් ශිෂ්‍යයන් හා ප්‍රජාව අතර ඇති වීමේ ප්‍රතිඵලයක් වශයෙන් දැනුම පළපුරුද්ද අතර මනා සම්මිශ්‍රණයක් ඇති වන අතර එමගින් සේවාදායකයන් නොමඳව අගය කරන දැනුමෙන් හා කුසලතාවලින් සන්නද්ධ පරිපූර්ණ උපාධිධාරීන් බිහිකිරීමට අවස්ථාව සැලසෙනු ඇත. මෙවැනි වැඩදායී සහසම්බන්ධයකින් රැස් කර ගන්නා ලද අනගි දැනුම හා අත්දැකීම් සම්භාරය විශ්වවිද්‍යාලයන්ට ග්‍රාමීය සංවර්ධන විෂයෙහි ලා මහෝපකාරී වන්නා වූ පාඨමාලා සකස් කිරීමේ හැකියාව ලබාදෙනු ඇත. එම නිසා ප්‍රජාව හා දක්වන සහසම්බන්ධය උපාධිධාරීන් වෘත්තීය ලෝකය හා මනාව පෑහෙන්නා වූ රැකියා අපේක්ෂකයන් කරනවාට අමතරව ලංකාව සංවර්ධිත රටක් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලියට ධනාත්මක දායකත්වයක් ලබා දීමට ද ඔවුන්ට අවස්ථාව සලසයි.

## සංවර්ධනය වූ රටක් කරා

සංවර්ධනය ක්‍රියාවලියකි. භාණ්ඩයක් හෝ සේවාවක් පරිද්දෙන් එය ආනයනය කළ නොහැක්කකි. එම නිසා අපගේ ප්‍රදේශීය හා ජාතික ප්‍රශ්න සඳහා විසඳුම් සෙවීමේ දී, අප ජපානය, අමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය හා සිංගප්පූරුව යනාදී වශයෙන් වන සංවර්ධිත රටවලින් ආකෘති අතමාරුවට ගත යුතුය. එසේ අන්‍යන්ගෙන් ලබාගන්නා ආකෘති ඵලදායී නොවනු ඇත. න්‍යායන් හා සංකල්ප ආනයනය කරනු වෙනුවට අපට ගැළපෙන විසඳුම් අපම සොයාගත යුතුය. අප දේශීය වූ පිළිතුරු හා පිළියම් සොයාගැනීම අත්‍යවශ්‍ය වේ. මෙහිදී අප අපගේම වූ බුද්ධිමය දේපළ තැනීමට ඇති හැකියාව මත දැක්ම රඳා පැවතිය යුතුය. මෙම බුද්ධිමය දේපළ අතරට ඉහළම තලයට අයත් වන්නා වූ විද්‍යාත්මක හා තාක්ෂණික සොයාගැනීම් ද මධ්‍යම තලයට අයත් වන්නා වූ භාණ්ඩ, ක්‍රියාවලි හා සේවා නව්‍යකරණයට බඳුන් කිරීම ද පහළ තලයට අයත්වන්නා වූ සොයා ගැනීම් හා නව්‍යකරණයන්ට දේශීය හා අන්තර්ජාතික වෙළඳපළ තුළ වාණිජමය අගය ලබා දීම යන කරුණු අන්තර්ගත වේ. එම නිසා විශ්වවිද්‍යාල ශාස්ත්‍රඥයන් දේශීය සන්දර්භය මූලය කරගන්නා වූ ඵලදායක ප්‍රජා හා ප්‍රදේශීය සංවර්ධනයට මංපෙත් විවර කරන ඉතාම සාරවත් හා බහුවිධ වූ බුද්ධිමය සම්පත් හා යටිතල පහසුකම් සහිත 60,000ක් ඉක්ම වූ ගතික හා දක්ෂතා පරිපූර්ණ සිසු කැලකින් සුපෝෂිත වූ විශ්වවිද්‍යාල පද්ධතියට දැනුම් ආර්ථිකයක් තුළ ජාතික සංවර්ධනයේ ගාමක බලවේගය වීමේ හැකියාව ඇත. කෙසේ නමුත්, විශ්වවිද්‍යාල සතු මෙම වටිනා මානව සම්පතින් මේ තාක් දුරට නිසි ප්‍රයෝජන ගෙන නොමැත. යම් හෙයකින් මනා සංචලතාවට පත් කර ප්‍රදේශීය සංවර්ධන කාර්යයන් වෙත මෙහෙයවන්නේ නම් විශ්වවිද්‍යාලයන්ට ප්‍රදේශීය සංවර්ධනය ඉදිරියට මෙහෙයවන බලවේග කට්ටලය වීමටත් ශ්‍රී ලංකාව සංවර්ධිත රාජ්‍යයක් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලියේ ඵලදායක කොටස්කරුවකු වීමටත් හැකියාව පවතී. මේ සඳහා අවශ්‍ය වන මැදිහත්වීම් සිදු කිරීමේ කාර්යභාරය මේ තීරණාත්මක මොහොතේ විශ්වවිද්‍යාල බලධාරීන් වෙත පැවරී ඇත. මෙම මැදිහත්වීම් කල් වේලා ඇති ව සිදු කරන පමණට ඒවායින් අත් වන ප්‍රතිඵල ද වේගවත් වේ.

ආදරණීය උපාධිධාරීනි, ඔබේ අධ්‍යාපනය හා ජයග්‍රහණ වෙනුවෙන් උසස් අධ්‍යාපන අවස්ථා සුරක්ෂිත කර පවත්වාගෙන යාමට ඉවහල් වන්නා වූ මහජන මුදල් දායක වී ඇති ඔබට මතක් කරන්නට මම රිසි වෙමි. එසේ හෙයින් ඔබ අද අත් කරගෙන ඇති තත්වයට පැමිණීමට ඔබට උර දුන් ඔබේ සමාජයට, ඔබේ ජාතියට, ඔබේ රටට ඵලදායී ආකාරයෙන් කෘතගුණ සැලකීමට ඔබට සදාචාරමය බැඳීමක් හා බැහැර නොවිය හැකි වගකීමක් ඇත. එම නිසා ඔබ කවර තිලයක් දරන්නෙකු බවට පත් වුව ද කුමන කාර්යයක නියැලෙන්නේ වුව ද කරුණාකර ඔබට පැවරී ඇති ජාතික වගකීම පිළිබඳ සිතිවිල්ල සිත්හි තබාගන්න. මම ඔබ සියලු දෙනාටම දීප්තිමත්, ඵලදායක හා සාරවත් අනාගතයක් ප්‍රාර්ථනා කරමි.

<u>2012.02.05</u>

# 44

# ඔබේත් රටේත් දියුණුව උදෙසා සාර්ථක මිනිසුන්ගෙන් අප උගත යුතු පාඩම්

ආචාර්ය ඒ. එම්. මුබාරක්

රටේ තිබෙන වඩාත්ම ප්‍රගතිශීලී පීඨයන් අතරින් එකක් වන ඔබේ පීඨයේ උපාධි ප්‍රදානෝත්සව අවස්ථාවේ දී ඔබ ඇමතීමට අවස්ථාව ලැබීම මම විශාල ගෞරවයක් හා වරප්‍රසාදයක් ලෙස සලකමි. මා මෙහිදී ප්‍රගතිශීලි යන වචනය යොදාගන්නේ අයිටිඅයි හි හිටපු අධ්‍යක්ෂවරයා ලෙස ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ විද්‍යා පීඨයෙන් පසුගිය වසර කිහිපය තුළ උපාධිය ලබා පිට වන උපාධිධරයන්ගේ ගුණාත්මකභාවය පිළිබඳ අත්දැකීමෙන් ලද පුද්ගලික අවබෝධයක් මා තුළ පවතින නිසාය.

ආදරණීය ශිෂ්‍යයනි, අද ඔබ බාහිර ලෝකය වෙත ඉතා තීරණාත්මක පියවරක් තබා තිබේ. ඔබ ඔබේ ජීවිතය සහ ඔබේ වෘත්තිය ජීවිතය ගොඩනගාගැනීමේ ගමනට දැන් අවතීර්ණ වී සිටී. මෙය ඔබේ සහ ඔබගේ පවුලේ සියලු දෙනාහට සතුටුදායක අවස්ථාවක් වනු නිසැකය. මේ මාර්ගය වෙත ඔබට පෙර පිවිසි අයගේ උපදෙස් සහ අත්දැකීම්වලින් ඉගෙන ගැනීමට ද මෙය උචිත අවස්ථාවකි. විශිෂ්ට අධ්‍යාපනයක් ලැබීම තුළින් ඔබ අනාගතය සඳහා වූ ශක්තිමත් හා බලවත් අත්තිවාරමක් නිර්මාණය කරගෙන තිබේ. උපාධිධාරීන් ආර්ථිකමය වශයෙන් ශක්තිමත් අය බවත් උපාධිධාරීන් නොවන අයට සාපේක්ෂව ආර්ථික ගැටලුවලට සාර්ථකව මුහුණදීමේ ශක්‍යතාව ඔවුන් සතුව ඇති බවත් ප්‍රචලිත මතයක්. මේ නිසා ඔබ දැන් පිවිස සිටින්නේ සාර්ථකත්වයේ මාවත වෙතටයි.

එහෙත් ඔබගේ අධ්‍යාපන ක්‍රියාවලිය අදින් අවසන් නොවන බව ඔබ මතක තබා ගත යුතුය. ඉගෙන ගැනීම ජීවිත කාලය පුරා පවතින ක්‍රියාවලියකි. ඔබේ වෘත්තීය ජීවිතය තුළ ඔබේ ව්‍යාපාරයේ දී සහ ඔබේ නිවෙස තුළ දී ඔබ දිගටම අධ්‍යාපනික අත්දැකීම්වලට මුහුණ දෙනු ඇත. අද උපාධිය ලබන පුද්ගලයා හෙට ඉගෙන ගැනීම නතර කළහොත් අනිද්දා වනවිට ඔහු නූගතකු බවට පත්ව කෙළවර වන බවට ප්‍රසිද්ධ කියමනක් ඇත. එසේම තමා තුළ ස්වයං උද්යෝගය ඇති කරගැනීමට අසමත් වන තැනැත්තේ කොතරම් දක්ෂ වුවත් අවසන් විග්‍රහයේ දී දුර්වලයකු බවට පත්වන බව මතක තබා ගැනීම වැදගත්. දුෂ්කරතාවලින් තොරව සාර්ථකත්වය ඔබ වෙත ශීඝ්‍රයෙන් ළඟා නොවනු ඇති. එහෙත් ඔබ නිවැරදි දෙය කරන්නේ නම්, මහන්සි වී වැඩ කරන්නේ නම් සහ වඩා ඉහළ අපේක්ෂා දල්වා ගන්නේ නම් ඔබ සාමූහිකව මේ සුන්දර රටේ දියුණුව වෙනුවෙන් සැලකිය යුතු වැඩ කොටසක් ඉටු කිරීමට සමත් වන බවට මම විශ්වාසයෙන් යුතුව සඳහන් කිරීමට කැමැත්තෙමි.

ඔබේ විෂය ක්ෂේත්‍රය තුළ ඔබ ගොඩනගාගෙන සිටින ශක්තිමත් දැනුමට අමතරව බාහිර සමාජයේ සේවායෝජකයන් අපේක්ෂා කරන මෘදු කුසලතා ඔබ විසින් දියුණු කරගෙන තිබීම ඉතා වැදගත් කරුණක්. මෘදු කුසලතා යනු මොනවාද? සේවායෝජකයන් අපේක්ෂා කරන වඩාත්ම ප්‍රමුඛ කුසලතාව මම මෙසේ පෙළගැස්වීමට කැමැත්තෙමි. ලිඛිත හා වාචික සන්නිවේදන කුසලතා, විශ්ලේෂණ කුසලතා, වෘත්තිය ආචාරධර්ම, කණ්ඩායම් ලෙස වැඩ කිරීමට තිබෙන හැකියාව සහ නවෝත්පාදන

සිදුකිරීමට තිබෙන හැකියාව හා ධෛර්යය එසේම පාඨ ග්‍රන්ථවල තිබෙන කරුණු සැබෑ ලෝකයේ ප්‍රායෝගික යථාර්ථයන්ට ගැළපෙන ලෙස පරිවර්තනය කිරීමේ හැකියාව සහිත උපාධිධාරීන් කෙරෙහි වැඩි කැමැත්තක් සේවායෝජකයින් තුළ තිබේ.

ආදරණීය ශිෂ්‍යයනි, කෙතරම් සැලසුම් කළත්, කොතරම් සූදානම් වුවත් ඔබට ජීවිතයේ මුහුණ දීමට සිදුවන සෑම අවදානමකට හා ගැටලුවකටම පූර්වයෙන් සූදානමක් ඇති කරගැනීම කිසිවිටෙකත් සිදුකළ නොහැක. අප සැමවිටම අනපේක්ෂිත දේට මුහුණ දීමට සූදානම් වී සිටිය යුතුය. ඔබ අතින් වැරදි සිදුවනු ඇත. එහෙත් ඉන් අධෛර්යයට හෝ දුර්මුඛභාවයට පත් නොවිය යුතුය. තියඩෝර් රූස්වෙල්ට් වරෙක පැවැසූ පරිදි - කිසිදු වරදක් සිදුනොකරන එකම මිනිසා යනු කිසිදු වැඩක් කවදාවත් නොකරන තැනැත්තාය. එවැනි තැනැත්තකු වීමට ඔබ අපේක්ෂා නොකරන බවට මා තුළ සැකයක් නැත.

1879 දී පළමු සාර්ථක විද්‍යුත් බල්බය සොයාගැනීමට පෙර තෝමස් අල්වා එඩිසන් අසාර්ථකවීම් ගණනාවකට මුහුණ පෑවේය. එම සාර්ථක ජීවිතයේ ඉතාම තීරණාත්මක අවස්ථාවට මුහුණ පෑමට පෙර ඔහුට අත්විඳින්නට සිදුවූ ගැහැට, ඔහුට වූ වැරදි හා ඔහු දරන ලද වෙහෙස ගැන කිසිවෙක් කථා කරන්නේ නැත. සාර්ථකත්වය ලබාගැනීමට නම් අසාර්ථකවීම්වල තිත්ත රසය දිව ගෑමට ඕනෑම කෙනෙක් සූදානමින් සිටිය යුතු බව ඔහු දැන සිටියේය.

එළැඹෙන මිනිත්තු දහයක කාලය තුළදී රටේ විද්‍යා හා තාක්ෂණ තත්ත්වය පිළිබඳ සාරාංශගත පැහැදිලි කිරීමක් කිරීමටත් ජීවන ඉනිමඟ දිගේ නැගීමට ඔබට ආධාර විය හැකි තොරතුරු කීපයක් සැපයීමටත් මම අපේක්ෂා කරමි.

මහින්ද චින්තන ඉදිරි දැක්ම කෘතියේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා විසින් කරනු ලබන සඳහනක් මෙහිදී උපුටා දැක්වීමට මට අවසර දෙන්න.

''එළැඹෙන වසර හය තුළ දී අපගේ ඒකශීර්ෂ ආදායම ඇමෙරිකන් ඩොලර් 4000 ඉක්මවා වර්ධනය කිරීමට මම කැපවෙමි. ඒ තුළින් අපගේ රට මැද ආදායම ලබන රටවල් අතරට එකතු කරමි.''

මේ සඳහා අපගේ වත්මන් ඒකශීර්ෂ ආදායම දෙගුණ කළ යුතුව පවතින අතර මේ අරමුණ වෙත ළඟාවීම සඳහා ඇති තීරණාත්මක සාධකයක් වනුයේ විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදනය මත වැඩි වැඩියෙන් ආයෝජනය කිරීමට අප සමත් වන්නේද යන කරුණයි. අප මෙම දේශය නවෝත්පාදන මත පදනම් වූ ආර්ථිකයක් සහිත දේශයක් බවට පත්කිරීමට අදහස් කරන්නේ නම් තාක්ෂණික ඥානය කාර්යක්ෂම ලෙස භාවිත කිරීම අත්‍යවශ්‍ය සාධකයක් වන්නේය.

අපගේ දල දේශීය නිමැවුම ඉහළ නැංවීම සඳහා රජය යෝජනා කර තිබෙන එක් මූලෝපායික යෝජනාවක් වන්නේ අගය එකතු කළ අධි තාක්ෂණික අපනයනවල දැනට තිබෙන සියයට 1.5 ක් වූ ප්‍රමාණය සියයට 10 දක්වා ඉහළ නැංවීම සහ ඉදිරි වසර පහ තුළ තෝරාගත් නිෂ්පාදනවලට අදාළව සිදුකෙරෙන ආනයන ආදේශනයන්හි ප්‍රමාණය ඉහළ දැමීමයි.

ඇඟලුම්, අගය එකතු කළ තේ හා රබර් නිෂ්පාදන, ස්වර්ණාභරණ, යන්ත්‍ර සූත්‍ර සෙරමික්ස්, විද්‍යුත් භාණ්ඩ සහ වෙනත් නිෂ්පාදිත භාණ්ඩ අධිතාක්ෂණික සංවර්ධනය සඳහා ඉලක්කගත භාණ්ඩ ලෙස

හඳුනාගෙන තිබෙන අතර ඉදිරි වසර 3 තුළ දී මේවායේ අපනයන සියයට 24 කින් වැඩි කිරීමට අපේක්ෂා කරනු ලැබේ. මේ තත්ත්වය විසින් රජයේ පර්යේෂණ ආයතන තුළ සේවය කිරීම සඳහා උසස් ගුණාත්මකභාවයකින් යුතු විද්‍යාඥයන්, ඉංජිනේරුවන් සඳහා විශාල ඉල්ලුමක් ජනිත කරනු ඇත.

ආනයන ආදේශන සම්බන්ධයෙන් කතා කරන කල්හි තාක්ෂණික මැදිහත්වීම් සඳහා සුදුසු යැයි සලකන ක්ෂේත්‍ර කීපයක් තිබේ. ඉන් කීපයක් පිළිබඳ සාකච්ඡා කිරීමට මට අවසර දෙන්න.

අපගේ දිවයින මෙන් 27 ගුණයක් විශාල අපගේ සාගර කලාපය අප රට සතු ඉතාම වැදගත් හා වටිනා ආර්ථික සම්පතකි. එතුළ ගැබ්ව තිබෙන ඛණිජ, ගෑස් හා තෙල් නිධි සැලැකූ විට මේ වැදගත්කම හඳුනාගත හැක. අපගේ සාගර සම්පත්වල වටිනාකම පිළිබඳ පූර්ණ අධ්‍යයනයක් හා තක්සේරුවක් කිරීම සහ මේ සම්පත් තිරසාර ලෙස ප්‍රයෝජනයට ගැනීම මේ නිසා වැදගත් වන්නේය. මේ තුළින් අද අප ආනයනය කරන බොහෝ ඛනිජ ද්‍රව්‍ය සඳහා ප්‍රමාණවත් ආදේශන නිපදවා ගැනීමට අවස්ථාව ලැබේ.

අප මුහුදින් වට වී සිටිය ද ටින් මාලු හා කරවල ආනයනය කිරීම අප දිගටම සිදුකරමින් සිටින අතර වාර්ෂිකව මේ සඳහා ඇමෙරිකන් ඩොලර් මිලියන 150 ට අධික ප්‍රමාණයක් අපි වැය කරමු. මේ නිසා සාගර සහ මිරිදිය මත්ස්‍ය කර්මාන්තය නැංවීම විශේෂයෙන් ටින් මාලු හා කරවන නිමැවුම කෙරෙහි අවධානය යොමුකිරීම රජයේ ප්‍රධාන ප්‍රමුඛතාවක් විය යුතුය.

කිරි හා පශු සම්පත් යනු රට තුළ ශීඝ්‍රයෙන් දියුණු කළ හැකි තවත් වැදගත් කර්මාන්ත අංශයකි. කිරි නිෂ්පාදන සම්බන්ධයෙන් තිබෙන මූලික ගැටලුවකි අඩු ඵලදායිතාව. එක් ගවයෙකුගෙන් දෛනිකව කිරි ලීටර් හයක් පමණ අප නිපදවන විට මැද පෙරදිග කාන්තාර රාජ්‍යයක් වන ඊශ්‍රායලය ලීටර 22 ක් නිපදවයි. කිරි නිෂ්පාදනයේ දී එරට දක්වන මෙම සාර්ථකත්වයේ රහස විද්‍යාව හා තාක්ෂණයයි. පර්යේෂණ හා සංවර්ධන සඳහා කරන ආයෝජන තුළින් කිරි නිෂ්පාදන ඵලදායිතාව නැංවිය හැකි අතර අමෙරිකන් ඩොලර් මිලියන 350 ක් පමණ වටිනා විදේශ විනිමය එතුළින් පිටට ගලා යාම නතර කරගත හැකි අතර අපගේ ග්‍රාමීය ව්‍යවසායකයන්ට නව ආදායම් මූලාශ්‍රය ද බිහිකරගැනීමට එය රුකුලක් වනු ඇත.

1980 ගණන්වලදී ලංකාව රටේ සීනි අවශ්‍යතාවලින් සියයට තිහක් නිපදවිය. එහෙත් අද ඒ ප්‍රමාණයට සියයට 6 දක්වා පහත වැටී අර වාර්ෂික සීනි ආනයන වියදම අමෙරිකානු ඩොලර් මිලියන 450 ඉක්මවයි. විද්‍යා හා තාක්ෂණික ක්‍රම හරහා ප්‍රතිලාභ ලද හැකි තවත් අංශයක් ලෙස සීනි කර්මාන්තය හඳුනාගත හැකි අතර එමගින් ආනයන මත අප රඳා පවතින ප්‍රමාණය සැලකිය යුතු මට්ටමකින් අඩු කරගැනීමට හැකිවනු ඇත.

අප රටේ ඉන්ධන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා පසුගිය වසරේ අප අමෙරිකානු ඩොලර් මිලියන 6000 ක් වියදම් කල අතර මෙය සමස්ත අපනයන වටිනාකමින් තුනෙන් එකක් වන්නේය. මේ ආනයන වියදම අඩු කරගැන්මට නම් සූර්ය ශක්තිය ජීව ඉන්ධන බඳු පුනර්ජනනීය ඉන්ධන ප්‍රභව මත සිදුකෙරෙන පර්යේෂණ සඳහා වැඩි වැඩියෙන් ආයෝජනය කළ යුතුව පවතී.

ස්වාභාවික වනාන්තර, ගංගා, වැව්, වැසි වනාන්තර, සතුන්, වන ජීවීන් යනාදියේ සිදුවන විනාශය අද ලෝකයට විශාල හානියක් ගෙන දෙමින් තිබේ. අපගේ සංවර්ධනයේ එක් තේමාවක් ලෙස හරිත

පරිසරයක් පැවැතීම රජය හඳුනාගෙන තිබෙන අතර වනගහනය සියයට 35 දක්වා වැඩි කිරීමට එනම් හෙක්ටයාර 250 000 දක්වා වනගහනය ව්‍යාප්ත කිරීමට අදහස් කොට තිබේ. මේ යටතේ වැසි වනාන්තර, වැව් හා වනජීවීන් සුරක්ෂිත කිරීම අරමුණු කෙරේ.

මා සඳහන් කළ මේ සියලු කටයුතු සඳහා එනම් අපගේ අපනයන වැඩිකිරීම වේවා, ආනයන ආදේශන දියුණු කිරීම වේවා, පරිසරය ආරක්ෂා කිරීම වේවා, මේ අරමුණු ඉටු වේවා, ඒ සඳහා අවශ්‍ය වූ ජාතික විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදන සැලැස්ම සාර්ථක කරගැනීමට හෝ වේවා අපට විද්‍යා හා ඉංජිනේරු අංශවල දක්ෂ උපාධිධාරීන් අවශ්‍ය කෙරේ. ඉදිරි වසරවලදී විශ්වවිද්‍යාල තුළ, රජයේ පර්යේෂණ ආයතන තුළ හා පුද්ගලික අංශයේ එවැනි අයට තිබෙන ඉල්ලුම විශාල වශයෙන් ඉහළ යනු ඇත.

එහෙත් වර්තමානයේ එවැනි ගුණාත්මකබවින් අනූන ඉංජිනේරු හා විද්‍යා උපාධිධාරීන්ගේ හිඟ යක් පවතී. 31 ක් වූ රාජ්‍ය පර්යේෂණ ආයතනවල, 16 ක් වූ විශ්වවිද්‍යාලවල හා වෙනත් පුද්ගලික අංශයේ ආයතනවල සේවය කරන පර්යේෂකයින් සිටින්නේ 4000ට ආසන්න ප්‍රමාණයකි. එනම් මිලියනයක් වූ ජනගහනයකට අනුපාතිකව අපට ඇත්තේ පර්යේෂකයින් 237 කි. ලෝකයේ මේ දර්ශකයේ සාමාන්‍ය අගය මිලියනයකට 894 වන අතර අපගේ කලාපයේ රටවල් මේ දර්ශකය අතින් අපට වඩා ඉදිරියෙන් සිටී. රජය මේ අඩුව වටහා ගෙන 2020 වන විට මේ සංඛ්‍යාව 20 000 දක්වා ඉහළ නැංවීමට සැලසුම් කොට තිබේ. විශ්වවිද්‍යාල, විශේෂයෙන් විද්‍යා හා ඉංජිනේරු පීඨ, මේ ඉහළ ඉල්ලීම සැපයීම සඳහා ස්වකීය භූමිකාව ඉදිරි වසර කිහිපය තුළ දී ඉටු කිරීමට සූදානම් විය යුතුය.

21 වන සියවසේ ශ්‍රේෂ්ඨ නවෝත්පාදකයෙක් වන ස්ටීව් ජොබ්ස්ගේ චරිතාපදානයේ කථාවක් ඔබහට පැවසීමට මට අවසර දෙන්න.

ස්ටීව් ජොබ්ස් එක්සත් ජනපදයේ කීර්තිමත් විද්‍යාතනයක් වන රීඩ් විද්‍යාලයට ඇතුළු වූ අතර මාස හයක් තුළ ඔහුට එම විද්‍යාලය හැර යාමට සිදුවිය. තවත් මාස 18 ක් ඔහු විද්‍යාලය හැර ගිය අයකු ලෙස කිසිවක් සිදුනොකොට සිටියේය. පාසල් අධ්‍යාපනයේ වැදගත්කමක් ඔහු දුටුවේ නැත. මන්ද ඒ අවස්ථාවේ තම ජීවිතය හැඩ ගස්වා ගත යුතු ආකාරය සහ ඊට පාසල උදවුවක් විය හැකි ආකාරය ගැන ඒ අවස්ථාවේ ඔහුට අවබෝධයක් තිබුණේ නැත. එහෙත් ආපසු හැරී බලන විට ජොබ්ස් කියන්නේ ඒ තීරණය තම ජීවිතයේ වඩාත්ම හොඳම තීරණයක් බවයි. ඔහු පාසල හැර ගිය පළමු මොහොතේ දීම ඔහු තුළ කිසිදු උනන්දුවක් ජනිත නොකළ පාඩම් ඉගෙන ගැනීම නතර කොට තමා කැමති දෙය සිදුකිරීමට තමා උනන්දු දේ ගැන අවධානය යොමුකිරීමට ඔහුට අවස්ථාව ලැබුණි. රීඩ් විද්‍යාලය ඒ යුගයේ ඇතැම් විට රටේම තිබුණු පාසල් අතරින් ඉතාම හොඳම විචිත්‍ර අක්ෂර සහිත දැන්වීම් තිබූ පාසල වූයේය. විද්‍යාලයේ සෑම පෝස්ටරයක්ම, සෑම පොත් රාක්කයක්ම විචිත්‍ර අක්ෂර සහිත දැන්වීම්වලින් යුක්ත ඒවා විය. විචිත්‍ර අක්ෂර කලාව පිළිබඳ පාඨමාලාවක් හැදෑරීමට ස්ටීව් ජොබ්ස් උනන්දු විය. විවිධ අක්ෂර සංයෝග අතර තිබිය යුතු හිඩැස්වල ප්‍රමාණය යනාදි අක්ෂර කලාවට අදාළ බොහෝ දෑ හෙතෙම ඉගෙන ගත්තේය. මේවා ඓතිහාසික වූත්, සුන්දරවූත්, විද්‍යාවට කිසිදිනක ග්‍රහණය කරගත නොහැකි තරම් කලාත්මක වශයෙන් සියුම් වූත් දේවල් වූ අතර එය ඔහු තුළ මහත් උනන්දුවක් දැල්වීය.

මේ කාලයේ මේ දැනුම තම ජීවිතයේ ප්‍රායෝගික භාවිතයට ප්‍රයෝජවත් වේ යන අදහස ඔහු තුළ තිබුනේ වත් නැත. ඔහු මේවා ඉගෙන ගැනීම තුළින් මහත් වින්දනයක් ලැබූ අතර කෙසේ වුවද වසර දහයකට පසු ඔහුගේ කණ්ඩායම පළමු මැකින්ටොශ් පරිගණකය නිර්මාණය කරන අවස්ථාවේ එම

දැනුම ඔහුගේ උපකාරයට පිවිසියේය. ඔවුහු මැක් පරිගණකය නිර්මාණය කළහ. විචිත්‍ර මුද්‍රණාක්ෂර සහිත පළමු පරිගණකය වූයේ එයයි. ඔහු කවදාවත් විද්‍යාලයෙන් ඉවත් නොවුනා නම්, ඔහු කවදාවත් විචිත්‍ර අක්ෂර කලාව පිළිබඳ පාඨමාලාව හැදෑරීමට යොමු නොවුනා නම්, මැක් පරිගණකය කිසිදිනෙක සමානුපාතික හිස්තැන් සහිතව නිර්මාණය කරන ලද අක්ෂරවලින් හා බහුවිධ අක්ෂර මුහුණකින් යුතු නිර්මාණයක් ලෙස එළි නොදකිනු ඇත. වින්ඩෝස් මැක් පරිගණකය අනුගමනය කළ අතර මේ නිසා ස්ටීව් ජොබ්ස්ගේ ඉරණම ලෝකයේ පුද්ගලික පරිගණකවල ස්වභාවය හැඩගැසීමෙහිලා විශාල වශයෙන් තීරණාත්මක වූ බව කිව හැක. විද්‍යාලයේ සිටිය දී ඉදිරියේ දී සිදුවන දේ ගැන නිශ්චිත පැහැදිලි අදහසක් ඔහුට තිබුණේ නැත. එහෙත් ආපසු හැරී බලන විට ඔහු පැමිණි ගමන් මාර්ගය පැහැදිලිවම දැකගන්නට ලැබේ.

අක්‍රමවත්ව විසිරී ඇති තිත් යම් දිනෙක අනාගතයේ දී එකතු වී නිශ්චිත රූපයක් මවනු ඇත. මේ ස්ටීව් ජොබ්ස්ගේ උපදෙසයි. ඔබේ විශ්වාසය, දෛවය, ජීවිතය, කර්මය - මේ කවර හෝ දෙයක් ගැන ඔබට ඇවැසි ඕනෑම දෙයක් ගැන ඔබ විශ්වාසය තැබිය යුතුය. මේ ප්‍රවේශය කිසිදිනෙක අසාර්ථක නොවූ බවත් එය සිය ජීවිතයේ සියලු වෙනස්කම් පසුපස තිබෙන රහස ලෙස ක්‍රියාකළ බවත් ජොබ්ස් කියයි.

තමා බිහිකළ ඇපල් සමාගමෙන් ස්ටීව්ව ඉවත් කළ අවස්ථාව ඔහුගේ ජීවිතයේ තවත් සන්ධිස්ථානයකි. වයස අවුරුදු විස්සේදී ඇපල් සමාගම ඔහු ආරම්භ කළේ සිය කාමර සගයා වූ වොස්නියැක් සමග එකතුව සිය දෙමවුපියන්ගේ ගරාජයේ දීය. ඔවුන් වෙහෙස නොබලා වැඩ කළ අතර වසර 10 ක් තුළ ගරාජයක් තුළ සිටි දෙදෙනෙකුගේ සිට සේවකයන් 4000 ක් සිටින අමෙරිකානු ඩොලර් බිලියන දෙකක් වටිනා වත්කම් සහිත සමාගමක් බවට එය පත්කිරීමට ඔවුහු සමත් වූහ. සමාගම වර්ධනය වන විට ස්ටීව් එහි කටයුතු මෙහෙයවීමට තරම් දක්ෂ යැයි සැලැකූ අයෙක් මෙහෙයුම් කටයුතු සඳහා සම්බන්ධ කරගත් අතර මුල් වසර කීපයේදී සියල්ල ඉතා හොඳින් සිදුවිය. එහෙත් පසුව ඔවුන් දෙදෙනා අතර ගැටුම් ඇති වූයේය. අධ්‍යක්ෂ මණ්ඩලය ස්ටීව්ගේ පාර්ශවය නොව අනෙක් පුද්ගලයාගේ පාර්ශවය ගත්තේය. මේ නිසා ඇපල් සමාගම සිය අනගිතම නිමැවුමක් වන මැකින්ටොශ් පරිගණකය නිෂ්පාදනය කොට වසරක් යාමට පෙර වයස අවුරුදු 30 දී ස්ටීව්ව ආයතනයෙන් ඉවත් කරන ලදි. ඔහුගේ මුලු වැඩිහිටි ජීවිතය පුරා ඔහු අවධානය යොමු කළ දෙය ඔහුට අහිමි වූ අතර පැහැදිලිවම මෙය ඛේදජනක අත්දැකීමකි.

කළ යුත්තේ කුමක්දැයි ඔහු දැන සිටියේ නැත. සිලිකොන් නිම්නයෙන් පිටව යාමට පවා ඔහු සිතූ අතර අසාර්ථකත්වය සම්බන්ධයෙන් ප්‍රසිද්ධ උදාහරණයක් ලෙස ඔහුව සැලකෙන්නට විය. එහෙත් යම් දෙයක් ක්‍රමානුකූලව ඔහුට අවබෝධ වෙමින් තිබුණි. ඔහු තමා කළ දෙයට තවමත් ආදරය කළේය. මේ නිසා අලුතින් නැවත පටන්ගැන්මට ඔහු තීන්දු කළේය.

ඒ අවස්ථාවේදී ඔහුට නොවැටහුණත් ඇපල් සමාගමින් ඉවත් කිරීම ස්ටීව් ජොබ්ස්ට සිදු වූ හොඳම දෙයයි. සාර්ථකත්වය විසින් ගෙන ආ බර ආධුනිකයකු වීමේ සැහැල්ලුව විසින් ප්‍රතිස්ථාපනය කරන ලදී. ව්‍යාපාරයේ බරසාර වගකීම්වලින් ඔහු නිදහස් විය. ඔහු ඉක්බිති පිවිසියේ ඔහුගේ ජීවිතයේ වඩාත්ම නිර්මාණශීලී අවධිය වෙතය.

පික්සාර් සහ නෙක්ස්ට් නමින් සමාගම් දෙකක් ඔහු ආරම්භ කළේය. පික්සාර් සමාගම ලෝකයේ පළමු පරිගණක සජීවිකරණ චිත්‍රපටය නිපද වූ අතර - ටෝයි ස්ටෝර් - එය වර්තමානයේ ලොව වඩාත්ම සාර්ථක සජීවීකරණ මැදිරය ලෙස සැලකේ. සිත්ගන්නා සුලු සිදුවීම් සමුදායක ප්‍රතිඵලයක්

ලෙස ඇපල් සමාගම නෙක්ස්ට් සමාගම මිලට ගත් අතර ස්ටීව් නැවත ඇපල් වෙත ගියේය. නෙක්ස්ට් හි සිට ස්ටීව් කළ නිර්මාණ ඇපල් සමාගමේ පුනර්ජීවනයේ හදවත බවට පත්විය. අයිපොඩ්, අයිෆෝන් සහ ඇයිපෑඩ් යන සියල්ල ස්ටීව්ගේ විශිෂ්ට නිර්මාණයන්ය. මේ උපාංග අප සන්නිවේදනය කරන ආකාරය සිත්ගන්නා සුලු ලෙස වෙනස් කිරීමට සමත් විය. වසර අටක් තුළ ඔහු ඇපල් සමාගම බංකොලොත්භාවයේ අද්දර සිට කොටස් වෙළඳපොල යෝධයකු බවට පරිවර්තනය කළේය. 2010 අගෝස්තුවේ දී එක්සන් මොබිල් සමාගම පරාජය කරමින් ඇපල් ආයතනය විශාලතම වත්කම සහිත ආයතනය බවට පත්වූයේය.

ඇතැම් විට ජීවිතය ඔබගේ හිසට ගඩොල් කැටයකින් පහර දෙන අවස්ථා තිබේ. ස්ටීව් ජොබ්ස් මුහුණ දුන්නේ එවැනි අත්දැකීමකටය. එහෙත් ඔහු විශ්වාසය අහිමි කර ගත්තේ නැත. ඔහුගේ සාර්ථකත්වයේ රහස වූයේ තමා කැමති දේ කිරීම ඔහු විසින් අත් නොහැරීමයි. ඔබ ආදරය කරන දේ කුමක්දැයි ඔබ සොයාගත යුතු බව ඔහු අපට දෙන උපදෙසයි. ඔබ සැබැවින්ම ආදරය කරන දේ කවරේදැයි හඳුනාගෙන ඒ අනුව ඔබ වැඩ කරන්නට පටන් ගන්නේ නම් එය ඔබගේ ජීවිතයේ විශාල අවකාශයක් පුරවනු ඇති අතර ඔබ ශ්‍රේෂ්ඨ දෙයක් යැයි සිතන දෙය අඛණ්ඩව සිදුකිරීම පමණි ඔබව සැබැවින්ම තෘප්තිමත් පුද්ගලයකු බවට පත්කරනු ඇත්තේ. ශ්‍රේෂ්ඨ වැඩ කිරීමට තිබෙන එකම ආකාරය ඔබ ආදරය කරන දෙය කිරීමයි.

නෝනාවරුනි මහත්වරුනි, විසිරී ඇති තිත් එකට යා කිරීම - ඔබ ආදරය කරන දේ කිරීම හා ඔබ කරන දේට ආදරය කිරීම මේ තමයි සැබැවින්ම අපූර්ව වූ ස්ටීව් ජොබ්ස්ගේ ජීවන කථාවෙන් අපට උගත හැකි පාඩම. විචිත්‍ර අක්ෂර කලාව කෙරෙහි ඔහු තුළ පැවැති ඇල්ම වසර දහයකට පසු මැකින්ටොශ් අක්ෂර නිර්මාණය කිරීමෙහිලා ඔහුට උපකාරි වූ අතර මෙය සියලු පරිගණකවල අනන්‍ය ලක්ෂණයක් බවට පත්විය. එසේම ඇපල් සමාගම ඔහු ඉවත් කොට ප්‍රසිද්ධියේ ඔහුව අපහසුතාවට ලක් කළ පසු, ඔහු දිගටම තමා කැමති දේ සිදුකළේය. එනම් පරිගණක අංශයේම වැඩ කළේය. පසුව ඔහු නැවත ඇපල් සමාගම වෙතම ප්‍රධාන විධායක නිලධාරියා ලෙස සම්බන්ධ වූ අතර එය අද ලෝකයේ වඩාත්ම අගය කිරීමට ලක්වන සමාගම වන්නේය.

අතිගරු ජනාධිපතිතුමා 2013 අය වැය වෙනුවෙන් කළ කථාවෙන් උපුටා දැක්වීමක් කිරීමට මට අවසර දෙන්න.

පවුල ආගම හා සංස්කෘතිය ලංකාවේ වටිනාකම් පද්ධතිය සමඟ දැඩිව බැඳී ඇත. ගෘහස්ථ හා ප්‍රජා ජීවිතයේ සියලු අංග බලගැන්වීමට මහින්ද චින්තන දැක්ම අරමුණු කරන අතර පවුල් වටිනාකම් ප්‍රවර්ධනය, අන්තරාදායක මත්ද්‍රව්‍ය තුරන් කිරීම, වැඩිහිටි හා ආබාධිත අය රැකබලාගැනීම, ප්‍රාථමික අදියරයන්හිදීම රෝග වැළැක්වීම, සෞඛ්‍යමත් ජීවන රටාවක් සඳහා පෙළඹවීම ඇතිකිරීම හා වාර්ගික ආගමික සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම මේ තුළින් සිදුකරනු ඇත.

ජනාධිපති බැරැක් ඔබාමා මෝහවුස් විද්‍යාලයේ මෑතකදී කළ කථාවේ දී ද මීට සමාන අදහසක් පළ කළේය.

මා මරණ මංචකයේ සිටින යම් දිනෙක මම මා සම්මත කළ යම් නිශ්චිත පනතක් ගැන හෝ මා ප්‍රවර්ධනය කළ යම් ප්‍රතිපත්තියක් ගැන මා නොසිතන බව මම දනිමි. මා ලැබූ නොබෙල් ත්‍යාගය ගැන හෝ මා පැවැත්වූ කථා ගැන හෝ මා මරණ මංචකයේ දී සිතන්නේ නැත. මාගේ දියණිවරුන්

සමග මා කල්ගත කල හැටි, මාගේ බිරිඳ සමග අලස සන්ධ්‍යාවන්හි මා කාලය බෙදාහදාගත් හැටි ඔවුන්ට මා යුතුකම් ඉටු කළ හැටි - මම මරණ මංචකයේදී සිතනු ඇත්තේ මේවා ගැනය.

ආදරණීය සිසුනි, මේ නායකයන් දෙදෙනාගේ පණිවුඩ ඉතා පැහැදිලියි. අවසන් විග්‍රහයේ දී වඩාත්ම වැදගත් වන්නේ ඔබ ඉපයූ මුදල් ප්‍රමාණයවත්, ඔබ ඉසිලූ තනතුරේ විශාලත්වයවත්, ඔබේ ජීවිත කාලය තුළ ඔබ දිනූ ත්‍යාගවල ප්‍රමාණයවත් නොවේ. සෞඛ්‍යමත් ජීවිතයක් ගත කිරීම ඒ ජීවිතය තුළ පවුලේ වටිනාකම්වලට ප්‍රමුඛතාව දීම ආගමික හා වාර්ගික සංහිඳියාව සහ සමාජයේ ගරු කටයුතු පුද්ගලයකු බවට පත්වීම වැදගත් වන්නේ එයයි.

දලයි ලාමාගේ ප්‍රසිද්ධ ප්‍රකාශයක් ගෙන හැර දැක්වීමට මට අවසර දෙන්න. මේ ප්‍රකාශය මේ ශාලාවෙන් පිටත ලෝකයට ඔබ පිය නඟද්දී ඔබට ප්‍රයෝජනවත් වනු ඇත.

ඔබේ සිතිවිලි ගැන සැලකිලිමත් වන්න. ඒවා වචන බවට පත්වේ.
ඔබේ වචන ගැන සැලකිලිමත් වන්න. ඒවා ක්‍රියාවන් බවට පත්වේ.
ඔබේ ක්‍රියාවන් ගැන සැලකිලිමත් වන්න. ඒවා ඔබේ චරිතය හැඩගස්වයි.
ඔබේ චරිතය ගැන, සැලකිලිමත් වන්න. එය ඔබේ දෛවය හැඩගස්වනු ඇත.
ඔබේ ජීවිතය වනු ඇත්තේ ඔබේ දෛවයයි.

ස්තුතියි.

<u>*2013.07.11*</u>

# 45
# Duties and Responsibilities of a Doctor
## Dr. H. H. R. Samarasinghe

I thank Professor Mohan De Silva, Dean Faculty of Medical Sciences and the other members of the Faculty of Medical Sciences of the University of Sri Jayewardenepura for inviting me to be the chief guest for the Medical Faculty Convocation 2013 and for requesting me to deliver the convocation speech.

My association with this university and the Faculty of Medical Sciences dates back to early 1993 when the Vice Chancellor then, Professor Hettiarachchi and the Vice Chancellor who succeeded him, Dr. Dorekumbura and I took the initial steps to establish this faculty.

Today is a day of recognition of the achievement of success of you as graduates from this university which has a long and distinguished heritage and in Buddhism in particular. Therefore you should hold with great pride and distinction this degree you have obtained from this prestigious university. This is a faculty that could boast with pride for having produced nearly 2000 medical graduates of whom over 200 have postgraduate specialist degrees in a relatively short period of about two decades. This speaks volumes for the hard work and dedication of all of your faculty members whose tireless, yeoman service has produced such results. Each medical graduate with his or her healing hands has cured or comforted thousands of people in our country. What unadulterated merit they and their teachers would have accumulated over the years and in many more years to come.

I trust that all of you will remember today as a momentous occasion in your lives.

Your success has come as a result of tremendous personal sacrifice, perseverance and dedication. The alternative to all this hard work of well over four years in the most productive and enjoyable years of one’s life to become a doctor, could have been employment in the teaching profession or the banking sector or as a clerk in a government department. But how many are fortunate to have this special privilege to attempt to comfort or heal a fellow human being in distress?You are the chosen few. "Either a king or a healer".

පක්ෂ දේශපාලනය නිසා නැතිවෙමින් තිබුණු කුල භේදය අලුත් විය. ජාති භේදය විශාල ලේ වැගිරීම්වලටත් දශක තුනක් පැවැති අතිශයින්ම භයානක යුද්ධයකටත් පෙරළිනි. ජාතිභේද කෝළාහල සහ යුද්ධය පමණක් නොව මේ කාල පරිච්ඡේදයේදී 1971 සහ 1989 දී ඇති වූ ලේ වැගිරීම්වලටත් හේතුව පක්ෂ ක්‍රමයෙන් රටේ ප්‍රජාව සහ සෑම ආයතනයක්ම බෙදී තිබීම බව වරප්‍රසාද ලත් පංතියට තේරුම් නොයෑම රටේ අවාසනාවකි. සාමාන්‍ය පෙළට පමණක්වත් අධ්‍යාපනයක් නොමැති නායකයන් ජනතා පරමාධිපත්‍යය ඔවුන් අතට ගෙන පස, ජලය, වාතය, ගංගා ඇළදොළ, වෘක්ෂලතාදිය ඇතුළු සමස්ත ශ්‍රී ලාංකික භූමිතලයේ පිහිටි ජීවාධාරක පද්ධති සියල්ලම විනාශ කරමින්, නීතියේ

පරමාධිපත්‍යය දුර්වල කරමින්, ඔවුන්ගේ බලය සහ ධනය ගැන පමණක් සිතා පක්ෂ දේශපාලනය මුළු ජනතාවට ම එපා කරවන තත්ත්වයකට ගෙන ගියේය. සමස්තයක් වශයෙන් මුළු ජනතාවගේම සාර්ධර්ම පද්ධතිය විනාශ විය.

2015 වර්ෂය ලබන විට පක්ෂ දේශපාලනය නිසා ජාතියේ සාරධර්ම ඇතුළු ජීවාධාරක පද්ධතීන් විනාශවීමේ ඊනියා සංවර්ධන සහ දේශපාලන ක්‍රමය ප්‍රතික්ෂේප කිරීමට තරම් ජන විඥ්ඥාණය මුහුකුරා ගොස් තිබුණේය. අපේ ජනතාවගේ දේශපාලන විඥ්ඥාණය ගැන සලකා බලන විට පසුගිය ජනවාරි 8 වැනි දා සමස්තයක් වශයෙන් ශ්‍රී ලාංකික ජනතාව ගත් තීරණය අපේ ජන විඥ්ඥාණයේ ඓතිහාසික ක්‍රියාත්මක වීමක් හැටියට මම සලකමි. ජනමාධ්‍යවලින්, කට කතාවලින් විශාල ධනස්කන්ධ වියදම් කරමින් රාජ්‍ය සහ රාජ්‍ය නොවන කණ්ඩායම් මාර්ගයෙන් ප්‍රචණ්ඩත්වය යොදා ගනිමින් අල්ලස්, දූෂණ, වංචා ක්‍රියාමාර්ග උපයෝගි කර ගනිමින් මහජනතාව මුලා කිරීමේ සීමාවක් තිබෙන බව එම අවස්ථාවේදී හැමටම අවබෝධ විය. මනුෂ්‍ය ප්‍රජාවක් තුළ තිබෙන සාමූහික විඥ්ඥාණයේ ශක්තිය අන් සියලුම ජාති, පක්ෂ, ආගමික මතවාදවලට වඩා බලවත්ව ක්‍රියාත්මක වන ශක්තියක් බවත්, එය කතා කරන හෝ ලියන වචනවලට ඔබ්බෙන් තිබෙන නොපෙනෙන ශක්තියක් බවත් එදා පැවැති ජනාධිපතිවරණයෙන් ස්ඵුට විය. මෙම ඡන්ද ප්‍රතිඵලය මා දකින්නේ පුද්ගලයෙකුගේ ජයක් හෝ පරාජයක් හෝ ලෙස නොව ජන විඥ්ඥාණයේ අවදිවීමක් ලෙසයි.

ජන විඥ්ඥාණය ස්වභාවයෙන්ම අනුමත කරන්නේ ප්‍රජාතන්ත්‍රවාදයයි. සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය සහ ව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදය අතර වෙනස් අවබෝධ කර ගැනීමේ හැකියාවක් ජන විඥ්ඥාණයට තිබේ. ව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදි බල කණ්ඩායම්වලට ඒකාධිපතිත්වය කරා යාමට හැකි දුරක් තිබේ. ජන විඥ්ඥාණයේ තීරණාත්මක ස්කන්ධයක් ගොඩනැගුණු විට ඒකාධිපති ප්‍රවණතාවන් විනාශ වී ප්‍රජාතන්ත්‍රවාදී මඟක් නැවත විවෘත කරයි. අද අප ඉදිරියේ විවෘත වී ඇත්තේ ඒ මාර්ගයයි. මෙය ආරක්ෂා කර ගැනීම ප්‍රජාතන්ත්‍රවාදය අගයන සෑම පුරවැසියෙකුගේම වගකීමයි. නව සාමාජික, ආර්ථික, දේශපාලන දැක්මක් ඇති කර ගැනිමට මේ උචිතම කාල පරිච්ඡේදයකි.

ඔබ ඇතුළුවන සැබෑ ලෝකය දෙස බලන්න. අඩු වශයෙන් පනත සඳහන් ගෝලීය ප්‍රශ්නවලට ඔබට කළ හැක්කේ කුමක්දැයි සිතන්න. නම් වශයෙන් සඳහන් කළහොත් ගෝලීය කාලගුණ විපර්යාස, පාරිසරික දූෂණය, වන විනාශය සහ කාන්තාරකරණය, දුප්පත්කම, ත්‍රස්තවාදය සහ යුද්ධය, බලශක්ති අර්බුදය සහ ආධ්‍යාත්මික පරිහානිය මෙයින් සමහරකි.

මේ ප්‍රශ්නයට විසඳුම් සෙවීමේ වගකීම් විශාල වශයෙන් පැටවෙන්නේ කළමනාකරණ සහ වාණිජ අංශයේ සහ රාජ්‍ය පරිපාලන අංශයේ සේවක පිරිස් මතයි. අද උපාධි ලබන ඔබගෙන් වැඩි දෙනෙකු මේ අංශ දෙකට යන බවයි මා විශ්වාස කරන්නේ. ඒකාධිපතිත්වය කරා යන දේශපාලනයේ නිවුන් සොහොයුරන් වන්නේ රාජ්‍ය පරිපාලනය සහ බහුජාතික ව්‍යාපාර අංශයේ ප්‍රධානීන්ය. අද උපාධි ලබන ඔබගෙන් බහුතරය සේවය සඳහා යන්නේ මෙම අංශ දෙකට බව මම නැවතත් අවධාරණය කරමි. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදී සමාජ ක්‍රමයක ආරක්ෂකයන් වශයෙන් සමස්ත ජනතාවටම යුක්තිය, සාධාරණත්වය සහ නීතියේ පරමාධිපත්‍යය සැලසෙන මානවවාදීන් හැටියටත් ඔබ අනුගමනය කළයුතු යැයි මා විශ්වාස කරන සාරධර්ම පද්ධතියක් යෝජනා කරමින් මගේ මෙම දේශනය හමාර කරමි.

පළමුව, ඔබත් අපත් හැදුනු වැඩුනු සංස්කෘතියේ උරුමක්කාරයන් ලෙස ඔබ මෙම විශ්වවිද්‍යාලයේදී ලත් විද්‍යා තාක්ෂණික දැනීම, ඔබගේ පෞරුෂය හෙවත් නාමරූප ස්වභාවයේ ඇතුළාන්තය දෙස

බැලීමෙන් ඇතිවන ප්‍රඥාව සමඟ සම්බන්ධ කර ඔබේ සේවා ජනතාව සඳහා මෙහෙයවීමට තරම් ඔබ බුද්ධිමත් විය යුතුය.

දෙවැනිව, ඔබගේ ජීවන රටාව සහ සේවා වගකීම් පවත්වා ගෙන යෑමේදී ඔබ ක්‍රියාත්මක වන්නේ ඒකියාවක කොටු වූ පරිසරයක නොව ගෝලීය වශයෙන් එකිනෙකාට සම්බන්ධ වූ අන්තර් ජාලීය පරිසරයක බව අමතක නොකළ යුතුය.

තෙවැනිව, පරිසරය, ජීවාධාරක පද්ධතීන් විනාශ කරන විෂ ආහාර නිපදවන, මනුෂ්‍යයා ඇතුළු ජීව ප්‍රාණීන් ඝාතනය කරන, අපේ සදාචාර පද්ධතිය විනාශ කරන කැසිනෝ, සූදු, මත්වතුර, මත්ද්‍රව්‍ය ආදියට සම්බන්ධ කිසිදු ඒකියාවක නොයෙදීමට තරම් ඔබට ආත්ම ශක්තියක් තිබිය යුතුය.

සිව්වැනිව, අන්ධානුකරණයෙන් පාරිභෝගික ජීවන රටාවකට හුරුවීමට පුරුදු නොවී සරල චාම් ජීවන රටාවකින් තමාගේත් තම පවුලේත් ප්‍රීතිමත් සාර්ථකත්වයක් ලබා ගත හැකි බව විශ්වාස කළ යුතුය.

පස්වැනිව, අද අප ජීවත් වන සමාජයේ පවතින දේශපාලන, ආර්ථික මතවාද සහ ව්‍යුහයන් කිසිසේත් අප මුහුණ දෙන දරිද්‍රතාව, විරැකියාව, පවුල් සහ ආයතනීය කණ්ඩායම්වල සිට ජාතික වශයෙන් අද පවත්නා බෙදීම සහ අසමගිකම දුරලීමට අසමත් වන බව තේරුම් ගෙන තමා ලැබූ සෛද්ධාන්තික දැනීම සහ ප්‍රායෝගික අත්දැකීම් ශ්‍රී ලංකාවේ නව ආර්ථික, දේශපාලන දර්ශනයක්, ක්‍රියාමාර්ග සහ ව්‍යුහයන් ගොඩනැගීමට දායකවීමට ඔබේ නිර්මාණ කෞශල්‍යයන් යොදා ගැනීම ද කළයුතු බව මගේ අදහසයි.

මෙම විශ්ව විශ්වවිද්‍යාලයේම ඉගෙන ගත් කෙනෙකු හැටියටත් ඔබට වඩා වැඩිමහල් කෙනෙකු හැටියටත් දශක හයකට කිට්ටු කාලයක් මෙතෙක් මා සඳහන් කළ දර්ශනය, ප්‍රතිපත්තීන් හා ක්‍රියාදායමයන් ස්වශක්තිය, සාමූහිකත්වය, විද්‍යාත්මක සංවිධාන ක්‍රමයන් ආදිය තුළින් බලකාමී පක්ෂ දේශපාලනයට හවුල් නොවී ලක්ෂ සංඛ්‍යාත දේශීය සහ ලෝක ජනතාවට සේවයක් කිරීමට හවුල් වූ කෙනෙක් හැටියටත් මා ඉහත සඳහන් කළ උපදෙස් ගැන ගැඹුරට කල්පනා කරන්න. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කීර්ති නාමය තවදුරටත් ලොව පුරා පැතිරවීමට ඔබ සමත් වේ යැයි ආශිංසනය කරමින් මට මෙම උපාධි ප්‍රදානෝත්සව දේශනය කිරීමට ඇරයුම් කිරීම පිළිබඳව පීඨාධිපතිතුමන් ඇතුළු සියලු දෙනාටම මගේ කෘතඥතාව පළ කරමින් මම නිහඬ වෙමි.

2015.07.13

# 50

# තිරසාර සංවර්ධනය සඳහා බුද්ධිමය ප්‍රජාව ශක්තිමත් කිරීම

## මහාචාර්ය එස්. බී. හෙට්ටිආරච්චි

මෙම උපාධි ප්‍රදානෝත්සව දේශනය පැවැත්වීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අපට ආරාධනා කිරීම අප ලද විශේෂ ගෞරවයක් සේ සලකන්නේ සාම්ප්‍රදායික ආචාර ධර්මයක් ඉටු කිරීම සඳහා නොව මෙය ප්‍රථමයෙන් මෙම සරසවියෙන් ප්‍රථම හා ද්විතීය උපාධි ලැබ දෙවනුව මෙම සරසවියෙන් ම ලත් ප්‍රතිපාදන මත ලන්ඩන් සරසවියෙන් දර්ශනසූරී උපාධිය ලබා තදනන්තරව ආචාර්යවරයෙකු, වෘත්තීය සංගම් නායකයකු, අංශප්‍රධානවරයකු, පීඨාධිපතිවරයකු හා උපකුලපතිවරයකු වශයෙන් දිගු කලක සේවය කළ ඔබේ ම සාමාජිකයකුට පුදන ලද සම්මානයක් වන නිසා ය.

දයාබර නවක විද්‍යාර්ථිනි,

මා මෙම සරසවියේ ආදි විද්‍යාර්ථීන් අතුරින් බිහි වූ පළමු වන පීඨාධිපතිවරයා ද උපකුලපතිවරයා හා රාජ්‍යතාන්ත්‍රික නායකයා ද වීම සරසවියේ නව කඩඉමක් ඇති කිරීමට සමත් වූ බව පවසන්නේ නිරහංකාරව ය. ඒ නව කඩඉම නම් ඊනියා පිරිවෙන් සරසවිවල උපාධිධාරීන්ගේ හැකියාවන් අඩු තක්සේරුවට ලක් කළ යුගය අවසන් කොට තමන්ගේ ආයතනය පාලනය කරන්නට පමණක් නොව විදේශයන්හි තම රට නියෝජනය කරන්නට ද සමත් විද්‍යෝදය විද්‍යාර්ථීන් සිටින බව පෙන්වන යුගයේ ආරම්භය යි. එයින් සුදුසුකමට අගයක් දෙනු ලැබිණ. එදා ඇරඹි විදුදය පාලනයට විද්‍යෝදය ආදි විද්‍යාර්ථියකු ම පත් කිරීම අද සම්ප්‍රදායක් බවට පත්ව තිබීම ම ඊට සාක්ෂ්‍ය සපයයි. දේවානම්පියතිස්ස රජතුමා හා මිහිඳු හිමියන් අතර ඇති වූ සුප්‍රකට දෙබසක් මෙහි දී මගේ සිහියට නැගේ. "ස්වාමීනි, දැන් බුදුසමය ලක්දිව මුල් බැස ගෙන තිබේ ද?" "නැත මහරජ, එය මුල් බැස ගන්නේ මෙම දිවයිනේ දෙමාපියන්ගෙන් උපන් අයෙකු පැවිදිව මෙහි තනවන ලද සීමාවක විනය සජ්ඣායනා කිරීමෙන් පසුව පමණකි." යනු ඒ දෙබස යි.

මා විසින් ආරම්භ කරන ලද්දේ මගේ පුද්ගලික කුශලතා පෙන්වීම නොව ඔබ ද මා ද උගත් විදුදයේ කුශලතා පෙන්වීම යි. එම කුශලතා ඔප් නැංවූ බොහෝ දෙනා අතරට ඔබ ද අද එක් වෙයි. හිතෛෂී දෙමාපියනි, මම ඔබේ දූ-පුතුන් සෙනෙහසින් පිළිගනිමි. කරුණාකර අපගේ සොඳුරු සෙවණට ඔවුන් සමග ගොඩ වන්න. එහි දී "ඔබ පොළොවෙහි ලුණු ය; ලුණෙහි ලුණු ගතිය නැති නම් එයට ලුණු රසය කවන්නේ කුමකින් ද? ඉන් පසු ඒවා ඉවත දමනු ලබන්නට ද මිනිසුන්ගේ පයින් පාගනු ලබන්නට ද මිස අන් කිසිවකට සුදුසු නැත." (*Mathew*, 5.13) යන්න ඔබ සිත්හි තබා ගන්නවාට සැකක් මට නැත.

"ඥානවෘද්ධයෝ ද තපෝවෘද්ධයෝ ද වයෝවෘද්ධයෝ ද යන සියලු දෙන ධනවෘද්ධයාගේ එළිපත්ත අබියස සිට ගෙන සිටිති." (ව්‍යාසකාර, 17 ශ්ලෝකය) යන සකු කියමන එදාටත් වඩා අදට

ගැළපෙන බව පෙනේ. ඒ පිළිබඳ අටුවා ටීකා මෙම විද්වත් සංසදයට ගෙන හැර පෑම "ගහ දන්නා අයට කොළ කඩා පෑමක් " විය හැකි ය.

සංවර්ධනය කිරීමට ගොස් ඉකුත් සියවස තුළ සත්ත්ව ප්‍රජාවට හා පාරිසරික අංගෝපාංගවලට මුදල ම කරපින්නා ගත් ව්‍යාපාරික ලෝකයෙන් සිදු වන්නට පටන් ගත් හානිය මෙම සියවසේ තීව්‍ර වී ඇත. වනාන්තර කාන්තාර බවට පත් වෙමින් තිබේ. කල් තබා ගැනීමේ චේතනාවෙන් හා වෙළඳපළට සුදුසු තත්ත්වයට පත් කිරීමේ කූට අරමුණෙන් විෂ රසායනික ද්‍රව්‍ය යොදමින් සකස් කරනු ලබන එළවළු, පලතුරු හා වෙනත් අහිතකර ආහාරපානවලින් වෙළඳපළ ගහන වීමෙන් ආහාර සුරක්ෂිතතාවට තර්ජන එල්ල වී තිබේ. මත්ද්‍රව්‍ය හා විෂ මත්වතුර හා අත්වැල් බැඳ ගත් සමාජ විරෝධී කටයුතු උත්සන්න වී ඇත. මෙම ව්‍යසනයට ඇතැම් දේශපාලනඥයන් මෙන් ම පාරිභෝගික සමාජය ද වගකිව යුතු ය.

දුප්පත්කම උග්‍ර වීම හා ධනය සම සේ බෙදී නො යෑම වැනි රාජ්‍යමූලිකව විසඳිය යුතු ප්‍රශ්න ද ඇත. අම්ල වර්ෂාවල ඕසෝන් ස්තරයේ විනාශය හා දේශගුණික විපර්යාස වැනි ස්වාභාවික ආපදා ද වෙයි; මේ සියල්ල සමාජයට විඳ දරා ගැනීමට නොහැකි ඒවා වෙයි. විශේෂයෙන් මේවායෙන් ඇතැම් ප්‍රශ්න දේශීය ඒවා වෙයි; බොහොමයක් විශ්වව්‍යාප්ත වූ ඒවා වෙයි.

මේ අතර කාමසුඛල්ලිකානු ජීවන රටාවකට ඇබ්බැහි වූ ධනවෘද්ධයන් විසින් ඥාන සමාජයේ ජ්‍යෙෂ්ඨයන් හෙවත් ඥානවෘද්ධයන් අඩු ලංසුවකට මිල නියම කරමින් ඔවුන් අවපාතයකට ලක් කිරීම සුවිශේෂ පරිහානි ලක්ෂණයක් වී තිබේ. මුනිවෘද්ධයන් හෙවත් සමාජ සුධාරකයන් වූ පැවිදි සමාජයේ සාමාජිකයන් අකර්මණ්‍ය කර ඇත. දේශපාලන බලාධිකාරය මෙම සමාජ විරූපීතාව කීප ආකාරයකින් ම ඔද තෙද නංවයි. ඒ දේශප්‍රේමය හෝ ජාති වාත්සල්‍යය දඩමීමා කර ගත් ඔවුන් ආත්මාභිලාෂය නම් වූ කෙවිටෙන් දක්කනු ලැබීම නිසා ය

මේ සියල්ලට විසඳුම් සොයා ගැනීම සඳහා ජගත් සංවිධානය හඳුන්වා දුන් වැඩ පිළිවෙළ තිරසාර සංවර්ධනය බව අපි දනිමු. මෙහි තිඹිරිගෙය වූයේ 1983 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පත් කරන ලද පරිසරය හා සංවර්ධනය පිළිබඳ ජගත් කොමිෂම යි. නෝර්වේ රාජ්‍යයේ හිටපු අගමැතිනිය වූ ග්‍රෝ හාලීම් බෲට්ලන්ඩ් එහි සභාපතිනිය වශයෙන් කටයුතු කළ නිසා එම කොමිෂම බෲට්ලන්ඩ් කොමිෂම නමින් සමාජගත විය. රටවල් 23ක් එක්ව දීර්ඝ කාලයක් තුළ කළ සාකච්ඡාවක ප්‍රතිඵලයක් වශයෙන් එහි වාර්තාව 1987 දී බිහි වීමත් සමග කොමිෂම විසුරුවා හරින ලදී. අපේ පොදු අනාගතය (*Our Common Future*) නමින් එම වාර්තාව හැඳින්වීමෙන් පෙනී යන්නේ විශ්ව සාධාරණ දර්ශනයක් හා කාර්ය පටිපාටියක් එමගින් ප්‍රතිපත්තියක් වශයෙන් අපට දායාද කළ බව යි. එම වාර්තාව අපේ පොදු අරමුණු මධ්‍යස්ථානය විසින් ක්‍රියාවට නංවන ලදී. මෙම වාර්තාව කෙතරම් දුරට ඇමෙරිකා එක්සත් ජනපදයේ බුද්ධිමය ප්‍රජාවේ සැලකිල්ලට පාත්‍ර වූවා ද යන්න එරට ලුවිස්විල් විශ්වවිද්‍යාලය විසින් ග්‍රොව්මියර් සම්මානයෙන් (*University of Louisville-Grawemeyer-Award*) පිදීමෙන් හෙළි වෙයි.

වර්තමාන ප්‍රශ්නවලට විසඳුම් දෙමින් තිරසාර සංවර්ධනයක් ඇති කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව ජගත් සංවාදයක් ආරම්භ වූයේ බෲට්ලන්ඩ් කොමිෂමෙන් බව සැබෑ වුවත් තිරසාර සංවර්ධන සංකල්පය ප්‍රභවය වූයේත් එය ක්‍රියාවට නැංවීම ආරම්භ වූයේත් මෙතැනින් නොවේ; යුරෝපයෙන් ද නොවේ. එය පැරණි වෙනත් බොහෝ රටවල ඥාන මාර්ගයේ විෂය පථයට ගෝචර වූවක් විය. ඕස්ට්‍රේලියානු ආදි වාසීහු වසර 40,000ක් පමණ කලක් පරිසරය නොනසා ඒ හා ඒකාබද්ධව විසූහ. වසර 30,000කට වැඩි කලක් මිසර වැසියෝ පරිසරය සුරකිමින් අපූර්ව තාක්ෂණයක් පවත්වා

ගෙන ගියහ. අනාදිමත් කාලයක් පුරා චීන වැසියෝ ලොව මවිත කරවනසුලු පරිසරහිතකාමී නිෂ්පාදන බිහි කළෝය. වරිච්චි බිත්ති තාක්ෂණයත් සමග පරිසර හිතකාමී සමාජ රටාවකට මීට සමාන නැකම් කියමින් ගොඩ නගන ලද ප්‍රාග් ඓතිහාසික ප්‍රෞඪත්වයකට ලක්වැස්සෝ හිමිකම් කියති.

තිරසාර සංවර්ධනයට අදාළ උගැන්වීම් ප්‍රධාන ආගම් පිළිබඳ සියලු ධර්ම ග්‍රන්ථයන්හි විරල නොවේ. මෙහි දී ශ්‍රී ලාංකික සමාජය හැසිරවූ ප්‍රමුඛ බලවේගය වූයේ ත්‍රිපිටකාගත ඉගැන්වීම් නිසා ඒ පිළිබඳ ලුහුඬින් සලකා බැලීම ප්‍රයෝජනවත් ය.

පුනරුදය සමග හට ගත් කාර්මික විප්ලවය නිසා හා විද්‍යාවේ හා තාක්ෂණයේ අපූර්ව ප්‍රගමනයෙන් හටගත් නව නිපදවීම් හා තාක්ෂණ ක්‍රම නිසා සමාජයේ ප්‍රමුඛතා වෙනස් වූ අතර ම අලුත් දේ අපට එක් විය. එහෙයින් මූලික දේ හැරෙන්නට නව ලෞකික ප්‍රශ්න සියල්ලක් පැරණි ඥානමාර්ගය ඔස්සේ විසඳා ගැනීමට උත්සාහ නො කළ යුතු ය.

තිරසාර සංවර්ධනය සඳහා ළඟා විය යුතු පළමු වන ඉලක්කය ලෙස 2000 වර්ෂයේ දී ජගත් සංවිධානය විසින් පිළිගන්නා ලද සහස්‍රක සංවර්ධන ඉලක්ක අටට හා රියෝ+20/2012 ජාත්‍යන්තර සමුළුවෙන් සම්පාදිතව 2014 වර්ෂයේ දී මහා සමුළුවෙන් පිළිගන්නා ලද තිරසාර සංවර්ධන ඉලක්ක 17ට දුප්පත්කම තුරන් කිරීම ඇතුළත් කර තිබේ. ඇත්ත වශයෙන් ම දුප්පත්කම පිටු දැකීම සඳහා වූ ආරම්භයක් ජනසවිය හා ඊට පෙර ආරම්භ වූ වගා සංග්‍රාමය ආදි වූ ව්‍යාපෘති මගින් මීට පෙර ම ලංකාව විසින් දෙනු ලැබුවත් එය පළමු වන ඉලක්කය ලෙස නිල වශයෙන් ලොව පිළිගත් නිසා අද විශ්වව්‍යාපී මාතෘකාවක් බවට පත්ව තිබේ.

ඊට සහස්‍රක දෙකකටත් වඩා පෙර ගෞතම බුදුන් වහන්සේ තම න්‍යාය පත්‍රයට එය ඇතුළත් කර තිබූ ආකාරය දීඝනිකායේ 26 වන සූත්‍රය එනම් චක්කවත්තිසීහනාද සූත්‍රය අපට කියා දෙයි. ඊට අනුව නිර්ධනයාට ධනවතා විසින් ධනය නො දෙන කල දරිද්‍රතාව ඉහළ යයි; දරිද්‍රතාව ඉහළ ගිය විට අදත්තාදානය ඉහළ යයි; අපරාධ, මිනීමැරීම්, අපවාද, ගණිකා වෘත්තිය ඉහළ යයි; වෙනත් දුරාචාර වැඩි වෙයි; දෙමාපිය දූදරු සෙනෙහස මිලින වෙයි; ආගම ධර්මයෙන් මිනිසා බැහැර වෙයි; නීතිය නොසලකා හරියි; දශවිධ වැරදි ක්‍රියාවල නිමග්න වෙයි; මේ සමග ම අධිධනවතා නිතැතින් ම එවැනි සමාජවිරෝධී ක්‍රියාවලට ඇබ්බැහි වෙයි. මේ අනුව බෞද්ධ ආර්ථික දර්ශනයේ ප්‍රධාන අභිප්‍රාය වන්නේ දුප්පත්කම පිටු දැකීම යැයි කීම නිවැරදි වේ.

එහි දෙවන අරමුණ සේ මා දකින්නේ මිනිසා ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීමයි. ඒ සඳහා ගත යුතු මග එම ග්‍රන්ථයේ ම සතර වන සූත්‍රය හෙවත් කූටදන්ත සූත්‍රය පැහැදිලි කරයි. ඒ මෙසේ ය;

> ''ආර්ථික ව්‍යාපාරයන්හි විශේෂයෙන් කෘෂිකර්මාන්තයෙහි නියුක්ත වූවන්ට ඉඩම්, බීජ, පොහොර, කෘෂි උපකරණ හා ගව-මහිසාදීන් දිය යුතු වේ. (වෙනත් තැනක කියැවෙන පරිදි හොඳ අස්වැන්න ලැබෙන්නේ හොඳ බීජ වැපුරුවෝතින් පමණක් බැවින් හොඳ අස්වැන්නක් ලැබෙන බීජ පමණක් සැපයිය යුතු ය). වෙළඳ හා වාණිජ කටයුතුවල නියුක්ත වූවන්ට මූලධනය හා අවශ්‍ය වෙනත් පහසුකම් සැපයිය යුතු ය. වෙළඳ හා වාණිජ කටයුතු රජය විසින් අධීක්ෂණය කළ යුතු අතර වෙළඳුන් විසින් පාරිභෝගිකයා ගසාකෑම නැවැත්විය යුතු ය. රජයේ සේවකයන් තෘප්තිමත් කිරීම සඳහා

හා අල්ලස් හෝ දූෂණ ක්‍රියාවල නො යෙදීම සඳහා ඔවුන්ගේ සේවයට සරිලන වැටුප්, උසස් වීම්, නිවාඩු හා දිරි දීමනා දිය යුතු ය. ආධ්‍යාත්මික සංවර්ධනයේ නියුක්ත පුද්ගලයන්ට අවශ්‍ය සියලු පහසුකම් සැපයිය යුතු ය. මෙසේ අදාළ පහසුකම් සැලසූ විට ඒ ඒ වෘත්තීන්හි නියුක්ත වූවෝ තෘප්තිමත් වෙති; බිය සැක නැතිව ජීවත් වෙති; එහෙයින් රටේ අපරාධ සිදු නොවේ.''

තිරසාර සංවර්ධනයේ අද ඊළඟ ඉලක්කය වූ පරිසර සංරක්ෂණයට අප අවතීර්ණ වන්නේ කෙසේ ද යන්න ක්‍රියාවෙන් ම ආගම් ශාස්තෘවරු පෙන්වා දුන්හ. වෘක්ෂලතා පූජ්‍යත්වයෙන් සැලකූ උන් වහන්සේලා ඒවාට ගරු බුහුමන් දැක්වූහ. උන් වහන්සේලාගේ ජීවිතවල මූලික සිදුවීම් බොහොමයක් සිදුව ඇත්තේ මහාමන්දිර ආශ්‍රිතව නොව ගහකොළ ඇළ-දොළ, ගංගා, පිටිසර ගම්මාන, තණබිම් හා ගොවිපළවල් ඇසුරු කර ගෙන බව අපි දනිමු. මේ කරුණුවලින් පෙනී යන්නේ බෞද්ධ ආර්ථික හා සමාජ දර්ශනය මානව හිතවාදී හා පරිසරහිතවාදී මූලධර්ම මත ගොඩ නැඟී ලිය ලා ගිය එකක් බව යි.

තව වැදගත් බෞද්ධ සිද්ධාන්තයක් නම් මානව අයිතිවාසිකම්වලට ගරු කිරීමයි. 1948 දී ජගත් සංවිධානය ප්‍රකාශයට පත් කරන ලද මානව අයිතිවාසිකම් විශ්ව ප්‍රකාශනයේ ප්‍රඥප්ති 30ක් අඩංගු වෙයි. මේ ප්‍රඥප්ති ආගමික දෘෂ්ටිකෝණයකින් විමසූ උගතුන් අතර අප විශ්වවිද්‍යාලයේ කලක් උපකුලපති වශයෙන් සේවය කළ පාලි අධ්‍යයනය පිළිබඳ කීර්තිධර උගතකු වූ මහාචාර්ය එල්. පී. ඇන්. පෙරේරා මහතා ප්‍රමුඛත්වයක් ගනී. එතුමාගේ අධ්‍යයනයන්හි ප්‍රතිඵල *Buddhism and Human Rights* නමින් 1991 දී පළ විය. "මෙම ප්‍රකාශනයේ අන්තර්ගත ප්‍රඥප්ති බොහොමයක් ප්‍රධාන ආගම්වල ඉගැන්වීම් හා එකඟය. ඒ අතර බෞද්ධ ඉගැන්වීම් ප්‍රධාන වේ." යනු එහි බහා ලූ එක් කියමනකි. එම නිගමනයට එතුමා බැස්සේ එකිනෙක ප්‍රඥප්තිය බෞද්ධ ඉගැන්වීම් හා ගැළපෙන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව මූලාශ්‍රය මත සිදු කළ අධ්‍යයනයකින් පසුව ය.

තිරසාර අර්ථක්‍රමය, සමාජ සමතාව හා පරිසර සංරක්ෂණය පිළිබඳ ඉලක්ක සම්පූර්ණ කර ගැනීම සඳහා පැරණි ඥානමාර්ග හඳුන්වා දුන් අර්ථකථන හා ක්‍රමෝපක්‍රම ද ඒවායේ පරිචය ආදිය ද පිළිබඳ ව අප මේ කළේ ඒ පිළිබඳ ප්‍රවේශයකට අවතීර්ණ වීම පමණි. එය ගැඹුරු අධ්‍යයනයකට හොඳ මාතෘකාවකි. ඒ පිළිබඳ අවධානය යොමු කරන මෙන් නවක විද්‍යාර්ථීන්ගෙන් මෙන් ම මෙම විද්වත් සංසදයේ ජ්‍යෙෂ්ඨ සාමාජික-සාමාජිකාවන්ගෙන් ද මම ධර්මශාස්ත්‍රෝන්නතිකාමීව ඉල්ලා සිටිමි.

## පැරණි ඥානමාර්ගයෙන් පෝෂණය වූ පැරණි ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනය පිළිබඳ සාධක

මැයි මස සිට සැප්තැම්බර් මස දක්වා වූ කාලය තුළ නිරිත දිග මෝසම් සුළං සක්‍රිය වීමෙන් නිරිත දිග හා මධ්‍ය කඳුකරයේ ගංගා ඇළවේලිවලට වැසි ජලය ලැබේ. දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා කාලය තුළ ඊසානදිග මෝසම් සුළං සක්‍රිය වීමෙන් උතුරු හා නැගෙනහිර මධ්‍ය කඳුකරයේ නැගෙනහිර දිග පිහිටි ගංගාවලට ජලය ලැබේ. අන්තර් මෝසම් කාලයේ දී එක්තරා වැසි ප්‍රමාණයක් මුළු දිවයිනට ම ලැබේ. මෙය සාමාන්‍ය වර්ෂාපතනයේ ස්වභාවය වුවත් උච්චාවචන බොහෝ විට සිදු වීමෙන් නියඟ මෙන් ම ජල ගැලීම් ද ඇති වේ. බෙංගාල බොක්කේ ඇති වන කැළඹිලි නිසා වරින්වර දිවයිනට තද සුළං සමග මහවැසි ද ලැබේ.

මේ වර්ෂාපතන රටාව නිසා සෑම කලක ම සෑම ප්‍රදේශයකට ම වැසි නො ලැබෙන බව පැහැදිලි ය. මෙය ද කඳුහෙල්, තැනිතලා ආදි භූගෝලීය සාධක ද පාරිසරික කරුණු ද මැනවින් තේරුම් ගත් පැරණි ශ්‍රී ලාංකිකයෝ දිශානුදිශාවන්හි විහිදී පැවති වැසි දියෙන් පමණක් පෝෂණය වන ගංගා, ඇල-දොළ හරස් කර වැව්, අමුණු බඳවා වැසි ලැබෙන පෙදෙස්වල ජලය වැසි නො ලැබෙන පෙදෙස්වලට හැරවීමේ අරමුණෙන් දකුණට වැටෙන වැසි ජලය උතුරට හැරවීමටත් උතුරට වැටෙන ජලය දකුණට ගෙන යෑමට හා නැගෙනහිරට වැටෙන ජලය බටහිරටත් බටහිරට වැටන ජලය නැගෙනහිරටත් ගෙන යෑමට හැකි වාරිමාර්ග හා ජල කළමනාකරණ පද්ධතියක් දේශීය තාක්ෂණය හා අමුද්‍රව්‍ය උපයෝග කර ගනිමින් හඳුන්වා දුන්හ. "ධාන්‍යයෙන් අටු-කොටු පිරවිය යුතුය; පොළොවට වැටෙන දිය බිඳක් හෝ ප්‍රයෝජනයට නො ගෙන සාගරය කරා ගමන් කිරීමට ඉඩ නො තැබිය යුතු ය." යන අදිටන යථාර්ථයක් බවට පත් කිරීම සඳහා මෙම අන්තර් වාරිමාර්ග පද්ධතිය අත්‍යවශ්‍ය විය. ක්‍රිස්තු වර්ෂ නව වන සිය වස පමණ වන විට ක්‍රියාත්මකව තිබූ එම වාරිමාර්ග පද්ධතිය එම යථාර්ථය මල්පල ගැන් වීය. මෙම අදීන වාරි තාක්ෂණය මත සිදු කළ කෘෂි ආර්ථික සංවර්ධනය මගින් ශ්‍රී ලංකාවට ආවේණික ජලාශ්‍රිත ශිෂ්ටාචාරයක් ගොඩ නැගිණ. අතීත ශ්‍රී ලාංකික තිරසාර සංවර්ධනයට හොඳ ම සාක්ෂිය සැපයෙන්නේ මෙයින් යැයි සිතමි.

අනිත් අතට මේ කෘෂි වාරි පද්ධතිය නිසා වසරට තෙවරක් කුඹුරු අස්වැද්දිය හැකි විය; අටු-කොටු පිරවිය හැකි විය; රට අහරින් ස්වයංපෝෂිත කළ හැකි විය. මේ සියල්ල කරන ලද්දේ පරිසරහිතකාමී කෘෂි ආර්ථික ප්‍රතිපත්තියකින් විනා ගැඩවිලා මරණ බැර ලෝහ පසට මුසු කරමින් විවිධ රෝගකාරක ඇතුළත් විෂම පරිසරයක් බිහි කිරීමෙන් ජල සම්පතට හා පසට විෂ කවන ඊනියා රසායනික පොහොරවලින් නො වන බව අවධාරණය කළ යුතු වේ. මෙම අර්ථක්‍රමය කෙතරම් සාර්ථක ප්‍රතිඵල ගෙන දීමට සමත් වී ද යන්න පෙන්වන හොඳ ම දර්ශකය නම් අතීතයේ දී ශ්‍රී ලංකාව පෙරදිග ධාන්‍යාගාරය ලෙස හැඳින්වීමට තරම් ආඪ්‍යත්වයකින් පරිපූර්ණ වී තිබීම යි.

මේ සඳහා අවශ්‍ය න්‍යායාත්මක ඥාන සම්භාරය ගබඩා වී තිබුණේ ආගමික සංස්ථාවෙහි ය. ඇතැම් පාලකයන්ගේ මුවින් මෙම තාක්ෂණික ප්‍රාගුණ්‍යය පිළිබඳ වදන් පිට වූ බවට වංසකථා කරන සඳහන් දෝංකාර දෙන්නේ මෙම ඥාන මාර්ගය නොවේ ද? ස්තූපකරණය සඳහා ගඩොල් තනා ගන්නා දේශීය තාක්ෂණය ථූපවංස කතුවරයා යස රඟට දුටුගැමුණු රජුගේ මුවට දමා පිට කරයි. ඇතැම් ආරාම පීඨ ගණනාවකින් යුත් ජාත්‍යන්තර අධ්‍යයන පීඨ බවට පත් වී තිබිණ. සුවිසල් අභයගිරි විහාරයේ තිබූ එක් පීඨයක් විද්‍යා හා තාක්ෂණ පීඨය නමින් නම් කිරීම සුදුසු යැයි පෙන්වන සාධක සමහරක් අපට හමු විය. විද්‍යාව විනය ඇති කරයි. යන සුප්‍රකට කියමන ගැඹුරු අරුතක් ඇත්තකි. අධ්‍යාපනයත් රජුත් පන්සලත් සමාබද්ධව ක්‍රියාවට නැංවූ වැඩ පිළිවෙළක් ඉන් නිරූපණය වන බැවිනි.

මහා ස්තූප මළු ආදියේ වැසි ජලය කළමනාකරණය කිරීම පිළිබඳ දේශීය තාක්ෂණය පිළිබඳ සාධක රැඳී ඇත්තේ ද පැරණි පන්සල් බිමේ ය. ඇතැම් සෑ මළු අක්කර හයක් හතක් පමණ වපසරියකින් යුක්ත වේ. මෙයට ඇද හැලෙන වැසි ජලය අතිවිශාල වේ. එය අභියෝගයක් හැටියට භාර ගත් වාස්තුවිද්‍යාඥයා ඔහුට ආවේණික වූ තාක්ෂණික ක්‍රමවේදයක් එම ජලය පාලනය කිරීම සඳහා හඳුන්වා දුන්නේ ය. ස්තූපයේ කොත් කැරැල්ලේ සිට පාදාන්තය දක්වා ඇද හැලෙන්නා වූ ජලකඳ ඕනෑ විදියට හැසිරවූ ඔහු එය හතර දිශාවෙහි තනවන ලද ජලාස හතරකට ගෙන ආවේ ය. එසේ අවසන් වරට ගබඩා කරන ලද්දේ අවස්ථා කීපයදී අවසාදිත ඉවත් කළ ජලයයි. මෙම තාක්ෂණය නිසා ස්තූපය ආරක්ෂා විය; පරිසරය සිසිල් විය. අලංකාර විය. වෘක්ෂලතාවලට හිතකර පරිසරයක් නිර්මාණය විය; මැසි මදුරුවන් බෝවීමට තිබූ ඉඩ කඩ ඇහිරී යාමෙන් මැලේරියා හා ඩෙංගු

ආදියෙන් එල්ල වීමට තිබූ තර්ජන පහව ගොස් සෞඛ්‍යය සුරක්ෂිත විය. අපතේ යන්නට තිබූ ජලය බහුවිධ අරමුණු ඉටු කර ගැනීම අරබයා කළමනාකරණය කරනු ලැබුවේ මේ අයුරෙනි. බහුකාර්ය ව්‍යාපෘතියක් වූ මෙයින් අවදානමක් ධනාත්මක පැත්තට හරවනු ලැබී ය.

2015 වසර අවසන් වන විට ලංකාවේ වැඩිහිටි සාක්ෂරඥානය 100%ක් වෙතැයි අනුමාන වශයෙන් ගණනය කොට තිබේ. එය කෙසේ වුවත් අද වන විට 98.1% දක්වා මට්ටමකට එය වර්ධනය වී ඇත. මෙය ආසියාතික රටවල් සමග පමණක් නොව යුරෝපයේ ඇතැම් රටවල් සමග සසඳන විට ද ඉහළ අගයක් පෙන්නුම් කරයි. එහෙත් සාක්ෂරඥාන ඒකකය බුද්ධිවිෂයක ප්‍රජාවක් පිළිබිඹු කරන දර්ශකයක් නොවේ. ඊනියා සහතිකය මෙනි. බුද්ධිවිෂයක ප්‍රජාව පිළිබිඹු වන්නේ ක්‍රියාවෙනි; ඔවුන්ගේ හැසිරීම් රටාවෙනි.

ඔබේ මුතුන් මිත්තන් විසින් මෙසේ ප්‍රායෝගිකත්වය, ප්‍රයෝජනය හා සුන්දරත්වය සලකමින් ඔබට දායාද කළ මෙම පොකුණු පොලිතින්, ටොපි හා චොකලට් දවටන ආදි වූ නොදිරන අපද්‍රව්‍යවලින් වැසී ඇති අයුරු ඔබ අද දැක්කොත් ඔබට හැඟෙන්නේ කුමක් ද? වත්මන් අපගේ බුද්ධිවිෂයක ඥානය හා සාක්ෂරඥානය කෙතරම් පිරිහී තිබේ ද යන්න නොවේ ද? ටික දිනකින් එහි සරන සියලු ම ජලජීවීන් අප අතරින් සදහට තුරන් වනු ඇත. අපේ සම්ප්‍රදායානුකූල මත්ස්‍ය සම්පත ඇළ-දොළ ගංගාවලින් වඳ වී ගියේ මේ ආදි කරුණු නිසා ය.

අටපිරිකරේ පාත්‍රය කළු කරන ලද්දේ කළු පැහැ ගැන්වෙන තුරු උණු කරමින් පදම් කර ගත් තලතෙල් ආලේපයෙනි. මෙම ආලේපය පාත්‍ර පෘෂ්ටයට කාවද්දා මල නොනගින ලෙස සකස් කරනු පිණිස යොදා ගත් පැරණි පන්සලේ ගබඩා වී තිබූ දේශීය තාක්ෂණය අද නැති වී ගොස් ය. ඒ වෙනුවට වෙළෙන්දෝ පාත්‍රයට අද කළු තීන්ත ගාති. එසේත් නොමැති නම් සුදු යකඩයෙන් පාත්‍ර තනති. ඊටත් වඩා ඛේදජනක වන්නේ ඇලුමිනියම් භාවිතය යි. අප රටේ පැවති වර්ණාලේප ගන්වන තාක්ෂණය පුරාණයේ පැවති තිරසාර සංව¾ධනය මැනවින් නිරූපණය කරන දර්ශකයක් හැටියට නො ගත යුතු ද?

තත්ත්වය මෙසේ නම් අප සිටින්නේ කොහේ දැයි මෙනෙහි කරන්න. අප ගැන තක්සේරුවක් කිරීමට අප ම ඉදිරිපත් විය යුතු ය. එහි ප්‍රතිඵල අසල්වැසියා සමග බෙදා ගත යුතු වේ. අර උතුම් පරමාර්ථ සිත්හි තබා ඒ ශ්‍රේෂ්ඨ නිර්මාණ අපට දායාද කර දුන් අපේ මුතුන් මිත්තන්ට ඔබ විසින් සාධාරණයක් ඉටු කරන්නේ ද යන්න ඔබ ම සිතා බැලිය යුතු වේ. අද උපාධි කබායෙන් සැරසී සිටින ඔබ හෙට සමාජයට ගොස් නොයෙක් වගකීම් උසුලන්නන් බවට පත් වේවි. එහි දී ඔබට පැවරෙන සුවිශේෂ කාර්ය අතර ඒ අපේ මුතුන් මිත්තන් ඔබට උරුම කර දුන් දායාද රැක ගැනීමට උපරිම දායකත්වයක් සැපයීම වැදගත් තැනක් ගනී. ඔබ ඔබ විසින් ම මේ පිළිබඳව පත් කර ගත් 'තානාපතිවරයකු' වන්න.

තිරසාර සංවර්ධනය ඇති විය යුත්තේ ආර්ථික සංවර්ධනයල පරිසර සංරක්ෂණය හා සමාජ සාධාරණත්වය යන අංශවල බව දැනට පිළිගෙන තිබේ. මේ කිසිවක් පැරණි ඥාන මාර්ගයෙන් කිසි ලෙසකින් හෝ බැහැර වී නැත. එහෙත් මේවා ගැන පර්යේෂණ කොට අපේ සාම්ප්‍රදායික ක්‍රමශිල්ප හා උපාය මාර්ග මේ දැවෙන ප්‍රශ්න විසඳීම සඳහා ලොවට කියා දිය යුතු ය. එය කළ හැක්කේ අන් කවරෙකුටවත් නොව අධ්‍යාපන ප්‍රජාව හෙවත් ඥාන සමාජයේ සාමාජික සාමාජිකාවන් බවට පත් වන ඔබට ය.

හරිත ලංකා වැඩපිළිවෙළ 2009-2016 සඳහා වූ ජාතික සැලැස්මක් 2009 වර්ෂයේ දී හඳුන්වා දෙන ලද අතර එය ක්‍රියාවට නැංවීම සඳහා තිරසාර සංවර්ධන ජාතික මණ්ඩලය නමින් පූර්ණ බලැති ඉහළ පෙළේ සංවිධානයක් ද ප්‍රථම පුරවැසියාගේ නායකත්වය යටතේ පිහිටුවනු ලැබී ය. මෙයට අදාළ ලේඛන විශාල වියදමක් ද දරා වෘත්තීය පදනමක් යටතේ සකස් කර ප්‍රකාශයට පත් කර තිබුණත් මේ දක්වා මෙම ජාතික මණ්ඩලය රැස්වීමක් වත් පවත්වා ඇත්තේ එක් වතාවක් පමණි. එහෙයින් එම වැඩපිළිවෙළ ඇත්ත වශයෙන් ම තිඹිරි ගෙයි ම මිය ගියේ ය.

එසේ ද වුවත් එහි අන්තර්ගතය අපට බෙහෙවින් ප්‍රයෝජනවත් ය. දූත මෙහෙවර 10කින් සමන්විත එහි අවසන් දූත මෙහෙවර වෙන්ව ඇත්තේ ඍජුව නැතත් තිරසාර සංර්ධනය සඳහා බුද්ධිමය ප්‍රජාව ශක්තිමත් කිරීම පිළිබඳ කරුණු කෙරෙහි වීම වැදගත් වේ. ඒවා මෙසේ වෙයි: 1. තිරසාර සංවර්ධනයට අදාළ තොරතුරු පිළිබඳව වරින් වර දේශපාලන අංශය දැනුවත් කිරීම 2. තිරසාර සංවර්ධනයට දායක වීම සඳහා අවශ්‍ය ආකල්පමය වෙනස්කම් ශිෂ්‍යයන් තුළ ජනනය කිරීම 3. භෞතික සත්ත්ව-ශාක හා වෙනත් පාරිසරික සංවේදී ප්‍රතිපත්ති හා ක්‍රියා පාසල් අධ්‍යාපන ක්‍රමය තුළ සංගෘහීත කිරීම 4. විශ්වවිද්‍යාල විෂය ධාරාවට තිරසාර සංවර්ධනය පිළිබඳ කරුණු අන්තර්ගත කිරීම 5. තාක්ෂණ විද්‍යායතනවල විෂයධාරාවට තිරසාර සංවර්ධනය පිළිබඳ කරුණු අන්තර්ගත කිරීම 6. තිරසාර නිෂ්පාදනය හා පරිභෝජනය සඳහා අවශ්‍ය ආකල්පමය වෙනසක් තරුණ පරම්පරාව තුළ වර්ධනය කිරීම 7. තිරසාර නිෂ්පාදනය හා පරිභෝජනය වර්ධනය කරන්නා වූ නියෝජිතයන් බවට කාන්තාවන් පර්වර්තනය කිරීම 8. තිරසාර නිෂ්පාදන ඇති කිරීම සඳහා හා පරිභෝජනය සඳහා ජනතාව උනන්දු කිරීම 9. පුද්ගලික හා වෙනත් ආයතනවල සාමාජිකයන්ට තිරසාර සංවර්ධනය පිළිබඳ අවබෝධයක් ලබා දීම 10. ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී පරිසරය පිළිබඳව අවධානය යොමු කිරීම. මේ අතරට තිරසාර සංවර්ධනයට දායක වූ පැරණි සාම්ප්‍රදායික ඥාන මාර්ගය පිළිබඳ කරුණු ද අන්තර්ගත කළ යුතුයැයි සිතමි.

ගෞරවාර්හ කුලපති ස්වාමීන්ද්‍රයන් වහන්ස,

වර්තමාන තිරසාර සංවර්ධන ව්‍යාපෘතිවලින් කරනු ලබන්නේ වරදට පොළඹවා ඒ වැරැද්දෙන් සිදු වන හානිවලට පිළියම් සෙවීමට මහන්සි ගැනීම ය. එම වරද නැවත නො කෙරීමට හෝ සිදු නො වීමට වග බලා ගැනීමක් හෝ ඒවායෙන් නො කෙරේ. පැරණි හා සාම්ප්‍රදායික ඥාන මාර්ගයෙන් කරනු ලබන්නේ නිවාරණය කිරීම හා ආයති සංවරයේ පිහිටුවීම මගින් සමාජ ව්‍යුහය හා ක්‍රියාකාරිත්වය හැඩ ගැසීම යි; මානසික වර්ධනය ඇති කිරීමයි. බුද්ධිමය ප්‍රජාව ශක්තිමත් කළ යුත්තේ මේ පිළිබඳ යථාභූත ඥාන දස්සනය පහළ කර ගැනීම සඳහා හා කාර්මික රටවල වහල්භාවයෙන් මිදී තිරසාර සංවර්ධනයක් උදා කිරීමට දායක වීම සඳහාත් ජන විඥානය එම ඥාන සම්භාරයෙන් සන්නද්ධ කිරීම අරබයාත් ය. ඒ සඳහා කැප වන ලෙස අප ආදරණීය නවක විද්‍යාර්ථීන්ට අනුස්මරණීය අද දින මම සෙනෙහසින් ආරාධනා කර සිටිමි.

<u>2015.07.28</u>

# 51

# ජීවිතය කළමණාකරණය කරගැනීමෙහිලා සෞන්දර්යය

## ආචාර්ය ජයලත් මනෝරත්න

ප්‍රථමුවෙන්ම අද දිනය ඔබට මෙන්ම මටද අතිශය ප්‍රීතිදායක සහ අමරණීය දිනයක් වන බව ප්‍රකාශ කළ යුතුය.

මෙම රමණීය සරසවි පියස තුළ සිව් වසරක් මුළුල්ලේ අපමණ කැපකිරීම් සහ වෙහෙස මධ්‍යයේ, ශාස්ත්‍රීය සහ විද්‍යාත්මකව, කළමනාකරණය නම් වූ විශේෂිත විෂයය හදාරා ඒ සම්බන්ධව ප්‍රාමාණික දැනුමක් මෙන්ම ගෞරවනීය උපාධියක්ද ලබමින්, හෙට සිට නැවුම් සමාජමය ජීවිතයකට පියවර තැබීමට උදාවන භාග්‍යය ඔබේ සතුටයි. එමෙන්ම මෙබඳු අතිශය ගාම්භීර උත්සවයක් හමුවේ ඔබ වෙනුවෙන් දේශනයක් පැවැත්වීමට මා ලද ගෞරවණීය ආරාධනය මගේ සතුටයි. ඒ පිළිබඳව මගේ ප්‍රණාමය සහ උත්තමාචාරය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට පිරිනැමීමට අවසර.

දේශනශාලාව තුළ කළමනාකරණය සහ වාණිජ විද්‍යාව සාර්ථකව හැදෑරූ ඔබට, හෙට සිට සමාජය නමැති සංකීර්ණ පරිසරය තුළදී ජීවිතය සාර්ථකව කළමනාකරණය කරගැනීමට සිදුවෙන බව පැහැදිලිය. එනම්, හෙට සිට ඔබ තවදුරටත් ශිෂ්‍යයෙක් හෝ විද්‍යාර්ථියෙක් නොව සමාජ වගකීම් සහිත, යම් ප්‍රභූත්වයකින් පිළිගනු ලබන පූර්ණ පුරවැසියෙක් බවට පත්වන බැවින්මය.

ජීවිතය මනාව කළමනාකරණය කරගැනීම පිණිස ප්‍රධාන වශයෙන් අපට අනුප්‍රාණය සලසනු ලබනුයේ ආගම - ධර්මය හෝ දර්ශනය විසින් බව පිළිගත් කරුණකි. බුදුරජාණන් වහන්සේ, යේසුස් ක්‍රිස්තුස් වහන්සේ, මුහම්මද් නබි නායකතුමා වැනි ආගමික ශාස්තෘවරුන්, සොක්‍රටීස්, ප්ලේටෝ, ඇරිස්ටෝටල්, නීට්ෂේ, බර්ට්‍රන්ඩ් රසල්, කෘෂ්ණමූර්ති, ලුහුෂුන්ග් වැනි දාර්ශනිකයන් විසින් කරන ලද දේශනයන්, ප්‍රකාශනයන් අත්වැල් කරගනිමින් අපගේ ජීවන රටාව මනාව සැලසුම් කරගත හැකි බව නොරහසකි.

මේ හැරුණුකොට ජීවිතය ඵලදායී සහ අර්ථපූර්ණව, කලමනාකරණය කරගැනීමට පිටිවහල් වන තවත් විශේෂිත මූලයක් වශයෙන් කලාව, සාහිත්‍යය සහ සෞන්දර්යවේදය හඳුනාගත හැකිය. කලාව යනු කුමක්ද? එය කෙලෙස උත්පාදනය වීද? එහි අරමුණු කවරේද? එය හුදු විනෝදාස්වාදය උදෙසා පමණක්මද? නැතහොත් මානව සමාජයේ උන්නතිය හෝ උත්තරීතරභාවය උදෙසාද? අලුත් මිනිසෙක්, අලුත් සමාජයක්, අලුත් ලෝකයක් ගොඩනැංවීම වෙනුවෙන් එහි දායකත්වය කවරේද? වැනි ප්‍රශ්න කෙරෙහි අවධානය යොමු කිරීමෙන් ඒ පිළිබඳව යම් අවබෝධයක් ලබාගත හැකිය.

එහෙත් මෙය සරල ක්‍රියාදාමයක් සේ සැලකිය නොහැක. ඒ කලාව යනු අතිශය සංකීර්ණ, ගැඹුරු, පුළුල් විෂයයක් වනවා පමණක් නොව මූලාරම්භයේ පටන්ම එහි අරමුණු හා නිර්වචන වරින්වර විවිධ අරුත් ගැන්වුණු නිසාමය.

අප වෙසෙන පෘථිවියේ වයස අවුරුදු මිලියන හාරදහස් හයසීයයක් පමණ වන බව භූගර්භ විද්‍යාඥයන්ගේ අදහස යි. මිනිස් වාසය සඳහා පෘථිවිය සැකසුනේ ඊටත් අවුරුදු මිලියන ගණනාවකට

පසුවය. ඒ අනුව බලනවිට වර්තමාන මිනිසාගේ වයස අවුරුදු විසි ලක්ෂයක් පමණ විය හැකි යැයි අනුමාන කළ හැකිය.

මෙසේ උත්පාදනය වී ඉදිරියට විකාශනය වූ මානව වංශකතාවේ වැදගත් පාර්ශවයන් දෙකක් වනුයේ ක්‍රියාකාරකම හා චින්තනයයි. හුදු ජීවත්වීම උදෙසා ක්‍රියාත්මකවූ මානවයාගේ ශරීරය, ආහාර, නවාතැන, වස්ත්‍ර ආදිය ලබාගැනීම සඳහා යෙදවුණු අතර, කාලානුරූපව විවිධ අවශ්‍යතා මත ඒ ඔස්සේ යම් අනුකරණ ක්‍රියාවලියක්ද හටගත් බව අනුමාන කළ හැකිය. විශේෂයෙන් එය භෞතික ලෝකයේ තමාට පාලනය කරගත නොවුණු බලවේග උදෙසා හෝ පාරභෞතික ලෝකය තමන් වෙත පමුණුවන උවදුරු - ලෙඩරෝග - භය භීතිකා උදෙසා දක්වන ලද ප්‍රතික්‍රියා අනුසාරයෙන් උපදින්නට ඇත. නැතහොත් දඩයම ආදියේදී සතුනගේ හා තමන්ගේ ක්‍රියාකාරකම් ගෝත්‍රයේ අනෙකුත් අයට කියාපෑම සඳහා සන්නිවේදන මාර්ගයක් ලෙස අනුකරණය යොදාගත්තා විය හැක. කෙසේ වෙතත් පසුකාලීනව මෙකී අනුකරණය, රිද්මයානුකූලව සහ නාදානුරූපීව යොදා ගැනීමෙන්, එය නිර්මාණාත්මක කලාවේ මුල් බිජුවට හා සබඳතාවක් දක්වතැයි උපකල්පනය කිරීමටද අපහසුවක් නොමැත. මිනිස් ශ්‍රමය භාවිතයට ගැනීම සහ කලාවේ උපත පිළිබඳ සහසබඳතාවද මෙම ඓතිහාසික මූලධාතු අතර කෙනෙකුට ගවේෂණය කළ හැක.

දෙවැනි වැදගත් සාධකය වන චින්තනය, කලාවේ උපත ගැන සොයා බැලීමේදී වැඩි ප්‍රතිශතයක් අත්කරගන්නා බව ඉතා පැහැදිලිය. තමා අවට ලෝකය විසින් පෙන්වා දෙනු ලැබූ සොබාදහමෙහි අනුභාවයෙන් සෞන්දර්යාත්මක චින්තනයක් කරා මෙහෙයවීමේ ප්‍රතිඵල මිනිසාට ළඟාකර දෙන්නට ඇත.

අනෙකුත් සත්ත්ව කොට්ඨාශයන්ගෙන් මානවයා, වෙනස්වන මූලික සාධක වශයෙන්, ශ්‍රම හැකියාව, චින්තනය සහ අදහස් සන්නිවේදනය කරගැනීමේ භාෂාමය හැකියාව පෙන්වා දිය හැකිය. කලාව හෝ සෞන්දර්යාත්මක ප්‍රකාශනයන් බිහිකිරීමෙහිලා මිනිස් මොළයේ මෙම විශේෂිතවූ ගුණය හා හැකියාව අනුප්‍රාණය සලසන්නට ඇතැයි සිතීම විවාද රහිතය.

කලාව හෝ සෞන්දර්යවේදය මිනිසාගේ නිර්මිතයක් නොව, දෙවියන් විසින් දෙනු ලැබූ දායාදයක්ය යන ප්‍රවාදයද මෙහිලා සිහිපත් කළ යුතුය. කලාව පමණක් නොව මිනිසාද දෙවියන්ගේ මැවුමක්ය යන විඥානවාදී අදහස අභියෝගයට ලක්වනුයේ, චාල්ස් ඩාවින් ප්‍රමුඛ විද්වතුනගේ පරිණාමවාදය පිළිබඳ ගවේෂණයන් සමගමය. විද්‍යාත්මකවත්, ඓතිහාසික සාධක අනුවත්, තාර්කිකවත් මිනිසා බිහිවූයේ ජීව පරිණාමයේ එක් සන්ධිස්ථානයකදී වානර ප්‍රභේදයකින් බව එහිලා සාක්ෂාත් විය. මිනිසා බිහිවූයේ පරිණාමීය ක්‍රියාවලියක් ලෙස නම්, කලාවද එම පරිණාමීය ක්‍රියාවලියේම ප්‍රතිඵලයක් යැයි සිතීමට බාධාවක් නොමැත.

කෙසේ වුව, ලොව පුරා ස්වභාව ධර්මය විසින් එනම්, ප්‍රකෘතිය විසින් නිර්මාණය කළ දෙයට අමතරව යම් නිර්මාණයක් වේ නම් ඒ මිනිසාගේ ශ්‍රමයේ සහ චින්තනයේ ප්‍රථිඵලයන් බව නොරහසකි. ස්වකීය හැඟීම් හෝ අත්දැකීම් අන් අයට සම්ප්‍රවේශණ කිරීමෙහිලා භාවිත කළ විවිධ අනුකරණ නොයෙක් මාධ්‍යයන් කරා වර්ධනය වී කලාවේ මූලික හැඩතල සපයා දෙන ලදී. ස්පාඤ්ඤයේ අල්ටමීරා පෙදෙස්හි වසර 25000 ක් පමණ පැරණි ගුහා චිත්‍ර, වසර 17000 ක් පමණ පැරණි ගිණිකොණදිග ප්‍රංශයේ ලැස්කෝ ගුහා චිත්‍ර මෙන්ම, පැරණි ලංකාවේ පාරු කවි, නෙළුම් කවි, කරත්ත කවි, පැල් කවි, ආදී ශ්‍රමය මුදාහැරීමේ දී මතුවන වෙහෙස දුරුකරගත් ප්‍රකාශනද එබඳු මතවාදයක් වෙනුවෙන් සැපයිය හැකි මනා නිදසුන්මය.

කලාවේ උපත පිළිබඳව වූ බොහෝ මතවාද එලෙස තිබියදී එහි අරමුණු කවරේදැයි මඳ වශයෙන් හෝ විමසීම කලාව ජීවිතය කළමනාකරණය කර ගැනීමෙහිලා දක්වන දායකත්වය සාකච්ඡා කිරීමට තවත් පිටිවහලක් සපයනු නොඅනුමානය. පෙරදිග ඉන්දියාවේදී භරතමුනිතුමා ප්‍රකාශ කළේ, කලාවේ අරමුණ රස ජනනය කිරිම වශයෙනි. අපරදිග ග්‍රීසියේදී ඇරිස්ටෝටල් ප්‍රකාශ කළේ, විශේෂයෙන් නාට්‍ය කලාව වූකලී විකාශනය වන යම් කාර්යයක් අනුකරණය කිරිම වශයෙනි.

කලාව වනාහී සංස්කෘතියේ සංකේතාත්මක ප්‍රකාශනයකි යනුවෙන් විස්තර කළේ මාක්ස්වාදී සෞන්දර්ය විද්‍යාඥයන් විසින්ය. මාක්ස්ට අනුව කලාව වනාහි භෞතික ලෝකය පිළිබඳ සමාජ යථාර්ථවාදී ප්‍රකාශනයකි. වෙනත් කෝණයකින් එයම විශ්ලේෂණය කළහොත්, ප්‍රකෘතිය හෙවත් ස්වභාවධර්මය සෞන්දර්යාත්මක ලෙසින් මිනිස් මනසේ පිළිබිඹුවීම කලාව වශයෙන්ද අර්ථකථනය කළ හැකිය.

රුසියානු මහා ගත්කතුවර ලියෝ ටෝල්ස්ටෝයි අනුව, කලාව වූ කලී එක් අයෙකු සිතාමතාම යම් බාහිර සලකුණු උපයෝගී කරගෙන, අන්‍යයන් ආසාදනය වන සේ, ස්වකීය වේදිතයන් අන්‍යයන් තුළ ජනිත කරවන  මානව ක්‍රියාවලියකි. එනම්, යමෙකු යම් වේදිතයක් විඳගැනීමෙන් පසු චලන, රේඛා, වර්ණ, ශබ්ද හෝ වචන සංයෝග මගින් ඒ වේදිතයම අන්‍යයන් තුළද දැනවීම කලාවේ කාර්යය බවයි.

විසිවැනි සියවසෙහි ප්‍රකට බටහිර විචාරක අයි.ඒ. රිචර්ඩ්ස් සඳහන්  කළ පරිදි, කලාව වූ කලී සන්නිවේදන කාර්යයයේ උපරිම අවස්ථාවකි. මෑත කාලයෙහි ලොව බිහිවූ අග්‍රගණ්‍ය චිත්‍ර ශිල්පියකු වන පැබ්ලෝ පිකාසෝ, සෘජුව නොවුණද කලාවෙහි අරමුණු මෙලෙස සංකේතවක් කර ඇත. ''මා අඳින්නේ මා දකින දෙය නොව, මා දකින දෙය ගැන මා සිතන ආකාරය යි.''  ලොව විශිෂ්ට පෙළේ සිනමා අධ්‍යක්ෂවරයකු වශයෙන් සැලකෙන ඉන්ග්මාර් බර්ග්මාන් ද කලාව පිළිබඳ ව්‍යංග්‍යාර්ථයෙන් පළ කරන්නේ මේ අයුරිනි. ''ජීවිතය මුලින් ගොඩ නගන්න, ඉන්පසුව කැමරාවට ඇහැ තබන්න...''

විසිවැනි සියවසෙහි මෙරට පහළවූ ප්‍රශස්ත කිවියර මහගම සේකර, 'ප්‍රබුද්ධ' කාව්‍ය  ප්‍රබන්ධයේදී කලාව පිළිබඳව ඉදිරිපත් කරන සංකල්පනාව මෙබඳුය.

'බුදු සමිඳුනි කුමක් නිසා
ඔබ කලාව අත්හළෝද ?

කලාව, සත්‍යය හා මිථ්‍යාවය.
සත්‍යය ප්‍රකෘතිය ය.
ප්‍රකෘතිය තරම් සුන්දර වූ කිසිවක්
කිසි දවසක මිනිසාහට මැවිය නොහැක.
ඒ සුන්දර බව හරි හැටි දක්නට බැරි
දුහුනන්ටය කලාව....'

මෙම බොහෝ ප්‍රකාශන තුළ ගැබ්වන එක් විශේෂිත පොදු පාදමක් වෙයි. එය නම් කලාව යනු ජීවිතයම යන්නයි.

මේ හැරුණුකොට කලාව පිළිබඳව ලෝක ඉතිහාසය පුරාවට විසිරුණු විවිධ අදහස් රාශියක්ද තිබෙන බව සිහිපත් කරගත යුතුය. කලාව ජීවනය සඳහාය. කලාව ජීවනයේ කම්කටොළුවලින් ගැලවී සිටීම සඳහාය. කලාව කම්කටොළුවලින් නොසැලී, එයින් විනෝදය ලබනු සඳහාය. කලාව

සේවය සඳහාය. කලාව ආත්මානුභූතිය සඳහාය. කලාව විනෝදය සඳහාය. කලාව ඉන්ද්‍රිය ප්‍රීණනය සඳහාය. කලාව කලාව සඳහාය.

සිව් වසරක් මුළුල්ලේ ඔබ ප්‍රගුණ කළ කළමණාකරණ විෂය ධාරාව කලා අංශයට මෙන්ම විද්‍යා අංශයටද අදාළ වේ යැයි මම අනුමාන කරමි. එය හැඳින්වෙන්නේද කළමනාකරණ අධ්‍යයනය සහ වාණිජ විද්‍යාව වශයෙනි. ජගත් ලේඛක ලියෝ ටෝල්ස්ටෝයි සටහන් කළ වාක්‍ය දෙකක් මෙහිදී මා මතකයට පිවිසෙයි. 'කලාව හා විද්‍යාව පෙනහළු සහ හෘදය වස්තුව මෙන්ම බෙහෙවින් ඒකාබද්ධවී පවතී. යම් එක් ඉන්ද්‍රියයක් අකර්මණ්‍ය වුවහොත්, අනෙක් ඉන්ද්‍රියටද තත්ත්වාකාරයෙන් ක්‍රියාකාරී විය නොහැකිය...' ඉදින් කලාව සහ විද්‍යාව අන්‍යොන්තයෙන්ම එකට බැඳී ඇති බවට වෙනත් නිදසුන් කුමකටද?

ජීවිතය කළමනාකරණය කරගැනීම උදෙසා කලාව භාවිත කිරීමේ ශක්‍යතා කවරේදැයි විමසන්නකුට ඒ තුළ ගැබ්වන විවිධ වර්ගීකරණ වැදගත් වෙයි. ලලිතකලා සහ උපයෝගීතා කලා වශයෙන්, ප්‍රාකෘතික කලා, ජන කලා, වාණිජ කලා වශයෙන්, නූතන කලාව අමූර්ත කලා, දෘශ්‍ය කලා වශයෙන් වන වර්ගීකරණ ඒ අතරවේ.

කෙසේ වුව දෘශ්‍ය කලාව යටතේ එන චිත්‍ර, මූර්ති, කැටයම්, ඡායාරූප සහ වාස්තු විද්‍යාවේ යම් ශ්‍රේෂ්ඨ අංගෝපාංග ද, ප්‍රාසංගික කලාව යටතේ එන නර්තනය, සංගීතය, නාට්‍යය, සිනමාව ආදී මාධ්‍යයන් ද, සාහිත්‍යය යනුවෙන් සැලකෙන ගද්‍ය යටතේ එන නව කතා, කෙටි කතා ආදිය සහ පද්‍ය යටතේ එන ගී කාව්‍ය, සිලෝ, සිව්පද, නිදහස් ආදී වූ ආකෘතීන්ද සමස්ත කලාව යන සංකීර්ණ විෂයපථයට අඩංගුය. එනමුදු මෙය වුව පරිපූර්ණ වගුවක් නොවේ. විශේෂයෙන් නූතන තාක්ෂණය හා වැඩිදියුණුවූද පරිගණකය, ජංගම දුරකථනය ඔස්සේ පවා කලාත්මක භාවිතාවන් නිරූපණය වන නිසාය.

මෙම සියලු කලා මාධ්‍යයන්ගෙන් සිදුවනුයේ යම් සන්නිවේදන ක්‍රියාවලියක් බව ඉතා පැහැදිලිය. එනම් කෙනෙකුගේ අත්දැකීමක් තවත් බොහෝ දෙනා අතර බෙදා හදා ගැනීමකි. එම අත්දැකීම බොහෝවිට තමන්ගේම අත්දැකීමක් විය හැකි වුවත්, ඇතැම්විට අන්‍යයෙකුගේද විය හැකියි. එසේත් නැති වුවොත් උපකල්පනය කරන ලද අත්දැකීමක්ද විය හැකියි. අත්දැකීම් බෙදාහදා ගැනීම අප සාමාන්‍ය ජීවිතයේ සුලබ කරුණක් බව සැබෑය. මළගෙයකදී, මඟුල් ගෙයකදී, කඩ පොළේදී, මහමඟදී, නිවෙස තුළදී කවර ස්ථානයක තමා ලැබූ අත්දැකීම අන්‍යයන් වෙත පමුණුවාලීම් හෝ බෙදාහදා ගැනීම අතිශය සාමාන්‍ය චර්යාවකි. එය සමාජයක් පවත්වාගෙන යාමේ මූලික සාධකයක්ද වෙයි.

කලාව විෂයයෙහි දී මෙම ක්‍රියාවලියේ වෙනස නැතහොත් විශේෂත්වය වනුයේ මෙම සන්නිවේදනය සෘජුව සිදු නොවීමය. එනම්, වාර්තා ස්වරූපයෙන් නොවීමය. කලා මාධ්‍යයන් ඔස්සේ එකී අත්දැකීම් අන්‍යයන් වෙත පිරිනැමෙනුයේ ව්‍යංගයෙනි, වක්‍රෝක්තියෙනි. වෙනස් ස්වරූපයකිනි. භාවයන් රස බවට පෙරළීමෙනි, යම් චමත්කාරයකිනි. ඉතා කෙටියෙන් පවසතොත් 'අත්දැකීමකට හැඩයක්' ලබාදීමෙනි, සෘජුව නොවීමෙන් මෙම හැඩය ඒ ඒ මාධ්‍යයන්ට අනුව වෙනස් ස්වරූපයක් ගන්නා අතරම, හැඟීම් සහ සංවේදනා පුබුදුවාලීම නිසාම යම් කම්පනයක් ඇති කරලීම විසින් පුද්ගලයාද වෙනත් අයෙකු බවට පරිවර්තනය කරවනු ලබයි. මෙහිදී සාමාන්‍ය ප්‍රේක්ෂකයා හෝ පාඨකයා හෝ ග්‍රාහකයා, 'රසිකයකු' බවට පරිවර්තනය වීම සැබෑ කලාවේ නියතියකි.

මෙහිදී අවධාරණය කළ යුතු වැදගත් කරුණක් වනුයේ, කලාකරුවා විසින් ප්‍රදානය කරනු ලබන අත්දැකීම සාමාන්‍ය එකක් නොවිය යුතුය යන්නය. එනම් අප උදේ සිට රාත්‍රී වනතුරු ලබන්නේ අත්දැකීම්ය. ළමා කල සිට වියපත් කල දක්වා ලබනුයේ අත්දැකීම්ය. එහෙත් මේ සියලු අත්දැකීම්,

අන්‍ය සියලු දෙනාට වැදගත් නොවනු ඇත. එසේ නම් කලාකරුවා තෝරාගත යුත්තේ, විශේෂිත, තියුණු, සංවේදිත, අපූර්ව අත්දැකීම් පමණක් බව පැහැදිලිය. ජීවිතයේ තමන් ලැබූ තියුණු අත්දැකීමක්, එනම් ඇස, කණ, සම, නාසය, දිව කියන පංචේන්ද්‍රියන්ගෙන් ලැබෙන අත්දැකීමක් මනස විසින් සංකලනය කිරීමෙන් ලබන අනුභූතිය, පරිකල්පනය මගින් නව මුහුණුවරක් දී කලාකරුවා, සාහිත්‍යකරුවා විසින් අපූර්ව නිර්මාණයක් බවට පත්කරවනු ලබයි.

අපූර්ව යනු පෙර නුවූ විරූ යන අදහසය. මීට පෙර නොඇසූ නොදුටු මෙසේ අමුතු දෙයක් දකින තැනැත්තා පළමුවෙන්ම විස්මයට පත්වෙන බව කිව හැකිය. ඊළඟට ඔහු භයානක රසය හෝ හාස්‍ය රසය හෝ කරුණ රසය විඳගනියි. මේ සියලු රසයන්ගේ හරය චමත්කාරයයි. චමත්කාරය යනු සිත පුරවා දමන විස්මය මිස අන් කිසිවක් නොවේ, යනුවෙන් මහාචාර්ය සරච්චන්ද්‍ර 'කල්පනා ලෝකය' ග්‍රන්ථයේදී සඳහන් කරන්නේ ඒ නිසාම විය හැකියි.

ඕනෑම නාට්‍යයක්, ඕනෑම චිත්‍රපටයක්, ගීතයක්, කවියක්, නවකතාවක්, කෙටිකතාවක් වස්තු විෂයය කරගනුයේ අත්දැකීමක් බව පෙරදීත් සඳහන් කළෙමි. එය තමයි අන්තර්ගතය, එනම් කිව යුතු දෙය හෙවත් අත්දැකීම. කිවයුතු ආකාරය තමයි ආකෘතිය, නැතිනම් ස්වරූපය නමින් හඳුන්වන්නෙ. කියන දෙයක් තියෙනවා. කියන විදියක් තියෙනවා. අන්තර්ගතය සහ ආකෘතිය එනම් අත්දැකීම සහ හැඩය.

අන්තර්ගතයෙහි යම් අර්ථයක් ගැබ් වෙන අතර, ආකෘතියෙහි යම් රසයක් ගැබ් වෙයි. අර්ථය අපේ බුද්ධිය ආමන්ත්‍රණය කරන අතර, රසය අපේ මනෝභාවයන් පුබුදුවාලයි. අර්ථය සංජානනීය වන අතර රසය සංවේදනීය වෙයි. මේ අනුව උසස් කලා නිර්මාණයක්, සාහිත්‍ය නිර්මාණයක් සේවනය කරන පුද්ගලයා අර්ථය හා කැටිවූ රසයක් විඳගැනීමට ප්‍රස්තාව උදාකර ගනියි.

බොහෝවිට අත්දැකීම නැතහොත් අන්තර්ගතය සමාජය පිළිබඳව ජීවිතය පිළිබඳව යථාර්තයක් නැතහොත් සත්‍යයක් විය හැකිය. එසේම එම සත්තාව ප්‍රක්ෂෙපණය කෙරෙන ආකෘතිය යම් රමණීයත්වයකින් අලංකාර වන බවද පැහැදිලිය. සත්‍යය සහ රමණීයත්වය. Truth and Beauty.

මේ නිසා යථාර්ථවාදී හෝ ස්වභාවවාදී කලාකරුවා, අතින් සත්‍යය වඩාත් රමණීය සහ පරිපූර්ණ ලෙස ඉදිරිපත්වන බවට මතයක් පවතින අතරම. අනෙක් අතට කලාව සහ සත්‍යය අතර සම්බන්ධයක් අවශ්‍ය නොවන බවටද මතයක් ඇති බව පෙනෙන්නට ඇත. සත්‍යයද සාපේක්ෂ ධර්මතාවක් නිසා සත්‍යය කුමක්දැයි ඒකමතික පිළිගැනීමක් නැති බැවිනි. උදාහරණ ලෙස යම් ආගමක් හෝ, විශ්වාසයක් කෙනෙකුට සත්‍ය වන අතර, තව කෙනෙකුට එසේ නොවිය හැකියි. නැතිනම් එක් කලෙක සත්‍යය යැයි පිළිගැහුණු දෙයක් පසුව සාවද්‍ය බවට ඔප්පු විය හැකිය. කෙසේ වෙතත් කලාව විෂයයෙහි සත්‍යය රඳා පවතින්නේ එය නිර්මාණය කරනු ලබන්නාගේ පිළිගැනීම මත බව සිතාගත හැකිය. අනෙක් අතට කලාවෙන් ඉදිරිපත් වන්නේ පෞද්ගලික සත්‍යය නොව පොදු හෙවත් සමාජ සාධාරණ සත්‍යය බවද සිහිපත් කරගත යුතුය.

ඉදින්, ජීවිතය කළමනාකරණය කරගැනීමේලා කලාව හෝ සාහිත්‍යයේ දායකත්වය කවරේද? කලාව විනෝදාස්වාදය සඳහා පමණක්ද ? අප නාට්‍යයක්, චිත්‍රපටයක් නරඹන්නේ කුමක් අරමුණු කරගෙනද? කෙටි කතාවක්, කවියක් කියවන්නේ කුමක් සඳහාද ? ගීතයක්, සංගීතයක් ශ්‍රවණය කරන්නේ කවර අවශ්‍යතාවක් මතද? වැනි ගැටළු මතුවන්නට පුළුවන.

මෙයට ඍජු පිළිතුර විනෝදය සඳහා යැයි එක එල්ලේම කිව හැකි වන අතර, සතුට, සන්තෝසය, ආනන්දය වැනි පිළිතුරුද තිබිය හැක. එම පිළිතුරුවල කිසිදු වරදක් දැකිය නොහැක්කාක් මෙන්ම එහි අවංකභාවය පිළිබඳවද සැකයක් ඇතිවිය නොහැක. එසේද වුවත් එය හුදු විනෝදය උදෙසා

පමණක්මද? යන්න විමසා බැලීම උචිතය. එය පළමු අරමුණ විය හැක. දෙවැනි හෙවත් වැදගත්ම අරමුණ වන්නේ මෙම විනෝදාස්වාදය ඔස්සේ ජීවිතයට ලැබෙන අලුත් අත්දැකීමය. අලුත් දැනුමය. අලුත් දැක්මය. අවසාන විග්‍රහයේදී ප්‍රඥාවේ නිම්වළලු ප්‍රසාරණය වීමය.

කලාකෘතියක් ඔස්සේ මෙය සිදුවනුයේ ව්‍යංගයෙන්, වක්‍රෝක්තියෙන් හෝ අවිඥානකව විය හැකිය. එසේ වුව ජීවන ප්‍රණිධානයා විය යුත්තේ උත්තම කලාකෘතියකින් ලබන මෙම විශිෂ්ට ගුණාංගය බව පැහැදිලිය.

කලාවේ අරමුණ මේ යැයි ස්ථිරසාර, ඍජු, තනි පිළිතුරක් සැපයීම එතරම් පහසු කරුණක් නොවන බව විවාද රහිතය. ශතවර්ෂාධික කාලයක් මුළුල්ලේ මේ පිළිබඳව විවිධ මතවාද, තර්ක විතර්ක, විශ්වාස, සංකල්ප මතුවනුයේද ඒ හේතුකොට ගෙනමය. එසේවුව, කලාව විෂයයෙහි පොදු අරමුණ, හුදු විනෝදය පමණක් නොවන බව අද අපගේ කියැවීමය. විනෝදය ඇසුරින්, සෞන්දර්යකාරකයක් ලෙස, චමත්කාරය උත්පාදනය කරමින්, අලුත් අත්දැකීමක්, අලුත් දැනුමක්, අලුත් දැක්මක් පාඨකයා, ප්‍රේක්ෂකයා, ග්‍රාහකයා තුළ තැන්පත් කරමින්, අලුත් මිනිසෙක්, අලුත් සමාජයක්, අලුත් ලෝකයක් බිහිකිරීමේ නව මාවතක් ගොඩනැංවීම උදෙසා අවශ්‍ය ප්‍රඥාව සම්පාදනය කිරීම එහි සාධනීය අරමුණ විය යුතු බව අපගේ කියැවීමය.

'ලෝකය උඩුයටිකුරු කළ නාට්‍යවේදියා' වශයෙන් විරුදාවලි ලත් ජර්මානු ජාතික බර්ටෝල්ඩ් බ්‍රෙච්ට් මෙම කාරණය කැටිකරමින් නිර්මාණය කළ කාව්‍යමය ආත්ම ප්‍රකාශනය දෙස මඳකට සිත් යොමු කරනු මැන.

'... මිනිසුන් අවදි නොකරන්නේ නම්
ඒ සංගීතයෙන් අපට කවර නම් පලක්ද ?
දයාවේ පණිවිඩයක් නැත්නම්
ඒ කාව්‍යය එපාමැයි
ජීවිතයට මාර්ගයක් නොකියන්නේ නම්
පිටුදකිමු ඒ නවකතාව.
ක්‍රියාවට මඟක් නොපෙන්වන්නේ නම්,
විරුද්ධවෙමු අප ඒ නාට්‍යයට ....'

මෙම කෙටි දේශනය අවසන් කිරීමට පෙර, එහි සම්පිණ්ඩනයක් ලෙස, කලාකරුවකු ලබනා විශේෂිත, තියුණු අත්දැකීමක්, නිර්මාණකරණය දක්වා විකසිත වූ එක් අවස්ථාවක් මෙම ගෞරවනීය සභාව ඉදිරියේ තැබීමට මට අවසර දෙන්න.

**''අද දින ශ්‍රී ලාංකික සාහිත්‍ය ක්ෂේත්‍රයෙහි අග්‍රගණ්‍ය කවියෙකු, ගී පද රචකයකු ලෙස සම්භාවනාවට පත්වන, රත්න ශ්‍රී විජේසිංහයන් විසින් රචිතව, ආචාර්ය පණ්ඩිත් අමරදේවයන් විසින් ගැයෙන 'සුදු නෙළුම කෝ ....' ගීතයට පාදකවූ සත්‍ය අත්දැකීම සහ එම ගීයෙහි පදවැල් ඉතා සංක්ෂිප්තව ඉදිරිපත් කෙරෙයි."**=

මෙම උපාධි ප්‍රදානෝත්සවයේදී දේශනයක් ඉදිරිපත් කිරීමට ලද ඉඩප්‍රස්තාව මගේ ජීවිතයේද අමරණීය අවස්ථාවක් බව යළිදු සිහිපත් කරමින්, ඒ පිළිබඳ මගේ ගෞරවය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට පිරිනමමින්, උපාධි ලබන ඔබ සියලුදෙනාට නීරෝගී සම්පන්න, ප්‍රඥාසම්පන්න සුභ අනාගතයක් පතමි.

<u>*2015.07.28*</u>

# 52
# Country Needs Independent and Innovative Thinkers

## Dr. C. M. Madduma Bandara

I feel honoured and deeply moved by the invitation extended to me by the University to deliver a Convocation Address at this exclusive and learned gathering today. In this regard, let me specially thank the Dean of the Faculty of Graduate Studies - Prof. Hemathi Ranasinghe for initiating and facilitating this kind gesture of goodwill.

As you are aware, a convocation is a ceremonial and festive occasion for any University at which Degrees and Diplomas are awarded to students, recognizing their attainments in different fields of knowledge. **Convocation** is a word hardly found in the Little Oxford Dictionary or the Thesaurus and possibly coined by the academia themselves. It may have possibly been associated with 'congregation' - a term with overt religious connotations. Whatever it may be, where proper quality standards are maintained, students arrive at this high stage after toiling hard, often both day and night since the entry to the graduate school, despite many sporadic distractions. Therefore, for 'graduands' (another word not found in many dictionaries!) gathered here today, the convocation marks the culmination of a highly stressful and competitive journey that had commenced from their early school days. It is pertinent to note that, we are indeed witnessing here today a convocation for postgraduate students who have passed through the highest levels of training in their respective fields, some receiving the highest academic Degrees offered by the University. For parents, guardians and well-wishers, it is a day of self-fulfillment in which they rejoice in the high attainment of a young or mature person they have scouted, often through difficult times from their early childhoods. For professors and teachers, who nurtured these graduands intellectually, it is a day of relief and rejoice since these are the persons who have learnt the art and science of their own thinking processes, in creating new ideas that may be carried to the society at large, and that perhaps has the potential to transform the world. For the Universities and Research Institutes, those who receive their higher degrees and other qualifications today, are expected to man their staff cadres to continue their good work for the future. For the country at large, every convocation particularly for post-graduate Degrees and Diplomas, is an opportunity to be optimistic about the future, since it adds new thinkers and researchers to the existing stock of intellectuals.

### Questions of Relevance and Applicability

In my own thoughts on our contemporary university research, there had been a pestering feeling for some time, as to how much of the hardly discovered new findings of our professors and their graduands, find their way to the policies that benefit the society at large, that in turn nurtures our Universities and Research Institutes through tax payers funds. If such findings are not trickling down adequately, what

are the real impediments and 'bottle-necks'? In search of answers to this vexed question, my mind began to sweep across the whole spectrum of our socio-political scenario, from average citizens and researchers to the highest levels policy makers and their implementers.

In this context, let us first consider whether we have to put our own academic houses in order! I shall make an attempt to present here some of my own thoughts for your perusal and digestion for whatever they are worth. If one attempts to look at the research outputs of our universities as well as those of other affiliated research institutes, one common feature is that the large majority of them are obviously limited in scope to specific disciplines or to narrowly defined problems of individual or guided choice. This is because, still we are knowingly or unknowingly inclined to follow the western tradition of reductionism where our minds are trained to cut broader fields of knowledge into smaller and smaller parts. Despite its obvious merits, if we follow it to its logical end, one day we will know 'everything about nothing'! As a person who initially had the occasion to propose to the University Senate (Peradeniya,1992), that, time had come to set up 'Faculties of Graduate Studies' that would eventually become happy homes for interdisciplinary research, I derive some innocent satisfaction of witnessing their birth, multiplication and growth in most universities, except perhaps in Peradeniya! On the other hand, the tradition of multiplication of Departments both in universities as well as in areas of administrative governance continued to flourish. This opened the way to policy makers to complain about the relevance and applicability of some findings and gloat over the fact that, 'communities have problems and conflicts but universities have Departments and Faculties'!

Most problems in human society today demand multidisciplinary treatment and they often seem to escape from scientific attention. The major problems of the kidney disease (CKDu) and dengue, *mega polis* development, the need for a change of the Capital City, out of Colombo, redefinition of colonial Provinces, to name a few, are not within any single scientific discipline, and become everybody's business but nobody's concern. In the contemporary research culture, our focus often appears to be more on 'tinkering' than 'thinking' on a wider canvass.

I am not thinking even for a moment, that we must distance ourselves from fundamental research. Nevertheless, in countries that struggle to become 'industrialized and developed', it is inevitable that applied and development-oriented research may receive precedence over fundamental studies. The critical issue here is however, the vital link between our research efforts and the societal needs, which we are compelled to re-visit from time to time and ask the question whether the ball is at least partly in our courts, and if so how to set about it.

One practical strategy to handle this link issue, seems to be for researchers to become thoroughly familiar with the manifestos and policy agendas of the Governments that come into office from time to time. Wherever they reflect the public will, it may be contended that it is even incumbent on the intellectuals to devote at least a part their best of skills to attain such societal goals. This may sound somewhat provocative to many conventional thinkers and researchers. But then, what other avenues are there to comprehend the public mind and the will? My contention is that it may become even detrimental to the interests of the research Faculties, Institutes and Centres to ignore the political manifestoes and

drag ourselves more and more towards ivory tower attitudes while cuddling the dreams of academic autonomy. In this regard, I am increasingly inclined to believe that, such conventional attitudes are also at least responsible to some extent for widening the gulf between research and policy making. At the same time let me ask , how many of us have taken the trouble to study the victorious manifestoes, or even the Constitutional Reforms Public Consultation Committee Reports, and the current government agendas such as *Megapolis* or Port City Development, Cluster Village Development Plans or the forthcoming 5 Year National Development Programme?

## 'Thinkers' and 'Tinkers'

A self-critical examination of our university research academia will reveal that, there are different types of academics whose personas and aspirations are distinctly contrasting. In my own view, the core of our academic community consists of professors who work in silence and present their findings at high level seminars, symposia and conferences, and eventually publish them in reputed journals. This silent minority of the academic community are hardly seen or heard and often more well-known outside the country than locally. They live away from the lime - light of social media and power politics and often they have to be 'discovered' when needed. Another category consists of academics who prefer to go to town even with their meagre, and often piece-meal and sometimes questionable research findings. They seem to love publicity than their research and often become oblivious of the depth of social impacts of their actions. A good example is the competing theories some scientists are propound, regarding the root causes of the kidney disease that takes the lives of so many hundreds of people every month! However, it is indeed difficult to bring them all to a round table discussion.

There is also a third category who are half-academics and half-politicians. The research they conduct are often painted with ideological biases, and sometimes they come out of their academic garbs and enter the mainstream political arena directly. Most of our academics who crossed the line that way, have not only ruined their own academic reputations but also performed disgracefully, sacrificing their independence of thought. Another category consists of those who blatantly seek power and prestige at any cost, often appearing at strikes, public agitations, *padayatras* and the like, with the hope of getting into powerful positions in the newly emerging Governments irrespective of their political colour or ideology. Apart from politics, some researchers are also hell-bent on earning more and more money through lucrative research projects and consultancies. The arising uneasy question here is how serious research efforts can be undertaken by the young generation in such a mixed community of intellectuals.

Among the researchers, one can also notice loners as well as teams of multiple authors, the latter phenomenon is mostly observable in science-oriented disciplines. When it comes to their evaluations for promotions, the latter demands mathematical calculations. However, there are occasions when evaluators engross themselves with small sieves; the bigger decisions are taken through subjective means.

In the mean time, the younger generation of researchers have also evolved their own academic traits and attributes in the changing circumstances. Their concern often appears to be more on 'quantity' than

'quality'. This unfortunately appears at least partly in response to the endless promotional circulars and their stipulations emanating from higher authorities by indirectly promoting quantity than quality. Some of our most revered scholars like Sarachchandra, Paranavitane or Deraniyagala would have hardly had a chance if they were subjected to the currently operational rigorous quantitative assessment procedures! In this bizarre scenario we can occasionally observe academics who have produced over 100 research papers within amazingly short periods or who have written 10-15 'books' within a span of mere 5-6 years – in consonance with the normal promotional period!.

One can, of course, place the blame for this unhealthy academic culture with the changes in the economy and the society at large, particularly after the adoption of free economic policies during the last few decades. At the same time, it may be noted that, the university system was relatively immune to privatization processes, despite many socio-economic compulsions for them such as the massive outflow of private funds to other countries for educating the young who could not enter the local universities. Their destinations include some of our less developed neighbouring countries who may offer even lower quality Degrees for lucrative fees. It may be noted in this controversial context that ideological and political considerations seem to have taken precedence over the massive economic losses incurred by the country.

## Empowering the Thinkers

As explained already, in our country, there appears to be widespread misgivings among the more educated general public, that the prevailing system of governance not only fails to accommodate new thinking, but indirectly discourages independent thinkers from entering the mainstream policy making processes. The virulent kind of 'Sri Lankan Democracy' that began to flourish during the last four decades, provides abundant evidence for an antithesis of the original thinking of the early philosophers and architects of democracy. For instance the words of Plato (c. 427-c. 347 BC) who defined a philosopher as a 'wisdom lover', still resonates and deserves to be revisited. Plato's argument that 'philosophers' should be the rulers of the Republic is valid and still persuasive. In his monumental work - 'The Republic', Plato argued that 'Kings should become philosophers or that philosophers should become Kings, or philosopher Kings, as they possess a special level of knowledge, which is required to rule the Republic successfully'. He further stressed that,

> *"there will be no end to the troubles of States, or of humanity itself, till philosophers become Kings in this world, or till those we now call Kings and rulers really and truly become philosophers, and political power and philosophy thus come into the same hands".*

At a time when we are desirous of following the path of a 'knowledge economy', the thoughts of early architects of democracy become even more relevant and useful. Let us look at the political paths that we were pursuing knowingly or unknowingly since Independence. At the time of National Independence, our leaders acted with much devotion, vision and wisdom. One can notice in the early video tapes how the first Prime Minister Senanayake spoke with deep sentimentality and national

commitment. He used to consult some of the the best thinkers of the day, particularly Ivor Jennings the first Vice-Chancellor of the University, almost on a regular and routine basis. It may also be recalled that he also wrote a book with the title "Agriculture and Patriotism". Then again when he wrote the forward to another monumental work by R.L. Brohier on Ancient Irrigation Works, it reflected his vision of the public service. That period of economic prosperity and national harmony gradually faded away, giving rise to the present political culture with hardly any deep-rooted values or ethics.

The rise of present ruling classes, irrespective of their party affiliations, that had now become a subject of public ridicule, and their hegemony, deserve more elaborate analyses. Let me therefore touch only briefly on a few outstanding characteristics. Most of the present generation of politicians are the sons and daughters of old and new political families, and much had been written on the subject of kinship in Sri Lankan politics. The real leadership still remains in the hands of the progeny of *Mudliars and Muhandirams* whose loyalties were with the English Monarchy than with that of our own. These were the political babies who have benefitted from that enormous wealth. and family power was passed on to them by their colonial fore-fathers. Their world outlook still remains not so much with the national ethos but with the wild liberalism of the west. The roots of their *comraderie* and intellectualism are nurtured by the colonial schools, as could be seen in the composition of the Cabinet of Ministers last few decades.

Since the brief observations presented above may sound like an indictment of the prevailing political system, let me elaborate on it a little further. The malady of the present system is rooted in the issue that, higher anyone goes on the hierarchy of power, less and less time they can devote for deep thinking or reading. Almost all his time is spent on political meetings, social obligations and the endless selfish requests of his constituents. Similarly a high official in the administration has to keep on moving from one administrative meeting to another having hardly any time to pause and ponder, but obliged to make far reaching decisions affecting the society often under political compulsions. On top of that, he has to render unto his political lords with much awe and humility, and follow humbly all their public functions, if he has to have some peace of mind or even to save his position itself. Any decision making without deep analysis and thinking is indeed obviously detrimental to the well-being of the country. A case in point is the infamous Hedging Deal for petroleum supplies which is still continuing to have its devastating impact on the average consumer.

The persona of an average politician has been adapted over the years to serve his political overlords on one hand, and at the same time to keep his officers under control, often through the tactics used to humiliate them before the eyes of the public. It could be recalled that, there had been occasions when administrative officers have not only been humiliated, but also physically assaulted, while the politicians to go scotch free. The tragic part of such episodes is that most such politicians are less educated, or have had a poor record in the schools due to rough behaviour, than their subordinate administrative officers!. It has been often noted that, about one-fourth of the parliamentarians had much less education than their administrative subordinates who had come up to their current ranks and positions through hard work and highly competitive selection processes.

In most government organizations, appointments are made from the labour grade and sometimes even up to higher positions from the lists of loyalists submitted by the Honourable Ministers. Those with higher academic achievements are therefore wilfully suppressed giving way to the mediocrity to handle government organizations where delays, inefficiencies and corruption become rampant. The key issue here is under what law the Honourable Ministers are given this level of power and authority to abuse everything at their will and pleasure. At this time of Constitutional Reform, it may therefore be prudent to define the powers, duties and functions of local politicians, the Members of Parliament, Ministers and even those above them, without leaving the average citizens under their mercy, will and pleasure.

In this regard, it may be stressed that, all others in the public service from bottom to the top have their functions and duties clearly defined and there is hardly any reason as to why the same principle cannot be applied to the politicians as well. Practically such a suggestion may appear to be an almost impossibility, since any such change to the Constitution has to be ultimately approved by the same groups of politicians, creating a situation of judge and the jury joining together *or creating a 'naduth hamuduruwange baduth hamuduruwange'* syndrome.

It is indeed necessary to contribute even in small ways to create a society and a culture in which the knowledge and wisdom are valued and respected. In order to reach this noble goal, even a silent cultural revolution appears justifiable. The nature and form of this revolution in this country has to be designed and executed by the thinkers of the new generation of researchers and intellectuals.

In conclusion, the key message to be delivered to the graduands who receive post graduate Degrees and Diplomas today is that you are entering a world of fierce competition and power play. The higher you go up the bigger the pressures and challenges will be. It is important not to restrict yourself strictly to the area of your specialization, but to keep your antennas up in order to receive signals from the rest of the world. It is not just sufficient to be a good researcher or scientist, but one has to struggle to defend the thirst, dignity and respect for knowledge, that would be trampled by the unscrupulous rulers. The place that intellectuals deserve in the society and their productive role in good governance will not automatically come unless they are ready to struggle for it.

With those words let me wish you a bright future and a productive and satisfying role in the development of our motherland!

*2016.08.02*

# 53

# රැකියාවකට ඔබ සූදානම් ද?

## මහාචාර්ය ඩබ්ලිව්. එම්. අබේරත්න බණ්ඩාර

ප්‍රථමයෙන්ම, අද දින උපාධි ලැබූ සියලුම උපාධිධාරීන් හා උපාධිධාරිනියන් හට ඔවුන්ගේ ජයග්‍රහණ වෙනුවෙන් මාගේ උණුසුම් සුභ පැතුම් පිරිනැමීමට මම කැමැත්තෙමි. දෙවනුව මෙම උපාධි ප්‍රදානෝත්සව දේශනය සඳහා මා හට ආරාධනා කිරීම වෙනුවෙන් අප සරසවියෙහි උපකුලපතිතුමාට ද, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයෙහි පීඨාධිපතිතුමා ඇතුළු පිඨ මණ්ඩලයෙහි සියලුම දෙනාටද, බාහිර උපාධි ඒකකයෙහි අධ්‍යක්ෂතුමාටද, එහි ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීතුමා ඇතුළු කාර්ය මණ්ඩලයෙහි සියලු දෙනාටද මාගේ හෘදයංගම ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. මෙම දේශනය සඳහා මා හට ආරාධනා කිරීම මා ලද විශාල භාග්‍යයක් කොට සැලකීමට මම කැමැත්තෙමි. එමෙන්ම ඒ සඳහා ආරාධනා කිරීම 1977 සිට මේ දක්වා ශ්‍රී ජයවර්ධනපුර සරසවියෙහි ආචාර්ය මණ්ඩලයෙහි සාමාජිකයකු ලෙස විශ්වවිද්‍යාලයට මා විසින් ඉටු කරන ලද සේවය අගය කිරීමක් හා ඒ සඳහා මා වෙත දක් වූ උපහාරයක් කොට සැලකීමට කැමැති බව මෙහිලා සඳහන් කර තැබීමටද කැමැත්තෙමි.

අද දින උපාධි ලැබූ සියලුම උපාධිධාරීනි,

ඔබ අප සැම දෙනාටම ජීවිතයෙහි නොයෙකුත් අරමුණු පවතින අතර අප සැම විටම උත්සාහ කළ යුත්තේ එම අරමුණු උපරිම ආකාරයෙන් ළඟා කර ගැනීමටය. අරමුණු ළඟා කර ගැනීමේදී අභියෝගවලට මුහුණ දීමට සිදු වීම සාමාන්‍ය දෙයකි. අපගේ සාර්ථකත්වය මැනිය හැකි වන්නේ එම අභියෝග කොපමණ ප්‍රමාණයක් ජය ගැනීමට අප සමත් වන්නේ ද යන සාධකය මතය. ලෝකයෙහි බිහි වූ ශ්‍රේෂ්ඨ ආගමික ශාස්තෘන් වහන්සේලාද, දාර්ශනිකයන්ද, විද්‍යාඥයන්ද සාර්ථකත්වය ලබා ගෙන ඇත්තේ මුහුණ දුන් අභියෝග ඔවුන් විසින් ජය ගන්නා ලද නිසාය. ඔබට මුහුණ දීමට සිදු වූ සියලුම අභියෝග ජයගෙන අද දින උපාධිය ලබාගැනීමෙන් ඔබ ලෝකයට පෙන්වා දී ඇත්තේ ද ඔබ සාර්ථක අයෙකු බවය. යම් හෙයකින් එම අභියෝග හමුවේ ඔබ පරාජය වී උපාධිය අහිමි වූයේ නම් ඔබ සාර්ථක අයෙකු ලෙස පිළි ගැනීමට කිසිවෙක් ඉදිරිපත් නොවනු ඇත.

උපාධියක් ලබා ගත් ඔබගේ අනාගත අරමුණ කුමක් දැයි මා විමසුවහොත් වැඩි දෙනෙකුගේ පිළිතුර වන්නේ ''හොඳ රැකියාවක් ලබා ගෙන ඒ හරහා ජීවිතයෙහි අනෙකුත් අභිලාෂයන් ළඟා කර ගැනීම' යන්න බව මම දනිමි. එම අරමුණු ඉටු කර ගැනීමට මෙතෙක් මුහුණ නොදුන් අභියෝග රැසකට මුහුණ දීමට ඔබට සිදු වනු ඇත.

යම් ආයතනයක් ඔබට රැකියාවක් ලබා දෙන්නේ ඔබ උපාධිධාරියෙකු වූ නිසාම හෝ උපාධිධාරීන්ගේ රැකියා ප්‍රශ්නය විසඳීමට ආයතනවලට ඇති සමාජ වගකීම නිසාම නොවනු ඇත. රැකියාවකට ඔබ බඳවා ගන්නේ ආයතනයෙහි අරමුණු ඉටු කර ගැනීම සඳහා ඔබගේ දායකත්වය ලබා ගැනීමටය. මේ නිසා ආයතනයක් ඔබ රැකියාවකට තෝරා ගැනීමේදී ඔබගේ දැනුමට වඩා රැකියාව හොඳින් කිරීමට ඔබට ඇති හැකියාව ගැන වැඩියෙන් සලකා බලනු ඇත. ඔබ දන්නේ

කුමක්ද යන්නට වඩා ඔබට කළ හැක්කේ කුමක්ද යන්න ආයතනයකට වැදගත් වීම මෙයට හේතුවයි. ඔබට කළ හැක්කේ කුමක්ද යන සාධකය සම්බන්ධයෙන් සලකන විට ඔබ සතු දැනුමට වඩා ඔබගේ ආකල්ප හා කුසලතා පිළිබඳව සැලකිලිමත් වනු ඇත. දැනුම අතින් ඔබ සැම දෙනාම බොහෝ දුරට සමාන වන නමුත් කුසලතා හා ආකල්ප අතින් එක සමාන නොවන නිසා සමාන දැනුම සහිත කිහිපදෙනෙකු අතුරින් ආයතනයක් රැකියාවක් සඳහා තෝරා ගනු ඇත්තේ ආයතනයෙහි අරමුණු ඉටු කර ගැනීම සඳහා දායක වීමට යහපත් ආකල්ප අතින් වැඩිම පුද්ගලයාය. මේ නිසා ඔබ රැකියාවක් සඳහා සූදානම්ද යන කරුණ පිළිබඳව විමසා බැලීමේදී වඩාත් වැදගත් වන්නේ රැකියාවක් කිරීමට ඔබ සතුව පවතින ආකල්පයන්ය.

ඕනෑම රැකියාවක් සාර්ථකව ඉටු කිරීම සඳහා ඔබ සතු විය යුතු හා ආයතන ඔබගෙන් අපේක්ෂා කරන කාරණා ලෙසත කලට වේලාවට වැඩ කිරීම (Punctuality), කැපවීම (Dedication), වගකීම (Responsibity), කාල කළමනාකරණය (Time Management), ධනාත්මක චින්තනය (Positive Thinking) වැනි ඉතා වැදගත් කරුණු රැසක් විෂය දේශනවලදී ඔබ ඉගෙන ගෙන ඇත. මා මෙහිදී උත්සාහ කරන්නේ ඒවාට අමතරව රැකියාවක් කිරීමේදී ඔබට වැදගත් වන පහත සඳහන් කරුණු කෙරෙහි ද ඔබලාගේ අවධානය යොමු කිරීමටය.

ජීවිතය සඳහා නිශ්චිත අග්‍රස්ථ අභිලාෂයක් පවත්වා ගැනීම ( ඔබ අනාගතයේදී ළඟා කර ගැනීමට අපේක්ෂා කරන දෑ පමණක් මෙයින් අදහස් කරන්නේ නැත. ඔබගේ අරමුණු ඉටු කර ගැනීම සඳහා රැකියාවක නිරතවීමේදී ආයතනයෙහි අරමුණු ගැන ද පැහැදිලිව හඳුනාගෙන තිබිය යුතුය. ලැබෙන වැටුප් හෝ අනෙකුත් දීමනා පිළිබඳව පමණක් නොසලකමින් ආයතනයෙහි අරමුණු හැකිතාක් උපරිමයෙන් ද ඔබගේ සේවායෝජකයා උපරිම ලෙස තෘප්තිමත් වන ආකාරයට ද රැකියාව කිරීමේ අභිලාෂය ද ඔබගේ අග්‍රස්ථ අභිලාෂය තුළ ඇතුළත් විය යුතුය. රැකියාවක් සඳහා සම්මුඛ පරීක්ෂණයකට ඉදිරිපත් වන විට ඔබ එම රැකියාව තෝරා ගන්නේ ඇයි දැයි ඇසුවහොත් ඔබ ප්‍රකාශ කළ යුත්තේ ඔබට එම ආයතනයෙහි අභිලාෂයන් හොඳින් ඉටු කර දීමේ හැකියාවක් ඇති නිසා එම රැකියාව තෝරා ගන්නා බවය. බොහෝ විට අයදුම්කරුවන් එසේ ප්‍රකාශ නොකර තමන්ගේ සුදුසුකම් ගැන ප්‍රකාශ කිරීමට පෙළඹෙන නිසා එයමට ඔහු රැකියාවට සුදුස්සකු නොවීමට හේතුවනු ඇත.

**ආත්ම ශක්තිය:** ඔබ ආශා කරන්නේ ඔබ කැමතිම රැකියාවක් කිරීමට බව රහසක් නොවෙයි. කැමති රැකියාවක් කිරීමට ලැබීම නිසා එම රැකියාව සතුටින් කාර්යක්ෂමව කළ හැකි යයි ඔබ සිතනු ඇත. එහෙත් පවතින තත්ත්වයන් නිසා අප කැමතිම රැකියාවක් අපට නොලැබෙනු ඇත. අප අකැමැති රැකියාවක් ලැබුණහොත් අපට ඇත්තේ විකල්ප දෙකකි. එකක් නම් රැකියාව අතහැර දැමීමය. බොහෝ විට එය කළ නොහැකි වෙයි. ඒ නිසාම අකමැත්තෙන් වුවද ලැබෙන රැකියාව කරගෙන යාමේ දෙවැනි විකල්පය තෝරා ගැනීමට ඔබට සිදු වනු ඇත. අකැමැති රැකියාවක නිරත වන විට ඒ සඳහා ඔබට විශාල ආත්ම ශක්තියක් අවශ්‍යම වෙයි. මේ සඳහා ඔබ විසින් ඔබ කෙරෙහිම විශ්වාසය තැබිය යුතුය. මෙහිදී අවශ්‍ය සියලුම හැකියාවන් හා දක්ෂතාවන් ඔබ සතුව ඇතැයි සිතීමට පුරුදු වන්න. ඔබ ඔබව විශ්වාස නොකරන විට අන් අයද ඔබවට විශ්වාස නොකරන නිසා ''මම එය කරමි'' ''I will do it''යන අධිෂ්ඨානයෙන් කටයුතු කිරීමට සෑම විටම උත්සාහ ගන්න. ඔබ අකමැති රැකියාවක් ලැබුණ විට එය ඔබගේ සුදුසුකම්වලට ගැළපෙන්නේ නැත, ඒ සඳහා ඔබට හැකියාවක් නැත යනාදී මැසිවිලි නොනඟා උපරිම අයුරින් සිය කාර්යය ඉටු කිරීමට උත්සාහ ගත යුතුය. ආයතන අපේක්ෂා කරන්නේ මට එය කළ නොහැකි යයි ප්‍රකාශ කරන අය නොව, මම එය කෙසේ හෝ කරමි යන හැඟීම හා අධිෂ්ඨානය ඇති පුද්ගලයන්ය. ආත්ම විශ්වාසය ඇති විට කළ නොහැකි

දෙයක් මෙලොව නැති බව සලකන්න. ආත්ම ශක්තිය පිළිබඳව මහා කවි ෂේක්ස්පියර් විසින් සඳහන් කර ඇති පහත සඳහන් වැකිය පිළිබඳ ඔබගේ අවධානය යොමු කරන්න.

"Your doubts are traitors, and make us lose the good we oft might win by fearing to attempt"

ලී මඩුවක උපත ලැබූ ඒබ්‍රහම් ලින්කන් ඇමරිකාවේ ජනාධිපතිවරයා වූයේද, දුප්පත් පොත් තබන්නෙකු ලෙස රැකියාව ඇරඹූ රොකර්පෙලර් ලෝකයේ ධනවත්ම පුද්ගලයා බවට පත් වූයේද ඔවුන් සතු වූ ආත්ම විශ්වාසය නිසාය. මේ නිසා ආයතනය ඔබට පවරන යෝග්‍ය ඕනෑම කාර්යයක් ප්‍රතික්ෂේප නොකර ආත්ම විශ්වාසයෙන් එම කාර්යය ඉටු කිරීමට අවශ්‍ය යහපත් ආකල්පය ඔබ සතු විය යුතුම වෙයි. මෙහිදී වැදගත් වන තවත් වැදගත් කරුණක් ගැන සඳහන් කිරීම අවශ්‍යම වෙයි. එනම් ආත්ම විශ්වාසයෙන් යම් කාර්යයක් කළ හැකි නම් ඕනෑම බැරෑරුම් කාර්යයක් ඔබට අවශ්‍ය ආකාරයට පාලනය කර ගත හැකි වන බවය. එසේම ආත්ම විශ්වාසයෙන් කටයුතු කිරීම මඟින් ආයතනයේ සියලුම දෙනාගේ මෙන්ම ඔබගේ සේවාදායකයන්ගේ අවධානය ඔබ වෙත යොමු කරවා ගත හැකි වෙයි.

**මුලපිරීමේ හැකියාව:** රැකියාවන් සඳහා ඔබ තෝරා ගන්නා ආයතනය ඔබ විසින් ඉටු කළ යුතු වන කාර්යයන් වෙනත් අයෙකු විසින් පවසන්නට පෙර ඔබ විසින්ම ආරම්භ කිරීම ඔබගේ අපේක්ෂා කරනු ලබයි. ඔබට පවරා ඇති කාර්යය කාර්යක්ෂමව ඉටු කරන අතරම අනෙකුත් අයගේ කාර්යයන්ට සහාය දැක්වීමට ඔබ උත්සාහ ගත යුතුය. එසේ අන් අයට සහාය විය නොහැකි නම් ඔබට පැවරී ඇති කාර්යයන් අඩු කාලයකින්, වැඩි කාර්යක්ෂමතාවකින් කළ හැකි ක්‍රමයක් සොයා ගැනීමට උත්සාහ ගන්න. තරඟකාරී ලෝකයක ආයතනය සොයන්නේ පිරිවැය අඩු කර ගත හැකි හා ගුණාත්මක බව වැඩි කර ගත හැකි නව්‍යතා නිසා ඒ සඳහා මුල පිරීම සෑම විටම ඔබගෙන් අපේක්ෂා කරනු ලබයි. නව්‍යතාවයකට මුල පිරීමට ඔබට හැකි නම් අන් අය අතුරින් සුවිශේෂ පුද්ගලයෙකු බවට පත් වීමටත් ඒ සඳහා ගෞරවය හා වෙනත් වරප්‍රසාද ලැබීමටත් ඔබට අවස්ථාව ලැබෙනු ඇත.

**සිතා ගැනීමේ හැකියාව:** අලුත් දෙයකට මුල පිරීමට මෙන්ම ඔබ කරන රැකියාව නිර්මාණශීලීව කිරීම සඳහා යම් දෙයක් පිළිබඳව සිතා ගැනීමට ඇති හැකියාව ඔබගෙන් අපේක්ෂා කරන තවත් කරුණක් වෙයි. සිතා බැලීම සඳහා විශාල අධ්‍යාපනයක් අවශ්‍ය නොවනු ඇත. ඔබ කළ යුත්තේ ඔබ වටා ඇති යමක් අඩු ශ්‍රමයකින්, අඩු කාලයකින් හා අඩු සම්පත් ප්‍රමාණයකින් කළ හැකි ආකාරයක් ගැන සිතා බැලීමය. අපතේ යන යම් දෙයක් හෝ විනාශ වන යම් දෙයකින් වටිනාකමක් උපදවා ගත හැකි ක්‍රමයක් ගැන සිතා බැලීමට ඔබට හැකි නම් ඒ හරහා ආයතනයට යම් අගයක් එකතු කිරීමට ඔබට හැකිවනු ඇත. ඔබට පවරන කාර්යය පවරන ආකාරයෙන්ම ඉටු කිරීමට වඩා ඒ ගැන සිතා බලා වඩාත් හොඳින් ඉටු කිරීම ආයතනය ඔබගෙන් අපේක්ෂා කරයි. සිතා බැලීමේ හැකියාව ඔබ වටිනාකමක් සහිත පුද්ගලයෙකු බවට පත් කරවයි. නූතන සන්නිවේදනය සඳහා සැටලයිට් තාක්ෂණය සොයා ගැනීමට ශ්‍රීමත් ආතර් සී. ක්ලාක් මහතාට හැකි වූයේ ඔහු සතුව තිබූ සුවිශේෂී සිතා ගැනීමේ හැකියාව නිසාය. එය ඔහු ලෝකයටම ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකු බවට පත් කිරීම සමත්විය. ශ්‍රේෂ්ඨ අයෙකු වීමට සිතා ගැනීමේ හැකියාවේ වැදගත්කම එයින් ඔබට අවබෝධ කරගත හැක.

ලැබෙන දෙයට වඩා වැඩි යමක් ලබාදීම: තමන්ට ලැබෙන වැටුපට වැඩි යමක් කිරීමට කැමැත්තක් දැක්වීම ආයතනය ඔබගෙන් අපේක්ෂා කරනු ඇත. මේ නිසා සේවය වෙනුවෙන් ලැබෙන දීමනාවට වඩා වැඩියෙන් යමක් කිරීමේ පුරුද්ද (Habit of performing more work than paid for) තමන් විසින් ඇති කරගත යුතුය. රැකියාවක් කිරීමේ දී ප්‍රථමයෙන් ඔබ විසින් ඉටු කළ යුතු වන කාර්යයන්

උපරිමයෙන් ලබාදීමටත් ඉන් පසුව ඒ සඳහා ලැබිය යුතු දෑ ලබා ගැනීමටත් ඉගෙන ගත යුතුය. මෙය දීම හා ගැනීම (Give and Take) පිළිබඳ ප්‍රතිපත්තිය වෙයි. ඔබ ඉටු කළ යුතු යුතුකම් ගැන නොසිතා අයිතිවාසිකමක් ගැන පමණක් නොසිතන්න. එයට හේතුව ඔබගේ අයිතිවාසිකම ඔබ ඉටු කරන සේවයේ ප්‍රමාණය හා ගුණාත්මක බව මත රඳා පැවතීමට අඩුවෙන් සේවය කර වැඩියෙන් වරප්‍රසාද දිනා ගැනීමේ හැසිරීම් රටාවෙන් ඉවත් වී වැඩියෙන් වැඩ කර ඒ සඳහා සුදුසු හා අයිති වරප්‍රසාදයන් ලබා ගැනීමට ඔබ පුරුදු විය යුතුය. කළ යුතු වන දෙයට වඩා වැඩි යමක් කිරීමට ඔබ කැමති නම් දැනට සිටින තත්ත්වයට වඩා ඉහළ තත්ත්වයකට යාමට අවශ්‍ය ඉඩ කඩ පහසුවෙන් ඔබ වෙත ළඟා වන බව අවබෝධ කරගෙන ක්‍රියා කිරීමට උනන්දු වන්න.

**සමාජීය (ප්‍රජා) උනන්දුව:** ඔබගේ පෞද්ගලික අරමුණු සාර්ථක කර ගැනීමට වඩා ආයතනයෙහි පොදු අරමුණු ඉටු කර ගැනීම සඳහා කටයුතු කිරීම ආයතන ඔබගෙන් අපේක්ෂා කරයි. ආයතනයෙහි අරමුණු අභිභවා ඔබගේ පෞද්ගලික අභිමතාර්ථ වෙනුවෙන් ක්‍රියා නොකිරීමට ඔබ සෑම විටම වගබලා ගත යුතුය. ආයතනයේ අරමුණු ඉටු වන තරමටම ඔබගේ අරමුණු ඉටු කර ගැනීමට පහසු වන්නේ සෑම විටම ඔබ දෙන දෙයට වඩා වැඩි යමක් අනාගතයේ දී ඔබට ලැබීමට හැකිවන නිසාය. මේ නිසා වර්තමානය වෙනුවෙන් අනාගතය කැප නොකර, අනාගතය වෙනුවෙන් වර්තමානය කැප කිරීමට උනන්දු වන්න. ඔබ සාර්ථක වන්නේ කොතරම් දුරට සමාජීය උනන්දුවකින් ක්‍රියා කරන්නේ ද යන කරුණ මතය. එයට හේතුව ඔබ වැඩ කරන්නේ කණ්ඩායමක් සමඟ පොදු අරමුණක් ළඟා කර ගැනීම සඳහා වීමය. සමාජීය උනන්දුව ගැන ඔබට ඉතා කුඩා මීමැස්සාගෙන් විශාල පාඩමක් උගත හැක. මීමැස්සන් වදයට පැණි පුරවන්නේ මුළු මී මැසි ජනපදයේ සියලුම දෙනාගේ අවශ්‍යතාව සඳහා මිස තමන්ගේ අවශ්‍යතාව සඳහා නොවේ. එය සමාජීය උනන්දුව කදිමට විදහා පෑමක් වෙයි. ආයතනයක අරමුණු සාර්ථක කර ගැනීමට සාමූහිකව කටයුතු කිරීමේ වැදගත්කමට තවත් කදිම නිදසුනක් ලෙස ඔබ ළමා වියේදී කියවා ඇති වටු කුරුල්ලන්ගේ දැල එසවීමේ කතාව පෙන්වා දීමට කැමැත්තෙමි. ඔබ විසින් අවබෝධ කරගත යුතු වන්නේ අන් අයගේ සහයෝගය හා සාමූහික උනන්දුව නොමැතිව කිසි විටෙකත් ඔබට තනියෙන් සාර්ථක විය නොහැකි බවය. ඒ සඳහා සමාජීය උනන්දුව ඇතිව කටයුතු කිරීමට ඔබ සතු හැකියාවන් වැඩි දියුණු කර ගන්න.

**ස්වයං පාලනය:** වෙනත් අයෙකු විසින් ඔබ පාලනය කරනවාට ඔබ කැමති නැත එසේ නම් ඔබ විසින්ම ඔබ පාලනය කරගත යුතුය. සෑම ආයතනයක්ම ඔබගෙන් ස්වයං පාලන හැකියාවක් අපේක්ෂා කරයි. ස්වයං පාලනයක් ඇති විට ආයතනයට ඔබ සම්බන්ධයෙන් වැඩි අධීක්ෂණයක් යොමු කිරීමට සිදු නොවෙයි. බොහෝ ආයතන ඔබගේ සාර්ථකත්වය මනින්නේ ඔබ සම්බන්ධයෙන් අවශ්‍ය වන අධීක්ෂණයෙහි ප්‍රමාණය අනුවය. වැඩි අධීක්ෂණයකින් තොරව ඔබට කටයුතු කළ හැකි නම් ඔබ යම් මට්ටමක කාර්යක්ෂම අයෙකු ලෙසද අධික්ෂණයක් අවශ්‍යම නැත්නම් ඔබ ඉහළම කාර්යක්ෂමතාවට පත් වී ඇති අයෙකු ලෙස ද සලකනු ඇත. ස්වයං පාලනයක් ඇති විට ඔබට ඔබගේ මෙන්ම අනිකුත් අයගේ කටයුතු කෙරෙහිද විශාල බලපෑමක් ඇති කළ හැකි වන නිසා සිය කාර්යයන් සාර්ථකව ඉටු කළ හැකි වනු ඇත. එමෙන්ම ලැබෙන ඕනෑම ප්‍රතිඵලයක් උපේක්ෂාවෙන් භුක්ති විඳීමට ද එය ඔබට ශක්තියක් ලබා දෙයි. ස්වයං පාලනයක් ඇති අයෙකුට අන් අය සමඟ කලහයන් ඇති නොකරගෙන තම අවශ්‍යතා ඉටු කර ගැනීමට ඉඩ කඩ ලැබෙන නිසා ස්වයං පාලනයක් ඇති කර ගැනීමෙන් ඔබ සාර්ථක අයෙකු බව ඔප්පු කිරීමට උත්සාහ කරන්න.

**කාර්යය අඛණ්ඩව හා ප්‍රිය ජනකව කිරීම:** ඔබට පවරන කාර්යයන් පිළිබඳව දැඩි අවධානයක් යොමු කරමින් එය අඛණ්ඩව හා ප්‍රියජනක ආකාරයෙන් කරගෙන යෑමේ හැකියාව ආයතන විසින් ඔබගෙන් අපේක්ෂා කරන තවත් ගුණාංගයක් වෙයි. මෙය ඒකාකාරී බවින් මිදී විනෝදජනකව හා

අනෙකුත් සියලු දෙනාගේ සිත් තුළ ප්‍රබෝධයක් ඇති වන ආකාරයට කටයුතු කිරීමට ඔබට අවස්ථාව ලබා දෙයි. ඔබ සමග කටයුතු කිරීමට සෑම දෙනාම වැඩි කැමැත්තක් දක්වන නිසා ඔබ ආයතනය තුළ ප්‍රියජනක පුද්ගලයකු බවට පත්වේ. එමෙන්ම ඔබගේ සේවාදායකයන්ගේ අවශ්‍යතා ඔවුන් අපේක්ෂා කරන ප්‍රමාණයට වඩා හොඳින් ඉටු කර දීමට ද ඔබට අවස්ථාවක් සැලසේ. මෙමඟින් ආයතනයෙහි අරමුණු ඉටු කර ගැනීමට ඔබට වැඩි දායකත්වයක් ලබාදිය හැකි නිසා ඔබ සාර්ථකව කටයුතු කරන බව ඔබගේ ප්‍රධානීන් මැනවින් අවබෝධ කරගනු ඇත. ආරම්භ කළ කාර්යයන් අවසානය දක්වා දිගින් දිගට කරගෙන යාම ආයතන ඔබගෙන් අපේක්ෂා කරනු ඇත. ඔබ සාර්ථක වන්නේ ආරම්භ කරන කාර්ය ප්‍රමාණය අනුව නොව ඔබට අවසන් කළ හැකි වන ප්‍රමාණය අනුවය. මේ නිසා ඔබට හොඳින් කරගෙන යා හැකි කාර්යයන් තෝරා ගෙන ඒවා ආරම්භ කිරීම වඩාත් වැදගත් වේ. කටයුතු ආරම්භ කර ඒවා අවසන් නොකළහොත් ඔබ සම්පත් අපතේ යවනවා පමණක් නොව ඔබගේ අසාර්ථකභාවය පෙන්නුම් කරන බව ද මතක තබා ගන්න. ඒ නිසා සෑම විටම ආරම්භ කළ කාර්යය අවසන් කිරීමට උත්සාහ ගන්න.

**වැරදි හා අඩුපාඩු නිහතමානීව භාර ගැනීම:** ඕනෑම කාර්යයක් නිවැරදිව කිරීම ආයතනය අපගෙන් අපේක්ෂා කළ ද කාර්යයන් කිරීමේදී යම් යම් වැරදි හා අඩුපාඩු සිදු වීම ස්වාභාවිකය. වැරදි නොකළ කිසිම අයෙකු මෙලොව නැති බව මතක තබා ගන්න. වැරදි හා අඩුපාඩු පොතපතින් අපට ලබාගත නොහැකි පාඩම් උගන්වයි. වැරදි හා අඩුපාඩු මඟින් අපට ලැබෙන්නේ අත්දැකීම්ය. ඕනෑම කාර්යයක් සාර්ථකව කළ හැකි වන්නේ ඒ පිළිබඳව ඔබ සතුව ඇති දැනුමට වඩා අත්දැකීම් පදනම්කොට ගෙනය. එම නිසා සිදුවිය හැකි වැරදි හා අඩුපාඩුවලට බිය නොවී කළ යුතු කාර්යය කරන්න. වරදක් හෝ අඩුපාඩුවක් සිදු වූ විට එයට නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට හෝ එය අන් අය මත පැටවීමට උත්සාහ නොගෙන නිහතමානීව ඔබගේ වරද පිළිගැනීමටත්, එය නිවැරදිව කර ගැනීමටත් සූදානම් වන්න. ඔබ හිතාමතා වැරදි නොකරන බවත්, වරද සිදු වූයේ ඔබගේ අවබෝධයෙහි අඩුකම නිසා බවත් ආයතනයට අවබෝධ වූ විට දඬුවම් කරනවා වෙනුවට වරද නිවැරදි කරගැනීමට ආයතනය ඔබට සහාය ලබාදෙන අතරම ඔබ අත්දැකීම් ලබා ගැනීමට හා දියුණු වීමට කැමති අයෙකු ලෙස පිළිගැනීමට ආයතනය ද කැමති වෙයි.

**ආකර්ෂණීය පෞරුෂත්වය:** සෑම ආයතනයක්ම උත්සාහ ගන්නේ ආකර්ෂණීය පෞරුෂත්වයකින් යුක්ත අය තෝරා ගැනිමටය. පෞරුෂත්වය යනු ඔබගේ උස, මහත හෝ හැඩ රුව නොව ඔබගේ යහපත් ආකල්ප, පුරුදු හා සාරධර්මයන් ලෙස පෙන්වා දිය හැක. පෞරුෂත්වය ජලය වැනි දෙයකි. එය දමන භාජනයෙහි ස්වභාවය අනුව එහි හැඩය වෙනස් වෙයි. එසේම පෞරුෂත්වය ද පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වෙයි. අප මෙතෙක් කතා කළ යහපත් ආකල්ප හා ගුණාංග ඔබ සතුව ඇත්නම් ඔබ වඩාත් ආකර්ෂණීය පෞරුෂත්වයකින් හෙබි අයෙකු වනු නොඅනුමානය. එවිට සෑම දෙනාගේම ආකර්ෂණය ඔබ වෙත යොමු කර ගැනීම අපහසු නොවනු ඇත.

ඔබ රැකියාවකට සුදුසු දැනුම, කුසලතා හා ආකල්පවලින් යුක්ත, ආයතනයන් ඔබගෙන් අපේක්ෂා කරන පරමාර්ථ ළඟා කර දිය හැකි වටිනා ආකර්ෂණීය පුද්ගලයෙකු දැයි විමසමි. පිළිතුර ඔබම ඔබ ගැන ස්වයං විග්‍රහයක් මාර්ගයෙන් ලබාගැනීමට උත්සාහ ගන්න. මගේ ප්‍රාර්ථනය වන්නේ රැකියාවකදී අසාර්ථක පුද්ගලයෙකු නොවී සාර්ථක අයෙකු වීමට අවශ්‍ය සියලුම ශක්තීන් ඔබ තුළ වගා වී අනාගතයේදී ඔබ සාර්ථක අයෙකු වේවා යන්නය. මේ සඳහා ඔබට අවශ්‍ය ධෛර්යය හා වාසනාව ලැබේවා යි මම අවසාන වශයෙන් ප්‍රාර්ථනා කරමි. ඔබ සැමට ජය !

<u>*2017.01.04*</u>

# 54

# ඉගැන්වීම් හා ඉගැන්වීම පිළිබඳ සන්නිවේදනයන් සමුදායක්

මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර

''ගුරු'' යන යෙදුම අප සමාජයේ බහුලව භාවිතයට ආ උත්තම යෙදුමකි. 'ගුරු', 'දෙගුරු', 'තිලෝගුරු', 'ගුරුන්නාන්සේ', 'ගුරුකම්' යන යෙදුම් ඒ හා සමඟ යෙදෙන අන්‍ය යෙදුම් සමුදායකි. 'ගුරු' යයි සලකන්නේ යමක් 'උගත්' හෙවත් 'ඉගෙනුමක්' ලද කෙනෙකි. ඒ අනුව මේ යෙදුම 'ගුරු', 'ඇදුරු', 'මහැදුරු','වෙදදුරු' යනාදී වශයෙන් දිගු වී පවති. ඒ අනුව අපට යමක් ඉගැන්වූ කෙනෙකුට මේ මගින් 'ගුරු' යයි කීමට අමතක නොකරමු.

''ගුරු'' පදය විවිධාකාර ලෙස යෙදෙන හා යොදන අයුරු දැක ගැනීමට නම් ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය පෙරළා බැලිය යුතුය. (බලන්න ප්‍රථම භාගය 341-342 පිටු. 1963) ප්‍රාචීනවාදී සංස්කෘතියේ බහුල ලෙස යෙදෙන්නේ 'උත්තම' හා 'සාධු' යන අර්ථවලය. මේ හේතුවෙන් ඉංග්‍රීසියේ "Teacher" යන්නට වැඩි අර්ථයක් "guru" යන්නෙන් ප්‍රචලිතව පවති. මේ හේතුවෙන් "guru" යන්නට බහුල සන්නිවේදනාර්ථ සමුදායක් එකතු වී පවතී. 'ගුරුන්නාන්සේ' යන්න යාතුකර්ම ඇදුරන් හැඳින්වීමට යෙදෙන නාමයක් ලෙස හැඳින්වේ. එය කෙතරම්ද කිවහොත් ප්‍රාථමික සන්නිවේදනය ලෙස රංග කලාවේදී 'පොතේගුරු' යන්නත්, 'රංගගුරු', 'නාට්‍යගුරු' යනුවෙන් භාවිත කෙරේ. පරපුරෙන් පරපුරට පැවත එන ඥානය (දැනුම) මැනවින් හඳුනා ඒ ඥානය තම සිසු පරපුරට ප්‍රදානය කළ හැකි ශක්තිය ඇති කෙනෙකු වටා සැකසෙන කවය 'ගුරුකුලය' ලෙස සැලකේ. ඉගැන්වීමක් කළ හැක්කේ යමක් උගත් ගුරුවරයෙකු විසින්ය යන්න ජන සමාජයකදී වුව සැලකෙන්නේ සන්නිවේදනයේ ''ගුරු'' සංකල්පය හෙවත් (Teacher concept in communication) යන්නය. කිසියම් ජන මාධ්‍යයක් විභූෂණය වන්නේ ඊට අන්තර්ගත 'සන්දේශය' 'Message' දන උගත් සන්දේශකයන්ගෙන් සැදුම්ලත් විට යන්න මින් ගම්‍ය කෙරේ. කිසියම් මතයක් සන්දේශගත කිරීමට නම් ඒ මතය පිළිබඳ දැනුමක් ඇති (Knowlegeable) සන්නිවේදකයකු අවශ්‍ය බව ඉන් ප්‍රකාශ කෙරේ.

මට වඩාත් හුරු රංග කලාවයි. රංග කලාවෙන් කළ යුත්තේ හුදෙක් විනෝදය සඳහාම විනෝදය සැපයීම නොවේ. රංග කලාව එක්තරා ක්‍රමයක චිකිත්සාවකි. (Therapy) හෙවත් ගුරුකමකි. කුමක්ද චිකිත්සාව කියන්නේ? වෙදකමක්, එක්තරා සුවපත් කිරීමක්. රංග කලාව පැවත එන්නේ යාතුකර්මයෙනි. මොකක්ද යාතුකර්මය කියන්නේ? (Ritual) මානව අවශ්‍යතාවක් (Human cecessity) උපතේ සිට මරණය දක්වාම මානවයා යාතුකර්මයේ නියැළී සිටින කෙනෙකි. සුදාරකෝත්පත්තිය, නැතිනම් යහපත් දරු උපතක් සඳහා යාතුකර්මය අවශ්‍යය. දරු ගැබ දරා සිටින මවට එමඟින් ශාන්තියක් අත්පත් කරදෙනු ඇත. එපමණක්ද, ගිලන්ගතව සිටින කෙනෙකුගේ හිත මෙන්ම කයත් සුවපත් කළ හැකිය. ඊට ශාන්තිකර්ම අවශ්‍ය කෙරේ. ගිලන්ගතවීම ස්වාභාවිකයි. ඉන් මිදීම අවශ්‍යය. වැඩි කලක් යහතින් ජීවත් වීමට අකමැති කවුරුන්ද? ආයු, වර්ණ, සැප, බල නොකැමැති කෙනෙක් සිටිය හැකිද? සිටිය නොහැකිය. හිත සන්සුන් කර ගැනුමට රංග කලාව අවශ්‍ය නොකෙරේද? සන්සුන් සිත සුව එළවයි. විනෝදය හා විවේක සුවය බද්ධ වී පවතී. රංග කලාවට සම්බන්ධ වන හැම කෙනෙකුන්ම සන්සුන් සිතින් සිටිය යුතුයි. රංග කලාවේ නියමුවාට එබැවින් ගුරුන්නාන්සේ යන්න ගැළපේ. කෙමෙන් රංග කලාවට සම්බන්ධ හැම කෙනෙක්ම ''ගුරු'' බවට පත්වේ.

කොහොමද එහෙම වෙන්නේ? විශාල ප්‍රේක්ෂකාගාරයකට ඉගැන්වේ. මොනවද උගන්වන්නේ? විවිධාකාර අත්දැකීම්, චින්තන, මෙහෙයුම්, යමක් උගන්වන්නා ගුරුවරයා. ඉගෙනීම (learning) හා ඉගැන්වීම (teathing) නොමැතිව ජීවත්විය නොහැකිය. ජීවත් වුණත් එය සැබෑ ජීවිතයක් නොවේ. 'උපන්නාට මේ ලොව වැනෙමින් සිටීමක්' 'ටික දෙනෙකුට උගන්වන්න, බොහෝ දෙනෙක් ඉගෙන ගනිති' කොන්ෆියුසියස්තුමා තමයි. එහෙම කිව්වේ.

අපට පෙරාතුව ජීවත් වූ ගුරුවරුන්ගෙන් අපි ඉගනුමක් ලැබුවා නොවේද? දැන් අපි, අපට පසුව එන අයට උගන්වනු ලබනවා. රංග කලාව උගතහොත් බොහෝ දේ උගත හැකිය. Watcher Concept (ආරක්ෂක සංකල්පය) හා Forum Concept (මණ්ඩප සංකල්පය) ගුරු සංකල්පයෙන් පසුව එන සන්නිවේදන සංකල්පයන්ය.

'සන්නිවේදකයා', 'ගුරු සංකල්පය' ගුරු කොට ගත යුතුය යන්න විවිධාකාර ලෙස ප්‍රකාශ කෙරේ. තමන් දැන අන්‍යයන් දැනුම ඇත්තන් කළ යුතුය යන්න මින් ප්‍රකාශිත අර්ථය යි. බුදුන් වහන්සේ ද සිය භික්සඟනට පැවසූ පරිදි, 'චරථ භික්ඛවේ චාරිකං චරමානු, බහුජන සුඛාය, බහුජන හිතාය' යන්න මෙහිදී සිහි කටයුත්තකි. තම භික්සඟන දැන උගත් පිරිසක් වීම හේතුවෙන් ඔවුන්ගෙන් බණ දහම් උගන්නා ශ්‍රාවක (ග්‍රාහක) මණ්ඩල දැන උගන්වන අයුරු අප වටහා ගත යුතුය. ජනමාධ්‍ය භාවිතයට මෙය අපූරු පසුබිමක් සකසයි. මේ කරුණ මැනවින් පෙන්නුම් කරන්නේ දූතෙයා්‍ය සූත්‍රය අනුසාරයෙනි. නැණවත් දේ උගන්වන ගුරු හිමියන් අපේ රටේ බහුලව ගුරු හාමුදුරුවෝ යනුවෙන් භාවිතයට ගැනී පවති. වඩාත් සමීපව බලන කල්හි ශ්‍රාවක, ග්‍රාහක මණ්ඩල දැනුමැත්තන් බවට පත් කිරීමට නම් භාණක ස්ථානය මැනවින් සන්නිවේදක පෝෂණයේදී තිබිය යුතුය.

'ගුරුන්ටත් අකුරු වරදි' යන ජන කියමනේ සැඟවුණු හෙවත් නිලීනාර්ථ (Hidden meanings) සමුදායක් පවති. ගුරුන්ට තමන් උගත් දේ වැරදීමට හේතුවක් සොයාගත නොහැකිය. එහෙත් ගැඹුරින් කල්පනා කර බලන විට මෙය ගුරු පුහුණුව පිළිබඳ සංකල්පයක් ලෙස සැලකිය හැකිය. තමන් නිසි ලෙස ඉගෙනුමක් ලද ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වීම ගුරු කාර්යයයි. මෙය වරදින්නේ ගුරුවරයා නොමඟ යැවීමෙන් හෝ මංමුළා කිරීමෙනි. ගුරු වෘත්තිය මස්ත බාල්දු වූ කල්හි ද මෙය සිදු වනු වැළැක්විය නොහැකිය. ගුරුන්ට වැරදීම යනු ඔවුන්ගෙන් ඉගෙනුම ලබන සිසුන්ටද වැරදීමකි. එමගින් මුළු පරපුරකටම වැරදීමකි.

'තමන්ට කවුද ශිල්ප ශාස්ත්‍ර ඉගැන්නුවේ' යනුවෙන් ඇසීම පෙර සිට පැවත එන ප්‍රශ්නයකි. ඉන් ගම්‍ය වන්නේ සරල ලෙස බලන කල' කවුද තමන්ගේ ගුරුවරයා?' යන්නය. 'මගේ ගුරුවරයා අසවලා' යනුවෙන් පටන් ගෙන 'අසවලා' යයි කී සැණින් කෙනෙකු එක්කෝ නිශ්ශබ්ද වනු ඇත. නැතහොත් තවත් ප්‍රශ්න අසනු ඇත. 'කවුද ඕවා ඉගැන්නුවේ?' යනුවෙන් ඇසීම ද සාමාන්‍යයෙන් සිදුවන්නකි. 'මම අහවල් විශ්වවිද්‍යාලයේ අහවල් ගුරුන්ගෙන් තමයි ශිල්ප ශාස්ත්‍ර ඉගෙන ගත්තේ' යයි කෙනෙකු පවසන්නේ මහත් ගර්වයකිනි. එහිම විකල්පය ද සිදුවනු අප ඇස් පනාපිටම දැක ගත හැකිය.

'ඔබේ රටේ බොහෝම ඉහළ වර්ගයේ ගුරුවරු ඇති නේද?' යන ප්‍රශ්නය මගෙන් කලකට උඩදී ඇසුවේ මහා සන්නිවේදන ශාස්ත්‍රඥයෙකු වූ මහාචාර්ය විල්බර් ශ්‍රාම් (Wilbur Schramm) මහතාය. මට ප්‍රථම වතාවටත්, අන්තිම වතාවටත් එතුමා මුණ ගැසුණේ හවායි රටේ හොනොලුලු හි පිහිටි ඊස්ට් වෙස්ට්, මධ්‍යස්ථානය (East West Centre) නමින් ප්‍රකට සන්නිවේදන ශාස්ත්‍රාලයේදීය. ශ්‍රාම් මහතා තුළ මා දුටුවේ අතිශය නිහතමානී උත්තම ගති ලක්ෂණ සමුදායකි. එතුමා මගෙන් එබඳු

ප්‍රශ්නයක් ඇසුවේ කිනම් හේතුවක් නිසාද යන්න මට ඒ අවස්ථාවේදී නොවැටහිණ. එහෙත් කල්යත්ම එසේ නගන ලද ප්‍රශ්නයෙන් එතුමා අපේක්ෂා කළ ප්‍රතිචාරය කෙබඳු දැයි මම වටහා ගතිමි. 'ඔව්, මහාචාර්යතුමනි' යයි පැවසූ මගේ මුවින් නිකුත් වදන් වැල මට මතකය. 'අපේ රටේ ඉතාමත්ම ඉහළ වර්ගයේ ගුරුවරු ඉන්නවා. ඒත් මට හරියටම ඔබතුමාට පිළිතුරු දෙන්නට පුළුවන්ද යන්න සැක සහිතයි. ඔබතුමා මගෙන් ඒවාගේ ප්‍රශ්නයක් ඇසුවේ මක් නිසා ද කියලවත් මට තේරුම් ගැනීම අපහසුයි.' 'මම හැම රටකින්ම මෙතැනට එන අයගෙන් මුලින්ම අහන ප්‍රශ්නයක් තමයි, තමන්ගේ ගුරුවරුන් ගැන. කල්පනාවේ නිමග්න වීමට තරම් සාධක සමුදායක් ඉන් බිහි විය. 'මට හමුවූ උත්තම ගණයේ ගුරුවරු කවරහුද?' මම මගෙන්ම ප්‍රශ්නයක් නැගුවෙමි. මට විටින් විට ඉගැන්වූ ගුරුවරු පෙළ ගැසී මගේ මතක ජවනිකා පිරෙන්නට වූහ. ඇතැම් ගුරුවරුන් අපට ඉගැන්වූ දේ සිහිපත් විය. ඇතැම් ගුරුවරුන් ගේ විවිධ නිර්මාණශීලි ඉගැන්වීම (Creative teaching) මට සිහිපත් විය.

පහුවදා විල්බර් ශ්‍රාම් මහතාගේ දේශනයකදී සන්නිවේදනයේ ගුරු සංකල්පය (Teacher concept in communication) යන්න අන්තර්ගත විෂයය බවට පත් විය. සන්නිවේදනය යන්න සාම්ප්‍රදායිකව මානව සමූහයා අතර විවිධ අර්ථවලින් පැවැත එන අයුරු සාකච්ඡා විය. කෙමෙන් සන්නිවේදනාර්ථ (Communication meanings) යන්න ද බිහි වූ අයුරු අපේ කතාබහට ලක්විය. එකම විෂය ධාරාවක විසිර පැතිර ගිය සන්නිවේදනාර්ථ සමුදායක් තිබිය හැක. මේ තත්ත්වය වටහා ගැනීම එක් පැත්තකින් වදන් ඔස්සේ බිහි වූ අර්ථවලින් කියවෙන දේ හඳුනාගත යුතුය. ඒ සඳහා පුළුල් ලෙස semantics හෙවත් පද අර්ථ පිළිබඳ අධ්‍යයනය කිරීමට සිදුවේ. semantics යන්න අර්ථ විචාරය ලෙසත්, පද අර්ථ විභාගය ලෙසත් හැඳින ගැනීම අපට උගන්වා ඇත. කෙමෙන් මෙකල එය සන්නිවේදනාර්ථ ලෙසද ගැනේ.

ගුරු සිත නොරිදවා
වේලාව නොවරදවා
බැති පෙම් උපදවා
අකුරු උගනී කුමරු සොඳවා

යන කාව්‍යශේඛර කවි පද හතර මගේ මුවට නැඟෙන්නේ විවිධ අර්ථ නඟමිනි. 'ගුරු සිත' යන යෙදුම කෙතරම් අපූරුද ? එහි හුදු වාච්‍යාර්ථය ඉක්ම වූ සියුම් සංකල්පයක් ඇතැයි මට හැඟේ. මේ නම් සාමාන්‍ය ගණයේ ගුරුවරයෙක් නොවිය හැකියි. 'මේ නම් සැබැවින්ම උත්තම ගණයේ ගුරුවරයෙකු විය යුතුය' යන හැඟුමක් නිදන්ගත වේ. 'අකුරු උගැනීම' යනු ශාස්ත්‍රඥභාවය ලබා ගැනුමකි. එය පහසුවෙන් ලද නොහැකිය. ඉගෙනුම හා ඉගැන්වීම (learning and teaching) පිළිබඳ පිරිපුන් දැනුමක් ලැබේ. නැණ, නුවණ ලැබ ගැනුමට නම් අකුරු උගත යුතුය. සුභාෂිතයේ එන 'උගත මනා ශිල්පයමයි මතු රැකෙනා' යන්න අපට මෙහිදී සිහිපත් වේ. නැණ නුවණ නොලබා සිටීම යනු අන්ධකාරයේ නිමග්න වීමකි. ගුරු සිත රිදවන්නේ නම් ඉන් ලැබෙන්නේ අනිෂ්ට ප්‍රතිඵලයන්මය. තවද අර්ථයක් වන ''ගුරු'' යනු උත්තම හෙයින් එවන් උත්තමයකුගේ සිත නොරිදවිය යුතු බවයි. ගුරු කෙනෙකුන්ගේ සිත නොහොබනා ලෙස රිදවීම වරදකටත් වඩා 'පාපයක්' බව පෙන්නුම් කෙරෙන ප්‍රබලතම නිදසුන ලැබෙන්නේ දෙව්දත් චරිතයෙනි. දෙව්දත් තම ගුරුන්ගේ සිත රිදවීය.

ගුරු පරපුර (generation of teathing) යනු උත්තම මානව සම්ප්‍රදායකි. එබැවින් ගුරුවරයා යනු හැමටම ඉහළින් සිටින හා හිඳවන කෙනෙකි. මුල්ගුරු, උපගුරු යනාදී යෙදුම් පහළ වී ඇතත් ඒ හැම කෙනෙකුටම නිවාස වන්නේ ගුරු ගෙදරය. ආදිතම යෙදුමක් ලෙස එය සැලකිය හැකිය. රජවරුන්ගේ දූ පුතුන් හෙවත් කුමර, කුමරියන් තම ඉගෙනුම් කටයුතු සඳහා රාජගුරුන් ලෙස පිදුම් ලද දිසාපාමොක් නමින් හැඳින් වූ ගුරුවරු සොයා යාම සම්ප්‍රදායක් විය. 'ගුරු තන්හි තබා සැලකීම' යනු පැරණි සම්භාව්‍ය සාහිත්‍යයේ එන සංකල්පයකි. තම ගුරුන් නමැද ඉගෙනුම් කටයුතු පටන් ගැනීමට ඉන් ඇරඹිණි. ගුරුවරයකු හමුවට යන සිසුවා කළේ, එකත්පස්ව හිඳීමකි. එය ගුරු ගෞරවය ලෙස හැඳින

ගත යුත්තකි. ගුරු ගෞරවය කෙමෙන් දුරස් වනවාත් සමගම ගුරු - ගෝල හෙවත් ගුරු - සිසු පරතරය ද ඇත් විය. ඒ හේතුවෙන්ම ගුරු වෘත්තිය තවත් සාමාන්‍ය වෘත්තියක් බවට පත් වූවාට සැක නැත. 'ගුරු සංගම්' අවශ්‍ය වූයේ ගුරු වෘත්තියේ ගෞරවය රැක ගැනීමටය. ගුරුවරුන්ට ගෞරව කරන සමාජයකට ගුරු සංගම්' අවශ්‍ය නොවේ. ගුරු පූජා පැවැත්වූයේත්, ගුරු දින පැවැත්වූයේත් ගුරුවරුන්ට ගෞරව කරන සමාජ පැවැත්මේ උත්තමාංගයක් වශයෙනි. උත්තම ගණයේ ගුරුවරුන්ට තම සිසුන් විසින් ගුරු පූජා පැවැත්වීම හදවතට එකගව සිදු වූ ක්‍රියාදාමයක් ය. 'මට ඉගැන්වූ ඇතැම් ශ්‍රේෂ්ඨ ගුරුවරුන් නිසා තමයි අද මේ තත්ත්වයට ඒමට පුළුවන්කමක් ලැබුණේ' යනුවෙන් කෙරෙන ප්‍රකාශන අපට අසන්නට ලැබේ. 'මට ඉතිහාසය ඉගැන්වූ මගේ ගුරුවරුන් මට නිතරම සිහිපත් වෙනවා' යි ශ්‍රී ජවහල්ලාල් නේරුතුමා ප්‍රකාශ කළේය. 'උත්තම ගණයේ ගුරුවරුන් නැති සමාජය වූ කලී, කැලිවලට භේද හින්න වී පැවැතීම වැළැක්විය නොහැකිය' යි චීන මහා දාර්ශනික කොන්ෆියුසියස් (Confusius) ප්‍රකාශ කළේය. 'බොහෝ තීරණ ගැනීමේදී මට මගේම ගුරු වීමට සිදු වූ වාර අපමණය'යි මහත්මා ගාන්ධිතුමා ප්‍රකාශ කළේය. 'ගුරු මහත්ම, මහත්මාවනි' යයි ඇමතූ අනගාරික ධර්මපාලතුමා මෙසේ කීය. 'දරුවන්ට හරි හැටියට අකුරු උගන්වන්න. ඒත් ඒ මදි. ආගම දහම ගැනත් උගන්වන්න. රට බේරා ගැනීමට උගන්වන්න.'

සන්නිවේදනය කෙමෙන් තාක්ෂණය හේතුවෙන් දිගු වී ජන මාධ්‍ය භේදයක් බවට පත්වීමේදී ගුරු කාර්යය (teacher function) ඊට නතු වූ අයුරු ප්‍රථමකොට අපට උගන්වනු ලැබුවේ මහා බ්‍රිතාන්‍ය සන්නිවේදන ශාස්ත්‍රඥයකු වූ රේමන්ඩ් විලියම්ස් (Raymond Williams) සහ ජෝජ් ගාබ්නර් (Geoge Gerbner) විසිනි. ඔවුන් පැහැදිලි කළ මතවාදයන්ට අනුව ජන මාධ්‍ය භාවිතයේදී තෙවැදෑරුම් ධර්මතාව (Three fold function) යළිත් සිහිපත් කරගත හැකිය. ඒවා නම්,

1. Watcher (ආරක්ෂක)
2. Forum (මණ්ඩප)
3. Teacher (ගුරු)

ජන මාධ්‍ය භාවිතයේදී වඩාත් ප්‍රබලත්වයක් දක්වනු ලබන්නේ ගුරු සංකල්පයට අනුකූලවය. ඒ කෙසේ ද යත් සන්නිවේදකයා තම භූමිකාව (Role) කෙමෙන් ගුරුවරයකුගේ කාර්යයට හරවා ගන්නා විට එම සන්නිවේදකයා හා ඔහුගේ හෝ ඇයගේ මාධ්‍ය (media) කෙරෙහි අවනත බවක් (loyalty) දැකගත හැකිවේ. මේ අවනත බව විටෙක ඇල්මකි. තවත් විටෙක ගෞරවයකි. ලිඛිත, ශ්‍රව්‍ය හා දෘශ්‍ය යන මාධ්‍යයන් මගින් මීට කොතෙකුත් නිදර්ශන පැරණි නවීන භේදයකින් තොරව දැන හැඳින ගත හැකිය. දිනපතා ලංකාදීප පුවත්පතේ, කලක් මුළුල්ලේ දිනපතා පළ වූ ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහයන්ගේ 'වගතුග' තීරු රචනාව කියවූ පාඨක ජනයාට එකල හැඟුණේ තීරු රචකයා හුදු ලේඛකයකු හෝ හිඩැස් පුරවන්නකු (gap writer) නොව එම සීමාවන් ඉක්ම වූ ගුරු සංකල්පයක පිහිටා ඇති බවකි. වගතුග තීරුවේ බෙහෙවින් ගැබ් වූයේ ගුරු උපදේශයන් හා මාර්ගෝපදේශයන්ය. මෙලෙසින් කලක් මුළුල්ලේ 'ඇත්ත' පුවත්පත්හි කතුවැකිය පළ කළේ ද සන්නිවේදනයේ ''ගුරු'' සංකල්පයයි. සමාජයක පවත්නා ඇතැම් විෂමතා දුරු කිරීමට ජනමාධ්‍ය කාර්යභාරය උපයෝගී කරගත හැකිය. මෙබඳුම ගුරු සන්නිවේදන සංකල්පය ශබ්ද මාධ්‍යයේ ප්‍රබලත්වයටද හැරවිය හැකිය. මෙහිදී නිවේදකයාගේ කාර්යභාරය මුල් තැනක් ගනියි. නිවේදකයකුට තම ශ්‍රාවක මණ්ඩලය වෙත කෙතරම් සමීප විය හැකිද යන්න උරගා බැලීමේ සමීක්ෂණ රැසක් බිබීසි ලෝක සේවය (BBC World Service) මඟින් පවත්වන ලදි.

ඉන් ප්‍රධාන සාධකය ලෙස සලකනු ලැබුවේ තොරතුරු විකාශනයේ (information dissemination) හි අන්තර්ගත වූ නිරවද්‍යතාවයි (accuracy) 'නිවැරදිව දැන ගන්න. නිවැරදිව සන්නිවේදනය කරන්න' යනු ලෝක සේවයේ ප්‍රථම අධ්‍යක්ෂවරයා වූ ජෝන් රීච් (Johe Reich) ගේ මතය විය.

'යමක් දැන ඉගෙන සිටීම එසේ නොදැන සිටීමට වඩා හැම අතින්ම යහපත් බව ප්‍රකාශ කෙරේ. ඇතැම් විටෙක සාමාන්‍ය වශයෙන් හෝ නීතිය (law) නොදැන සිටීම හේතුවෙන් දඬුවම් ලැබීමට හේතු කාරක බව පෙනී යයි. 'දැනගෙන ගියොත් කතරගම, නොදැන ගියොත් අතරමඟ' යන කියමනින් මෙබඳු බොහෝ දේ ස්වදේශික වශයෙන් පළ කෙරේ.

'මග හොඳට තිබේ නම්
යන්න දැසත් පෙනේ නම්
කිම බැදිවල යන්නේ
මංමුළා වූ එකෙකු සේ'

යන්න ඔවදන් මුසු ආප්ත කවි පද හතරක් ලෙස සැලකිය හැකිය.

ඉගෙනුම් විධික්‍රම (learning techniques or methods) ලෙස බෙහෙවින් ව්‍යවහාරයේ පවතී. යම්කිසි කාර්යයක් මැනවින් හා විධිමත් ලෙස ඉගෙනුම ලැබීම ඉන් අදහස් කෙරේ. පුහුණුවකින් කිසියම් කාර්යයක් සංයුක්ත විය යුතු බවක් ඉන් ගම්‍ය කෙරේ. නුපුහුණු වෛද්‍යවරයකුට නිසි වෘත්තීය පුහුණුව සඳහා පරිවාස කාලයක් ඇත. මෙහිදී තම වෛද්‍ය වෘත්තික පුහුණුව මැනවින් ලද හැකිය. එම සුදුසුකම නොලබා මැනවින් ඉගෙනුම ලද තැනැත්තා වෛද්‍යවරයකු වශයෙන් නොසැලකේ. යුද භටයකු වීමට ද පුහුණුවක් ලද යුතුය. ඉන් තොරව යුද බිමට යා නොහැකිය.

මා ඇසූ එක්තරා රංග ගුරුතුමකු පිළිබඳ සැබෑ කතාවකින් මේ සටහන් පෙළ සමාප්ත කිරීමට කැමතියි. ඒ කතාවේ මතුපිට පෙළට වඩා වැදගත් වන්නේ ඉගෙනීම හා ඉගැන්වීම පිළිබඳ යටි පෙළයි.

එක්තරා අධ්‍යාපන ඇමතිවරයෙක් එක්තරා රංග ගුරුතුමකුගේ කතාවකට කන්දී සිට මෙහෙම කියනවා.

'ගුරුතුමනි, ඔබ දන්නා පරිදි මම තමයි මේ රටේ අධ්‍යාපනය භාර ඇමතිතුමා. මම ඔබතුමාගේ කතාව ඉතා ආසාවෙන් අසා සිටියා. මටත් නිකමට වාගේ හිතුනා රංග කලාව ඉගෙන ගැනීමට ඇත්නම් කියලා. මේ නිසා මම කල්පනා කළා, ඔබතුමාත් මගේ අමාත්‍යාංශයේ උපදේශක තනතුරකට පත් කරන්නට. එවිට ඔබතුමන්ට පුළුවන්කමක් ලැබේවි මට හිතෙනවා අපේ ගුරුවරුන්ට රංග කලාව පිළිබඳ හොඳ දැනුමක් ලබාදීමට.'

ඇමතිවරයාගේ මේ කතාව අසා සිටි රංග ගුරුතුමා මොකක්ද කීවේ?
'බොහොම ස්තුතියි ඇමතිතුමනි, මම ඒ තනතුර භාර ගන්නට ඒ හැටි කැමැත්තක් නැහැ.'
'ඒ මක් නිසාද?'
'එවිට මට සිදු වන්නේ මා තුළ ජීවත් වන රංග ගුරු මියගොස් වෙන කෙනෙක් මතුවීමයි.'
'එසේ නොවන්නට වගබලා ගත නොහැකිද?'
'එසේ වීමට නම් මම, මට හුරු රංග කලාවේම නියැළී සිටිය යුතුයි.'
'උපදේශක තනතුර භාර ගන්න නැද්ද?'
'නැහැ. එය මට කටු ඔටුන්නක් වේවි.'
ඇමතිවරයා බොහෝ වේලා කල්පනාවෙන් බලා සිටියා රංග ගුරුවරයා දිහා.

<u>2017.01.04</u>

# 55

# ආදිවිද්‍යාර්ථී අපේ අද්දැකීම් නවෝපධාරී ඔබ දියුණට රට වැඩුමට

## සුනිල් කන්නන්ගර

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ උපාධි ප්‍රදානෝත්සවයට ආරාධිතයකු ලෙස එක් වෙමින් ඔබ සැම අමතන්නට ලැබීම මා ජීවිතයේ ලද අතිශය භාග්‍යසම්පන්න අවස්ථාවක් සේ සලකනු ලබන බව ප්‍රථමයෙන් ම ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. ඒ සඳහා මට ආරාධනා කිරීම පිළිබඳව මාගේ ස්තුතිය හා ගෞරවය පිරිනැමීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි. ඔබ සැම ඇමතීමට අවස්ථාවක් ලැබීම පිළිබඳව මා ලබන සතුට වැඩි වීමට බලපාන ප්‍රධාන හේතුව වනුයේ ඔබ මෙන් ම මා ද මෙම විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ අයකු වීම යි. මින් වසර තිස් හතරකට ඉහත දී 1979-1983 වකවානුවේ මෙම විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ මම විශ්වවිද්‍යාලයට වසර විසිපහක් ගත වීමෙන් පසු පැවැත් වූ උපාධි ප්‍රදානෝත්සවයේ දී ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය ලබාගත් අයෙක්මි. එදා අප අධ්‍යාපනය ලැබූ ශාස්ත්‍ර පීඨය වර්තමානයේ කාලානුරූප ව පුළුල් වෙමින් විශාල ලෙස පුළුල් විෂය ක්ෂේත්‍රයක් කරා පැතිරුණු මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය ලෙස වැඩිදුරටත් සංවර්ධනය වී තිබීම පිළිබඳ අතිශයින් සතුටු වෙමි. පොදුවේ ගත් කල අප අධ්‍යාපනය ලැබූ වකවානුවට වඩා මේ කීර්තිමත් විශ්වවිද්‍යාලය බොහෝ සේ සංවර්ධනය වී ඇති බව කිව යුතු ය. භෞතික පහසුකම් පමණක් නොව ගුණාත්මක භාවයෙන් ද අප විශ්වවිද්‍යාලය අතිශය කීර්තිමත් තත්ත්වයකට පත් ව තිබීම අප සැමගේ අභිමානයට කරුණකි. අප විශ්වවිද්‍යාලය ස්ථාපිත කිරීමෙන් අනතුරුව ශ්‍රී ලාංකිකයනට ඉටු කරන ලද මෙහෙය පිළිබඳ ව ඔබ අප සැම දෙනාම සතුටු වනු නො අනුමානය.

මෙම සුවිශේෂ අවස්ථාවේ දී මා අධ්‍යාපනය ලැබූ වකවානුවේ අප හා සමකාලීන ව අධ්‍යාපනය හැදෑරූ විශාල ශිෂ්‍ය පිරිස අතුරින් කිහිප දෙනෙකුගේ වර්තමාන වගකීම පිළිබඳ සමාලෝචනයක් සිදු කිරීම සුදුසු යැයි සිතමි. විශේෂයෙන් මෙම කීර්තිමත් විශ්වවිද්‍යාලයේ වර්තමාන උපකුලපතිතුමා ඉදිරියේ දී මෙම සමාලෝචනය කිරීමට ලැබීම සතුටක් වන්නේ එතුමාත් අප හා විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ යුගයේ ඊට ඇතුළත් වූ ශිෂ්‍යයකු වන බැවිනි. එදා අප හා අධ්‍යාපනය ලැබූ වසර කිහිපයකට අයත් පිරිස වර්තමානයේ රටේ බොහෝ ඉහළ වගකීම් දරන්නා වූ පිරිස අතර සැලකිය යුතු අන්දමේ නියෝජනයක් දරමින් සිටිති. ඊට උදාහරණ ලෙස වර්තමානයේ අමාත්‍යාංශ ලේකම් ධුර දන්නා වූ අයගෙන් පහළවකට ආසන්න පිරිසක් අප හා සමකාලීන යුගයේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ අය බව පෙන්වා දීමට කැමැත්තෙමි. මීට අතිරේක ව රාජ්‍ය අංශයේ ප්‍රමුඛ සේවා සපයන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් ලෙස ද මේ හා සමාන ප්‍රමාණයක පිරිසක් අප සමකාලීන සේවයේ නිරත වෙමින් සිටිති. ඒ අතර විගණකාධිපති, ශ්‍රී ලංකා පොලිසිය, දේශීය අධ්‍යාපනය, රේගු, තක්සේරු, විභාග වැනි ප්‍රමුඛ දෙපාර්තමේන්තු ප්‍රධානීන් ද ඇතුළත් වන බව පෙන්වා දෙමි. එමෙන් ම රටේ පරිපාලනය මෙහෙයවන්නා වූ දිස්ත්‍රික් පාලනයේ නිරත දිසාපතිවරුන් අතුරින් හය දෙනෙක් ද අප යුගයේ මෙම විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලැබූවන් වෙති. මීට ද අතිරේක ව මේ රාජ්‍ය අංශයේ ඊළඟ මට්ටම්වල වගකීම් උසුලන්නා වූ නිලධාරීන් විශාල පිරිස් මෙම විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලැබූවෝ වෙති. එසේ ම මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ විශාල

පිරිසක් ද රාජ්‍ය අංශයට දායක කර ඇත්තේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසිනි. එසේ ම අධ්‍යාපන අංශයේත් මෙම විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ උපාධිධාරී ගුරුවර ගුරුවරියන් විශාල පිරිසක් රටේ සෑම පාළාතකම නිදහස් අධ්‍යාපනය උදෙසා කැප කිරීම් සහිත සේවාවන් ඉටු කරමින් සිටිති. මේ පිළිබඳ නිසි අධ්‍යයනයක් සිදු කිරීම සඳහා ඉතාමත් උචිත බව ද මෙහිලා සඳහන් කරනු කැමැත්තෙමි.

රාජ්‍ය අංශයේ හැර රාජ්‍යානුබද්ධ අංශයත් පළාත් රාජ්‍ය සේවාවන් හා මෙන් ම පෞද්ගලික අංශයේ ද මෙම විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ පිරිස කැපී පෙනෙන දායකත්වයක් දක්වති. ජාත්‍යන්තරය දක්වා විහිදුනු දේශීය පෞද්ගලික ව්‍යවසායකත්ව ගණනාවකම නිර්මාතෘන් වන්නේ අප යුගයේ මෙම විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ අය වෙති. සමස්තයක් ලෙස ගත් කල රාජ්‍ය, පෞද්ගලික, ව්‍යාපාර, පළාත් සේවා වැනි විවිධ අංශ හරහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන් විශාල පිරිසක් ජාතියට මහඟු සේවාවන් ඉටු කරමින් සිටින බව ප්‍රකාශ කළ යුතු ව ඇත.

ඉහත පිරිස් අතුරින් රටේ ප්‍රමුඛ වගකීම් උසුලන්නන් පිළිබඳ ව බැලීමේ දී ඔවුන්ගෙන් වැඩි දෙනෙක් ඔබ මෙන් ම කලා මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූවෝ වෙති. එමෙන් ම ඔබ අප සියලු දෙනාගෙන් අතිශය බහුතරය ග්‍රාමීය ප්‍රදේශවල ඉපිද ඉමහත් දුෂ්කරතා මධ්‍යයේ අධ්‍යාපනය ලැබූවෝ ද වෙති. අපගේ අධ්‍යාපනය ලැබූ යුගයට වඩා යම් යම් පහසුකම් පාසල් අධ්‍යාපනයේ දී ඔබ සෑම ඇතැම් විට භුක්ති විඳින්නට ඇතත් ග්‍රාමීය ප්‍රදේශවල පවතින සම්පත් හිඟය ඇතුළු විවිධ අපහසුතා නිසා ඉතාමත් දුෂ්කර තත්ත්වයන් යටතේ අධ්‍යාපනය ලබන්නන් සැලකිය යුතු පිරිසක් තවමත් සිටින බව අපට පැහැදිලි වී ඇත. ග්‍රාමීය ප්‍රදේශවල ඉපිද එසේ දුෂ්කර තත්ත්වයන් යටතේ අධ්‍යාපනය ලබා අද ඔබ මෙන් ම උපාධිධාරීන් වූ අප සියලු දෙනාම රටේ ක්‍රියාත්මක වන නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිඵල ලෙස ඉහළට පැමිණි අය බව පැහැදිලි ව කිය යුතු ය. අපේ රටේ ක්‍රියාත්මක වන නිදහස් අධ්‍යාපනය හා නිදහස් සෞඛ්‍ය සේවය පිළිබඳ ප්‍රතිපත්තීන් තරම් ග්‍රාමීය ප්‍රජාවගේ ඉදිරි ගමනට බලපෑ වෙනත් කිසිදු ප්‍රතිපත්තියක් පිළිබඳ හිතා ගැනීමට නොහැක. නිදහස් අධ්‍යාපනය තුළින් හා ස්වභාෂා අධ්‍යාපනය තුළින් ඉදිරියට ගිය අප රටවැසියන්ගේ සෞඛ්‍ය තත්ත්වය උසස් තත්ත්වයක තබා ගත්තේ මේ ක්‍රියාත්මක නිදහස් සෞඛ්‍ය සේවාව යි.

ඉහත කරුණු පිළිබඳ ව ඔබ සැමගේ අවධානය යොමු කරවන ලෙස ඉල්ලා සිටීමට මම කැමැත්තෙමි. නිදහස් අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවාව ආරම්භ කරන අවස්ථාවේ සිට ඉතා මෑතක් වන තුරු අප රට දිළිඳු රටක් සේ හඳුන්වනු ලැබිණ. අද පවා අප රට මැදි ආදායම් තත්ත්වයකට ආසන්න රටක් සේ සැලකේ. කොතරම් දුප්පත් රටක් වුව ද මේ රටේ ජනතාව තම ජාතික ආදායමෙන් නිදහස් අධ්‍යාපනය හා නිදහස් සෞඛ්‍ය සේවාව පවත්වාගෙන යාමෙන් අපේ රටේ මානව සම්පත සංවර්ධනය උදෙසා දැවැන්ත සේවාවන් සිදු වී ඇත. අප සියලු දෙනාට මෙන් ම අනාගතයේ තවත් ලක්ෂ සංඛ්‍යාත පිරිසක් මේ ප්‍රතිපත්තිවලින් ප්‍රයෝජනය ගන්නවා නිසැක ය. කොතරම් දුෂ්කරතා මධ්‍යයේ වුව ද අප රටේ ජනතාව නිදහස් අධ්‍යාපනය හා නිදහස් සෞඛ්‍ය සේවාව වෙනුවෙන් දැක්වූ දායකත්වය අතිශය පරාර්ථකාමී ක්‍රියාවක් බව පෙන්වා දිය යුතු ව ඇත. නිදහස් අධ්‍යාපනය අප වෙත ගෙන ආ ගුරු පරපුර ගත් කල බොහෝ කැපවීම් කළ පිරිසකි. මේ අවස්ථාවේ දී මා හා එකට කණ්ඩායමක අධ්‍යාපනය ලැබ ජයවර්ධනපුර සරසවියෙන් උපාධිය ගත් අපේ එක් මිතුරෙකු එම අවධියේ මහවැලි සී කලාපයේ පාසලක ගත කළ දුෂ්කර ජීවිතය සිහිපත් වේ. හරිහැටි ආහාර පාන ගැනීමට තැනක් නැතිව නිදා ගැනීමට ස්ථානයක් හරිහැටි නොමැති ව පැසල් ගොඩනැගිල්ලේ පිහිටි කාමරයක බිමට එලන ලද පැදුරක නිදා ගනිමින් පානීය ජලය සොයා සැතපුම් ගණනාවක්

ගමන් කරමින් එම විද්‍යාලයේ දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් කැපවීම් කළ එම මිතුරන්ගෙන් උගත් සිසු දරු දැරියන් පසුව විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබාගත් අන්දම පිළිබඳ ව ඔවුන් මහත් ආඩම්බරයෙන් ආවර්ජනය කරන්නේ ඒ සඳහා තමන් විඳි දුක්කම්කටළු අමතක කරමිනි. මෙබඳු ගුරු මහතුන්ගේ ඒ මහා පරාර්ථකාමී චර්යාව හැම පරපුරක අධ්‍යාපනය සඳහා මහඟු උපහාරයක් වී ඇත. අප මෙන් ම ඔබ සියලු දෙනා ම මේ අන්දමින් නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තියේ ද ගුරු භවතුන්ගේ ද කැප කිරීමේ ප්‍රතිඵල බව පිළිගත යුතු ව ඇත. මහා පරාර්ථකාමී චර්යාවක ප්‍රතිඵල වූ උපාධිධාරීන් වන අප හා ඔබ සියලු දෙනාට ආත්මාර්ථකාමී අන්දමින් කටයුතු කිරීමේ අයිතියක් හෝ සදාචාරයක් නොමැති බව තේරුම් ගනිමු.

රටේ පුරවැසියන්ගේ දායකත්වයෙන් බිහිවුණු අපි ඔවුන් වෙනුවෙන් වඩා හොඳ ලෝකයක් නිර්මාණය කළයුතු වෙමු. රටේ වැඩි වගකීම් දරන තනතුරුවල සේවය කරන්නා වූ අප ඒ වගකීම් අමතක කර නොමැති බව ඉමහත් අභිමානයෙන් යුතුව කීමට කැමැත්තෙමි. රටේ පුරවැසියන් සියුම් කැපකිරීම් කොට ඊළඟ පරපුර ඉහළට ඔසවන්නේ එම පරපුරට වගකීම් ලැබුණු පසු කැපවීම් කළ පුරවැසියන්ට යුක්තිය හා සාධාරණය ඉටුකරන වඩා උසස් සමාජයක් නිර්මාණය කරනු ඇතැයි යන අපේක්ෂාවෙනි. අද ඔබ ඉදිරියේ පවතින්නේ මේ අපේක්ෂාවන් සාක්ෂාත් කිරීමේ අභියෝගය යි.

රටේ ජනතාව බලාපොරොත්තු වන්නා වූ අපේක්ෂාවන් සාක්ෂාත් කිරීම උදෙසා ඔබ කටයුතු කළ යුත්තේ කෙසේ ද? ඔබ ඉදිරියේ පවතින ප්‍රධාන ගැටලුව ලෙස දක්වා ඇත්තේ තරුණයන් ලෙස රැකියාවක් සොයා ගැනීමේ අභියෝගය යි. එදා විශ්වවිද්‍යාලයීය උපාධිධාරීන් ලෙස සමාජයට පැමිණි අප ඉදිරියේ ද එම අභියෝග එලෙස ම පැවතුණි. වර්තමානයේ මා නියෝජනය කරන රාජ්‍ය අංශය දෙස බැලීමේ දී ප්‍රධාන වශයෙන් නිරීක්ෂණය වන්නේ සියලු තනතුරු තරඟ විභාග තුළින් තෝරා ගැනීමේ සාධාරණ ක්‍රමවේදයන් රාජ්‍ය අංශය තුළ ක්‍රියාත්මක වන බව යි. රාජ්‍ය අංශය හැරුණු විට ඉතා විශාල ලෙස පුළුල් වන පෞද්ගලික අංශක් රටේ ක්‍රියාත්මක වෙමින් පවතී. උපාධිධාරීන් ලෙස රාජ්‍ය අංශය වෙතට නෙත් යොමා සිටිනු වෙනුවට පෞද්ගලික අංශය කෙරෙහි ද නෙත් යොමන ලෙස ඔබෙන් ඉල්ලා සිටීමට මම කැමැත්තෙමි.

පෞද්ගලික අංශය තුළ නිර්මාණශීලි හැකියාවන්ට රාජ්‍ය අංශයට වඩා ඉඩකඩ පවතී. එසේ ම දක්ෂ නිර්මාණශීලි උගතුන් සඳහා පෞද්ගලික අංශය තුළ විශාල ඉල්ලුමක් ද පවතී. එබැවින් උපාධිධාරීන් ලෙස අදින් පසු මේ ගැන ද සිහි තබාගෙන පෞද්ගලික අංශය සහ රාජ්‍ය අංශය යන දෙඅංශයට ම ගැළපෙන අතිරේක සුදුසුකම් සම්පූර්ණ කර ගැනීම කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු කැමැත්තෙමි. මේ සඳහා අප යුගයේ නොතිබුණු පහසුකම් රාශියක් වර්තමානයේ පවතින බවත් විශේෂයෙන් සඳහන් කරනු කැමැත්තෙමි. අප අධ්‍යාපනය ලැබූ යුගයේ අධ්‍යාපනය සඳහා මූල්‍ය පහසුකම් සපයන ණය යෝජනා ක්‍රම සමාජගත ව නොතිබුණි. වර්තමානයේ එබඳු මූල්‍ය පහසුකම් සපයන ආයතන බොහෝ පවතී. මේ සියල්ල ප්‍රයෝජනයට ගනිමින් තම ධාරිතාව පුළුල් කර ගැනීම වර්තමාන තරගකාරී සමාජය තුළ ඉදිරි ගමන සඳහා බොහෝ ප්‍රයෝජනවත් වන බව ඔබට පෙන්වා දීමට කැමැත්තෙමි. කවර අංශයක අවස්ථාවක් ලැබුව ද ඔබේ කැපවීම ඒ ඕනෑම අංශයක ඉදිරි ගමන වෙනුවෙන් මහා පිටිවහලක් වනු බව ඔබට සිහිපත් කරමි. පසුගිය 2012 වර්ෂයේ දී උපාධිධාරීන් 50,000ක් රාජ්‍ය සේවාවට එක් කරගත් අවස්ථාවේ දී පරිපාලන දිස්ත්‍රික්කය භාර ව පාලන කටයුතු කළ මාහට එම දිස්ත්‍රික්කයේ උපාධිධාරී තරුණ තරුණියන් 2500කට අධික පිරිසක් අභ්‍යාසලාභීන් ලෙස බඳවා ගැනීමට හැකි විය. එසේ බඳවා ගත් පිරිස එක් අවුරුදු කාල සීමාවක පුහුණුවකින් පසු ස්ථිර රාජ්‍ය සේවාවට එක් කළ අවස්ථාවේ එහි වූ එක් ගැටළුවක් ඔබ ඉදිරියේ ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. ස්ථිර තනතුරු පුරප්පාඩු පැවතියේ බොහෝ විට අභ්‍යාසලාභීන් පදිංචි

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලින් බැහැර ප්‍රදේශවල ය. ඇතැම් විට යාබද දිස්ත්‍රික්කවල ය. තම පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පුරප්පාඩු වන තුරු යාබද කොට්ඨාශයේ පුරප්පාඩුව සඳහා ඉදිරිපත් නොවී අභ්‍යාසලාභී දීමනාව ලබමින් අවුරුදු දෙකකට ආසන්න කාලයක් ගෙවූ උපාධිධාරී තරුණ තරුණියෝ රැසක් ම එම දිස්ත්‍රික්කයේ සිටියහ. උසස් අධ්‍යාපනය හැදෑරීමට තම පදිංචි ප්‍රදේශයෙන් බැහැර වී කල් ගෙවූ ඇතැම්හු රාජ්‍ය සේවය සඳහා තමන් පදිංචි ප්‍රදේශවලින් බැහැර ව යාමට අකමැත්ත පළ කළහ.

උපාධිධාරීන් ලෙස අපට ලැබුණු අවස්ථාවන් භාවිත කළේ බොහෝ දුෂ්කර සේවා ස්ථානවලට කොටු වෙමිනි. වසර 33ක පමණ රාජ්‍ය සේවා කාලයක් සහිත මා එසේ වසර 21ක් ම ගත කර ඇත්තේ අතිශය දුෂ්කර උපන් ප්‍රදේශයෙන් කිලෝමීටර් සිය ගණන් ඈත යුද්ධ වාතාවරණයක් යටතේ සිවිල් පාලනය කඩා වැටී තිබුණු ප්‍රදේශවල සේවය වෙනුවෙනි. උපන් ප්‍රදේශයේ ජනතාව පමණක් නොව අප වෙනුවෙන් කැපවීම් කර ඇත්තේ මුළුමහත් රටේ ජනතාව බව අප සිහියේ තබා ගත යුතුය. ඔවුනගේ කැපවීමට සාධාරණය ඉටුකිරීම අපගේ වගකීම යි. ඒ සඳහා කැපවීම් කළ හැකි පරපුරක් බව ඔබ විසින් ඔප්පුකළ යුතු ව ඇත. අප රට ආර්ථික පැත්තෙන් යම් ආකාරයක සුබදායක ස්ථාවරයකට පිවිස ඇති බව පෙනේ. ආර්ථික වර්ධනයට සමගාමී ව සමාජ සංවර්ධනය යහපත් ව නොපවතින බව බොහෝ දෙනා පවසති. විශේෂයෙන් සමාජ සාධාරණත්වය, විනයගරුක බව, සදාචාර සම්පන්න බව වැනි කරුණුවල දී අප සමාජය පසුගාමී තත්ත්වයක පවතින බැව් පෙනී ගොස් ඇත. මේවා නිවැරදි කරන ලෙසට විවිධ බලධාරීන්ගෙන් අපි සැම ඉල්ලා සිටින්නෙමු. මේ අන්දමින් විවිධ බලධාරීත්වයන්ගෙන් ඉල්ලීම් කරන අතරතුර අප කටයුතු කිරීමේ දී ඉහත සමාජ තත්ත්වයන් නිවැරදි කරමින් කටයුතු කිරීම තුළින් පූර්වාදර්ශය සැපයීමට හැකි බව අපට අමතක වී ඇත. මේ නිසා වර්තමාන තරුණ පරපුර වූ ඔබ ඉදිරියේ සමාජ සංවර්ධනය වෙනුවෙන් වූ අභියෝග ජයගැනීමේ විශාල කාර්ය භාරයක් පවතී. එසේම මුළු මහත් ජාතියට වසර දහස් ගණනක් තිබෙන්නේ සංවර්ධනය කරගත්තා වූ ගුණාංගයන් සුරක්ෂිත කොට ඉදිරි පරපුරට භාරදීමේ වගකීම ද ඔබ වෙත පවතින බව පෙන්වා දෙනු කැමැත්තෙමි.

අවසාන වශයෙන් මෙම කීර්තිමත් විශ්වවිද්‍යාලය මගේ ජීවිතයේ දී ලබා දුන් ඒ මහඟු චින්තන සම්ප්‍රදාය තුළින් රටට කිරීමට හැකි වූ සේවාව පිළිබඳ සතුටු වන බව ප්‍රකාශ කරන අතර අද දින උපාධි ලබන්නා වූ ඔබ සියලු දෙනාම ඉදිරියේ ඇති අභියෝගයන්ගෙන් ජය ගනිමින් ඉදිරියට ගමන් කරනු ඇතැයි බලවත් සේ විශ්වාස කරමි. එසේ ම අනාගතයේ දී අප සමකාලීනයන් දරන්නා වූ වගකීම් පිළිබඳ මා සතුටු වූ අන්දමට තව දශක දෙක තුනක් තුළ දී ඔබට ද සතුටු වීමට අවස්ථාව උදා වනු ඇති බවට බලාපොරොත්තු වන බව ද ප්‍රකාශ කරමි. ඔබ සියලු දෙනාට සාර්ථක අනාගතයක් උදාවේවායි ද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය දිනේවායි ද ප්‍රකාශ කරමි.

<u>2017.09.07</u>

# 56

# Some Lessons for Success and Progress of Success of a Graduate

**Prof. H. H. D. N. P. Opatha**

First of all I take this opportunity to thank the Vice Chancellor, Dean, Heads and Members of the Board of the Faculty of Management Studies of the University of Sri Jayewardenepura for inviting me to deliver the 2018 Convocation address for the Third Session at this memorable and prestigious event. It is a privilege for me to share some thoughts with .you, on this vital occasion in your lives, wherein you are assembled, after several years of strenuous studies, to secure your degree. Let me congratulate all the graduates! To secure a Degree from a recognized state university, particularly a BSc Business Administration from USJ, is a great achievement in one's life.

Rather than making a more sophisticated and scholastic address about a selected topic I decided to do this convocation address with regard to some lessons learnt from my own experience, vicarious experience, and my reading and research which will be useful for the current graduates who are here in front of me. Alternatively these lessons can be perceived as requirements for or principles of success and progress of success of a graduate.

## Lesson Number 1 - Believe that Attitude is a Major Factor that Makes the Difference between being Successful and being Unsuccessful

Right attitude means appropriate beliefs (cognitive), feelings (affective) and intention to behave (behavioural) with regard to the field you have selected or you have been fallen. It does not matter whatever the field of your interest is. What matters is that you should have a right attitude about the field. Right attitude involves positive thinking too which refers to perceiving your life positively, perceiving your future optimistically and having favourable self-concept (your evaluation about yourself, linked with self esteem). Think that you CAN do. Think that you can SUCCEED. You should not have doubts about your life, and the field you have selected or you have to be in. Think that there were people who had been highly successful in the field and therefore it is POSSIBLE for you also. Think optimistically about yourself, the future and the world.

Your attitude about life matters significantly. Life is not a great tragedy. It is a great natural gift and indeed it is the greatest opportunity you got to work, contribute, make a significant positive impact, and enjoy. If life has many problems, believe that there are solutions for all problems. If life is a mystery, it is possible to discover. If life is a spirit, it is possible to realize it. Of course life is a journey, and you are supposed to complete it.

## Lesson Number 2 - Be an Internal (a Person With Internal Locus of Control rather than an External (a Person with External Locus of Control).

